# වාර්ෂික වාර්තාව
# 2022

ලංකා විදුලිබල මණ්ඩලය





# පටුන


අපගේ ඉදිරි දැක්ම, අපගේ මෙහෙවර හා සාරධර්ම 2
අපගේ පාරිසරික ප්‍රතිපත්තිය 3
බැලූ බැල්මට 4
අපගේ කාර්ය බලකාය 5
අතීත කාර්ය සාධනයන් 6
ආයතනික තොරතුරු 7
සංවිධාන ව්‍යුහය 8
අනු-ආයතනද සහිත ලං.වි.ම. ආයතනික ව්‍යුහය - 2022 10
සභාපතිතුමාගේ සමාලෝචනය 12
සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය 14
ලං.වි.ම. සම්ප්‍රේෂණ පද්ධතිය 16
මෙහෙයුම් සමාලෝචනය
- ජනන අංශය 18
- සම්ප්‍රේෂණ අංශය 24
- බෙදාහැරීමේ අංශ 30
- ව්‍යාපෘති අංශය 38
- වත්කම් කළමනාකරණ අංශය 43
- ආයතනික ක්‍රමෝපාය අංශය 47
- මූල්‍ය අවදානම් කළමනාකරණය 50
- තාක්ෂණික අවදානම් කළමනාකරණය 51
- තිරසාරභාවය පිළිබඳ වාර්තාව 53
- ආයතනික සමාජ වගකීම් වාර්තාව 58
- මුල්‍ය අංශය සහ මූල්‍ය තොරතුරු 61

දස වසරක සාරාංශය 70
අගය එකතු කිරීමේ ප්‍රකාශය 71
ආයතනික පාලනය පිළිබඳ වාර්තාව 72
අධ්‍යක්ෂ මණ්ඩලය 74
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 76
ලාභ හෝ අලාභ ප්‍රකාශනය 80
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 81
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 82
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 83
සමූහය - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය 84
මණ්ඩලය - ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය 86
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් 87
විගණකාධිපති වාර්තාව (සමූහ මූල්‍ය ප්‍රකාශන) 154
විගණකාධිපති වාර්තාවට පිළිතුරු 173
කෙටි යෙදුම් 245

# අපගේ දැක්ම

සසිරිමත් දිවියකට විදුලිය

# අපගේ මෙහෙවර

අපගේ සාරධර්මයන්ට අනුගත වෙමින් සමස්ත ශ්‍රී ලංකාවට කාර්යක්ෂම, සමායෝජිත සහ සකසුරුවම් විදුලිය සැපයුමක් සංවර්ධනය කර පවත්වාගෙන යාම.

# අපගේ සාරධර්ම

- ගුණාත්මක බව
- ජාතියට සේවා සැලසීම
- කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව
- කැපවීම
- සුරක්ෂිත බව
- වෘත්තීය නිපුණතාව
- තිරසාර බව

# අපගේ පාරිසරික ප්‍රතිපත්තිය



සමනලවැව ජලාශය

ලංකා විදුලිබල මණ්ඩලය එහි සියලු වාණිජ ක්‍රියාකාරකම් ඉටුකරන්නේ ස්වභාවික පරිසරය සහ මිනිසා විසින් නිර්මිත පරිසරය ආරක්ෂා කරමින්, සංවර්ධනය සඳහා චිරස්ථායි දායකත්වයක් ලබා දෙමිනි. පාරිසරික ප්‍රශ්න සම්බන්ධයෙන් විවෘතව කටයුතු කිරීම මගින් මහජනතාව, පාරිභෝගිකයන්, අධිකාරීන්, සේවයකයන් සහ අයිතිකරුවන් තුළ අපගේ ක්‍රියාකාරකම් සම්බන්ධ විශ්වාසයක් ඇති කිරීමට අපි බලාපොරොත්තු වෙමු. අපගේ ක්‍රියාකාරකම් සඳහා පාරිසරික වැදගත්කමින් යුත් කරුණු අන්තර්ගත කර ගැනීම සහ අනුකලනය සඳහා වූ ප්‍රතිපත්තියක් අපි ක්‍රියාශීලී ලෙස අනුගමනය කරමු.

# බැලූ බැල්මට



සමාරම්භය
1969



ශ්‍රී ලංකාවේ
දිවයින පුරා විහිදී ඇත



6,936,735
විදුලිය සම්බන්ධතා සංඛ්‍යාව



14,520 ගි.වො.පැ.
විදුලිය අලෙවිය



24,272
දිවයින පුරා
සේවකයන් සංඛ්‍යාව



1,062,344 රු. මිලියන
සමස්ත වත්කම්



4,084 මෙ.වො.
සමස්ත
ධාරිතාවය



2,260 මෙ.වො.
පුනර්ජනනීය
ධාරිතාවය



535 මෙ.වො.
වහළ මත සවිකරන
සූර්ය පැනල ධාරිතාව

සම්ප්‍රේෂණ මාර්ග 3,253 කි.මී.

බෙදාහැරීමේ මාර්ග 188,648 කි.මී.

ඒකකයකට සාමාන්‍ය පිරිවැය 33.65 රු./කි.වො.පැ.

ඒකකයකට අලෙවි පිරිවැය 21.24 රු./කි.වො.පැ.

ආදායම 308,457 රු. මිලියන

අලෙවි පිරිවැය 430,509 රු. මිලියන

# 2022-12-31 දිනට අපගේ කාර්ය බලකාය

## කාර්ය බලකාය




## සේවා කාණ්ඩයන්




## වයස් විග්‍රහය




## සේවා කාල විග්‍රහය




## සේවා කාණ්ඩ විග්‍රහය





ලක්ෂපාන ජලාශය

# අතීත කාර්ය සාධනයන්

| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| දළ බලශක්ති ජනනය (ගි.වො.පැ.) | 11,962 | 12,423 | 13,154 | 14,249 | 14,773 | 15,985 | 16,556 | 16,392 | 17,378 | 16,576 |
| සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ජනනය * (ගි.වො.පැ.) | 1,179 | 1,217 | 1,467 | 1,160 | 1,464 | 1,832 | 1,761 | 1,866 | 2,922 | 2,937 |
| උපරිම ඉල්ලුම (මෙ.වො.) | 2,164 | 2,152 | 2,283 | 2,453 | 2,523 | 2,616 | 2,669 | 2,717 | 2,802 | 2,708 |
| විදුලිය අලෙවිය (ගි.වො.පැ.) | 10,621 | 11,063 | 11,786 | 12,785 | 13,431 | 14,091 | 14,611 | 14,286 | 15,214 | 14,520 |
| පාරිභෝගික ගිණුම් (සංඛ්‍යාව) | 5,210,761 | 5,417,532 | 5,648,132 | 5,964,194 | 6,193,131 | 6,354,281 | 6,500,641 | 6,636,266 | 6,809,528 | 6,936,735 |
| පද්ධතිමය බලශක්ති හානිය (%) | 11.1 | 10.9 | 10.4 | 10.3 | 8.5 | 8.3 | 8.2 | 9.1 | 8.7 | 8.8 |
| ආදායම (රු. මිලියන) | 194,147 | 202,645 | 188,684 | 206,811 | 218,450 | 229,571 | 242,950 | 238,911 | 248,776** | 308,457 |
| සාමාන්‍ය විකුණුම් මිල (රු./කි.වො.පැ.) - (අ) | 17.93 | 18.50 | 16.00 | 16.18 | 16.26 | 16.29 | 16.63 | 16.72 | 16.37 | 21.24 |
| අලෙවි ලක්ෂ්‍යයේදී සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.) - (අ) | 16.94 | 20.00 | 15.07 | 18.08 | 20.34 | 19.12 | 24.12 | 21.67 | 19.42 | 33.65 |
| වසර තුළ විදුලියනය කළ නිවාස (සංඛ්‍යාව) | 198,484 | 178,300 | 198,166 | 277,038 | 181,627 | 118,077 | 108,315 | 98,829 | 125,277 | 94,768 |

* - සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය - (කුඩා ජලවිදුලි, සුළං, සූර්ය, ඩෙන්ඩ්‍රෝ, ජෛවස්කන්ධ හා නාගරික අපද්‍රව්‍ය)

** - ප්‍රතිප්‍රකාශිත

(අ) - තාවකාලික

# ආයතනික තොරතුරු

**නෛතික ස්වභාවය**

ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) යනු 1969 අංක 31, 1979 අංක 29, 1988 අංක 32 දරණ පනත් මගින් සංශෝධිත 1969 අංක 17 දරණ පාර්ලිමේන්තු පනත මගින් හා 2013 අංක 31 දරණ පනත මගින් සංශෝධිත 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් ස්ථාපිත, සංස්ථාපිත මණ්ඩලයකි.

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්**

**සභාපති**

එම්. එම්. සී. ෆර්ඩිනැන්ඩු මහතා 2022-06-12 දින දක්වා

එන්. එස්. ඉලංගකෝන් මහතා 2022-06-13 දින සිට

**උප සභාපති**

එන්. එස්. ඉලංගකෝන් මහතා 2022-06-12 දින දක්වා

**මහා භාණ්ඩාගාරය නියෝජනය කරන සාමාජික**

එස්. ඩී. ජුඩ් නිලුක්ෂාන් මහතා 2022-01-10 දින දක්වා

එම්. ආර්. වී. ආර්. මීපුර මහතා 2022-01-11 දින සිට

**සාමාජිකයෝ**

එම්. එම්. නයිමුදීන් මහතා

ආර්. වික්‍රමාරච්චි මහතා

ආචාර්ය බී. විජයරත්න මහතා

ජී. පී. එන්. එම්. අබේසේකර මහතා

ඩී. පී. එම්. චන්දන මහතා 2022-12-12 දින සිට

**අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

එච්. ආර්. පී. පත්බේරිය මහත්මිය

**සාමාන්‍යාධිකාරී**

ඉංජිනේරු එම්. ආර්. රණතුංග මහතා 2022-01-12 දින දක්වා

ඉංජිනේරු (ආචාර්ය) ඩී. සී. ආර්. අබේසේකර මහතා 2022-01-13 දින සිට 2022-12-18 දින දක්වා

ඉංජිනේරු ජී. ඒ. ඩී. ආර්. පී. සෙනෙවිරත්න මහතා 2022-12-19 දින සිට

**ආයතනික කළමනාකරණය**

**අතිරේක සාමාන්‍යාධිකාරී (ජනන)**

ඉංජිනේරු ඒ. ආර්. නවමනී මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ)**

ඉංජිනේරු පී. ඩබ්. හෙන්දහේවා මහතා 2022-05-30 දින දක්වා

**අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ - රැහැන් රහිත මෙහෙයුම්)**

ඉංජිනේරු පී. ඩබ්. හෙන්දහේවා මහතා 2022-05-31 දින සිට

**අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ - රැහැන් සහිත මෙහෙයුම්)**

ඉංජිනේරු එස්. සී. දිද්දෙනිය මහතා 2022-05-31 දින සිට 2022-12-25 දින දක්වා

ඉංජිනේරු එච්. ඩී. සී. ජයරත්න මහතා 2022-12-26 දින සිට

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 1)**

ඉංජිනේරු ජේ. මීගොඩ මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 2)**

ඉංජිනේරු ටී. ඒ. කේ. ජයසේකර මහත්මිය

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 3)**

ඉංජිනේරු ජී. ජේ. අලුත්ගේ මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරී (බෙ.අ. 4)**

ඉංජිනේරු ජී. ඒ. ඩී. ආර්. පී. සෙනෙවිරත්න මහතා 2022-12-18 දින දක්වා

ඉංජිනේරු එන්. ඩබ්. කුමාරසිංහ මහතා 2022-12-19 දින සිට

**අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණ)**

ඉංජිනේරු කේ. කේ. එස්. දසනායක මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික ක්‍රමෝපාය)**

ඉංජිනේරු (ආචාර්ය) ඩී. සී. ආර්. අබේසේකර මහතා
2022-01-12 දින දක්වා

ඉංජිනේරු කේ. කේ. එස්. දසනායක මහතා (වැඩ බලන)
2022-02-03 දින සිට 2022-12-18 දින දක්වා

ඉංජිනේරු එම්. එම්. එන්. මුනව්වරා මහත්මිය
2022-12-19 දින සිට

**අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)**

ඉංජිනේරු එච්. එස්. සෝමතිලක මහතා

**මුදල් කළමනාකරු**

ටී. කේ. ලියනගේ මහතා

# සංවිධාන ව්‍යුහය 2022



නි.සා. (ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය)
නි.සා. (ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු)
නි.සා. (ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන)
නි.සා. (තොරතුරු තාක්ෂණ)
නි.සා. (පර්යේෂණ හා සංවර්ධන)

නි.සා. (ආයතනික හා නියාමන සම්බන්ධතා)
නි.සා. (වත්කම් කළමනාකරණ හා තත්ත්ව නියාමන)
නි.සා. (පාලන හා ආරක්ෂණ)
නි.සා. (සන්නිවේදන)
නි.සා. (සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු - උතුර)
නි.සා. (සම්ප්‍රේෂණ මෙහෙයුම් හා නඩත්තු - දකුණ)

නි.සා. (බලශක්ති අලෙවිකරණ)
නි.සා. (බලශක්තිය මිලදී ගැනීම්)
නි.සා. (පුද්ගලික බලශක්ති සංවර්ධන)
නි.සා. (පුනර්ජනනීය බලශක්ති සංවර්ධන හා කාර්ය සාධන අධීක්ෂණ)
නි.සා. (පද්ධති පාලන)
නි.සා. (සම්ප්‍රේෂණ සැලසුම් හා පරිසර)
නි.සා. (සම්ප්‍රේෂණ හා ජනන සැලසුම්)
අ.මු.ක. (සම්ප්‍රේෂණ)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නි.සා. (මධ්‍යම පළාත I)
නි.සා. (මධ්‍යම පළාත II)
නි.සා. (නැගෙනහිර පළාත)
නි.සා. (බස්නාහිර පළාත උතුර)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 2)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නි.සා. (දකුණු පළාත I)
නි.සා. (දකුණු පළාත II)
නි.සා. (බස්නාහිර පළාත දකුණ I)
ව්‍යා.අ. (විදුලක්පාය)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 4)

නි.සා. (වත්කම් කළමනාකරණ හා ආයතනික)
නි.සා. (සිවිල් කටයුතු හා ගොඩනැගිලි)
නි.සා. (වෘත්තීමය සෞඛ්‍යය හා ආරක්ෂාව)
නි.සා. (වැඩපල හා උපකාරක සේවා)
නි.සා. (පුහුණු කිරීම්)
අ.මු.ක. (වත්කම් කළමනාකරණ)

අ.මු.ක. (ආයතනික)
අ.මු.ක. (මූලස්ථාන)
අ.මු.ක. (භාණ්ඩාගාර කළමනාකරණ)

නි.සා. (ආයතනික කටයුතු)
නි.සා. (වත්කම් කළමනාකරණ ජල විදුලි)
නි.සා. (වත්කම් කළමනාකරණ ජල යාන්ත්‍රික)
නි.සා. (වත්කම් කළමනාකරණ තාප විදුලි)
නි.සා. (වත්කම් කළමනාකරණ තාප යාන්ත්‍රික)
නි.සා. (වේලි ආරක්ෂණ, පරිසර හා සිවිල් ව්‍යුහ නඩත්තු)
නි.සා. (බලශක්ති විකුණුම්)
නි.සා. (ජනන ආරක්ෂණ)
නි.සා. (ලක්ෂපාන සංකීර්ණය)
නි.සා. (මහවැලි සංකීර්ණය)
නි.සා. (තාපබල සංකීර්ණය)
නි.සා. (සමනල සංකීර්ණය)
බ.ක. (ලක්විජය විදුලි බලාගාරය)
නි.සා. (ජනන ව්‍යාපෘති)
අ.මු.ක. (ජනන)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නි.සා. (බෙදාහැරීම් සම්බන්ධීකරණ)
නි.සා. (කොළඹ නගර)
නි.සා. (උතුරු මැද පළාත)
නි.සා. (උතුරු පළාත)
නි.සා. (වයඹ පළාත I)
නි.සා. (වයඹ පළාත II)
ව්‍යා.අ. (කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (විදුලි සැපයුම්හි විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය I)

නි.සා. (වාණිජ හා ආයතනික)
නි.සා. (සැලසුම් හා සංවර්ධන)
නි.සා. (ව්‍යාපෘති හා අධිසැර නඩත්තු)
නි.සා. (සබරගමුව පළාත)
නි.සා. (ඌව පළාත)
නි.සා. (බස්නාහිර පළාත දකුණ II)
අ.මු.ක. (බෙදාහැරීමේ අංශය 3)

නි.සා. (ආයතනික හා ව්‍යාපෘති සම්බන්ධීකරණ)
නි.සා. (ඉංජිනේරු උපදේශන සේවා)
නි.සා. (සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති)
නි.සා. (සම්ප්‍රේෂණ ව්‍යාපෘති)
ව්‍යා.අ. (බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ හානි අවමකරණ ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (හරිත විදුලිබල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයොජන ව්‍යාපෘතිය - අදියර II)
ව්‍යා.අ. (ද්‍රව ස්වභාවික වායු)
ව්‍යා.අ. (මන්නාරම සුළං විදුලි ව්‍යාපෘතිය - අදියර I )
ව්‍යා.අ. (මන්නාරම සුළං විදුලි ව්‍යාපෘතිය - අදියර II)
ව්‍යා.අ. (මොරගොල්ල ජලවිදුලි ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන සහ කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (විදුලිබල පද්ධති විශ්වසනීයත්වය බලගැන්වීමේ ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (ත්‍රිකුණාමලය ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය)
ව්‍යා.අ. (උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය)
අ.මු.ක. (ව්‍යාපෘති)

නි.සා. (සම්බන්ධීකරණ)
නි.සා. (පිරිස්)
නි.සා. (ඉංජිනේරු විගණන)
ප්‍රධාන අභ්‍යන්තර විගණක

ප්‍රධාන නීති නිලධාරී

කළමනාකරු විමර්ශන

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

# අනු-ආයතනද සහිතව
# ලං.වි.ම. ආයතනික ව්‍යුහය - 2022



# කළමනාකරණ සමාලෝචනය



රන්දෙණිගල විදුලි බලාගාරය

# සභාපතිතුමාගේ සමාලෝචනය



"අප විසින් විදුලි ජනන හැකියාවන් ප්‍රශස්තකරණය මට්ටමින් පවත්වා ගනිමින්ද කාර්යක්‍ෂම සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පද්ධතියන් පවත්වාගනිමින්ද උසස් තාක්ෂණයන් ක්‍රියාත්මක කරමින්ද අපගේ සේවාවන්හි විශ්වාසනීයත්වය හා ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම උදෙසා ඉලක්කගතව කටයුතු කර ඇත."

හිතවත් වටිනා පාර්ශවකරුවනි,

පවත්නා සාර්ථකත්වයන්, අභියෝග හා ප්‍රාණවත් බලශක්ති පරිසරය තුළ අපගේ ඉදිරි ගමන පිළිබඳ පිළිබිඹු කරමින් ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයාගේ සමාලෝචනය සිදු කිරීමට හැකිවීම පිළිබඳ මම ඉමහත් සතුටට පත්වෙමි.

2022 වසර ලංකා විදුලිබල මණ්ඩලයට වැදගත් වසරක් විය. අප විසින් නිරතුරු විකාශනය වන කර්මාන්ත භූ දර්ශනයක් හරහා සාර්ථක ඉදිරි ගමනක නියැළෙමින් ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ හැකියාව අඛණ්ඩව පෙන්නුම් කර ඇත. විවිධ අභියෝග හමුවේ වුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කැපී පෙනෙන සන්ධිස්ථානයක් සාක්ෂාත් කරගනු ලැබ ශක්තිමක් කාර්ය සාධනයක් පවත්වාගෙන යන බව සතුටින් දන්වා සිටිමි.

මෙහෙයුම් කටයුතු ආශ්‍රිත විශිෂ්ටයන් බවට පත්වීම උදෙසා අප තුළ පවත්නා කැපවීම අපගේ සාර්ථකත්වයේ ධාවක බලය විය. අප විසින් විදුලි ජනන හැකියාවන් ප්‍රශස්තකරණය මට්ටමින් පවත්වා ගනිමින්ද කාර්යක්‍ෂම සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පද්ධතියන් පවත්වාගනිමින්ද උසස් තාක්ෂණයන් ක්‍රියාත්මක කරමින්ද අපගේ සේවාවන්හි විශ්වාසනීයත්වය හා ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම උදෙසා ඉලක්කගතව කටයුතු කර ඇත.

කෙසේ වුවද, ලං.වි.ම. ට රටේ පවත්නා ආර්ථික අර්බුදයෙන් නිදහස්ව සිටිය නොහැකි වූ අතර, විදුලිය සැපයුමේ දැඩි හිඟ යකට එරෙහිව අරගලයක නිරත වන්නට සිදුවූ වටපිටාවක එමගින් විදුලිය ජනනය කිරීමේ අපගේ හැකියාවට සැලකිය යුතු බලපෑමක් එල්ල විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, රටපුරා පනවන ලද විදුලිය ඇණ හිටුවීම් ක්‍රියාත්මක කිරීම නමැති අසීරු තීරණයට මුහුණ දීමට අපට සිදුව ඇති අතර, සමාලෝචිත වසර තුළ මෙම විදුලිය ඇණ හිටුවීම් හේතුකොට නිකුත් නොකරන ලද සමස්ත විදුලිය ප්‍රමාණය ගි.වො.පැ. 799.2 ක් විය. තාවකාලික වුවද මෙම විදුලිය ඇණ හිටුවීම් මගින් අවාසනාවන්ත ලෙස අපගේ වටිනා පාරිභෝගික හවතුන් හට අපහසුතා හා දුෂ්තරතාවයන් ඇති කරන ලද අතර, ඒ වෙනුවෙන් හෘදයාංගමව සමාව අයැදිමු.

තිරසර බව නමැති සංකල්පයෙහි දිනෙන් දින වර්ධනය වෙමින් පවත්නා වැදගත්කම වටහා ගනිමින්, වඩාත් පිරිසිදු හා වඩාත් හරිතමය බලශක්ති මූලාශ්‍රයන් කරා සංක්‍රමණය වීමේ අපගේ ප්‍රයත්නයන් තව දුරටත් තීව්‍ර කළෙමු. අපගේ කාබන් මං සලකුණු අවම කරමින් වඩාත් තිරසර අනාගතයකට දායක වෙමින් සූර්ය හා සුළං බලශක්තියද ඇතුළත් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතීන් ප්‍රවර්ධනය කොට පහසුකම් සලසා දී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් වහළය මත සවිකරන සමස්ත සූර්ය පැනල ධාරිතාවය මෙ.වො. 535 දක්වා ඉහළ නංවමින් සමාලෝචිත වසර තුළ වහළය

# සභාපතිතුමාගේ සමාලෝචනය (ඉතිරි කොටස)

මත සවිකරණ සූර්ය පැනල ධාරිතාවය 29% කින් ඉහළ නැංවීමට ලං.වි.ම.ට හැකිවිය. මෙයට අමතරව, ජාලය හා සම්බන්ධ සූර්ය ධාරිතාවයද 30% කින් වර්ධනය වූ අතර, 2022 වසර සඳහා විදුලිය ජනනයේ පුනර්ජනනීය බලශක්ති දායකත්වය 52% ක් ලෙස වාර්තා වී ඇත.

නොකඩවා අපගේ සේවාවන් ප්‍රවර්ධනය කරමින්ද, ඔවුන්ගේ දිනෙන් දින වෙනස්වන අවශ්‍යතාවනට යෝග්‍යවන පරිදි නවෝත්පාදනීය විසඳුම් ලබා දෙමින්ද, අප විසින් පාරිභෝගික තෘප්තිය ප්‍රමුඛතාගත කොට ඇත. තත් කාලීන තොරතුරු හා අඛන්ඩ සම්බන්ධතා පවත්වාගෙන යාම හරහා අපගේ පාරිභෝගිකයන් බලගැන්වීම උදෙසා අප විසින් ඩිජිටල් වේදිකාවන් හා සුහුරු තාක්ෂණයන් ක්‍රියාත්මක කොට ඇත. ලං.වි.ම. සේවා හා ක්‍රියාවලීන් ඩිජිටල්කරණය උදෙසා ගොඩනංවන ලද වේදිකාවක් රහිත විසඳුමක් වූ CEBAssist ක්‍රමය SLASSCOM විශිෂ්ටත්වය හඳුනා ගැනීමට අදාළ සම්මානයද, BCS ශ්‍රී ලංකා පාර්ශ්වයෙන් හොඳම ඩිජිටල්කරණය වූ ක්‍රියාවලි නිර්මාපක සම්මානයද වශයෙන් වසර තුළ දෙවතාවක් සම්මානයට පාත්‍ර විය.

මූල්‍යමය දෘෂ්ටි කෝණයකින් සලකා බලන කල 2022 වසර ලං.වි.ම. ට අභියෝගාත්මක වසරක් විය. උද්‍යෝගිමත් ප්‍රයත්නයන් හා ක්‍රමෝපායික ක්‍රියාමාර්ගයන් මධ්‍යයේ වුව, ආයතනයට ශුද්ධ අලාභයන් ඇතිකළ බාධාවන් ගණනාවකට මුහුණ පෑමට අපට සිදුව ඇත. ඉන්ධන, ගල් අඟුරු හා සෙසු ද්‍රව්‍යද ලෙස ගෝලීය භාණ්ඩ මිල ඉහළ යාම, විනිමය අනුපාත අවප්‍රමාණය, හා පිරිවැය පිළිබිඹු කරන්නාවූ අයක්‍රමයක් නොමැති තත්ත්වයක පොළී අනුපාත ඉහළ යාමද මගින් ශුද්ධ අලාභය මත පීඩනයක් එල්ල කර ඇත. 2022 අගෝස්තු මස සිට ක්‍රියාත්මක කරන ලද අයක්‍රම ප්‍රතිශෝධනය සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ඉහළ ගිය භාණ්ඩ මිල ආවරණය කිරීමට තරම් ප්‍රමාණවත් නොවීය. මූල්‍ය විචක්ෂණශීලිත්වය, මෙහෙයුම් විශිෂ්ටත්වය හා පාරිභෝගික තෘප්තිය සහතික කිරීමෙහි ලා වූ කැපවීම නොකඩවා පවත්වාගෙන යන්නෙමු. අපගේ ක්‍රමෝපායික මූලාරම්භයන් ක්‍රියාත්මක කිරීම හා ක්‍රමිකව වෙනස් වන්නාවූ කර්මාන්ත අවකාශයට අනුගත වීම මගින් ආයතනයේ ලාභදායකත්වය නැවත ඇති කරමින් ඒ උදෙසා තිරසර දිගු කාලීන වටිනාකමක් නිර්මාණය කිරීම සඳහා අප තුළ පවත්නා හැකියාව පිළිබඳ විශ්වාස කරමු.

අවසාන වශයෙන්, ලබාදුන් නොසැලෙන සහාය හා කැපවීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්, අපගේ පාර්ශවකරුවන්, සාමාන්‍යාධිකාරීවරයාගේ නායකත්වයෙන් ක්‍රියාත්මක සේවා නියුක්තිකයන් වෙත කෘතවේදිත්වය පළ කරමි. ශක්තිමත් පදනම, කුසලතා පූර්ණ සේවා බලකාය හා විශිෂ්ටත්වය අත්පත් කරගැනීමෙහිලා පවත්නා නොසැලෙන කැපවීමද සමගින් අභියෝග ඔස්සේ ඉදිරි ගමනක නියැළෙමින් ඉදිරියේ පවත්නා අවස්ථාවන් ග්‍රහණය කරගැනීමට ලං.වි.ම. මනාව ස්ථානගතව ඇත්තේය යන්න මාගේ විශ්වාසයයි.



**එන්.එස්. ඉලංගකෝන්**
සභාපති,
ලංකා විදුලිබල මණ්ඩලය


**චුන්නාකම් කොටුමා උපපොළ**

# සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය



**"අප පාරිභෝගික භවතුන්ගේ වෙනස්වන අවශ්‍යතාවයන් සපුරාලනු උදෙසා ජාලයේ සම්ප්‍රේෂණ යටිතල පහසුකම් පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කළෙමු. ඒ අනුව, උතුරු මැද පළාතේ, බස්නාහිර පළාතේ හා දකුණු පළාතේද නව කොටුමා උපපොළයන් ඉදිකිරීමද ඇතුළත් ප්‍රධාන ව්‍යාපෘති ගණනාවක් සාර්ථකව අවසන් කළෙමු."**

හිතවත් වටිනා පාර්ශවකරුවනි,

ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයා වශයෙන් 2022 රාජ්‍ය මූල්‍ය වර්ෂය සඳහා එම ආයතනයේ වාර්ෂික සමාලෝචනය ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. පසුගිය වර්ෂය ලෝකයේ බොහෝ විදුලිබල සමාගම් හා ශ්‍රී ලාංකිකයන් වන අප කෙරෙහිද අතිශය සිදුවීම් බහුල හා අභියෝගාත්මක වර්ෂයක් විය. කොවිඩ් සමයෙන් අනතුරුව ෆොසිල ඉන්ධන සඳහා වූ ලෝක ඉල්ලුම නැවත යථා තත්ත්වයට පත්වන්නට වූ සමයක කළාපීය ගැටුම් හේතුකොට ද්‍රව ස්වභාවික වායු සැපයුමට සිදුවූ බාධාවන් විසින් ලෝක බලශක්ති අර්බුදයක් නිර්මාණය කරන ලදී. ලෝක වෙළඳපල තුළ ගල් අඟුරු ඉල්ලුම අන් කවරදාටත් වඩා ඉහළ අගයකට පත්වන්නට විය. වසරේ බහුතර කාල සීමාවක් තුළ දශකයේ ඉහළම මට්ටම්වලින් ගල් අඟුරු හා තෙල් වෙළඳාම සිදුවන්නට විය. ප්‍රධාන කොටම හේතු සාධක දෙකක් කරණකොට අප කෙරෙහි වූ එහි බලපෑම සුවිශාල එකක් විය. ඉන් පළමුවැන්න විදුලි ජනනය උදෙසා තෙල් හා ගල් අඟුරු මත අපගේ දැඩි රඳා පැවත්මයි. දෙවැන්න නම් රටතුළ විදේශ සංචිත සිඳී ගොස් තිබූ සමයක අපට මෙම තත්ත්වයට මුහුණ පාන්නට සිදුවීමයි.

අර්බුද තත්ත්වය විසින් නැවතද විදුලිය ජනනය සඳහා ආනයනික ෆොසිල ඉන්ධන මත අපගේ පවත්නා රඳා පැවැත්ම අවම කොට පුනර්ජනනීය බලශක්ති විකල්ප මූලාශ්‍ර සොයා බැලීමේ දිගු කාලීන අවශ්‍යතාවය උද්දීපනය කරවන ලදී. මේවන විට පාරිභෝගිකයන් හට සිය කොන්ත්‍රාත්මය පාරිභෝජන ඉල්ලුම ඉක්මවූ ධාරිතාවයන් දක්වා වහළය මත සවිකරන සූර්ය පැනල ස්ථාපනය කළ හැක. වහළය මත සවිකරන සූර්ය පැනල පාරිභෝගික ගණත්වය ඉහළ ප්‍රදේශයන්හි අපගේ ජාල ප්‍රවර්ධන කාර්යයන් නොකඩවා සිදු කරන ලදී. වහළය මත සවිකරන විදුලි සම්බන්ධතා ලබාදීමේ ක්‍රියාවලිය වඩාත් සරල හා කාර්යක්ෂම තත්ත්වයට පත් කරන ලද අතර එය මාර්ගගතව සිදුකරන ලදී. එවන් ප්‍රතිපාදනයන්ගෙන් ප්‍රතිලාභ ලබාගත් අපගේ පාරිභෝගිකයන් හා ආයෝජකයන් විසින් වහළය මත සවිකරන සූර්ය බලය මෙ.වො. 150 ක්ද, බිම්ගත සූර්ය බලය මෙ.වො. 66 ක්ද වසර තුළ ජාලයට එක් කරන ලදී. එය වූකලි පාරිභෝගිකයන් සංඛ්‍යාවෙන් ගත්කල 23.3% කද, ජනන ධාරිතාවය සම්බන්ධයෙන් ගත්කල 28.8% කද ප්‍රවර්ධනයකි.

අපගේ ජාලය තුළට මෙ.වො. 35 ක පවිත්‍ර ධාරිතාවයක් එක් කරමින් වසර තුළ බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාරය මෙහෙවරෙහි යොදවන ලදී. මෙමගින් වඩාත් හරිතමය අනාගතයක් උදෙසා තිරසර බලශක්ති සංවර්ධනයක් කරා ඉදිරියට යන අපගේ ගමනෙහි වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කෙරේ. බලාගාරයෙන් වාර්ෂිකව ජනනය කෙරෙන බවට ඇස්තමේන්තු කොට ඇති ධාරිතාවය ගි.වො.පැ. 126 කි.

වසර ගණනාවක් පුරා අප විසින් රටෙහි ජල විදුලි ශක්‍යතාවය වර්ධනය කිරීමේ අවකාශය ගවේෂණය කරනු ලැබ ඇත. කාලස්රි ජලාශයේ ජල රැඳවුම් ධාරිතාවය වර්ධනය කරනු පිණිස ඒ මත ගොඩනගන ලද යති පෝරු එවන් නවෝත්පාදනීය ක්‍රමෝපාය ක්‍රියාවට නැංවීම ආශ්‍රිත එක් නිදසුනකි. එය වඩාත් ශක්තිමත්

# සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය (ඉතිරි කොටස)

කරවනු පිණිස මේවන විට අදාළ අවස්ථාවට උචිත පරිදි යති පෝරු වෙනුවට අමතර ජලය මුදා හැරීමේ කටයුතු පාලනය කළ හැකි ව්‍යුහයක් යොදා ඇත. මෙහෙයුම් කටයුතුවලට අදාළ මුල් වසර තුළම අපගේ ප්‍රයත්නයන් මල්ඵල ගැණිනි. 2022 වසරේ මාස තුන ඉක්මවූ කාල පරිච්ඡේදයක් පුරා ජනන යන්ත්‍ර ඒවාහි උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මකවන පසුබිමෙක කාසල්රී ජලාශයේ ජල මට්ටම යතිපෝරු කළාපය තුළ පැවතිණි.

2022 මූල්‍ය වර්ෂය තුළ පුනර්ජනනීය බලශක්තිය යොදා ගනිමින් අපගේ බලශක්ති ප්‍රමාණයෙන් 52.1% ක් ජනනය කොට ඇති බව සතුටින් ප්‍රකාශ කරමි.

වසර ගණනාවක් පුරා අපගේ ජාලයට සම්බන්ධිත පාරිභෝගිකයන් සංඛ්‍යාවේ අඛන්ඩ වර්ධනයක් අත්දැක ඇත. අඩු අවස්ථා සහිත සහ ග්‍රාමීය ප්‍රදේශ කරා අපගේ සේවාවන් ව්‍යාප්ත කරලීමේ අපගේ ප්‍රයත්නයන් ඵලදරා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වසර තුළ අපගේ පාරිභෝගික පදනම 1.9% කින් වර්ධනය වී ඇත.

ලං.වි.ම. හි මෙහෙයුම් විශිෂ්ටත්වය කෙරෙහි අවධානය යොමුකිරීම හා සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ අලාභයන් අවම කිරීම උදෙසා වූ කැපවීම කැපී පෙනෙන ප්‍රතිඵල අත්කර දී ඇත. පසුගිය වර්ෂ තුළදී දකුණු ආසියානු ප්‍රමිතීන් හා සාපේක්ෂව ලං.වි.ම. විසින් සැලකිය යුතු ලෙස අවම අලාභ මට්ටම් සාක්ෂාත් කරගෙන ඇති බව වාර්තා කිරීමට හැකිවීම පිළිබඳ ආඩම්බර වෙමු.

විදුලිබල පනත හා අනුගතව මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අයක්‍රම ක්‍රමවේදය තුළ විවිධ පාරිභෝගික කණ්ඩායම් අතර ගාස්තු පිරිවැය පිළිබිඹු කරන්නාවූ පදනමක් පවත්නා අතර සැපයුම් පිරිවැය මුළුමනින්ම අයකර ගැනීම අවශ්‍ය බවට පනවා ඇත. කෙසේ වුවද, බරපතල සමුච්චිත අලාභයන් ඇතිකළ පසුගිය වර්ෂ ගණනාවක් පුරා තත්ත්වය එපරිදි නොපැවතිණි.

අභියෝගාත්මක ආර්ථික තත්ත්වය යටතේ සිය පැවැත්ම තහවුරු කරගනු පිණිස ආන්තික වශයෙන් සිය පාරිභෝගික ගාස්තු සමාලෝචනය කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමට ලං.වි.ම. ට හැකියාව ලැබුණු වර්ෂයක් ලෙස 2022 වසර සැලකේ. මින් පෙර ගාස්තු සංශෝධනයක් සිදු කරන ලද්දේ 2014 වසරේදීය. පැවති තීරණාත්මක ආර්ථික තත්ත්වය යටතේ කිසියම් වූ හෝ මිල ගැලපීමක් සිදුකිරීම අපගේ පාරිභෝගිකයනට අභියෝගාත්මක කරුණක් විය හැක්කේය යන අවබෝධය අප තුළ පවත්නා අතර, අපගේ පාරිභෝගිකයන් හට මෙන්ම අපගේ මෙහෙයුම් කටයුතුවල තිරසරභාවය උදෙසාද එමගින් ඇතිකරනු ලබන ප්‍රතිලාභ කෙරෙහි අවධානය යොමු කරමින් මෙම සංවර්ධනයන් ධනාත්මක දෘෂ්ටි කෝණයකින් සලකා බැලිය යුතුව පවතී.

මෙකී පිරිවැය පීඩනයන් අතරින් ඇතැම්වා සමනය කරනු පිණිස පෙරකී ගාස්තු ඉහළ නැංවීම ක්‍රියාත්මක කරවීම මධ්‍යයේ වුව, පාරිභෝගික මිල ගණන් වර්ධනය වීමේ වේගය අපගේ මූලික ප්‍රක්ෂේපණ මට්ටම් ඉක්මවා ගිය අතර, එමගින් වඩා ඉහළ මෙහෙයුම් වියදම් හා අපගේ මූල්‍ය කාර්ය සාධනයන් මත වූ පීඩනයන්ද ඒ හරහා වසර අවසන ශුද්ධ අලාභයක්ද ඇති කෙරිණි. වසර තුළ ශ්‍රී ලංකා රුපියලේ සිදුවූ ගැඹුරු කඩා වැටීම හා ඉහළ පොළී අනුපාතිකයන් අප ක්ෂේත්‍රය කෙරෙහි අවාසිදායක බලපෑමක් එල්ල කළ අතර, ඒ හරහා අපගේ මූල්‍ය පිරිවැයෙහි සැලකිය යුතු වර්ධනයක් ඇති කරවන ලදී.

අප පාරිභෝගික භවතුන්ගේ වෙනස්වන අවශ්‍යතාවයන් සපුරාලනු උදෙසා ජාලයේ සම්ප්‍රේෂණ යටිතල පහසුකම් පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කළෙමු. ඒ අනුව, උතුරු මැද පළාතේ, බස්නාහිර පළාතේ හා දකුණු පළාතේද නව කොටුමා උපපොළයන් ඉදිකිරීමද ඇතුළත් ප්‍රධාන ව්‍යාපෘති ගණනාවක් සාර්ථකව අවසන් කළෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ග කි.මී. 19 ක්ද, කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ග කි.මී. 11 ක ප්‍රමාණයක්ද කැස්බෑව හා කළුතර වශයෙන් කි.වෝ. 132/33 කොටුමා උපපොළ දෙකක්ද, නව හබරණ, හම්බන්තොට වශයෙන් කි.වෝ. 220/132 කොටුමා උපපොළ 2 ක්ද, බියගම වශයෙන් කි.වෝ. 220/33 කොටුමා උපපොළක්ද සම්ප්‍රේෂණ පද්ධතිය තුළට එක් කරන ලදී. මෙයට අමතරව, අවසන් පරිශීලක ඉල්ලීම් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමේ අදහසින් බෙදාහැරීමේ ජාල සංවර්ධනයන්ද සිදු කරන ලදී.

වසර පුරා ආයතනය තුළ විවිධ අංශ හා මට්ටම් හරහා පුළුල් හා පරිපූර්ණ ඉලක්කගත පුහුණු වැඩසටහන් පෙළක් සංවිධානය කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සේවා නියුක්තිකයන් හට සිය කාර්ය භාරයන් ඵලදායී ලෙස ඉටු කරමින් වෙනස්වන කර්මාන්තමය ප්‍රවණතාවයනට අනුගත වීමේ හැකියාව ලබා දෙමින් වසර තුළ සේවා නියුක්තිකයන් 6000 කට පමණ පුහුණුව ලබාදෙන ලදී.

අප විසින් සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගන්නා ලද තවත් ක්ෂේත්‍රයක් වූයේ අපගේ සේවා ස්වයංක්‍රීයකරණය හා අංකිතකරණයට අදාළ ක්ෂේත්‍රයයි. CEBAssist යෙදවුම් කට්ටලය වඩ වඩාත් ක්‍රියාකාරකම් හා මෙහෙයුම් අංග ඇතුළත් කෙරෙමින් පුළුල් වෙමින් හා දියුණු වෙමින් පවත්නා අතර එමගින් අපගේ පාරිභෝගිකයන් හට වඩ වඩාත් මාර්ගගත සේවාවන් සම්පාදනය කෙරෙමින් පවතී. නව විදුලි සම්බන්ධතා සහ වහළය මත සවිකරන සූර්ය සම්බන්ධතා සඳහා අයැදුම්පත් මේවන විට මාර්ගගතව ඉදිරිපත් කළ හැකි අතර එම ක්‍රමයෙන්ම ඒවාහි ප්‍රගති මට්ටම්ද නිරීක්ෂණය කළ හැක. නිෂ්පාදනයන් සංවර්ධනය කරලීමෙහි අප විසින් දරණ ලද ප්‍රයත්නයන් පිළිගැනීමක් වශයෙන් ඉහළ ගුණාත්මකභාවය හා පාරිභෝගිකයන් වෙත එමගින් ඇතිකරන ලද බලපෑමද හදුනා ගනිමින් තොරතුරු තාක්ෂණ කර්මාන්තය විසින් වසර තුළ තවත් සම්මාන ගණනාවක් අප වෙත පිරිනමන ලදී.

සංචාරයනට බලපෑ ඉන්ධන අර්බුදය, ගෝලීය වසංගත තත්ත්වය හා අපගේ පිරිවැය කපා හරිනු පිණිස වසර තුළ ඇතැම් සේවා නියුක්තික ප්‍රතිලාභ විෂයයෙහි සිදුකරන ලද සීමාකරණයන් වැනි බොහෝ දුෂ්කරතා මධ්‍යයේ වුව ආයතනයේ සාර්ථකත්වය වෙනුවෙන් ඉමහත් දායකත්වයක් ලබාදුන් ලං.වි.ම. සේවා නියුක්තිකයන් සියලු දෙනාගේ එම දායකත්වයද ඇගයීමට කැමැත්තෙමි. රටේ වඩාත්ම දුෂ්කර මූල්‍ය තත්ත්වයක් යටතේ පවා මා වෙත සිය සහාය ලබාදුන් සියලු සේවා නියුක්තිකයන් වෙත ස්තුතිය පළ කරමි.

මෙය වූකලි සාර්ථකත්වයන්, අභියෝග හා වර්ධනයන්ගෙන්ද පිරි වසරක් වූ අතර, අප විසින් එක්ව සාක්ෂාත් කරගන්නා ලද තත්ත්වයන් පිළිබඳ ආඩම්බර වෙමි. මෙම අභියෝගාත්මක වසර තුළ අප වෙත අවශ්‍ය මාර්ගෝපදේශකත්වය හා උපදේශයන්ද ලබාදීම සම්බන්ධයෙන් සභාපතිතුමා හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම වෙතද හෘදයාංගම කෘතවේදිත්වය පළ කරමි.

පුනර්ජනනීය බලශක්තිය උපයෝගී කරගැනීම කෙරෙහි වූ අපගේ නැඹුරුව වඩාත් වේගවත් වීම මෙම අදුරු වර්ෂයේ පෑයූ රිදී රේඛාව ලෙස සටහන් කළ හැක. පසුගිය වසර තුළ වඩ වඩාත් වර්ධනය වූ මහජන ඇල්ම හා අප විසින් ක්‍රියාත්මක කරවන ලද සැලසුම්ද හේතුකොට, නුදුරු අනාගතයේදීම අපගේ සිහිනය යථාර්ථයක් බවට පත්වනු ඇත.



**ඉංජිනේරු (ආචාර්ය) ඩී. සී. ආර්. අබේසේකර**
සාමාන්‍යාධිකාරී

# ශ්‍රී ලංකාවේ සම්ප්‍රේෂණ පද්ධතිය පිළිබඳ සිතියම 2022



මෙහෙයුම් සමාලෝචනය

# ජනන අංශය



ලක්විජය බලාගාරය

# ජනන අංශය

ජනන අංශය විසින් ලංකා විදුලිබල මණ්ඩලය සතු සියලු විදුලි බලාගාර ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම සිදුකරනු ලබයි. මෙ.වො. 1,378.4 ක ස්ථාපිත ධාරිතාවයක් සහිත ජල විදුලි බලාගාර දහහතක්ද, මෙ.වො. 654 ක ස්ථාපිත ධාරිතාවයක් සහිත තෙල් බලයෙන් ක්‍රියාත්මක තාප බලාගාර හතක්ද, මෙ.වො. 900 ක ස්ථාපිත ධාරිතාවයක් සහිත එක් ගල් අඟුරු බලගත විදුලි බලාගාරයක්ද, මෙ.වො. 103.5 ක ස්ථාපිත ධාරිතාවයක් සහිත සුළං බලාගාර එකක්ද අංශය සතුවේ. ලං.වි.ම. විසින් යාපනය අර්ධද්වීපය වටා පිහිටි දූපත්වල ඩීසල් විදුලි බලාගාර කිහිපයක්ද ක්‍රියාත්මක කරනු ලබයි. 2022 වසර අවසානය වනවිට ලං.වි.ම. සතු විදුලි බලාගාරයන්හි සමස්ත ස්ථාපිත ධාරිතාවය මෙ.වො. 3,036 ක් විය.

## විදුලි බලාගාරයන්හි කාර්ය සාධනය

මහවැලි ජලයෙන් ක්‍රියාත්මක සියලු විදුලි බලාගාරයන්ගෙන් හා මන්නාරම සුළං විදුලි බලාගාරයෙන් (මහවැලි සංකීර්ණය) සිදුවූ විදුලිය ජනනය විෂයයෙහි 2022 වසර සතුටුදායක වසරක් විය. මහවැලි සංකීර්ණයේ විදුලි බලාගාරයන් තුළින් 2022 වසර තුළ ගි.වො.පැ. 2,797.7 ක් ජනනය කරනු ලැබ ඇති අතර 2022 වසර සඳහා වූ සිය සැලසුම්ගත විදුලිය ජනනයෙන් 98% කට ඉහළ ප්‍රමාණයක් ජනනය කිරීමට සංකීර්ණයට හැකිවිය.

2022 වසර තුළ කැළණි ගංගා ජලයෙන් ක්‍රියාත්මක විදුලි බලාගාර (ලක්ෂපාන සංකීර්ණය) කාණ්ඩයේ සමස්ත වාර්ෂික ජනනය ගි.වො.පැ. 1,737.6 ක් ලෙස වාර්තා වූ අතර, වලවේ, කලු හා ගල් ඔය ගංගාවන්ගේ ජලයෙන් ක්‍රියාත්මක සමනල සංකීර්ණයෙන් උත්පාදිත සමස්ත වාර්ෂික ජනනය සමාලෝචිත වසර තුළ ගි.වො.පැ. 730.5 ක් ලෙස වාර්තා විය. 2022 වසර තුළ සමනල සංකීර්ණයට එහි සැලසුම්කළ ජනනයෙන් 97% ඉක්මවූ ප්‍රමාණයක් ජනනය කිරීමට හැකිවිය.

2022 වසර තුළ තාප සංකීර්ණයේ සමස්ත ජනනය ගි.වො.පැ. 1,339.4 ක් වූ අතර ලක්විජය විදුලි බලාගාරයේ සමස්ත ජනනය ගි.වො.පැ. 5,173.8 ක් ලෙස වාර්තා විය.

2022 වසර තුළ ලං.වි.ම. ජනන මුහුව G1 රූපය තුළ දක්වා ඇති අතර 2022 වසරට අදාළව එක් එක් විදුලි බලාගාරය විසින් දක්වන ලද විදුලි ජනන දායකත්වය හා ආශ්‍රිත සෙසු සාධකයන්ද G1 සිට G3 දක්වා වූ වගු තුළ දක්වා ඇත.




*රූපය G1: ලං.වි.ම. ජනන මුහුව - 2022*

සටහන: 2022-12-31 වන විට බ්‍රෝඩ්ලන්ඩ්ස් විදුලි බලාගාරය වාණිජ කටයුතුවල නිරත නොවන බැවින් ඉන් ජනිත ජල විදුලිය නොසලකා හරින ලදී.

*වගුව G1: ලං.වි.ම. සතු ජල විදුලි හා සුළං විදුලි බලාගාරයන්හි දායකත්වය*

| විදුලි බලාගාරය | ස්ථාපිත ධාරිතාවය (මෙ.වො.) | ජනනය (ගි.වො.පැ.) | උපයෝජ්‍යතා සාධකය (%) | බලාගාර සාධකය (%) |
|---|---|---|---|---|
| **මහවැලි සංකීර්ණය** | **920.3** | **3144.9** | | |
| වික්ටෝරියා | 210 | 907.5 | 100.0 | 49.4 |
| කොත්මලේ | 201 | 526.5 | 99.9 | 30.0 |
| ඉහළ කොත්මලේ | 150 | 505.3 | 100.0 | 38.6 |
| රන්දෙණිගල | 122.6 | 419.8 | 99.8 | 39.4 |
| රන්ටැඹේ | 50 | 197.2 | 99.8 | 46.4 |
| උකුවෙල | 40 | 169.9 | 91.7 | 48.6 |
| බෝවතැන්න | 40 | 59.2 | 99.8 | 17.0 |
| නිල්ලඹේ | 3.2 | 12.3 | 99.3 | 42.4 |
| තම්බපවනි | 103.5 | 347.2 | 89.6 | 39.9 |
| **ලක්ෂපාන සංකීර්ණය** | **353.8** | **1,737.6** | | |
| ලක්ෂපාන | 153.8 | 938.9 | 95.0 | 69.8 |
| පොල්පිටිය | 90 | 513.3 | 97.4 | 65.2 |
| කැනියන් | 60 | 147.4 | 75.0 | 28.1 |
| විමලසුරේන්ද්‍ර | 50 | 138.0 | 86.0 | 31.6 |

# ජනන අංශය (ඉතිරි කොටස)

*වගුව G1: ලං.වි.ම. සතු ජල විදුලි හා සුළං විදුලි බලාගාරයන්හි දායකත්වය*

| විදුලි බලාගාරය | ස්ථාපිත ධාරිතාවය (මෙ.වො.) | ජනනය (ගි.වො.පැ.) | උපයෝජ්‍යතා සාධකය (%) | බලාගාර සාධකය (%) |
|---|---|---|---|---|
| **සමනල සංකීර්ණය** | **207.8** | **730.5** | | |
| සමනලවැව | 120 | 325.1 | 97.8 | 31.2 |
| කුකුලේගඟ | 75 | 372.1 | 94.2 | 60.9 |
| උඩවලව | 4 | 15.9 | 90.9 | 46.8 |
| ඉඟිනියාගල | 8.8 | 17.4 | 71.3 | 17.8 |
| **එකතුව** | **1,481.9** | **5,613.0** | | |

සටහන: තම්බපවනි හැර අන් සියල්ල ජලවිදුලි බලාගාර වේ.

*වගුව G2: ලං.වි.ම. සතු තාප-තෙල් බලාගාර දායකත්වය*

| විදුලි බලාගාරය | | ස්ථාපිත ධාරිතාවය (මෙ.වො.) | ජනනය (ගි.වො.පැ.) | උපයෝජ්‍යතා සාධකය (%) | බලාගාර සාධකය (%) |
|---|---|---|---|---|---|
| සපුගස්කන්ද | බලාගාරය A | 80 | 168.3 | 82.1 | 28.5 |
| | බලාගාරය B | 80 | 295.2 | 96.0 | 48.7 |
| කැළණිතිස්ස සංයුක්ත චක්‍රීය විදුලි බලාගාරය | වායු තලබමන (GT) | 110 | 421.9 | 77.4 | 32.1 |
| | වාෂ්ප තලබමන (ST) | 55 | | 74.7 | 26.1 |
| කැළණිතිස්ස වායු තලබමන - 07 | | 115 | 77.0 | 94.0 | 8.0 |
| කැළණිතිස්ස Frame V වායු තලබමන | | 80 | 10.3 | 37.1 | 2.0 |
| ඩීසල් විදුලි බලාගාර (මෙ.වො. 50 x 1) | | 50 | 44.1 | 75.0 | 93.0 |
| උතුරු ජනනි | | 24 | 82.6 | 80.8 | 41.2 |
| යාත්‍රාවක නැංවූ බලාගාරය | | 60 | 237.4 | 96.8 | 45.2 |
| විදුලි ජනක යන්ත්‍ර (යාපනය කුඩා දූපත්වල) | | | 2.6 | | |
| **එකතුව** | | **654** | **1,339.4** | | |

*වගුව G3: ලං.වි.ම. සතු ගල් අඟුරු බලාගාර දායකත්වය*

| ලක්විජය විදුලි බලාගාරය | ස්ථාපිත ධාරිතාවය (මෙ.වො.) | දළ ජනනය (ගි.වො.පැ.) | ශුද්ධ ජනනය (ගි.වො.පැ.) | උපයෝජ්‍යතා සාධකය (%) | බලාගාර සාධකය (%) |
|---|---|---|---|---|---|
| ඒකකය 01 | 300 | 2,252.2 | 2,033.0 | 90.5 | 85.7 |
| ඒකකය 02 | 300 | 1,441.2 | 1,295.4 | 99.8 | 54.8 |
| ඒකකය 03 | 300 | 2,036.4 | 1,845.3 | 82.4 | 77.5 |

# ජනන අංශය (ඉතිරි කොටස)

## උද්දීපනයන්

### කොත්මලේ විදුලි බලාගාරයේ අංක 01 දරන කි.වෝ.ඇ. 800 වියළි වර්ගයේ සහාය තරාපැවිය මාරු කිරීම

කොත්මලේ විදුලි බලාගාරයේ වියළි වර්ගයේ සහාය තරාපැවි අංක 01 වසර 40 ක් පැරණි එකක් වූ අතර, කොත්මලේ විදුලි බලාගාරයේ විශ්වසනීයත්වය නංවාලනු පිණිස 2022 මැයි මාසයේදී ඉතාලියේ ELKIMA ආයතනය විසින් නිෂ්පාදිත නව තරාපැවියක් ඒ වෙනුවට යොදන ලදී.

### කොත්මලේ විදුලි බලාගාරයේ ඒකකය 01 හි විද්‍යුත් පාලකය වෙනුවට නව අංකිත පාලකයක් යෙදීම.

පාලක ඒකකයේ විශ්වසනීයත්වය හා මෙහෙයුම් නම්‍යශීලිත්වය නංවාලනු පිණිස අමතර කොටස් හා උපාංග කල් ඉකුත්වීම හේතුකොට ඒකකය 01 හි පවත්නා විද්‍යුත් වර්ගයේ පාලකය වෙනුවට නව අංකිත පාලකයක් යොදන ලදී. ඔස්ට්‍රියාවේ Andritz ආයතනයේ තාක්ෂණික කණ්ඩායමක් හා ලං.වි.ම. කාර්ය මණ්ඩලය විසින් සති 03 ක් ඇතුළත නව පාලකය ස්ථාපිත කොට, පරීක්ෂා කොට මෙහෙවරෙහි යොදවන ලදී. පාලක පද්ධතිය 2022-06-07 දින පූර්ණ වශයෙන් මෙහෙවරෙහි යොදවන ලදී.

### උකුවෙල විදුලි බලාගාරයේ වෝ. 220 ද්විත්ව පරිපථ බැටරි පද්ධතිය මාරු කිරීම

ගෙවීයාම හේතුකොට දශක ගණනාවක් සේවයෙහි යොදවන ලද බැටරි පද්ධතිය භෞතිකව හානියට පත්ව තිබූ අතර නිරන්තර දෝෂ වාර්තා වන්නට විය. එබැවින්, විදුලිය ඇණ හිටවුම් කාල සීමාවන් තුළ විශ්වසනීය සහාය විදුලි සැපයුමක් සම්පාදනය කෙරෙන බවට වගබලාගනු පිණිස සහ ජනන ඒකක ආරම්භ කිරීමේදී විශ්වසනීය විදුලිය සැපයුමක් ලබාදීම උදෙසා සහතිකවනු පිණිසද උකුවෙල විදුලි බලාගාර කාර්ය මණ්ඩලය විසින් නව බැටරි පද්ධතියක් ස්ථාපනය කරන ලදී.

### උකුවෙල විදුලි බලාගාරයේ ඒකකය 02 හි ටර්බයිනය හා ශීර්ෂාවරණය මාරු කිරීම

උකුවෙල විදුලි බලාගාරයේ ඒකකය 02 වසර 06 ක කාලයක් පුරා සිදුවූ වැලි සේදීයාම හේතුකොට ශීර්ෂාවරණයෙන් ජල කාන්දු නිරීක්ෂණය වීම නිසා එම ඒකකය ක්‍රියාත්මක නොවන තත්වයක පැවතුනි. මුල් උපකරණ නිෂ්පාදනායතනයෙන් (OEM) විදේශීය අධීක්ෂණ සේවා ලබාගැනීමකින් තොරව ලං.වි.ම. කාර්ය මණ්ඩලය විසින් අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසානය වනවිට ටර්බයිනය හා ශීර්ෂාවරණය ආශ්‍රිත අලුත්වැඩියා කටයුතු හා මාරු කිරීමේ කටයුතු සාර්ථකව සිදු කරමින් පවතී.



රූපය G2: උකුවෙල විදුලි බලාගාරයේ බැටරි පද්ධතිය මාරු කිරීම

### කාසල්රී ජලාශයේ ගබඩා ධාරිතාවය නංවාලීම

ප්‍රවේශ ද්වාර සැකසුම් ආශ්‍රිතව පවත්නා සීමා සහිතකම් හේතුකොට යටිධාරාගත ප්‍රදේශය තුළ හදිසි ගංවතුර තත්ත්වයන් ඇතිවීමේ අවදානම වළකාලනු පිණිස කාසල්රී වේල්ල අඩු ජල මට්ටම් සහිතව පවත්වාගෙන යාමට සිදුවිය. මෙයට විසඳුමක් ලෙස, ජලාශ මට්ටම අවදානම් සහගත ඉහළ මට්ටමකට නැඟීමේ හැකියාවන් වළකාලනු පිණිස ප්‍රවේශ ද්වාරය පහත් කිරීමේ පහසුකම සහිතව ස්වභාවික පිටාර මඟකට සමානව පිටාර ජලයට ගලායා හැකි, ස්වයං නියාමනීය ජල පාලක වේලි ප්‍රවේශ ද්වාරයන් ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය විසින් යෝජනා කරන ලදී. ඒ අනුව, 2022 වසර තුළ ගි.වො.පැ. 5.6 කින් ජලාශයේ ඵලදායී ධාරිතාවය නංවාලමින් වායුමය වශයෙන් ක්‍රියාත්මකවන ස්වයං නියාමන ජල පාලක මුදුන් ප්‍රවේශ ද්වාර ක්‍රමයක් ගොඩනගා සාර්ථක ලෙස මෙහෙවරෙහි යොදවන ලදී.

### තම්බපවණි සුළං විදුලි බලාගාරයේ තල අකුණු ආරක්ෂණ පද්ධතිය යාවත්කාලීන කිරීම

අකුණු පහර හේතුකොට තම්බපවණි සුළං විදුලි බලාගාරයේ ටර්බයින් තල පහකට හානි සිදුවූ අතර ඒවා මාරු කිරීමට සිදුවිය. තවද, මුල් උපකරණ නිෂ්පාදනායතනය වන Vestas ආයතනය විසින් ලං.වි.ම. සමග එක්ව පවත්නා පාරිසරික තත්ත්වයනට මුහුණ දෙනු පිණිස මුළින් ස්ථාපනය කරන ලද අකුණු ආරක්ෂණ පද්ධතිය උත්ශ්‍රේණිගත කරන ලදී.



රූපය G3: තම්බපවණි සුළං විදුලි බලාගාරයේ තල මාරු කිරීම

# ජනන අංශය (ඉතිරි කොටස)

### කැනියන් බලාගාරයේ උමං පරීක්ෂාව හා අලුත්වැඩියා කටයුතු



*රූපය G4: කැනියන් උමග පරීක්ෂාව*

කැනියන් ජලාශයේ ජල වර්ණයේ වෙනසක් නිරීක්ෂණය වීමෙන් අනතුරුව කැනියන් විදුලි බලාගාරය අඩු ධාරිතාවයකින් ක්‍රියාත්මක කිරීමට සිදුවූ අතර එයට හේතු සොයාගනු පිණිස උමං පරීක්ෂාවක් කිරීමට සිදුවිය. ඒ අනුව, වසර 27 ක් ක්‍රියාත්මක වීමෙන් අනතුරුව 2022 ජනවාරි මාසයේදී කැනියන් උමං පරීක්ෂාවක් ආරම්භ කරන ලදී.

ලං.වි.ම. විශේෂඥයන් හා කුලී පදනමින් සේවය ලබාගත් උපදේශකවරුන්ගෙන්ද සමන්විත කණ්ඩායමක් විසින් පරීක්ෂාව සිදුකරන ලදී. මෙම උමං කටයුතුවලට අදාළව විදුලිය ඇණ හිටුවා තිබූ කාල සීමාව තුළ, උමං මාර්ගයේ නිසි භෞතික තත්ත්වය සහතික කරනු පිණිස කොන්ක්‍රීට් හානි අලුත්වැඩියාවන්, සියලු වානේ අයිතම පින්තාරු කිරීම, මඩ ඉවත් කිරීම, ඒකක අංක 02 හි කොටුදොර මාර්ගය පිරිසිදු කොට පින්තාරු කිරීම හා ආරක්ෂක වෑල්වය සහ මාරුකරණ වෑල්ව මුද්‍රාව සේවාකරණයද සිදුකරන ලදී. ලං.වි.ම. පොදුකාර්ය වියදම් හැර මෙම අලුත්වැඩියා කටයුත්තේ සමස්ත පිරිවැය රු. මිලියන 48.1 ක් විය. මෙම කටයුත්ත 2022-03-30 දින සාර්ථකව සම්පූර්ණ කරන ලදී.

### ලක්විජය විදුලි බලාගාරයේ ඒකකය 02 හි "A මට්ටමට" අදාළ අලුත්වැඩියාව

"A මට්ටමේ" අලුත්වැඩියාවක් යනු බලාගාරය ක්‍රියාත්මක කොට වසර හයක් ගතවීමෙන් අනතුරුව සිදු කෙරෙන මහා පරිමාණ අලුත්වැඩියාවක් වන අතර ඒ සඳහා 300 ඉක්මවූ අත්දැකීම් සහිත කාර්ය මණ්ඩලයක් අවශ්‍ය වේ. ලං.වි.ම. කාර්ය මණ්ඩලය, දේශීය කාර්මික කාර්ය මණ්ඩලය හා මුල් උපකරණ නිෂ්පාදනායතනයන්ද ඇතුළත්ව විදේශීය විශේෂඥයන්ගේද සහභාගිත්වය සහිතව දින 75 කින් එම කාර්ය භාරය නිම කිරීමට සැලසුම් කොට තිබිණි. අලුත්වැඩියා කටයුත්ත 2022-06-18 දින සිදුකරන ලද අතර, චීන කාර්ය මණ්ඩලය තුළ කොවිඩ් 19 වෛරසය පැතිරී යාමේ තත්ත්වය මධ්‍යයේ වුවද අළුත්වැඩියාව සැලසුම් කල පරිදිම සාර්ථකව අවසන් කෙරිණි. එම අලුත්වැඩියා කටයුත්තේ පිරිවැය රු. බිලියන 5.5 ක් විය.



*රූපය G5: ජනන යන්ත්‍ර රොටරය උකහා ගැනීම*

### සපුගස්කන්ද විදුලි බලාගාරයේ B කොටසේ උපරිම ධාරිතාවය ප්‍රති-ස්ථාපනය

සපුගස්කන්ද බලාගාරයේ B කොටසේ උපරිම ධාරිතාවය එහි රේඩියේටර් පද්ධතීන් අයහපත් තත්ත්වයට හේතුකොට සීමාකරණයකට ලක්වූ බැවින් වඩාත් උණුසුම් කාලගුණික තත්ත්වයන් අතරතුර පවා ක්‍රියාත්මක කල හැකි උපරිම ධාරිතාව ප්‍රතිස්ථාපනය පිණිස රේඩියේටර් පද්ධතිය මාරු කරන ලදී. රු. මිලියන 580 ක සමස්ත පිරිවැයක් දරමින් එම මාරු කිරීමේ කටයුත්ත සාර්ථකව අවසන් කරන ලදී.

### ලක්විජය විදුලි බලාගාරයේ ගල් අඟුරු අංගනයේ සැකසුම් ධාරිතාව වර්ධනය

ලක්විජය ගල් අඟුරු බලාගාරය ක්‍රියාත්මක කිරීමේදී ලබාගත් අත්දැකීම්ද සමගින්, පවත්නා ගල් අඟුරු තොගය ඉහළ නැංවිය හැක්කේ නම් බලාගාරයේ විශ්වසනීයත්වය තවදුරටත් වැඩිදියුණු කළ හැකි බවට හඳුනා ගන්නා ලදී. එබැවින්, දුර්වල කාලගුණයේ අයහපත් ප්‍රතිවිපාක, ගල් අඟුරු ප්‍රසම්පාදන කටයුතුවලදී සිදුවන ප්‍රමාදයන් සහ ගල් අඟුරු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ පද්ධතියේ ගැටලුද වළකාලනු පිණිස, දැනට පවත්නා ගල් අඟුරු පර්යන්තයේ ගල් අඟුරු ගබඩා අවකාශය හා ගල් අඟුරු පිරිසැකසුම් ධාරිතාවය මෙ.ටො. මිලියන 1.21 දක්වා වර්ධනය කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර, බැර නඩත්තු ගොඩනැගිලි, නවාතැන් ගොඩනැගිලි ඉදිකිරීම සහ ගල් අඟුරු පර්යන්තය පුළුල් කිරීමේ කාර්යය විසින් 2022 වසර අවසානය වනවිට පිළිවෙලින් 42%, 64.8% හා 70.1% ක ප්‍රගතියක් වාර්තා කරන ලදී.

### කැළණිතිස්ස විදුලි බලාගාරයේ ධාරිතා ප්‍රවර්ධනය

දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම 2015-2034 තුළ මුළුමනින්ම විදුලිය ඇණහිටි අවස්ථාවකදී කොළඹ විදුලිය තත්ත්වය කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය පහසුකම් සලසනු සඳහාත් පහත සඳහන් අමතර ප්‍රතිලාභ සඳහාත් මෙ.වො. 3x35 වායු ටර්බයින ස්ථාපනය කිරීමට යෝජනා විය.

- කාර්ය බහුල කාල වේලාවන් තුළ පවත්නා ජල විදුලිය ප්‍රමාණය මත රඳා පැවැත්ම අවම කිරීම.
- අවශ්‍ය අවස්ථාවන්හි පද්ධතියේ මූලික/ද්විතීයික සංඛ්‍යාත පාලන ජනකය වශයෙන් ක්‍රියාත්මක වීම.
- ලං.වි.ම. සතුව දැනට පවත්නා ඩීසල් ජනන යන්ත්‍රයන්හි අඩු කාර්යක්ෂමතා තත්ත්වය මාරු කිරීම.

ඒ අනුව, සැපයුම්කරුවන්ගේ ණය අරමුදල්කරණ වැඩ පිළිවෙලයන් යටතේ මෙම ව්‍යාපෘතිය සකස් කරන ලදී. කොන්ත්‍රාත් පිරිනැමීම 2023 ජුලි මාසයේදී සිදු කිරීමට අපේක්ෂිත අතර ව්‍යාපෘතිය 2024 ඔක්තෝබර් මාසයේදී කටයුතු සම්පූර්ණ කිරීමට සැලසුම් කොට ඇත.

# ජනන අංශය (ඉතිරි කොටස)

## ජනන පිරිවැය

2022 වසර සඳහා ජනන පිරිවැය වගුව G4 තුළ දක්වා ඇත.

*වගුව G4: ජනන පිරිවැය*

| සංකීර්ණය | බලාගාරය | සැබෑ ශුද්ධ ජනනය (ගි.වො.පැ.) | සැබෑ ශුද්ධ වියදම (රු. මිලියන) | සාමාන්‍ය ඒකක පිරිවැය (රු./ කි.වො.පැ.) |
|---|---|---|---|---|
| **තාප** | කැළණිතිස්ස වි.බ. - ගෑස් ටර්බයිනය | 87.3 | 5,129.2 | 58.75 |
| | කැළණිතිස්ස වි.බ. - සංයුක්ත චක්‍රීය | 421.9 | 16,787.1 | 39.79 |
| | සපුගස්කන්ද | 463.5 | 30,887.8 | 66.64 |
| | විදුලි ජනක යන්ත්‍ර (යාපනය කුඩා දූපත්වල) | 2.6 | 363.0 | 139.62 |
| | උතුරු ජනනි | 82.6 | 5,495.8 | 66.54 |
| | යාත්‍රාවක නැංවූ වි.බ. | 237.4 | 14,925.6 | 62.87 |
| | ඩීසල් විදුලි බලාගාර (මෙ.වො. 50x1) | 44.1 | 2,565.5 | 58.17 |
| | **සමස්ත තාප - ඉන්ධන** | **1,339.4** | **76,153.9** | **56.86** |
| **ගල් අඟුරු** | **ගල් අඟුරු** | **5,173.8** | **138,731.8** | **26.81** |
| **සමස්ත තාප** | | **6,513.2** | **214,885.7** | **32.99** |
| **මහවැලි** | වික්ටෝරියා | 907.5 | 647.1 | 0.71 |
| | කොත්මලේ | 526.5 | 1,135.0 | 2.16 |
| | උකුවෙල | 169.9 | 353.0 | 2.08 |
| | බෝවතැන්න | 59.2 | 209.6 | 3.54 |
| | රන්දෙණිගල/රන්ටැඹේ | 617.0 | 1,004.7 | 1.63 |
| | නිල්ලඹේ | 12.3 | 103.8 | 8.44 |
| | ඉහළ කොත්මලේ | 505.3 | 1,459.1 | 2.89 |
| | තම්බපවණි | 347.2 | 1,746.0 | 5.03 |
| | **මහවැලි එකතුව** | **3,144.9** | **6,658.3** | **2.12** |
| **ලක්ෂපාන** | පැරණි හා නව ලක්ෂපාන | 938.9 | 1,317.2 | 1.40 |
| | පොල්පිටිය | 513.3 | 867.3 | 1.69 |
| | විමලසුරේන්ද්‍ර | 138.0 | 500.2 | 3.62 |
| | කැනියන් | 147.4 | 619.0 | 4.20 |
| | **ලක්ෂපාන එකතුව** | **1,737.6** | **3,303.7** | **1.90** |
| **සමනල** | සමනලවැව | 325.1 | 1,378.4 | 4.24 |
| | කුකුලේ | 372.1 | 519.5 | 1.40 |
| | ඉඟිනියාගල | 17.4 | 144.1 | 8.28 |
| | උඩවලවේ | 15.9 | 179.1 | 11.26 |
| | **සමනල එකතුව** | **730.5** | **2,221.1** | **3.04** |
| **ජල/සුළං එකතුව** | | **5,613** | **12,183.1** | **2.17** |
| **සමස්ත ලං.වි.ම. (ජනන ලක්ෂයයේදී)** | | **12,126.2** | **227,068.8** | **18.73** |

*මූලාශ්‍රය: බලශක්ති අලෙවි ශාඛාව*

සටහන්:

1. තෙල් / ගල් අඟුරු ගෙවීම් ප්‍රමාද පොළී ගාස්තු, කෙටි/දිගු කාලීන පොළී ගාස්තු වැනි මූල්‍ය පිරිවැය සංඝටක වියදම් ගණනයේදී ඉවත්කොට ඇත.
2. සමාලෝචිත වර්ෂය තුල බ්‍රෝඩ්ලන්ඩ්ස් විදුලි බලාගාරය වාණිජ මෙහෙයුම් කටයුතුවල නිරත නොවූ බැවින් ඉන් ජනිත විදුලිය සැලකිල්ලට ගෙන නොමැත.
3. බලශක්ති ගාස්තු තුළට ඉන්ධන හා ඉන්ධන නොවන දෙවර්ගයේම ගාස්තු ඇතුළත් වේ.
4. බලශක්ති පිරිවැය ගණනයේදී සහාය බලශක්ති පිරිවැය සැලකිල්ලට ගන්නා ලදී.

## මෙහෙයුම් සමාලෝචනය

# සම්ප්‍රේෂණ අංශය



මන්නාරම නාඩුකුඩා කොටුමා උපපොළ

# සම්ප්‍රේෂණ අංශය

සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ගොඩනැගීම, නඩත්තුව හා මෙහෙයුම්කරණය මෙන්ම සම්ප්‍රේෂණ ජාලය පුරා විදුලි ධාරා ගලනය කළමනාකරණය කරමින් පද්ධතිය විශ්වසනීය හා ආරක්ෂිත තත්ත්වයෙන් පවත්නා බවට වගබලා ගැනීමේ ව්‍යවස්ථාපිත වගකීම ලංකා විදුලිබල මණ්ඩලය සතුවේ. මෙයට අමතරව, රටේ පුරෝකථනීය විදුලිය ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් ජනනයක් පවත්වාගෙන යාමද ලං.වි.ම. හි වගකීමක් වේ.

ලං.වි.ම. වෙත පවරා ඇති උක්ත ව්‍යවස්ථාපිත වගකීම් නිසි පරිදි ඉටු කරනු ලබන බවට වගබලාගනු පිණිස සම්ප්‍රේෂණ අංශය වෙත පහත සඳහන් මෙහෙයුම් අරමුණු පවරා ඇත:

- කාර්යක්ෂම, සමායෝජිත, විශ්වසනීය හා පිරිමැසුම්දායී සම්ප්‍රේෂණ පද්ධතියක් ගොඩනඟා පවත්වාගෙන යාම.
- පාරිභෝගිකයන් වෙත සුරක්ෂිත, විශ්වසනීය හා පිරිමැසුම්දායී විදුලිය සැපයුමක් ලබාදෙන බවට සහතික වනු පිණිස බෙදාහැරීමේ බලපත්‍රලාභීන් වෙත තොග වශයෙන් විදුලිය ලබාගනිමින් අලෙවි කිරීම.
- පුරෝකථනීය විදුලිය ඉල්ලුම සපුරාලනු පිණිස ප්‍රමාණවත් ජනන ධාරිතාවයක් පවත්නා බවට වගබලා ගැනීම.
- පද්ධතිමය සම්ප්‍රේෂණ වෝල්ටීයතා විචලනයන් කි.වෝ. 132 හා කි.වෝ. 220 සඳහා ± 10% වශයෙන්ද, හර්ට්ස් 50 සංඛ්‍යාතය ±1% තුළද පවත්වා ගැනීමට වගබලා ගැනීම.

අංශය වෙත පවරා ඇති අරමුණු වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස සාක්ෂාත් කරගනු පිණිස 2022 වසරේදී මණ්ඩලය විසින් සම්ප්‍රේෂණ අංශය සම්ප්‍රේෂණ රැහැන් රහිත මෙහෙයුම් අංශය හා සම්ප්‍රේෂණ රැහැන් සහිත මෙහෙයුම් අංශය වශයෙන් අංශ දෙකකට බෙදීමට තීරණය කරන ලදී.

## සම්ප්‍රේෂණ අංශයේ කාර්ය සාධනය

2022 වසර සඳහා වාර්තාගත විදුලිය ඉල්ලුම ගි.වො.පැ. 15,942.2 ක් වූ අතර, ජනන හිඟතාවයන් හේතුකොට 2022 වසර තුළ සැලසුම්ගත විදුලිය ඇණ හිටුවීම් හරහා සිදුකරන ලද ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණයෙහි ප්‍රතිඵලයක් ලෙස විදුලි ඉල්ලුම් පසුගිය වසර හා සාපේක්ෂව 4.6% ක පහත වැටීමක් වාර්තා කරන ලදී.

2022 වසර තුළ ලං.වි.ම. සතු ජලවිදුලි බලාගාරයන් වෙතින් මිලදී ගන්නා ලද බලශක්තිය ප්‍රමාණය ගි.වො.පැ. 5,364.3 ක් වූ අතර, එය වසරේ සමස්ත ජනනයෙන් 33.6% ක් වූ අතර 2021 වසර හා සාපේක්ෂව 4.9% ක පහත වැටීමක් වාර්තා කරන ලදී. ලං.වි.ම. සතු තම්බපවනි සුළං විදුලි බලාගාරයෙන් මිලදී ගන්නා ලද ජනනය ප්‍රමාණය ගි.වො.පැ. 347.2 ක් වූ අතර එය සමස්ත සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය ජනනයෙන් 11.8% ක් ලෙස වාර්තා විය.

ලක්විජය විදුලි බලාගාරයෙන් මිලදී ගන්නා ලද වාර්ෂික බලශක්ති ප්‍රමාණය ගි.වො.පැ. 5,173.8 ක් වූ අතර, එය සමාලෝචිත වසර තුළ සමස්ත ජනනයෙන් 32.5% ක් ලෙස වාර්තා විය. ස්වාධීන විදුලිය නිෂ්පාදනායතනයන්හි තාප (තෙල්) විදුලි බලාගාර වෙතින් මිලදී ගත් ජනනය ප්‍රමාණය ගි.වො.පැ. 1,127.7 ක් වූ අතර, එමගින් සමස්ත ජනනයට 7.1% ක දායකත්වයක් වාර්තා විය. ACE Power (ඇඹිලිපිටිය) හා ACE Power (මාතර) ලෙස වූ ස්වාධීන විදුලිය නිෂ්පාදනායතනයන් පිළිවෙලින් 2022-03-28 සිට 2022-09-28 දක්වා සහ 2022-04-20 සිට 2022-10-20 දක්වා වශයෙන් මාස හයේ කොන්ත්‍රාත් කාල සීමාවන් පදනමින් ක්‍රියාත්මක කරවන ලදී. Sojitz (කැළණිතිස්ස) ස්වාධීන විදුලිය නිෂ්පාදක බලාගාරය එම බලාගාරය විසින් ගන්නා ලද තීරණයක් පාදක කරගනිමින් විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම (PPA) අවසන් කිරීම හේතුකොට කොන්ත්‍රාත් කාල සීමාව ඉකුත් වීමට පෙර ලංකා විදුලිබල මණ්ඩලය වෙත පවරාගන්නා ලදී.

නාගරික ඝන අපද්‍රව්‍ය, ඩෙන්ඩ්‍රෝ හා ජෛවස්කන්ධ මේවන විට සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (සෙසු) යටතේ කාණ්ඩගත ශ්‍රී ලංකාවේ විදුලිය ජනන මූලාශ්‍රයන් වේ. 2022 වසර සඳහා සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (සෙසු), ස්වාධීන විදුලිය නිෂ්පාදනායතන මිලදී ගත් සමස්ත ප්‍රමාණය ගි.වො.පැ. 2,589.8 ක් වූ අතර එම වර්ෂය සඳහා වහළය මත සවිකරන සූර්ය පැනල මගින් උත්පාදිත විදුලිය ගි.වො.පැ. 530 ක් විය. 2022 වසර තුළ සමස්ත පුනර්ජනනීය බලශක්ති දායකත්වය 52.1% ක් විය.




*රූපය T1: 2022 වසර සඳහා බලශක්ති ජනන මුහුව*

සටහන: බ්‍රෝඩ්ලන්ඩ්ස් විදුලි බලාගාර ජනනයද සහිතව

වාර්ෂික විදුලිය ජනනයට හා මාසික විදුලිය ජනනයට විවිධ බලශක්ති මූලාශ්‍රයන් වෙතින් ලැබෙන දායකත්වය පිළිවෙලින් T2 හා T3 රූප තුළින් නිරූපණය කර ඇත.




*රූපය T2: 2022 සහ 2021 වසර වල වාර්ෂික විදුලිය ජනනයට විවිධ බලශක්ති මූලාශ්‍රයන්හි දායකත්වය*

# සම්ප්‍රේෂණ අංශය (ඉතිරි කොටස)

වසර පුරා මාසික විදුලිය ජනනයේ විවිධත්වයට කාලගුණික තත්ත්වයන්හි ඇතිවන වෙනස්කම් හා මාසයේ දින ගණන යන සාධක මගින් බලපෑම් ඇතිවිය හැක. මෙයට අමතරව, ජනන හිඟතාවය හේතුකොට වසර පුරා සිදුකරන ලද සැලසුම්ගත විදුලිය අත්හිටුවීම්ද සාමාන්‍ය දෛනික ජනන රටාව තුළ නිරූපිතය.




*රූපය T3: 2022 වසර තුළ මාසික ශුද්ධ විදුලි ජනනය*

2021 හා 2022 වසරවල සාමාන්‍ය දෛනික ජනනයේ විචලන සන්සන්දනයක් රූපය T4 මගින් නිරූපණය කර ඇත. ජනනයේ හිඟතාවයක් හේතුකොට 2022 වසර පුරා සිදුකරන ලද සැලසුම්ගත විදුලිය අත්විටුවීම්හි බලපෑම මෙම සන්සන්දනය තුළද නිරූපිතය.




*රූපය T4: 2021 හා 2022 වර්ෂවල මාසික සාමාන්‍ය දෛනික ජනන විචලනය*

වර්ශයේ උපරිම දෛනික ජනනය ප්‍රමාණය වූ ගි.වො.පැ. 48.2 ක ප්‍රමාණය 2022-03-23 දින වාර්තාව වූ අතර වාර්ෂික අවම දෛනික ජනනය 2022-11-07 දින ගි.වො.පැ. 28.7 ක් ලෙස වාර්තා විය. ඉහතින් සඳහන් කරන ලද උපරිම හා අවම දෛනික ජනන අගයන් සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (සෙසු) ජනනයෙන් තොර අගයන් වේ.

2022 වසරේ රාත්‍රි කාලයේ උපරිම ඉල්ලුම 2022-01-31 දින පැය 19:00 ට වාර්තා වූ අතර, එම අවස්ථාවේදී විදුලිය ඉල්ලුම මෙ.වො. 2,708.1 අගයකට පිවිසිණි. පොදුවේ ගත්කල, වසරේ රාත්‍රි කාලයේ උපරිම ඉල්ලුම වියළි සමයේ මාසයක වාර්තා වේ. කෙසේ වුවද, 2022 වසර තුළ සිදුකරන ලද සැලසුම්ගත විදුලිය ඇණහිටුවීම් හේතුකොට මෙම සාමාන්‍ය තත්ත්වයට බලපෑම් එල්ල විය. වසරේ රාත්‍රි කාලයේ උපරිම ඉල්ලුම සටහන් වූ දිනයේ පැය කාලෙන් කාලට ජනන පැතිකඩ රූපය T5 තුළ නිරූපණය කර ඇත. 2022 වසරේ දිවා කාලයේ උපරිම ඉල්ලුම 2022-02-22 දින 16:00 පැයට මෙ.වො. 2,358.1 ක් ලෙස වාර්තා විය. දිවා කාලයේ උපරිම ඉල්ලුමටද සැලසුම්ගත විදුලිය ඇණ හිටුවීම් මගින් බලපෑම් එල්ල විය. වසරේ අවම පද්ධතිමය ඉල්ලුම 2022-12-26 දින පැය 03:00 ට මෙ.වො. 832.9 ක් ලෙස වාර්තා විය.




*රූපය T5: 2022-01-31 දින පද්ධති ජනන වක්‍රය*

# සම්ප්‍රේෂණ අංශය (ඉතිරි කොටස)

අවසන් වසර තුන සඳහා වාර්ෂික උපරිම රාත්‍රි කාල ඉල්ලුම් අගයන් වාර්තාවූ දින සම්බන්ධ දෛනික බැර වක්‍ර සන්සන්දනයක් T6 රූපයෙන් නිරූපණය කර ඇත.




*රූපය T6: (දීපව්‍යාප්ත සැලසුම්ගත විදුලිය ඇණහිටුවීම්ද ඇතුළත්ව) පසුගිය වසර තුන ඇතුළත වාර්ෂික උපරිම රාත්‍රි කාල ඉල්ලුම් දිනයනට අදාළ බැර වක්‍ර*

### සැලසුම්ගත විදුලිය ඇණහිටුවීම්

රටතුළ පැවති මූල්‍ය අර්බුදයේ ප්‍රතිවිපාකයක් ලෙස ඇතිවූ ඉන්ධන හිඟයන් හේතුකොට ජනනය ප්‍රමාණය අඩුවීමක්ද සමගින් 2022 වර්ෂය ආරම්භ විය. එහි ප්‍රතිඵල ලෙස, දීපව්‍යාප්ත සැලසුම්ගත විදුලිය ඇණහිටුවීම් සිදු කරමින් ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණයක් ක්‍රියාත්මක කිරීමට ලං.වි.ම. ට සිදුවිය. සැලසුම්ගත විදුලිය ඇණහිටුවීම් හේතුකොට ඇතිවූ සමස්ත සේවා නොකළ බලශක්තිය ප්‍රමාණය ගි.වො.පැ. 799.2 ක් විය. මාර්තු හා අප්‍රේල් මාසවල වාර්තාගත මාසික ඉහළම සේවා නොකළ බලශක්තිය ප්‍රමාණය පිළිවෙලින් ගි.වො.පැ. 157.7 ක් හා ගි.වො.පැ. 117.6 ක් ලෙස ඇස්තමේන්තු කෙරිණි. කල්තබා සැලසුම්කළ කාල රාමු සහිතව දිවා කාලයේ උච්ච ඉල්ලුම් කාලයන්හි මෙන්ම රාත්‍රි කාලයේ උච්ච ඉල්ලුම් කාලයන්හිද විදුලිය ඇණහිටුවීම් සිදුකරන ලදී. මාසිකව සේවාකරණය නොකළ අවම බලශක්ති අගය විදුලිය ඇණහිටුවීම් දින හයක් පමණක් පැවති ජනවාරි මාසයේදී ගි.වො.පැ. 3.9 ක් ලෙස වාර්තා විය.

### ජලාශ කාර්ය සාධනය

2022 වර්ෂය ගි.වො.පැ. 880.2 ක සමස්ත ජලවිදුලි ධාරිතාවයක් සහිතව ආරම්භ විය. මෙය වූකලි ගි.වො.පැ. 1,207.3 ක් වූ සමස්ත ගබඩා ධාරිතාවයෙන් 72.9% ක අගයකි. වර්ෂය තුළ ජලාශ වෙත ලැබුණු ජල ධාරිතාවය ගි.වො.පැ. 5,418.2 ක් වූ අතර, එතුළ සැලකිය යුතු මට්ටමින් තෙත් හා ජල ආගලනයක් සහිත වර්ෂයක් පෙන්නුම් කරනු ලබයි. 2022-04-02 දින ගි.වො.පැ. 315.5 ක් ලෙස අඩුම ගබඩාකරණ මට්ටමක් වාර්තා වූ අතර, වර්ෂාවසාන ගබඩාකරණ මට්ටම ගි.වො.පැ. 915.7 ක් වූ අතර, එය සමස්ත ගබඩාකරණයෙන් 75.9% ක් වේ.

නිරිතදිග මෝසම් සමය සහ දෙවන අන්තර් මෝසම් සමය පුරා (ඔක්තෝබර් - නොවැම්බර්) ලද ඉහළ ජල ධාරිතාවයන් කරණකොට 2022-11-06 දින ගි.වො.පැ. 1112,6 ක් වූ උපරිම ගබඩාකරණ මට්ටමක් වාර්තාවූ අතර, එතුළ සමස්ත ගබඩාකරණ මට්ටමින් 92.2% ක් වාර්තා විය. වසරේ දෙවන අර්ධය තුළ පද්ධතියට ගි.වො.පැ. 3,637.5 ක ජල ආගලනයක් ලැබිණි.

ගි.වො.පැ. 30.8 ක සාමාන්‍ය දෛනික ආගලනයක් ලද අගෝස්තු මාසයේදී (ගි.වො.පැ. 955.1) වසරේ ඉහළම මාසික ආගලනය වාර්තා විය.

වසර සඳහා (අවශ්‍යතාවයට අනුව මුදා හැරිය හැකි) ප්‍රධාන ජලවිදුලි බලාගාරයන්ගෙන් වාර්තාවූ ජලවිදුලි ජනනය ගි.වො.පැ. 5,364.3 ක්ද, කුඩා ජලවිදුලිබල බලාගාරයන්හි ජනනය ගි.වො.පැ. 1,376.7 ක්ද විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ලද ඉහළ ජල ධාරිතාවයන් හේතුකොට ජලවිදුලි ජනනයෙහි සාමාන්‍ය තත්ත්වයට වඩා යහපත් තත්ත්වයන් පෙන්නුම් කෙරේ. ජල ගබඩාකරණ විචලනය රූපය T7 තුළ දක්වා ඇත.




*රූපය T7: ජල ගබඩාකරණ විචලනය*

# සම්ප්‍රේෂණ අංශය (ඉතිරි කොටස)

**සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘතිවල කාර්ය සාධනය**

'හරිත බලශක්තිය උකහා ගැනීම ප්‍රශස්තකරණය' නමැති අභිමතාර්ථය හා අනුගතව, ලං.වි.ම. විසින් මෙ.වො. 30 ක සමස්ත ධාරිතාවයකින් යුත් බිම නංවන ලද සූර්ය පැනල ව්‍යාපෘති 21 ක් සාර්ථකව මෙහෙවරෙහි යොදවන ලදී. මෙයට අමතරව, අයක්‍රමය පෝෂණ හා ටෙන්ඩර් ක්‍රියාවලිය යටතේ සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති 74ක් දැනට ක්‍රියාත්මක මට්ටමේ පවතී. මෙහෙවරෙහි යොදවන ලද සහ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති පිළිබඳ විස්තර T1 සිට T3 දක්වා වගු තුළ නිරූපණය කොට ඇත.

*වගුව T1: කි.වෝ. 33 හා ඉහළ අගයේ මෙහෙවරෙහි යොදවන ලද සූර්ය පැනල ව්‍යාපෘති විස්තර*

| කොටුම් උපපොළ | ව්‍යාපෘති සංඛ්‍යාව | මෙහෙවරෙහි යොදවන ලද ධාරිතාව |
|---|---|---|
| අනුරාධපුර | 2 | 2 |
| හබරණ | 1 | 1 |
| මහියංගනය | 6 | 6 |
| මහව | 3 | 3 |
| පල්ලෙකැලේ | 5 | 5 |
| පන්නල | 2 | 2 |
| හොරණ | 1 | 1 |
| වව්නතිවු | 1 | 10 |
| **එකතුව** | **21** | **30** |

*වගුව T2: පෝෂණ අයක්‍රම ක්‍රියාවලිය යටතේ ක්‍රියාත්මක සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති විස්තර*

| කාණ්ඩය | ව්‍යාපෘති සංඛ්‍යාව | සමස්ත ධාරිතාව (මෙ.වො.) | කොටුම් උපපොළ | තත්වය |
|---|---|---|---|---|
| කුඩා ජලවිදුලි | 7 | 8.04 | කෑගල්ල, නාවලපිටිය, මාලිබොඩ, රත්නපුර, රිකිල්ලගස්කඩ | සූර්ය විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් (SPPA) දීර්ඝ කිරීමේ ගාස්තු ගෙවීමේ අයක්‍රම යටතේ අත්සන් කොට ඇති අතර මෙහෙවරෙහි යෙදවීමට අපේක්ෂිතය. |
| සූර්ය | 3 | 12.9 | ඇඹිලිපිටිය, බෙලිඅත්ත, වව්නතිවු | |
| ජෛවස්කන්ධ (ඩෙන්ඩ්‍රෝ හා ජීව වායු) | 1 | 5 | අම්පාර | |
| **එකතුව** | **11** | **25.94** | | |

*වගුව T3: ටෙන්ඩර් ක්‍රියාවලියට යටත් සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති විස්තර*

| ව්‍යාපෘතිය | බලාගාර සංඛ්‍යාව | සමස්ත ධාරිතාව (මෙ.වො.) | කොටුම් උපපොළ | තත්වය |
|---|---|---|---|---|
| මෙ.වො. 90 x 1 සූර්ය පැනල | 32 | 32 | - | ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතී |
| මෙ.වො. 10 පොළොන්නරුව සූර්ය පැනලය | 1 | 10 | වාලච්චේන | |
| මෙ.වො. 60 සුළං විදුලි (මෙ.වො. 1-10 දක්වා විචලනය වන ධාරිතාවයන්) | 1 | 10 | ත්‍රිකුණාමලය | අභිප්‍රාය ලිපිය නිකුත් කරන ලදුව, ව්‍යාපෘති කටයුතු ආරම්භ කොට ඇත. |
| | 2 | 15 | මන්නාරම | |
| | 2 | 10 | මාදම්පේ | |
| මෙ.වො. 150 සූර්ය පැනල (මෙ.වො. 1-10 දක්වා විචලනය වන ධාරිතාවයන්) | 24 | 157 | කොටුම් උපපොළ 23 ක් | ලංසු තක්සේරු කටයුතු සිදු වෙමින් පවතී |
| මෙ.වො. 100 සියඹලාණ්ඩුව සූර්ය පැනලය | 1 | 100 | ඇතිමලේ | |
| මෙ.වො. 30 සූර්ය පැනල (මෙ.වො. 1-5 දක්වා විචලනය වන ධාරිතාවයන්) | - | 30 | බෙලිඅත්ත, මාතර, පල්ලෙකැලේ, නාවලපිටිය, වව්නතිවු | |
| මෙ.වො. 40 සූර්ය පැනල (මෙ.වො. 5 ධාරිතාව) | - | 40 | ගාල්ල, කප්පල්තුරේ | |
| මෙ.වො. 20 සුළං විදුලිය (මෙ.වො. 2.5-10 දක්වා විචලනය වන ධාරිතාවයන්) | - | 20 | මන්නාරම | |
| මෙ.වො. 70 සූර්ය පැනල (මෙ.වො. 1-5 දක්වා විචලනය වන ධාරිතාවයන්) | - | 70 | කොටුම් උපපොළ 11 ක් | |
| **එකතුව** | **63** | **494** | | |

# සම්ප්‍රේෂණ අංශය (ඉතිරි කොටස)

## උද්දීපනයන්

රටපුරා විශ්වසනීය හා කාර්යක්ෂම විදුලිය සම්ප්‍රේෂණයක් ඇතිකරනු ලබන බවට වගබලා ගැනීම විෂයයෙහි තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරමින් සම්ප්‍රේෂණ අංශය විසින් 2022 වසර තුළ වැදගත් කඩඉම් සාක්ෂාත් කරගෙන ඇත. 2022 වසර සඳහා අංශයට අදාළ උද්දීපනයන් පහත දක්වා ඇත.

### අනාගතය සඳහා සැලසුම්කරණය

දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම (LTGEP) 2023-2042 අනුමැතිය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) වෙත ඉදිරිපත් කරන ලදී. රජය විසින් ප්‍රකාශයට පත්කොට ඇති 70% පුනර්ජනනීය බලශක්ති ප්‍රතිපත්ති ඉලක්ක සාක්ෂාත් කරගනු පිණිස 2023-2030 කාල පරිච්ඡේදය තුළ මෙ.වො. 5,646 ක පුනර්ජනනීය බලශක්ති ධාරිතා එක් කිරීමක්ද, 2031-2042 කාල පරිච්ඡේදය තුළ මෙ.වො. 8,180 ක එක් කිරීමක්ද අපේක්ෂා කරමින්, සැලසුම් අවකාශය තුළ (සුළං හා සූර්ය පැනල විශේෂ කොටගත්) පුනර්ජනනීය බලශක්ති ධාරිතා එක්කිරීම් විෂයයෙහි සැලකිය යුතු සංවර්ධනයක් මෙම සැලැස්ම තුළ යෝජනා කොට ඇත.

### ලෝකය ආරක්ෂා කරමු

ලෝක දේශගුණික විපර්යාස සමනය කරනු පිණිස ප්‍රකාශයට පත් කරන ලද රජයේ ප්‍රතිපත්තිය හා අනුගතව 2030 වසර වනවිට පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් භාවිත කරමින් රටේ විදුලිය ඉල්ලුමෙන් 70% ක් සපුරාලීමට ලං.වි.ම. කැපවී සිටී. මෙම කැපවීම යථාර්ථයක් බවට පත් කරනු පිණිස, '2023-2026 දක්වා ජාතික ජාලයට සම්බන්ධ කෙරෙන පුනර්ජනනීය බලශක්ති සම්පත් පිළිබඳ ඉදිරි ගමන' නමැති වාර්තාව 2022-11-23 දින ප්‍රකාශයට පත් කරන ලදී. අවම යටිතල පහසුකම් සංවර්ධනයන් සහිතව ජාතික ජාලයට පුනර්ජනනීය බලශක්තිය උකහා ගැනීමේ කාර්යය උදෙසා මෙම වාර්තාව මගින් මාර්ගෝපදේශයක් සම්පාදනය කර ඇති අතර, එමගින් 2030 වනවිට පුනර්ජනනීය බලශක්ති ඉලක්කයෙන් 70% ක් සපුරාගැනීමේ මාර්ගය හෙළි කරනු ඇත.

### පද්ධති සංවර්ධනයන්

2022 වසර තුළ පහත සඳහන් විදුලි බලාගාර, කොටුමා උපපොළ හා සම්ප්‍රේෂණ මාර්ග සම්ප්‍රේෂණ ජාලයට සම්බන්ධ කරන ලදී.

*වගුව T4: සම්ප්‍රේෂණ පද්ධති සංවර්ධනය - 2022 වසර*

| ජාල මූලාංගය | ධාරිතාව / දුර |
|---|---|
| බ්‍රෝඩ්ලන්ඩ්ස් විදුලි බලාගාරය | මෙ.වො. 35 |
| කළුතර කොටුමා උපපොළ (කි.වෝ. 132 / කි.වෝ. 33) | මෙ.වො. 63 |
| කැස්බෑව කොටුමා උපපොළ (කි.වෝ. 132 / කි.වෝ. 33) | මෙ.වො. 63 |
| නව හබරණ කොටුමා උපපොළ (කි.වෝ. 220 / කි.වෝ. 132) | මෙ.වො. 500 |
| හම්බන්තොට කොටුමා උපපොළ (කි.වෝ. 220 / කි.වෝ. 132) | මෙ.වො. 500 |
| බියගම කොටුමා උපපොළ (කි.වෝ. 220 / කි.වෝ. 33) | මෙ.වො. 126 |
| පාදුක්ක - පන්නිපිටිය කි.වෝ. 220 මාර්ගය | කි.මී. 19.2 |
| කළුතර - මතුගම කි.වෝ. 132 මාර්ගය (පිවිසුම් හා පිටවීම් සම්බන්ධතාවය) | කි.මී. 4.8 |
| කැස්බෑව කි.වෝ. 132 (පිවිසුම් හා පිටවීම් සම්බන්ධතාවය) | කි.මී. 6.5 |

මෙහෙයුම් සමාලෝචනය

# බෙදාහැරීමේ අංශ



# බෙදාහැරීමේ අංශ

පාරිභෝගිකයන් වෙත උසස් තත්ත්වයේ විදුලිය සැපයුමක් හා සේවාවන් සැපයීමේ වගකීමක් දරන බැවින් බෙදාහැරීමේ අංශ විසින් ආයතනය තුළ තීරණාත්මක කාර්යභාරයක් සිදුකරනු ලබයි. ලං.වි.ම. විසින් රටේ සමස්ත අලෙවි ප්‍රමාණයෙන් 89% ක් සිදුකරනු ලබන අතර, ඉතිරි ප්‍රමාණය ලං.වි.ම. අනු ආයතනයක් වන ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් අලෙවි කරනු ලබයි.

ලං.වි.ම. සමස්ත බෙදාහැරීමේ පද්ධතිය භූගෝලීය වශයෙන් බෙදාහැරීමේ අංශය 1 (DD1), බෙදාහැරීමේ අංශය 2 (DD2), බෙදාහැරීමේ අංශය 3 (DD3), සහ බෙදාහැරීමේ අංශය 4 (DD4) වශයෙන් අංශ හතරකට වෙන්කර ඇත. මෙම වෙන්කිරීම ප්‍රධාන වශයෙන් පරිපාලනයේ සහ මෙහෙයුකම්රණ පහසුව හා සැපයුම් කාර්යක්ෂමතාවය හා ගුණාත්මකභාවයද වැඩිදියුණු කිරීම සඳහා වූ ප්‍රමිතිගත තරගකාරිත්වය සාක්ෂාත් කරගනු පිණිස සිදුකොට ඇත.

බෙදාහැරීමේ ජාලය කි.වෝ. 33 හා කි.වෝ. 11 මැදි වෝල්ටීයතා (MV) මාර්ග, වෝ. 400 අඩු වෝල්ටීයතා (LV) මාර්ග සහ බෙදාහැරීමේ තරාපැවිවලින් සමන්විත වේ. කි.වෝ. 220 සහ කි.වෝ. 132 සම්ප්‍රේෂණ පද්ධති මගින් දිවයින පුරා පිහිටි කොටුමා උපපොළයන් හරහා බෙදාහැරීමේ ජාලය තුළට විදුලිය හුමවාරු කරවනු ලබයි.

## මෙහෙයුම් ව්‍යුහය

බෙදාහැරීමේ අංශ පළාත්වලට බෙදනු ලැබ ඇති අතර, මෙම පරිච්ඡේදය තුළ සීමා මායිම් කරන ලද පළාත් රටේ පරිපාලනමය පළාත්ම නොවිය හැක. සේවාකරණය කරනු ලබන පාරිභෝගිකයන් සංඛ්‍යාව මත පදනම්ව පළාතක් ප්‍රදේශ ගණනාවකට බෙදෙන අතර, ප්‍රදේශයක් තවදුරටත් පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ගණනාවකට බෙදේ. එක් එක් අංශය යටතේ එන පළාත් පහත D1 සිට D4 දක්වා වගු තුළින් නිරූපණය කර ඇත.

## මෙහෙයුම් ප්‍රදේශය

බෙදාහැරීමේ අංශය 1 මගින් සමස්ත වයඹ පළාත, උතුරු හා උතුරු මැද පළාත් සහ බස්නාහිර පළාතේ කොටසක්ද ප්‍රාදේශීය කාර්යාල 19 ක් හරහා ආවරණය කරනු ලබයි. බෙදාහැරීමේ අංශය 1 වයඹ I , වයඹ II, උතුරු මැද, උතුරු හා කොළඹ නගර වශයෙන් පළාත් පහකින් සමන්විත වේ. වයඹ I සහ වයඹ II පළාත් ප්‍රදේශ හතරකට බෙදේ. 2022 වසරේ සිට උතුරු මැද පළාත් ප්‍රදේශ තුනකටද, උතුරු සහ කොළඹ නගර පළාත් ප්‍රදේශ හතරකටද බෙදේ (වගුව D1).

*වගුව D1: බෙදාහැරීමේ අංශය 1 ට අදාළ මෙහෙයුම් ප්‍රදේශ*

| අංශය | පළාත | ප්‍රදේශය |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 1 | වයඹ I | හලාවත, කුලියාපිටිය, වෙන්නප්පුව සහ පුත්තලම |
| | වයඹ II | කුරුණෑගල, වාරියපොල, නාරම්මල සහ මහව |
| | උතුරු මැද | අනුරාධපුර, කැකිරාව සහ මින්නේරිය |
| | උතුරු | යාපනය, යාපනය නැගෙනහිර, කිලිනොච්චි සහ වව්නියාව |
| | කොළඹ නගර | කොළඹ උතුරු, කොළඹ දකුණු, කොළඹ බටහිර සහ කොළඹ නැගෙනහිර |

බෙදාහැරීමේ අංශය 2 මගින් ප්‍රාදේශීය කාර්යාල 25 ක් හරහා සමස්ත නැගෙනහිර සහ මධ්‍යම පළාත් ආවරණය කෙරෙන අතර බස්නාහිර සහ සබරගමුව පළාත්වල යම් කොටස් ප්‍රමාණයක්ද ආවරණය කෙරේ. 2022 වසරේ සිට පළාත් සතරෙන් නැගෙනහිර පළාත ප්‍රදේශ පහකටද, මධ්‍යම පළාත I ප්‍රදේශ හයකටද, මධ්‍යම පළාත II ප්‍රදේශ හතකටද, බස්නාහිර පළාත උතුර ප්‍රදේශ හතකටද බෙදා ඇත (වගුව D2).

*වගුව D2: බෙදාහැරීමේ අංශය 2 ට අදාළ මෙහෙයුම් ප්‍රදේශ*

| අංශය | පළාත | ප්‍රදේශය |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 2 | නැගෙනහිර | අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, වාලච්චේන සහ කල්මුණේ |
| | මධ්‍යම පළාත I | දඹුල්ල, ගලගෙදර, මහනුවර නගරය, කටුගස්තොට, කුණ්ඩසාලේ සහ මාතලේ |
| | මධ්‍යම පළාත II | කෑගල්ල, මාවනැල්ල, පේරාදෙණිය, නුවරඑළිය, ගිණිගත්හේන, නාවලපිටිය සහ හඟුරන්කෙත |
| | බස්නාහිර පළාත උතුර | ගම්පහ, කැළණිය, මීගමුව, ජා-ඇල, දිවුලපිටිය, වේයන්ගොඩ සහ කිරිඳිවැල |

# බෙදාහැරීමේ අංශ (ඉතිරි කොටස)

බෙදාහැරීමේ අංශය 3 මගින් බස්නාහිර පළාතේ කොටසක්ද (බස්නාහිර පළාත දකුණ II), සබරගමුව සහ ඌව පළාත්ද ආවරණය කරනු ලබයි. සමාලෝචිත වර්ෂය තුළ ඌව පළාත තුළට වැල්ලවාය ප්‍රදේශය හඳුන්වා දෙන ලද අතර, 2022 වසර අවසානය වනවිට වගුව D3 තුළ දී ඇති පරිදි උක්ත සියලු පළාත් ප්‍රදේශ පහකට අනු-බෙදුම්ගත කොට ඇත.

*වගුව D3: බෙදාහැරීමේ අංශය 3 තුළ මෙහෙයුම් ප්‍රදේශ*

| අංශය | පළාත | ප්‍රදේශය |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 3 | බස්නාහිර පළාත දකුණ II | බණ්ඩාරගම, හෝමාගම, අවිස්සාවේල්ල, ශ්‍රී ජයවර්ධනපුර සහ හොරණ |
| | සබරගමුව | රත්නපුර, කහවත්ත, රුවන්වැල්ල, ඇහැලියගොඩ, ඇඹිලිපිටිය |
| | ඌව | බදුල්ල, දියතලාව, මොණරාගල, මහියංගනය සහ වැල්ලවාය |

බෙදාහැරීමේ අංශය 4 මගින් බස්නාහිර පළාතේ කොටසක්ද (බස්නාහිර පළාත දකුණ I) , සමස්ත දකුණු පළාතද, සබරගමුව සහ ඌව පළාත්වල ඇතැම් ප්‍රදේශද ආවරණය කෙරේ. බස්නාහිර පළාත දකුණ I මගින් ප්‍රදේශ හතරක්ද, දකුණු පළාත I මගින් ප්‍රදේශ හතරක්ද, දකුණු පළාත II මගින් ප්‍රදේශ තුනක්ද 2022 වර්ෂයේ සිට ආවරණය කෙරේ (වගුව D4)

*වගුව D4: බෙදාහැරීමේ අංශය 4 ට අයත් මෙහෙයුම් ප්‍රදේශ*

| අංශය | පළාත | ප්‍රදේශය |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 4 | දකුණු පළාත I | අම්බලන්ගොඩ, ගාල්ල, අකුරැස්ස සහ බද්දේගම |
| | දකුණු පළාත II | තංගල්ල, හම්බන්තොට සහ මාතර |
| | බස්නාහිර පළාත දකුණ I | රත්මලාන, කළුතර, දෙහිවල සහ මතුගම |

පළාත් හැරුණු කොට, එක් එක් අංශයේ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සහාය සේවා සිදුකරනු පිණිස සියලු බෙදාහැරීමේ අංශ තුළ වෙන් වෙන් වශයෙන් ශාඛා තුනක් ස්ථාපනය කොට ඇත. ඒවා ව්‍යාපෘති හා අධිසැර නඩත්තු ශාඛාව, සැලසුම් හා සංවර්ධන ශාඛාව සහ වාණිජ සහ ආයතනික ශාඛාව වශයෙන් වේ. බෙදාහැරීමේ අංශය 1 තුළට බෙදාහැරීමේ සම්බන්ධීකරණ ශාඛාවද ඇතුළත් වේ.

### බෙදාහැරීමේ අංශයන්හි ප්‍රධාන අරමුණු

- පාරිභෝගික අපේක්ෂා සපුරාලනු පිණිස මෙහෙයුම් සහ නඩත්තු කාර්යක්ෂමතාවය නංවාලීම.
- පාරිභෝගික අපේක්ෂා සපුරාලනු පිණිස ඵලදායී හා කාර්යක්ෂම බෙදාහැරීමේ ජාල පාලන මධ්‍යස්ථාන (DNCC) සහ සෙසු සන්නිවේදන යෙදවුම් පවත්වාගෙන යාම.
- ආයතනික සැලැස්ම සපුරාලනු පිණිස ආංශික ක්‍රමෝපාය කටයුතු සහ අවශ්‍ය සම්පත් සඳහා තාක්ෂණික සැලසුම්කරණය.
- පද්ධතිමය අලාභ අවම කරන අතර විශ්වසනීයත්වය, ගුණාත්මකභාවය, ආරක්ෂාව හා කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රමිතීන් හා අනුගතවන පරිදි විදුලිය බෙදාහැරීමේ පද්ධතිය සංවර්ධනය කරනු ලබන බවට වගබලා ගැනීම.
- නිරවද්‍ය අයවැයකරණය, මූල්‍යකරණය හා නියාමනය මගින් නිසි මූල්‍ය කළමනාකරණයක් පවත්වාගෙන යනු ලබන බවට වගබලා ගැනීම.
- කලට වේලාවට ආදායම් රැස් කරමින් මුදල් ප්‍රවාහ කළමනාකරණය සහතික කිරීම.
- නිසි ද්‍රව්‍ය කළමනාකරණයක් සහතික කිරීම.
- නවීනතම ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ සංකල්ප සහ පාරිභෝගික දැනුවත්භාවය හරහා බලශක්ති සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම.
- නවීන කර්මාන්තයට යෝග්‍ය වන පරිදි ඉදිකිරීම්, මෙහෙයුම් හා නඩත්තු තොරතුරු සඳහා වූ ප්‍රමිති, පිරිවිතර, කාර්ය පරිපාටි සහ කළමනාකරණ සැලසුම්, ඉදිකිරීම්, මෙහෙයුම් හා නඩත්තු තොරතුරු සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම.
- නවීන තාක්ෂණයන් සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු නංවාලීම.
- නිපුණ කාර්ය බලකායක් නිර්මාණය කොට අධ්‍යාපන හා සංවර්ධන වැඩසටහන් හරහා සාර්ථකත්වය උදෙසා ඔවුන්ගේ අවස්ථාවන් උපරිමකරණය.
- සිය මෙහෙයුම් කටයුතු සිදුවන තැන්හි පරිසරය ආරක්ෂා කොට සුරැකීමට කැපවීම.
- වත්මන් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාර පුනර්ජනනීය අවශෝෂණයනට අවශ්‍ය පහසුකම් සැලසීම.

# බෙදාහැරීමේ අංශ (ඉතිරි කොටස)




*රූපය D1: බෙදාහැරීමේ සිතියම -2022*

# බෙදාහැරීමේ අංශ (ඉතිරි කොටස)

**බෙදාහැරීමේ අංශවල විහිදුම් පරාසය**

2022 වසර සඳහා වූ ප්‍රධාන යටිතල පහසුකම් සහ මෙහෙයුම් දත්ත, බෙදාහැරීමේ යටිතල පහසුකම් එකතු කිරීම් සහ ගාස්තුවලට අනුව සැකසූ පාරිභෝගික, අලෙවි සහ ආදායම් විශ්ලේෂණ දත්ත D6 සිට D9 දක්වා වූ වගු තුළ දී ඇත. තවද, පසුගිය වසර පහ තුළ ආයතනයේ පාරිභෝගික සංඛ්‍යාවේ වර්ධනය රූපය D3 හි පෙන්වා දී ඇත.

*වගුව D5: ප්‍රධාන යටිතල පහසුකම් සහ මෙහෙයුම් සංඛ්‍යා*

| විස්තරය | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 |
|---|---|---|---|---|
| සේවා ප්‍රදේශය[1] (වර්ග කි.මී.) | 26,931 | 17,935 | 11,036 | 6,694 |
| ප්‍රදේශ (සංඛ්‍යාව) | 19 | 25 | 15 | 11 |
| පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (සංඛ්‍යාව) | 61 | 91 | 53 | 42 |
| පාලක මධ්‍යස්ථාන (සංඛ්‍යාව) | 4 | 3 | 3 | - |
| ඇමතුම් මධ්‍යස්ථාන (සංඛ්‍යාව) | 4 | 3 | 3 | 1 |
| තොග පාරිභෝගිකයන් (සංඛ්‍යාව) | 5,006 | 4,014 | 2,444 | 1,994 |
| සිල්ලර පාරිභෝගිකයන් (සංඛ්‍යාව) | 1,993,938 | 2,382,773 | 1,409,781 | 1,136,783 |
| මුළු පාරිභෝගිකයන් (සංඛ්‍යාව) | 1,998,944 | 2,386,787 | 1,412,225 | 1,138,777 |
| පද්ධති සාමාන්‍ය අතුරු බිඳුම් දර්ශකය (SAIDI) (විනාඩි/පාරිභෝගිකයන්/වර්ෂය) | 1,625 | 3,627 | 5,470 | 5,202 |
| පද්ධති සාමාන්‍ය අතුරු බිඳුම් වාර දර්ශකය (SAIFI) (අතුරු බිඳුම්/පාරිභෝගිකයන්/වර්ෂයකට) | 8 | 27 | 39 | 34 |
| මිලදී ගත් විදුලි ඒකක (ගි.වො.පැ.) | 4,190 | 4,723 | 1,006 | 1,774 |
| පාරිභෝගිකයන් වෙත අලෙවි කරන ලද විදුලිය ඒකක (ගි.වො.පැ.) | 4,021 | 4,499 | 2,552 | 1,897 |
| බෙදාහැරීමේ අලාභය (%) | 5.5% | 7.3% | 5.6% | 6.9% |
| අලෙවි කරන ලද ඒකකවලින් ඉපැයූ ආදායම (රු. මිලියන) | 90,691.74 | 93,547.37 | 54,015.20 | 40,551.56 |
| සාමාන්‍ය අලෙවි මිල (රු./කි.වො.පැ.) | 22.56 | 20.79 | 21.16 | 21.38 |
| ලැබිය යුතු තත්ත්වය (මාස) | 1.3 | 1.3 | 1.5 | 1.4 |
| වර්ෂය තුලදී ලබාදුන් නව සම්බන්ධතා (සංඛ්‍යාව) | 32,729 | 47,182 | 28,406 | 18,890 |

*[1] වනාන්තර හා විදුලි ජාලයන් නොමැති දූපත් හැර*

*වගුව D6: බෙදාහැරීමේ යටිතල පහසුකම් එක් කිරීම් - 2022 වර්ෂය*

| විස්තරය | ඒකක | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 |
|---|---|---|---|---|---|
| **බෙදාහැරීමේ රැහැන් (උඩිස්)** | | | | | |
| කි.වෝ. 33 (රැහැන් දිග) | කි.මී. | 1,274.8 | 355.3 | 85.6 | 19 |
| කි.වෝ. 11 (රැහැන් දිග) | කි.මී. | 17.9 | - | - | 0.4 |
| අඩු වෝල්ටීයතා (පරිපථ දිග) | කි.මී. | 1009.8 | 106.4 | 537.1 | - |
| **යටිබිම් බහන්** | | | | | |
| කි.වෝ. 33 (රැහැන් දිග) | කි.මී. | 1.5 | 0.5 | 0.4 | - |
| කි.වෝ. 11 (රැහැන් දිග) | කි.මී. | 37.2 | 3.8 | 0.4 | 0.4 |
| අඩු වෝල්ටීයතා (පරිපථ දිග) | කි.මී. | 28.2 | 1.2 | - | 0.1 |
| **උපපොළ** | | | | | |
| කි.වෝ. 33/11 ප්‍රාථමික උපපොළ සංඛ්‍යාව | සංඛ්‍යාව | 1 | - | - | 2 |
| අඩු වෝල්ටීයතා බෙදාහැරීමේ උපපොළ සංඛ්‍යාව | සංඛ්‍යාව | - | 349 | 178 | 93 |

# බෙදාහැරීමේ අංශ (ඉතිරි කොටස)

*වගුව D7: අයකුම කාණ්ඩයට අනුව පාරිභෝගික ගිණුම් සංඛ්‍යාව*

| විස්තරය | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 |
|---|---|---|---|---|
| ගෘහස්ථ | 1,681,960 | 2,061,074 | 1,234,848 | 992,444 |
| ආගමික | 14,477 | 14,615 | 7,978 | 6,129 |
| කර්මාන්ත | 37,360 | 15,417 | 9,236 | 6,802 |
| හෝටල් | 119 | 244 | 42 | 159 |
| රජයේ | 2,157 | 2,870 | 2,785 | 1,503 |
| පොදු කාර්ය | 260,796 | 292,016 | 157,196 | 131,739 |
| කෘෂිකාර්මික | 2,075 | 551 | 140 | 1 |
| **එකතුව** | **1,998,944** | **2,386,787** | **1,412,225** | **1,138,777** |

*වගුව D8: අයකුම කාණ්ඩයට අනුව අලෙවිය (ගි.වො.පැ.)*

| විස්තරය | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 |
|---|---|---|---|---|
| ගෘහස්ථ | 1,471.6 | 1,731.9 | 980.5 | 859.8 |
| ආගමික | 32.7 | 25.1 | 11.6 | 11.2 |
| කර්මාන්ත | 1,003.8 | 1,818.5 | 1,013.3 | 495.9 |
| හෝටල් | 105.9 | 59.4 | 8.2 | 71.6 |
| රජයේ | 79.8 | 59.6 | 24.8 | 43.1 |
| පොදු කාර්ය | 1,285.0 | 767.5 | 514.1 | 395.8 |
| කෘෂිකාර්මික | 1.4 | 0.6 | 0.1 | 0.002 |
| විථි ලාම්පු | 40.6 | 36.6 | - | 19.8 |
| **එකතුව** | **4,020.7** | **4,499.4** | **2,552.5** | **1,897.1** |

*වගුව D9: අයකුම කාණ්ඩයට අනුව ආදායම (රු. මිලියන)*

| විස්තරය | බෙ.අ. 1 | බෙ.අ. 2 | බෙ.අ. 3 | බෙ.අ. 4 |
|---|---|---|---|---|
| ගෘහස්ථ | 29,564.3 | 32,216.8 | 18,057.8 | 16,541.8 |
| ආගමික | 541.6 | 418.6 | 182.7 | 176.5 |
| කර්මාන්ත | 20,653.6 | 37,179.1 | 20,907.2 | 10,507.3 |
| හෝටල් | 2,208.3 | 1,338.7 | 199.1 | 1,500.4 |
| රජයේ | 1,911.8 | 1,430.5 | 599.2 | 984.3 |
| පොදු කාර්ය | 35,778.8 | 20,949.4 | 14,066.5 | 10,841.3 |
| කෘෂිකාර්මික | 33.4 | 13.6 | 2.7 | 0.03 |
| විථි ලාම්පු | - | 0.6 | - | - |
| **එකතුව** | **90,691.7** | **93,547.4** | **54,015.2** | **40,551.6** |




| | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|
| බෙ.අ.1 | 1,832,829 | 1,875,852 | 1,916,904 | 1,966,215 | 1,998,944 |
| බෙ.අ.2 | 2,178,082 | 2,229,774 | 2,276,715 | 2,339,605 | 2,386,787 |
| බෙ.අ.3 | 1,291,700 | 1,320,826 | 1,347,949 | 1,383,819 | 1,412,225 |
| බෙ.අ.4 | 1,051,668 | 1,074,187 | 1,094,696 | 1,119,887 | 1,138,777 |

*රූපය D3: පාරිභෝගික ගිණුම්වල වසර පහක ප්‍රගතිය*

## විදුලියනය සඳහා වූ ප්‍රවේශය

යම්කිසි පළාතක සාපේක්ෂ වශයෙන් පහසුවෙන් විදුලිය ලබාගත හැකි පුද්ගල ප්‍රතිශතය එම පළාතේ සංවර්ධන මට්ටමට අනුව වෙනස් වේ. පළාත් පහළව අතරින් කොළඹ නගර, බස්නාහිර පළාත උතුර, බස්නාහිර පළාත දකුණ I, දකුණු පළාත I සහ දකුණු පළාත II විසින් 100% ක අගයක විදුලියන ප්‍රවේශ පහසුකම් ලබා ඇත. විදුලියනයේ පවත්නා ප්‍රතිලාභ සලකා බැලීමේදී, ග්‍රාමීය විදුලියන ව්‍යාපෘති ආධාර ආයතන, ශ්‍රී ලංකා රජය සහ ලං.වි.ම. විසින් ලබාදෙන මූල්‍ය ප්‍රතිපාදන හරහා 100% ක විදුලියන ප්‍රවේශයක් සාක්ෂාත් කරගනු පිණිස ග්‍රාමීය විදුලියන ව්‍යාපෘති හඳුන්වා දෙන ලදී.




*රූපය D2: විදුලියන මට්ටම 2021/2022*

## ග්‍රාමීය විදුලියන යෝජනාක්‍රම හා ව්‍යාප්ති

ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලනු පිණිස ග්‍රාමීය විදුලියන යෝජනාක්‍රම හදුන්වා දෙන ලදී. 2022 වසර තුළ දළ වශයෙන් ග්‍රාමීය විදුලියන යෝජනාක්‍රම 208 ක් සහ පුළුල් කිරීමේ යෝජනාක්‍රම 486 කට වැඩි සංඛ්‍යාවක් රු. මිලියන 570 ක සමස්ත පිරිවැයක් දරමින් අවසන් කරන ලදී.




*රූපය D4: ග්‍රාමීය විදුලියනය - 2022*

## වහළය මත සවිකරන සූර්ය පැනල (PV)

'හරිත බලශක්ති ඒකාබද්ධකරණ කාර්යය ප්‍රශස්ත කිරීමේ' අරමුණ හා අනුගතව, විදුලිය පාරිභෝගිකයන් හට සිය පරිශ්‍ර තුළ වහළය මත විදුලිය ජනනය කොට ශුද්ධ මානනය (Net Metering), ශුද්ධ ගිණුම්කරණය, (Net Accounting) ශුද්ධ ධන (Net +) සහ ශුද්ධ ධන ධන (Net ++) නමැති යෝජනාක්‍රම සතරක් යටතේ බලශක්තිය පරිභෝජනය හා අපනයනයද සිදු කරමින් ලං.වි.ම. පද්ධතිය සමග සිය ජනන යන්ත්‍ර සම්බන්ධ කිරීමට අවසර ලබාදී ඇත. 2022 වසර අවසානය වනවිට සූර්ය පැනල සම්බන්ධතාවය පිළිබඳ විස්තර වගුව D10 තුළ නිරූපණය කර ඇත.

වගුව D10: *2022 වසර අවසානය වනවිට සූර්ය පැනල සම්බන්ධතා පිළිබඳ විස්තර.*

| අංශය | අයිතමය | ශුද්ධ මානනය | ශුද්ධ ගිණුම්කරණය | ශුද්ධ ධන |
|---|---|---|---|---|
| බෙ.අ. 1 | පාරිභෝගිකයන් (සංඛ්‍යාව) | 3,485 | 5,374 | 1,016 |
| | ස්ථාපිත ධාරිතාව (මෙ.වො.) | 29.1 | 50.7 | 62.5 |
| | පද්ධතියට එක් කළ බලශක්තිය (ගි.වො.පැ.) | 17.7 | 45.5 | 78.5 |
| බෙ.අ. 2 | පාරිභෝගිකයන් (සංඛ්‍යාව) | 2,304 | 6,046 | 602 |
| | ස්ථාපිත ධාරිතාව (මෙ.වො.) | 19.6 | 54.0 | 96.7 |
| | පද්ධතියට එක් කළ බලශක්තිය (ගි.වො.පැ.) | 6.9 | 53.9 | 109.9 |
| බෙ.අ. 3 | පාරිභෝගිකයන් (සංඛ්‍යාව) | 2,311 | 4,284 | 523 |
| | ස්ථාපිත ධාරිතාව (මෙ.වො.) | 13.8 | 35.2 | 66.7 |
| | පද්ධතියට එක් කළ බලශක්තිය (ගි.වො.පැ.) | 8.2 | 30.0 | 74.9 |
| බෙ.අ. 4 | පාරිභෝගිකයන් (සංඛ්‍යාව) | 2,033 | 4,871 | 529 |
| | ස්ථාපිත ධාරිතාව (මෙ.වො.) | 14.9 | 45.0 | 46.5 |
| | පද්ධතියට එක් කළ බලශක්තිය (ගි.වො.පැ.) | 8.2 | 43.0 | 53.0 |

*සටහන: 2022 වර්ෂයේදී ශුද්ධ ධන ධන (Net ++) පාරිභෝගිකයන් නොමැත.*

# බෙදාහැරීමේ අංශ (ඉතිරි කොටස)

පසුගිය වසර 5 තුළ සූර්ය පැනල මගින් පද්ධතිය වෙත එක් කල බලශක්තියේ ප්‍රවර්ධනය රූපය D5 තුළ නිරූපණය කර ඇත.




| | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|
| බෙ.අ.1 | 19 | 43 | 77 | 115 | 142 |
| බෙ.අ.2 | 8 | 33 | 73 | 116 | 171 |
| බෙ.අ.3 | 9 | 33 | 61 | 79 | 113 |
| බෙ.අ.4 | 11 | 30 | 59 | 80 | 104 |

*රූපය D5: පසුගිය වසර පහ ඇතුළත සූර්ය පැනල දායකත්ව ප්‍රවර්ධනය ගි.වො.පැ. වලින්*

## උද්දීපනයන්

**තරු ශ්‍රේණිගතකරණ වැඩසටහන මගින් පාරිභෝගික තෘප්තිය ප්‍රවර්ධනය**

'පාරිභෝගිකයන් වෙත ඉහළ ගුණාත්මකභාවයෙන් යුත් විදුලිය සැපයුමක් හා සේවාවක් ලබාදීම' නමැති අරමුණ හා අනුගතව ලං.වි.ම. සේවයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට අවධානය යොමුකොට ඇත. එබැවින්, පාරිභෝගික සේවා ගුණාත්මකභාවය වැඩිදියුණු කරනු පිණිස ආයතනික ක්‍රමෝපාය අංශය විසින් තරු ශ්‍රේණිගතකරණ වැඩසටහන ආරම්භ කරන ලදී.

ඒ අනුව, තරු ශ්‍රේණිගතකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කාර්යය බෙදාහැරීමේ අංශයන්හි අතිරේක සාමාන්‍යාධිකාරිවරුන් වෙත පවරා දී ඇති අතර, අවසන් කර්තව්‍ය වනුයේ තරු 7 මට්ටමේ ISO 9001:2015 තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකය ලබාගැනීමයි.

2022 වසර තුළ තරු ශ්‍රේණිගතකරණ වැඩසටහන නොකඩවා පවත්වන ලද අතර, බෙදාහැරීමේ අංශය 2 හි පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 47 ක් වෙත තරු 3 පිරිනැමීමේ ක්‍රියාවලිය වසර තුළ



*රූපය D6: පළමු ස්ථානය - තරු ශ්‍රේණිගත යෝජනාක්‍රමයේ හොඳම කාර්ය සාධනයක් සහිත පාරිභෝගික සේවා මධ්‍යස්ථානය*

අවසන් කරන ලදී. තරු ශ්‍රේණිගතකරණ වැඩසටහනේ හොඳම කාර්ය සාධනයක් සහිත පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සම්මානයට පාත්‍ර විය. ඒ අනුව, ලිඳුල /තලවකැලේ, ජා-ඇල සහ කුරුඳුවත්ත පාරිභෝගික සේවා මධ්‍යස්ථාන වෙත පිළිවෙලින් පළමු, දෙවන හා තුන්වන ස්ථාන පිරිනමන ලදී. මෙයට අමතරව, සේවා මට්ටම් වැඩිදියුණු කිරීමේ කාර්යයට ඉදිරිපත්වන උද්‍යෝගිමත් පාරිභෝගික සේවා මධ්‍යස්ථාන හා පාරිභෝගිකයන් උදෙසා ගුණාත්මකභාවයෙන් යුත්, විශ්වසනීය බලශක්ති සැපයුමක් පවත්වාගෙන යන්නාවූ පාරිභෝගික සේවා මධ්‍යස්ථානද ඇගයීමට ලක්විය.

**භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) ක්‍රියාත්මක කිරීම**

නිරවද්‍ය ජාල සිතියමක් පවත්වාගෙන යනු පිණිස බස්නාහිර පළාත දකුණ II අංශය විසින් භූගෝලීය තොරතුරු පද්ධතිය සංවර්ධනය කොට ඇත. මෙය මැදි වෝල්ටීයතා සහ අඩු වෝල්ටීයතා යන දෙවර්ගයේම ජාලයන් සඳහා වූ භූ සම්බන්ධක වත්කම් දත්ත පදනමක් වශයෙන්ද ක්‍රියාත්මක කළ හැක. ArcGIS මාර්ගගත සේවා හා වෙබ් යෙදවුම් ගණනාවක්ද භාවිත කරමින් වේදිකාව ගොඩනගා ඇත. පළාතේ හා අංශයේ විවිධ අවශ්‍යතාවයන් සපුරාලනු පිණිස ජංගම යෙදවුමක්ද ගොඩනගා ඇත. තවද, CEBAssist නමැති සම්මානලාභී ගෘහස්ත මෘදුකාංගය යටතේ ගොඩනංවන ලද මොඩියුලයක් වන ''GEOAssist'' වෙතද එම ලක්ෂණයන්ම ඇතුළත් කරමින් සමස්ත ලං.වි.ම. පුරා එහි වේදිකාව විහිදුවාලීමට අපේක්ෂා කෙරේ.

**නඩත්තු මෙහෙයුම් කටයුතු ප්‍රතිව්‍යුහගත කරනු පිණිස මෘදුකාංග මෙවලමක් ගොඩනැගීම**

'නවීන තාක්ෂණයෙන් මෙහෙයුම් විශිෂ්ටතාව' නමැති අභිමතාර්ථය සාධනය කරගනු පිණිස, ලං.වි.ම. විසින් නිරතුරු ක්‍රියාවලි අංකිතකරණය දිරිගන්වනු ලබයි. ඒ අනුව, බෙදාහැරීමේ නඩත්තු කටයුතු ප්‍රතිව්‍යුහගතකරනු පිණිස මෘදුකාංග මෙවෙලමක් ගොඩනගා ඇත. එම මෙවලම බස්නාහිර පළාත දකුණ I තුළ නියමු ව්‍යාපෘතියක් වශයෙන් යොදාගන්නා ලද අතර, ඵලදායිතාවය නංවාලමින්, බිඳ වැටීම් සහ පිරිවැයද අවම කරමින් නඩත්තු මෙහෙයුම් කටයුතු යාවත්කාලීන කිරීමට මෙම මෙවලම බොහෝ සෙයින් උපකාරී වී ඇත. පරිශීලක මිත්‍රශීලී අන්තර් මුහුණත, තත් කාලීන යාවත්කාලීනයන් සහ සැලසුම්කරණ හා පුරෝකථන අංග මගින් මෙම මෘදුකාංගය බෙදාහැරීමේ නඩත්තු කණ්ඩායම්වලට අත්‍යවශ්‍ය මෙවලමක් බවට පත්කොට ඇත. පරිහරණ පහසුව, තත් කාලීන යාවත්කාලීනයන් ලබාගැනීමේ හැකියාව, සැලසුම්කරණ හා පුරෝකථන පහසුකම් සැලසීම, වර්ධිත ඵලදායකත්වය හා පිරිවැය ඉතිරිවීම බඳු සහජ ප්‍රතිලාභ හේතුකොට මෙම මෙවලම නොකඩවා භාවිත කිරීමටද මෙය සමස්ත ලං.වි.ම. පුරා හඳුන්වා දීමටද තීරණය කරන ලදී.

## මෙහෙයුම් සමාලෝචනය

# ව්‍යාපෘති අංශය



බ්‍රෝඩ්ලන්ඩ්ස් විදුලිබලාගාරය

# ව්‍යාපෘති අංශය

විදේශීය, ශ්‍රී ලංකා රජයේ හා ලං.වි.ම. අරමුදල්ගත ප්‍රධාන ජනන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු පිණිස 2010 වසර තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති අංශය ස්ථාපනය කරන ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළ සමස්ත විදුලි පද්ධතියේ ධාරිතා වර්ධනය හා විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම ආශ්‍රිත ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කෙරේ.

රු. බිලියන 48.2 ඉක්මවූ ව්‍යාපෘති කටයුතු ප්‍රමාණයක් සිදුකරන ලද බැවින් 2022 වසර වූකලි ව්‍යාපෘති අංශයට තවත් අභියෝගාත්මක වසරක් විය.

2022 වසර තුළ සිදුකරන ලද ව්‍යාපෘති කටයුතු පිළිබඳ විස්තරයක් පහත දැක්වේ:

## බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි ව්‍යාපෘතිය

බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය යනු කැළණි ගංගාව ආශ්‍රිතව ගොඩනංවන ලද ගලන ජලයෙන් ක්‍රියාත්මක ජල විදුලි සංවර්ධන කාර්යයකි. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ දැනට පවත්නා සමනල (පොල්පිටිය) විදුලි බලාගාරයේ පහළ ධාරා ප්‍රදේශයේ ජල විදුලි ශක්‍යතාවයෙන් ප්‍රයෝජන ගැනීමයි. ව්‍යාපෘතියේ ප්‍රධාන වැඩබිම් ප්‍රදේශ කිතුල්ගල නගරයට ආසන්න වන්නට කොළඹින් ඊසාන දෙසට කි.මී. 90 ක් පමණ එපිටට වන්නට පිහිටා ඇත.

ප්‍රධාන වේල්ල, ප්‍රධාන උමඟ, විහිදුම් උමඟ, විදුලි බලාගාරය, ස්විච් අංගයන සහ සම්ප්‍රේෂණ මාර්ගයද ඇතුළත් ප්‍රධාන ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කොට, 2022 වසරේ මුල් භාගයේදී ජාතික ජාලයට සම්බන්ධ කරන ලදී.

කිතුල්ගල ප්‍රදේශයේ දිය මත ජල පහුරු ක්‍රීඩා කටයුතු ආරක්ෂා කරනු පිණිස ලං.වි.ම. ට විශාල ජල ප්‍රමාණයක් මුදා හැරීමට සිදුවන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, වාර්ෂික බලශක්ති ජනනයේ අඩුවීමක් ඇතිවනු ඇත.

බ්‍රෝඩ්ලන්ඩ්ස් ජලවිදුලි ව්‍යාපෘතිය වූකලි දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියේ (UNFCCC) පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය (CDM) යටතේ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි මහාපරිමාණ ජලවිදුලි බලාගාරයකි.



*රූපය P1: බ්‍රෝඩ්ලන්ඩ්ස් බලාගාරයේ ස්විච් අංගනය*

## මොරගොල්ල ජලවිදුලි ව්‍යාපෘතිය

මොරගොල්ල ජලවිදුලි ව්‍යාපෘතිය සූදානම්කාරිත්ව කටයුතුවලින් සමන්විත A1 කොටසින්ද, ප්‍රධාන සිවිල් කටයුතුවලින් සමන්විත A2 කොටසින්ද, යාන්ත්‍රික සහ විදුලි පහසුකම්වලින් සමන්විත B කොටසින්ද, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ සහාය ආශ්‍රිත 3 කොටසින්ද යුත් කොටස් හතරකින් සමන්විත වේ. ව්‍යාපෘති විස්තර හා එක් එක් ව්‍යාපෘති උපාංගයන්හි ප්‍රගතියද පහත දක්වා ඇත:

| | | |
|---|---|---|
| **බලාගාර ධාරිතාව** | මෙ.වො. 30.5 | |
| **අරමුදල්කරණ සැකසුම්** | අංක 3146 (SF)/3147-SRI දරන ආසියානු සංවර්ධන බැංකු ණය | |
| **ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය** | **විදේශ අරමුදල්** | එ.ජ.ඩො. මිලියන 113.9 |
| | **ශ්‍රී ලංකා රජයේ අරමුදල් (ලං.වි.ම.)** | රු. මිලියන 3,958 |
| **නිම කිරීමට අපේක්ෂිත දිනය** | 2024 මැයි | |
| **අපේක්ෂිත වාර්ෂික බලශක්තිය** | ගි.වො.පැ. 100 | |
| **ව්‍යාපෘති උපාංගය** | **භෞතික ප්‍රගතිය** | **කොන්ත්‍රාත්කරු** |
| සූදානම්කාරිත්ව කටයුතු | 76% | වී.වී. කරුණාරත්න සහ සමාගම |
| ප්‍රධාන සිවිල් කටයුතු | 40% | චීනයේ Gezhouba Group සමාගම |
| යාන්ත්‍රික හා විදුලි පහසුකම් | 28% | චීනයේ Dongfang Electric International Corporation ආයතනය |

## උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරවනු ලබයි. ව්‍යාපෘතියේ විද්‍යුත් යාන්ත්‍රික කටයුතු සඳහා තාක්ෂණික උපදෙස් සේවා සපයනු පිණිස ලං.වි.ම. තාක්ෂණික කාර්ය මණ්ඩලය උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය වෙත අනුයුක්ත කොට ඇත. ව්‍යාපෘතියේ විස්තර පහත පරිදි වේ.

| | |
|---|---|
| **ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය** | එ.ජ.ඩො. මිලියන 530 |
| **කොන්ත්‍රාත්කරු** | ඉරානයේ FARAB සමාගම |
| **කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය** | අගෝස්තු, 2023 |
| **භෞතික ප්‍රගතිය** | 98.5% |

# ව්‍යාපෘති අංශය (ඉතිරි කොටස)



*රූපය P2: රන්දෙණිය ස්විච් අංගනය*

## ද්‍රව ස්වභාවික වායු ව්‍යාපෘතිය (LNGP)

පාවෙන ගබඩා ප්‍රතිවායුකරණ ඒකකයක් (FSRU) හා නැව්ගත පද්ධතියක් යෙදවීම මගින් කෙරවළපිටිය හා කැළණිතිස්ස විදුලි බලාගාර වෙත ද්‍රව ස්වභාවික වායු සපයන බවට වගබලාගනු පිණිස ව්‍යාපෘති අංශය විසින් හැකි සියලු ක්‍රියාමාර්ග ගන්නා ලදී.

ඉදිකොට, හිමිකරගනිමින් ක්‍රියාත්මක කිරීමේ (BOO) පදනමින් පාවෙන ගබඩා ප්‍රතිවායුකරණ ඒකකය ස්ථානගත කිරීමේ හා කෙරවළපිටිය අක් වෙරළ ඉදිකොට, හිමිකරගනිමින් ක්‍රියාත්මක කොට පවරා දීමේ (BOOT) පදනමින් නැව්ගත පද්ධතිය සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු ක්‍රියාවලිය අනුගමනය කරමින් සුදුසුකම් ලත් ව්‍යාපෘති යෝජකවරයෙකු තෝරාගන්නා ලදී. 2022 අගෝස්තු මස අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුව විසින් ව්‍යාපෘති ගිවිසුම අනුමත කරන ලද අතර, කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ අනුමැතිය අපේක්ෂාවෙන් පසුවේ.

මේ අතර, ඉදිකොට, හිමිකරගනිමින් ක්‍රියාත්මක කොට පවරා දීමේ පදනමින් කෙරවළපිටිහ හා කැළණිතිස්ස ස්ථානගත විදුලි බලාගාර වෙත පාවෙන ගබඩා ප්‍රතිවායුකරණ ඒකකය වෙතින් ස්වභාවික වායු නලමාර්ග පද්ධතියක් ඉදිකිරීමේ කටයුතු සඳහා සුදුසු ව්‍යාපෘති යෝජකවරයෙකු ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් තෝරාගෙන ඇත. නලමාර්ග පද්ධතිය ස්ථානගත කිරීමේ කොන්ත්‍රාත් ගිවිසුම ව්‍යාපෘති යෝජක සමග සාකච්ඡා කරන ලදුව ව්‍යාපෘති ගිවිසුම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුව වෙතින් කෙටුම්පත් ගිවිසුම සඳහා අනුමැතිය අපේක්ෂාවෙන් පසුවේ.

2025 වනවිට විදුලි බලාගාරයන්හි භාවිතය සඳහා ස්වභාවික ද්‍රව වායු පවත්වාගන්නා බවට වගබලා ගැනීමට ලං.වි.ම. අපේක්ෂා කරයි.

## සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති

2022-12-31 දිනට සිදු කෙරෙමින් පවත්නා සම්ප්‍රේෂණ සංවර්ධන කාර්යයන්හි ප්‍රගතිය වගුව P1 තුළ දී ඇති අතර, එහි සැලසුම්ගත ප්‍රගතියට සාපේක්ෂව ලැබූ සැබෑ ප්‍රගතියෙහි වෙනස ප්‍රගති තීර වර්ණයන්ගෙන් දැක්වේ.

| | |
|---|---|
| වෙනස < 10% නම් | |
| 10% < වෙනස < 25% නම් | |
| 25% < වෙනස < 50% නම් | |
| 50% < වෙනස < 100% නම් | |

*වගුව P1: ක්‍රියාත්මකව පවත්නා ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය*

| ව්‍යාපෘතිය/ ශාඛාව | පැකේජය | පිරිවැය (රු. මිලියන) | 2022-12-31 දිනට භෞතික ප්‍රගතිය | නිම කෙරෙන දිනය |
|---|---|---|---|---|
| **සම්ප්‍රේෂණ ව්‍යාපෘති** | ව්‍යා.කළ.ඒ. 01: පිවිතුරු බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය - ක්‍රියාත්මක කිරීමට පෙර සිදුකළ යුතුවන කටයුතු | 405 | 68.4% | 2025 දෙසැම්බර් |
| | ව්‍යා.කළ.ඒ. 02: පිවිතුරු බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය - ක්‍රියාත්මක කිරීමට පෙර සිදුකළ යුතුවන කටයුතු | 462 | 50% | 2025 දෙසැම්බර් |
| | මන්නාරම, නාඩුකුඩා, ඇඹිලිපිටිය කොටුමා උපපොළ විශාලන ව්‍යාපෘතිය | 3,605 | 50% | 2023 දෙසැම්බර් |
| **ත්‍රිකුණාමලය ගල් අඟුරු විදුලි සංවර්ධන ව්‍යාපෘතිය** | හබරණ - වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය A කොටස ඉදිකිරීම - උපපොළ | 6,958 | 99.5% | 2023 ජුනි |
| | හබරණ - වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය B කොටස ඉදිකිරීම - සම්ප්‍රේෂණ මාර්ගය | 17,770 | 98.5% | 2023 සැප්තැම්බර් |

# ව්‍යාපෘති අංශය (ඉතිරි කොටස)

| ව්‍යාපෘතිය/ ශාඛාව | පැකේජය | පිරිවැය (රු. මිලියන) | 2022-12-31 දිනට භෞතික ප්‍රගතිය | නිම කෙරෙන දිනය |
|---|---|---|---|---|
| සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති | මාදම්පේ - අම්පාර කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම | 3,206 | 10.0% | 2025 ජනවාරි |
| | වික්ටෝරියා - රන්ටැඹේ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | 1,400 | 5.0% | 2024 දෙසැම්බර් |
| | අතුරුගිරිය - කොළොන්නාව කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය විශාලනය | 170 | 13.0% | 2024 ජූනි |
| | පූනරින් - කිළිනොච්චි කි.වෝ. 220 ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | 3,400 | 9.0% | 2025 දෙසැම්බර් |
| | කොළොන්නාව - පන්නිපිටිය කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම | 960 | 6.0% | 2024 ජූනි |
| | කැළණිතිස්ස - කොළොන්නාව කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගයේ උස ඉහළ නැංවීම | 702 | 9.0% | 2024 අප්‍රේල් |
| | නව අනුරාධපුර කොටුමා උපපොළෙහි මෙ.වෝ.ඈ. 2x50 ප්‍රතිචාරකය හා මන්නාරම කොටුමා උපපොළෙහි මෙ.වෝ.ඈ. 1x50 ප්‍රතිචාරකය ස්ථාපනය | 1,463 | 100.0% | 2023 මාර්තු |
| | වගවත්ත කොටුමා උපපොළ ඉදිකිරීම (මෙ.වෝ.ඈ. 2x45) | 1,898 | 76.0% | 2023 දෙසැම්බර් |
| | කැළණිතිස්ස කි.වෝ 132 ගෑස් පරිවරණිත ස්විච්ගියරය පුළුල් කිරීම | 464 | 80.0% | 2024 මාර්තු |
| | නව පොල්පිටිය ස්විච්කරණ ස්ථානයේ කි.වෝ. 220 ද්විත්ව බස්බාර් සම්ප්‍රේෂණ මාර්ග කඩ දෙකක් ඉදිකිරීම | 291 | 98.0% | 2023 මාර්තු |
| | කොටුගොඩ විශාලන කටයුතු | 73 | 68.0% | 2023 ජූනි |
| | බලන්ගොඩ විශාලන කටයුතු | 67 | 55.0% | 2023 ජූලි |
| | අතුරුගිරිය විශාලන කටයුතු | 15 | 53.0% | 2023 මැයි |
| | රත්මලාන කොටුමා උපපොළෙහි කි.වෝ. 33 පෝෂක කඩ දෙකක් ඉදිකිරීම | 148 | 100.0% | 2023 සැප්තැම්බර් |
| | රන්ටැඹේ ස්විච් අංගනයේ කි.වෝ. 220 වායු පරිවරණිත ස්විච්ගියරය ඉදිකිරීම | 2,809 | 6.0% | 2025 දෙසැම්බර් |
| | වික්ටෝරියා විදුලි බලාගාරයේ කි.වෝ. 220 1 $^{1}/_{2}$ බ්‍රේකර් පද්ධතියක් ඉදිකිරීම | 229 | 8.0% | 2023 දෙසැම්බර් |
| | රන්දෙණිය (උමාඔය ජල විදුලි ව්‍යාපෘතිය) කි.වෝ. 132 ස්විච් අංගනය ඉදිකිරීම | 350 | 85.0% | 2023 ජූනි |
| | අම්පාර කොටුමා උපපොළේ කි.වෝ. 132 තනි බස්බාර් සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | 85 | 5.0% | 2023 දෙසැම්බර් |
| මහ කොළඹ සම්ප්‍රේෂණ හා හානි අවමකරණ ව්‍යාපෘතිය | කෙරවළපිටිය සිට කොළඹ L දක්වා දෙවන කි.වෝ. 220 කේබලය ඉදිකිරීම | 9,119 | 9.5% | 2024 ඔක්තෝබර් |
| | කොළඹ නගර සම්ප්‍රේෂණ ජාල සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 2 | 30,295 | 0.0% | 2025 ජූනි |

# ව්‍යාපෘති අංශය (ඉතිරි කොටස)

| ව්‍යාපෘතිය/ ශාඛාව | පැකේජය | පිරිවැය (රු. මිලියන) | 2022-12-31 දිනට භෞතික ප්‍රගතිය | නිම කෙරෙන දිනය |
|---|---|---|---|---|
| හරිත විදුලි සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය - අදියර II | කැස්බෑව හා කළුතර කොටුමා උපපොළයන් ඉදිකිරීම හා නව අනුරාධපුර හා පැරණි අනුරාධපුර කොටුමා උපපොළයන් විශාලනය | 2,738 | 100.0% | 2023 පෙබරවාරි |
| | අදියර 2 - පැකේජය 9 : කෙරවළපිටිය කි.වෝ. 220 ස්විච්චිකරණ ස්ථානය | 2,910 | 42.0% | 2023 සැප්තැම්බර් |
| | ව්‍යා.කළ.ඒ. 2 - පැකේජය 3/A1 කොටස - කොළඹ B කොටුමා උපපොළ, කි.වෝ. 132 වර්ග මිමී 800 කේබලය කොළඹ C සිට කොළොන්නාව දක්වා තනි ඇතුළු හා පිටත සම්බන්ධතාවය ඉදිකිරීම සහ කොළඹ C සහ කොළොන්නාව කොටුමා උපපොළයන් විශාලනය | 1260.8 | 97.0% | 2023 මැයි |
| | ව්‍යා.කළ.ඒ. 2 - පැකේජය 3/A2 කොටස - කොටුගොඩ, කොළොන්නාව, පාදුක්ක, හොරණ, දෙහිවල සහ මාදම්පේ කොටුමා උපපොළයන් විශාලනය | 2316.32 | 98.5% | 2022 දෙසැම්බර් |
| | ව්‍යා.කළ.ඒ. 2 - පැකේජය 8/B කොටස - අම්බලන්ගොඩ කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය, පන්නල කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය හා කි.වෝ. 132/33 මෙ.වෝ.ඇ. 31.5 අතිරේක තරාපැව් 2 ක් සැපයීම | 1493.9 | 16.0% | 2024 ජනවාරි |
| | විදුලි සැපයුම් විශ්වසනීයත්වය ප්‍රවර්ධනයට සහාය දැක්වීමේ ව්‍යාපෘතිය (SESRIP) : පැකේජය 7 - A1 කොටස: - පන්නිපිටිය කොටුමා උපපොළෙහි මෙ.වෝ.ඇ. 100 කැඩුම් ස්විච ධාරිත්‍රකය (BSC) ස්ථාපනය | 1103.5 | 88.9% | 2023 පෙබරවාරි |
| | විදුලි සැපයුම් විශ්වසනීයත්වය ප්‍රවර්ධනයට සහාය දැක්වීමේ ව්‍යාපෘතිය : (SESRIP) පැකේජය 7 - A2 කොටස : බියගම කොටුමා උපපොළෙහි ස්ථිතික වාර පද්ධතිය (SVS) ස්ථාපනය | 1680.8 | 71.0% | 2023 මැයි |
| | විදුලි සැපයුම් විශ්වසනීයත්වය ප්‍රවර්ධනයට සහාය දැක්වීමේ ව්‍යාපෘතිය (SESRIP) : පැකේජය 7 - A3 කොටස : කොළඹ නගර කොටුමා උපපොළෙහි මෙ.වෝ.ඇ. 124 කැඩුම් ස්විච ධාරිත්‍රක කඩ ස්ථාපනය හා තුල්හිරිය කොටුමා උපපොළෙහි අවසුසරගත කැඩුම් ස්විච ධාරිත්‍රක කඩ මාරු කිරීම | 1704.8 | 0.0% | 2023 දෙසැම්බර් |
| | පැකේජය 1/B කොටස - නව පොල්පිටිය - හම්බන්තොට සම්ප්‍රේෂණ මාර්ගය | 5,794 | 93.8% | 2023 මාර්තු |
| | පැකේජය 2/B2A කොටස - පාදුක්ක - හොරණ කි.වෝ 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | 592 | 41.3% | 2023 ජුනි |
| ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන හා කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය | පැකේජය 1 : කි.වෝ. 400, කි.වෝ. 220 හා කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම | 13,003 | 60.2% | * |
| | පැකේජය 2 : කොටුමා උපපොළ ඉදිකිරීම හා විශාලනය | 7,418 | 90.0% | 2023 අප්‍රේල් |
| | පැකේජය 3 : සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම (කි.වෝ. 220, කි.වෝ. 132) | 12,000 | 60.0% | ** |
| | පැකේජය 4 : බෙදාහැරීමේ උපපොළ හා කේබල ඉදිකිරීම (කි.වෝ. 33, කි.වෝ. 11, කි.වෝ. 0.4) | 4,594 | 40.0% | |

** නොගෙවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව අත්හිටුවා ඇත.*

*** කොන්ත්‍රාත්කරු නොගෙවීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවසන් කළේය.*

## වසර තුළ මුහුණ පෑමට සිදුවූ අභියෝග

රටතුළ පැවති ආර්ථික අර්බුදය හේතුකොට සැපයුම් දාමයට සිදුවූ බාධාකාරිත්වය ව්‍යාපෘති ඉදිකිරීම් අතරතුර අංශයට මුහුණ පෑමට සිදුවූ පළමු අභියෝගය විය. ඉන්ධන සම්බන්ධයෙන් රජය විසින් පනවන ලද සීමාකරණයන් හේතුකොට ඉදිකිරීම් ද්‍රව්‍ය හා උපකරණ ප්‍රවාහන ප්‍රමාදයන් ඇතිවිය. තවද, විදේශයන්ගෙන් සපයන ලද උපකරණද විදේශ විනිමය හිඟතාවය හේතුකොට ලැබීම ප්‍රමාද විය. මෙමගින් ව්‍යාපෘති කාල රාමුවල සැලකිය යුතු ප්‍රමාදයක් ඇති කෙරිණි.

දෙවනුව, රුපියලේ අවප්‍රමාණය වීම හේතුකොට ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ඉහළ යාම තුළ පිළිගත හැකි මට්ටම් ඉක්මවා කොන්ත්‍රාත්කරුවන් විසින් ප්‍රමාණ බිල්පත්වල (BOQ) සුවිශාල ප්‍රතිශෝධනයන් ඉල්ලා සිටින ලද බැවින්, එමගින්ද කොන්ත්‍රාත් ව්‍යාපෘතිවලට සැලකිය යුතු බලපෑමක් එල්ල විය. නිසි කලට ප්‍රතිශෝධිත ප්‍රමාණ බිල්පත් අනුමත කරගැනීමේ මෙකී දුෂ්කරතාවය මගින් ඉදිකිරීම් කටයුතු ආශ්‍රිත ප්‍රමාදයන් සිදුවූ අතර, එමගින් ව්‍යාපෘති කාල රාමුවලටද බලපෑම් එල්ල විය.

මෙයට අමතරව, විදේශ අරමුදල්ගත ණය මුදල් අත් හිටුවීම තුළ ව්‍යාපෘති සඳහා අරමුදල් හිඟයක් ඇතිවූ බැවින් එමගින් ව්‍යාපෘති ප්‍රගතියට හා සමාලෝචිත වසර තුළ ඒවා අවසන් කිරීම කෙරෙහිද බරපතල බලපෑම් කළ අතර, එමගින් ඉදිකිරීම් පිරිවැය, උපකරණ මිලදී ගැනීම ආදී ව්‍යාපෘති වියදම් ආවරණය කරගැනීමේ දුෂ්කරතා ඉස්මතු විය.

මෙහෙයුම් සමාලෝචනය

# වත්කම් කළමනාකරණ අංශය



ලක්විජය විදුලි බලාගාරය

# වත්කම් කළමනාකරණ අංශය

ආයතනික වත්කම් කාර්යක්ෂම හා ඵලදායී ලෙස උපයෝජනය කෙරෙන බවට වගබලාගනු පිණිස ඒවා අධීක්ෂණය කරමින් පවත්වාගෙන යාමේ වගකීම වත්කම් කළමනාකරණ අංශය සතුවේ. මෙම අංශය ලංකා විදුලිබල මණ්ඩලය ආශ්‍රිත ආර්ථික අභිවෘද්ධිය, සමාජ ප්‍රවර්ධනය හා පාරිසරික සංවර්ධනය උදෙසා තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරන අතර එය පහත විස්තර කොට ඇති පරිදි ශාඛා පහකින් සමන්විත වේ.

වත්කම් කළමනාකරණ හා ආයතනික ශාඛාවේ වගකීම වනුයේ මානව සම්පත් ප්‍රශස්ත උපයෝජනය හරහා වත්කම් කළමනාකරණ අංශයේ නිසි ක්‍රියාකාරිත්වයක් සිදුවන බවට වගබලා ගැනීමයි. ශාඛාවේ ප්‍රධාන වගකීම් වනුයේ ලං.වි.ම. ඉඩම් හා ගොඩනැගිලි වඩාත් යහපත් අන්දමින් කළමනාකරණය හා ව්‍යවස්ථාපිත කර්තව්‍යයනට බලපෑමක් සිදුවීමෙන් තොරව ප්‍රධාන කටයුතු හැරුණු කොට පවත්නා සෙසු කටයුතු සඳහා දැනට පවත්නා සම්පත් හා වත්කම් උපයෝගි කරගනිමින් අතිරේක ආදායමක් උත්පාදනය කිරීමයි.

සිවිල් වැඩ හා ගොඩනැගිලි ශාඛාවට නව ගොඩනැගිලි ඉදිකිරීම, දැනට පවත්නා ගොඩනැගිලි නවීකරණය හා ඒවා පුළුල් කිරීම සහ ලං.වි.ම. මූලස්ථානය සහ සංචාරක බංගලා නඩත්තුවද ඇතුළත් කාර්යයන් පැවරේ. සිවිල් වැඩ හා ගොඩනැගිලි ශාඛාව යටතේ ස්ථාපිත ව්‍යුහාත්මක සැලසුම් ඒකකය විසින් නවීනතම මෘදුකාංග භාවිතයෙන් ආකෘති සැලසුම් සිදුකිරීමත් හා ඒ ආශ්‍රිත ඇඳීම් සිදු කිරීමත් සිදු කරනු ලැබේ.

වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ ශාඛාවේ අරමුණ වනුයේ සිදුවන අනතුරු හා තුවාල වීම් සංඛ්‍යාව අවම කරනු පිණිස ආරක්ෂිත වැඩ පරිසරයක් හා සේවා නියුක්තිකයන් අතර සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවයක් ඇති කරවනු ලබන බවට වගබලා ගැනීම හරහා ආයතනය තුළ ආරක්ෂක සංස්කෘතිය වැඩිදියුණු කිරීමයි.

සේවා නියුක්තිකයන් හට ඔවුන්ගේ කුසලතා, දැනුම හා හැකියාවන්ද වැඩිදියුණු කරගනු පිණිස පුහුණු වැඩසටහන් ඇතිකොට ක්‍රියාත්මක කිරීමේ වගකීම පුහුණු ශාඛාව සතුවේ. පුහුණුව වූකලී තාක්ෂණික ප්‍රගතිය හේතුකොට නිරන්තරයෙන් වෙනස් වන්නාවූ තාක්ෂණික කුසලතාවයන් හා දැනුම පිළිබඳ අවශ්‍යතා හා අනුගත වෙමින් පූර්ණතම මට්ටමට පාරිභෝගික අපේක්ෂාවන් තෘප්ත කරනු පිණිස අපගේ සේවා නියුක්තිකයන්ගේ ආකල්ප වැඩිදියුණු කිරීම සඳහාද අත්‍යවශ්‍ය මෙවලමකි. මෙම ශාඛාව යටතේ පිහිටුවා ඇති පිලියන්දල පුහුණු මධ්‍යස්ථානය විදුලි ශිල්පී, කම්බිමාර්ගකරු, යාන්ත්‍රික ශිල්පී හා වෑද්දුම්කරු වෘත්තීන් සඳහා NVQ 4 මට්ටමේ සහතික ලබාදීම උදෙසා පිළිගත් ආයතනයක් බවට පත්කොට ඇත.

වැඩපොළ හා උපකාරක සේවා ශාඛාව විදුලි බලාගාර ඒකකය, විදුලි සෝපාන ඒකකය, වායු සමීකරණ හා ශීතකරණ ඒකකය සහ මධ්‍යම වැඩපල සහ ගරාජ් ඒකකය යන ඒකකයන්ගෙන් සමන්විතවන අතර, ඉල්ලීම් සිදු කළහොත් ඒ අනුව උපකරණ සේවාකරණ, අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු සිදු කරයි.

මෙයට අමතරව, මෙම අංශය යටතේ ස්ථාපිත ආරක්ෂක ඒකකය ආයතනයේ ජීවිත හා දේපළ ආරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතුවන ඒකකය වේ.

## මෙහෙයුම් කාර්ය සාධනය

### පුහුණුව

වගුව A1 තුළ සවිස්තරාත්මකව දක්වා ඇති පරිදි පුහුණු ශාඛාව විසින් 2022 වසර තුළ පුහුණුවන්නන් 5,917 දෙනෙකු සඳහා පුහුණුව ලබාදෙන ලදී.

*වගුව A1: 2022 වසර තුළ පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව*

| පුහුණු පාඨමාලාව / කාණ්ඩය | සහභාගිවූවන් සංඛ්‍යාව | |
|---|---|---|
| | පිළියන්දල පුහුණු මධ්‍යස්ථානය | කාසල්රී පුහුණු මධ්‍යස්ථානය |
| මධ්‍යම මට්ටමේ තාක්ෂණික සේවා කාර්ය මණ්ඩලය | 297 | - |
| කාර්මික ශ්‍රේණි | 2,662 | 561 |
| ලිපිකරු හා සමාන්තර සේවා | 1,258 | - |
| කාර්යාල කාර්ය සහායක සේවය | 156 | - |
| ඉංජිනේරුවරුන් සඳහා සිදුකරනු ලබන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන කටයුතු | 393 | 34 |
| ලිපිකරු සේවා සඳහා සිදුකරනු ලබන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන කටයුතු | 180 | 129 |
| කාර්මික ශ්‍රේණි සඳහා සිදුකරනු ලබන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන කටයුතු | 13 | 140 |
| බාහිර ආයතන | - | 94 |
| **එකතුව** | **4,959** | **958** |

වසංගත සමයෙන් අනතුරුව 2022 වසරේදී ලං.වි.ම. ට සිය සේවා නියුක්තිකයන් විදේශීය තාක්ෂණික පුහුණු, පරීක්ෂණ සහ සෙසු නිල ගමන් සඳහා යොමු කිරීමට හැකිවිය. ඒ අනුව, පිළිවෙලින් සේවා නියුක්තිකයන් 21, 67 හා 16 බැගින් වූ සංඛ්‍යාවනට විදේශ පුහුණු, පරීක්ෂා සහ නිල චාරිකා ලබාගත හැකිවිය.

පුහුණු ශාඛාවට සමාලෝචිත වසර තුළ සෙසු දේශීය ආයතනයන්හි පුහුණුව සඳහා විධායක නිලධාරීන් 24 දෙනෙකු සහ මධ්‍යම මට්ටමේ කාර්මික කාර්ය මණ්ඩල සාමාජිකයන් හත්දෙනෙකුද පිටත්කර යැවිය හැකි විය. මෙයට අමතරව, ශාඛාව විසින් ආයතනය තුළ කාර්මික පුහුණුව සඳහා ඉංජිනේරු උපාධි අපේක්ෂකයන් හා ඩිප්ලෝමා මට්ටමේ සිසුන් 396 දෙනෙකු සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලදී.

තවද, ශාඛාව විසින් සමාලෝචිත වසර තුළ පිළිවෙලින් 984, 206 හා 86 දෙනෙකු උදෙසා ප්‍රථමාධාර, ගිනි ආරක්ෂක සහ ඵලදායිතා පුහුණුව ලබාදෙන ලදී. පුහුණුවලට අමතරව 2022 වසර තුළ උසස් කිරීමේ විභාග 1,626 ක්ද, බඳවා ගැනීමේ විභාග 371 ක්ද පවත්වන ලදී.

# වත්කම් කළමනාකරණ අංශය (ඉතිරි කොටස)

## ඩීසල් විදුලි ජනන යන්ත්‍ර, වායු සමීකරණ ඒකක, සෝපාන ඒකක සහ ලං.වි.ම. වාහන අලුත් වැඩියාව සහ නඩත්තුව

2022 වසර තුළ සිදුකරන ලද ඩීසල් ජනන යන්ත්‍ර, වායු සමීකරණ ඒකක, සෝපාන ඒකක හා ලං.වි.ම. වාහන ආශ්‍රිත අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු පිළිබඳ විස්තර වගුව A2 තුළ දක්වා ඇත.

*වගුව A2: වැඩපළ සහ ආශ්‍රිත සේවා සම්බන්ධ කාර්ය සාධන විස්තර*

| කාර්ය කාණ්ඩය | කාර්ය සංඛ්‍යාව | ඇස්තමේන්තුගත පිරිවැය (රු. මිලියන) |
|---|---|---|
| ඩීසල් ජනන යන්ත්‍ර කුලියට ලබාදීම, නඩත්තුව සහ අලුත්වැඩියා කටයුතු. | 323 | 524 |
| වායු සමීකරණ ඒකකයන්හි වාර්ෂික නඩත්තු සේවා, නව ස්ථාපනයන්, අලුත්වැඩියාවන් සහ ප්‍රතිසංස්කරණ කටයුතු. | 628 | 376.5 |
| සෝපාන ඒකක ආශ්‍රිත වාර්ෂික නඩත්තු සේවා, නව ස්ථාපනයන්, අලුත්වැඩියාවන්, ප්‍රතිසංස්කරණ, පරීක්ෂණ සහ උපදේශන සේවා. | 52 | 46.8 |
| වාහන පිරිසැකසුම්, නිෂ්පාදන, අලුත්වැඩියා සහ සේවාකරණ කටයුතු. | 447 | 48.6 |

නවීන සේවා තාක්ෂණය හා ගුණාත්මක කළමනාකරණ පද්ධතීන් ඇතුළත් කරමින් ගෘහස්ථ වාහන සේවාකරණ පහසුකම ප්‍රවර්ධනය කොට ඇත. ඒ අනුව, වසර තුළ වාහන 302 ක් සේවාකරණ කරන ලද අතර, එය පසුගිය වසර හා සාපේක්ෂව 30% ක වර්ධනයකි.



*රූපය A1: වාහන සේවා කටයුතු*

## ගොඩනැගිලි ඉදිකිරීම්, නඩත්තුව හා අලුත්වැඩියාවන්

සිවිල් වැඩ හා ගොඩනැගිලි ශාඛාව විසින් සිදුකරන ලද ගොඩනැගිලි ඉදිකිරීම්, නඩත්තු හා අලුත්වැඩියා කටයුතු ආශ්‍රිත කාර්ය සාධනය වගුව A3 තුළ දක්වා ඇත.

*වගුව A3: ගොඩනැගිලි ඉදිකිරීම්, නඩත්තු හා අලුත්වැඩියාවන් ආශ්‍රිත කාර්ය සාධනය - 2022 වසර*

| කාර්ය විස්තරය | වටිනාකම (රු. මිලියන) |
|---|---|
| පිළියන්දල පුහුණු මධ්‍යස්ථානයේ දෙමහල් වැඩපළ ගොඩනැගිල්ල ඉදිකිරීම. | 44 |
| කොළොන්නාව විදුලි වැඩපළ ප්‍රතිසංස්කරණය සහ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම. | 11.5 |
| කතරගම සංචාරක බංගලාව නවීකරණය. | 51.4 |
| පොළොන්නරුව ප්‍රාදේශීය කාර්යාලයේ අභ්‍යන්තර නිමැවුම් කටයුතු. | 11.7 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික හා නියාමන සම්බන්ධතා) සම්ප්‍රේෂණ කාර්යාල කටයුතු විතැන් කිරීම. | 9.9 |
| **එකතුව** | **128.5** |

## වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ වැඩසටහන් හා ආරක්ෂක පරීක්ෂණ

2022 වසර තුළ ආරක්ෂිත වැඩ පරිසරයක් සහතික කරනු පිණිස සිදුකරන ලද වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ වැඩසටහන් හා ආරක්ෂක නිරීක්ෂණ පිළිබඳ විස්තර වගුව A4 තුළ නිරූපණය කර ඇත.

*වගුව A4: සෞඛ්‍ය හා ආරක්ෂක වැඩසටහන් හා පරීක්ෂාවන් පිළිබඳ විස්තර*

| අංශය | ආරක්ෂක පරීක්ෂාවන් සංඛ්‍යාව | ආරක්ෂක වැඩසටහන් | |
|---|---|---|---|
| | | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගීවූවන් සංඛ්‍යාව |
| ජනන | 2 | 3 | 99 |
| සම්ප්‍රේෂණ | - | 1 | 60 |
| බෙදාහැරීමේ | 19 | 29 | 1,663 |
| වෙනත් | 1 | 9 | 338 |
| **එකතුව** | **22** | **42** | **2,160** |

## හදිසි අනතුරු පිළිබඳ සාරාංශය

වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂණ ශාඛාව වෙත හදිසි අනතුරුවලින් තොර ආරක්ෂිත වැඩ පරිසරයක් හා සෞඛ්‍යාරක්ෂිත සේවා බලකායක් නිර්මාණය කිරීමේ වගකීම පැවරී ඇත. 2022 වසර සඳහා වූ ආයතනික හදිසි අනතුරු සාරාංශය රූපය A2 තුළ දක්වා ඇති අතර, ආරක්ෂිත වැඩ පරිසරයක් සහතික කරනු පිණිස විදුලි බලාගාර, කොටුමා උපපොළයන් සහ ක්ෂේත්‍ර සේවා නියුක්තිකයන් විසින් සිදුකරනු ලබන වැඩබිම් කටයුතු පරීක්ෂා කරනු පිණිස වූ සිය ආරක්ෂක පරීක්ෂාවන්/වැඩබිම් පරීක්ෂාවන් සංඛ්‍යාව පුළුල් කිරීමට ශාඛාව විසින් සැලසුම් සකස් කරමින් පවතී.




*රූපය A4: කොන්ත්‍රාත් සේවා නියුක්තිකයන්ද ඇතුළත්ව බරපතල හා වාර්තා කළ යුතු මට්ටමේ හදිසි අනතුරු*

## ඉඩම් හා ගොඩනැගිලි විස්තර

2022 වසර අවසානය වනවිට ඉඩම් හා ගොඩනැගිලි හඳුනා ගැනීම, මැනීම හා තක්සේරුකරණය පිළිවෙලින් වගු අංක A5 සහ A6 තුළ දක්වා ඇත.

*වගුව A5: 2022 වසර අවසානය වනවිට ඉඩම් සම්බන්ධ විස්තර*

| අංශය | ඉඩම් සංඛ්‍යාව | ඉඩම් විශාලත්වය | | | වටිනාකම (රු. මිලියන) |
|---|---|---|---|---|---|
| | | අ. | රූ. | ප. | |
| බෙදාහැරීමේ අංශය 1 | 206 | 157 | 0 | 31.6 | 8,206 |
| බෙදාහැරීමේ අංශය 2 | 398 | 138 | 1 | 35.5 | 5,252 |
| බෙදාහැරීමේ අංශය 3 | 128 | 66 | 2 | 0.9 | 3,420 |
| බෙදාහැරීමේ අංශය 4 | 161 | 66 | 3 | 1.1 | 3,835 |
| වත්කම් කළමනාකරණ | 5 | 45 | 2 | 14.6 | 5,366 |
| සම්ප්‍රේෂණ | 123 | 409 | 2 | 6.3 | 15,413 |
| ජනන | 3092 | 6274 | 2 | 19.1 | 689 |
| **එකතුව** | **4,113** | **7,158** | **2** | **29.2** | **42,181** |

*වගුව A5: 2022 වසර අවසානය වනවිට ගොඩනැගිලි සම්බන්ධ විස්තර*

| අංශය | ගොඩනැගිලි සංඛ්‍යාව | විශාලත්වය වර්ග අඩි 000' අගයෙන් |
|---|---|---|
| බෙදාහැරීමේ අංශය 1 | 271 | 2,701.3 |
| බෙදාහැරීමේ අංශය 2 | 417 | 3,336.9 |
| බෙදාහැරීමේ අංශය 3 | 215 | 2,083.1 |
| බෙදාහැරීමේ අංශය 4 | 168 | 3,448.7 |
| වත්කම් කළමනාකරණ | 75 | 253.4 |
| සම්ප්‍රේෂණ | 110 | 477.8 |
| ජනන | 1,044 | 2,966.7 |
| ව්‍යාපෘති | 30 | 103.0 |
| ආයතනික ක්‍රමෝපාය | 8 | 81.8 |
| **එකතුව** | **2,338** | **15,452.7** |

## උද්දීපනයන්

- 'උාණ උපයෝජිත සම්පත්වලින් ආදායම් ජනනය' නමැති ආයතනික ක්‍රමෝපාය හා අනුගතව පාවෙන ගුවන් යානා සහ බෝට්ටු සේවා මෙහෙයුම් කටයුතු වැනි සංචාරක සහ විනෝදාස්වාද කටයුතු සඳහා සංචාරක ක්ෂේත්‍රය වෙත ජලාශ බදුදෙන ලදී. කාසල්රී ජලාශයේ බොට්ටු සේවා සහ පාවෙන ගුවන් යානා ක්‍රියාත්මක කරවීම සඳහා MJF Holdings and Saffron Aviation ආයතනය සමගින් එළැඹි ගිවිසුම වර්ෂය තුළ සාර්ථකව ඉදිරියට ගමන් කළ අතර, කාසල්රී ජලාශයේ බෝට්ටු මෙහෙයුම් කටයුතු වෙනුවෙන් Farm Resort Collection (Pvt) Ltd. ආයතනය සමගින් නව ගිවිසුමක් අත්සන් කරන ලදී.

- සෘජුව දත්ත කළමනාකරණ පද්ධතිය තුළ ඉඩම් ආශ්‍රිත දත්ත ගබඩා කරනු පිණිස ලං.වි.ම. පළාත්වල අවසරලත් භාවිතයන් සඳහා කැපවූ ප්‍රවේශ අවසරයක් "CEBAssist" මෘදුකාංගය තුල ස්ථාපනය කරන ලදී.

- නිවැරදි හිමිකාරිත්ව ලේඛන රහිත, ලං.වි.ම. විසින් භාවිත කරනු ලබන ඉඩම්වල හිමිකාරිත්වය ලබාගනු පිණිස අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් කෙටුම්පත් කොට භාරදෙන ලදී.

- 2022 වසර තුළ ලං.වි.ම. වත්කම් ලේඛනය ජනන අංශය වෙතින් හඳුනා ගන්නා ලද ඉඩම් කට්ටි 326 ක්ද, වෙනත් අංශයන් විසින් හඳුනා ගන්නා ලද ඉඩම් කට්ටි අටක්ද ඇතුළත් වන පරිදි ජනන අංශයේ මුළු ඉඩම් කට්ටි 3,092 ක්ද, සෙසු අංශයන්හි ඉඩම් කට්ටි 1,021 ක්ද සකස් කිරීමේ කාර්යය සාර්ථකව ඉදිරියට ගෙන යන ලදී.

- අනවසර ඇතුළුවීම් පිළිබඳ විස්තර ඒකරාශි කරනු පිණිස මාවුස්සාකැලේ ජලාශ පරිශ්‍රයෙහි ප්‍රජා සමීක්ෂණයක් ආරම්භ කරන ලදී. (රූපය A3)



*රූපය A3: මාවුස්සාකැලේ ජලාශ පරිශ්‍ර මැනුම*

මෙහෙයුම් සමාලෝචනය

# ආයතනික ක්‍රමෝපාය අංශය




තරු ශ්‍රේණිගත කිරීමේ සම්මාන වැඩසටහන - කඩවත

# ආයතනික ක්‍රමෝපාය අංශය

ආයතනික ක්‍රමෝපාය අංශය ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාව, ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු ශාඛාව, ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව, තොරතුරු තාක්ෂණ ශාඛාව සහ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව නමින් යුත් ශාඛා පහකින් සමන්විත වේ.

ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය ශාඛාවට ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන කටයුතුවලට අදාළව ක්‍රමෝපාය සකස් කිරීමේ තීරණාත්මක කාර්යභාරය පැවරී ඇත. මෙයට අමතරව, ආයතනික සැලැස්මේ දක්වා ඇති ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමෙහි ලා ආයතනයේ කාර්ය සාධනය අධීක්ෂණය කිරීමේ හා ආයතනයේ කීර්ති නාමය නංවාලීමේ වගකීම ශාඛාව වෙත පැවරී ඇත.

ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු ශාඛාව විසින් ලං.වි.ම. නිකුත් කළ ජනන, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ බලපත් ආශ්‍රිතව ඉස්මතුවන සියලු කරුණු සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන අතර, බලපත්ලාභීන් මෙන්ම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) සමගින්ද සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබයි. ඉහත කරුණුවලට අමතරව, අවසන් පරිශීලක විදුලි ගාස්තු ආශ්‍රිත ගැටලු සහ විදුලි ගාස්තු අධ්‍යයනයන් සම්බන්ධ කරුණු කාරණා ක්‍රියාත්මක කිරීමේ හා කටයුතු කිරීමේ වගකීමද මෙම ශාඛාව වෙත පැවරී ඇත.

ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන ශාඛාව ලං.වි.ම. කාර්ය ක්‍රමෝපාය, ප්‍රතිපත්ති හා ක්‍රියාවලි සංවර්ධන කටයුතු සංවර්ධන කාර්යයෙහි නියැළී සිටී. අදාළ මෙහෙයුම් හා කාර්ය අත්පොත්හි සියලු පද්ධති හා කාර්ය පරිපාටි ලේඛනගත කොට ඇතුළත් කෙරෙන බවට වගබලා ගැනීමේ වගකීම ශාඛාව සතුවේ.

තොරතුරු තාක්ෂණ ශාඛාව ලං.වි.ම. ව්‍යාපාර ක්‍රියාවලි වටහා ගනිමින් කාර්යක්ෂමතාවය හා පාරිභෝගික තෘප්තිය ඇති කරලීම සඳහා ඒවා නිසි තාක්ෂණය සමගින් අනුගත කිරීමේ වගකීම දරයි. අංකිතකරණ හෙවත් ඩිජිටල්කරණ අවශ්‍යතාවයන් ඉටු කිරීමේදී තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් ගෘහස්ථ සංවර්ධනය, ආයතනයේ අවශ්‍යතාවනට ගලපනු ලබන බාහිර නිෂ්පාදන, තොරතුරු තාක්ෂණ ශාඛාවන් බාහිර පාර්ශවයන් වෙතින් සංවර්ධනයන් හා නවෝත්පාදනයන් උකහා ගැනීම සහ බාහිර සේවා ලබාගැනීම නමින් ක්‍රමෝපාය සතරක් භාවිත කරනු ලබයි.

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ ඒකකය, පර්යේෂණ හා සංවර්ධන ඒකකය සහ ආලෝකකරණ ප්‍රාදේශීය මධ්‍යස්ථානය යන ඒකක තුනකින් සමන්විත වේ. පර්යේෂණ හා සංවර්ධන ශාඛාව ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ කටයුතු හා පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලට වගකිව යුතුවේ. ශාඛාව විසින් පර්යේෂණ කටයුතු සම්බන්ධයෙන් මොරටුව විශ්වවිද්‍යාලය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමගින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කොට ඇත.

## උද්දීපනයන්

### අවසන් පරිශීලක ගාස්තු ප්‍රතිශෝධනය.

අංශය පිරිවැය පිළිබිඹු කරන්නාවූ විදුලි ගාස්තු සකස් කොට ක්‍රියාත්මක කිරීමේ ක්‍රමෝපායික වගකීම දරයි. කෙසේ වුවද, විදුලි ව්‍යාපාරයට අදාළ සියලු පිරිවැය සාධක සීඝ්‍ර වර්ධනයකට ලක් වුවද, 2014 වසරේ සිට ගාස්තු නොවෙනස්ව පැවතිණි. මේ අතර ගාස්තු ක්‍රමවේදය 2021 ජනවාරි මාසයේ ප්‍රතිශෝධනය කරන ලද අතර, ''ඒකරූපී ජාතික ගාස්තු (UNT)'' පිරවීමේ වගකීම ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙතින් ලං.වි.ම. වෙත පවරා ඇත. අනෙක් අතින්, ඉන්ධන ගාස්තු අවස්ථා ගණනාවකදී ප්‍රතිශෝධනය කරන ලද අතර රජය විසින් 2022 වසරේදී එ.ජ. ඩොලරයට සාපේක්ෂව දේශීය විනිමය පාවෙන්නට ඉඩ හැරීමට තීරණය කරන ලදී. ඒ අනුව, ලං.වි.ම. විසින් 2022 ජූනි මාසයේදී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙන් 229% ක ගාස්තු ඉහළ නැංවීමේ අවස්ථාවක් ඉල්ලා සිටින ලදී. සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පැවති වියදම්වලට ප්‍රතිචාරීව, වසර අටක නිහඬතාවයකින් අනතුරුව, දිනපතා පැය 3 ක අනුමත විදුලිය ඇණ හිටුවීමේ සැලැස්මක්ද සහිතව, 2022-08-10 දින සිට ක්‍රියාත්මකවන පරිදි 75% කින් විදුලි ගාස්තු ඉහළ නැංවීමත් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

කෙසේ වුවද, ගාස්තු ප්‍රතිශෝධනය හා සැලසුම්ගත විදුලිය ඇණ හිටුවීම් මධ්‍යයේ, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද 75% ක අනුමත ගාස්තු ක්‍රමයේ පවත්නා අප්‍රමාණවත්බව පිළිබිඹු කරමින් 2022 වසර සඳහා ලං.වි.ම. විසින් රු. බිලියන 272.9 ක සමස්ත ශුද්ධ අලාභයක් ලබා තිබිණි.

### සේවා සම්බන්ධයෙන් ලද පිළිගැනීම

''CEBAssist'' පද්ධතිය විසින්, මෘදුකාංග සේවා සමාගම් පිළිබඳ ශ්‍රී ලංකා සංගමය හෙවත් SLASSCOM විසින් පිරිනමනු ලබන රාජ්‍ය අංශයේ විශිෂ්ටත්වය පිළිගැනීමට අදාළ සම්මානය සහ බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ (BCS) ශ්‍රී ලංකා පාර්ශ්වයෙන් හොඳම ඩිජිටල්කරණ ක්‍රියාවලි හැකියාකරු සම්මානය නමැති සම්මාන දෙකම දිනාගන්නා ලදී. මැදි වෝල්ටීයතා නඩත්තු කළමනාකරණ පද්ධතියට (MVMMS) ගෘහස්ථ සංවර්ධන කාණ්ඩය යටතේ NBQSA-2022 ආශ්‍රිතව පිරිනමනු ලබන කුසලතා සම්මානය පිරිනමන ලද අතර, බලශක්ති කළමනාකරණ පද්ධතියට 2022 දී පවත්වන ලද ලං.වි.ම. නවෝත්පාදන තරගයේ දී විශේෂ ත්‍යාග යක් පිරිනමන ලදී.



රූපය C1: SLASSCOM සම්මානය

# ආයතනික ක්‍රමෝපාය අංශය (ඉතිරි කොටස)

2022 වසර තුළ අංශයට අදාළ සෙසු උද්දීපනයන් පහත දක්වා ඇත:

- ''CEBAssist'' වෙත වහළය මත සවිකරන යෙදවුම් පිරිසැකසුම්කරණ පද්ධතිය නමින්, බෙදාහැරීමේ කාර්ය මණ්ඩලයට පිරිසැකසුම් සූර්ය පැනල නිශ්කාශන ඉල්ලීම්, සම්බන්ධතා අයැදුම්පත්, අභ්‍යන්තර කාර්ය ධාරා, ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු ආදියට සම්බන්ධ වීමට අවකාශ සලසන්නාවූ නව මාදිලියක් එක් කරන ලදී.

- ලක්විජය විදුලි බලාගාර පාලන ගොඩනැගිල්ල, ලං.වි.ම. මූලස්ථාන ආපනශාලා ගොඩනැගිල්ල සහ සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති ගොඩනැගිල්ල සඳහා වහළය මත සවිකරන සූර්ය පැනල පද්ධතියක් නිර්මාණය කරන ලද අතර විශ්වසනීය සහ නිරවද්‍ය බලශක්ති පුරෝකථන පද්ධතියක් නිර්මාණය කරනු පිණිස සූර්ය පැනල පද්ධති උදෙසා වූ ජාතික බලශක්ති පුරෝකථන මාදිලියක් ගොඩනඟමින් පවතී.

- තොරතුරු තාක්ෂණ ශාඛාව විසින් ලබාදෙනු ලබන සේවයේ ගුණාත්මකභාවය නංවාලනු පිණිස ලං.වි.ම. අභ්‍යන්තර පාරිභෝගිකයන් වෙත අලුතින් සංවර්ධනය කරන ලද ස්වයංක්‍රියගත තොරතුරු තාක්ෂණ සේවා මේස මෘදුකාංග යක් දියත් කරන ලදී.

- පාරිභෝගික සේවා මධ්‍යස්ථාන (CSC) විසින් සලසනු ලබන සේවාවන් වර්ධනය කරනු පිණිස තරු ශ්‍රේණිගතකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන මගින් ලං.වි.ම. සමස්ත සේවා ගුණාත්මකභාවය සහ පාරිභෝගික තෘප්තිය විෂයයෙහි ධනාත්මක බලපෑමක් සිදුකරන ලදී. පාරිභෝගික සේවා මධ්‍යස්ථාන අතරින් බහුතරයක් දෙවන තරු තත්ත්වය සාක්ෂාත් කරගනිමින් හා බෙදාහැරීමේ අංශය 2 ට අදාළ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන අතරින් අඩකට වැඩි සංඛ්‍යාවක් විසින් තුන්වන තරු තත්ත්වය සාක්ෂාත් කරගනිමින්, 2022-12-31 දින වනවිට ලං.වි.ම. තරු ශ්‍රේණිගතකරණ යෝජනාක්‍රමය විසින් සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන තිබිණි.

- සැලකිය යුතු මට්ටම්වලින් දැන්වීම්කරණ සහ මුද්‍රණ පිරිවැය අවම කරනු පිණිස ඩිජිටල් ප්‍රකාශන ක්‍රම යොදා ගනිමින් නවෝත්පාදනීය පිරිවැය අවමකරණ ක්‍රමෝපායන් ගණනාවක් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. විදුලිය විසන්ධි කරලීමේ නිවේදන නැවත නිර්මාණය කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රකාශන පිරිවැය පහත වැටුණු අතරම සවිස්තරාත්මක තොරතුරු උදෙසා කියවන්නන් ලං.වි.ම. වෙබ් අඩවිය වෙත යොමුකරවන ලෙස මේවන විට කඩදාසිවල මුද්‍රණය කරනු ලබන සවිස්තරාත්මක තොරතුරු වෙනුවට QR කේතයක් ලබාදීම සඳහා කල්තබා වැඩ පිළිවෙලයන් යොදවන ලදී.

- මහජනතාව වෙත ලං.වි.ම. හා එහි විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ අධ්‍යාපනයක් ලබාදෙනු පිණිස ලං.වි.ම. යූටියුබ් නාලිකාව සඳහා, "හරිත අනාගතයක්" සාකච්ඡාමය වැඩසටහන නිර්මාණය කරන ලදී.

- ලං.වි.ම. පුරා විහිදෙන පරිදි විස්තීර්ණ මානව සම්පත් විගණන වැඩසටහනක් සම්පූර්ණ කරන ලද අතර, වෙනස්වන ව්‍යාපාර පරිසරයන්, තාක්ෂණික සංවර්ධනයන්, යටිතල පහසුකම් සංවර්ධනයන්, ඩිජිටල්කරණ වර්ධනයන් ද සැලකිල්ලට ගනිමින් නව කාර්ය සම්මතයන්ද සකස් කරන ලදී.

- ඇගයුම් ක්‍රියාවලිය වඩාත් ඒකරූපී, වඩාත් ඵලදායී හා කාර්යක්ෂම එකක් බවට පත් කරමින් භාෂාත්‍රයෙන්ම සකස් කරන ලද නව කාර්යසාධන ඇගයුම් කාර්ය පරිපාටි සහ ආකෘතිද හඳුන්වා දෙන ලදී.

- ලං.වි.ම. නිවාඩු රෙගුලාසි ප්‍රතිශෝධනය කොට පළ කරන ලදී (තුන්වන සංස්කරණය). තවද, 'වැටුප් හා වේතන අත්පොත' සහ 'මාරුවීම් රීති' සංශෝධනය කොට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

- පරිශීලකයන් හට ආකර්ශනීය සෙවුම් අත්දැකීමක් ලබාදෙනු පිණිස වඩා පුළුල් අංග ලක්ෂණ සහ උසස් සෙවුම් ක්‍රියාකාරිත්වයන්ද සහිතව චක්‍රලේඛ, අත්පොත් හා ලේඛන පද්ධතිය (CMDS) ප්‍රති-මාදිලිගත කරන ලදී.

- කාර්යබහුල ඉල්ලුම් කාල වේලාවන්වලදී ෆොසිල ඉන්ධන භාවිතය අවම කරමින් ඒ අනුව හරිතාගාර වායු විමෝචනයන් අවම කරනු පිණිස ජාත්‍යන්තර සංවර්ධනය උදෙසා වූ එක්සත් ජනපද නියෝජිතායතනයේ (USAID) ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහන හා ඒකාබද්ධව කටුනායක අපනයන සැකසුම් කළාපයේ ඉල්ලුම් ප්‍රතිචාරක නියමු ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීමේ කාර්යය ආරම්භ කරන ලදී.

මෙහෙයුම් සමාලෝචනය

# මූල්‍ය අවදානම් කළමනාකරණය
# තාක්ෂණික අවදානම් කළමනාකරණය
# තිරසරභාවය සම්බන්ධ වාර්තාව
# ආයතනික සමාජ වගකීම් වාර්තාව



# මූල්‍ය අවදානම් කළමනාකරණය

ලංකා විදුලිබල මණ්ඩලයේ ගතික මෙහෙයුම් පරිසරය තුළ, ලං.වි.ම. මූල්‍ය ශක්‍යතාවයෙන් යුත් ආයතනයක් බවට පත් කිරීමේ ප්‍රමුඛ අරමුණ සාක්ෂාත් කරගනු පිණිස ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමේදී අවදානම් ධාවකයන් කළමනාකරණය තීරණාත්මක මූලිකාංගයක් බවට පත්වේ. එබැවින්, ලං.වි.ම. මෙහෙවර සාක්ෂාත් කරගනු පිණිස ශක්තිමත් අවදානම් කළමනාකරණයක පදනම්ගත කරුණු අනිවාර්යයෙන් ක්‍රියාත්මකව පැවතිය යුතුවේ. මෙනයින් ගත්කල, මූල්‍ය අංශය විසින් පහත සඳහන් නිශ්චිත අරමුණු සාක්ෂාත් කරගැනීමට අපේක්ෂා කරනු ලබයි.

1. ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම.
2. ප්‍රමාණවත් පාලන ක්‍රමවේදයන් ස්ථාපිතව පවත්නා බවට වගබලා ගැනීම.
3. බාහිර හා අභ්‍යන්තර පරිසරයේ සිදුවන විපර්යාසයනට ප්‍රතිචාරීව ප්‍රධාන අවදානම් නැවත හැඩගැස්වීම.
4. අවදානම් මැනීම.
5. ප්‍රධාන අවදානම් සමනය.

ඒ අනුව, මූල්‍ය අවදානම් දෘෂ්ටි කෝණය තුළ පළමු ආරක්ෂක ක්‍රියාමාර්ගය වශයෙන් මූල්‍ය අංශය විසින් අවදානම් ප්‍රවේශය ක්‍රියාත්මක කරවනු ලබයි. අවදානම් කළමනාකරණ ප්‍රවේශයේ දෙවන හා තෙවන ආරක්ෂක මාර්ග පිළිවෙලින් ආයතනික කළමාකරණ කණ්ඩායමට හා මණ්ඩලයේ විගණන කමිටුවට / බාහිර විගණක වෙත පවරනු ලැබ ඇත. අවසන් වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරනු ලැබ ඇත.

පෙරකී අවදානම් පාලන මාදිලිය තුළ, අංශය විසින් පහත දක්වා ඇති ප්‍රධාන අවදානම් සාධකයන් ඒවාහි බලපෑම් හා සමන ක්‍රමෝපායන්ද සහිතව අනුගමනය කරන ලදී.

| අවදානම | බලපෑම | අවදානම් මට්ටම | සමන ක්‍රමෝපාය |
|---|---|---|---|
| පොළී අනුපාත අවදානම | - ලං.වි.ම. විසින් උපරිම ණය සීමාව දක්වා ණය ගෙන ඇත.<br>- සියලු දිගු කාලීන ණය බරතැබූ ප්‍රමුඛ ණයදීමේ අනුපාතිකයක් (WPLR) මත පදනම් වේ. එබැවින්, අධික ලෙස මුදල් පිටතට ගලායාමක් සිදුවන පරිදි සියලු ණය පොළී අනුපාතිකයන් දැඩිසේ වර්ධනය වී ඇත. | ඉහළ | - පැතිර යාම අවම කරනු පිණිස බැංකු සමග සාකච්ඡා කිරීම.<br>- ස්ථාවර පොළී අනුපාතික මූල්‍ය මෙවලම් කෙරෙහි එකඟ කරවා ගැනීම. |
| විනිමය අනුපාත අවදානම | - ගල් අඟුරු, ඉන්ධන හා අමතර කොටස් වැනි යෙදවුම්හි මිල ගණන් වර්ධනය වීම.<br>- ණයවර ලිපි ආශ්‍රිත ප්‍රමාදයන් හේතුකොට සැපයුම් දාමයට සිදුවන බාධාවන්. | ඉහළ | - ඉදිරි කොන්ත්‍රාත් සම්බන්ධ එකඟ කර ගැනීම්.<br>- විදේශ මුදල්වලින් බිල්පත්කරණයට එකඟ කරවා ගැනීම.<br>- ගෙවීම් නියමයන් පිළිබඳ සාකච්ඡා කිරීම.<br>- අත්තිකාරම් මුදල් වෙන්කර ගැනීම්. |
| ණය අවදානම | - පාරිභෝගිකයන් වෙතින් ලැබෙන ගෙවීම් ප්‍රමාදවීම මගින් ද්‍රවශීලතාවයට සිදුවන බලපෑම. | පහළ | - ගනුදෙනුකරුවන් වෙතින් ලැබෙන මුදල් ගෙවීම් හා සම්බන්ධ කොට සැපයුම්කරුවන් වෙත සිදුකළ යුතුවන ගෙවීම් සැලසුම්කරණය. |
| වෙළඳ භාණ්ඩ අවදානම | - ජනන පිරිවැය වර්ධනය.<br>- ව්‍යාපෘති පිරිවැය අපේක්ෂිත මට්ටම් ඉක්මවා යාම. | ඉහළ | - ස්ථාවර මිල කොන්ත්‍රාත් සාකච්ඡා කොට එකඟ වූ කොන්ත්‍රාත්. |
| ද්‍රවශීලතා අවදානම | - ඉහළ දඬුවම් ගාස්තු.<br>- සැපයුම් දාමයේ ගැටලු.<br>- ප්‍රදේශ කාල සටහන් ප්‍රකාර විදුලිය විසන්ධි කිරීම. | ඉහළ | - ණය පමා සහන කාලය.<br>- සාකච්ඡා කොට එකඟ වූ නිරාකරණ ක්‍රමවේද.<br>- පහසුකම ප්‍රතිව්‍යුහගත කිරීම. |

# තාක්ෂණික අවදානම් කළමනාකරණය

## අවදානම් හඳුනා ගැනීම

විදුලි බලයේ පවත්නා අවදානම් සහගත ස්වභාවය හා එහි කටයුතුවල ස්වභාවයට අනුව, අවදානම් සමන කර්ය පරිපාටි ලං.වි.ම. මෙහෙයුම් කටයුතුවල කොටසක් වේ. ගුණාත්මක, විශ්වසනීය හා අරපිරිමැසුම්දායී විදුලි සැපයුම්කරුවෙකු වශයෙන් ආයතනයේ නිවැරදි ක්‍රියාකාරිත්වයට බලපෑමක් ඇතිකළ හැකි අවදානම් සහගත තත්ත්වයන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් හඳුනාගෙන ඇත.

අවදානම් හඳුනා ගනිමින් සිදුවීමේ හැකියාවට අනුව හා සෘණාත්මක හෝ ධනාත්මක වශයෙන් එහි ප්‍රතිවිපාකවල පරිමාණයට අනුව එය කාණ්ඩගත කොට ඒ අනුව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම අතිශයින් වැදගත් වේ. හඳුනාගත් හා කාණ්ඩගත කළ ඉහළ ප්‍රතිවිපාක ඇතිකළ හැකි අවදානම් සමහරක් සැලසුම්කරණ ක්‍රියාවලිය, ආයතනික සැලැස්ම, දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම, දිගු කාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම හා අයවැය තුළද ආමන්ත්‍රණය කරනු ලැබ ඇත. සෙසු කරුණු සම්බන්ධයෙන් වගකිවය යුතු අංශ විසින් හදිසි අවස්ථා කාර්ය පරිපාටි තුළ කටයුතු කරනු ලැබ ඇත.

## මූල්‍ය අවදානම සහ තාක්ෂණික කාර්ය සාධනය මත එමගින් ඇති කරන බලපෑම

පිරිවැය පිළිබිඹු කරන්නාවූ / අයකරගන්නා වූ අවසන් පරිශීලක අයක්‍රමයක් නොමැති වීම වූකලි ඉහළ ප්‍රතිවිපාක ඇතිකළ හැකි අවදානම් සාධකයක් වේ. මෙම අවදානම විසින් මූල්‍ය කාර්ය සාධනයට පමණක් නොව තාක්ෂණික කාර්ය සාධනයටද බලපෑම් සිදුකර ඇත.

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 30 (2) (ආ) වගන්තිය යටතේ, අවසරලත් කටයුතු සිදු කිරීමේදී දැරීමට සිදුවන සියලු සාධාරණ පිරිවැය අයකර ගැනීමට ලං.වි.ම. වෙත අවසර ලබදෙනු ලබයි. එම වගන්තියේ අරමුණ වනුයේ මූල්‍යමය ශක්‍යතාවයකින් යුතුව එහි අවසරලත් ප්‍රධාන කටයුතු නොකඩවා සිදු කිරීමට ලං.වි.ම. ට හැකියාව ලබාදෙනු ලබන බවට තහවුරු කිරීමයි. කෙසේ වුවද, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පිරිවැය අයකරගනු ලබන ගාස්තු ක්‍රමයක් නොමැති වීම මගින් ලං.වි.ම. ට එහි ප්‍රධාන කර්තව්‍ය කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීමට නොහැකි වීම පිළිබඳ අවදානම වර්ධනය කොට ඇත.

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතේ V කොටස යටතේ, ලං.වි.ම. වෙත ගාස්තු හා අයකිරීම් සකස් කොට එහි පිරිවැය පියවා ගැනීමේ බලතල පැවතිණි. කෙසේ වුවද, එම බලතල ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ අවලංගු කොට නියාමනායතනය වූ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ලබාදෙන ලදී. සමස්ත රට පුරා 'ඒකාකාර ජාතික අයක්‍රමයක්' (UNT) ක්‍රමයක් පැවැත්වීම රජයේ ප්‍රතිපත්තිය වන බැවින්, එවන් ඒකාකාර ජාතික අයක්‍රමයක් පවත්නා කාල සීමාවන්හි සියලු පාරිභෝගිකයන් වෙත අදාළවන අවසන් පරිශීලක අයක්‍රම සැලැස්මක් සකස් කිරීම එක් බලපත්ලාභියෙකුට සිදුකළ නොහැකි කටයුත්තක් වන බැවින් එය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වගකීම බවට පත් කරන ලදී. කෙසේ වුවද, 2014 වසරේ අයක්‍රම අඩු කිරීමෙන් අනතුරුව, ඉන්පසු රටතුළ පැවති ආර්ථික අර්බුද සමය තුළ පිරිවැය පිළිබිඹු කරන්නාවූ ගාස්තු ක්‍රමයක් නොපැවතීම හේතුකොට ලං.වි.ම. මත පැටවුණු වර්ධිත මූල්‍ය බර සැලකිල්ලට ගනිමින් ගාස්තු වැඩිකිරීමක් සිදුකරන ලද්දේ 2022 අගෝස්තු මාසයේදී පමණි. ගාස්තු වැඩිකිරීම් මගින් ලං.වි.ම. ට ඉදිරියේදී සිය පිරිවැය අයකර ගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. අඩු පිරිවැය විදුලි බලාගාර ඉදිකිරීමේ නොහැකියාව මගින්ද මූල්‍ය අලාභය වඩාත් අයහපත් අතට හරවනු ලැබ ඇත. වර්ධිත පුනර්ජනනීය බලශක්ති ඉලක්ක හා ද්‍රව ස්වභාවික වායු පදනම්ගත ජනනයන්ද සමගින්, ලං.වි.ම. විසින් ජනන පිරිවැය අඩු කිරීමට අපේක්ෂා කරයි.

## ප්‍රමාණවත් නොවන ජනන ධාරිතාවය පිළිබඳ අවදානම

ලංකා විදුලිබල මණ්ඩලයේ දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලසුම් තුළ හඳුනාගනු ලැබූ පරිදි (දිගු කාලීන අවශ්‍යතා සහ මැදි කාලීන හිදැස් පියවීමේ අවශ්‍යතාවයන් යන දෙකරුණම උදෙසා) ලං.වි.ම. ට අවශ්‍ය පමණට වඩා අඩු ආන්තිකයක ධාරිතා සංචිතයක්ද සහිතව ක්‍රියාත්මක වීමට සිදුවන ආකාරයට විදුලිබල ධාරිතාවයන් සැලසුම්ගත පරිදි ක්‍රියාත්මක කොට නොතිබිණි. නිසි කලට සැලසුම්ගත ජනන එක් කිරීම් ඉදි කිරීමේ නොහැකියාව මගින් විෂම චක්‍රයක් ක්‍රියාත්මක කරවනු ලබයි. පවත්නා සංචිත ආන්තිකයන් පහත වැටෙන විටදී වැළැකුම් නඩත්තු හෝ සෙසු දෛනික නඩත්තු කටයුතු වෙත යොමුවනු පිණිස සැලසුම්ගත කාල සටහනෙන් පිටත දැනට පවත්නා විදුලි බලාගාර ඉවත් කිරීමේ හැකියාව වළකාලනු ලබයි. එමගින් යන්ත්‍රයන්හි විශ්වසනීයත්වයට බලපෑමක් සිදුවන අතර ඉල්ලුම සපුරාලීම සඳහා දැනට පවත්නා හැකියාව තවදුරටත් පහතට ඇද දමනු ලබයි. සංචිත ධාරිතාවයක් නොමැති වීම මගින් පාලිත විදුලිය විසන්ධි කිරීමේ විකල්ප වෙත යොමුවීමට බල කෙරෙන අතර, අයහපත්ම තත්ත්වයේදී පද්ධතිය බිඳවැටීමත් දක්වා එය ගමන් කළ හැක. තවද, පද්ධතිය තුළ පවත්නා අප්‍රමාණවත් සංචිත ජනන ධාරිතාව මගින්, දිගු කලක් පුරා ඇදී යන වියළි කාලගුණික තත්ත්වයන් තුළ හා/හෝ විශාල ජනන ඒකකයක විදුලි නිපැයුම බිඳ වැටීමකදී කෙටි කාලීන අනුපූරක විදුලි සම්පාදනයන් කලින් කලට ලබාගැනීමට ලං.වි.ම. යොමු කරවනු ලබයි.

## ජාල ව්‍යාප්ති අවදානම - ජාල ව්‍යාප්ති ප්‍රමාදය

අනාගත විදුලි බලාගාරයන්ගෙන් විදුලිය ගෙන ඒමට සහ වඩාත් විශ්වසනීය ආකාරයකින් වර්ධනය වන බලශක්ති ඉල්ලුම සේවාකරණය පිණිස ඉහළ, මධ්‍යම හා අඩු වෝල්ටීයතා ජාල පුළුල් කිරීම් සැලසුම් කර ඇත. මේවා තුළට නව සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පරිපථ ඉදිකිරීම, නව උපපොළ විශාලනය / ඉදිකිරීම, ජාලයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම ආදිය ඇතුළත් වේ. ජනන බලාගාරයන් වෙතින් නිපදවන විදුලිය සම්ප්‍රේෂණය කිරීම සඳහා නව සම්ප්‍රේෂණ මර්ග ඉදිකිරීම යන කාරණය ජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සමගින් නිසි පරිදි කාල නිර්ණය කළ යුතු වන්නේ පෙරකී කරුණෙහි ප්‍රමාදය මගින් පසුකී ඒකකයන් වෙතින් සිදු කෙරෙන විදුලිය සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රමාදයන් ඇති කරවන බැවිනි. තවද, වසර 20ක් හෝ එයටද වැඩි කාල සීමාවක් සේවය සලසා ඇති මැදි වෝල්ටීයතා ජාලයේ සංගත වායු පරිවරණිත උපපොළද ඇතුළත් ඇතැම් ස්විච්පන්නයන්හි විශ්වසනීයත්වය විග්‍රහ කළ යුතුවන කාලය පැමිණ ඇත. ජල සැපයුම, ඛනිජ තෙල් වැනි ප්‍රධාන උපයෝගිතා සේවාවන් සපයන්නාවූ එවන් උපපොළයන්හි විශ්වසනීයත්වය හා අපනයන පිරිසැකසුම්කරණ ක්ෂේත්‍ර කර්මාන්ත කෙරෙහි එහි පවත්නා විශ්වසනීයත්වය නව්‍ය දෘෂ්ටි කෝණයකින් දැකිය යුතු වන්නේ එවන් ප්‍රධාන සේවා හා කර්මාන්ත වෙත බාධාවකින් තොරව විදුලිය සැපයීම සහතික කරනු පිණිස විකල්ප විදුලි සැපයුම් ක්‍රම පවත්නේද යන්න විමසා බැලිය යුතුවන බැවිනි. තවද, ජාල විශ්වසනීයත්වය වැඩිදියුණු කරනු පිණිස මාරු කළ යුතුවන වයස්ගත හා පැරණි ජාල උපකරණ පවතී. එවන් උපකරණ මාරු කිරීම් සඳහා අවශ්‍ය අරමුදල් ලබාගැනීම සහ ජනන හා සම්ප්‍රේෂණ යන දෙවර්ගයේම ජාලයන් තුළ අතිරික්තයන් රහිත තත්ත්වයක් තුළ එවන් කටයුතු සිදුකරනු පිණිස විදුලිය විසන්ධි කිරීමේ අවස්ථා ලබාගැනීමද බරපතල අභියෝගයකි. යන්ත්‍ර අක්‍රියව පවත්නා කාල සීමාව තුළ ප්‍රමාදයන් ඇතිවීමක් හෝ ආපදා තත්ත්වයක් ඇතිවීමකින් තොරව කල්තබා නිරාකරණ කටයුතු ආරම්භ කිරීමට හැකිවනු පිණිස දෝෂ සහගත තත්ත්වයන් කල්තබා පුරෝකථනය කළ හැකි වත්කම් කළමනාකරණ මූලධර්ම යෙදීමෙන් ජාල උපකරණ ආශ්‍රිත අවදානම් යම්තාක් දුරකට අවම කෙරේ.

## ඉන්ධන සැපයුම් අවදානම

විදුලිය ජනනයෙන් 50% කට ආසන්න ප්‍රමාණයක් ගල් අඟුරු හා ඉන්ධන තෙල් මත පදනම් වන බැවින් ලං.වි.ම. හි අඛණ්ඩ විදුලිය සැපයුමක් සහතික කරනු පිණිස ඉන්ධන ආරක්ෂාව සහතික කිරීම අත්‍යවශ්‍ය කරුණක් වේ. ඉන්ධන සැපයුමට අදාළ අවදානම්

තුළට විදුලිය ජනනයේදී අවශ්‍ය කෙරෙන ඉන්ධන ප්‍රවාහනය, ගබඩාකරණය හෝ පවත්වාගෙන යාමට අදාළ අවස්ථාවන්හි ඇතිවිය හැකි බාධාවන් හෝ සීමාකරණයන් අදාළ වේ. සැපයුම් ජාල බාධා, භූ දේශපාලනික ආතතිමය තත්ත්වයන්, ස්වභාවික ආපදා, නියාමන වෙනස්කම්, මිල උච්චාවචනයන් හෝ බලශක්ති මිල ගණන්හි විතැන් වීම් වැනි විවිධ සාධක හේතුකොට එම තත්ත්වය ඉස්මතු විය හැක. අප විසින් 2022 වසර තුළද එම තත්ත්වය අත්දක්නා ලද අතර, ඉල්ලුම් කළමනාකරණ ක්‍රියාමාර්ග යක් වශයෙන් සැලසුම්ගත විදුලිය බිඳවැටීම් හඳුන්වා දීමට බල කෙරිණි. මෙමගින් රටේ සමාජ හා ආර්ථික පැවැත්මට බරපතල බලපෑමක් ඇතිවිය. ඒ අනුව, පාරිභෝගික ඉල්ලීම් සපුරාලනු පිණිස විශ්වසනීය සහ අඛණ්ඩ විදුලිය සැපයුමක් සහතික කරනු උදෙසා මෙම අවදානම් කලමනාකරණය තීරණාත්මක වැදගත්කමකින් යුත් කාර්යයක් වේ. ඉන්ධන සැපයුම් අවදානම් කළමනාකරණ ක්‍රමෝපායන් වශයෙන් ඉන්ධන මූලාශ්‍ර විවිධාංගිකරණය, දිගු කාලීන ඉන්ධන කොන්ත්‍රාත්වලට එළැඹීම, ගබඩාකරණ පහසුකම් නංවාලීම, පුනර්ජනනීය සංක්‍රමණය, සහ අඛන්ඩ නිරීක්ෂණ සහ හදිසි අවශ්‍යතා සැලසුම්කරණය සිදුකළ යුතු බවට ලං.වි.ම. විසින් අවධාරණය කරන ලදී.

## මානව සම්පත් අවදානම – කුසලතා පූර්ණ හා අභිප්‍රේරිත කාර්ය බලකායක් පවත්වාගෙන යාමේ අභියෝග

කුසලතා පූර්ණ සේවා බලකායක් පවත්වාගෙන යාම වූකලි අස්පෘශ වත්කමක් වන අතර, ජාල උපකරණ නිසි පරිදි නඩත්තු කරනු පිණිස එය අතිශයින් වැදගත් වේ. ජාතිය වෙත ගුණාත්මක සේවයක් සැලසීම අපේක්ෂා කරන ලං.වි.ම. කේන්ද්‍රීය කටයුතු පවත්වාගෙන යනු පිණිස කාර්ය බලකා අභිප්‍රේරණය වැදගත් වේ. තවද, කාර්මික ආරවුල් වළකාලනු පිණිස සේවක තෘප්තිය ප්‍රධාන අවශ්‍යතාවයක් වේ. ලං.වි.ම. විසින් අඛන්ඩ පුහුණු වැඩසටහන් හරහා කුසලතා පූර්ණ කාර්ය බලකායක් නඩත්තු කරනු ලබයි. මෙම කාර්ය භාරය නොකඩවා පවත්වාගෙන යාම විෂයයෙහි කොවිඩ් - 19 වසංගතය විසින් අයහපත් බලපෑමක් ඇතිකරන ලද නමුදු, මෙම විශේෂඥතාවය නඩත්තු කරනු උදෙසා ධාරිතා සංවර්ධනය සහ කාර්ය මණ්ඩල අභිප්‍රේරණය ඇති කරනු පිණිස මාර්ගගත වැඩසටහන් පැවැත්වීමට උත්සාහ ගන්නා ලදී. රටේ දැනට පවත්නා ප්‍රතිපත්ති සහ දුර්වල ආර්ථික තත්ත්වය මගින් කුසලතා පූර්ණ ශ්‍රම බලකායක් පවත්වාගෙන යාම අභියෝගාත්මක කාර්යයක් බවට පත්කර ඇත.

## ණය දෙන නියෝජිතායතන වෙතින් ඇතිවන පීඩනය හේතුවෙන් ප්‍රමුඛතාගත ක්ෂේත්‍රයන් වෙතින් අරමුදල් ලබාගැනීමේ අවදානම

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතේ 38 වන වගන්තිය යටතේ, මණ්ඩලයේ ආදායම මණ්ඩලයේ සේවාවන් සංවර්ධනය කිරීමේ පිරිවැය සපුරාලීම සඳහා ප්‍රමාණවත්ව පවත්නා බවට වගබලා ගැනීමේ වගකීමක් මණ්ඩලය වෙත ලබාදෙන ලදී. කෙසේ වුවද, ගාස්තු හා අයකිරීම් පැනවීම නම් වූ එවන් මූල්‍ය සම්පාදනය කරගැනීම සඳහා ලං.වි.ම. සතුව පැවති මෙවලම් 2009 වසරේදී ලං.වි.ම. වෙතින් ඉවත් කොට ශ්‍රී ලංකා විදුලිබල පනත මගින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ලබාදෙන ලදී. අරමුදල් නොමැති වීම වූකලි ජාත්‍යන්තර අරමුදල් ලබාගත නොහැකි ක්ෂේත්‍ර ප්‍රධාන කොටගෙන ජනන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙන්ම සම්ප්‍රේෂණ/බෙදාහැරීමේ ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිද හා සම්බන්ධ පොදු ගැටලුවක් වේ. විදුලි ඉල්ලුම, වෙනස්වන රජයේ ප්‍රතිපත්ති, පාර්ශවකරු අපේක්ෂා, සැපයුම් දාම ගැටලු, ව්‍යාපාරික සම්බන්ධතාවයන් මෙන්ම කාලගුණික ප්‍රතිපත්ති වෙතින් එල්ලවන පීඩනයද ඇතුළත් සංකීර්ණ සාධක ගණනාවක් මගින් විදුලි අංශයේ ආයෝජන තීරණ හැඩ ගස්වනු ලබයි. ෆොසිල ඉන්ධන, රජය සතු උපයෝගිතා ව්‍යුහයන් ආදිය කෙරෙහි ලෝකයේ මතය වෙනස්වන තත්ත්වයනට සරිලන පරිදි අරමුදල් සම්පාදනායතන විසින්ද තම ආයතනයනට අනන්‍ය අරමුදල්කරන ප්‍රතිපත්ති අනුගමනය කරනු ලබයි. ණය ප්‍රඥප්ති හරහා කොන්දේසි කෙරෙහි අවධාරණය කිරීම හේතුකොටගෙන ලං.වි.ම. ට දැනට පවත්නා ණය ගැනීමේ සීමිත අවකාශය පවා ආයතන ණය දීමට කැමැත්තක් දක්වන ක්ෂේත්‍ර කෙරෙහි යොමුකොට ඉන්පසු ප්‍රමුඛතාගත ක්ෂේත්‍රවලට යොමු කරීමට සිදුව ඇත.

## මහජන අදහස් සම්බන්ධ අවදානම හා උපයෝගිතා සැලසුම් කෙරෙහි පවත්නා අභියෝග

විදුලි බලය භාවිත වනුයේ රටේ සමස්ත බලශක්ති ඉල්ලුමෙන් 14% ක ප්‍රමාණයකට පමණි. එසේ වුවද, ඉතිරි 86% ප්‍රමාණයට වඩා පවත්නා ඉහළ වාණිජමය වටිනාකම හේතුකොට විදුලි ක්ෂේත්‍රය මාධ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන, පරිසර බලපෑම් කණ්ඩායම් ආදී පිරිස් වෙතින් වැඩි අවධානයක් දිනාගන්නා ක්ෂේත්‍රයකි. විදුලි පද්ධතිය යනු නිරන්තරයෙන්ම සාමාන්‍ය ජනතාවගේ අවබෝධ මට්ටමින් ඔබ්බෙහි පවත්නා වූද, වටහා ගැනීම සඳහා ගැඹුරු අනාවරණයක් හා අත්දැකීමක්ද අවශ්‍ය වන්නාවූද අතිශය විශේෂීකරණය වූ ක්ෂේත්‍රයකි. එබැවින්, උපයෝගිතා සැලසුම් සහ තීරණ පිලිබඳව පොදු ජනතාව හා මාධ්‍ය වෙත සාධාරණීකරණය හා ඒත්තු ගැන්වීම අතිශය දුෂ්කර කාරණයක් වේ. විදුලිබල ක්ෂේත්‍රය විසින් අතිශයින් ආකර්ශනීය ව්‍යාපාරික අවස්ථාවන් ඉදිරිපත් කරනු ලබන බැවින්, සිය පාර්ශ්වයෙන් ව්‍යාපාරික අභිලාශයන් සහිත කණ්ඩායම් වෙතින් තමාට නියැළිය හැකි ව්‍යාපාරික ක්ෂේත්‍රයනට සහාය දක්වනු පිණිස ප්‍රතිපත්ති හා සැලසුම් වෙනස් කිරීමට හා තමාට අලෙවි කළ හැකි තාක්ෂණයන් සඳහා ඉඩ හසර විවර කිරීමට අදාළ බලපෑම් එල්ල වීමේ සැලකිය යුතු අවදානමක් පවතී.

## වෙනස්වන ප්‍රතිපත්ති පිළිබඳ අවදානම

විදුලි ව්‍යාපෘති ගොඩනැගීම සඳහා දීර්ඝ කාලයක් ගතවේ. එබැවින්, කල්තබා සංවර්ධන කටයුතු ආරම්භ කරනු පිණිස අවශ්‍ය දිනට බොහෝ කලකට පෙර සිට සැලසුම් සකස් කෙරේ. විදුලි බලය පුළුල් කිරීම සඳහා සැලසුම් කිරීමටද සැලකිය යුතු කාලයක් ගතවේ. එබැවින්, රජයේ ප්‍රතිපත්ති පැහැදිලි හා අඛන්ඩ ස්වරූපයේ ඒවා විය යුතුවේ. වෙනස්වන හා අනනුගත රජයේ ප්‍රතිපත්ති මගින් උපයෝගිතා සැලසුම්කරණයට හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම විෂයයෙහි ප්‍රධාන අභියෝගයන් හා අවදානම් ඇති කරවනු ලබයි.

## සයිබර් ආරක්ෂාව පිළිබඳ අවදානම

ලං.වි.ම. ක්‍රම ක්‍රමයෙන් වඩ වඩාත් තොරතුරු තාක්ෂණයට යොමුව ඇත. සියලුම ශාඛාවන් පාහේ ජාලගතව අන්තර් සම්බන්ධතාගතව පවතී. එක් ස්ථානයකට අනවසරයෙන් ඇතුළු වීම තුළින් සමස්ත ජාලය පුරා පහසුවෙන් ව්‍යාප්ත වීමේ හැකියාවක් පවත්නා බැවින් බාහිර සයිබර් ප්‍රහාරයනට පහසුවෙන් හසුවීමේ හැකියාවක් පවතී.

ලං.වි.ම. වැනි විදුලි උපයෝගිතා ආයතන විසින් පොදුවේ පරිහරණය කරනු ලබන මෙහෙයුම් තොරතුරු තාක්ෂණ පද්ධති මගින් සන්නිවේදන හා පාලන කටයුතු උදෙසා තොරතුරු තාක්ෂණය බහුලව භාවිත කොට ඇත. කෙසේ වුවද, මෙම මෙහෙයුම් හා පද්ධති බොහෝ කොටම තනි හුදෙකලා ඒකක වශයෙන් ක්‍රියාත්මක වන අතර කළමනාකරණ තොරතුරු තාක්ෂණ පද්ධති මෙන් නොව බාහිර හා පවත්නා සම්බන්ධතාවය ඉතා අවම වේ. තවද, මෙහෙයුම් තොරතුරු තාක්ෂණ පද්ධති බාහිරට සම්බන්ධවන විටදී, ඒවාහි ප්‍රවේශ ද්වාරයන් වශයෙන් ඉහළ ආරක්ෂක උපකරණ පවත්වාගනු ලබයි. එබැවින්, ඒවාට අනවසර මැදිහත්වීම් හා බාහිරින් සිදුවන ප්‍රහාරයන් සම්බන්ධයෙන් පවත්නා අවදානම සාපේක්ෂව අවම වේ. කෙසේ වුවද, සයිබර් ප්‍රහාරයන් සමබන්ධයෙන් පවත්නා අවදානම නිරන්තරව පවත්නා එකක් වේ. මෙය ප්‍රහාරකයන් විසින් ආරක්ෂක පද්ධතිවල පවත්නා හිදැස්වලින් ප්‍රයෝජන ගැනීම හේතුවෙන් සිදුවන්නක් විය හැකි අතර මානව දෝෂ හා අත් වැරදීම්ද පැවතිය හැක. එබැවින්, මෙසේ අවදානමට ලක්වීමේ හැකියාව අවම කරනු පිණිස නිසි පරිදි සංවිධිත හා කළමනාකරණය වූ උපකරණ මෙන්ම වඩාත් ප්‍රබල තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක්ද අවශ්‍ය වේ.

# විදුලි කර්මාන්තයේ තිරසරභාවය සම්බන්ධ අපගේ ප්‍රවේශය

විදුලිබල කර්මාන්තයේ තිරසරභාවය උදෙසා ලං.වි.ම. ප්‍රවේශය වූකලි විදුලිය ජනනය, සම්ප්‍රේෂණය හා බෙදාහැරීම යන ක්ෂේත්‍රයන් මගින් ඇතිකරන පාරිසරික බලපෑමද අවම කරමින් පාරිභෝගිකයන් වෙත විශ්වසනීය හා දැරිය හැකි මිලකට විදුලිය ලබාදීමේ අභිමතාර්ථය වටා කේන්ද්‍රගත වන්නකි. මෙම ප්‍රවේශය තුළ, කර්මාන්තය දිගු කාලීන තිරසරභාවයක් පවත්වන බවට සහතික කරනු පිණිස ආර්ථික, සමාජ හා පාරිසරික සාධක සමතුලනය කිරීමක්ද අන්තර්ගත වේ.




## ආර්ථික තිරසරභාවය

දිගු කාලීනව සලකන කල විදුලි සේවාවන් මූල්‍යමය තිරසරභාවයක් සහිත ආකාරයකින් සම්පාදනය කළ හැකි බවට සහතික කරන බැවින් ආර්ථික තිරසරභාවය විදුලි කර්මාන්තයේ ප්‍රධාන පැතිකඩකි. කර්මාන්තයේ ආර්ථික තිරසරබව ප්‍රවර්ධනය කිරීමේ එක් ක්‍රමෝපායක් වනුයේ පිරිවැය පිළිබිඹු කරන්නාවූ ගාස්තු ක්‍රමය ක්‍රියාත්මක කිරීමයි. පාරිභොගිකයන් වෙතින් අය කෙරෙන මිල ගණන් මගින් නිවැරදි ලෙසම විදුලිය සේවා සම්පාදනය කිරීමේ පිරිවැය පිළිබිඹුවන බැවින් විදුලිය කර්මාන්තය මූල්‍යමය ශක්‍යතාවයක් සහිත කර්මාන්තයක් බවට පත්කරන බවට වගබලාගනු පිණිස පසුගිය වසර 14 පුරා ලං.වි.ම. විසින් පිරිවැය පිළිබිඹු කරන්නාවූ අයක්‍රමයක් ඉල්ලා සිටින ලදී. පිරිවැය පිළිබිඹු කරන්නාවූ ගාස්තු යනු ක්ෂේත්‍රයට ආයෝජන ආකර්ශනය කරගනිමින් දිගු කාලීනව එහි යටිතල පහසුකම් පවත්වාගෙන යන අතර, බලශක්ති සංරක්ෂණයෙහි නිරතවන අතර බලශක්ති පරිභරණය අවම කරමින් සියලු පාරිභෝගිකයන් වෙත වඩාත් ස්ථාවර හා විශ්වසනීය බලශක්තිය සැපයුමක් සහතික කරවීමට උපකාරී වනු පිණිසද ප්‍රයෝජනවත් මෙවලමකි.

අනෙක් අතින්, පවත්නා පද්ධති විශ්වසනීය බවටද, කාර්යක්ෂම බවටද යාවත්කාලීනව පවත්නා බවටද වගබලාගනු පිණිස විදුලිබල උපයෝගිතා ආයතන විසින් යටිතල පහසුකම්වල සිය ආයෝජනයන් සිදුකළ යුතුය. ලං.වි.ම. දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම (LTGEP) ශ්‍රී ලංකාවේ සැලකිය යුතු යටිතල පහසුකම් ආයෝජනයක් සිදුකරනු සඳහා වූ ආර්ථික මූලධර්ම හා ගිණුම් මත සකස් කරනු ලැබ ඇත. දිගු කාලීන සම්ප්‍රේෂණ සැලැස්ම හා බෙදාහැරීමේ අංශයන්හි බෙදාහැරීමේ සැලසුම් විසින් ජනන ස්ථාන බැර මධ්‍යස්ථාන වෙත සම්බන්ධ කරවනු ලබයි.

තවද, එම ආයතන විසින් උපයනු ලබන ආදායමට වඩා වියදම් නොකරන බවට වගබලාගනු පිණිස මෙහෙයුම් පිරිවැය ප්‍රවේශම් සහගතව කළමනාකරණය කිරීම අතිශයින් වැදගත් වන අතර, මේ සඳහා මෙහෙයුම් හා නඩත්තු පිරිවැය මෙන්ම යටිතල පහසුකම් හා උපකරණ මත සිදුකරන මූලධන වියදම්ද ඵලදායී ලෙස කළමනාකරණය අවශ්‍ය වේ. ඒ අනුව, ආයතනයේ මෙන්ම රටේද ආර්ථික තිරසරබව පවත්වාගනු පිණිස වාරිමාර්ග අවශ්‍යතාවයන්හි නිසි ක්‍රියාකාරිත්වයට බලපෑමක් සිදු කිරීමකින් තොරව, ජනන මුහුව සුදුසු සමබරතාවයකින්ද පවත්වා ගනිමින් ප්‍රශස්ත ජනන යොමුවක් ඉදිරිපත් කරන බවට ලං.වි.ම. විසින් වගබලාගනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 වසර තුළ අත්විඳි ඉහළ උද්ධමන තත්ත්වය යටතේ කි.වො. පැයකට රු. 33.65 අගයක සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය පවත්වාගෙන යාමට ලං.වි.ම. ට හැකිවිය. කෙසේ වුවද, 2022 අගෝස්තු මාසයේදී පනවන ලද අයක්‍රම සංශෝධනයෙන් අනතුරුව පවා ලං.වි.ම. විසින් කි.වො. පැයකට රු. 21.24 වැනි අඩු මිලකට විදුලිය අලෙවි කළ බැවින් පිරිවැය පිළිබිඹු කරන්නාවූ ගාස්තු ක්‍රමයක් ක්‍රියාත්මක නොකිරීම මගින් මූල්‍ය තිරසරභාවයට බලපෑමක් ඇතිවිය.

සමස්තයක් ලෙස, ශ්‍රී ලංකාවේ විශාලතම විදුලි උපයෝගිතා ආයතනය වශයෙන් ලං.වි.ම. දිගු කාලීන දෘෂ්ටි කෝණයකින්, ප්‍රායෝගික කළමනාකරණයකින් හා අඛන්ඩ ප්‍රවර්ධනයකින්ද ආර්ථික තිරසරභාවය සාක්ෂාත් කරගැනීමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගැනීමට කැපවී සිටී. අපගේ පිරිවැය හා ආදායම සමබර කරමින්ද, අපගේ මෙහෙයුම් කටයුතු ප්‍රශස්තකරණය මගින්ද, වෙනස්වන වෙළඳපල තත්ත්වයනට අනුගත වෙමින්ද විශ්වසනීය හා වටිනා සේවා සම්පාදකයෙකු ලෙස අපට තවදුරටත් පැවතිය හැක්කේය යන්න අපගේ විශ්වාසයයි.

# විදුලි කර්මාන්තයේ තිරසරභාවය සම්බන්ධ අපගේ ප්‍රවේශය (ඉතිරි කොටස)

## සමාජ තිරසරබව

විදුලිබල කර්මාන්තයේ ප්‍රමුඛ ආයතනය වශයෙන්, ලං.වි.ම. සිය පාරිභෝගිකයන් හා පාර්ශවකරුවන් ආශ්‍රිත සුබ සාධනය සඳහා සහාය දක්වමින් ජන ප්‍රජාවේ ඉල්ලීම් සපුරාලන සේවා සම්පාදනය සඳහා කැපවී සිටී. ඒ අනුව, ලං.වි.ම. වසර කිහිපයකට පෙර 100% ක විදුලියන මට්ටම සාක්ෂාත් කරගත් අතර, සමාජ තිරසරබවට අවශ්‍ය පදනම සකස් කරන ලදී. මෙම සාර්ථකත්වය මගින් ජන ප්‍රජාවන්ගේ ජීවන ක්‍රම සැලකිය යුතු වැඩිදියුණුවකට ලක්වූ අතර ජනතාවට රැකියා අවස්ථාවන්ද විවර විය.

ඉහත කී ප්‍රධාන සාර්ථකත්වයට අමතරව, ආයතනය මේවන විට සිය පාරිභෝගිකයන් වෙත ගුණාත්මක හා විශ්වසනීය සේවා සම්පාදනයක් ලබාදෙමින් නවීන තාක්ෂණය හරහා මෙහෙයුම් විශිෂ්ටත්වය සාක්ෂාත් කරගැනීම කෙරෙහි අවධානය යොමුකොට ඇත. මෙම අරමුණ හා සමාන්තරව, සූර්ය පැනල යෙදවුම් ක්‍රියාවලිය තාර්කිකකරණය කරනු පිණිස සම්මානලාභී "CEBAssist" යෙදවුම යටතේ ලං.වි.ම. විසින් වහළය මත සවි කරන සූර්ය පැනල යෙදවුම් පිරිසැකසුම්කරණ මාදිලිය දියත් කරන ලදී.

තවද, ධනාත්මක වැඩබිම් සංස්කෘතියක් ඇති කරමින් සමාජ වගකීම හා තිරසරභාවය සම්බන්ධ ආයතනයේ කැපවීමට සහාය දක්වමින් සේවක යහසාධනය ප්‍රවර්ධනය උදෙසා පුහුණු සැසි හරහා සිය කාර්ය මණ්ඩලය සංවර්ධනය කිරීම කෙරෙහි ආයතනයේ අවධානය යොමුවිය. ඒ අනුව, 2022 වසර තුළ සේවා නියුක්තිකයන් 4.959 ක් සඳහා පුහුණුව ලබාදෙන ලදී.

## පරිසර තිරසරබව

හරිත බලශක්තිය ඒකාබද්ධකරණය ප්‍රශස්ත කරමින් හා තාප විදුලි ජනනයේ හානිකර පාරිසරික බලපෑම් අවම කරමින් පරිසර තිරසරබව ප්‍රවර්ධනය කිරීමට ලං.වි.ම. කැපවී සිටී. ඒ අනුව, පුනර්ජනනීය සංවර්ධනයන් ප්‍රවර්ධනය කිරීමේ සිය ප්‍රයත්නයන්හි ආයතනය නොකඩවා නිරත වූ අතර, වසර අවසානය වනවිට වාර්ෂික ජනනයට පුනර්ජනනීය දායකත්වය 52% මට්ටමක විය. මෙතුළට සමාලෝචිත වර්ෂය තුළ සාර්ථකව මෙහෙවරෙහි යොදවන ලද දහ අටවන ජලවිදුලි බගාගාරය වන බ්‍රෝඩ්ලන්ඩ්ස් බගාගාරයේ බලශක්ති දායකත්වයද ඇතුළත් වේ. මෙම ජලවිදුලි ව්‍යාපෘතිය මගින් අපගේ පුනර්ජනනීය බලශක්ති මුහුව ප්‍රවර්ධනය කොට විදුලිබල ජනන ධාරිතාවය වර්ධනය කරනු ලැබුවා පමණක් නොව අපගේ තිරසර සංවර්ධනයේ හර වටිනාකම ඉහළ නංවන්නට දායක වූ වගකිව යුතු ආයතනික පුරවැසියන් වශයෙන් අපගේ තත්ත්වයද බලගන්වන ලදී.

තවද, හරිත බලශක්ති ඒකාබද්ධකරණය මෙන්ම බලශක්ති සංරක්ෂණය ප්‍රවර්ධනය කරනු පිණිසද විවිධ මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

අනෙක් අතින්, පහත විස්තර කර ඇති පරිදි ෆොසිල ඉන්ධනයන්හි හානිකර පරිසර බලපෑම් කළමනාකරණය කරනු පිණිස වූ සිය ප්‍රයත්නයන්හි ලං.වි.ම. නොකඩවා නිරත විය.

## දුහුවිලි සමන හා නිරීක්ෂණ කටයුතු

ලක්විජය ගල් අඟුරු බලාගාරය සහ ඒ අවට නිරිතදිග මෝසම් කාලය තුළ පැන නගින ප්‍රධාන ගැටලුව වන්නේ දූවිලි ලෙස අර්ථ දක්වා ඇති සියුම් ගල් අඟුරු අංශුයි. ජලය යොදා මෙම දුහුවිලි යටපත් කොට සුළං පාලනය ලක්විජය විදුලි බලාගාරයට ගත හැකි විසඳුම් දෙක වශයෙන් හඳුනා ගනු ලැබ ඇත. ඒ අනුව, වියළි ගල් අඟුරු ස්ථාන ඉසීම් පද්ධති, සුළං බාධක, ට්‍රක් රථ හා රික්ලේමර් යන්ත්‍රවලට සම්බන්ධ කොට ඇති මිහිදුම් සුළං විදුම් මෙහෙයුම් සහ ගල් අඟුරු තොගයේ තෙත් මතුපිට මතට ඉසුම් බව්සර හා එහා මෙහා ගෙනයා හැකි ඉසීම් යන්ත්‍ර භාවිතයෙන් ප්‍රවේශ මාර්ග තෙත් කිරීම යන ක්‍රියාමාර්ග දුහුවිලි පාලනය පිණිස ගල් අඟුරු අංගනය තුළ ස්ථාපනය කොට ඇත. (රූපය S1)



*රූපය S1: ගල් අඟුරු අංගනයේ මිහිදුම් විදුම් මෙහෙයුම්*

තවද, ගල් අඟුරු අංගනයේ බටහිර සීමා මායිම දිගේ ඉදිකරන ලද මීටර 460 ක් දිග සුළං බාධකයක්ද, ගල් අඟුරු අංගනයේ දකුණු හා නැගෙනහිර සීමා මායිම් දිගේ ඉදිකරන ලද මීටර 1,183 ක සුළං බාධකයක්ද ලක්විජය විදුලි බලාගාරය සතුවේ. 2022 වසර වූකලි අපට අපගේ ගල් අඟුරු අංගනය 'තෙත්' තත්ත්වයෙන් තබාගැනීමට හැකිවූ සාර්ථක වසරක් වූ අතර නේවාසිකයන් වාසය කරන ප්‍රදේශ කරා දුහුවිලි විසිර යාම වළකාලිය හැකි විය.



*රූපය S2: සුළං බාධක*

# විදුලි කර්මාන්තයේ තිරසරභාවය සම්බන්ධ අපගේ ප්‍රවේශය (ඉතිරි කොටස)

අබන්ධව තෙත් කිරීමේ ක්‍රියාවලිය, මට්ටම් කිරීම හා තද කිරීම, දුහුවිල්ලෙන් ආවරණය කිරීම සහ එළවළු වගාව සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම අළු අංගනයේ දුහුවිලි ජනනය පාලනය සඳහා යොදාගන්නා ලද ප්‍රධාන පිළිවෙත් වේ. අළු තරඟකාරී මිල ගණන් යටතේ අලෙවි කිරීම, විවිධ නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍යයක් වශයෙන් භාවිත කිරීම සහ ගඩොල් නිෂ්පාදන කටයුතු සඳහා යොදාගැනීම (රූපය S3) මගින් විවෘතව අළු ඉවතලීම පාලනය කරන ලදී.



රූපය S3: අළුවලින් නිෂ්පාදිත ගඩොල්

පසුගිය වසර පහ පුරා අනුගමනය කරන ලද අළු කළමනාකරණ වැඩසටහනේ ප්‍රතිඵල පහත ප්‍රස්ථාරය තුළ දක්වා ඇත.




රූපය S4: විහිදුම් අළු කළමනාකරණ වැඩසටහන

තවද, ඒ වටා පිහිටි ගම්වල අබන්ධ දුහුවිලි නිරීක්ෂණ කටයුතුද 2022 වසරේ නිරිතදිග මෝසම් සමය පුරා සිදුකරන ලදී.

## ජල සත්කාරය හා නිරීක්ෂණය

පසු සත්කාරය හා නැවත භාවිත කිරීම අපජල ධාරාවන් සම්බන්ධ නවීන ප්‍රවණතාවයන් වේ. අපජල සත්කාර යන්ත්‍රාගාර, මළ සත්කාර යන්ත්‍රාගාර, ගල් අඟුරු, හා අඟුරු ජල සත්කාර යන්ත්‍රාගාර විසින් නිසි පරිදි සිය කාර්ය භාරය ඉටුකරනු ලබන අතර, දුහුවිලි මැඩ පැවැත්වීමේ කටයුතු සඳහා අවශ්‍ය නැවත පරිහරණය කළ හැකි සත්කාරක ජල නිෂ්පාදනයන් නිර්මාණය කරවනු ලබයි. කාර්මික තාක්ෂණ ආයතනය (ITI) හරහා ජලයේ ගුණාත්මකභාවය නිරීක්ෂණය කිරීම හා පරිසර නිරීක්ෂණ ඒකකය (EMU) හරහා ජලයේ ගුණාත්මකභාවය මැනීම යන කටයුතු වසර පුරා සිදුකරන ලදී. (රූපය S5)



රූපය S5: කාර්මික තාක්ෂණ ආයතන නිදර්ශකකරණය

තවද, තිරසර උපයෝජනය තහවුරු කරමින් සම්පතේ දිගුකල් පැවැත්ම ආරක්ෂා කරනු පිණිස බිම් ජල නිරීක්ෂණ වැඩසටහන ත්‍රෛමාසික පදනමින් ජල සම්පත් මණ්ඩලය (WRB) හරහා

# විදුලි කර්මාන්තයේ තිරසරභාවය සම්බන්ධ අපගේ ප්‍රවේශය (ඉතිරි කොටස)

ලක්විජය විදුලි බලාගාරය විසින් සිදුකරනු ලබන අතර මෙය විදුලි බලාගාර පරිශ්‍රය තුළ හා ඒ වටා බිම් ජලයේ තත් කාලීන තත්ත්වය නිරීක්ෂණය කිරීමට උපකාරී වේ.

ජලයේ ගුණාත්මකභාවය නිරීක්ෂණය කිරීමට අමතරව, ලක්විජය විදුලි බලාගාරය විසින් ජල සම්පත් මණ්ඩලය හරහා සෑම ළිඳක් සඳහාම පොම්පකරණ පරීක්ෂණයක් සිදුකර ඇත. ඒ අනුව නොගැඹුරු නල ළිං පනස් එකක් ප්‍රයෝජනයට ගැනීමට අනුමත කරන ලද අතර දිනපතා කටයුතු සිදුකරනු පිණිස පොම්පකරණ රටා, පූර්ණ උපයෝජන අනුපාත, හා ජල පොම්ප වර්ග ලක්විජය විදුලි බලාගාරය වෙත ලබාදෙන ලදී.



රූපය S6: භූගත ජල සාම්පල ලබා ගැනීම

බැර ලෝහවලට (ආසනික්, කැඩ්මියම්, මර්කරි, ක්‍රෝමියම්, ඊයම් හා බේරියම්) අදාළව භූගත ජල මට්ටම හා මුහුදු ජලය කාන්දු වීම යන කරුණු මත ලක්විජය විදුලි බලාගාරයෙන් කිසිදු බලපෑමක් ඇති නොකරන බවට හෙළිදරව් කරමින් 2021 වසර සඳහා වූ භූගත ජල වාර්තාව 2022 වසරේදී නිකුත් කරන ලදී. තවද, ලක්විජය විදුලි බලාගාරයේ ජලයේ ගුණාත්මකභාවය 2019 වසරේ ක්‍රියාත්මක කරන ලද පොම්පකරණ රටාව ක්‍රියාත්මක කිරීම හේතුවෙන් වැඩිදියුණු වී ඇති බවද එතුළ සඳහන් කෙරිණි.

## සාගර පරිසර නිරීක්ෂණය

කාර්මික තාක්ෂණ ආයතනය (ITI), ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA) සහ සාගර පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA) නමැති ශ්‍රී ලංකාවේ කීර්තිමත්ම රජයේ ආයතන හරහා සීසිලන ජල බැහැර කිරීම හා සාගර පරිසර නිරීක්ෂණ කටයුතු සිදුවේ. සාගර පරිසරය කෙරෙහි විදුලි බලාගාරයන්ගේ බලපෑම තක්සේරු කරනු පිණිස මෙම ආයතන විසින් අධ්‍යයනයන් හා පර්යේෂණ ගණනාවක් සිදුකරන ලදී. මෙම ආයතනයන්හි ප්‍රවීණත්වය සහ දැනුම නිරතුරු සාගර පරිසරයේ ජීවී හා අජීවී සංගටක ආරක්ෂා කිරීමට උපකාරී වේ. විදුලි බලාගාරයේ පිටවුම් ද්වාරය වටා පවත්නා ප්‍රදේශයේ මසුන්ගේ විවිධත්වය ඉහළ මටට්මක පැවති අතර එය ගැසට් මගින් ප්‍රකාශයට පත් නොකළ සාගර ආරක්ෂිත කළාපයක් වශයෙන් ක්‍රියාත්මකවන අතර සම්පත් වර්ධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි.

## අවට වාතයේ ගුණාත්මකභාවය හා දුම් විමෝචන නිරීක්ෂණය

අවට වාතයේ ගුණාත්මකභාවය හා දුම් හා විසිරෙන දුහුවිලි විමෝචන නිරීක්ෂණය වූකලි වායුගෝලයේ තත්ත්වයන් හා ආශ්‍රිත තත්ත්වයන් වන අතර, අදාළ වායුගෝලීය පරාමිතීන් නිරීක්ෂණ කටයුතු ත්‍රෛමාසික හා (කාලගුණික මෝසම් සමයනට අදාළ) සමයානුගත පදනමකින් කාර්මික තාක්ෂණ ආයතනය හරහා සිදුකරන ලදී. අවට වාතයේ ගුණාත්මකභාවයට අදාළ පරාමිතීන් 2022 වසර තුළ අවසර ලබාදිය හැකි මට්ටමට වඩා පහළ අගයක වූ බව උක්ත නිරීක්ෂණයන්හි ප්‍රතිඵල මගින් අනාවරණය විය.

මෙයට අමතරව, එහා මෙහා ගෙනයා හැකි දුම් විශ්ලේෂකයක් භාවිතයෙන් සතිපතා සිදුකළ අභ්‍යන්තර නිරීක්ෂණයන් හා එක් එක් ඒකකයකට අදාළව අඛන්ඩ විමෝචන නිරීක්ෂණ පද්ධති (CEMS) මගින් සිදුකරන ලද අඛන්ඩ නිරීක්ෂණද දුම් මාර්ග විමෝචන නිරීක්ෂණය කරනු පිණිස වසර පුරා සිදුකරන ලදී. ඒකකය 01 ට අදාළ අඛන්ඩ විමෝචන නිරීක්ෂණ පද්ධතිය වෙනුවට මෑතකදී නවීනතම තාක්ෂණය සහිත නිස්සාරණ වර්ගයේ අඛන්ඩ විමෝචන නිරීක්ෂණ පද්ධතියක් යොදන ලද අතර එතුළ දුරස්ථ නිරීක්ෂණ පහසුකම් අන්තර්ගත වේ.

තවද, 2018 වර්ෂයේ නිරිත දිග මෝසම් සමය තුළ ජයශ්‍රී මහා බෝධිය පරිශ්‍රයේ අවට වාතයේ ගුණාත්මකභාවය මනිනු ලබන වැඩසටහනක් දියත් කරන ලදී. මේවන විටද පරීක්ෂණ වාර්තා දහයක් නිකුත් කොට ඇති අතර, එකී නිරීක්ෂණ වැඩසටහනේ ප්‍රතිඵල මගින් අනාවරණය කරන ලද පරිදි සියලු නිරීක්ෂණ පරාමිතීන් ඒවාහි අවසර ලබාදිය හැකි උපරිම මට්ටම්වලට වඩා පහළ මට්ටම්වල පැවතිණි. S1 වගුව මඟින් අධීක්ෂණ පරාමිතිවල උපරිම අවසර ලත් මට්ටම් පෙන්වන අතර S7 රූපය මගින් ජය ශ්‍රී මහා බෝධි පරිශ්‍රයෙන් ලබාගත් වායු තත්ත්ව මිනුම් පෙන්වයි.

වගුව S1: අවසර ලබාදිය හැකි උපරිම මට්ටම්

| පරාමිතිය | ඒකකය | අවසර ලබාදිය හැකි උපරිම මට්ටම |
|---|---|---|
| $PM_{10}$ | µg/m³ | 100 |
| $PM_{2.5}$ | µg/m³ | 50 |
| $SO_2$ | ppb | 30 |
| $NO_2$ | ppb | 50 |
| CO | ppb | 26,000 |
| $O_3$ | ppb | 100 |




*රූපය S7: ජය ශ්‍රී මහා බෝධිය පරිශ්‍රයේ වාතයේ ගුණාත්මකභාවය මැනීම*

**ශෝෂා හා කම්පන නිරීක්ෂණය**

ලක්විජය විදුලි බලාගාරයේ පිළිවෙතක් ලෙස බලාගාරයේ ශෝෂා හා කම්පන මට්ටම් අවසර ලබාදිය හැකි සීමාවන් තුළ පවත්නේද යන්න තහවුරු කරගනු පිණිස ශෝෂා මට්ටම පිළිබඳ නිරීක්ෂණයක් සෑම මාස හයකට වරක්ද, කම්පන මට්ටම පිළිබඳ නිරීක්ෂණයක් සෑම වසරකටම වරක්ද සිදුකරනු ලබයි. 2022 වසර සඳහා වූ ප්‍රතිඵල තුළ අනාවරණය කරන ලද පරිදි බලාගාර මෙහෙයුම් කටයුතු අතරතුර ශෝෂා මෙන්ම කම්පන මට්ටම්ද අවසර ලබාදිය හැකි මට්ටම තුළ පැවතිණි.

අවසන, ආර්ථික, සමාජ හා පාරිසරික වශයෙන් වන තිරසරභාවයේ කුලුණු තුන තුළදීම ඉටුකරනු ලබන තීරණාත්මක කාර්යභාරය අප විසින් හඳුනාගනු ලැබ ඇති අතර, හරිතාගාර වායු විමෝචනයන් හා වායු සහ ජල දූෂණයද අවම කරමින් ජෛව විවිධත්වය සුරකිනු පිණිස වූ අපගේ පරිශ්‍රමයන් හරහා වඩාත් පවිත්‍ර වූද, සෞඛ්‍ය සම්පන්න වූද, තිරසර වූද අනාගතයක් කරා පියමං කරමින් සිටින්නෙමු. අපගේ වර්තමාන පරිශ්‍රමයන් හරහා මෙන්ම නවෝත්පාදනයන් සහ අපගේ පාර්ශවකරුවන් සමග එක්ව කටයුතු කිරීම මගින්ද අපගේ තිරසරභාවය පිළිබඳ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමට අප කැපවී සිටින්නෙමු.

# ආයතනික සමාජ වගකීම් වාර්තාව

රටේ විදුලි උපයෝගිතා සම්පාදන ආයතනය වශයෙන්, පරිසරය හා සමාජය කරා වූ අපගේ වගකීම හඳුනාගෙන සිටින්නෙමු. අපගේ පාරිභෝගිකයන් වෙත විශ්වසනීය ලෙස හා දැරිය හැකි මිලකට බලශක්තිය සම්පාදනය කරන අතර අපගේ ව්‍යාපාරික වගකීම හා තිරසරබව පවත්වාගෙන යාමටද කැපවී සිටින්නෙමු. මෙම පරිච්ඡේදය තුළ අපගේ ආයතනික සමාජ වගකීම් (CSR) මූලාරම්භය හා පරිසරය සහ සමාජය කෙරෙහි එහි ඇති බලපෑම පිළිබඳ සාරාංශයක් විස්තර කෙරේ.

## පාරිසරික මූලාරම්භයන්

අපි පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් පරිහරණය ප්‍රවර්ධනය කෙරෙහි කැපවී සිටින්නෙමු. 2022 වසර තුළ පසුගිය වසරට සාපේක්ෂව ජාලයට සම්බන්ධිත හා වහළය මත සවිකරන සූර්ය ජනනයෙහි 32% ක වර්ධනයක් සාක්ෂාත් කරගත්තෙමු. මෙම වර්ධනය ප්‍රධාන වශයෙන් පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් උකහා ගැනීමේ අපගේ කැපවීම හේතුකොට සිදුවූවකි.




රූපය CSR1: විදුලිය ජනනය සඳහා සූර්ය බලශක්තියේ දායකත්වය

මෙයට අමතරව, කාර්ය බහුල ඉල්ලීම් සහිත කාල වේලාවන් තුළ ෆොසිල ඉන්ධන භාවිතය අවම කරනු පිණිස හා ඒ අනුව හරිතාගාර වායු විමෝචනයන් අවම කරනු පිණිසද කටුනායක අපනයන සැකසුම් කළාපය තුළ ඉල්ලුම් ප්‍රතිචාරී නියමු ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීමේ කර්තව්‍යය අපි ආරම්භ කොට ඇත්තෙමු.

තවද, ලක්විජය විදුලි බලාගාරය සහ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය විසින් ඒකාබද්ධව තලවිල කොරල් පර සංරක්ෂණය කිරීමේ වැඩසටහනක් දියත් කොට ඇත. ඒ අනුව, 2022 මුහුද රළු වීමේ සමය ආරම්භ වීමට පෙර තලවිල කොරල් පරය ආසන්නයේ කෘත්‍රිම ගල්පර 40 ක් හැඩගස්වන ලදී (රූපය CSR2 සහ CSR3). මුහුද රළු වීමේ සමය අවසානයේදී මෙම ගල්පර බෝල මත ජීවී කොරල් කොටස් පැළ කෙරෙනු ඇති අතර, ආසන්න මුහුදු කළාපයේ මත්ස්‍ය සම්පත් හා ජෛව විවිධත්වයද සංවර්ධනය කරනු පිණිස කෘත්‍රිම කොරල් පරයක් තලවිල කොරල් පරය අසල සකස් කෙරෙනු ඇත. මෙම වැඩසටහනේ සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 2.6 කි.



රූපය CSR2: කෘත්‍රිම ගල්පර



රූපය CSR3: කෘත්‍රිම ගල්පර ස්ථානගත කිරීම

විදුලිය ජනන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ගසක කොටසක් විනාශ වීමේ සිට වනාන්තර විනාශය දක්වා පාරිසරික ප්‍රතිඵල වෙනස් විය හැක. වගකිව යුතු රජය සතු ආයතනයක් වශයෙන් ලං.වි.ම. විසින් සංවර්ධන ව්‍යාපෘති ආරම්භයේ සිට ප්‍රවේශම් සහගත ලෙස සැලසුම්කරණය මගින් මෙම බලපෑම් අවම කිරීමේ ප්‍රයත්නයක නිරතව සිටී. ප්‍රතිකර්ම වශයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා සහයෝගයෙන් ප්‍රති-වන වගාව සිදු කිරීමට අමතරව, ලං.වි.ම. විසින් සිය ජලාශයන්හි දිය බස්නා ප්‍රදේශයන්හි 32,500 ඉක්මවූ රුක් සංඛ්‍යාවක් රෝපණය කොට ඇත. මෙම උත්තුංග සමාජ සේවය නොකඩවා ඉදිරියට ගෙන යමින්, පරිසර ශෝධනය හා අලංකරණය සහතික කරනු පිණිස 2022 වසර තුළ රුක් 2,500 ඉක්මවූ සංඛ්‍යාවක් රෝපණය කරන ලදී.

## සමාජ මූලාරම්භයන්

අපි අප ක්‍රියාත්මකවන සමාජය සමග එක්ව කටයුතු කිරීමේ වැදගත්කම වටහාගෙන සිටින්නෙමු. අපගේ සමාජ මූලාරම්භයන් තුළ අධ්‍යාපනය, සෞඛ්‍ය හා යහ සාධනය ප්‍රවර්ධනය සහ ප්‍රාදේශීය ප්‍රජාවනට සහාය දැක්වීම කෙරෙහි ද අවධානය යොමු කරනු ලැබේ.

2022 වසර තුළ සමාජයේ යහපත උදෙසා අප විසින් පහත සඳහන් ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සම්පූර්ණ කරනු ලැබ ඇත.

# ආයතනික සමාජ වගකීම් වාර්තාව (ඉතිරි කොටස)

පාරිසරික හා සමාජ ප්‍රතිලාභ උදාවන පරිදි මඟී පහසුවද ඇති කරවමින් පොදු ප්‍රවාහන ක්‍රම භාවිතය නංවාලනු පිණිස රු. මිලියන 4.3 ක සමස්ත පිරිවැයක් දරා පාලවි - කල්පිටිය සහ පාලවි - පුත්තලම් ප්‍රධාන මාර්ගයන් දෙපස බස් මඟී ආවරණ 10 ක් ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලදී. (රූපය CSR4)



*රූපය CSR4: පාලවි - කල්පිටිය ප්‍රධාන මාර්ගයන් දෙපස බස් මඟී ආවරණ*

ගුණාත්මක අධ්‍යාපනයක් ලබාගැනීමේ හැකියාව සහතික කිරීම, සමාජ සමානාත්මතාව හා අන්තර්ගත බව ප්‍රවර්ධනය සහ සිසු-ගුරු යහපත හා සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කරනු පිණිස රු. මිලියන 9.2 ක මුලු පිරිවැයක් දරා ඉලංතාඩිය රජයේ සිංහල පාසලේ 25'x80' ප්‍රමාණයේ පාසැල් ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. (රූපය CSR5)



*රූපය CSR5: ඉලන්තඩිය රජයේ සිංහල පාසලේ පාසල් ගොඩනැගිල්ල.*

සෞඛ්‍ය සම්පන්න හා ප්‍රාණවත් වූ ජන සමාජයක් උදෙසා අතිශයින් වැදගත්වන සමාජයට අවශ්‍ය පුරවැසියෙක්ය යන හැඟීම සහ සමාජ සම්බන්ධතාවයන් සමාජය තුළ වැඩි වර්ධනය කරනු පිණිස මාම්පුරිය හා නාරක්කල්ලිය ප්‍රදේශවල ප්‍රජා ශාලා දෙකක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

ඉදිකිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 8.4 කි.



*රූපය CSR6: ප්‍රජා ශාලා ඉදි කිරීම*

මෙහෙයුම් සමාලෝචනය

# මූල්‍ය අංශය



# මූල්‍ය අංශය

ව්‍යාපාරික කටයුතුවල දිගු කාලීන තිරසරබව සහ වර්ධනය සඳහා අවශ්‍ය පහසුකම් සලසනු පිණිස ලං.වි.ම. තුළ මූල්‍ය අංශය විසින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මුදල් අංශයේ මූලික අරමුණ වනුයේ මනා නිර්ණායක මත පදනම්ව ඵලදායී මූල්‍ය තීරණ ගනිමින් ලංකා විදුලිබල මණ්ඩලයේ කර්තව්‍යයනට අදාළ පිරිවැය කාර්යක්ෂමතාවය සාක්ෂාත් කරගැනීමයි. අංශයේ සෙසු අරමුණු හා කර්තව්‍ය අතරට කළමනාකරණ තීරණ ගැනීම්වලට අදාළ නිවැරදි මූල්‍ය තොරතුරු ලබාදීම, දැනට පවත්නා මුදල් ඵලදායී ලෙස උපයෝගී කරගැනීම සඳහා මුදල් ප්‍රවාහය සහ අරමුදල් කළමනාකරණ ක්‍රමෝපායන් සකස් කිරීම, ප්‍රධාන කාර්යසාධන දර්ශක තුළ පවත්නා හිදැස් හඳුනාගනු පිණිස මූල්‍ය කාර්ය සාධනය සම්බන්ධයෙන් වාර්තා කිරීම, මූල්‍ය අවදානම් සමනය පිණිස ක්‍රමෝපාය සකස් කිරීම, ප්‍රමාණවත් මූල්‍ය පාලනයන් ක්‍රියාත්මකව පවත්නා බවට වගබලා ගැනීම, පනවනු ලැබ ඇති ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන සකස් කෙරෙන බවට වගබලා ගැනීම, මූල්‍ය ශක්‍යතාවයක් සහිත මූලාශ්‍රයන්ගෙන් අරමුදල් ලබාගැනීම සහ ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය සහතික කරනු පිණිස මුදල් ආශ්‍රිත කටයුතු ඉටු කිරීම යන කරුණුද ඇතුළත් වේ.

## වසරේ සමාලෝචනය

2022 වසර තුළ එක් එක් කර්තව්‍යයට අදාළ මෙහෙයුම් කටයුතු නගා සිටුවීම සඳහා ගන්නා ලද සුවිශේෂී මූලාරම්භයන් පිළිබඳ ලුහුඬු විස්තරයක් පහත දක්වා ඇත.

ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටම් සාක්ෂාත් කරගැනීමේ කාර්යයේදී මූල්‍ය අංශයට අඛණ්ඩ අභියෝගයනට මුහුණ දීමට සිදුවිය. දේශීය ණය ගෙවීම් නවතා ඇති තත්ත්වය සහ රුසියාව හා යුක්රේනය අතර යුද්ධයේ අහිතකර ප්‍රතිඵලයක් වශයෙන් සැලකිය යුතු මට්ටම්වලින් සැපයුම් දාමයට බාධා සිදුවීම හේතුකොට වෙළඳපල තුළ ඇතිවූ අස්ථාවරත්වය හා සමගින් අවපාතයක් කරා ගමන් කරමින් පවත්නා ගෝලීය අර්බුදයද යන හේතු සාධක මත සංකීර්ණ ප්‍රතිඵල අත් විඳින්නට සිදුවිය.

උක්ත සන්දර්භය තුළ, ගල් අඟුරු ආනයනයට අදාළ මිල ගණන් සීඝ්‍ර ලෙස ඉහළ නැගී අතර, විදේශ විනිමය සංචිත සිඳී යාම හේතුකොට දේශීය බැංකු ජාලය තුළ ගල් අඟුරු ආනයනය කිරීමට අවශ්‍ය විදේශ විනිමය සොයාගැනීම දුෂ්කර කටයුත්තක් විය. ඉහත කරුණුවල ප්‍රතිවිපාකයක් වශයෙන්, සැපයුම්කරුවන්ගේ කොන්ත්‍රාත්වලට ඉඩ හසර විවර කිරීමේ අභියෝගය මූල්‍ය අංශය වෙත ඉදිරිපත් විය. කොන්ත්‍රාත් බැඳීම් පියවීමේ ප්‍රමාදයන් මධ්‍යයේ, අවශ්‍ය විදේශ විනිමය සම්පාදනය කළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත්වීම සමගින් මූල්‍ය අංශයට තත්වය කළමනාකරණය කරගැනීමට හැකිවිය.

මෙයට අමතරව, සීඝ්‍ර ලෙස ඉහළ ගිය ගල් අඟුරු මිල ගණන්, ඉන්ධන තෙල් මිල ගණන් නිරන්තරයෙන් ඉහළ නැංවෙන පරිදි සිදු කරන ලද සංශෝධනයන් සහ විදේශ විනිමයේ වර්ධිත ප්‍රවණතාවයන්ද හා අනුගතව ජනන පිරිවැය වර්ධනය විය. මේ අතර, වසරේ 3 වන කාර්තුව දක්වා විදුලි ගාස්තු ස්ථාවරව පැවති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අනිවාර්ය විදුලිය විසන්ධි කිරීමේ කාලය දීර්ඝ කිරීමට මං සලසමින් දෛනික විදුලි ජනනය සඳහා අවශ්‍ය ඉන්ධන හා උපකරණ ලබාගැනීම සඳහා අවශ්‍ය මුදල් විෂයයෙහි දැඩි හිඟයක් ඇතිවිය.

මෙම තත්වය තුළ, මූල්‍යායතනයන් තුළින් ණය පහසුකම් නංවාලීම හා බැංකුවලින් ලබාගත් කෙටි කාලීන හා දිගු කාලීන ණය ප්‍රතිව්‍යුහගත කිරීම මගින් මුදල් ලබාගැනීම හරහා මුදල් ප්‍රවාහ හිදැස පටු කරගැනීමට මූල්‍ය අංශයට හැකිවිය. මෙයට අමතරව, ජාතික ආර්ථිකය අඩුම විදුලිය විසන්ධි කිරීම් සහිතව ඉදිරියට ගමන් කරවීමේ අභිලාශය පෙරදැරිව සැපයුම් සඳහා අවශ්‍ය ගෙවීම් කල්තැබීමේ ක්‍රියාමාර්ගයන් ගන්නා ලදී.

කෙසේ වුවද, රජයේ සුරැකුම්පත්වල මිල ගණන්ද ඉහළම අගයක පැවති තත්වයක මූල්‍ය පිරිවැය ඉතිහාසයේ ඉහළම අගයකට පිවිසි වටපිටාවක තරගකාරී මිල ගණන් යටතේ පහසුකම් ලබාගැනීම සඳහා මූල්‍යායතන සමග වෙහෙස නොබලා සාකච්ඡා කිරීමට මෙම අංශයට සිදුවිය. දිගු කලකට පෙර සිදුකළ යුතුව පැවති ගාස්තු ප්‍රතිශෝධනය ක්‍රියාත්මක කිරීමත් සමගින් වසරේ දෙවන භාගයේදී මුදල් ප්‍රවාහයට අදාළ සහනයක් ලැබුණු අතර, එතෙකුදු වුව, එය විදුලියේ පිරිවැය ගැලපීමට ප්‍රමාණවත් නොවිණි. එබැවින්, අඛණ්ඩව ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සිදු කෙරෙන බවට වගබලාගනු පිණිස මුදල් ප්‍රවාහ හිදැස පියවීම සඳහා අවශ්‍ය ක්‍රම සහ විධි සොයා බැලීමට නොකඩවා මූල්‍ය අංශය වෙත බල කෙරිණි.

අරමුදල් සපයන ආයතනය, ව්‍යාපෘති කළමනාකරණ ඒකක (PMUs), විදේශ සම්පත් දෙපාර්තමේන්තුව (ERD), සහ මහා භාණ්ඩාගාරය අතර ඉස්මතුව පැවති ණය ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් සිය සහාය ලබා දෙමින් සියලු විදේශ අරමුදල්ගත ව්‍යාපෘතීන් සඳහා සම්බන්ධීකරණ ඒකකයක් වශයෙන් ලං.වි.ම. මූල්‍ය අංශය ක්‍රියාත්මක වේ. සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය අංශය මහා භාණ්ඩාගාරයේ සහයෝගය සහිතව සම කොටස්වලට ණය (මහා භාණ්ඩාගාරය හරහා ලබාගත් ව්‍යාපෘති ණය) පරිවර්තනය කරනු සඳහා ලං.වි.ම. මූල්‍ය ප්‍රකාශන ගැළපීමේ කාර්යයෙහි නියැළිණි.

මුදල් වෙන් කිරීම, ගෙවීම් පිරිසැකසුම්කරණය සහ ගෙවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමද අංශයේ ප්‍රධාන කර්තව්‍යයන් අතරින් සමහරකි. අයහපත් මුදල් ප්‍රවාහයන් හේතුකොට 2022 වසර ලං.වි.ම. ට තීරණාත්මක වසරක් විය. කෙසේ වුවද, මූල්‍ය අංශය විසින් ගෙවීම් ප්‍රමුඛතාගත කරන ලද අතර, එක් එක් අංශයට දෛනික ගෙවීම් සීමාවන් පනවමින් පවත්නා අරමුදල් කාර්යක්ෂමව වෙන් කරන ලදී. තවද, හැකිතාක් දුරට ගල් අඟුරු, ස්වාධීන විදුලිය නිෂ්පාදකයන් සහ සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින් සඳහා ගෙවීම් සිදු කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙලයන් සකසන ලදී.

සාමාන්‍ය බරතැබූ ප්‍රමුඛ ණයදීමේ අනුපාතය මත පදනම් වූ දිගු කාලීන ණයවලට අදාළ සියලු වාරික පොළී අනුපාත ඉහළ යාම හේතුකොට වැඩි කරන ලද නමුදු, කිසිදු ණය මුදලක් අක්‍රිය කාණ්ඩයට යොමු කිරීමකින් තොරව 2022 වසර සඳහා අදාළ ණය වාරික සියල්ල ගෙවීමට ලං.වි.ම. ට හැකිවිය.

තාක්ෂණික පැතිකඩයනට අනුව, මහජන බැංකු සම්බන්ධීකරණයෙන් සියලු අංශවල විද්‍යුත් බැංකුකරණ පහසුකම ක්‍රියාත්මක කරන ලදී.

2022 වසර තුළ මුදල් ප්‍රවාහය වැඩිදියුණු කරමින් අයහපත් ණය කපා හැරීමේ තත්ත්වයන් අවම කරන ණයකරු රැස්කිරීම් සඳහා අවශ්‍ය කාලීන ක්‍රියාමාර්ග ගැනීමේ වෙළඳ ණයකරු අයකිරීම් හා කපා හැරීමේ ක්‍රියාවලිය කෙටුම්පත් කිරීමේ කාර්යය අංශය විසින් ආරම්භ කරන ලදී.

තවද, ලං.වි.ම. සේවා නියුක්තිකයන්ගේ ප්‍රයෝජනය සඳහා ලං.වි.ම. අර්ථසාධක අරමුදල සහ විශ්‍රාම වැටුප් අරමුදලද කළමනාකරණය කිරීමේ වගකීම මූල්‍ය අංශය සතුවේ. වසර තුළ ස්ථාවර තැන්පතු පොළී අනුපාත සහ ඉහළ ප්‍රතිලාභ සහිත බැඳුම්කර ආයෝජන

# මූල්‍ය අංශය (ඉතිරි කොටස)

හා සන්සන්දනාත්මකව ආයෝජන මත ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස වර්ධනය විය. 5% සිට 8% දක්වා ආයෝජන අඩු පොලී අනුපාතිකයක පැවති ස්ථාවර ආයෝජන සුරැකුම සැලකිය යුතු ප්‍රමාණයක් කල් පිරීමට පෙර ඉවත් කරගැනීමේ නිර්භීත තීන්දුවක්ද අංශය විසින් ක්‍රියාත්මක කරන ලද අතර, මෙම අරමුදල් දෙකේම කාර්ය සාධනය වර්ධනය කිරීමට සැලකිය යුතු දායකත්වයක් ලබාදෙමින් ආයෝජන මත අධිකතර ප්‍රතිලාභයක් සහිත 25% සිට 29% දක්වා අනුපාතයන්ගෙන් එම මුදල් නැවත ආයෝජනය කරන ලදී. ඒ අනුව, පිළිවෙලින් රු. මිලියන 845 හා රු. මිලියන 568 ප්‍රමාණයන්ගෙන් විශ්‍රාම අරමුදලට හා අර්ථසාධක අරමුදලට අදාළ ඉහළ ප්‍රතිලාභ තුළට දායකත්වය ලබාදෙන ලදී.

## භාණ්ඩාගාර කළමනාකරණය

අවදානම් පාලන කාර්ය පර්පාටි ක්‍රියාත්මක කිරීම සඳහා වූ වගකීම භාර ගනිමින් මෙන්ම භාණ්ඩාගාර කළමනාකරණ පැතිකඩට අදාළව ඉස්මතුවන හඳුනාගත් අවදානම් සඳහාද වගකීම් භාරගනිමින් ලං.වි.ම. අවදානම් කලමනාකරණ ප්‍රවේශයේ පළමු ආරක්ෂක වැටිය වශයෙන් මූල්‍ය අංශය ක්‍රියාත්මක වේ. භාණ්ඩාගාර කර්තව්‍යයට අදාල ප්‍රධාන කටයුතු වනුයේ:

- ලං.වි.ම. විසින් එහි ප්‍රතිලාභ සීමාවන් සපුරාලනු ලබන බවට සහතික කරනු පිණිස ආයෝජන ප්‍රතිලාභ ප්‍රශස්තකරණය
- නියාමන අවශ්‍යතාවනට අනුගත වන අතරම වෙළඳපල හා ලං.වි.ම. මෙහෙයුම් කටයුතුවලට අදාළ වෙනස්වීම්වලට අනුගත වීමට යොමුවන්නාවූ ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටම් පවත්වාගෙන යාම.
- පැහැදිලිව අර්ථ නිරූපිත සීමා මායිම් ඇතුළත ආයෝජන තීරණ ක්‍රියාත්මක කරනු පිණිස මනාසේ අර්ථ නිරූපිත හා ප්‍රායෝගික වූ රාමුවක් සම්පාදනය.
- ලං.වි.ම. ආයෝජන වත්කම්/කළඹට අදාළ තත්ත්වය හා කාර්ය සාධනය නිරීක්ෂණය කිරීමට ආයතනික කළමනාකරණ කණ්ඩායමට (CMT) හැකිවනු පිණිස සෘජු හා පාරදෘශ්‍ය වාර්තාකරණ ක්‍රියාවලියක් ස්ථාපනය.
- ආයෝජන ක්‍රියාකාරකම්හි ආරක්ෂාව, ද්‍රවශීලතාව හා ප්‍රමාණවත් ප්‍රතිලාභ (ප්‍රමුඛතා අනුපිළිවෙලට) සහතික කිරීම.

## ලං.වි.ම. අර්ථසාධක අරමුදල

ලංකා විදුලිබල මණ්ඩලීය අර්ථසාධක අරමුදල (CEBPF) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අමුදල පනතේ විධිවිධාන යටතේ පුද්ගලික අර්ථසාධක අරමුදලක් ලෙස ක්‍රියාත්මක වේ. අරමුදලේ භාරකරු වශයෙන් ලං.වි.ම. අධ්‍යක්ෂ මණ්ඩලයේ සුපරීක්ෂාව යටතේ කළමනාකරණ කමිටුවකට අරමුදලේ කටයුතු සම්බන්ධ සමස්ත වගකීම පැවරී ඇත.

අතිශයින්ම අභියෝගාත්මක තත්ත්වයන් තුළට අනුගත වෙමින් පෝෂණය වීමේ සිය හැකියාව පෙන්වමින්, සමාලෝචිත වසර තුළ සිය මෙහෙයුම් ඉතිහාසයේ ඉහළම ලාභයක් අරමුදල විසින් ලබාදෙන ලදී. නිසි කලට සිදුකරනු ලබන මැදිහත්වීම් හරහා ඉස්මතුවන අවදානම් හා වගකීම් හඳුනා ගනිමින් ඒවාට ප්‍රායෝගිකව ප්‍රතිචාර දැක්වීමෙහි ලා අරමුදල සතු ඉදිරි දැක්ම වසරේ සාර්ථකත්වය තුළින් සනාථ කෙරිණි.

අරමුදලේ ලාභදායකත්වය හා පසුගිය වසර පහට අදාළව වාර්තා වූ සම කොටස් මත ප්‍රතිලාභ පිළිවෙළින් F1 හා F2 රූප වල දක්වා ඇත.




රූපය F1: ආයෝජන මත ප්‍රතිලාභ




රූපය F2: අර්ථසාධක අරමුදලේ ලාභදායකත්වය

2022 වසරේ මෙහෙයුම් පසුබිමට වසංගතය ආශ්‍රිත බාධාවන් මගින් නොඩකවා බලපෑම් එල්ලවූ බැවින්, ලං.වි.ම. අර්ථසාධක අරමුදලට තවත් වංචල හා අවිනිශ්චිත වසරකට මුහුණ දෙන්නට සිදුවිය. මෙම අභියෝගාත්මක කාලයන් මධ්‍යයේ වුව, අරමුදල විසින් එහි ක්‍රමෝපායික දැක්ම හා ප්‍රතිචාරිත්වය බාහිර චණ්ඩ මාරුතයන් කළමනාකරණය සඳහා උපයෝගී කරගන්නා ලද අතර එමගින් සියලු පාර්ශවකරුවන් වෙත අඛණ්ඩ ස්ථාවරත්වයක් හා අගය නිර්මාණයක්ද ලබාදෙමින් වාර්තාගත ලාභදායකත්වයක්ද පෙන්නුම් කරන ලදී.

ඉස්මතුවන අවදානම් සහගත තත්ත්වයන් නිසි කලට හා කාර්යක්ෂම ලෙස කළමනාකරණය කරමින් අරමුදලේ කාර්ය සාධනය ආරක්ෂා කරගන්නා ලදී. ආයෝජන කළඹ නිසි කලට පෙළ ගැස්වීම තුළින් ස්ථාවර තැන්පතු ආයෝජන තුළින් අරමුදලේ ද්‍රවශීලතාවයට හා ලාභදායකත්වයට ක්‍රමෝපායික අවධාරණයක් ලබාදෙන ලදී. ඒ අනුව, අරමුදල විසින් පිළිවෙලින් 95% ක හා 108% ක ආදායම් හා ලාභ වර්ධනයක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, සාමාජිකයන් වෙත ලබාදෙන ලද ණය මුදල් පිළිබඳ පරීක්ෂාවන් සම්බන්ධ වර්ධනයක් හා වාහන ඉන්ධන තෙල් සහ අමතර කොටස්වල වර්ධනයක්ද සමගින් මෙහෙයුම් වියදම්වල 57% ක තියුණු වර්ධනයක් සිදුවිය.

2022 වසර සඳහා වූ අරමුදලේ බදු වියදම් 17.2% අගයකින් තරමක් දුරට වර්ධනය වී ඇත. කෙසේ වුවද, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25 අ (1) වගන්තිය යටතේ මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු ගෙවිය යුතුවන අරමුදල් මත 15% ක අනුපාතකයකට නියෝගයක් නිකුත් කර ඇත. අරමුදල විසින් පොලී ආදායම මත කිසිදු එකතු කළ අගය මත බදු මුදලක් නොගෙවන ලද නමුදු පොළී ආදායම මත 15% ක එකතු කළ අගය මත බදු පැනවීම මගින් අරමුදලේ තිරසරභාවය අයහපත් අතට හරවනු ඇත.

2022 වසර තුළ අරමුදලේ වත්කම් පදනම රු. බිලියන 87.2 දක්වා 17.9% කින් වර්ධනය විය. අවදානම්-ප්‍රතිලාභ ගතිකයන් ප්‍රශස්තකරණයේදී අරමුදල විසින් තෝරාගත් ආයෝජන අවස්ථාවන් පමණක් අනුගමනය කරන ලදී. පැවති මෙහෙයුම් තත්ත්වයන් යටතේ අරමුදලේ ආයෝජනය (පසුගිය වසරේ වූ 74.9% අගය හා සාපේක්ෂව) සමස්ත වත්කම්වලින් 75.7% ක් විය.

# මූල්‍ය අංශය (ඉතිරි කොටස)

2022 දෙසැම්බර් මස 31 වන දිනය වනවිට සාමාජිකයන්ගේ ඉතිරි මුදල රු. බිලියන 74.6 දක්වා 5.2% කින් ඉහළ නංවමින් සමස්ත වගකීම් 22% කින් පහත වැටිණි. අරමුදල සතුව සාමාජික ගිණුම් 25,162 ක් පැවති අතර, ඒ අතරින් 24,553 ක් පමණ සක්‍රිය දායකත්ව සාමාජිකයෝ වෙති. 2022 වසර සඳහා සමස්ත දායකත්වය රු. බිලියන 6.3 ක් ලෙස වාර්තාවූ අතර, එම කාල සීමාව තුළම අරමුදල විසින් සිය සාමාජිකයන් වෙත රු. බිලියන 2.6 ක මුදලක් ආපසු ගෙවන ලදී. අර්ථසාධක අරමුදලේ විස්තර F3 සහ F4 රූපයන්හි දක්වා ඇත.

**10** රු. බිලියන **ආදායම**

**87.2** රු. බිලියන **සමස්ත වත්කම්**

**9.7** රු. බිලියන **බදු පසු ලාභය**

**58.4** රු. බිලියන **ස්ථාවර තැන්පතුවල ආයෝජනය**




**5.3** රු. බිලියන **ණයකරවල ආයෝජනය**

**9.2** රු. මිලියන **මෙහෙයුම් වියදම්**

**25,162** **සාමාජිකයන් සංඛ්‍යාව**

**5.7** රු. බිලියන **සාමාජික ණය**

**9.2** රු. මිලියන **රජයට බදු**

*රූපය F3: 2022 අවසානය වනවිට අර්ථසාධක අරමුදල සංඛ්‍යාවලින්*













## ආර්ථික වටිනාකම් නිර්මාණය







*රූපය F4: සාමාජිකයන් වෙත ලැබෙන වටිනාකම්*

## විශ්‍රාම වැටුප් අරමුදල

විශ්‍රාම වැටුප් අරමුදල 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතේ 12 (ජේ) වගන්තියේ විධිවිධාන යටතේ 1994-01-01 දින ස්ථාපනය කරන ලද අතර, අරමුදල භාරකරු වන ලංකා විදුලිබල මණ්ඩලය විසින් පත්කරනු ලබන කළමනාකරණ කමිටුවක් මගින් කළමනාකරණය කෙරේ.

2022 වසර අවසානය වනවිට විශ්‍රාමලාභීන් සංඛ්‍යාව 8,105 ක් වූ අතර 7,654 දෙනෙකු අරමුදලෙන් ප්‍රතිලාභ හිමිකම් ලැබූ සක්‍රීය විශ්‍රාමිකයන් විය. වගුව F1 මගින් පසුගිය වසර පහ ඇතුළත විශ්‍රාමිකයන්ගේ සංචලනය සාරාංශගත කෙරෙන අතර, ලං.වි.ම. ට අදාළවන පරිදි විශ්‍රාම යාමේ වයස අවුරුදු 61 බවට පත් කරමින් විශ්‍රාම යාමේ වයස දීර්ඝ කිරීමේ රජයේ ප්‍රතිපත්තිය හේතුකොට ඉදිරි වසර තුළ විශ්‍රාමලාභී ප්‍රතිශතයේ ඉහළ නැගීමක් පිළිබඳ අවදානම් සංඥාවක් අරමුදල වෙත ලබා දෙමින් 2018 වසරේ සිට 2022 වසර දක්වා විශ්‍රාමිකයන් සංඛ්‍යාව ආශ්‍රිත සැලකිය යුතු පහත වැටීමක් සිදුව ඇති බව දක්වා ඇත.

*වගුව F1: පසුගිය වසර 5 ඇතුළත විශ්‍රාමිකයන්ගේ සංචලනය*

| වර්ෂය | විශ්‍රාමිකයන් සංඛ්‍යාව | විශ්‍රාමිකයන් සංඛ්‍යාවේ වර්ධනය | |
|---|---|---|---|
| | | සංඛ්‍යාව | % |
| 2018 | 7,061 | 439 | 6.6% |
| 2019 | 7,533 | 472 | 6.7% |
| 2020 | 7,839 | 306 | 4.0% |
| 2021 | 8,057 | 218 | 2.8% |
| 2022 | 8,105 | 48 | 0.6% |

ඉන් පෙර වසර හතර ඇතුළත විශ්‍රාම වැටුප් බැරකම් පියවීම සඳහා ආයෝජනවලින් ලද ප්‍රතිලාභ ප්‍රමාණය ප්‍රමාණවත් නොවූ අතර රූපය F5 තුළ දක්වා ඇති පරිදි 2022 වසර තුළ දායකත්වයේ පරිහානීය ප්‍රවණතාවය පෙන්වා දී ඇත. ඉහත විස්තර කරන ලද හේතු සාධක මගින් අරමුදල අනුගමනය කළ ක්‍රමෝපායන් නැවත සැලකිල්ලට ගනිමින් අරමුදලේ තිරසර පැවැත්ම ඉලක්ක කරගනිමින් ක්‍රමෝපායන් සකස් කිරීමට භාණ්ඩාගාර කළමනාකරණ ශාඛාව පොළඹවනු ලබයි. අරමුදලේ ආයෝජන කළඹ රූපය F6 හි දක්වා ඇත.




*රූපය F5: පසුගිය වසර පහ ඇතුළත විශ්‍රාම වැටුප් අරමුදලේ සංචලනය*




*රූපය F6: ආයෝජන කළඹ*

# මූල්‍ය සමාලෝචනය

කොවිඩ් - 19 වසංගතයේ හා ගෝලීය උච්චාවචනයන්හි පුළුල් පදනමකින් යුත් බලපෑම්ද සමගින් රටතුළ උද්ගත වූ ආර්ථික ආපදාව විසින් ප්‍රධාන සාර්ව ආර්ථික දර්ශක ගණනාවක් තුළ අඩු අගයන් වාර්තාවන්නට වූ පසුබිමෙක, රට සමාජ ආර්ථික අර්බුදයක් කරා තල්ලු කරනු ලැබීය. විදේශ විනිමය අර්බුදය විසින් ඉන්ධන ප්‍රධාන කොටගත් අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල හිඟයක් ඇතිකරන ලද අතර, ශ්‍රී ලංකා රුපියලේ අගයෙහි සිදුවූ තියුණු පහත වැටීම විසින් 2022 වසර පුරා ඉන්ධන හා ගල් අඟුරු මිල ගණන්වල තත්ත්වය වඩාත් අයහපත් අතට හරවන්නට විය. මෙම අභියෝගාත්මක වසර තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ජාතියේ විදුලිබල සම්පාදකායතනය වශයෙන් සිය කාර්යභාරය සිදු කරනු උදෙසා අරගලයක නිරත විය. ජලවිදුලි ජනනය සඳහා අවශ්‍ය වර්ෂාපතනයක් නොමැතිවීම හේතුකොට තාප විදුලි බලාගාර සඳහා ඉන්ධන සැපයීමට සිදුවූ අඛණ්ඩ බාධාවන් මධ්‍යයේ ඉල්ලුම සපුරාලනු පිණිස සමාලෝචිත වසර තුළ චක්‍රීය පදනමකින් විදුලිය විසන්ධි කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයට බල කෙරිණි.

## මූල්‍ය කාර්ය සාධනය

### ආදායම

ලංකා විදුලිබල මණ්ඩලය විසින් සිය මෙහෙයුම් ඉතිහාසයේ ඉහළම ආදායම ලබා දෙමින් වසර තුළ රු. බිලියන 308.46 ක් වන පරිදි ආදායම 24% කින් වර්ධනය කරගන්නා ලදී. භාණ්ඩ මිල ගණන්ද ඇතුළත් විදුලි ව්‍යාපාරයට අදාළ අන් සියලු පිරිවැය සාධක නොකඩවා උද්ධමනයට භාජනය වන පරිසරයක 2014 වසරේ සිට එකම අගයක පැවති විදුලිය ගාස්තු විෂයයෙහි 2022-08-10 දින සිට ක්‍රියාත්මකවන පරිදි ක්‍රියාත්මක කරන ලද ගාස්තු ඉහළ නැංවීමේ සංශෝධනය විසින් මෙම ආදායම් වර්ධනය වේගවත් කරන ලදී. විදුලිය පිරිමැසීම පිණිස හඳුන්වා දෙන ලද චක්‍රීය විදුලි විසන්ධි කිරීම් හා රටතුළ පැවති සමාජ ආර්ථික අර්බුදය හේතුකොට සිල්ලර හා තොග පාරිභෝගිකයන් විසින් සිදුකරන ලද අඩු පරිභෝජනය මගින් රටතුළ විදුලිය ඉල්ලුම 5% කින් පහත හෙළන ලදී. අවසන් වූ වසර පහ තුළ අලෙවි කරන ලද බලශක්තියේ විචලනය සහ ආදායම පහත FR1 රූපයේ හි දැක්වේ.




*රූපය FR1: අලෙවි කළ ඒකක හා ආදායමට අදාළ විචලනය*

### ශුද්ධ ලාභය / (අලාභය)

රු. බිලියන 94.7 ක් වූ රජය පාර්ශ්වයෙන් සිදුකළ ණය කොටස් බවට පරිවර්තනය කිරීමේ කාර්යය හේතුකොට ඇතිවූ 688% ක් වූ මෙහෙයුම් අලාභ හා විනිමය අලාභ මගින් වේගවත්ව ඉහළට ඔසවා තබන ලදුව, මෙහෙයුම් ඉතිහාසයේ ඉහළම අලාභය දක්වමින් වසරේ ශුද්ධ අලාභය රු. බිලියන 272.9 ක් ලෙස වාර්තා විය. ලං.වි.ම. භාණ්ඩාගාර ණය රු. බිලියන 372 ක් රජයේ කොටස් ආයොජනයන් වශයෙන් ලං.වි.ම. වෙත පැවරීමට මුදල් අමාත්‍යාංශය තීරණය කිරීම හේතුවෙන් විනියම පාඩු සිදු විය. ඒ අනුව, පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘති ණය මුදලේ ඉතිරිව පවත්නා ශේෂයට අදාළව 2022-12-31 දින සිට විදේශ විනිමය ප්‍රති-ඇගයුම්කරණයක ප්‍රතිඵලයක් ලෙස රු. බිලියන 144 ක විනිමය අලාභයක් රජය විසින් ලං.වි.ම. වෙත මාරුකර ඇති අතර, ඉන් රු. බිලියන 94.7 ක් පවත්නා වර්ෂයේ ආදායම් ප්‍රකාශනයෙන් අයකොට ඇත.

වසරකට පෙර රු. බිලියන 34.1 කින් 390% ක වසරින් වසර සාපේක්ෂ වර්ධනයක් නියෝජනය කරමින් ශුද්ධ මූල්‍ය පිරිවැයෙන් අනතුරුව සිදුවූ අලාභය රු. බිලියන 167.2 ක් ලෙස වාර්තා විය. ඉන්ධන, ගල් අඟුරු හා සෙසු ද්‍රව්‍ය ඇතුළත් ගෝලීය පාරිභෝගික ද්‍රව්‍ය මිල ගණන්වල ඉහළ යාම, විනිමය අනුපාතය පහත වැටීම, හා පිරිවැය පිළිබිඹු කරන්නාවූ ගාස්තු ක්‍රමයක් නොමැති පසුබිමෙක පොළී අනුපාතිකයන්ගේ සිදුවූ වර්ධනය විසින් ශුද්ධ අලාභය මත යම් පීඩනයක් එල්ල කොට ඇත. 2022 වසරේ අගෝස්තු මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද අවසන් පරිශීලක අයක්‍රම සංශෝධනය සමාලෝචිත වර්ෂයේ වෙළඳ භාණ්ඩ මිල ගණන්වල සිදුවූ ඉහළ යාම ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවීය.

චක්‍රීය විදුලිය විසන්ධි ක්‍රමය හා ආර්ථිකයේ සිදුවූ හැකිළීම හේතුකොට 2022 වසර සඳහා වූ විදුලිය ඉල්ලුම පහත වැටී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, විදුලිය ජනනයද පහත වැටිණි.




** අර්ථ නිරූපිත ප්‍රතිලාභ වගකීම් මත ආයුගණක ලාභය/(අලාභය) සෙසු ආදායම් සමගින් ශුද්ධ අගයකට ගෙන එන ලදී*

*රූපය FR2: මූල්‍ය කාර්ය සාධනය 2021/2022*

# මූල්‍ය සමාලෝචනය (ඉතිරි කොටස)

| | 2022 (රු. මිලියන) | 2021 - නැවත ප්‍රකාශිත (රු. මිලියන) | විචලනය (%) |
|---|---|---|---|
| විදුලිය අලෙවිය | 308,457 | 248,776 | 24% |
| සෙසු ආදායම් | 12,975 | 12,597 | 3% |
| විකුණුම් පිරිවැය | (325,245) | (157,374) | 107% |
| රජයේ පාර්ශ්වයෙන් ණය කොටස්වලට පරිවර්තනය කිරීමෙන් ඇතිවූ විනිමය අලාභය | (94,689) | - | 100% |
| අර්ථ නිරූපිත ප්‍රතිලාභ වගකීම් මත ආයුගණක අලාභය | (11,059) | (505) | 2,092% |

විදුලිය ඉල්ලුම 5% කින් පහත වැටීමෙන් අනතුරුව සමාලෝචිත වසර තුළ ජනනය පෙර වසරට සාපේක්ෂව 5% කින් පහත වැටිණි.




රූපය FR3: අලෙවිය හා ජනනය ගි.වො.පැ. වලින්

ජනන මුහුව බොහෝ දුරට පෙර වසරේදී තත්ත්වයට සමාන වූ අතර FR4 රූපයේ දැක්වෙන පරිදි කුඩා ජලවිදුලි බලාගාරයන්ගෙන් ලද දායකත්වය පසුගිය වසර හා සාපේක්ෂව දුර්වල වී ඇත. නොවැළැක්විය හැකි නඩත්තු කටයුතු උදෙසා ලක්විජය විදුලි බලාගාරයේ ජනන යන්ත්‍ර ඉවතට ගන්නා ලද බැවින්, ලක්විජය විදුලි බලාගාරයේ දළ ජනනය 6% කින් පහත වැටුණු අතර, එබැවින් සමාලෝචිත වර්ෂයේ බලශක්ති ඉල්ලුම සපුරාලනු පිණිස ලං.වි.ම. තාප විදුලි බලාගාරයට වැඩි දායකත්වයක් ලබාදීමට සිදුවිය. ජනන මුහුව තුළට ලං.වි.ම. - සුළං හා වහළය මත සවිකරන සූර්ය පැනල දායකත්වයේ සිදුවූ වර්ධනය මගින් පෙර වසර හා සාපේක්ෂව මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරන ලදී. ශුද්ධ ධන (Net Plus&/ ශුද්ධ ගිණුම්කරණය (Net Accounting) යෝජනාක්‍රමද සහිත තත්ත්වයක, පෙර වසර හා සාපේක්ෂව වහළය මත සවිකරන සූර්ය පැනල සම්බන්ධතා සඳහා වූ ඉල්ලුම නොකඩවා වර්ධනය වන්නට විය.




රූපය FR4: ජනන මුහුව

### පිරිවැය ව්‍යුහය

ලංවිම සෑජු ජනන පිරිවැය මුළු පිරිවැයෙන් 66.6% ක් ලෙස සටහන් වූ අතර පසුගිය වසරට සාපේක්ෂව 107% ක වැඩිවීමක් වාර්තා කර ඇත. රුපියල් බිලියන 157 සිට රුපියල් බිලියන 325 දක්වා, ඉන්ධන සහ ගල් අඟුරු මිල 2022 වසර තුළ වාර්තාගත ඉහළ අගයක් දක්වා ඉහළ ගියේය. බල ශක්ති ජනනයේ 6% ක පහත වැටීමක් තිබියදීත්, 2022 වසරට සාපේක්ෂව 186% ක පිරිවැය වැඩිවීමක් ගල් අඟුරු වියදම්වලින් පිළිබිඹු විය. බලශක්ති ජනනයේ 9% ක වර්ධනයක් සහිතව 2021 වසර හා සාපේක්ෂව රු. බිලියන 24.4 සිට රු. බිලියන 68.9 දක්වා ඉන්ධන පිරිවැය 183% කින් වර්ධනය විය. වෙළඳ භාණ්ඩ මිල ගණන්වල සිදුවූ ඉහළ යාම හා තියුණු ලෙස විනිමය අනුපාත අගය පහත වැටීමද හේතුකොට ලං.වි.ම. සෑජු ජනන පිරිවැය රු. බිලියන 325 ක් වැනි ඉතිහාසයේ ඉහළම අගයකට ප්‍රවේශ විය. පසුගිය වසර හා සාපේක්ෂව මූල්‍යකරණ පිරිවැය රු. බිලියන 133 කින් ඉහළ නැගීමෙන් අනතුරුව ආන්තිකයන් හා ශුද්ධ අලාභය මත මෙසේ පැවති තත්ත්වය විසින් දැඩි පීඩනයක් එල්ල කරන ලදී. 2022-08-10 දින සිට ක්‍රියාත්මකවන පරිදි ක්‍රියාත්මක කරන ලද ගාස්තු ප්‍රතිශෝධනය හේතුවෙන් ලං.වි.ම. ට මෙම දුෂ්කරතාවයනට යම් මට්ටමකින් මුහුණ දීමේ හැකියාවක් ඇති විය.

විනිමය අනුපාත අවප්‍රමාණය හා සාපේක්ෂව ඉහළ උද්ධමනය හේතුකොට විනිමය අලාභයක් පිළිබිඹු කරමින් වසර තුළ ලං.වි.ම. පොදුකාර්ය වියදම් 3% කින් වර්ධනය විය. මේ අතර, පිරිස් පිරිවැය කළමනාකරණය මත දැඩි පාලනයක් පවත්වා ගනිමින් පිරිස් පිරිවැය 6% කින් අඩුකර ගැනීමට ලං.වි.ම. ට හැකිවිය.

සෑජු ජනන පිරිවැය ආශ්‍රිතව සිදුවූ සැලකිය යුතු වර්ධනය විසින් රු./කි.වො.පැ. 12.38 (ප්‍රති-ප්‍රකාශිත) සිට රු./කි.වො.පැ. 23.01 දක්වා පසුගිය වසරට සාපේක්ෂව ජනන ලක්ෂ්‍යයේදී ඒකකයක සාමාන්‍ය පිරිවැයෙහි ඉහළ නැගීමක් ඇති කරන ලදී.

අලෙවි ලක්ෂ්‍යයේ සිට අවසන් පාරිභෝගිකයා දක්වා විදුලිය ඒකකයක පිරිවැය 2021 වසරේ (ප්‍රති-ප්‍රකාශිත) රු./කි.වො.පැ. 19.42 අගයට සාපේක්ෂව 2022 වසර සඳහා රු./කි.වො.පැ. 33.65 ක අගයක විය. ඒ අනුව, සෑජු ජනන පිරිවැයද ඇතුළත් මෙහෙයුම් පිරිවැය පසුගිය මූල්‍ය වර්ෂය හා සාපේක්ෂව 65% කින් වර්ධනය වී ඇත.

# මූල්‍ය සමාලෝචනය (ඉතිරි කොටස)




රූපය FR5: පිරිවැය ව්‍යුහය 2021/2022

**ණය ගැනීම් සහ මූල්‍ය පිරිවැය**

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව (CPC) වෙත ගෙවිය යුතු ගාස්තු මත ප්‍රමාද පොළිය රු. බිලියන 2.4 ක් දක්වා 38% කින් ද, ස්වාධීන විදුලිය නිෂ්පාදකයන් වෙත ගෙවිය යුතු ගාස්තු මත ප්‍රමාද පොළිය රු. බිලියන 4.8 දක්වා 278% කින්ද ඉහළ නැගීම හේතුකොට සමාලෝචිත වර්ෂය තුළ ලං.වි.ම. මූල්‍ය පිරිවැය රු. බිලියන 20 සිට රු. බිලියන 41.8 දක්වා 104% කින් වර්ධනය විය. පිරිවැය පිළිබිඹු කරන්නාවූ අවසන් පරිශීලක අයකුමයක් නොපැවතීම සහ විසංගත තත්ත්වය හේතුකොට ගාස්තු ඒකරාශිකරන ක්‍රියාවලියෙහි සිදුවූ බාධාවන්ද මගින් ඒවන විටද බාධාව පැවති ලං.වි.ම. මුදල් ප්‍රවාහයනට දැඩි බලපෑමක් එල්ල වූ අතර, ප්‍රමාද පොළියෙහි වර්ධනයක් ඇති කරමින් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවද ඇතුළත් ප්‍රධාන සැපයුම්කරුවන් වෙත ගාස්තු පියවීමේ කාර්යයට අවහිරතා ඇති කරන ලදී.

2022 වසර තුළ රු. බිලියන 101.5 ක් වූ නව ණය ගැනීම් මධ්‍යයේ පොළී අනුපාතිකයන්හිද වර්ධනයක් පිළිබිඹු කරමින් පොළී පිරිවැයද රු. බිලියන 26.3 දක්වා 114% කින් වර්ධනය විය. මූල්‍ය පිරිවැය වර්ධනයක් ඇති කරමින් සමාලෝචිත වසර තුළ මහ බැංකුව විසින් වාර්තාගත ඉහළ අගයකින් පොළී අනුපාතිකයන් ඉහළ නංවන ලදී. ලං.වි.ම. කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරාලනු පිණිස වර්ධිත අයිරා පහසුකමද මූල්‍ය පිරිවැයට හානිකර බලපෑමක් ඇතිකර ඇත.




රූපය FR6: ණය ගැනීම් හා සාපේක්ෂව මූල්‍ය පිරිවැය

**මූල්‍ය තත්ත්වය**

ජනන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ අංශයන්හි ක්‍රියාත්මක ව්‍යාප්තීන් හා වර්ධිත කාරක ප්‍රාග්ධනයද නිරූපණය කරමින් 2022 වසර තුළ ලං.වි.ම. වත්කම් රු. බිලියන 1,062 දක්වා 6% කින් වර්ධනය විය. ප්‍රධාන දායකත්ව අංශ ලෙස දේපළ, පිරියත හා උපකරණද වෙළඳ හා සෙසු ලැබිය යුතු දෑ ද ඇතුළත් වන පරිදි ජංගම නොවන වත්කම් හා ජංගම වත්කම් පිළිවෙලින් 5% කින් හා 11% කින් වර්ධනය විය.




රූපය FR7: වත්කම් වර්ධනය 2021/2022

ප්‍රධාන වශයෙන්ම සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ මාර්ග සහ සිවිල් කටයුතුවලට අදාළ ආයෝජනයන් හේතුකොට සමස්ත වත්කම් පදනමෙහි 84% ක ප්‍රමාණයක් පිළිබිඹු කරමින් දේපළ, පිරියත හා උපකරණ පසුගිය වසරට සාපේක්ෂව 5% කින් වර්ධනය විය. මේ අතර, ප්‍රධාන කොටම, ලංකා ගල් අඟුරු සමාගම වෙත සිදුකරන ලද අත්තිකාරම් ගෙවීම් සහ සෙසු ද්‍රව්‍ය මිලදී ගනු පිණිස ගෙවන ලද අත්තිකාරම් හා සෙසු පූර්ව ගෙවීම්ද හේතුකොට, වෙළඳ හා සෙසු ලැබිය යුතු දෑ රු. බිලියන 80.2 දක්වා 35% කින් වර්ධනය විය. පසුගිය වසරේ පැවති 13% ක අගය හා සාපේක්ෂව ජංගම වත්කම් සමස්ත වත්කම් පදනමෙහි 14% ක් විය. සිදුකරන ලද උන්නතික අවසන් පරිශීලක අයකුම ගාස්තු සංශෝධනය හා පාරිභෝගිකයන්ගේ වැයකළ හැකි ආදායමේ සීමාකරණයන්ද

සමගින් විදුලිය විසන්ධි කිරීමේ කටයුතු කල්තැබීමට රජය විසින් ගන්නා ලද තීරණය සහ වසංගත සමය තුළ ගාස්තු රැස්කිරීමේ කාර්යයට සිදුවූ බාධාවන්ද හේතුකොට ආශ්‍රිත නොවූ විදුලිය ණයගැතියන්ගේ සංඛ්‍යාව 11% කින් වර්ධනය විය.

මෑත වර්ෂයන්හිදී පිරිවැය පිළිබිඹු කරන්නාවූ අවසන් පරිශීලක අයක්‍රමවේදයක් නොපැවතීම හේතුකොට සිදුවූ අඛන්ඩ මූල්‍ය අලාභයන් විසින් ලං.වි.ම. මූලධන තත්ත්වය සහ අරමුදල් පැතිකඩ අයහපත් තත්ත්වයකට පත්කොට ඇත. 2022 වසර තුළ රු. බිලියන 272.9 ක් වූ ශුද්ධ අලාභයක් තිබියදීත් ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර ණය විදුලිබල මණ්ඩලයේ රජයේ කොටස් ආයෝජන බවට පරිවර්තනය කිරීම හේතුකොට සමස්ත කොටස් ප්‍රමාණය රු. බිලියන 354 දක්වා 104% කින් වර්ධනය වී ඇත. ඒ හා සමගම, රජය විසින් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙත සිදුකළ යුතුවන ගෙවීම් සඳහා අතිරේක සමකොටස් ආයෝජනයක් වශයෙන් රු. බිලියන 80 ක් මාරුකර ඇත. එහි ප්‍රතිවිපාකයක් ලෙස, සමස්ත සම කොටස් ප්‍රමාණය සමස්ත වත්කම් ප්‍රමාණයෙන් 33% ක අගයක් පෙන්වා ඇති අතර, එය පසුගිය වසරෙහි සමස්ත වත්කම් ප්‍රමාණයෙන් 17% ක අගයක් විය.

වර්ෂය තුළ ණය මගින් අරමුදල්ගත ලං.වි.ම. සමස්ත වත්කම් ප්‍රතිශතය ණය කොටස් බවට පරිවර්තනය කිරීම හේතුකොට පසුගිය වසරට සාපෙක්ෂව 46% සිට 26% දක්වා සාපේක්ෂ ප්‍රගතියක් පෙන්වා ඇත. ලං.වි.ම. විසින් නොකඩවා ණය අරමුදල්ගත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යය සිදුකර ඇති අතර එමගින් ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා ණය ගැනීමේ වර්ධනයක් සිදුව ඇති අතර එතුළ රු. බිලියන 33.2 ක මුදලක්ද, වැඩිදුරටත් රු. බිලියන 44.9 ක මුදලක්ද කාරක ප්‍රාග්ධනය මූල්‍යකරණය සඳහා ලබාගන්නා ලදී. වසර තුළ වැඩිදියුණු කරන ලද අයිරා පහසුකම හා අලුතින් ලබාගත් දිගු කාලීන ණය විසින් කෙටි කාලීන ණය ප්‍රමාණය රු. බිලියන 83.2 දක්වා 39% කින් වර්ධනය කර ඇත.




*රූපය FR8: වත්කම් සංයුතිය 2021/2022*




රූපය FR9: සම කොටස් හා බැරකම් සංයුතිය *2021/2022*

# මූල්‍ය සමාලෝචනය (ඉතිරි කොටස)

| අනුපාතය | 2022 | ප්‍රතිප්‍රකාශිත 2021 |
|---|---|---|
| වත්කම් මත ප්‍රතිලාභ | -25% | -3% |
| සම කොටස් මත ප්‍රතිලාභ | -99% | -19% |
| කොටස් වලට ණය | 78% | 267% |
| කොටස් වලට වත්කම් | 26% | 46% |
| ජංගම අනුපාතය | 0.40:1 | 0.45:1 |
| ක්ෂණික අනුපාතය | 0.25:1 | 0.23:1 |
| පොලී ආවරණය | -4.83 | -1.21 |
| ණය සේවා ආවරණ අනුපාතය | -3.00 | 0.49 |

*රූපය FR10: මූල්‍ය අනුපාත*

**අවසන් පරිශීලක ගාස්තු සහ රජයේ ප්‍රතිපත්තිය**

ලං.වි.ම. විසින් ගෘහස්ථ කාණ්ඩයේ සහ සෙසු ගාස්තු කාණ්ඩයන්හි අඩු පරිභෝජන මට්ටම් දක්වන පාරිභෝගිකයන් වෙත රජයේ ප්‍රතිපත්තියක් ලෙස අලෙවි අවස්ථාවේදී සැබෑ පිරිවැයට වඩා අඩු මිලකට විදුලි ගාස්තු පිරිනමනු ලබයි.

එබැවින්, ගෘහස්ථ කාණ්ඩයේ ඉහළ ආන්තිකයේ පාරිභෝගිකයන් හට මෙම අතිරේක පිරිවැයෙන් යම් කොටසක් දැරීමට සිදුවේ. 2022-12-31වන දින සිට පෙරකී රජයේ සහන ප්‍රතිපත්තිය හේතුකොට සිදුවූ සමස්ත අලාභය රු. බිලියන 182.58 ක් වූ අතර, එතුළ ඉහළ ආන්තිකයේ පාරිභෝගිකයන් වෙතින් අයකරනු ලබන අතිරික්තය රු. බිලියන 2.4 ක් විය. එබැවින්, ලං.වි.ම. ට දැරීමට සිදුවූ අලාභය සෙසු ආදායම් හැර රු. බිලියන 180.16 ක් ලෙස ප්‍රකාශිතය.

ඒ අනුව, රජයේ සහන ප්‍රතිපත්තිය හේතුකොට ලං.වි.ම. මූල්‍ය ප්‍රකාශන මත සිදුවූ ශුද්ධ බලපෑම පහත පරිදි වේ:

| | 2022 (රු. මිලියන) | 2021 (ප්‍රති-ප්‍රකාශිත) (රු. මිලියන) |
|---|---|---|
| රජයේ ප්‍රතිපත්තිය හේතුකොට සිදුවූ පාඩුව/හිඟය ( අවශ්‍ය සහන මුදල) | (182,580) | (68,340) |
| අයකළ අතිරික්තය | 2,424 | 21,603 |
| **රජය විසින් ලබාදිය යුතුවන ශුද්ධ සහනය** | (180,156) | (46,736) |
| එකතු කළා /(අඩුකළා): | | |
| වෙනත් ආදායම් | 12,975 | 12,597 |
| රජය පාර්ශ්වයෙන් සිදුකළ ණය කොටස් බවට පරිවර්තනය කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවූ විනිමය අලාභය | (94,689) | - |
| අර්ථ නිරූපිත ප්‍රතිලාභ වගකීම් මත ආයුගණක අලාභය | (11,059) | (505) |
| **මූල්‍ය ප්‍රකාශ ප්‍රකාර ශුද්ධ අලාභය** | (272,928) | (34,644) |

# දස වසරක සාරාංශය

පසුගිය වසර දහයක කාල පරිච්ඡේදයට අදාළව ලංකා විදුලිබල මණ්ඩලයේ මෙහෙයුම් හා වත්කම් තත්ත්වයට අදාළ ප්‍රතිඵල පහත දක්වා ඇත.

| 2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වසර සඳහා | 2022 ශ්‍රී ලං.රු. මිලියන | 2021 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන | 2020 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන | 2019 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන | 2018 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන | 2017 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන | 2016 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන | 2015 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන | 2014 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන | 2013 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මෙහෙයුම් ප්‍රතිඵලය | | | | | | | | | | |
| ආදායම | 308,457 | 248,776 | 238,911 | 242,950 | 229,571 | 218,450 | 206,811 | 188,684 | 202,645 | 194,147 |
| ගෘහස්ථ පාරිභෝගිකයන්හට ලබාදුන් සහනය | (1) | (196) | (5,908) | - | - | - | - | - | - | - |
| අලෙවි පිරිවැය | (430,509) | (266,596) | (276,938) | (322,521) | (251,964) | (260,273) | (222,097) | (168,781) | (213,646) | (165,509) |
| දළ ලාභය /(අලාභය) | (122,053) | (18,016) | (43,935) | (79,571) | (22,393) | (41,823) | (15,286) | 19,903 | (11,001) | 28,638 |
| අනෙකුත් ආදායම් හා ලැබීම් | 11,581 | 11,466 | 8,817 | 10,307 | 9,450 | 8,143 | 10,323 | 8,292 | 5,871 | 5,107 |
| පරිපාලන වියදම් | (16,354) | (8,290) | (7,131) | (7,280) | (5,832) | (5,110) | (4,965) | (4,086) | (3,146) | (2,556) |
| මූල්‍ය ආදායම | 1,394 | 1,131 | 1,338 | 1,751 | 1,466 | 1,194 | 1,049 | 434 | 304 | 1,677 |
| මූල්‍ය පිරිවැය | (41,749) | (20,431) | (19,522) | (22,526) | (13,036) | (8,415) | (4,312) | (5,134) | (7,030) | (10,601) |
| ශුද්ධ මූල්‍ය පිරිවැයෙන් පසු ලාභය /(අලාභය) | (167,180) | (34,139) | (60,433) | (97,319) | (30,345) | (46,011) | (13,191) | 19,409 | (15,002) | 22,265 |
| රජය පාර්ශ්වයෙන් සිදුකළ ණය කොටස්වලට පරිවර්තනය හේතුවෙන් සිදුවූ විනිමය අලාභය | (94,689) | - | - | - | - | - | - | - | - | - |
| ආදායම් බදු අය කිරීමට පෙර ලාභය /(අලාභය) | (261,869) | (34,139) | (60,433) | (97,319) | (30,345) | (46,011) | (13,191) | 19,409 | (15,002) | 22,265 |
| ආදායම් බදු වියදම් | - | - | (53) | (39) | (50) | (232) | (263) | (61) | (95) | |
| විලම්බිත බදු (ගාස්තු) / ආපසු හැරවීම් | - | - | - | - | - | - | - | - | 995 | (1,326) |
| අර්ථ නිරූපිත ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක ලාභය / (අලාභය) | (11,059) | (505) | (8,678) | (64) | (1,541) | (1,338) | (1,003) | 952 | (3,183) | (39) |
| විස්තීර්ණ ආදායම | (272,928) | (34,644) | (69,164) | (97,422) | (31,936) | (47,581) | (14,457) | 20,300 | (17,285) | 20,900 |

| දෙසැම්බර් 31 දිනට | 2022 ශ්‍රී ලං.රු. මිලියන | 2021 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන | 2020 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන | 2019 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන | 2018 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන | 2017 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන | 2016 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන | 2015 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන | 2014 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන | 2013 (ප්‍රතිප්‍රකාශිත) ශ්‍රී ලං.රු. මිලියන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| වත්කම් | | | | | | | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 894,860 | 852,072 | 819,248 | 781,517 | 747,012 | 724,068 | 704,695 | 694,415 | 681,471 | 648,130 |
| අනු ආයතනයන්හි ආයෝජනය | 912 | 912 | 912 | 912 | 912 | 912 | 912 | 912 | 785 | 785 |
| බද්ධ ව්‍යාපාරවල ආයෝජනය | 349 | 329 | 329 | 329 | 329 | 329 | 329 | 329 | 150 | 150 |
| රක්ෂණ සංචිත අරමුදලේ ආයෝජනය | 12,460 | 10,658 | 9,981 | 8,997 | 8,070 | 7,246 | 6,496 | 6,036 | 5,653 | 5,250 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 5,783 | 7,700 | 8,859 | 9,951 | 10,204 | 8,912 | 8,983 | 3,848 | 2,291 | - |
| අනෙකුත් ජංගම නොවන වත්කම් | 2,496 | 851 | 1,074 | 1,489 | 1,242 | 961 | 949 | 896 | - | - |
| අලෙවිය සඳහා රඳවාගෙන ඇති ජංගම නොවන වත්කම් | 0.076 | 0.076 | 0.076 | 0.076 | 0.076 | 0.655 | 1,022 | 1,025 | 1,023 | 1,021 |
| ජංගම වත්කම් | 145,484 | 131,446 | 116,617 | 110,576 | 102,338 | 89,065 | 80,968 | 69,391 | 72,662 | 91,423 |
| **මුළු වත්කම්** | **1,062,344** | **1,003,967** | **957,020** | **913,771** | **870,107** | **831,494** | **804,354** | **776,852** | **764,035** | **746,759** |
| **වගකීම්** | | | | | | | | | | |
| පොළියක් සහිත ණය හා ණය ගැනීම් | 193,478 | 403,592 | 352,094 | 318,149 | 281,262 | 236,129 | 220,476 | 214,299 | 221,735 | 355,043 |
| පාරිභෝගික තැන්පතු | 16,720 | 16,300 | 15,641 | 15,014 | 14,311 | 13,557 | 12,753 | 11,484 | 10,458 | 9,722 |
| ප්‍රතිපාදන සහ සෙසු විලම්බිත බැරකම් | 33,001 | 21,615 | 20,121 | 10,482 | 10,038 | 8,622 | 7,262 | 6,116 | 6,572 | 3,236 |
| රජයේ ප්‍රදානයන් | 173 | 188 | 200 | 213 | 228 | 243 | 211 | - | - | - |
| විලම්බිත ආදායම | - | - | - | - | - | - | - | 71,696 | 66,292 | 60,343 |
| කොන්ත්‍රාත් වගකීම් | 102,613 | 99,518 | 95,771 | 89,746 | 86,335 | 82,564 | 77,628 | - | - | - |
| විලම්බිත බදුකරණය | - | - | - | - | - | - | - | - | - | 22,182 |
| ජංගම වගකීම් | 361,932 | 289,037 | 208,447 | 223,803 | 145,712 | 123,682 | 72,661 | 43,630 | 64,147 | 69,134 |
| **මුළු වගකීම්** | **707,917** | **830,250** | **692,274** | **657,407** | **537,886** | **464,797** | **390,991** | **347,225** | **369,204** | **519,660** |
| **ස්කන්ධය** | | | | | | | | | | |
| දායක ප්‍රාග්ධනය | 865,159 | 413,055 | 391,731 | 323,194 | 302,695 | 302,695 | 302,695 | 302,228 | 289,038 | 121,708 |
| සංචිත | 44,077 | 41,223 | 39,254 | 37,110 | 34,881 | 32,783 | 30,283 | 28,463 | 27,434 | 25,999 |
| රඳවාගත් ඉපැයුම් | (554,810) | (280,560) | (166,239) | (103,940) | (5,355) | 31,219 | 80,385 | 98,936 | 78,359 | 79,392 |
| **මුළු ස්කන්ධය** | **354,427** | **173,717** | **264,746** | **256,364** | **332,221** | **366,697** | **413,363** | **429,627** | **394,831** | **227,099** |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | **1,062,344** | **1,003,967** | **957,020** | **913,771** | **870,107** | **831,494** | **804,354** | **776,852** | **764,035** | **746,759** |

# අගය එකතු කිරීමේ ප්‍රකාශය

| | 2022<br>රු මිලියන | 2021<br>රු මිලියන<br>ප්‍රතිප්‍රකාශිත |
|---|---|---|
| **එකතු කල අගය** | | |
| අදායම | **308,457** | 248,776 |
| අනෙකුත් ආදායම් | **11,581** | 11,466 |
| මුල්‍ය ආදායම | **1,394** | 1,131 |
| තෙවන පාර්ශවයන් විසින් සපයනු ලබන සම්පත් වල පිරිවැය | **(281,395)** | (143,792) |
| **ආයතනය විසින් එකතු කරන ලද මුළු එකතු කල අගය** | **40,037** | 117,582 |
| **අගය බෙදාහැරීම** | | |
| **සේවකයින්ට වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ වශයෙන්** | **44,980** | 47,863 |
| **රජයේ ආදායමට** | | |
| අදායම් බදු | **-** | - |
| අනෙකුත් බදු | **11,913** | 3,504 |
| **ප්‍රාග්ධනය ණය දෙන්නන්ට** | | |
| ණය මත පොළී | **41,749** | 20,431 |
| **ප්‍රජාවට** | | |
| ආයතනික සමාජ වගකීම | **172** | 24 |
| කොවිඩ් - 19 හේතුවෙන් සහන සැපයීම | **1** | 196 |
| සහන ගාස්තු යටතේ විදුලිය ලබා දීම | **180,156** | 46,736 |
| **වර්ධනය හා ව්‍යාපෘති සඳහා රඳවා ගත් අගය** | | |
| රඳවා ගත් අගය | **(272,928)** | (34,644) |
| ක්ෂය | **33,994** | 33,471 |
| **ආයතනය විසින් බෙදා හරින ලද මුළු එකතු කල අගය** | **40,037** | 117,582 |

# ආයතනික පාලනය පිළිබඳ වාර්තාව

ශ්‍රී ලංකාවේ විශාලතම විදුලිබල උපයෝගිතා ආයතනය වශයෙන් අපි මනා ආයතනික පාලන පරිචයන්හි වැදගත්කම හඳුනාගෙන සිටිමු. ලං.වි.ම. පාලනයන් හා මෙහෙයවීම් දිශානුගත කරන්නාවූ යහ පරිචයන් හා කාර්ය පරිපාටීන් භාවිත කරන්නෙමු. මෙම පරිචයන් හා කාර්ය පරිපාටි මගින් යහපත් බව, වගකීම, පාරදෘශ්‍ය බව හා වගවීම යන අංශයන්හි මනා සමබරතාවයක් පවත්වා ගනිමින් ආයතනයේ තීරණ ගැනීම හා මෙහෙයුම් ශක්‍යතාවය සකස් කිරීම සඳහා මූලික වශයෙන් පහසුකම් සලසනු ලබයි. අපි අපගේ ව්‍යාපාරික කටයුතුවලට අදාළ සියලු පැතිකඩයන්හි ආයතනික පාලනයේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙන යාමට උත්සාහ කරමු. මෙම පරිච්ඡේදය තුළ අපගේ පාලන රාමුව සහ අභ්‍යන්තර විගණන කාර්ය සාධනයද ගෙනහැර දක්වනු ලබයි.

## පාලන රාමුව

අපගේ පාලන රාමුව මනා, වගකීමක් සහිත, පාරදෘශ්‍ය සහ වගවීමෙන් බැඳී සිටින ආකාරයකින් ආයතනය කලමනාකරණය කෙරෙන බවට සහතික කරනු පිණිස සකස් කොට ඇත. මෙම රාමුව තුළට පහත ප්‍රධාන මූලිකාංග අන්තර්ගත වේ.

### අධ්‍යක්ෂ මණ්ඩලය

අපගේ අධ්‍යකෂ මණ්ඩලය ලං.වි.ම. කටයුතු සාමුහිකව අධීක්ෂණය කරන්නාවූ ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. ආයතනයේ කාර්ය සාධනය සමාලෝචනය, ක්‍රමෝපායික නියමයන් පැනවීම හා කළමනාකාරිත්වය වෙත මාර්ගෝපදේශ ලබාදීම උදෙසා නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වේ. අධ්‍යක්ෂ මණ්ඩලය සෘජුව රජයට වගවිය යුතුවේ. එබැවින් ලං.වි.ම. එහි පාර්ශවකරුවන්ගේ අභිලාශයන් සාක්ෂාත් වන අයුරින් හා එහි නියාමන රාමුව හා මුළුමනින්ම අනුගතව පාලනය හා ක්‍රියාත්මකවීම සිදු කෙරෙන බවට සහතික වීමේ වගකීමක් ලං.වි.ම. අධීක්ෂණය, පාලනය හා කළමනාකරණ පැවරී ඇති රජය හා එහි නිලධාරීන් හට පවතී.

### කළමනාකාරිත්වය

අපගේ කළමනාකරණ කණ්ඩායම අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම හා ආයතනයේ මෙහෙයුම් කටයුතු ඵලදායී, කාර්යක්ෂම හා විනිවිද පෙනෙන සුළු ආකාරයකින් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. මෙම කණ්ඩායම ආයතනයේ කාර්ය සාධනයට වගවිය යුතුවන අතර තිරසර වර්ධනයක් ලබාදෙනු පිණිස දිරි ගන්වනු ලැබ ඇත.

### ප්‍රතිපත්ති හා කාර්ය පරිපාටි

අප විසින් අපගේ මෙහෙයුම් කටයුතු පාලනය කරන්නා වූ ද නීති හා රෙගුලාසි සමග අනුගතව කටයුතු කරන බවට සහතික කරන්නාවූද ප්‍රතිපත්ති හා කාර්ය පරිපාටි ස්ථාපනය කොට ඇත. මෙම ප්‍රතිපත්ති තුළ යහපත් බව, වගවීම, වගකීම සහ පාරදෘශ්‍ය බව වැනි ක්ෂේත්‍ර ආවරණය කෙරේ. විනිවිද පෙනෙන සුළු බව හා වගවීම සහතික කරනු පිණිස ස්ථාපිත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි, මනා සේ ස්ථාපිත ජාතික සහ ජාත්‍යන්තර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා අනුගතව සිදු කෙරෙන තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලි, දැඩි විනය කාර්ය පරිපාටි ආදිය ක්‍රියාත්මක වේ. අභ්‍යන්තර විගණනයන්, පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) සහ සෙසු පාර්ලිමේන්තු කාරක සභා හරහා සිදුවන අඛණ්ඩ අධීක්ෂණ හා සමාලෝචනයන් මගින් ආයතනය නීති හා රෙගුලාසි හා අනුගතව කටයුතු කරන බවට තවදුරටත් සහතික කරවනු ලබයි.

### පාර්ශවකරු සහභාගිත්වය

පාරිභෝගිකයන්, කොටස් හිමියන්, සේවා නියුක්තිකයන් හා ජන ප්‍රජාවද ඇතුළත් අපගේ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා හා අපේක්ෂාවන්ද වටහාගනු පිණිස ඔවුන් සමග කටයුතු කරන්නෙමු. සියලු පාර්ශවකරුවන් සමගින් පාරදෘශ්‍ය හා විවෘත සන්නිවේදනයක් පවත්වා ගැනීමට උත්සාහ කරන්නෙමු. ලං.වි.ම. කොටස්කර ඇති සමූහයේ සමාගම් සමග සැමවිටම යහපත් සබඳතාවයක් පවත්වාගෙන යයි.

## අභ්‍යන්තර විගණන කාර්ය සාධනය

අභ්‍යන්තර විගණනය යනු ලං.වි.ම. ආයතනික පාලනයේ තීරණාත්මක සංගටකයකි. එමගින් ලං.වි.ම. අභ්‍යන්තර පාලනයන්, අවදානම් කළමනාකරණය සහ පාලන ක්‍රියාවලි සම්බන්ධ ස්වාධීන ඇගයුමක් ලබාදෙනු ලබන අතර, ආයතනය නීති, රෙගුලාසි හා අභ්‍යන්තර ප්‍රතිපත්ති සමගින් අනුගතව කටයුතු කරන්නේද යන කරුණ අධීක්ෂණයද අභ්‍යන්තර විගණනය කාර්යයට අදාළ වගකීමකි. ලං.වි.ම. අභ්‍යන්තර විගණන ශාඛාව විසින් ආයතනය තුළ ඵලදායී හා කාර්යක්ෂම කටයුතු හා මෙහෙයුම් ක්‍රියාවලි නංවාලමින් ප්‍රවර්ධනය කරන අතරම අධ්‍යක්ෂ මණ්ඩලයට හා කළමනාකාරිත්වයට සිය ආයතනික පාලන වගකීම් ඉටු කිරීමෙහි ලා සහාය ලබාදීමද සිදුකරනු ලබයි.

ඒ අනුව, සියලු ඒකක හා ශාඛාවන් සම්බන්ධ විගණනයන් සිදුකෙරෙන අතර, එසේ සිදු කෙරෙන වාර සංඛ්‍යාව හඳුනාගනු ලබන අවදානම් මට්ටම හා සිටින්නාවූ සේවක සංඛ්‍යාවද මත තීරණය වේ. සමාලෝචිත වසර තුළ අභ්‍යන්තර විගණන ශාඛාව විසින් පහත සඳහන් විගණන කාර්යයන් සම්පූර්ණ කරන ලදී.

*වගුව CGR1: 2022 වසර තුළ ඉටු කරන ලද විගණනයන් පිළිබඳ විස්තර*

| විගණනයේ ස්වභාවය | විගණන සංඛ්‍යාව |
|---|---|
| ආදායම් විගණන | 24 |
| පද්ධති විගණන | 30 |
| විශේෂ විමර්ශන | 15 |
| විගණන කමිටු වාර්තා | 22 |
| මණ්ඩල තොරතුරු | 4 |
| **එකතුව** | **95** |

ලං.වි.ම. තුළ ක්‍රියාත්මක නිශ්චිත පද්ධතීන් ක්‍රියාත්මකව පවත්නේද හා අදාළ නිලධාරීන් විසින් ඒවා ඵලදායී ලෙස පාලනය කරනු ලබන්නේද යන කරුණු නිර්ණය පිණිස වැඩි වශයෙන් පද්ධති විගණනයන් යෙදෙන පරිදි විගණන කෘත්‍යට අවධානය යොමු කරවන ලදී. මෙයට අමතරව, කළමනාකරණ පාලනයන්, ප්‍රසම්පාදන ක්‍රියාවලි, ගබඩා කළමනාකරණ පද්ධති හා ණයකරු ගාස්තු අයකර ගැනීමේ පද්ධති දැඩිසේ අධීක්ෂණය කරන ලද අතර වසර පුරා සමාලෝචනය කරන ලදී.



වවුනියාව සූර්ය පැනල උද්‍යානය

# අධ්‍යක්ෂ මණ්ඩලය

## එන්.එස්. ඉලංගකෝන් මහතා

| | |
|---|---|
| **නිල නාමය** | සභාපති |
| **ධුර කාලය** | 2022 ජූනි මස 13 වන දින සිට |
| **කුසලතා සහ පළපුරුද්ද** | උපකරණ ශ්‍රේණිගතකරණය හා මුහුදු ගුවන් යානා ශ්‍රේණිගතකරණය සම්බන්ධ ශ්‍රී ලංකාවේ මෙන්ම ඇමරිකා එක්සත් ජනපදයේද සුදුසුකම් ලත් නියමුවෙකි. ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙකු වන ඒ මහතා එක්සත් රාජධානියේ පශ්චාත් උපාධිධරයෙකි. රජයේ සහ පුද්ගලික අංශයේ ආයතනයන්හිද සභාපතිවරයෙකු, අධ්‍යක්ෂවරයෙකු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු වශයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ වසර 16 ක පළපුරුද්දක් සහිතව මනා ආයතනික පාලන පරිචයන් හා කාර්ය පරිපාටි ස්ථාපනය කොටගෙන ඇති ඒ මහතා ඉහළම මට්ටමේ විශ්වසනීයත්වයක් හා නිරවද්‍යතාවයක් ප්‍රවර්ධනය කරනු උදෙසා කටයුතු කරන්නෙකි. |
| **වෙනත් ආයතනයන්හි හොබවන ධුරයන්** | සභාපති - සී./ස. ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම<br>සභාපති - සී./ස. ත්‍රිකුණාමලය විදුලිබල පුද්ගලික සමාගම<br>අධ්‍යක්ෂ - සී./ස. ලංකා විදුලිබල පුද්ගලික සමාගම<br>අධ්‍යක්ෂ - සී./ස. එල්.ටී.එල්. හෝල්ඩිංස් පුද්ගලික සමාගම<br>අධ්‍යක්ෂ - සී./ස. එල්.ටී.එල්. ට්‍රාන්ස්ෆෝමර්ස් පුද්ගලික සමාගම<br>අධ්‍යක්ෂ - සී./ස. එල්.ටී.එල්. ගැල්වනයිසර්ස් පුද්ගලික සමාගම |

## එම්.එම්. නයිමුදීන් මහතා

| | |
|---|---|
| **නිල නාමය** | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| **ධුර කාලය** | 2020 ජනවාරි මස 17 වන දින සිට |
| **කුසලතා සහ පළපුරුද්ද** | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකු සහ වරලත් වෘත්තීක කළමනාකරුවන්ගේ සහාය සාමාජිකයෙකි. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් පශ්චාත් උපාධියක් ලබා ඇති හෙතෙම පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක්ද ලබා ඇත. ඒ මහතා රාජ්‍ය පරිපාලනය පිළිබඳ හා සාමාන්‍ය පරිපාලනය පිළිබඳවද සහතික ලාභියෙකි. රාජ්‍ය අංශයේ කළමනාකරුවෙක් වශයෙන් වසර 26 කට ආසන්න කාල සීමාවක පළපුරුද්ද ලබා ඇති ඒ මහතා උසස් මට්ටමේ නායකත්ව තනතුරුවල වසර 16 ක අත්දැකීම්ද ලද්දෙකි. ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයන්, ආයතනික බලගැන්වීම්, ව්‍යාපෘති කළමනාකරණය, ප්‍රසම්පාදනය, හා මානව සම්පත් විෂයයෙහි රජයේ ආයතනයනට මඟ පෙන්වීම උදෙසා ඒ මහතා සම්මානයටද පාත්‍ර වී ඇත. |
| **වෙනත් ආයතනයන්හි හොබවන ධුරයන්** | |

## එම්.ආර්.වී.ආර්. මීපුර මහතා

| | |
|---|---|
| **නිල නාමය** | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| **ධුර කාලය** | 2022 ජනවාරි මස 11 වන දින සිට |
| **කුසලතා සහ පළපුරුද්ද** | ඇඩලේඩ් විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය හා ව්‍යාපාර ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇති ඒ මහතා කොළඹ විශ්වවිද්‍යාලයේද ව්‍යාපාර අධ්‍යයනය සම්බන්ධ පශ්චාත් උපාධිධරයෙකි. මෙයට අමතරව ඒ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් මානව සම්පත් කලමනාකරණය පිළිබඳ විශේෂවේදී උපාධියක්ද ලබා ඇත.<br>තවද, ඒ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සහාය සාමාජිකයෙකුද, රාජ්‍ය මූල්‍ය හා සංවර්ධන ගණකාධිරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකුද, ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකුද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකුද, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සාමාජිකයෙකුද වේ.<br>ඒ මහතා 2021-01-18 දින සිට 2021-07-21 දින දක්වා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ වැඩබලන අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වශයෙන්ද, 2013-05-15 දින සිට 2019-01-20 දින දක්වා රජයේ ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති තීරණ) වශයෙන්ද, 2012 මැයි මස සිට 2013 මැයි මස දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී (ආදායම් හා ආපසු ගෙවීම්) වශයෙන්ද, 2009 වසරේ සිට 2012 මැයි මාසය දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී (සැපයුම්) වශයෙන්ද, 2008 සිට 2009 දක්වා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ වශයෙන්ද, 2007 සිට 2008 දක්වා වෘත්තීය සහ පුහුණු අමාත්‍යාංශයේ ගණනකාධිකාරී වශයෙන්ද, 2005 සිට 2007 දක්වා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී (ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ පුහුණු අවශ්‍යතා) වශයෙන්ද, 2002 සිට 2005 දක්වා නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී වශයෙන්ද 1999 සිට 2002 දක්වා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ (භාණ්ඩාගාර ශාඛාවේ) විගණන පරීක්ෂකවරයෙකු වශයෙන්ද සේවය කර ඇත. |
| **වෙනත් ආයතනයන්හි හොබවන ධුරයන්** | 2021-07-21 දින සිට 2022-12-31 දින දක්වා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්. |

## ආචාර්ය බී. විජයරත්න මහතා

| | |
|---|---|
| **නිල නාමය** | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| **ධුර කාලය** | 2021 ජනවාරි මස 7 වන දින සිට |
| **කුසලතා සහ පළපුරුද්ද** | දර්ශන විශාරද (ඇ.එ.ජ.), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් රාජ්‍ය පරිපාලනපති උපාධියක් හා එම විශ්වවිද්‍යාලයෙන්ම රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක්ද ලබා ඇත.<br>ඒ මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සාමාජිකයෙකු වශයෙන් රාජ්‍ය සේවයේ වසර 35 කට වැඩි අත්දැකීම් ලබා ඇත. ලං.වි.ම. අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීමට ප්‍රථම කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් සේවය කොට ඇත. ඒ මහතා යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් හා මෝටර් රථ කොමසාරිස් ජනරාල් යන තනතුරු දරා ඇත. |
| **වෙනත් ආයතනයන්හි හොබවන ධුරයන්** | |

# අධ්‍යක්ෂ මණ්ඩලය (ඉතිරි කොටස)

## රූබන් වික්‍රමාරච්චි මහතා

| | |
|---|---|
| **නිල නාමය** | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| **ධූර කාලය** | 2020 අප්‍රේල් මස 24 වන දින සිට |
| **කුසලතා සහ පළපුරුද්ද** | කැළණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා උපාධිධරයෙකු වන ඒ මහතා පිරිස් කළමනාකරණය විෂයයෙහි පශ්චාත් උපාධි ඩිප්ලෝමාධරයෙකුද වේ. ලං.වි.ම. අභ්‍යන්තර විගණන හා විශේෂ විමර්ශන ශාඛාවන්හි වසර 36 ක පළපුරුද්දක්ද ඔහු සතුවේ. තවද, ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයේද, විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයෙකු වශයෙන්ද, විනය අභියාචනා මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්ද, ලං.වි.ම. සේවා නියුක්තික දුක් ගැනවිලි කමිටුවේ සාමාජිකයෙකු වශයෙන්ද රාජකාරි ඉටු කරන්නෙකි. තවද, ඒ මහතා ලං.වි.ම. විශේෂ විමර්ශන ශාඛාවේ ආරම්භක ප්‍රධානියාද විය. |
| **වෙනත් ආයතනයන්හි හොබවන ධූරයන්** | |

## ජී.පී.එන්.එම්. අබේසේකර මහතා

| | |
|---|---|
| **නිල නාමය** | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| **ධූර කාලය** | 2021 දෙසැම්බර් මස 24 වන දින සිට |
| **කුසලතා සහ පළපුරුද්ද** | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධරයෙකු වන ඒ මහතා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකුද, අධීක්ෂණ හා ඇගයුම් කටයුතු සම්බන්ධ ඩිප්ලෝමාධාරියෙකුද, සාමාන්‍ය කළමනාකරණය පිළිබඳ හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ සහතිකලාභියෙකුද වේ.<br><br>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සාමාජිකයෙකු වශයෙන් වසර 22 කට වැඩි අත්දැකීම් සහිත ඒ මහතා අධිකරණ අමාත්‍යාංශයේ හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේද අතිරේක ලේකම්වරයෙකු වශයෙන් පූර්ව අත්දැකීම් ලද්දෙකි. මෙයට අමතරව, ඒ මහතා අමාත්‍යාංශ හා රජයේ දෙපාර්තමේන්තු ගණනාවක ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් සහ අධ්‍යක්ෂ තනතුරුවලද කටයුතු කර ඇත. |
| **වෙනත් ආයතනයන්හි හොබවන ධූරයන්** | කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම්. |

## ඩී.පී.එම්. චන්දන මහතා

| | |
|---|---|
| **නිල නාමය** | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| **ධූර කාලය** | 2022 දෙසැම්බර් මස 12 වන දින සිට |
| **කුසලතා සහ පළපුරුද්ද** | මේවන විට ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියකට අදාළ අධ්‍යයන කටයුතුවල නිරතව සිටී.<br><br>මොරටුව විශ්වවිද්‍යාලයේ ව්‍යුහාත්මක ඉංජිනේරු සැලසුම්කරණය පිළිබඳ ඉංජිනේරුපති උපාධිධරයෙකු වන චන්දන මහතා මොරටුව විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනපති උපාධියක්ද, පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් සිවිල් ඉංජිනේරු විෂයයට අදාළ ඉංජිනේරු විද්‍යාවේදී උපාධියද ලබා ඇත.<br><br>මෙයට අමතරව, පහත සඳහන් පරිදි ඒ මහතා හට රජයේ මෙන්ම පුද්ගලික අංශයේද ප්‍රධාන කළමනාකරණ තනතුරු ගණනාවක අත්දැකීම් ඇත.<br><br>- සහකාර සාමාන්‍යාධිකාරී (මිනිස්බල සංවර්ධන හා පුහුණු) - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය - (2017-07-01 සිට 2020-01-06 දක්වා)<br>- ප්‍රධාන ඉංජිනේරු/ව්‍යාපෘති කළමනාකරණ (ස්ථිර) - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (මෙහෙයුම් හා නඩත්තු - මහ කොළඹ මළ පද්ධතිය)/ වැ.බ. ව්‍යා.කළ. (ප්‍රතිදාන පදනම්ගත ආධාර පිළිබඳ ගෝලීය සහයෝගිතා ව්‍යාපෘතිය) - (2010-06-23 සිට 2017-06-30 දක්වා)<br>- ප්‍රධාන ඉංජිනේරු (ස්ථිර) - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (මෙහෙයුම් හා නඩත්තු - මහ කොළඹ මළ පද්ධතිය) - (2010-04-05 සිට 2010-06-22 දක්වා)<br>- ප්‍රධාන ඉංජිනේරු (වැ.බ.) - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ව්‍යා.කළ.)/ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (මෙහෙයුම් හා නඩත්තු - මහ කොළඹ මළ පද්ධතිය) - (2009-10-01 සිට 2010-04-04 දක්වා)<br>- ප්‍රධාන ඉංජිනේරු (වැඩ ආවරණ)/ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ව්‍යාපෘති කළමනාකරණ) - (2009-07-01 සිට 2009-09-30 දක්වා)<br>- ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ව්‍යාපෘති කළමනාකරණ) - (2006-01-10 සිට 2009-06-30 දක්වා)<br>- ඉංජිනේරු (1 පන්තිය) - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ව්‍යාපෘති කළමනාකරණ) - (2005-07-01 සිට 2006-01-09 දක්වා)<br>- ඉංජිනේරු (11 පන්තිය) - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (විදේශ අරමුදල්ගත ව්‍යාපෘති) (2001-07-01 සිට 2005-06-30 දක්වා)<br>- ඉංජිනේරු අභ්‍යාසලාභී - ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ව්‍යාපෘති කළමනාකරණ) - (2001-01-01 සිට 2001-06-30 දක්වා)<br>- සිවිල් ඉංජිනේරු - මාගා ඉංජිනියරින් පුද්ගලික සමාගම - (2000-06-26 සිට 2000-12-31 දක්වා)<br>- ව්‍යාපෘති ඉංජිනේරු - කාලන්ඩ් කැන්ඩි පුද්ගලික සමාගම - (1999-09-01 සිට 2000-06-25 දක්වා). |
| **වෙනත් ආයතනයන්හි හොබවන ධූරයන්** | සභාපති රාජ්‍ය සංවර්ධන හා ඉදිකිරීම් සංස්ථාව (2020-01-07 සිට 2022-08-06 දක්වා) |

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 49 වන වගන්තිය ප්‍රකාර, ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය (මණ්ඩලය) විසින් 2022 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වසර සඳහා විගණනය කළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සතුටින් ඉදිරිපත් කරනු ලබයි.

## ප්‍රධාන කටයුතු

මණ්ඩලයේ ප්‍රධාන කටයුතු වූයේ විදුලිය ජනනය, ප්‍රසම්පාදනය, සම්ප්‍රේෂණය, එළදායී බෙදාහැරීම හා අලෙවියයි. මණ්ඩලය විසින් රටේ නීති හා රෙගුලාසිවලට පටහැනි කිසිදු කටයත්තක නිරත වී නොමැත.

## අනු ආයතන හා හවුල් ව්‍යාපාර

අනු ආයතන හා හවුල් ව්‍යාපාරවලට අදාළ ප්‍රධාන කටයුතු 87 පිටුවේ එන මූල්‍ය ප්‍රකාශන සටහන් යටතේ දී ඇත. සමාලෝචිත වසර තුළ මණ්ඩලයේ හා කණ්ඩායමේ ප්‍රධාන කටයුතුවල ස්වභාවයේ කිසිදු සැලකිය යුතු වෙනසක් සිදුවී නොතිබිණි.

## සමූහයේ ව්‍යුහයේ සිදුකළ වෙනස්කම්

වසර තුළ සමූහයේ ව්‍යුහයට සිදුකළ වෙනස්කම් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 116 සිට 117 දක්වා එන මූල්‍ය ප්‍රකාශන සටහන් 12 හා 13 තුළ දී ඇත.

## වසරේ කාර්ය සාධන සමාලෝචනය

මණ්ඩලයේ/සමූහයේ වාර්ෂික කාර්ය සාධනය පිටු අංක 12 සිට 13 දක්වා වූ සභාපතිවරයාගේ පණිවිඩය තුළ අන්තර්ගත වේ. පිටු අංක 14 සිට 15 දක්වා එන සාමාන්‍යාධිකාරිවරයාගේ සමාලෝචනය තුළ සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධ සවිස්තරාත්මක විස්තරයක් සම්පාදනය කෙරේ. පිටු අංක 65 සිට 69 දක්වා පිටුවල 'මූල්‍ය සමාලෝචනය' යන සිරසින් එන කොටස තුළ මණ්ඩලයේ මූල්‍ය කාර්ය සාධනය හා තත්ත්වය සම්බන්ධ සවිස්තරාත්මක විග්‍රහයක් අන්තර්ගත වේ. මණ්ඩලයේ කටයුතු සම්බන්ධ සාධාරණ සමාලෝචනයක් ලබාදෙන්නාවූ මෙම වාර්තා මගින් වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසක් නිර්මාණය කරනු ලබයි.

## දායක ප්‍රාග්ධනය

දායක ප්‍රාග්ධනය තුළ 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත ප්‍රකාර 1969 වසරේදී ලංකා විදුලිබල මණ්ඩලය පිහිටුවීම මත රජයේ විදුලිබල පවරාගැනීම් දෙපාර්තමේන්තුව වෙතින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත භාරගන්නා ලද ශුද්ධ වත්කම්වල වටිනාකම සහ නිශ්චිත ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති වෙත මූල්‍ය සම්පාදනය උදෙසා ශ්‍රී ලංකා රජය විසින් ලබාදෙන ලද දායක මුදල් ද නියෝජනය කෙරේ. දායක ප්‍රාග්ධනය පිළිබඳ විස්තර පිටු අංක 122 හි මූල්‍ය ප්‍රකාශනයන්හි 22 වන සටහන තුළ දී ඇත.

## ණයකර නිකුතුව හා උපයෝජනය

ස්ථිර කූපන් අගය 9.35% අගයකට ශ්‍රී ලං.රු. 100 නිකුතු මිලකට වසර 5 ක කල් පිරෙන කාලයක් සඳහා 2022 වසරේ අප්‍රේල් මාසයේදී ලංකා විදුලිබල මණ්ඩලය විසින් ශ්‍රී ලං.රු. බිලියන 20 ක වටිනාකමකින් යුත් ජ්‍යෙෂ්ඨ සුරක්ෂණය නොකරනලද ලැයිස්තුගත මුද්‍රාහැරිය හැකි ශ්‍රේණිගත ණයකර ප්‍රමාණයක් නිකුත් කරන ලදී.

ණයකර නිකුතුව හරහා එකතුකර ගන්නා ලද අරමුදල් ප්‍රමාණය (ශ්‍රී ලං.රු. බිලියන 20) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව (අරමුදල්වලින් 30% ක්) සහ සෙසු ස්වාධීන විදුලිය නිෂ්පාදනායතනයන් (අරමුදල්වලින් 70%) වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් පියවනු පිණිස පූර්ණ වශයෙන් යොදාගන්නා ලදී.

## ණයකර වෙළඳාම්කරන තොරතුරු

2022 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වසර සඳහා ණයකර වෙළඳාම්කරන තොරතුරු පහත දක්වා ඇත.

| | |
|---|---|
| වැඩිම මිල | 88.61 |
| අඩුම මිල | 88.61 |
| අවසන් වරට වෙළඳාම් කළ මිල | 88.61 |
| වෙළඳාම් කළ ප්‍රමාණය | 507,900 |
| අවසන් වරට වෙළඳාම් කළ දිනය | 2022-01-20 |

## ආයතනික සමාජ වගකීම (CSR)

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ආයතනික සමාජ වගකීමට අදාළව සිදුකරන ලද කටයුතු 'ආයතනික සමාජ වගකීම් වාර්තාව' නමැති සිරසින් යුත් කොටසේ පිටු අංක 58 සිට 59 තුළ දක්වා ඇත.

## විදුලි කර්මාන්තයේ තිරසරභාවය සඳහා අපගේ ප්‍රවේශය

සමාජ, ආර්ථික හා පාරිසරික තිරසරභාවය පවත්වාගන්නා අතර සිය මෙහෙයුම් කටයුතු ඉටු කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය කැපවී සිට ඇත. එය සාක්ෂාත් කරගනු පිණිස ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගන්නා ලද ප්‍රවේශය පිටු අංක 55 සිට 57 තුළ දක්වා ඇත.

## මූල්‍ය වාර්තාකරණයට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

ආයතනයේ තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ අදහසක් පිළිබිඹු කරන්නාවූ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකීම අධ්‍යක්ෂවරුන් වෙත පැවරේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත හා අනුගතව සකස් කරනු ලැබ ඇත්තේය යන්න අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි. අනු ආයතන සම්බන්ධයෙන් ගත්කල, මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධානවලටද අනුකූලව සකස් කොට ඇත.

## විගණකවරයාගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර හා 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 51 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපතිවරයා ලංකා විදුලිබල මණ්ඩලයේ විගණකවරයාද වේ. 2022 දෙසැම්බර් 31 වන දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන හා මණ්ඩලයේ හා එහි අනු ආයතනයන්හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්තාවේ 154 සිට 192 තුළ දක්වා ඇත.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමූහය හා මණ්ඩලය විසින් සිය මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKASs) හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRSs) ප්‍රකාර සකස් කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති 87 සිට 104 දක්වා පිටුවල දක්වා ඇත. සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු නිරාකරණය කළ යුතු වෙනසක් සිදුවී නොමැත.

## මණ්ඩලය සමග පවත්වනු ලබන කොන්ත්‍රාත් විෂයයෙහි මණ්ඩලයේ සාමාජිකයන්ගේ අභිලාශය

මූල්‍ය ප්‍රකාශනයන්හි 39.4 සටහන තුළ අනාවරණය කොට ඇති කරුණු හැරුණුකොට 2022 දෙසැම්බර් මස 31 වන දිනෙන්

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව (ඉතිරි කොටස)

අවසන් වර්ෂය සඳහා මණ්ඩලය සමග ඇතිකරගත් කවර හෝ කොන්ත්‍රාත්තුවක් හෝ යෝජිත කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් තුළ කිසිදු සෘජු හෝ වක්‍ර අභිලාශයක් නොමැත.

**පාරිශ්‍රමික කමිටුව**

ලංකා විදුලිබල මණ්ඩලය වූකලි පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත ආයතනයකි. ඒ අනුව, පරිපාලන පරිචයන් හා පාලන කාර්ය පරිපාටි චක්‍රලේඛ, පනත් ආදිය මගින් පාලනය කෙරේ. ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකයන් මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක PED 3/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මත පදනම්ව තීරණය කෙරෙන බැවින් ලංකා විදුලිබල මණ්ඩලයට පාරිශ්‍රමික කමිටුවක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.

මණ්ඩලය විසින් පහත සඳහන් අනු කාරක සභා පත්කරනු ලැබ ඇත.

1. සේවක දුක් ගැනවිලි කමිටුව
2. විනය අභියාචනා මණ්ඩලය
3. විගණන හා කළමනාකරණ කමිටුව

**සේවක දුක් ගැනවිලි කමිටුව**

සේවක දුක් ගැනවිලි කමිටුව (EGC) වූකලි ලං.වි.ම. සේවා නියුක්තිකයන්ගේ/සේවා මුක්ත සේවා නියුක්තිකයන්ගේ පෞද්ගලික දුක් ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කරනු පිණිස මණ්ඩලය විසින් පත්කරනු ලැබ ඇති අනු කමිටුවකි.

කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකුගෙන් හා ලං.වි.ම. ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් කිහිප දෙනෙකුගෙන්ද සමන්විත වේ. 2022 වසර සඳහා කමිටුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සංයුතිය පහත දක්වා ඇත.

| නම | ලං.වි.ම. හි දරන තනතුර | කමිටුවේ දරන තනතුර | නිල කාලය |
|---|---|---|---|
| එන්.එස්. ඉලංගකෝන් මහතා | උප සභාපති | සභාපති | 2020-12-16 සිට 2022-06-13 දක්වා |
| ආචාර්ය බී. විජයරත්න මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | සභාපති | 2022 දෙසැම්බර් සිට මේ දක්වා |
| රූබන් වික්‍රමාරච්චි මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | සාමාජික | 2020 සිට මේ දක්වා |

සෙසු සාමාජිකයෝ පහත පරිදි වේ.

| නම | ලං.වි.ම. හි දරන තනතුර |
|---|---|
| ඉංජිනේරු එච්.එම්.කේ.ජේ. වීරසූරිය මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා ආයතනික), බෙ.අ. 02 |
| ඉංජිනේරු ආර්.කේ.පී.එස්. ගුණතිලක මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ආයතනික කටයුතු), ජනන අංශය |
| ඉංජිනේරු පී.ඒ.ජේ.පී.කේ. පෙරේරා මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) |
| ඩබ්.පී.ජී.සී.එස්. ජයලත් මෙය | වැ.බ. අතිරේක මූල්‍ය කළමනාකරු (ආයතනික) |
| ඉංජිනේරු එම්.අයි.එම්. ඉර්ෂාඩ් මහතා | ප්‍රධාන ඉංජිනේරු (ප්‍රතිපත්ති) |
| පී.ආර්. හඳපාන්ගොඩ මිය | මානව සම්පත් කළමනාකරු |

කමිටුව 2022 වසර තුළ විධිමත් ලෙස දෙවතාවක් රැස්වී අදාළ පෞද්ගලික දුක් ගැනවිලි 38 ක් සමාලෝචනය කරන ලදී.

එම රැස්වීම්වල කාර්ය සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී අනුමැතිය පිණිස සභාගත කරනු ලබන අතර, ඉන් අනතුරුව එකී තීරණ ඒ අනුව ක්‍රියාත්මක කරනු පිණිස ලං.වි.ම. සාමාන්‍යාධිකාරීවරයා විසින් කඩිනමින් කටයුතු කරනු ඇත.

මණ්ඩලයේ ලේකම්වරයා මෙම අනු-කමිටුවේ කැඳවුම්කරු වේ.

**විනය අභියාචනා මණ්ඩලය**

විනය අභියාචනා මණ්ඩලය යනු මණ්ඩලයේ තවත් අනු-කමිටුවකි. මෙම කමිටුව ලං.වි.ම. සේවා නියුක්තිකයන්ගේ විනය කටයුතුවලට අදාළව කටයුතු කරනු පිණිස ස්ථාපනය කොට ඇත. කමිටුව 2022 මුදල් වර්ෂය තුළ දෙවතාවක් විධිමත් පරිදි රැස්ව ඇති අතර පැමිණිලි නවයක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

එම රැස්වීම්වල කාර්ය සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී අනුමැතිය පිණිස සභාගත කරනු ලබන අතර, ඉන් අනතුරුව එකී තීරණ ඒ අනුව ක්‍රියාත්මක කරනු පිණිස ලං.වි.ම. සාමාන්‍යාධිකාරීවරයා විසින් කඩිනමින් කටයුතු කරනු ඇත.

2022 වසර සඳහා කමිටුවේ සංයුතිය පහත පරිදි වේ. මණ්ඩලයේ ලේකම් මෙම අනු-කමිටුවේ කැඳවුම්කරු වේ.

| නම | ලං.වි.ම. හි දරන තනතුර | කමිටුවේ දරන තනතුර | නිල කාලය |
|---|---|---|---|
| එන්.එස්. ඉලංගකෝන් මහතා | උප සභාපති | සභාපති | 2022 පෙබරවාරි දක්වා |
| ආචාර්ය බී. විජයරත්න මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | සභාපති | 2022-10-28 සිට |
| රූබන් වික්‍රමාරච්චි මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | සාමාජික | 2019-03-27 සිට මේ දක්වා |
| ජී.පී.එන්.එම්. අබේසේකර මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | සාමාජික | 2022-10-28 |
| එල්.කේ.එස්.යූ. ධර්මකීර්ති මහතා | මණ්ඩලයේ නිරීක්ෂක | සාමාජික | 2021-10-06 සිට මේ දක්වා |
| පී.එස්.පතිරණ මහතා | විශ්‍රාමික අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් | සාමාජික | 2018-12-07 සිට මේ දක්වා |

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව (ඉතිරි කොටස)

## විගණන කමිටුව

විගණන කමිටුව යනු මූල්‍ය වාර්තාකරණය, ආයතනික අවදානම් කලමනාකරණය, ආදායම් සහතික කිරීමේ කර්තව්‍ය, අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය හා අභ්‍යන්තර විගණනයන් සම්බන්ධ අධීක්ෂණයක් සිදු කරමින් ව්‍යවස්ථාපිත විගණන කාර්යයන්හිදී මණ්ඩලය වෙත සහාය දක්වන්නාවූ පාලක ආයතනයේ අනු කමිටුවකි.

කමිටුව විගණන ප්‍රඥප්තිය මගින් අවශ්‍ය බවට පනවා ඇති පරිදි අවම වශයෙන් වසරකට සිව් වරක් රැස්වන අතර මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන මණ්ඩල සාමාජිකයෙකුගේ සභාපතිත්වයෙන් යුක්ත වේ. කමිටුව බහුතරයක් ස්වාධීන පුද්ගලයන් වන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. 2022 වසර සඳහා කමිටුවේ සාමාජිකයන් පහත සටහන තුළ දක්වා ඇත.

| නම | තනතුර | කමිටුවේ දරන තනතුර |
|---|---|---|
| එම්.ආර්.වී.ආර්. මීපුර මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | සභාපති |
| එම්.එම්. නයිමුදීන් මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | සාමාජික |
| බී.විජේරත්න මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | සාමාජික |
| ආර්.වික්‍රමාරච්චි මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | සාමාජික |

ලං.වි.ම. සාමාන්‍යාධිකාරී, ලං.වි.ම. මුදල් කළමනාකරු, විගණකාධිපති දෙපාර්තමේන්තු නියෝජිතවරයෙකු හා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ නියෝජිතයෙකු වෙත රැස්වීම්වලට සහභාගි වන ලෙස ආරාධනා කෙරේ. කමිටුවේ කැඳවුම්කරු අභ්‍යන්තර විගණන ශාඛාවේ ප්‍රධානියා වේ.

කමිටුව විසින් මූල්‍ය වාර්තාකරණය, අවදානම් කළමනාකරණය සහ බාහිර හා අභ්‍යන්තර විගණන කාර්යයන් පිළිබඳ අභ්‍යන්තර පාලනයනට අදාළ ආයතනයේ සමස්ත රාමුව සමාලෝචනය කරයි. කමිටුව 2022 වසරේ සිව් වතාවක් රැස්වූ අතර, දැනට පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රම බලගැන්වීම සඳහා අවශ්‍ය තැන්හි ක්‍රියාත්මක කළ හැකි අතිරේක පාලනයන් හා අවදානම් සමන ක්‍රමෝපායන්ද නිර්දේශ කරමින් සිය පෘථුල පළපුරුද්ද හා විශේෂඥතාවයද යොදා ගනිමින් අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සමාලෝචනය කරන ලදී.

වසර පුරා පවත්වන ලද කමිටු රැස්වීම්වල පැමිණීම පහත දක්වා ඇත.

| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | විගණන කමිටු රැස්වීම්වලට සහභාගිත්වය |
|---|---|
| එම්.ආර්.වී.ආර්. මීපුර මහතා | 4 |
| එම්.එම්. නයිමුදීන් මහතා | 4 |
| බී. විජේරත්න මහතා | 2 |
| ආර්. වික්‍රමාරච්චි මහතා | 4 |

## ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 මගින් අවශ්‍ය බවට පනවා ඇති ආශ්‍රිත පාර්ශ්ව අනාවරණයන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි අංක 39 දරන වාර්තාව තුළ විස්තරාත්මකව දක්වා ඇත.

## නීති හා රෙගුලාසි සමගින් අනුගත වීම

අධ්‍යක්ෂවරුන් විසින් සිය උපරිම දැනුමට හා විශ්වාසයට අනුව නීති හා රෙගුලාසිවලට පටහැණි වන්නාවූ කිසිදු කාර්යයක සිය කණ්ඩායම යෙදී නොමැති බවට තහවුරු කරනු ලබයි.

## සිදු කිරීමට නියමිත නීති කෘත්‍යයන්

සිදු කිරීමට නියමිත නීති කෘත්‍යයන් හේතුකොට ඉස්මතු වන්නාවූ ආවස්ථික බැරකම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි 37.1 සටහන තුළ දක්වා ඇත.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

සේවා නියුක්තිකයන් ආශ්‍රිතව රජයට ගෙවිය යුතුව පවත්නා සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් නිසි කලට සිදුකර ඇති බව මණ්ඩලය විසින් සහතික කරනු ලබයි.

## ශේෂ පත්‍රයෙන් අනතුරුව සිදුවන සිදුවීම්

ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදුකළ යුතුවන කිසිදු විසඳාලිය යුතු සිදුවීමක් මූල්‍ය වර්ෂය අවසානය හා මෙම වාර්තාවේ දිනය අතර කාල පරිච්ඡේදය තුළ ඉස්මතුවී නොමැතිය යන්න අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි.

## මෙහෙයුම් සම්පත් පවත්නා බව

මණ්ඩලය සතු සම්පත් එහි මෙහෙයුම් කටයුතු නොකඩවා සිදු කිරීමට ප්‍රමාණවත්ය යන විශ්වාසය අධ්‍යක්ෂවරුන් සතුව පවතී. එබැවින්, මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී මෙහෙයුම් සම්පත් පවත්නේය යන පදනමින් ඒවා සකසා ඇත.

**වාර්ෂික වාර්තාවේ අන්තර්ගත කරුණුවලට අදාළ කොළඹ කොටස් වෙළඳපල ලැයිස්තුගතකරණ අවශ්‍යතා හා අනුගත වීම**

| ලැයිස්තුගතකරණ රීති අංකය | අනාවරණ අවශ්‍යතා | යොමුව/අදහස් | පිටු අංකය |
|---|---|---|---|
| 7.6 (i) | මූල්‍ය වර්ෂය තුළ ආයතනයේ අධ්‍යක්ෂවරුන් වූ පුද්ගලයන්ගේ නම් | අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 74 - 75 |
| 7.6 (ii) | වසර තුළ ආයතනයේ හා එහි අනු ආයතනයන්හි ප්‍රධාන කටයුතු හා එතුළ යම් වෙනස්වීමක් සිදු වූයේ නම් එය. | අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ විගණනය කළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සටහන 12.1 | 76, 116 |
| 7.6 (iii) | ඡන්ද හිමි හා ඡන්ද හිමි නොවන කොටස් සහිත විශාලතම ආයතන 20 හි නම් හා කොටස් සංඛ්‍යාව සහ එසේ දරනු ලබන කොටස්වල ප්‍රතිශතය. | අදාළ නැත | - |
| 7.6 (iv) | මහජන හිමිකම් ප්‍රතිශතය | අදාළ නැත | - |
| 7.6 (v) | එක් එක් මූල්‍ය වර්ෂය ආරම්භයේදී හා අවසානයේදී ආයතනයේ කොටස් අතරින් එක් එක් අධ්‍යක්ෂවරයාගේ කොටස් ප්‍රමාණය හා ප්‍රධාන විධායක නිලධාරියාගේ කොටස් ප්‍රමාණය පිළිබඳ ප්‍රකාශනයක් | අදාළ නැත | - |
| 7.6 (vi) | ආයතනයේ පුරෝකථනය කළ හැකි විසඳාලිය යුතු අවදානම් සාධකවලට අදාළ තොරතුරු | අවදානම් කළමනාකරණ වාර්තාව | 50 - 52 |
| 7.6 (vii) | ආයතනයේ සේවා නියුක්තිකයන් හා කර්මාන්තමය සම්බන්ධතාවනට අදාළ විසඳාලිය යුතු කරුණු පිළිබඳ වාර්තාව | වසර තුළ කිසිදු විසඳාලිය යුතු ගැටලුවක් පැනනැගී නොමැත | - |
| 7.6 (viii) | ආයතනයේ ඉඩම් හිමිකම් හා ආයෝජන දේපළවලට අදාළ ප්‍රමාණයන්, පිහිටි ස්ථාන, තක්සේරු සහ ගොඩනැගිලි සංඛ්‍යාව | වත්කම් කළමනාකරණ අංශය | - |
| 7.6 (ix) | ආයතනයේ ප්‍රකාශිත මූලධනය නියෝජනය කරන කොටස් සංඛ්‍යාව | අදාළ නැත | - |
| 7.6 (x) | සෑම කොටස් සුරැකුම් පන්තියකම හිමිකරුවන් සංඛ්‍යාව හා ඒවාහි සමස්ත හිමිකම් ප්‍රමාණ ප්‍රතිශතය පිළිබඳ බෙදාහැරීම් සැලැස්මක් | අදාළ නැත | - |
| 7.6 (xi) | අනුපාත හා වෙළඳපල මිල තොරතුරු | | |
| | සන්සන්දනාත්මක රජයේ සුරැකුම්හි පොලී අනුපාතය, ණය/කොටස් අනුපාතය, පොළී ආවරණය, ක්ෂණික වත්කම් අනුපාතය | මූල්‍ය සමාලෝචනය | 69 |
| | වසර තුළ වෙළඳපල මිල හා ප්‍රතිලාභය (ඉහළම මිල/අඩුම මිල/අවසන් වරට වෙළඳාම් කළ මිල) | අධ්‍යක්ෂවරුන්ගේ වාර්තා | 76 |
| | ණය ශ්‍රේණිගතකරණයේ යම් වෙනසක් වේනම් එය | ණය ශ්‍රේණිගතකරණයේ කිසිදු වෙනසක් සිදුවී නොමැත | - |
| 7.6 (xii) | අදාළ වටිනාකම පොත්වල සටහන් වටිනාකමට වඩා සැලකිය යුතු වෙනසක් පෙන්වන්නේ නම්, ආයතනයේ හෝ එහි අනු ආයතනවල ස්ථාවර වත්කම්වල සැලකිය යුතු වෙනස්කම් හා ඉඩමේ වෙළඳපල වටිනාකම | අදාළ නැත | - |
| 7.6 (xiii) | පොදු නිකුතුවක්, හිමිකම් නිකුතුවක් හෝ පුද්ගලික ස්ථානගතකරණයක් මගින් වසර තුළ ආයතනය විසින් අරමුදල් රැස්කර ඇත. | අදාළ නැත | - |
| 7.6 (xiv) | සෑම සේවා නියුක්තිකයෙකුටම අදාළ කොටස් හිමිකාරිත්වය හෝ තොග විකල්ප යෝජනාක්‍රමයට අදාළ තොරතුරු | අදාළ නැත | - |
| 7.6 (xv) | රීතිවල 7 වන වගන්තියේ අංක 7.10.3, 7.10.5 (ඇ) සහ 7.10.6 (ඇ) ප්‍රකාර ආයතනික පාලන පිළිවෙත්වලට අදාළ අනාවරණයන් | අධ්‍යක්ෂ මණ්ඩල පැතිකඩ හා අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 74 - 78 |
| 7.6 (xvi) | විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ප්‍රකාර කොටස්වලින් 10% ඉක්මවන්නාවූ හෝ ආයතනයේ සමස්ත වත්කම්වලින් 5% යන දෙකෙන් අඩු අගය දක්වන ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු. | විගණනය කළ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල අංක 39 දරන සටහන | 149 - 150 |

# විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
## ලාභ හෝ අලාභ ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

| | සටහන | සමූහය 2022 | සමූහය 2021 ප්‍රතිප්‍රකාශිත | මණ්ඩලය 2022 | මණ්ඩලය 2021 ප්‍රතිප්‍රකාශිත |
|---|---|---|---|---|---|
| ආදායම | 4 | 374,626,063 | 290,885,609 | 308,457,234 | 248,776,409 |
| ගෘහස්ත පාරිභෝගිකයින් සඳහා සහන | 5 | (765) | (195,709) | (765) | (195,709) |
| විකුණුම් පිරිවැය | | (471,350,692) | (291,572,012) | (430,509,030) | (266,596,386) |
| **දළ ලාභය / (අලාභය)** | | (96,725,394) | (882,112) | (122,052,561) | (18,015,686) |
| වෙනත් මෙහෙයුම් ආදායම් සහ ලාභ | 6 | 27,282,467 | 18,070,822 | 11,581,152 | 11,465,996 |
| බෙදාහැරීමේ පිරිවැය | | (288,296) | (205,209) | - | - |
| වෙනත් වියදම් | | (8,565,929) | (3,293,915) | - | - |
| පරිපාලන වියදම් | | (22,806,333) | (13,172,097) | (16,353,884) | (8,290,064) |
| **මෙහෙයුම් ලාභය/ (අලාභය)** | | (101,103,485) | 517,489 | (126,825,293) | (14,839,754) |
| මූල්‍ය ආදායම | 7.1 | 4,228,389 | 3,286,672 | 1,394,312 | 1,131,379 |
| මූල්‍ය පිරිවැය | 7.2 | (46,689,936) | (22,517,712) | (41,749,028) | (20,430,641) |
| මූල්‍ය පිරිවැය-ශුද්ධ | | (42,461,547) | (19,231,040) | (40,354,716) | (19,299,262) |
| බද්ධ ව්‍යාපාරයේ අලාභ කොටස | 13 | (6,373) | (5,080) | - | - |
| **ශුද්ධ මූල්‍ය පිරිවැයට පසු ලාභ / (අලාභ).** | | (143,571,405) | (18,718,631) | (167,180,009) | (34,139,016) |
| ණය ස්කන්ධය බවට පරිවර්තනය වීම නිසා ඇතිවන විනිමය පාඩු | 22.1 | (94,688,683) | - | (94,688,683) | - |
| **බදු පෙර ලාභය /(අලාභය)** | 8 | (238,260,088) | (18,718,631) | (261,868,692) | (34,139,016) |
| ආදායම් බදු වියදම් | 9.1 | (1,827,397) | (3,169,923) | - | - |
| විලම්භිත බදු (ගාස්තු)/ ප්‍රතිවර්ථන | 9.2 | 756,684 | (45,132) | - | - |
| **වර්ෂය තුල උපයන ලද ලාභය/(අලාභය)** | | (239,330,801) | (21,933,686) | (261,868,692) | (34,139,016) |
| **විසර්ජනය** | | | | | |
| පරිපාලනයට හිමි අයිතිය | | (250,647,151) | (29,259,828) | | |
| පාලනයට යටත් නොවන හිමිකම් | | 11,316,350 | 7,326,142 | | |
| | | (239,330,801) | (21,933,686) | | |

පිටු අංක 87 සිට 153 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

| | සටහන | සමූහය 2022 | සමූහය 2021 ප්‍රතිප්‍රකාශිත | මණ්ඩලය 2022 | මණ්ඩලය 2021 ප්‍රතිප්‍රකාශිත |
|---|---|---|---|---|---|
| **වර්ෂය සඳහා ලාභ (අලාභය)** | | (239,330,801) | (21,933,686) | (261,868,692) | (34,139,016) |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක අලාභය | | (10,948,707) | (377,986) | (11,058,850) | (504,579) |
| අයුගණක ලාභය/(අලාභය) මත විලම්භිත බදු වල බලපෑම | | (34,876) | (33,122) | - | - |
| විදේශ පරිපාලිත මෙහෙයුම් පරිවර්තන මත විනිමය වෙනස්වීම් | | 8,307,720 | 935,845 | - | - |
| ඕසීඅයි ආයෝජන වල සාධාරණ අගය මත ශුද්ධ ලාභ/(අලාභ) | | 411,257 | 1,082,877 | - | - |
| ඕසීඅයි ආයෝජන වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම් මත වලම්භිත බදු | | (93,831) | (92,688) | - | - |
| මුදල් ප්‍රවාහ ආරක්ෂණ සංචිතයේ වෙනස්වීම් | | (3,172,261) | - | - | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | (244,861,499) | (20,418,760) | (272,927,542) | (34,643,595) |

| **විසර්ජනය** | | |
|---|---|---|
| පරිපාලන හිමි අයිතිය | (259,628,280) | (28,862,085) |
| පාලනයට යටත් නොවන හිමිකම් | 14,766,781 | 8,443,325 |
| | (244,861,499) | (20,418,760) |

පිටු අංක 87 සිට 153 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනට

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

| වත්කම් | සටහන | සමූහය 2022 | සමූහය 2021 ප්‍රතිප්‍රකාශිත | සමූහය ජනවාරි 1 දිනට 2021 ප්‍රතිප්‍රකාශිත | මණ්ඩලය 2022 | මණ්ඩලය ජනවාරි 1 දිනට 2021 ප්‍රතිප්‍රකාශිත | මණ්ඩලය 2021 ප්‍රතිප්‍රකාශිත |
|---|---|---|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | | | | | |
| දේපල පිරියත හා උපකරණ | 10 | 928,252,264 | 872,461,307 | 837,407,716 | 894,718,428 | 851,937,543 | 818,473,484 |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | 509,746 | 513,347 | 512,457 | 141,626 | 133,997 | 161,509 |
| පරිපාලිත සමාගම්වල ආයෝජන | 12 | - | - | - | 911,813 | 911,813 | 911,813 |
| බද්ධ ව්‍යාපාරවල ආයෝජන | 13 | 39,304 | 25,677 | 30,757 | 348,606 | 328,606 | 328,606 |
| ලැබිය යුතු මූල්‍ය කල්බදු | 14 | 31,452,406 | 20,465,468 | 19,588,944 | - | - | - |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | 15 | 28,870,304 | 28,054,665 | 24,418,096 | 5,782,582 | 7,700,399 | 8,859,225 |
| වෙනත් ජංගම නොවන වත්කම් | 16 | 3,625,768 | 1,830,583 | 2,160,224 | 2,495,752 | 851,383 | 1,073,891 |
| රක්ෂණ සංචිතවල ආයෝජන | 17 | 12,460,350 | 10,657,598 | 9,980,730 | 12,460,350 | 10,657,598 | 9,980,730 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 1,005,210,142 | 934,008,645 | 894,098,924 | 916,859,157 | 872,521,339 | 839,789,258 |
| විකුණුම් සදහා ඇති ජංගම නොවන වත්කම් | 18 | 76 | 76 | 76 | 76 | 76 | 76 |
| **ජංගම වත්කම්** | | | | | | | |
| භාණ්ඩ තොග | 19 | 63,089,691 | 74,986,599 | 53,412,274 | 53,805,349 | 63,926,113 | 45,522,065 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 20 | 123,364,557 | 83,903,022 | 74,069,309 | 66,868,889 | 55,865,351 | 59,052,954 |
| සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු දෑ | 21 | - | - | - | 13,304,651 | 3,612,627 | 5,322,241 |
| ලැබිය යුතු මූල්‍ය කල්බදු | 14 | 688,914 | 825,121 | 1,015,236 | - | - | - |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම් | 15 | 25,575,582 | 29,922,547 | 33,652,650 | 2,358,209 | 2,601,739 | 2,826,654 |
| මුදල් හා බැංකු ශේෂ | 32 | 22,122,521 | 15,309,470 | 9,719,896 | 9,147,367 | 5,439,757 | 3,604,157 |
| **මුළු ජංගම වත්කම්** | | 234,841,265 | 204,946,759 | 171,869,365 | 145,484,465 | 131,445,587 | 116,328,071 |
| **මුළු වත්කම්** | | 1,240,051,483 | 1,138,955,480 | 1,065,968,365 | 1,062,343,698 | 1,003,967,002 | 956,117,405 |
| **ස්කන්ධය හා වගකීම්** | | | | | | | |
| **ප්‍රාග්ධනය හා ස්කන්ධය** | | | | | | | |
| දායක ප්‍රාග්ධනය | 22 | 865,159,371 | 413,054,569 | 391,730,584 | 865,159,371 | 413,054,569 | 391,730,584 |
| සංචිත | 23 | 63,975,736 | 59,080,517 | 52,807,113 | 44,077,095 | 41,222,599 | 39,253,986 |
| රඳවාගත් ඉපැයීම්/(අලාභ) | | (525,009,550) | (261,521,211) | (227,074,122) | (554,809,643) | (280,560,300) | (244,636,490) |
| **මව් සමාගමේ කොටස් හිමියන්ට අදාළ හිමිකම්** | | 404,125,557 | 210,613,875 | 217,463,575 | 354,426,823 | 173,716,868 | 186,348,080 |
| පාලනයට යටත් නොවන හිමිකම | | 52,515,406 | 39,335,587 | 34,649,119 | - | - | - |
| **මුළු ස්කන්ධය** | | 456,640,963 | 249,949,462 | 252,112,694 | 354,426,823 | 173,716,868 | 186,348,080 |
| **ජංගම නොවන වත්කම් හා විලම්භිත ආදායම්** | | | | | | | |
| පොලිය සහිත ණය හා ණය ගැනීම් | 24 | 220,994,937 | 421,649,216 | 406,099,931 | 193,477,785 | 403,592,008 | 405,017,867 |
| පාරිභෝගික තැන්පතු | 25 | 16,719,938 | 16,299,865 | 15,640,570 | 16,719,938 | 16,299,865 | 15,640,570 |
| ප්‍රතිපාදන හා අනෙකුත් විලම්භිත වගකීම් | 26 | 34,529,132 | 23,289,438 | 21,798,853 | 33,001,021 | 21,615,200 | 20,120,599 |
| රාජ්‍ය ප්‍රදාන | 27 | 650,456 | 491,359 | 278,934 | 172,663 | 188,347 | 200,334 |
| ගිවිසුම් ගත වගකීම් | 28 | 108,215,345 | 104,566,763 | 100,694,745 | 102,613,052 | 99,518,157 | 95,770,723 |
| විලම්භිත බදු | 29 | 84,699 | 712,684 | 541,752 | - | - | - |
| | | 381,194,507 | 567,009,325 | 545,054,785 | 345,984,459 | 541,213,577 | 536,750,093 |
| **ජංගම වගකීම්** | | | | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 30 | 290,627,593 | 245,367,541 | 211,909,197 | 271,129,209 | 221,808,101 | 201,048,104 |
| ගෙවිය යුතු ලාභාංශ | | 1,373,813 | 1,618,538 | 905,034 | - | - | - |
| සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල | 31 | - | - | - | 6,267,928 | 6,214,207 | 4,213,941 |
| පොලිය සහිත ණය හා ණය ගැනීම් | 24 | 106,994,467 | 71,042,881 | 52,999,459 | 83,264,513 | 59,743,483 | 26,486,421 |
| ගෙවිය යුතු ආදායම් බදු | | 3,220,140 | 3,967,733 | 2,987,196 | 1,270,766 | 1,270,766 | 1,270,766 |
| | | 402,216,013 | 321,996,693 | 268,800,886 | 361,932,416 | 289,036,557 | 233,019,232 |
| **මුළු ස්කන්ධ හා වගකීම්** | | 1,240,051,483 | 1,138,955,480 | 1,065,968,365 | 1,062,343,698 | 1,003,967,002 | 956,117,405 |

පිටු අංක 87 සිට 153 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකාරිත්වය වගකීම දරයි මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ ,

| ......................... | ......................... | ......................... | ......................... |
|---|---|---|---|
| සභාපති | උප සභාපති | සාමාන්‍යාධිකාරී | මුදල් කළමණාකරු |

දිනය 2023.09.19

කොළඹ

# විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| | 2022 | 2021<br>ප්‍රතිප්‍රකාශිත | 2022 | 2021<br>ප්‍රතිප්‍රකාශිත |
| **මෙහෙයුම් කටයුතුවල වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | | | |
| බදු පෙර ලාභ/(අලාභ) | (238,260,088) | (18,718,631) | (261,868,690) | (34,139,016) |
| **ගැලපීම්** | | | | |
| ක්ෂය-වර්ෂය සඳහා අයවීම | 35,862,446 | 34,809,316 | 33,948,035 | 33,095,688 |
| ගැලපීම් | 12,536 | - | - | - |
| පාරිභෝගික දායකය ක්‍රමක්ෂය කිරීම | (4,281,308) | (4,487,145) | (4,281,308) | (4,058,249) |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම් | (471,096) | (15,068) | (15,685) | (15,068) |
| ආයෝජන අදායම | (1,519,355) | (1,359,813) | - | - |
| දේපල, පිරියත සහ උපකරණ විකිණිමෙන් ලද ලාභ/(අලාභ) | 58,394 | 149,507 | 25,654 | 135,046 |
| කල්බදු පොලිය | 10,747 | 12,775 | 10,747 | 12,775 |
| මූල්‍ය පිරිවැය | 46,679,189 | 22,634,864 | 41,738,280 | 20,417,868 |
| යල්පැන ගිය භාවිතා කළ නොහැකි තොග සඳහා ප්‍රතිපාදන | (343,274) | 337,770 | (342,386) | 331,159 |
| මිල විචලනය සඳහා ප්‍රතිපාදන | 23,808 | (2,037,510) | 23,808 | (2,037,510) |
| ණයකරුවන් හානිකරණය වීම සඳහා ප්‍රතිපාදන | 1,589,841 | 1,649,777 | (1,578,762) | 1,747,552 |
| බොල් ණය කපාහැරීම | 907,163 | 345,653 | 907,163 | 345,653 |
| විද්‍යුත් වාහන ආරෝපණ ආදායම | (4,488) | (2,696) | (4,488) | (2,696) |
| බද්ධ ව්‍යාපාරවල කොටස් ලාභ/(අලාභ) | 6,373 | 5,080 | - | - |
| අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය | 78,818 | 60,832 | 45,616 | 48,442 |
| මූල්‍ය ආදායම | (2,702,202) | (2,041,285) | (1,394,313) | (1,131,378) |
| ලාභාංශ ආදායම | (516,129) | (6,908,775) | (274,221) | (2,519,496) |
| විදේශ මුදල් ලාභ හෝ අලාභ | 98,324,112 | (676,679) | 94,632,401 | 676,368 |
| ලැබිය යුතු මුල්‍ය කල්බදු සඳහා අදායම් බැරකම් | 1,853,641 | 1,600,538 | - | - |
| නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම | 1,655,664 | 1,301,341 | 1,380,133 | 1,067,140 |
| විශ්‍රාම වැටුප් අරමුදලේ පිරිවැය | (110,953) | 717,208 | (110,953) | 717,208 |
| කලින් ගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය | 863,216 | 556,360 | 863,216 | 556,360 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභ/(අලාභ)** | (60,282,945) | 27,933,420 | (96,295,753) | 15,247,846 |
| භාණ්ඩ තොග (වැඩිවීම)/අඩුවීම | 12,615,938 | (20,679,002) | 10,844,322 | (17,579,674) |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | (40,494,677) | (4,578,392) | (19,323,187) | 9,859,521 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | 71,012,994 | 30,403,302 | 73,679,921 | 18,539,379 |
| **මෙහෙයුම් වලින් ජනිත මුදල්** | (17,148,690) | 33,079,327 | (31,094,697) | 26,067,072 |
| ගෙවූ මූල්‍ය පිරිවැය | (45,408,340) | (19,928,688) | (40,467,431) | (17,685,265) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | (1,271,929) | (921,523) | (942,210) | (794,325) |
| ගෙවූ ආදායම් බදු | (2,367,502) | (2,190,520) | - | |
| **මෙහෙයුම් කටයුතු වල යෙදවූ/කටයතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | (66,196,461) | 10,038,596 | (72,504,338) | 7,587,481 |
| **ආයෝජන කටයතු වල (යෙදවූ) /කටයතු වලින් ජනනය වූ ප්‍රවාහ** | | | | |
| දේපල පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම සහ කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | (90,242,299) | (73,030,040) | (77,900,802) | (70,323,587) |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | (57,075) | (21,088) | (57,075) | (20,930) |
| බද්ධ ව්‍යාපාරවල ආයෝජන | (20,000) | - | (20,000) | - |
| රක්ෂණ සංචිත අරමුදලේ නැවත ආයෝජනය | (1,802,752) | (676,868) | (1,802,752) | (676,868) |
| රක්ෂණ සංචිත අරමුදල මත ලද පොලි අදායම (Escrow) | 1,523,707 | 663,841 | 1,523,707 | 663,841 |
| මූල්‍ය වත්කම්වල ආයෝජන | 1,425,188 | (140,931) | - | - |
| පාලනයට යටත් නොවන හිමිකම් අත්පත් කර ගැනීම | 67,500 | 51,975 | - | - |
| ලද ලාභාංශ | 957,041 | 6,908,775 | 715,133 | 3,119,790 |
| ලද පොලී | 3,417,261 | 2,746,863 | 531,097 | 575,018 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් | 167,171 | (131,759) | 120,374 | (135,046) |
| ගෙවූ ලාභාංශ | (5,990,343) | (2,660,377) | - | - |
| **අයෝජන කටයතු වල (යෙදවූ)/කටයතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | (90,554,601) | (66,289,609) | (76,890,318) | (66,797,782) |
| **මූල්‍ය කටයතු වල (යෙදවූ) /කටයතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්** | | | | |
| දායක ප්‍රාග්ධන ලැබීම් | 80,000,000 | - | 80,000,000 | - |
| පාරිභෝගික දායකත්වය | 7,642,888 | 10,669,518 | 7,642,888 | 10,669,518 |
| විදුලි වාහන සඳහා ඊ-කාර්ඩ් පෙර ගෙවීම් | 4,488 | 2,796 | 4,488 | 2,796 |
| ආර්එච්සීපී ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබීම් | 8,986 | 24,558 | 8,986 | 24,558 |
| ලද ප්‍රදාන | - | 3,082 | - | 3,082 |
| පාරිභෝගික තැන්පතු ආපසු ගෙවීම් | (341,275) | (146,050) | (341,275) | (146,050) |
| පාරිභෝගික තැන්පතු ලැබීම් | 761,348 | 805,345 | 761,348 | 805,345 |
| කල්බදු ණයකරු ශුද්ධ සංචරන/(කල්බදු ගෙවීම්) | (147,740) | (172,675) | (44,776) | (64,099) |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් වලින් ලද මුදල් | 103,686,181 | 91,263,883 | 78,997,829 | 80,269,493 |
| පොලී සහිත ණය සහ ණය ගැනීම් ආපසු ගෙවීම් | (47,772,310) | (41,588,962) | (35,705,960) | (31,460,088) |
| වරණීය කොටස් නිදහස් කිරීම | (1,657,331) | (732,087) | - | - |
| **මූල්‍ය කටයුතු වල (යෙදවූ)/ කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | 142,185,235 | 60,129,408 | 131,323,528 | 60,104,556 |
| **මුදල් සහ මුදල් වලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | (14,565,827) | 3,878,395 | (18,071,128) | 894,255 |
| **වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් වලට සමාන දෑ** | (3,037,807) | (6,916,202) | (8,701,967) | (9,596,222) |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් වලට සමාන දෑ** | (17,603,634) | (3,037,807) | (26,773,095) | (8,701,967) |

පිටු අංක 87 සිට 153 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
## ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

| සමූහය | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | ක්ෂය සංචිත | වත්කම් ප්‍රතිස්ථාපන සංචිත |
|---|---|---|---|---|
| **2020 දෙසැම්බර් 31 වන දිනට ශේෂය** | 391,730,584 | 19,337,879 | 25,000 | 312,494 |
| **කාල සීමාව තුළ සිදුකරන ලද පෙර වසර සඳහා ගැලපීම්** | - | - | - | - |
| **2021 ජනවාරි 01 වන දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)** | 391,730,584 | 19,337,879 | 25,000 | 312,494 |
| වර්ෂය සඳහා ලාභය / (අලාභය) | - | - | - | - |
| විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභය/(අලාභය) | - | - | - | - |
| ඕසීඅයි ආයෝජන වල සාධාරණ අගය මත ශුද්ධ ලාභ/(අලාභ) | - | - | - | - |
| හුවමාරු තුල්‍ය සංචිත | - | 306,670 | - | - |
| **මුළු විස්තීර්ණ ආදායම** | - | 306,670 | - | - |
| ස්කන්ධය ලෙස පරිවර්තිත ණය | 17,915,014 | - | - | - |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | 3,408,971 | - | - | - |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම | - | - | - | - |
| ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම් | - | - | - | - |
| ක්ෂය සංචිතයට මාරුකිරීම් | - | - | 1,000 | - |
| පාරිභෝගිකයන්ගෙන් ලද පොළී | - | 24,558 | - | - |
| **ආයෝජන සංචිත** | - | - | - | - |
| වත්කම් ප්‍රතිෂ්ඨාපන සංචිතය | - | - | - | (223,968) |
| සංවර්ධන සංචිත | - | - | - | - |
| උප සමාගම් කොටස් නිකුත් කිරීම | - | - | - | - |
| ලාභාංශ ගෙවීම් - එල්ටීඑල් | - | - | - | - |
| ලාභාංශ ගෙවීම් - ලෙකෝ | - | - | - | - |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 413,054,569 | 19,669,107 | 26,000 | 88,526 |
| **2022 ජනවාරි 01 දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)** | 413,054,569 | 19,669,107 | 26,000 | 88,526 |
| වර්ෂය සඳහා ලාභ/(අලාභ) | - | - | - | - |
| විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභය/(අලාභය) | - | - | - | - |
| ඕසීඅයි ආයෝජන වල සාධාරණ අගය මත ශුද්ධ ලාභ/(අලාභ) | - | - | - | - |
| හුවමාරු තුල්‍ය සංචිත | - | 2,779,173 | - | - |
| මුදල් ප්‍රවාහ ආරක්ෂණ සංචිත | - | - | - | - |
| **මුළු විස්තීර්ණ ආදයම** | - | 2,779,173 | - | - |
| ස්කන්ධය ලෙස පරිවර්තිත ණය | 251,629,768 | - | - | - |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | 120,475,034 | - | - | - |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම | - | - | - | - |
| CPC ගෙවීම් සඳහා අතිරේක කොටස් ආයෝජන | 80,000,000 | - | - | - |
| ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම් | - | - | - | - |
| ක්ෂය සංචිතයට මාරුකිරීම් | - | - | 1,000 | - |
| පාරිභෝගිකයන්ගෙන් ලද පොළී | - | 8,986 | - | - |
| අධිභාර | - | - | - | - |
| සංවර්ධන සංචිත | - | - | - | - |
| ලාභාංශ ගෙවීම් - ලෙකෝ | - | - | - | - |
| උප සමාගම් කොටස් නිකුත් කිරීම | - | - | - | - |
| ලාභාංශ ගෙවීම් - එල්ටීඑල් | - | - | - | - |
| | 865,159,371 | 22,457,266 | 27,000 | 88,526 |

පිටු අංක 87 සිට 153 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

| | ආයෝජන සංචිත | ස්වයං රක්ෂණ සංචිත | සාධාරණ අගය සංචිත | සංවර්ධන සංචිත | මුදල් ප්‍රවාහ ආරක්ෂණ සංචිත | රඳවාගත් ඉපයීම් | පාලනයට යටත් නොවන කොටස් හිමිකම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | 6,330,541 | 20,647,190 | 6,126,684 | 27,325 | - | (148,673,699) | 34,651,586 | 330,515,584 |
| | - | - | - | - | - | (78,400,423) | (2,467) | (78,402,890) |
| | 6,330,541 | 20,647,190 | 6,126,684 | 27,325 | - | (227,074,122) | 34,649,119 | 252,112,694 |
| | - | - | - | - | - | (29,259,828) | 7,326,142 | (21,933,686) |
| | - | - | - | - | - | (449,693) | 38,586 | (411,107) |
| | - | - | 540,767 | - | - | - | 449,422 | 990,189 |
| | - | - | - | - | - | - | 629,175 | 935,845 |
| | - | - | 540,767 | - | - | (29,709,521) | 8,443,325 | (20,418,759) |
| | - | - | - | - | - | - | - | 17,915,014 |
| | - | - | - | - | - | - | - | 3,408,971 |
| | - | 663,841 | - | - | - | - | - | 663,841 |
| | - | 1,279,214 | - | - | - | (1,279,214) | - | - |
| | - | - | - | - | - | (1,000) | - | - |
| | - | - | - | - | - | - | - | 24,558 |
| | 3,671,322 | - | - | - | - | (3,671,322) | - | - |
| | - | - | - | - | - | 223,968 | - | - |
| | - | - | - | 10,000 | - | (10,000) | - | - |
| | - | - | - | - | - | - | 28,350 | 28,350 |
| | - | - | - | - | - | - | (3,285,207) | (3,285,207) |
| | - | - | - | - | - | - | (500,000) | (500,000) |
| | 10,001,863 | 22,590,245 | 6,667,451 | 37,325 | - | (261,521,211) | 39,335,587 | 249,949,462 |
| | 10,001,863 | 22,590,245 | 6,667,451 | 37,325 | - | (261,521,211) | 39,335,587 | 249,949,462 |
| | - | - | - | - | - | (250,647,151) | 11,316,350 | (239,330,801) |
| | - | - | - | - | - | (11,019,462) | 35,769 | (10,983,693) |
| | - | - | 171,547 | - | - | - | 145,879 | 317,426 |
| | - | - | - | - | - | - | 5,528,547 | 8,307,720 |
| | - | - | - | - | (912,497) | - | (2,259,764) | (3,172,261) |
| | - | - | 171,547 | - | (912,497) | (261,666,613) | 14,766,781 | (244,861,609) |
| | - | - | - | - | - | - | - | 251,629,768 |
| | - | - | - | - | - | - | - | 120,475,034 |
| | - | 1,523,707 | - | - | - | - | - | 1,523,707 |
| | - | - | - | - | - | - | - | 80,000,000 |
| | - | 1,320,803 | - | - | - | (1,320,803) | - | - |
| | - | - | - | - | - | (1,000) | - | - |
| | - | - | - | - | - | - | - | 8,986 |
| | - | - | - | - | - | (511,782) | (461,498) | (973,280) |
| | - | - | - | 2,500 | - | (2,500) | - | - |
| | - | - | - | - | - | 14,359 | 14,280 | 28,639 |
| | - | - | - | - | - | - | 67,500 | 67,500 |
| | - | - | - | - | - | - | (1,207,244) | (1,207,244) |
| | 10,001,863 | 25,434,755 | 6,838,998 | 39,825 | (912,497) | (525,009,550) | 52,515,406 | 456,640,963 |

# විගණනය කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය
## ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

| මණ්ඩලය | දායක ප්‍රාග්ධන | අනෙකුත් ප්‍රාග්ධන සංචිත | ආර්.ඒච්.සී.පී. සංචිත | ණය නිදහස් කිරීමේ සංචිතය | ක්ෂය සංචිතය | ස්වයං රක්ෂණ සංචිතය | රඳවාගත් ඉපයීම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| **2020 දෙසැම්බර් මස 31 දිනට ශේෂය** | 391,730,584 | 165,446 | 985,239 | 17,447,062 | 25,000 | 20,631,239 | (166,239,106) | 264,745,464 |
| කාල සීමාව තුල සිදුකරන ලද පෙර වසර සඳහා ගැලපීම් | - | - | - | - | - | - | (78,397,384) | (78,397,384) |
| **2021 ජනවාරි මස 01 දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)** | 391,730,584 | 165,446 | 985,239 | 17,447,062 | 25,000 | 20,631,239 | (244,636,490) | 186,348,080 |
| වර්ෂය සඳහා ලාභ /(අලාභ) | - | - | - | - | - | - | (34,643,596) | (34,643,596) |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම | - | - | - | - | - | 663,841 | - | 663,841 |
| ස්කන්ධය ලෙස පරිවර්තිත ණය | 17,915,014 | - | - | - | - | - | - | 17,915,014 |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | 3,408,971 | - | - | - | - | - | - | 3,408,971 |
| ක්ෂය සංචිතයට මාරුකිරීම් | - | - | - | - | 1,000 | - | (1,000) | - |
| ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම් | - | - | - | - | - | 1,279,214 | (1,279,214) | - |
| පාරිභෝගිකයින්ගෙන් ලද පොලී | - | - | 24,558 | - | - | - | - | 24,558 |
| **2021 දෙසැම්බර් මස 31 දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)** | 413,054,569 | 165,446 | 1,009,797 | 17,447,062 | 26,000 | 22,574,294 | (280,560,300) | 173,716,868 |
| **2022 දෙසැම්බර් මස 31 දිනට ශේෂය (ප්‍රතිප්‍රකාශිත)** | 413,054,569 | 165,446 | 1,009,797 | 17,447,062 | 26,000 | 22,574,294 | (280,560,300) | 173,716,868 |
| වර්ෂය සඳහා ලාභ /(අලාභ) | - | - | - | - | - | - | (272,927,540) | (272,927,540) |
| රක්ෂණ සංචිත අරමුදලෙන් ලද පොලී ආදායම | - | - | - | - | - | 1,523,707 | - | 1,523,707 |
| ස්කන්ධය ලෙස පරිවර්තිත ණය | 251,629,768 | - | - | - | - | - | - | 251,629,768 |
| පුත්තලම ගල් අඟුරු විදුලිබල ව්‍යාපෘතිය | 120,475,034 | - | - | - | - | - | - | 120,475,034 |
| ක්ෂය සංචිතයට මාරු කිරීම් | - | - | - | - | 1,000 | - | (1,000) | - |
| ස්වයං රක්ෂණ සංචිතයට මාරුකිරීම් | - | - | - | - | - | 1,320,803 | (1,320,803) | - |
| පාරිභෝගිකයින්ගෙන් ලද පොලී | - | - | 8,986 | - | - | - | - | 8,986 |
| CPC ගෙවීම් සඳහා අතිරේක කොටස් ආයෝජන | 80,000,000 | - | - | - | - | - | - | 80,000,000 |
| **2022 දෙසැම්බර් මස 31 දිනට ශේෂය** | 865,159,371 | 165,446 | 1,018,783 | 17,447,062 | 27,000 | 25,418,804 | (554,809,643) | 354,426,823 |

පිටු අංක 87 සිට 153 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල කොටසක් වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

**1.0 ආයතනික තොරතුරු**

**1.1 වාර්තාකරණ ආයතනය**

1969 අංක: 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේ ලංකා විදුලිබල මණ්ඩලය සංස්ථාපිත කර ඇත. මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය අංක 50, සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 2 යන ස්ථානයේ පිහිටා ඇත.

**1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන**

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මණ්ඩලයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ලංකා විදුලිබල මණ්ඩලය (මණ්ඩලය) සහ එහි සියළුම අනුබද්ධ සමාගම් වලින් සමන්විත වේ.

**1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් වල ස්වභාවය**

**මණ්ඩලය**

වර්ෂය තුළ මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ, විදුලි උත්පාදනය, ප්‍රසම්පාදනය, සම්ප්‍රේෂණය, සළුලදායී බෙදාහැරීම සහ විකිණීමයි.

මණ්ඩලයේ පරිපාලිත සමාගම් වල සහ බද්ධ ව්‍යාපාරයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදි වේ.

**1.3.1 පරිපාලිතයන්**

**ආ) සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම**

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන කාර්යයන් වූයේ, ලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලිය මිල දී ගැනීම හා එසේ මිලදී ගත් විදුලිය ගාල්ල, කළුතර, මොරටුව, කැළණිය, නුගේගොඩ, කෝට්ටේ සහ මීගමුවේ පිහිටි සමාගමේ ශාඛා හරහා ගෘහාශිත හා කාර්මික පාරිභෝගිකයන්ට සිල්ලරට විකිණීමයි. කණ්ඩායමේ උපපරිපාලිත සමාගම් විදුලි මීටර නිෂ්පාදනය හා වෙළඳාම ඇතුළුව විදුලිය බෙදා හැරීම සඳහා යටිතල පහසුකම් සැපයීමේ නිරතව සිටිති.

**ආ) සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම**

වර්ෂය තුළදී සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ සමූහයට අයත් සමාගම්හි ව්‍යාපාරික අරමුණු ළඟා කර ගැනීමට උපායමාර්ගික ආයෝජනයන් සිදු කිරීමයි.මෙම පරිපාලිතයන් විදුලි උත්පාදනය ,බලශක්ති උත්පාදනයට අදාළ යටිතල පහසුකම් සැපයීම, තාරාපැටි සහ පෝෂක කුළුණු නිෂ්පාදනය කිරීම සහ ගැල්වනයිස් කිරීමේ කටයුතු වල නිරත වෙති.

**ඇ) සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම**

නොරොච්චෝලේ පිහිටි ගල් අඟුරු බලාගාරයේ විදුලිබල උත්පාදනය සඳහා ගෙන්දගම් ප්‍රමාණය අඩු උසස් ප්‍රමිතියෙන් යුත් ගල් අඟුරු සැපයීමයි.

**ඈ) සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම**

සමාගමේ ප්‍රධාන කාර්යයන් වනුයේ, සම්ප්‍රේෂණ මාර්ග සහ ජාලක උප පොළවල් ඉදිකිරීමේ කටයුතු වල නිරතවීම, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ඉදිකිරීම, නඩත්තු කිරීම හා මෙහෙයවීම සහ විදුලිබල බලශක්ති උත්පාදනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා අවශ්‍ය කටයුතුවල නිරතවීම, මීටර් පෙට්ටි නිෂ්පාදනය කිරීම සහ මණ්ඩලයේ අවශ්‍යතා සඳහා මිනිස් බල සේවා සැපයීමයි.

**1.3.2 බද්ධ ව්‍යාපාරය**

**සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම**

ලංකා විදුලිබල මණ්ඩලයේ ජාතික පද්ධතියට විදුලිබලය උත්පාදනය කර විකිණීමේ අරමුණ සහිතව සමාගම ස්ථාපිත කරන ලදී. සමාගම මේ වන විට ගල් අඟුරු බලාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය අතහැර දමා ඇතත් සාම්පූර්හි මෙගාවොට් 50 ක සූර්ය බලශක්ති බලාගාරය පිහිටුවීමට කැබිනට් අනුමැතිය ලැබී ඇත.

**1.4 පරිපාලකය සහ මණ්ඩලයෙහි අවසන් භාරකාරීත්වය**

මණ්ඩලය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ. අධ්‍යක්ෂකවරුන්ගේ මතය අනුව ශ්‍රී ලංකා ආණ්ඩුව, ලංකා විදුලිබල මණ්ඩලයේ මවු අස්ථිත්වයත් අවසන් පාලන පාර්ශවයත් වනු ඇත.

**1.5 නිකුතුව සඳහා බලය පැවරනු ලැබූ දිනය**

2022 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2023.10.10 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවට අනුව අනුමැතිය ලබාදී ඇත.

**2.0 පිළියෙල කිරීමේ පදනම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2.1 පිළියෙල කිරීමේ පදනම**

සාධාරණ අගයමත ගනනය කරනු ලබන මූල්‍ය වත්කම් වන, ආදායම් ප්‍රකාශනය තුලින් සාධාරණ අගය ගලපන වත්කම් හා විස්තීරණ අදායම තුලින් සාධාරණ අගය ගලපන වත්කම් හැරුනු විට සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මත සකස් කර ඇත. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කෙරෙන අතර වෙනත් අගයන් හැර අනෙක් සියලුම වටිනාකම් ලඟම ඇති දහස දක්වා (රු. 1000) දක්වා වටයා ඇත.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මගින් පෙර කාලයට සාපේක්ෂව සංසන්දනාත්මක තොරතුරු සපයයි. මීට අමතරව, පෙර කාලච්ජේදයට බලපෑම් ඇති වන පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සිදුවන වෙනස් වීමකදී හෝ පෙර කාලච්ජේදයට බලපෑම් ඇති වන පරිදි මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කිරීම අවශ්‍ය වන විට, සමූහය විසින් පූර්ව කාලසීමාව ආරම්භය වෙනුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ අතිරේක ප්‍රකාශයක් ඉදිරිපත් කරයි. සටහන 34 හි දක්වා ඇති හේතු නිසා 2021 ජනවාරි 01 දිනට අතිරේක මූල්‍ය ප්‍රකාශයක් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කෙරේ.

**2.2 අනුකූලතා ප්‍රකාශනය**

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය සමන්විත වන ලාභ හෝ අලාභ ප්‍රකාශනය , විස්තීර්ණ අදායම් ප්‍රකාශනය මූල්‍ය තත්ව ප්‍රකාශනය , හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ගිණුම්

ප්‍රතිපත්ති හා සටහන් සකස් කරනු ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතන විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS/LKAS) වලට අනුකූලවය

**2.3 අඛණ්ඩ පැවැත්ම**

අඛන්ඩ පැවැත්මක් ලෙස සමූහය නොකඩවා පවත්වා ගෙන යෑමේ සමූහයේ හැකියාව ගැන අධ්‍යක්ෂකවරුන් විසින් තක්සේරුවක් කර තිබෙන අතර, පහත සඳහන් කරුණු හැර ඈවර කිරීමට හෝ ව්‍යාපාර කටයුතු නැවැත්වීමට ඔවුහු අදහස් නොකරයි.

**අඛණ්ඩ පැවැත්ම - සීමාසහිත හෙලදනව් සමාගම**

සීමාසහිත හෙලදනව් සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් අත්සන් කරන ලද 2009 මැයි මස 09 දිනැති බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම 2014 දෙසැම්බර් මස 08 දින ඉකුත් වී තිබුණි ආයතනයේ දෘෂ්ඨි කෝණය අනුව ගිවිසුම කල් ඉකුත්වීමත් සමග ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් පවත්වා ගෙන යෑම ගැන සැළකිය යුතු මට්ටමේ අවිනිශ්චිතතාවයක් තිබේ.

ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් පවත්වා ගෙන යෑමේ ආයතනයේ හැකියාව ගැන වාර්තා කරන දිනය වන විට තක්සේරුවක් අධ්‍යක්ෂකවරුන් විසින් කර තිබෙන අතර, ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන පවත්වා ගෙන යෑමට අස්ථිතියට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් තිබෙන බව ඔවුහු තීරණය කර තිබේ. එම නිසා හෙලදනව් සමාගමේ මූල්‍ය වාර්තා සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය අනුව කටයුතු කිරීම උචිත නොවේ.

**අඛණ්ඩ පැවැත්ම - ලංකා ඉන්ඩස්ට්‍රියල් ප්‍රඩක්ස් ඉංජිනියරින් (පුද්ගලික) සමාගම**

2015 නොවැම්බර් මස 01 දින සිට මෙහෙයුම් නවත්වා සීමාසහිත එල් ටී එල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්) සමාගම වෙත සිය මෙහෙයුම් පැවරීමට අධ්‍යක්ෂකවරුන් තීරණයකර තිබේ. එම නිසා සීමාසහිත එල් ටී එල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්) සමාගමේ මූල්‍ය වාර්තා සකස් කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපක්ල්පනය අනුගමනය කර නොමැත.

**අඛණ්ඩ පැවැත්ම ශ්‍රී ලංකා එනජීස් එච්. ආර් (පුද්ගලික) සමාගම**

මෙම සමාගමේ බහුතරයක් වූ මිනිස්බල සේවකයන් ලංකා විදුලිබල මණ්ඩලයේ ස්ථිර සේවකයින් ලෙස පත් කරන ලද අතර එම තීරණයත් සමග මෙම සමාග මේ ආදායම විශාල ලෙස පහත වැටී ඇත. කෙසේ වෙතත් වාර්තාකරන දිනය වන විට සමාගම සමග කුමක් කිරීමට අදහස් කරන්නේද යන්න පිළිබඳව අධ්‍යක්ෂවරුන් විසින් කිසිදු තීරණයක් ගෙන නැති අතර ඈවර කිරීමට කිසිදු අදහසක් නොමැති හෙයින් සමාගමේ අඛණ්ඩ පැවැත්ම උදෙසා බලපෑමක් නොමැත්තේය යන පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

**2.4 සංසන්දනාත්මක තොරතුරු**

වඩා හොඳ ඉදිරිපත් කිරීමකට හා වර්ථමාන වර්ෂය සමග සැසඳීමට හැකිවන පරිදි පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කර ඇත.

**2.5 ඒකාබද්ධ කිරීමේ පදනම**

සමූහයේ සහ එහි පරිපාලිතයන්හි 2022 දෙසැම්බර් මස 31 දිනට අදාළ මූල්‍ය ප්‍රකාශනයන් ගෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. සමූහය නිරාවරණය වූ විට හෝ අයිතිවාසිකම් ඇති විට හෝ ආයෝජකයා සමඟ ඇති සම්බන්ධතාවයෙන් විචල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීම හෝ ආයෝජකයා කෙරෙහි බලපෑම් කිරීමට ඇති හැකියාව තුළින් ප්‍රතිලාභ කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාව යන සාධක මත පාලනය බලය ලබා ගත හැකිය. විශේෂයෙන් සමූහය සතුව පහත දැක්වෙන බලය ඇති විට පමණක් ආයෝජක පාලනය කෙරෙයි.

- ආයෝජක සම්බන්ධයෙන් අයිතියක් තිබේ නම් (එනම්, ආයෝජකගේ අදාළ ක්‍රියාකාරකම් මෙහෙය වීමට ප්‍රවර්තන හැකියාව ලැබෙන පවත්නා අයිතීන්)
- ආයෝජක සමග එහි සහභාගිත්වය සඳහා අදාල විචල්‍ය ප්‍රතිලාභ වලට අනාවරනය හෝ අයිතීන් ආවේදනය කිරීම සම්බන්ධයෙන් වන අයිතීන්
- එහි ලාභයන්ට බලපෑම් කිරීම සඳහා ආයෝජක කෙරෙහි සමූහයට ඇති හැකියාව

  සාමන්‍යයෙන් ඡන්දය දීමේ බහුතර අයිතීන් තිබීම මගින් පාලනයක් පවත්වා ගෙන යා හැකි බවට පූර්ව නිගමනයක් පවතී. මෙම පූර්ව නිගමනය තහවුරු කිරීමට සහ ආයෝජකයෙකු සතු ඡන්දය දීමේ හෝ වෙනත් සමාන අයිතිවාසිකම් බහුතරයට වඩා අඩු ප්‍රමාණයක් සමූහයට ඇති විට පහත දක්වා ඇති සියළු සාධක සැලකිල්ලට ගනීමින් අයිතිය පිළිබඳ තක්සේරුවක් සිදුකල යුතුය

- වෙනත් ඡන්ද හිමියන් සමග වන ආයෝජකගේ ගිවිසුම් ගත විධිවිධාන
- වෙනත් ගිවිසුම්ගත විධිවිධාන තුලින් පැන නගින අයිතීන්
- සමූහයේ ඡන්ද අයිතීන් හා විභව්‍ය ඡන්ද අයිතීන්

පරිපාලිතයන්ගේ තොරතුරු පහත දැක්වේ.

| පරිපාලිත සමාග මේ නම | සංස්ථාගත කරන ලද රට | ආයතනය සතු ප්‍රතිශතය |
|---|---|---|
| සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් | ශ්‍රී ලංකාව | 63% |
| සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම (LECO) | ශ්‍රී ලංකාව | 55.2% |
| සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC) | ශ්‍රී ලංකාව | 60% |
| සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම (SLE) | ශ්‍රී ලංකාව | 100% |
| **බද්ධ ව්‍යාපාරයේ නම** | **සංස්ථාගත කරන ලද රට** | **ආයතනය සතු ප්‍රතිශතය** |
| සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම (TPCL) | ශ්‍රී ලංකාව | 50% |

සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගමේ පහත සඳහන් උප පරිපාත සමාගම් ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාපිත කර ඇත.

| පරිපාලිත සමාගමේ නම | සංස්ථාගත කරන ලද රට |
|---|---|
| සීමාසහිත බ්‍රයිට් ඉන්ටර්නැෂනල් පවර් (පුද්ගලික) සමාගම | සිංගප්පූරුව |
| සීමාසහිත රාජ් ලංකා පවර් සමාගම | බංගලාදේශය |
| සීමාසහිත ලක්දනව් බංගලා පවර් සමාගම | බංගලාදේශය |
| සීමාසහිත මැකරිගාඩ් හයිඩ්‍රෝපවර් (පුද්ගලික) සමාගම | නේපාලය |
| සීමාසහිත ඒෂියාටික් ඉලෙක්ට්‍රිකල් ඇන්ඩ් ස්විච් ගියර් (පුද්ගලික) සමාගම | ඉන්දියාව |
| ෆෙනී ලංකා පුද්ගලික සමාගම | බංගලාදේශය |

ලංකා විදුලිබල මණ්ඩලය, සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම, සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම යන සමාගම් සඳහා දෙසැම්බර් මාස 31 දිනෙන් අවසන් වන පොදු ගිණුම් වර්ෂයක් ඇති අතර සීමාසහිත එල් ටී එල් හෝල්ඩින්ස් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම යන සමාගම් වල මූල්‍ය වර්ෂය මාර්තු 31 දිනෙන් අවසන් වේග කෙසේ වුවද එම සමාගම්වල දෙසැම්බර් 31 දිනට අදාල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමේ පරමාර්ථය මත විගණක වරුන් විසින් සහතික කර පිළියෙල කර ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ පරිපාලිත සමාගම් වල මුළු ලාභ/අලාභ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශන වල ඇතුළත් කර ඇති අතර ලංකා විදුලිබල මණ්ඩලයේ හිමිකරුවන්ට ආරෝපිත ලාභ හෝ අලාභ ගණනය කිරීමේදී, බාහිර කොටස්කරුවන්ට අදාළ ලාභ හො අලාභ අනුපාතිකයන් පාලනයට යටත් නොවන හිමිකමයන ශීර්ෂය යටතේ ගලපා ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම් වල සියලු වත්කම් හා වගකීම්, මූල්‍ය තත්ත්ව පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශනයට ඇතුළත් කර ඇත. පරිපාලිත සමාගම්වල බාහිර කොටස් හිමියන්ට අදාළ වත්කම් ඒකා බද්ධමූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පාලනයට යටත් නොවන හිමිකම් ශීර්ෂය යටතේ ගලපා ඇත. අන්තර් සමූහ ශේෂයන් හා ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනු වලින් උද්ගත වන උපලබ්ධි නොවූ ලාභ/අලාභ සහ ලාභාංශ, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ ඉවත් කරණු ලැබේ.

පාලනය ගිලිහීයාමෙන් තොරව පරිපාලිතයේ අයිතියෙහි සිදු වන වෙනස් වීමක් ස්කන්ධ ගනුදෙනුවක් ලෙස ගිණුම්ගත කරණු ලැබේ. පරිපාලිත සමාගමක පාලනය සමූහයෙන් ගිලිහී ගියහොත්, එය

- පරිපාලිත සමාගමෙහි (කීර්තිනාමය ද ඇතුළු) වත්කම් සහ වගකීම් තවදුරටත් ගිණුම්වල හදුනා නොගනියි
- පාලනයට යටත් නොවන හිමිකම් හී ධාරණ අගය ගිණුම්වල හදුනා
- ස්කන්ධය තුල වාර්ථා කර නොගනියි ඇත සමුච්චිත පරිවර්ථන වෙනස්කම් තවදුරටත් ගිණුම්වල හදුනා නොගනියි
- ලද ප්‍රතිශ්ඨාවේ සාධාරණ අගය ගිණුම්වල හදුනා ගනියි
- රඳවාගත් ආයෝජනයන්හි සාධාරණ අගය හදුනා ගනියි
- ලාභ/අලාභයන්හි අතිරික්ත/ඌණතා හදුනා ගනියි
- වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය හඳුනා ගෙන ඇති මව් සමාගමේ කොටස් සුදුසු පරිදි ලාභ/අලාභ යටතේ හෝ රඳවාගත් ඉපැයීම් යටතේ නැවත වර්ගීකරණය කිරීම

පාලනයට අදාල අංග තුනෙන් එකක හෝ වැඩි ගණනක වෙනස්කම් තිබේ දැයි කරුණු හා හේතූන් මගින් පෙන්නුම් කරන්නේ නම්, ආයෝජක පාලනය කරනවා ද නැද්ද යන්න සමූහය විසින් නැවත තක්සේරු කරණු ලබයි. පාලිත සමාගම ඒකාබද්ධ කිරීම ඇරඹෙනුයේ පාලිතය කෙරෙහි සමූහය විසින් පාලනය ලබා ගන්නා විට වන අතර, පාලිත සමාගම කෙරෙහි පාලනය සමූහයට අහිමි වන විට එය නවතී. සමූහය විසින් පාලනය ලබා ගන්නා දිනයේ සිට සමූහය විසින් පාලිත සමාගම පාලනය කිරීම නවතිනතෙක්, වසර තුළදී ලබාගත් හෝ බැහැර කළ පාලිත සමාගමක වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ වල ඇතුළත් වේ.

පාලනයේ නිරත නොවන පාර්ශවයට ඌන ශේෂයක් තිබුන ද, ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් වල සෑම අංගයක්ම ආරෝපණය කරනුයේ සමූහයේ මව් සමාගමේ සම කොටස් දරන්නන් හා පාලනය නොකරන පාර්ශවයන් මතය. ඒකාබද්ධ කිරීමේදී සමූහය සම්පූර්ණයෙන්ම ඉවත් කෙරේ නම්, සමූහයේ සාමාජිකයින් අතර ගනුදෙනු වලට අදාළ වත්කම් හා බැරකම්, සමකොටස්, ආදායම්, වියදම් හා මුදල් ප්‍රවාහ ගැන මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය විට ගලපනු ලැබේ. පාලනයේ අහිමිවීමකින් තොරව පරිපාලිත සමාගමේ අයිතිවාසිකම් ලැදියාවේ වෙනසක් ගිනුම් ගත කරනුයේ ස්කන්ධ ගනුදෙනුවක් වශයෙනි.

පාලිත සමාගමක් සම්බන්ධයෙන් පාලනය සමූහය වෙතින් ගිලිහී ගියහොත්, එය විසින් අදාළ වත්කම් (කීර්ති නාමය ඇතුලුව), වගකීම්, පාලනය නොවන ලැදියාවන් හා සමකොටස් වල වෙනත් අංගයන් පිළිගනු ලබන අතර, ලාභයක් හෝ පාඩුවක් වශයෙන් වූ ඕනෑම ප්‍රතිපලයක් ලාභයක් හෝ පාඩුවක් වශයෙන් පිළිගනු ලැබේ. රඳවා ගන්නා යම් ආයෝජනයක් සාධාරණ වටිනාකමක් මත පිළිගනු ලැබේ.

## 2.6 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පිළිබඳ සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කර ගන්නා ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් සෑම වසරක් සඳහාම මෙම ප්‍රතිපත්ති අඛණ්ඩව අදාළ වේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

**2.6.1 ජංගම සහ ජංගම නොවන වර්ගීකරණය**

මණ්ඩලය සිය මූල්‍ය තත්වය ප්‍රකාශනයෙහි වත්කම් හා බැරකම් ජංගම/ ජංගම නොවන වර්ගීකරණය මත පදනම්ව ඉදිරිපත් කරයි. පහත අවස්ථාවන්හිදී වත්කමක් ජංගම වත්කම් ලෙස හඳුනාගනී.

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුලදී උපලබ්ධි කිරීමට විකිණීමටල හෝ පරිභෝජනය කිරීමට අපේක්ෂා කරන වත්කම්
- වෙළඳාම සඳහා තබා ඇති වත්කම්
- වාර්තා කරන දිනෙන් පසු මාස දොළහක් ඇතුළත උපලබ්ද්ධි කර ගැනීමට අපේක්ෂා කෙරෙන වත්කම්
- වාර්තා කිරීමේ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහකටවත් පසු හුවමාරු කිරීමට හෝ වගකීමක් පියවීමට භාවිතා කිරීමට හෝ අපේක්ෂා නොකරන මුදල් හෝ මුදල් හා සමාන දෑ

  අනෙකුත් සියලුම වත්කම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කර ඇත

පහත අවස්ථාවන්හිදී වගකීමක් ජංගම වගකීමක් ලෙස හඳුනාගනී.

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුලදී ගෙවා නිදහස් කිරීමට අපේක්ෂා කරන වගකීම්
- වෙළඳාම සඳහා තබා ඇති වගකීම්
- වාර්තා කරන දිනෙන් පසු මාස දොළහක් ඇතුළත ගෙවා නිදහස් කල යුතු වගකීම්
- වාර්තා කිරීමේ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහක් වත් වගකීම් පියවීම කල් දැමීමට හැකියාවක් නොමැති වගකීම්

අනෙකුත් සියලුම වගකීම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කර ඇත.

විලම්භිත බදු වත්කම් සහ වගකීම් ජංගම නොවන වත්කම් හා වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

**2.6.2 ව්‍යාපාර සංයෝජනය, පාලනය යටත් නොවන හිමිකම් අත්පත් කර ගැනීම හා කීර්තිනාමය**

ව්‍යාපාර සංයෝජනය අදියර වශයෙන් සාක්ෂාත් කර ගන්නා විටක කලින් පැවති ඕනෑම හිමිකම් අයිතියක් එය ලබා ගත් දින පවතින සාධාරණ අගයෙන් නැවත මනිනු ලබන අතර එයින් ලැබෙන ලාභයක් හෝ අලාභයක් ලාභ හෝ අලාභ වශයෙන් පිළිගනු ලැබේ.

ව්‍යාපාර සංයෝජනයන්, අත්පත් කරගැනීමේ ක්‍රමය මත ගිණුම්ගත කරයි. අත්පත් කරගැනීමේ පිරිවැය, අත්පත් කරගන්න දිනට, සාධාරණ අගය මත ගණනය කරන ලද මාරු කල පිරිවැයත් අත්පත් කරගන්නගේ පාලනයට යටත් නොවන හිමිකමෙහිත් එකතුව වේග සෑම ව්‍යාපාර සංයෝජනයක් සඳහාම, පාලනය කල නොහැකි හිමිකමේ වටිනාකම සාධාරණ අගයට හෝ අත්පත්කරගන්නා සතු හඳුනාගත හැකි වත්කම් වලට සමානුපාතික අගයකට අනුව මැනීමටල සමූහයට තීරණය කල හැකිය. අත්පත් කර ගැනීම්දී දරනු ලබන පිරිවැය පරිපාලන වියදම් යටතට ඇතුළත් කෙරේ.

සමූහය ව්‍යාපාරයක් අත්පත් කර ගත් විට, එය සතු මූල්‍ය වත්කම් හා වගකීම් ගිවිසුමේ කොන්දේසි , ආර්ථික තත්වයන් සහ අත්පත් කර ගත් දිනයේදී අදාළ කොන්දේසි වලට අනුකූලව සකස් කරගන්නා ලද උපකල්පන මත සුදුසු පරිදි වර්ගීකරණය සහ තක්සේරුකිරීම් කරනු ලැබේ.

කීර්තිනාමයල ආරම්භයේදී පිරිවැයට මනිනු ලබන අතර එය හඳුනා ගතහැකි වත්කම් හා දරන ලද වගකීම් වල ශුද්ධ අගයට වඩා පාලනයට යටත් හිමිකමෙහි හා මාරු කරනලද ප්‍රතිලාභයෙහි එකතුවට වඩා වැඩි වූ වටිනාකමයි. අත්පත් කරගත් ශුද්ධ වත්කම් වල සාධාරණ අගය ගෙවනලද අගයට වඩා වැඩිනම්, එම ලාභය ලාභ අලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

ව්‍යාපාරය අත්කර ගැනීමෙන් ලබාගත් ශුද්ධ වත්කම් වල සාධාරණ වටිනාකම ගෙවන ලද අගයට වඩා වැඩි නම්, සමූහය විසින් අත්පත් කරගත් සියළුම වත්කම් නිවැරදිව හඳුනාගෙන තිබේ දැයි නැවත තක්සේරු කරනු ලබන අතර වගකීම් භාරගෙන සියළු දේ මැන බැලීම සඳහා භාවිතා කල ක්‍රියාපටිපාටිය නැවත සමාලෝචනය කරයි. නැවත තක්සේරු කිරීම මඟින්ද ශුද්ධ වත්කම් වල සාධාරණ වටිනාකමට මාරු කරන ලද සමස්ථ වටිනාකමට වඩා වැඩිපුර ඇත්නම්,එය ලාභය ලෙස ලාභ හෝ අලාභ ප්‍රකාශනය තුළ හඳුනා ගැනේ.

මූලික හඳුනාගැනීමෙන් පසු, කීර්තිනාමය මැනීම සඳහා පිරිවැයෙන් සමුච්චිත හාණිකරන පාඩු අඩුකරනු ලැබේ. හාණිකරන පරීක්ෂාව සිදුකිරීමේදී අත්පත් කරගත් තැනැත්තාගේ වෙනත් වත්කම් හෝ වගකීම් එම එක් එක් ඒකකයන් සඳහා පවරා නැතත්, ව්‍යාපාර සංයෝජනයක් තුළින් ලබා ගත් කීර්තිනාමය, අත්පත් කර ගත් දිනයේ සිටම, සංයෝජනයේ ප්‍රතිලාභ ඇති සමූහයේ එක් එක් මුදල් උත්පාදන ඒකක සඳහා වෙන් කරනු ලැබේ.

මුදල් උත්පාදන ඒකකයක් සඳහා කීර්තිනාමය වෙන්කර ඇති විටක එම ඒකකය තුළ ඇති මෙහෙයුම් කොටසක් බැහැර කරනු ලැබුවහොත්, බැහැර කිරීමේ ලාභය හෝ අලාභය තීරණය කිරීමේදී මෙහෙයුම් ඒකකයට අදාළ කීර්තිනාම කොටසද ධාරණ අගයට ඇතුලත් කරනු ලබයි. මෙම තත්වය තුළ බැහැර කළ කීර්තිනාමයේ වටිනාකම මනිනු ලබන්නේ බැහැර කරන ලද මෙහෙයුමේ අගය හා මුදල් උත්පාදන ඒකකයේ රඳවා ගත ප්‍රමාණයේ වටිනාකමට සාපේක්ෂවය.

**2.6.3. බද්ධ ව්‍යාපාරවල ආයෝජන**

බද්ධ ව්‍යාපාරයක් යනු ව්‍යාපාරයේ ශුද්ධ වත්කම් සම්බන්ධයෙන් බද්ධ පාලන අයිතිවාසිකම් ඇති බද්ධ සංවිධාන වර්ගයකි. බද්ධ පාලනයක් යනු අදාල ක්‍රියාකාරකම් ගැන චලබෙන්නාවූ තීරණ සම්බන්ධයෙන් පාලනය බෙදා හදා ගන්නා පාර්ශවයන් අතර ඒකමිතික කැමැත්තක් අවශ්‍ය වන්නාවූ ගිවිසුම්ගත එකගතාවයක් පවතින සංවිධානයක් වේ. සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සාමාගම යනු ලංකා විදුලිබල මණ්ඩලය හා සීමාසහිත NTPC සමාගම අතර වූ බද්ධව පාලනය වන ආයතනයකි. බද්ධ පාලනය පිලිබඳ තීරණය කිරීමේදී සැලකිල්ලට ගත යුතු

කරුණු පරිපාලිත සමාගම් පාලනය කෙරෙහි ගනු ලබන තීරණයට සමානය.

සිය බද්ධ ව්‍යාපාරයේ මණ්ඩලයේ ආයෝජන ගණනය කරනුයේ සමකොටස් ක්‍රමවේදය යොදා ගනිමිනි.සමකොටස් ක්‍රමවේදය යටතේ බද්ධ ව්‍යාපාර ආයෝජන මුලදී හඳුනාගන්නේ පිරිවැය මතය. අත්පත් කර ගැනීමේ දිනයේ සිට පවතින්නා වූ ව්‍යාපාරයේ ශුද්ධ වත්කම්වලින් මණ්ඩලයේ කොටස් වල වෙනස්කම් හඳුනා ගැනීම පිණිස ආයෝජනයේ ධාරණ වටිනාකම ව්‍යාපාරයට අදාළව (carrying amount) ගලපනු ලැබේ.බද්ධ ව්‍යාපාරයට අදාල කීර්ති නාමය ආයෝජනයේ ධාරණ වටිනාකමෙහි අඩංගු අතර අඩු කිරීම සඳහා තනි තනිව පරීක්ෂා නොකරේ.බද්ධ ව්‍යාපාරයේ මෙහෙයුම් ප්‍රතිඵලවල මණ්ඩලයේ කොටස අදායම් ප්‍රකාශයේ පිලිඹිබු වේ. ආයෝජකයාගේ වෙනත් විස්තීරණ අදායම් වෙනස්කම් මණ්ඩලයේ වෙනත් විස්තීරණ අදායම් කොටස් වශයෙන් ඉදිරිපත් කරේ.

මෙයට අමතරව බද්ධ ව්‍යාපාරයේ සමකොටස් වල සෘජුව හදුනාගන්න වෙනසක් සිදුව ඇත්නම් සමකොටස් වල වෙනස්වීම පිලිබඳ ප්‍රකාශයේ වෙනස්වීම්වලට සිය කොටස මණ්ඩලය විසින් අදාල පරිදි හදුනා ගනී. බද්ධ ව්‍යාපාරය ගැන වූ උනන්දුවේ ප්‍රමාණය කොතෙක්ද යත් මණ්ඩලය හා බද්ධ ව්‍යාපාරය අතර වූ ගනුදෙනු වලින් පැන නගින උපලබ්ධි නොවූ ලාභ හා පාඩු ඉවත්කරනු ලැබේ. මණ්ඩලයට අදාල බද්ධ ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ කොටස ලාභ හෝ පාඩු ලාභ අලාභ හා සුළු කොටස් හිමියන්ගේ බද්ධ ව්‍යාපාරයට ඇති ලැදියාව නියෝජනය කරමින් ලාභ පාඩු ප්‍රකාශණයේ මුහුණත පෙන්නුම් කරයි.

### 2.6.4 විදේශ විනිමයන් පරිවර්ථනය විදේශ විනිමය ගනුදෙනු සහ ශේෂයන්

#### අ) ව්‍යවහාරික හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී යොදා ගන්නා මුදල

සමූහයේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර තිබෙන්නේ ආයතනයේ ව්‍යවහාරික හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මුදල් වශයෙන් සැලකෙන ''ශ්‍රී ලංකා රුපියල්'' වලිනි.

#### ආ) ගනුදෙනු හා ශේෂයන්

විදේශ විනිමය ගනුදෙනු ආරම්භක අවස්ථාවේදී ගනුදෙනු සිදු වන දිනයන්හි බල පවත්නා විනිමය අනුපාත යොදා ගනිමින් ව්‍යවහාරික මුදලින් වාර්තා කරයි. විදේශ මුදල් වල සඳහන් මුදල් වත්කම් හා බැරකම් වාර්තා කරන දිනයේදී පවතින ස්ථානීය අනුපාතයට අනුව නැවත ව්‍යවහාර මුදලට පරිවර්තනය කෙරේ. සියලු වෙනස්කම් ලාභ හෝ අලාභය පිළිබඳ ප්‍රකාශය වෙත ගෙන යනු ලැබේ.

ඓතිහාසික පිරිවැය අනුව විදේශ මුදල් වලින් මනිනු ලබන මුදල් නොවන අයිතමයන් මුල් ගනුදෙනු සිදු වූ දිනයේ පැවති විනිමය අනුපාත උපයෝගී කරගනිමින් පරිවර්තනය කෙරේ. මුදල් නොවන අයිතමයන්හි පරිවර්තනයෙන් මතුවන ලාභය හෝ අලාභය පරිවර්තනන වෙනස ඇති කිරීමට හේතු වූ අයිතමයේ ලාභය හෝ අලාභය සමඟ පිළිගැනේ (වෙනත් විස්තීර්ණ ආදායමෙන් හෝ ලාභ ප්‍රකා කාශය තුළින් ලාභ හෝ පාඩු පිළිගත් අයිතමයන්හි පරිවර්තවන වෙනස්කම්) නැතහොත් පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායමෙන් හෝ ලාභයෙන් හෝ අලාභය තුළින් ද පාඩු පිළිගැනේ).

1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනතේ 42 වගන්තියේ 06 වන උපවගන්තිය යටතේ විදේශීය ව්‍යවහාර මුදල් ප්‍රාග්ධනය හා ණය මත පොලිය සම්බන්ධයෙන් විනිමය උච්චාවචන වලින් ඇති වන ලාභ හෝ පාඩු ලංකා විදුලිබල මණ්ඩලය ගිණුම් ගත නොකෙරෙනුයේ ඒවා ශ්‍රී ලංකා රජය විසින් දරන බැවිනි. ආපසු ගෙවිය යුතු නොපියවූ ණය තක්සේරු කරනුයේ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ණය ලබා ගන්නා අවස්ථාවේ පැවති එකග වූ විනිමය අනුපාතය මතය.

#### ඇ) විදේශ මෙහෙයුම්

විදේශ මෙහෙයුම් ලෙස සැලකෙන විදේශයන්හී ක්‍රියාත්මක පරිපාලිත සමාගම් සහ හවුල් ව්‍යාපාරවල මූල්‍ය තත්ත්වය සහ ආදායම් ප්‍රකාශය වාර්තා කරන දිනට අදාළ විනිමය අනුපාතය සහ වාර්ෂික හුවමාරු අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කෙරේ.

පරිවර්ථනය තුලින් මතුවන හුවමාරු වෙනස්කම් සෘජුවම වෙනත් විස්තීර්ණ ආදායමට හඳුනාගනු ලැබේ. විදේශීය ආයතනයක් බැහැර කිරීමේදී එම විදේශීය මෙහෙයුමට අදාළව අනෙකුත් විස්තීර්ණ ආදායමෙන් හඳුනාගෙන ඇති සමුච්චිත අගය ආදායම් ප්‍රකාශනයට හඳුනාගනු ලැබේ.

### 2.6.5 බදුකරණය

අදාළ කාලසීමාව සඳහා බදු වියදම්, ප්‍රවර්තන බදු සහ විලම්භිත බදු වලින් සමන්විත වේ.

වෙනත් විස්තීර්ණ ආදායම් වශයෙන් හඳුනා ගත් ආදායම් හෝ වියදම් අයිතමයකට අරෝපණය කළ හැකි වෙනසක් වෙනත් විස්තීර්ණ ආදායම් වල ද සෘජුව හඳුනා ගනු ලබන අතර අනෙකුත් බදු ලාභ අලාභ ප්‍රකාශනයට හඳුනාගනී.

#### අ) ප්‍රවර්තන බදු

පවත්නා හා පෙර කාලසීමාවන් සඳහා වූ ප්‍රවර්තන ආදායම් බදු වත්කම් හා බැරකම් මිනිනුයේ දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් ගෙන් ලැබීමට හෝ ඔහු වෙත ගෙවීමට අපේක්ෂිත මුදල මතය. මුදල් ප්‍රමාණය ගණන් බැලීමට යොදා ගන්නා බදු අනුපාතය හා බදු නීතිය වනුයේ සමාගම ක්‍රියාත්මක හා බදු වලට යටත් ආදායම් ජනනය කරනු ලබන රටේ පනවා ඇති හෝ වාර්තා කරන දිනයේ ප්‍රමාණවත් ලෙස පන වන ලද ඒවාය. හිමිකම් වලදී සෘජුව හඳුනා ගත් අයිතම වලට අදාළ ප්‍රවර්තන ආදායම්

බදුහිමිකම් හදුනා ගන්නේ හිමිකම් වලදී මිස ආදායම් ප්‍රකාශය තුළ නොවේ.

අදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම් වී ඇත්තේ 2018 අප්‍රේල් 01 වන දින සිට බලාත්මක 2017 අංක 24 දරණ දේශීය අදායම් පනතේ විධිවිධාන එහි සංශෝධන අනුව බදුකරණය සඳහා ගැලපීම් කරනලද ගිණුම්කරණ ලාභය මතය.

### ආ) විලම්භිත බදුකරණය

වත්කම් හා බැරකම් වල බදු පදනම් අතර පැනනගින තාවකාලික වෙනස් වීම් හා මූල්‍ය වාර්තා වල ඔවුන්ගේ ධාරණ වටිනාකම් මත බැරකම් ක්‍රමවේදය යොදා ගනිමින් විලම්බිත ආදායම් බදු ප්‍රතිපාදන සලසා ඇත.

ව්‍යාපාරික සංයෝජනයක් නොවන ගනුදෙනුවක වත්කමක හෝ බැරකමක මුල් හඳුනා ගැනීමකදී විලම්බිත ආදායම් බදු වගකීම් හට ගන්නා අවස්ථාවක ද ව්‍යාපාරික සංයෝජනයක් නොවන ගනුදෙනුවක් සිදු වන අවස්ථාවකදී ද හැර ගිණුම්කරණ ලාභය හෝ බදු වලට යටත් ලාභය හෝ පාඩුවකට බලපෑමක් විලම්බිත ආදායම් බදු බැරකම් පැන නැගීමේදී හැර බදුවලට යටත් සියලුම තාවකාලික වෙනස්වීම් සඳහා විලම්බිත ආදායම් බදු බැරකම් හඳුනාගනු ලැබීම සහ ගනුදෙනු කරන ගිණුම්කරණ ලාභයට හෝ බදු අය කල හැකි ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැත.

අඩු කළහැකි සියලුම තාවකාලික වෙනස්කම් ඉදිරියට ගෙන යන භාවිතයට නොගත් බදු වත්කම් හා භාවිතයට නොගත් බදුපාඩු සඳහා බදුවලට යටත් ලාභ තිබීමේ හැකියාවක් පවතින තාක් විලම්බීත ආදායම් බදු වත්කම් පිළිගනු ලැබේ. මෙයින් අඩු කළහැකි තාවකාලික වෙනස්කම් හා භාවිතයට නොගත් බදු බැර හා භාවිතයට නොගත් බදු පාඩුවල ඉදිරියට ගෙනයෑම් උපයෝගී කර ගත හැකි වනුයේ එය ව්‍යාපාරික සංයෝජනයක නොවන ගනුදෙනුවකදී ගනුදෙනු කාලය තුළදී හා එම ගනුදෙනු කාලය තුලදී ගිණුම්කරණ ලාභය හෝ බදුවලට යටත් ලාභය හෝ පාඩුවකට බලපෑමක් නොකළ යුතු ගනුදෙනුවකදි වත්කමක හෝ බැරකමක මූලික පිළිගැනීම තුළින් පැන නගින අඩු කළහැකි තාවකාලික වෙනස්කම් වලට අදාල විලම්බිත ආදායම් බදු වත්කම්ය.

විලම්බිත බදු වත්කම්වල ඉදිරියට ගෙන යන ප්‍රමාණයන් වාර්තා කරණ සෑම දිනයකදීම සමාලෝචනය කෙරෙන අතර විලම්බිත ආදායම් බදුවත්කම මුලුමනින්ම හෝ අඩක් වශයෙන් යොදා ගැනීමට ඉඩදීමට ප්‍රමාණවත් බදු වලට යටත් ලාභයක් තිබේ දැයි තවදුරටත් හැකි නොවනතාක් ප්‍රමාණය දක්වා අඩු කරනු ලැබේ.

පරිපාලිත සමාගම්වල, ආශ්‍රිත සමාගම් වල සහ බද්ධ ව්‍යාපාර වල ආයෝජන තුළින් ඇති වන තාවකාලික වෙන්සකම් සම්බන්ධයෙන් සලකා බැලීමේදී ප්‍රත්‍යාවර්ති නියම කිරීම් හැර අනෙකුත් තාවකාලික වෙනස්කම් පාලනය කළ හැකි අතර එම තාවකාලික වෙන්ස්වීම් නුදුරු අනාගතයේදී ප්‍රත්‍යාවර්තනය නොවනු ඇත.

වාර්තා කරනු ලබන සෑමදිනයකදීම හඳුනානොගත් විලම්බිත ආදායම් බදු වත්කම් නැවත ඇගයන අතර අනාගත බදුවලින් විලම්බිත ආදායම් බදුවත්කම් ආපසු ලබා ගැනීමට යටත් ලාභ වලින් ඉඩ ලැබෙන බව හඳුනා ගැනෙයි.

පාලිත සමාගම්, ආශ්‍රිත සමාගම් හා බද්ධ ව්‍යාපාර වල ලැදියාවන්ට සම්බන්ධ අඩු කළ හැකි සියලුම තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් විලම්බිත බදු වත්කම් පිළිගැනෙන්නේ නුදුරු අනාගතයේදී තාවකාලික වෙනස්වීම් ආපසු හැරීමේ හා තාවකාලික වෙනස්කම් යොදා ගත හැකි බදුයටතේ ලාභයක් ලැබීමේ හැකියාවක් තිබෙනතාක් පමණි.

විලම්බිත ආදායම් බදු වත්කම් හා බැරකම් මහිනුයේ වත්කම උපලබ්ධි වන හෝ බැරකම නිරවුල් කරණු ලබන අවස්ථාවන්හිදී හෝ වාර්තා කරන දිනට ක්‍රියාත්මක වන හෝ පසුකාලීනව පනවනු ලබන බදු අනුපාතයන් (හා බදු නීති) පදනම් වූ බදු අනුපාත මතය. වෙනත් විස්තීර්ණ ආදායම් හෝ ස්කන්ධ ප්‍රාග්ධකයට සෘජුව පිළිගන්නා ලද අයිතම වලට පාදක ගනුදෙනුවට සහ සම්බන්ධව අදාළ විලම්බිත බදු පිළිගනු ලැබේ. ප්‍රවර්තන බදු වත්කම් ප්‍රවර්තන බදුබැරකම් වලට හිලව් කිරීමට නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ හැකි අයිතියක් තිබේ නම් හා විලම්බිත බදු අදාළ වන්නේ බදු වලට යටත් එම ආයතනයට හා එම බදුකරණ බලධාරියාටම නම් විලම්බිත බදු වත්කම් හා විලම්බිත බැරකම් හිලව් කරනු ලැබේ.

විලම්භිත බදු වත්කම් වල ධාරණ අගය එක් එක් වාර්තාකරණ දිනයේදී සමාලෝචනය කෙරෙන අතර, විලම්භිත බදු වත්කම් වලින් කොටසක් හෝ ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගැනීමට ඉඩ සැලසෙන පරිදි ප්‍රමාණවත් බදු ගෙවිය හැකි ලාභයක් ලැබීමට නොහැකි වන තරමට අඩු කෙරේ.

හඳුනා නොගත් විලම්භිත බදු වත්කම් වාර්තාකරන සෑම දිනකම නැවත තක්සේරු කෙරෙන අතර අනාගත බදු අය කළ හැකි ලාභ මඟින් විලම්භිත බදු වත්කම් ආපසු ලබා ගැනීමට ඉඩ සැලසෙන තරමට පිළිගැනේ.

වත්කම් උපලබ්ද්ධි වීම තහවුරු වූ විට හෝ වගකීම පියවන අවස්ථාව පැමිණිවිට එට වාර්තාකරණ දිනය වන විට බලාත්මක කර ඇති හෝ සැලකිය යුතු ලෙස බලාත්මක කර ඇති බදු අනුපාත (සහ බදු නීති) මත පදනම්ව විලම්භිත බදු වත්කම් හා වගකීම් ගණනය කරනු ලැබේ.

**ලාභාංශ ආදායම මත බදු**

ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දී පරිපාලිත සමාගම් වලින් ලාභාංශ ආදායම සඳහා වන බද්ද වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

**විකුණුම් බද්ද**

පහත දැ හරුනු විට ආදායම්, වියදම් සහ වත්කම් විකිණුම් බදු වලින් පසු හඳුනා ගෙන ඇත.

වත්කමක් හෝ සේවාවක් මිලට ගැනීමේදී ගෙවිය යුතු විකුණුම් බද්ද බදු අධිකාරියෙන් අය කර ගත නොහැකි නම්, වත්කම් හෝ වියදම් අයිතමය අත්පත් කර ගැනීමේ පිරිවැයෙහි කොටසක් ලෙස විකුණුම් බද්ද පිළිගනු ලැබේ. හා

**ඇතුළත් කළ විකුණුම් බද්ද සමග ලැබිය යුතු හා ගෙවිය යුතු දේ සඳහන් කළ විට.**

බදු අධිකාරියෙන් අය කර ගත හැකි හෝ ගෙවිය යුතු විකුණුම් බද්දේ ශුද්ධ මුදල මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේදී ලැබිය යුතු හෝ ගෙවිය යුතු කොටසක් ලෙස ඇතුළත් කර ඇත.

### 2.6.6 භාණ්ඩ තොග

යල්පැන ඇති හා මන්දගාමී චලනය වන අයිතම සඳහා වෙන් කිරීමෙන් පසු තොග තක්සේරු කරනුයේ පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකම මත ශුද්ධ උපලබ්ධි වටිනාකම අවසන් කිරීමේ හා විකිණීම කිරීමට අවශ්‍ය වන ඇස්තමේන්තු කළ පිරිවැය අඩු කළ පසු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී භාණ්ඩ විකිණිය හැකි මිල ගණන්ය. භාණ්ඩ දැනට ඇති ස්ථානයට ගෙන ඒමට හා වත්මන් තත්වයට පත් කිරීමට දරන ලද පිරිවැය පහත දැක්වෙන පරිදි ගනනය කෙරේ.

**ලංකා විදුලිබල මණ්ඩලය**

වැඩි වශයෙන් පාවිච්චියට ගන්නා හා වාර්ෂික මිල ලැයිස්තුවේ ඇතුළත් භාණ්ඩ තක්සේරු කරනුයේ බෙදාහැරීම් අංශවල සම්මත මිල අනුව වන අතර පාරිභෝගික භාණ්ඩ හා අමතර කොටස් වැනි වෙනත් ඒවා (ජනන හා සම්ප්‍රේෂණ අංශවල)ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කෙරෙන ක්‍රමය මතය. එසේ වුවද සම්මත මිල අනුව තක්සේරුකර තිබෙන භාණ්ඩ වල උපලබ්ධි ලාභය මගින් දක්වා ඇති පිරි වැය පහත හෙළීම පිණිස අවශ්‍ය ප්‍රතිපාදන ලංකා විදුලිබල මණ්ඩලය විසින් සලසා ඇත.

**සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම**

| | | |
|---|---|---|
| මෙහෙයුම් හා නඩත්තු භාණ්ඩ | - | බර තබන ලද සාමාන්‍යය පදනමින් තත්‍ය පිරිවැය මත |
| මාර්ගස්ථ තොග හා වෙනත් තොග | - | සත්‍ය පිරිවැය මත |
| අමු ද්‍රව්‍ය | - | බර තැබූ මිළ ක්‍රමය මත සත්‍ය පිරිවැය |
| නිමි භාණ්ඩ සහ කෙරීගෙන යන වැඩ | - | සෘජු ද්‍රව්‍ය පිරිවැය ද, සෘජු ශ්‍රම පිරිවැය දල භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේ සමාන්‍ය ක්‍රියාකාරී ධාරිතාව මත පදනම්ව සමානුපාතිකව අවශෝෂණය කරන ලද ස්ථාවර හා විචල්‍ය පොදුකාර්ය පිරිවැය ද මත |

**සීමාසහිත එල්ටිඑල් හෝල්ඩින්ස් (පුද්) සමාගම**

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය තක්සේරු කරනු ලබන්නේ | - | ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුතුවන පදනමට සත්‍ය පිරිවැයට |
| නිමිභාණ්ඩ හා නිමකෙරෙමින් ඇති භාණ්ඩ | - | සෘජු ද්‍රව්‍ය පිරිවැය ද, සෘජු ශ්‍රම පිරිවැය දල සුදුසු අනුපාතයකට අවශෝෂණය කරනලද ස්ථාවර පොදුකාර්ය පිරිවැය ද මත |
| පාරිභෝගික භාණ්ඩ හා අමතර කොටස් | - | ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුතුවන පදනමට සත්‍ය පිරිවැයට |
| මාර්ගස්ථ තොග | - | සත්‍ය පිරිවැය මත |

### 2.6.7 දේපල, පිරියත හා උපකරණ

**අ) හඳුනාගැනීමේ පදනම**

දේපල, පිරියත සහ උපකරණ ගිණුම් සඳහා හඳුනාගනු ලබන්නේ වත්කමට ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා ඒමට ඉඩ තිබේ නම් හා වත්කම් වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් පමණි.

**ආ) මිනුම්කිරීමේ පදනම**

දේපල, පිරියත හා උපකරණ පිරිවැය සම්බන්ධයෙන් දක්වා ඇත්තේ සමුච්චිත ක්ෂය කිරීම් සහ හානි අලාභ කිසිවක් වුයේ නම් සමුච්චිත හානි අඩු කොට පිරිවැය වටිනාකමටය. දේපල, පිරියත හා උපකරණ වල උපාංග කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය හා පිළිගැනීමේ නිර්නායක සපුරා තිබේ නම් දීර්ඝ කාලීන ඉදිකිරීම් ව්‍යාපෘති වලට අදාළණය ගැනීමේ පිරිවැය එවැනි පිරිවැයට ඇතුළත් ය. දේපල, පිරියත හා උපකරණ වල වැදගත් කොටස් කලින් කලට ප්‍රතිස්ථාපනය කිරීම අවශ්‍ය වන විට ප්‍රතිස්ථාපිත වූ කොටසේ ශුද්ධ පොත් වටිනාකම සමූහය විසින් හඳුනා නොගන්නා අතර එයට අදාළ ප්‍රයෝජනවත් ආයුකාලය හා ක්ෂය වීම් සහිත වන කොටස පමණක් හඳුනා ගැනේ. එලෙසම ප්‍රධාන පරීක්ෂණයක් ඉටු කළ විට පිළිගැනීමේ නිර්නායක සපුරාලන්නේ නම් එහි පිරිවැය, පිරියත හා උපකරණයන්හි ධාරණ වටිනාකමේ ප්‍රතිස්ථාපනයක් ලෙස හඳුනා ගැනේ. අනෙකුත් සියළුම නඩත්තු සහ අළුත්වැඩියා වියදම් ලාභ/අලාභ ප්‍රකාශනය තුල හඳුනාගැනේ.

දේපල පිරියත සහ උපකරණ වල ධාරණ අගය නැවත අයකර ගත නොහැකි බව පෙන්නුම් කරන සිද්ධීන් හෝ තත්වයන් ඇතිවන විට ඒ සඳහා හාණිකරන පරීක්ෂාවන් සිදුකරනු ලැබේ.

**ඈ) දැනට සිදුකෙරෙමින් පවත්නා ප්‍රාග්ධන කාර්යයන්**

වාර්තා කරන දිනට අවසන් කර නොමැති ස්ථාවර වත්කම් හා සම්බන්ධව සිදු කරන ලද ප්‍රාග්ධන වියදම් කෙරීගෙන යන ප්‍රාග්ධන කාර්යයන් ලෙස පෙන්නුම් කෙරෙන අතර එය පිරිවැය අනුව දක්වා ඇත. මෙම කාර්යයන් අවසන් වූ පසු අදාළ වත්කම් දේපල, පිරියත සහ උපකරණ වෙත මාරු කෙරේ.

**ඈ) හඳුනා ගත් වත්කම් පොත් වලින් ඉවත් කිරිම**

දේපල, පිරියත සහ උපකරණ භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් බලාපොරොත්තු විය නොහැකි අවස්ථාවක දී හෝ බැහැර කිරීමකදී පොත් වලින් ලියා හැරීම සිදු කෙරේ. වත්කම් පොත් වලින් ලියා හැරීමේදී මතුවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (වත්කම ඉවත්කිරීමේ ශුද්ධ අගය සහ වත්කමේ ධාරන අගය අතර වෙනස මෙම ලාභය හෝ අලාභය ලෙස ගණනය කෙරේ) අදාල වර්ෂයේ ලාභ හෝ අලාභ ප්‍රකාශයට ඇතුළත් වේ.

**ඉ) ක්ෂය**

සින්නක්කර ඉඩම් හැර සෙසු දේපල, පිරියත සහ උපකරණ ඒවායේ පිරිවැය හෝ තක්සේරු වටිනාකම මත සරල රේඛීය ක්‍රමයක් උපයෝගී කරගනිමින් ගණනය කර එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය තුල ඒවායේ වටිනාකම් ලියා හැරීම ක්ෂය වීම් වේ. 2.6.7 යටතේ විස්තර කර ඇති පරිදි වත්කම් විකිණීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇති විට හෝ වත්කම පොත් වලින් ඉවත් කිරීමට තීරණය කර ඇතිවිට යන සිදුවීම් දෙකෙන් පෙරඇතිවන සිදුවීම් දින සිට වත්කම් සඳහා ක්ෂය කිරීම නතර වේ.

වත්කම් වල සඵල ආයුකාල ඇස්තමේන්තු කරනුයේ පහත දැක්වෙන අයුරිනි:

**ලංකා විදුලිබල මණ්ඩලය**

| | |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි හා බදුඉඩම් හා ගොඩනැගිලි | වසර 40 |
| සිවිල්වැඩ: | |
| වාන් දොරටු හා වේලි | වසර 100 |
| වානේ ජලනල හා කොටු දොර | වසර 40 |
| උප පොල හා ස්විච්චි අංගනය | වසර 35 |
| උත්පාදන යන්ත්‍ර: | |
| පිරියත ඇතුලු විදුලි බලාගාර (ජලවිදුලි) | වසර 35 |
| පිරියත ඇතුලු විදුලි බලාගාර (තාප) | වසර 25 |
| පිරියත ඇතුලු විදුලි බලාගාර (ඩීසල්) | වසර 12-15 |
| පිරියත ඇතුලු විදුලි බලාගාර (ගෑස් ටර්බයින්) | වසර 12 |
| පිරියත ඇතුලු විදුලි බලාගාර (ගල් අඟුරු) | වසර 30 |
| පිරියත ඇතුලු විදුලි බලාගාර (සුළං) | වසර 20 |
| සම්ප්‍රේෂණ මාර්ග කි.වො. 220, කි.වො. 132, කි.වො. 66 | වසර 35 |
| බෙදා හැරීමේ මාර්ග | |
| අධි සැරයටිබහන් - 33 | වසර 50 |
| අධි සැරයටිබහන් - 132 | වසර 50 |
| අධි සැරයටිබහන් - 11 | වසර 40 |
| අධි සැර උඩිස් රැහැන් | වසර 35 |
| අඩු සැර භූගත | වසර 40 |
| අඩු සැර උඩිස් රැහැන් | වසර 35 |
| අඩු සැර පෝෂණ කණුව | වසර 35 |
| පාරිභෝගික උප පොල | වසර 35 |
| අධිසැර ස්විච්චිපන්න | වසර 35 |
| ප්‍රාථමික හා ජාලක උප පොල | වසර 35 |
| සේවා නඩත්තු- පොදු කාර්යන් | වසර 35 |
| සේවා ගාස්තු භූගත | වසර 40 |
| SCADA(මධ්‍යම පහසුකම්) හා සන්නිවේදන උපකරණ | වසර 15 |
| මෝටර් වාහන- මගී ප්‍රවාහනය - වීල් දෙක හෝ තුන | වසර 15 |
| මෝටර් වාහන- මගී ප්‍රවාහනය - වෙනත් | වසර 14 |
| බර වාහන | වසර 20 |
| මෝටර් බෝට්ටු | වසර 07 |
| යන්ත්‍ර හා මෙවලම් | වසර 05 |
| කාර්යාලීය උපකරණ | වසර 05-15 |
| ලීබඩු හා සවිකිරීම් | වසර 05 |
| සූර්යපැනල | වසර 10-25 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

| සීමාසහිත එල්ටීඑල් හෝල්ඩිංස් (පුද්)සමාගම | |
|---|---|
| ගොඩනැගිලි | වසර 25-50 අධික |
| පිරියත හා යන්ත්‍ර | වසර 8 - 20 අධික |
| බලාගාරය | වසර 10-20 අධික |
| කම්හල් උපකරණ | වසර 10 අධික |
| විද්‍යුත් පණිවිඩ හුවමාරු උපකරණ | වසර 10 අධික |
| ගිනිනිවීමේ උපකරණ | වසර 10 අධික |
| කාර්යාලීය උපකරණ | වසර 03 - 10 අධික |
| ලීබඩු හා සවිකිරීම් | වසර 03 - 10 අධික |
| මෝටර් වාහන | වසර 4 අධික |
| මෙහෙයුම් හා නඩත්තු අමතර කොටස් තත්‍ය භාවිතය | තත්‍ය භාවිතය |
| සූර්ය බල පිවී බලාගාර | වසර 15 අධික |
| **සීමා සහිත ලංකාවිදුලි (පුද්)සමාගම** | |
| ගොඩනැගිලි බදු ඉඩම් | වසර 40 |
| යටිතල පහසුකම් සැපයීම | |
| පලාත් පාලන ආයතන හා ලංවිම වෙතින් භාරගත් උප පොලවල්, උඩිස් රැහැන් හා සේවා රැහැන් | වසර 10 |
| ලෙකෝ සමාගමෙන් ඉදි කළ උප පොලවල්, උඩිස් රැහැන් හා සේවා රැහැන් | වසර 20- 25 |
| මොටර් වාහන | වසර 5- 20 |
| පරිඝණක | වසර3 - 5 |
| කාර්යාල උපකරණ | වසර3 - 7 |
| පිරියත හා යන්ත්‍ර | වසර 3-4 |
| **සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්)සමාගම** | |
| ලීබඩු හා සවිකිරීම් | වසර 05 |
| උපකරණ | වසර 04 |
| මොටර් වාහන | වසර 04 |
| පරිඝණක වසර 04 | වසර 04 |
| කල්බදු වැඩි දියුණු කිරීම | වසර 02 |
| ජාල පද්ධති | වසර 02 |
| **ශ්‍රී ලංකා එනජීස් (පුද්) සමාගම** | |
| ගොඩනැගිලි | වසර 20 |
| ලී බඩු උපකරණ හා මෙවලම් | වසර 5 |
| මොටර් වාහන | වසර 5 |
| කාර්යාල උපකරණ | වසර 5 |
| පරිඝණක | වසර 5 |
| ඉන්ජෙක්ෂන් මොඩියුලින් යන්ත්‍ර | වසර 5 |
| **සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගම** | |
| ඉඩම් හා සංවර්ධනය | වසර 20 |
| ලීබඩු හා සවිකිරීම් | වසර 05 |
| උපකරණ | වසර 05 |
| පරිඝණක | වසර 03 |

අවසන් වරට වාර්තා කිරීමේ දිනයේ සිට වත්කම් වල වටිනාකම්, ප්‍රයෝජනවත් ජීවිත කාලය හා ක්ෂය වීමේ ක්‍රමවල සැලකිය යුතු වෙනසක් සිදු වන බවට ඉඟියක් තිබේ නම් ඒවා නැවත සමාලෝචනය කර, සුදුසු නම්, ගැලපෙන පරිදි සකස් කරනු ලැබේ.

### ඊ) ණය ගැනීම් පිරිවැය

අරමුදල් ණයට ගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් දරන පොලිය හා වෙනත් පිරිවැය වලින් ණය ගැනීම් පිරිවැය සමන්විත වේ. ඒවා යේ අපේක්ෂිත භාවිතය හෝ විකිණීමට සූදානම් වීම පිණිස ආවශ්‍යවම සැලකිය යුතු කාල සීමාවක් ගත වෙන යෝග්‍ය වන වත්කම් අත්කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනයට සෘජුවම ආරෝපණය කළ හැකි පොදු හා නිශ්චිත ණය ගැනීමේ පිරිවැය, වත්කම් සාරානුකූලව ඒවායේ අපේක්ෂිත භාවිතය හෝ විකිණීම පිණිස සාරානුකූලව සූදානම් කෙරෙන තුරු එම වත්කම් වල පිරිවැයට එකතු කරනු ලැබේ. අනෙකුත් ණය ගැනීමේ සියලුම පිරිවැය, වියදම් දරන ලද කාලසීමාව තුළ වියදම් ලෙස හඳුනා ගනු ලැබේ.

සුදුසුකම් ලත් වත්කම් සඳහා ලබාගත් ණය එම වත්කම් සඳහා වැයවන තෙක් තාවකාලිකව ආයෝජනය කිරීමෙන් උපයනු ලබන ආදායම ප්‍රාග්ධනිත කිරීමට සුදුසුකම් ඇති පිරිවැයෙන් අඩුකර දක්වයි.

### 2.6.8 විකිණීම සඳහා තබා ඇති ජංගම නොවන වත්කම්

වාර්තා ගත වටිනාකමල අඛන්ඩව භාවිතා කිරීමට වඩා මූලික වශයෙන්මල විකිණීම මගින් අයකර ගනී නම්ල සමූහය විසින් ජංගම නොවන වත්කම් විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගීකරණය කරයිග අපහරණය සඳහා වර්ගීකරණය කර ඇති එකී ජංගම නොවන වත්කම්ල ඒවායේ පොත්වල අගය හා සාධාරණ අගයෙන් විකුණුම් වියදම් අඩු කල පසු අගය යන දෙකෙන් අඩු අගයට තක්සේරු කරේ. මූල්‍ය පිරිවැය සහ ආදායම් බදු වියදම් හැර වත්කමක් ඉවත් කිරීම සඳහා සෘජුවම දැරිය යුතු වර්ධක පිරිවැය විකිණීමේ පිරිවැය වේ.

කළමනාකරණය (අධ්‍යක්ෂක මණ්ඩලය) විසින් ප්‍රධානය කරනු ලබන අනුමැතිය මත ඉහල විකුණුම් සම්භාවිතයක් ඇති යන නිර්ණායක මත සහ වත්කම එහි වර්තමාන තත්වය තුළ වහාම විකිණීමට හැකිය යන නිර්දේශය මත විකිණීම සඳහා ඇති වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

විකිණීම සම්පූර්ණ කිරීමට ගන්නා ක්‍රියාමාර්ග වලින් විකිණීමේදී සැලකිය යුතු වෙනස්කම් සිදුකිරීමක් හෝ විකිණීමේ තීරණය ඉවත් කර ගැනීමක් නොහැකි වීම දැක්වේ. වත්කම් විකිණීමේ සැලැස්මට කළමනාකාරිත්වය කැපවිය යුතු අතර වර්ගීකරණය කළ දින සිට මාස හයක් ඇතුළත විකිණීම අවසන් කිරීමට අපේක්ෂා කළ යුතුය.

විකිණීම සඳහා වර්ගීකරණය කිරීමෙන් පසු දේපල පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන අත්හිටුවයි. විකිණීම සඳහා වර්ගීකරණය කල වත්කම් සහ වගකීම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම අයිතිමයන් වශයෙන් වෙනමම දක්වනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)



#### බැහැර කිරීම

මණ්ඩල තීන්දුවෙන් "විකිණීමට තිබෙන වත්කම්" ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් මාස හයක් ඇතුළත විකිණීමට අපොහොසත් වුවහොත් නැවත එම වත්කම් දේපල පිරියත සහ උපකරණ (PPE) යටතේ වර්ගීකරණය කලයුතු අතර නවතා ඇති ක්ෂය ගැලපීම් කාලානුරූපව නැවත අයකල යුතුය.

### 2.6.9 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වත්කමක් වටිනාකම අඩු වන බවට වාර්තාකරණ සෑම දිනයකදීම එසේ වන බවට යම් සංඥාවක් තිබේ දැයි සමූහය විසින් තක්සේරු කරනු ලබයි. එවැනි කිසියම් සංඥාවක් තිබේ නම්, එම වත්කම හෝ මුදල් ජනන ඒකකය සඳහා හනිකරණ පරීක්ෂාවක් සිදුකරනු ලබයි. වත්කමේ ධාරණ අගයට වඩා නැවත අයකර ගත හැකි අගය අඩුවන ප්‍රමාණයෙන් හාණිකරන අලාභ හදුනාගනු ලබයි. නැවත අයකර ගත හැකි අගය යනු වත්කම විකිණීමට යන පිරිවැය හා පාවිච්චියේදී එහි අගය අඩු කර වත්කමක් හෝ මුදල් ජනනය කරණ ඒකකයක් යන දෙකෙන් වැඩිවටිනාකමක් ඇති සාධාරණ අගයෙන් අලෙවි කිරීමේ පිරිවැය අඩු කළ විට ලැබෙන අගයත් ප්‍රයෝජ්‍ය අගයත් යන දෙකෙන් වඩා වැඩි අගයටය. ප්‍රයෝජය අගය තක්සේරු කිරීම පිණිස, මුදල් වල කාලීන අගයේ වත්මන් වෙළඳපල තක්සේරුව හා වත්කමට විශේෂිත අවදානම් පිළිඹිඹු වන බදු අයකර ගැනීමට පෙර වට්ටම් අනුපාතයක් යොදා ගනිමින ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්, ඒවා යේ වත්මන් අගය දක්වා වට්ටම්කරණු ලැබේ.

හාණිකර අලාභ තක්සේරු කිරීමේ අරමුණින් සමස්ථ මණ්ඩලය වෙනම මුදල් උත්පාදන ඒකකයක් ලෙස සැලකේ.

අඛණ්ඩ මෙහෙයුම් වල හාණිකර අලාභ ලාභ හෝ අලාභ ප්‍රකාශයේදී හඳුනා ගැනේ.

පෙර හඳුනාගත් හාණිකරන අලාභය ආපසු හැරවිය හැක්කේ අවසන් වරට හඳුනාගත් හාණිකරන අලාභය හඳුනා ගත් දා සිට ආපසු අයකර ගත හැකි වත්කම් නිශ්චය කිරීම සඳහා භාවිතා කළ ඇස්තමේන්තු වල වෙනසක් සිදුවී ඇත්නම් පමණි.එය එසේ නම් වත්කම් වල ධාරණ අගය ආපසු අයකර ගත හැකි ප්‍රමාණය දක්වා වැඩි කෙරේ. එම වැඩි කළ මුදල කලින් වසර වල වත්කම් සඳහා වූ අඩුපාඩු පාඩු හඳුනා නොගත්තේ නම් අවප්‍රමාණය වීමේ ශුද්ධ අගය තීරණය කරන ලද ධාරණ අගයට වඩා වැඩි විය නොහැක. ලාභ හෝ පාඩු ප්‍රකාශ තුළ එවැනි ආපසු හැරවීමක් පිළිගැනේ.

### 2.6.10 කල්බදු

කොන්ත්‍රත්තුවක් අරම්භයේදී, මණ්ඩලය විසින් එම කොන්ත්‍රත්තුව හෝ එම කොන්ත්‍රත්තුව තුල කල්බදු ගිවිසුමක් තිබේ ද යන්න තක්සේරු කරයි. මූල්‍ය වටිනාකමකට හුවමාරුවක් වශයෙන් යම් කාලයක් සඳහා හඳුනාගත් වත්කමක භාවිතය පාලනය කිරීමේ අයිතිය යම් කොන්ත්‍රත්තුවක් මඟින් ලබා දෙන්නේ නම්ල එම කොන්ත්‍රාත්තුව කල් බද්දක් ලෙස හඳුනා ගැනේ. මෙසේ හඳුනාගත් වත්කමක් භාවිතය පාලනය කිරීමේ අයිතිය කොන්ත්‍රත්තුවක් හෝ එම කොන්ත්‍රාත්තුවෙහි අඩංගු කරුණු මඟින් ලබා දී ඇත් දැයි තක්සේරු කිරීම සඳහා මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි අර්ථ දැක්වීම භාවිතා කරයි.

#### 2.6.10.1 බදුකරු ලෙස සමූහය

කෙටි කාලීන කල්බදු සහ අඩු වටිනාකමින් යුත් කල්බදු වත්කම් හැර සෙසු කල්බදු සඳහා සමූහය තනි පිළිගැනීමක් සහ මිනුම් ප්‍රවේශයක් භාවිතා කරයි. භාවිතා කිරීමේ අයිතිය නියෝජනය කරන කල්බදු ගෙවීම් සහ භාවිතයේ අයිතිය පිළිබඳ වත්කම් මත සමූහය විසින් බදු වගකීම් හඳුනා ගනී.

#### භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම්

සමූහය විසින් භාවිතය සදහා හිමිකම් ඇති වත්කම් එවා ප්‍රයෝජනයට ගත හැකි විට හදුනා ගනී.

භාවිතයේ අයිතිය පිළිබඳ වත්කම් මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් හාණිකරණ අලාභ හා නැවත තක්සේරු කරන ලද බදු වගකීම් ගැලපීමෙන් පසුවවේ.ආරම්භයේ දීම භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම්, බදුකරුවන් විසින් ලබා දුන් යම් දිරිගැන්වීම් අඩු කිරීමෙන් පසු ආරම්භක කල් බදු වගකීම, ආරම්භක සෘජු පිරිවැය සහ වත්කම් නවීකරණය කිරීම සඳහා බැඳීම් වලින් සමන්විත වේ. භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම් කෙටි කාල සීමාවට හෝ පාදක වු වත්කමේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීව කාලයට සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.මෙම වත්කම් හාණිකරන පරීක්ෂවට යටත්වේ.

සමූහය සතු භාවිතය සදහා හිමිකම් ඇති වත්කම් දේපල පිරියත හා උපකරණ යටතේ ඇතුලත්වේ.

#### කල්බදු වගකීම්

කල්බදු ආරම්භ කරන දිනයේදී, කල්බදු කාලය තුළදී ගෙවිය යුතු සම්පූර්ණ ගෙවීම් වල වර්තමාන වටිනාකම අනුව සමූහය විසින් කල්බදු වගකීම් හදුනාගනු ඇත. කල්බදු ගෙවීම් වල වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී, කල්බදු ගිවිසුමේ ඇති පොලී අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නම්, කල්බදු ආරම්භක දිනයේ වර්ධක ණය ගැනීමේ අනුපාතය මණ්ඩලය භාවිතා කරයි. ආරම්භක දිනයට පසුව, පොලිය එකතු වීම පිළිබිඹු කිරීම සඳහා කල්බදු වගකීම් ප්‍රමාණය වැඩි කරන අතර බදු ගෙවීම් සඳහා ගෙවීම් අඩු කෙරේ. ඊට අමතරව, ස්ථාවර කල්බදු ගෙවීමේ ද්‍රවයේ වෙනසක් හෝ වත්කම් මිලදී ගැනීම සඳහා වූ තක්සේරුවේ වෙනසක් ඇත්නම් කල්බදු වගකීම් දරන ප්‍රමාණය නැවත මනිනු ලැබේ. සමූහයේ කල්බදු වගකීම් පොලී දරණ ණය සහ ණය ගැනීම් යටතේ ඇතුළත් වේ.

#### 2.6.10.2 සමූහය බදු කරු ලෙස - එල්ටීඑල්

#### මෙහෙයුම් කල්බදු

වත්කම් වල අයිතියේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් ප්‍රමාණවත් ලෙසින් නොපවරන ජලවිදුලි, වායු බල හා තාප බල බලාගාර වර්ග කරනුයේ මෙහෙයුම් කල්බදු වශයෙනි. සියලුම බලාගාර වලින් ලැබෙන ආදායම් බලශක්ති නිපැයුම මත ආදායම් ප්‍රකාශයේ පිළිගැනෙන්නේ බදු දුන් වත්කම් වලින් ඉපදෙන භාවිතයේ ප්‍රතිලාභ අඩු වන කාල රටාව වැඩියෙන් නියෝජනයවන කාල සීමාවේ බලශක්ති නිපැයුම මතය. බදු ආදායම ඉපයීමේදී දරන ලද ක්ෂයවීම් ඇතුලු පිරිවැය වියදමක් වශයෙන් පිළිගැනේ. ක්ෂයවීම යටත් බදු වත්කම් වල ක්ෂය වීමේ ප්‍රතිපත්තිය සමානවත්කම් සඳහා සමූහයේ ක්ෂය වීමේ ප්‍රතිපත්තියට ගැලපේ.

**මූල්‍ය කල්බදු**

පහත සඳහන් නිර්නායකයන්ගෙන් සෑහීමකට පත්වීම හේතුවෙන් සීමාසහිත රාජ් ලංකා විදුලිබල සමාගම හා බංග්ලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය සහ සීමාසහිත ලක්දනව් බංගලා පවර් සහ බංග්ලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය අතර ඇති විධිවිධාන IFRIC 4- එකඟවීමට කල්බදු ඇතුළත් ද යන්න තීරණය කිරීම සහ "ශ්‍රී.ගි.ප්‍ර - 16 කල්බදු" යටතේ කල්බදු ලෙස ගිණුම් ගැන කළ යුතුය යන විෂය පථයට අයත් බව සමූහයේ අදහසයි.

- විදුලිබල මිල දී ගැනීමේ ගිවිසුම යටතේ ඇති විධිවිධානය සපුරාලීම රඳා පවතින්නේ බංග්ලාදේශයේ හි පිහිටි සමූහයේ නිශ්චිත බලාගාරයේ සුවිශේෂී භාවිතය මතය.
- බලාගාරය ක්‍රියාත්මක කිරීමට හෝ බලාගාරයේ සමස්ත නිෂ්පාදනය පාලනය කරන අතරම එය තීරණය කරන ආකාරයට බලාගාරය ක්‍රියාත්මක කිරීම අන් අයට යොමු කිරීමට බංග්ලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලයට අයිතියක් ඇත.
- සමාගමේ විදුලි බලාගාරය මඟින් උත්පාදනය කරන ලද විදුලිබල නිමැවුම, බංග්ලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය හැර වෙනත් පාර්ශවයකට ලබාගත නොහැකි අතර බංග්ලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය විසින් ගෙවනු ලබන ඒකකයකට ධාරිතා ගාස්තුව නිමැවුම මත පදනම් නොවේ.

  සමූහයේ විදුලි බලාගාරයේ නෛතික හිමිකාරීත්වයට අනුපාතික සියලු අවදානම් සහ ප්‍රතිලාභ බංගලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය වෙත මාරු කර ඇති හෙයින් සී/ස රාජ් ලංකා සමාගම හා සීමාසහිත ලක්දනව් බංග්ලාපවර් සමාගම බදුකරු ලෙසත්, බංග්ලාදේශ බලශක්ති සංවර්ධන මණ්ඩලය බදුගන්නා ලෙසත් ශ්‍රී.ගි.ප්‍ර - 16 කල්බදු යටතේ මූල්‍ය කල්බදු ලෙස විධිවිධානය ගිණුම්ගත කෙරේ.

### 2.6.11 අස්පෘශ්‍ය වත්කම්

**හඳුනාගැනීමේ පදනම**

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා ඒමට ඉඩ තිබේ නම් සහ වත්කම් වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගනු ලැබේ.වෙන් වෙන් වශයෙන් අත්කර ගන්නා ලද අස්පෘශ්‍ය වත්කම් මුලින්ම හඳුනා ගනු ලබන අවස්ථාවේ පිරිවැය මත මැන දක්වයි. ව්‍යාපාර සංයෝජනයක අත්කර ගන්නා ලද අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය වනුයේ අත්කර ගන්නා දිනයේදී ඒවායේ පවත්නා සාධාරණ වටිනාකමය. මූලික හඳුනා ගැනීමෙන් පසු සමුච්චිත ක්‍රමක්ෂයක් හෝ සමුච්චිත හානිකරණයක් වෙතොත් අදාළ පරිදි පාඩු අඩු කර අස්පෘශ්‍ය වත්කම් පිරිවැය ඉදිරියට ගෙනයනු ලැබේ. ප්‍රාග්ධනිත කළ සංවර්ධන පිරිවැය හැර අභ්‍යන්තරිකව ජනනය කළ අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනිත නොකරන අතර වියදම දරන ලද වසරේ ආදායම් ප්‍රකාශයේ අදාළ වියදම පිළිඹිබුවේ.

**ක්‍රමක්ෂය/හාණිකරණය**

අස්පෘශ්‍ය වත්කම් වල සඵල ආයුකාලය තක්සේරු කරනුයේ පරිමිත හෝ අපිරිමිත වශයෙනි.

පරිමිත ජීවකාලයක් තිබෙන අස්පෘශ්‍ය වත්කම් ඒවායේ සඵල ආර්ථික ආයුකාලය ඔස්සේ ක්‍රමක්ෂය කරන අතර අස්පෘශ්‍ය වත්කම් හානියට ලක් විය හැකිබවට සංඥාවක් ලැබෙන සෑම අවස්ථාවකදීම හානිවූ ලෙස තක්සේරු කෙරේ. පරිමිත ජීවකාලයක් තිබෙන අස්පෘශ්‍ය වත්කමක් සඳහා වූ ක්‍රමක්ෂය ක්‍රමවේදය හා ක්‍රමක්ෂය කාලසීමාව අවම වශයෙන් වාර්තා කරන සෑම කාලසීමාවකදීම සමාලෝචනය කෙරේ. අපේක්ෂිත සඵල ජීව කාලයේ වෙනස් වීම් හෝ වත්කමෙහි ඇතුළත්ව තිබෙන අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනයේ අපේක්ෂිත රටාව ගිණුම් ගත කරනුයේ අදාළ පරිදි ක්‍රමක්ෂය ක්‍රමවේදය හෝ ක්‍රමක්ෂය කාලසීමාව වෙනස් කිරීමෙන් වන අතර ගිණුම් ඇස්තමේන්තු වල වෙනස්වීම් වශයෙන් සලකනු ලැබේ. සීමිත ආයු කාලයක් තිබෙන අස්පෘශ්‍ය වත්කම් වල ක්‍රමක්ෂය වියදම් ආදායම් ප්‍රකාශයෙන් හඳුනා ගනු ලබන්නේ අස්පෘශ්‍ය වත්කම් වල කාර්ය භාරයට අනුකූල වියදම් ප්‍රභේදයන් යටතේය.

**මණ්ඩලය**

වසර 5 ක ප්‍රයෝජනවත් ජීව කාලයක් සඳහා මෘදුකාංග ක්‍රමක්ෂය කර ඇති අතර බලපත්‍රය සඳහා ගිවිසුම් තුළ නියම කර ඇති ප්‍රයෝජනවත් ආයු කාලය අනුව ක්‍රමක්ෂය කරනු ලැබේ.

**එල්ටීඑල් හොල්ඩින්ග්ස් (පුද්) සමාගම**

පරිගණක මෘදුකාංග අත්පත් කර ගත් හා සංවර්ධනය කළ දින සිට වසර 4 ක් වැනි කාලයක් තුළදී ක්‍රමක්ෂය කර ඇත.

**ලංකා විදුලි (පුද්) සමාගම**

පරිගණක මෘදුකාංග බලපත්‍ර වසර 5 ක ප්‍රයෝජනවත් ආයු කාලය තුළ ක්‍රමක්ෂය කර ඇත.

තාක්ෂණික දැනුම ගිවිසුම් කාලය වන වසර 15 දක්වා ක්‍රමක්ෂය කර ඇත. අසීමිත සඵල ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය නොකෙරෙන අතර තනි තනි ව හෝ මුදල් ජනනය කරන ඒකකයේ මට්ටමින් හානි කරණය සඳහා වාර්ෂිකව පරීක්ෂාවට ලක් කරනු ලැබේ. අසීමිත ජීවිත කාලය තක්සේරු කිරීම වාර්ෂිකව සමාලෝචනය කෙරෙනුයේ අසීමිත ජීව කාලය උපකාරී ලෙස අඛණ්ඩව පවතීදැයි යන්න තීරණය කිරීමටයි. එසේ නොමැතිනම් ජීවකාලය අසීමිත සිට පරිමිත අවස්ථාව දක්වා අනාගතය සඳහා බලපවත්න පරිදි වෙනස් කෙරේ.

**හඳුනාගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් පොත් වලින් ලියා හැරීම**

අස්පෘශ්‍ය වත්කමක් පිළිගැනීම තුළින් පැන නගින ලාභ හෝ පාඩු මනින්නේ බැහැර කිරීමේ ශුද්ධ ලැබීම් හා වත්කම් වල ඉදිරියට ගෙනයන ප්‍රමාණය අතර වෙනස වශයෙන් වන අතර වත්කම පිළිගැනීමෙන් බැහැර කළ විට එය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනු ලැබේ.

### 2.6.12. මූල්‍ය වත්කම් හා වගකීම්

### 2.6.12.1 මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම් මූලික හඳුනා ගැනීම හා මිනුම්කරණය

මුලික වශයෙන් හඳුනාගැනීමේ දී, මූල්‍ය වත්කම් එහි ක්‍රමක්ෂය පිරිවැය, අනෙකුත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකම (FVOCI), හෝ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම (FVPL) ආදී වටිනාකම් මත වර්ගීකරණය කෙරේ.

මූල්‍ය වත්කමක් (එය සැළකිය යුතු මූල්‍ය සංරචකයක් නොමැතිව වෙළඳ ලැබිය යුතු නම්) හෝ මූල්‍ය වගකීම් මුලින් මනිනු ලබන්නේ සාධාරණ වටිනාකමින්, එය අත්පත් කර ගැනීම හෝ නිකුතුව සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වියදම් එක්වූ පසු ගනුදෙනු පිරිවැය වේ.

සැළකිය යුතු මූල්‍ය සංරචකයක් නොමැතිව ලැබිය යුතු වෙළඳ ණයක් මුලින් මනිනු ලබන්නේ ගනුදෙනු මිලෙනි.

### පසුකාලීන මිනුම්කරණය

- පසු කාලීන මිණුම්කරනය සඳහා මූල්‍ය වත්කම් කාණ්ඩ හතරකට වර්ගීකරණය කර ඇත;
- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්(ණය උපකරණ)
- සමුච්චිත ලාභ හා පාඩු ප්‍රතිචක්‍රීකරණය කිරීමත් සමඟ විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම හඳුනාගනු ලබන මූල්‍ය වත්කම් (ණය උපකරණ)

### ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්(ණය උපකරණ)

පහත සඳහන් කොන්දේසි සපුරාලන්නේ නම් සමාගම මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනු ලබයි:

- කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහ රැස්කර ගැනීම සඳහා මූල්‍ය වත්කම් තබා ගැනීමේ අරමුණ ඇතිව මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇති විට

සහ

- මූල්‍ය වත්කම් වල ගිවිසුම් කොන්දේසි නිශ්චිත දිනයන්හිදී මුදල් ගලා ඒමට හේතු වන අතර එය හුදෙක්ම හිඟ මුදලෙහි පොළිය සහ වාරිකය වීම

ක්‍රමක්ෂය පිරිවැයට මිණුම්කර ඇති මූල්‍ය වත්කම් ඵලදායී පොලී අනුපාත (ඊඅයිආර්) ක්‍රමය උපයෝගී කරගනිමින් පසුව මනිනු ලබන අතර එය හානිකර පරීක්ෂාවන්ට යටත්වේ. වත්කම් හඳුනා නොගත් විට, වෙනස් කළ විට හෝ හානිකරණයට ලක්වූ විට ලාභ හෝ අලාභය ලාභය හා පාඩු ප්‍රකාශනයට හඳුනා ගැනේ.

සමූහයේ ක්‍රමක්ෂය පිරිවැයට මිණුම්කර ඇති මූල්‍ය වත්කම් සඳහා වෙළඳ ලැබීම්, සේවකයින්ට ණය, සම්බන්ධිත පාර්ශවයන්ට ණය සහ වෙනත් මූල්‍ය වත්කම් යටතේ ඇතුළත් අනෙකුත් ආයෝජන ඇතුළත් වේ.

### විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම හඳුනාගනු ලබන මූල්‍ය වත්කම් (ණය උපකරණ)

පහත සඳහන් කොන්දේසි සපුරාලන්නේ නම් සමාගම මූල්‍ය වත්කම් විස්තීර්ණ අදායම හරහා සාධාරණ වටිනාකම හඳුනාගනු ලබයි:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම යන අරමුණු දෙක සහිතව මූල්‍ය වත්කම් ව්‍යාපාර ආකෘතියක් තුළ තබා ඇති විට

සහ

- මූල්‍ය වත්කම් වල ගිවිසුම් කොන්දේසි නිශ්චිත දිනයන්හිදී මුදල් ගලා ඒමට හේතු වන අතර එය හුදෙක්ම හිඟ මුදලෙහි පොළිය සහ වාරිකය වීම

විස්තීරණ අදායම හරහා සාධාරණ වටිනාකම හඳුනාගනු ලබන ණය උපකරණ සඳහා පොළී ආදායම, විදේශ විනිමය නැවත ඇගයීම සහ හානිකරණ පාඩු හෝ ආපසු හැරවීම් ලාභ හෝ අලාභය ප්‍රකාශනයට හඳුනාගනු ලබන අතර මිණුම්කරණය ක්‍රමක්ෂය පිරිවැයට අගය කළ මූල්‍ය වත්කම් සඳහා සිදුකරන ආකාරයට සිදුකරනු ලබයි.ඉතිරි සාධාරණ අගයන් වෙනස්වීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ. ආපසු හැරවීමේදී, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් සමුච්චිත සාධාරණ අගය වෙනස් වීම ලාභයට හෝ අලාභයට ප්‍රකාශයට ගැලපුම් කෙරේ.

### විස්තීර්ණ අදායම හරහා සාධාරණ වටිනාකම හඳුනාගනු ලබන මූල්‍ය වත්කම් (කොටස් උපකරණ)

මූලික හඳුනාගැනීමෙන් පසු, SLFRS - 3 යටතේ වෙළඳාම සඳහා හෝ අසම්භාව්‍ය සලකා බැලීම් ලෙස සිය ආයෝජන වර්ගීකරණය කිරීමට සමූහයට තෝරා ගත හැකිය. මෙහිදී ණය උපකරණයෙන් උපකරණය පදනම මත මෙම වර්ගීකරණය තීරණය වේ.

මෙම මූල්‍ය වත්කම් වල ලාභ හා පාඩු කිසි විටෙක ලාභ හෝ අලාභය ප්‍රකාශයට ප්‍රතිචක්‍රීකරණය නොකෙරේ. මූල්‍ය වත්කම් වල පිරිවැයෙන් කොටසක් නැවත අය කර ගැනීමක් ලෙස සමූහයේ ප්‍රතිලාභ ලැබෙන විට හැර, ගෙවීමේ අයිතිය තහවුරු වූ විට ලාභාංශ අලාභ ප්‍රකාශයේ ලාභාංශ වෙනත් ආදායමක් ලෙස හඳුනා ගනු ලබන අතර, පෙර කී ලැබීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනී. එසේම මෙම මූල්‍ය වත්කම් හානිකරණ පරීක්ෂාවන් සඳහාද යටත් නොවේ.

### මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය

මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා සමූහය සිය ව්‍යාපාර ආකෘතිය වෙනස් කළ විට පමණක් සමූහය සිය මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරනු ලැබේ. සමූහය විසින් ක්‍රමක්ෂය පිරිවැයට අගය කල මූල්‍ය වත්කම්, සාධාරණ අගය විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළින් ගළපන හෝ සාධාරණ අගය ලාභයෙන් හෝ අලාභයෙන් ගළපනු ලැබූ මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කරන්නේ නම්, නැවත වර්ගීකරණය කරන ලද දිනයේ සිට ඉදිරියට ගැළපුම් කිරීම සිදු කරයි. සමූහය කලින් හඳුනාගත් කිසිදු ලාභයක්, අලාභයක් (හානිකරන ලාභයක් හෝ අලාභයක් ඇතුළුව) හෝ පොළිය නැවත ලබා නිවැරදි නොකරයි.

සමූහය විසින් ක්‍රමක්ෂය පිරිවැය මිනුම් කාණ්ඩයෙන් සාධාරණ අගය ලාභඅලාභ ගිණුම තුලින් ගළපනු ලබන මිණුම් කාණ්ඩය වෙත නැවත වර්ගීකරණය කරන්නේ නම්, එහි සාධාරණ අගය නැවත වර්ගීකරණය කරන ලද දිනයේදී මනිනු ලැබේ. මෙම මූල්‍යමය වත්කම් වල සාධාරණ අගයන්වල සහ කලින් හඳුනාගත් ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනසකින් මතුවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් ලාභ හෝ

අලාභ ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

සමූහය විසින් ක්‍රමක්ෂය පිරිවැය මිනුම් කාණ්ඩයෙන් විස්තීර්ණ ආදායම තුලින් සාධාරණ අගය ගලපනු ලබන මිණුම් කාණ්ඩය වෙත නැවත වර්ගීකරණය කරන්නේ නම්, එහි සාධාරණ අගය නැවත වර්ගීකරණය කරන ලද දිනයේදී මනිනු ලැබේ. මෙම මූල්‍ය වත්කම් වල සාධාරණ අගයන්වල සහ කලින් හදුනාගත් ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනසකින් මතුවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හදුනාගනු ලැබේ. නැවත වර්ගීකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සඵල පොලී අනුපාතය සහ අපේක්ෂිත ණය පාඩු සඳහා ගැලපීම් සිදු නොකෙරේ.

සමූහය විසින් විස්තීර්ණ ආදායම තුලින් සාධාරණ අගය ගලපනු ලබන මිණුම් කාණ්ඩයෙන් ක්‍රමක්ෂය පිරිවැය මිනුම් කාණ්ඩය වෙත නැවත වර්ගීකරණය කරන්නේ නම්, එහි සාධාරණ අගය නැවත වර්ගීකරණය කරන ලද දිනයේදී මනිනු ලැබේ. කෙසේ වෙතත්, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට කලින් හඳුනාගෙන තිබූ සමුච්චිත ලාභ හෝ අලාභය විස්තීරණ ආදායම් ප්‍රකාශයෙන් ඉවත්කර නැවත වර්ගීකරණය කරන දිනයේදී මූල්‍ය වත්කමේ සාධාරණ අගය ගැලපුම් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කළ දිනයේදී මනිනු ලබන්නේ එය සැම විටම ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කල ආකාරයෙනි. මෙම ගැලපීම අනෙකුත් විස්තීර්ණ ආදායමට බලපාන නමුත් ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැති බැවින් එය නැවත වර්ගීකරණය කිරීමක් ලෙස නොසැලකේ. නැවත වර්ගීකරණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සඵල පොලී අනුපාතය සහ අපේක්ෂිත ණය පාඩු සඳහා ගැලපීම් සිදු නොකෙරේ.

සමූහය විසින් විස්තීර්ණ ආදායම තුලින් සාධාරණ අගය ගලපනු ලබන මිණුම් කාණ්ඩයෙන් ලාභ අලාභ තුලින් සාධාරණ අගය ගලපනු ලබන මිනුම් කාණ්ඩය වෙත නැවත වර්ගීකරණය කරන්නේ නම්, සාධාරණ අගය මත මූල්‍ය වත්කම් මැනීම අඛණ්ඩව සිදු කෙරේ. අනෙකුත් විස්තීර්ණ ආදායම් වලදී කලින් හඳුනාගෙන තිබූ සමුච්චිත ලාභ හෝ අලාභය නැවත වර්ගීකරණය කරන දිනයේදී නැවත වර්ගීකරණය කිරීමේ ගැලපීමක් ලෙස ස්කන්ධයෙන් ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කෙරේ.

**ආ) බැහැර කිරීම**

හඳුනා ගත් මූල්‍ය වත්කමක් (හෝ අදාළ පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) පොත් පත් වලින් ඉවත් කරනුයේ පහත අවස්ථාවලදීය:

i) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය අවසන් වීම

ii) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ සිය අයිතිය සමූහය විසින් මාරුකර තිබෙන විට හෝ පරික්‍රමණ වැඩ පිළිවෙලක් මත තෙවන පාර්ශ්වයකට ලැබී ඇති මුදල් ප්‍රවාහ සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන් ගෙවීමට වගකීමක් භාර ගෙන තිබෙන විට සහ පහත කරුණු දෙකෙන් එකක්:

අ) වත්කමේ සියලුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් හරවත් ලෙස මාරු කර තිබෙන විට හෝ

(ආ) සමූහය විසින් වත්කමේ අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස මාරු කිරීමක් හෝ තබා ගැනීමක් නොකර වත්කමේ පාලනය මාරු කර තිබෙන විට

වත්කමකින් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ සිය අයිතිය සමූහය විසින් පවරා තිබෙන විට හෝ පරික්‍රමණ වැඩ පිළිවෙලකට එළඹ තිබෙනවිට හා වත්කමේ අවදානම් හා ප්‍රතිලාභ ප්‍රමාණවත් ලෙස මාරු කිරීමක් හෝ රඳවා ගැනීමක් නොකර වත්කමේ පාලනය ද මාරු කර නොතිබෙන විට ඒ ගැන සමාගම පවත්වා ගෙනයන අඛණ්ඩ සම්බන්ධයේ ප්‍රමාණය දක්වා වත්කම හඳුනා ගැනේ. එවැනි අවස්ථාවකදී සමූහය විසින් ආශ්‍රිත බැඳියාවක්ද හඳුනා ගනී. මාරු කරන ලද වත්කම් හා ආශ්‍රිත බැඳියාව සමූහය විසින් රඳවා ගෙන තිබෙන අයිතිවාසිකම් හා වගකීම් පිළිඹිබු වන පදනමක් මත මනිනු ලැබේ.

ඇප ප්‍රතිඥාවක ස්වභාවයක් ගන්නා මාරු කරන ලද වත්කම කෙරෙහි වූ අඛණ්ඩ සහභාගීත්වය මනිනුයේ වත්කමේ මුල්ධාරණ අගයත් සමූහයට ගෙවීමට නියමිත විය හැකි උපරිම මුදලත් යන දෙකෙන් අඩු අගයටය.

**2.6.12.2 මූල්‍ය වත්කම් හානිකරණය**

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී තිබෙන බවට යම් විෂය බද්ධ සාක්ෂියක් තිබෙන බවට වාර්තා කරන සෑම දිනයකදීම සමූහය විසින් එම වත්කම් අගැයීමට ලක් කෙරේ.

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණයවී තිබෙන බවට සළකනු ලබන්නේ වත්කමක් මූලික හඳුනා ගැනීමෙන් පසු ඇති වූ සිද්ධියක හෝ සිද්ධි කීපයක ප්‍රතිඵලයක් වශයෙන් (දරණ ලද පාඩු සිද්ධියක්) වන අතර එම පාඩු සිද්ධිය මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ට විශ්වාසයෙන් ඇස්තමේන්තු කළ හැකි බලපෑමක් ඇති කළ විටය. පාඩු සිද්ධියෙන් ඇති කරන වත්කමක් මූලික හඳුනා ගැනීමෙන් පසු හානිකරණය වන බවට යම් විෂය බද්ධ සාක්ෂියක් තිබේ නම් පමණි. ණය කරුවන් හෝ ණය කරුවන් සමූහයක් සැළකිය යුතු අන්දමින් මුදල් දුෂ්කරතා, ණය නොගෙවීම් හෝ පොළිය හෝ ප්‍රාග්ධන ගෙවීම් වල දී අදාළ පැහැර හැරීම් අත්විඳින බවට ඇඟවීම්, ඔවුන්ව ස්තූහංගත්වයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයකට ප්‍රවේශ වීමේ භව්‍යතාවයක් සහ ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ මැනිය හැකි අඩුවීමක් ඇති වීම සහ නිරීක්ෂණය කළ හැකි දත්ත වලින් පෙන්වීම ද (එනම් හිඟවීම් වල වෙනස්වීම් හෝ ආර්ථික තත්වයන්ගේ වෙනස්වීම් අතපසුවීම් සමග සම්බන්ධතාවක් ඇති බව) හානිකරන සාක්ෂි වලට අයත් විය හැකිය.

සමූහය විසින් ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය ගලපන උපකරණ හැර අනෙකුත් සියලුම ණය උපකරණ සඳහා අපේක්ෂිත ණය අලාභ (ECL) සඳහා දීමනාවක් හඳුනාගනී. ණය අලාභ සඳහා පදනම් වී ඇත්තේ කොන්ත්‍රාත්තුවට අනුකූලව ගෙවිය යුතු කොන්ත්‍රාත් මුදල් ප්‍රවාහයන් සහ සමූහය ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහයන්හි වෙනස මූලික ඵලදායි පොලී අනුපාතයට වට්ටම් කිරීමෙනි. අපේක්ෂිත මුදල් ප්‍රවාහයට කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුකූලව සිදුවන ණය වැඩිදියුණු කිරීම් හෝ ඇප තැන්පතු විකිණීමෙන් ලැබෙන මුදල් ප්‍රවාහයන් ඇතුළත් වේ.

අපේක්ෂිත ණය අලාභ අවස්ථා දෙකකදී හඳුනා ගැනේ

මූලික හඳුනාගැනීමෙන් පසු ණය අවදානමේ සැළකිය යුතු වර්ධනයක් සිදු නොවූ ණය සඳහා, අපේක්ෂිත ණය අලාභය ලබා දෙනුයේ ඉදිරි මාස 12 තුළදී (මාස 12 ක ඊසීඑල්) සිදුවිය හැකි පැහැර හැරීම් හේතුවෙන් සිදුවන ණය අලාභ සඳහා ය.

මූලික හඳුනාගැනීමෙන් පසු ණය අවදානම සැළකිය යුතු ලෙස වැඩි වී ඇති ණය සඳහා, ගෙවීම් පැහැර හැරීමේ කාලය නොසළකා, ඉතිරි නිරාවරණ කාලය සඳහා අපේක්ෂිත ණය අලාභ සඳහා අලාභ දීමනාවක් අවශ්‍ය වේ.

වෙළඳ ලැබීම් සහ කොන්ත්‍රාත් වත්කම් සඳහා සමූහය අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී සරල ක්‍රමය අනුගමනය කරයි. එම නිසා සමූහය ණය අවදානමේ වෙනස්කම් නිරීක්ෂණය නොකරන අතර ඒ වෙනුවට එක් එක් වාර්තාකරණ දිනයේදී ජීවිත කාලය පුරාම අපේක්ෂිත ණය අලාභ මත පදනම් වූ අලාභ දීමනාවක් හඳුනා ගනී. සමූහය විසින් ඓතිහාසික ණය අලාභ අත්දැකීම සඳහා ආර්ථික පරිසරය සම්බන්ධ ඉදිරි සාධක ගලපන ලද ප්‍රතිපාදන ආකෘතියක් ස්ථාපිත කර ඇත.

### 2.6.12.3 මූල්‍ය බැරකම්

#### මූලික හඳුනා ගැනීම හා මිනුම්කරණය

SLFRS 9 හි විෂය පථය තුළ මූල්‍ය වගකීම් වල වර්ග කිරීම සමූහය විසින් තීරණය කරණු ලබන්නේ මුල් හඳුනා ගැනීමේදීය.

සියලුම මූල්‍ය බැරකම් මුලදී හඳුනා ගනු ලබන්නේ සාධාරණ අගය මත වන අතර, ණය හා අතමාරු සහ වෙනත් මූල්‍ය බැරකම් වලට අදාළව ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගනී. සෘජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මෙහි අඩංගුය.

#### පසුකාලීන මිනුම්කරණය

පහත දැක්වෙන පරිදි මූල්‍ය බැරකම්වල මිනුම් රඳා පවතිනුයේ වර්ග කිරීම මතය.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය ගලපන ලෙස වර්ගීකරණය කර ඇති මූල්‍ය වගකීම් පසුව සාධාරණ අගයකින් මනිනු ලබන අතර, ''වෙනත් වගකීම්'' ලෙස වර්ගීකරණය කරන ලද මූල්‍ය වගකීම් පසුව ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ඇත.

#### බැහැර කිරීම

මූල්‍ය බැරකමක් පොත්පත් වලින් ඉවත් කරනුයේ අදාළ වගකීම යටතේවූ බැඳීම ඉටු කළ විට හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විටය.

### 2.6.12.4 මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනුයේ හඳුනා ගත් වටිනාකම් දැනට බලාත්මක නීතිමය අයිතියක් හා ශුද්ධ පදනමක් මත වත්කම් උපලබ්ධි කර බැරකම් පියවීම සමගාමීව සිදු කිරීමෙන් ශුද්ධ වටිනාකම පියවීමේ අභිප්‍රායක් තිබෙන විට පමණි.

### 2.6.12.5 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

සමූහය විසින් සෑම වාර්තාකරන දිනයකදීම ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය ගලපන මූල්‍ය වත්කම් හා විකිණීමට ඇති මූල්‍ය වත්කම් මිණුම් කරනය සිදුකරනු ලබයි

සාධාරණ අගය වනුයේ මිණුම්කරන දිනයේදී වෙළෙඳපොළ සහභාගීවන්නන් අතර විධිමත් ගනුදෙනුවක දී වත්කමක් විකිණීමෙන් ලැබෙන හෝ වගකීමක් පැවරීමට ගෙවනු ලබන මිලයි.

සාධාරණ අගය මැනීම පදනම් වන්නේ වත්කම් විකිණීමේ හෝ වගකීම පැවරීමේ ගනුදෙනුව

- වත්කම් හෝ වගකීම් සඳහා ප්‍රධාන වෙළඳපොලකදී
- ප්‍රධාන වෙළඳපොලක් නොමැති විට, වත්කම් හෝ වගකීම් සඳහා වඩාත්ම වාසිදායක වෙළඳපොලේදී සිදුවන බවට ඇති උපකල්පනය මතය.

වත්කම් හෝ වගකීම් වල සාධාරණ අගය මනිනු ලබන්නේ වෙළෙඳපොළ සහභාගි වන්නන් තම ආර්ථික යහපත සඳහා ක්‍රියාකරන බව උපකල්පනය කරමින් වත්කම් හෝ වගකීම් මිල නියම කිරීමේදී වෙළෙඳපොළ සහභාගීවන්නන් භාවිතා කරන උපකල්පන උපයෝගී කරගනිමිනි.

අදාළ තත්ත්වයනට ගැලපෙන සහ සාධාරණ අගය මැනීම සඳහා ප්‍රමාණවත් දත්ත ලබා ගත හැකි, අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදීම් උපරිම ලෙස භාවිතා කිරීම සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදීම් භාවිතය අවම කිරීම සඳහා තක්සේරු කිරීමේ ක්‍රම සමූහය භාවිතා කරයි.

සමස්තයක් වශයෙන් සාධාරණ අගය මිණුම්කරණය සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව, මූල්‍ය ප්‍රකාශන වල සාධාරණ අගය මත ගිණුම්කරණය කර ඉදිරිපත් කරන සියලුම වත්කම් හා වගකීම් පහත සඳහන් පරිදි සාධාරණ වටිනාකම් ධූරාවලියකට අනුව වර්ගීකරණය කෙරේ.

| | |
|---|---|
| 1 වන මට්ටම | සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රීය ව නියමවූ වෙළඳපොලේ මිල ගණන් (වෙනස්කම් සිදු නොකළ) |
| 2 වන මට්ටම | සාධාරණ අගය මැනීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් සෘජුව හෝ වක්‍රව නිරීක්ෂණය කළ හැකි තක්සේරු කිරීමේ ක්‍රම |
| 3 වන මට්ටම | සාධාරණ අගය මැනීමේදී සැළකිය යුතු අවම මට්ටමේ යෙදවුම් නිරීක්ෂණය කළ නොහැක තක්සේරු කිරීමේ ක්‍රම. |

සමූහය විසින් එක් එක් වාර්තාකරණ කාලය අවසානයේදී. පුනරාවර්තන පදනමින් මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගන්නා වත්කම් හා වගකීම්, ධූරාවලියේ මට්ටම් අතර ස්ථාන මාරුවීම් සිදුවී ඇත්ද යන්න වර්ගීකරණය නැවත තක්සේරු කිරීමෙන් තීරණය කරනු ලබයි. (සාධාරණ අගය මැනීමට සැළකිය යුතු අවම මට්ටමේ යෙදවුම් සමස්තයක් ලෙස පදනම් කර)

වෙනත් විස්තීර්ණ ආදායම තුළින් මනිනු ලබන මිල නියම නොකළ මූල්‍ය වත්කම් වැනි පුනරාවර්තන සාධාරණ අගයන් මැනීම සඳහා වූ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සමූහයේ කළමනාකරණය විසින් තීරණය කරනු ලැබේ.

සාධාරණ වටිනාකම් හෙළිදරව් කිරීම් සඳහා, සමූහයේ වත්කම් හා වගකීම් කාණ්ඩයන්, වත්කම් හෝ වගකීම් වල ස්වභාවය, ලක්ෂණ සහ අවදානම් සහ ඉහත විස්තර කර ඇති සාධාරණ වටිනාකම් ධූරාවලියේ මට්ටම අනුව තීරණය කර ඇත.

### 2.6.13 ප්‍රතිපාදන

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් සමූහයට ප්‍රවර්තන බැඳීම් (නීතිමය හෝ සමප්‍රයුක්තව) තිබෙන විට ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරන සම්පත් පිටතට ගලායාමේ සම්භාවිතාවක් පවතී නම් සහ බැඳියාවට අදාළ මුදල් ගැන විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් සකස් කළ හැකි වන්නේ නම් ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. මුදලේ කාලීන අගයේ බලපෑම ප්‍රමාණවත් වන්නේ නම් මුදලේ කාලීන අගයේ බලපෑම සහ උචිත පරිදි බැඳියාවට විශේෂිත වූ ආදායම පිළිබිඹු වන අයුරින් බදු ගෙවීමට පෙර අනුපාතයන් මත අනාගතයේදී අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් වට්ටම් කර ප්‍රතිපාදන නියම කරනු ලැබේ. වට්ටම් කිරීම භාවිතා කිරීමේ දී කාලයත් සමග ප්‍රතිපාදනයේ වන වැඩිවීම් මූල්‍ය පිරිවැය වශයෙන් හඳුනා ගනු ලැබේ.

### 2.6.14 විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාවන්

සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාධක එකක් හෝ එයට වැඩි ගණනක් මත සාමාන්‍යයෙන් සේවකයෙකු හට විශ්‍රාම ගැනීමේදී ලැබෙන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ප්‍රමාණය, තීරණය කරයි.

#### අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම වැටුප් බැඳියාව

සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාධක එකක් හෝ එකට වැඩි ගණනක් මත සාමාන්‍යයෙන් සේවකයෙකු හට විශ්‍රාම ගැනීමේදී ලැබෙන විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ප්‍රමාණය, තීරණය කරයි.

ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලැස්ම සම්බන්ධයෙන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ පිළිගෙන තිබෙන බැරකම වන්නේ, සැලසුම් කළ වත්කම් වල සාධාරණ අගය අඩු කර, පිළිනොගත් පැරණි සේවා පිරිවැය වෙනුවෙන් ගැලපීම් සහිතව, වාර්තා කරනු ලබන කාල සීමාව අවසානයේ තිබුණු අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැරකමේ වත්මන් අගයයි. ස්වාධීන අයුගණකයින් විසින් ප්‍රක්ෂිප්ත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් අර්ථ දැක් වූ ප්‍රතිලාභ බැරකම වාර්ෂිකව ගණනය කරති. අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැරකමේ වත්මන් අගය තීරණය වන්නේ ඉහල ප්‍රමිති ව්‍යාප්ත සංයුක්ත බැඳුම් කර වෙළඳපලක් ශ්‍රී ලංකාවේ නොමැති නිසා, ඇස්තමේන්තු කළ අනාගත මුදල් පිටත ප්‍රවාහ රජයේ බැඳුම්කර වල පොලී අනුපාතය යොදා ගනිමින් වට්ටම් කිරීමෙනි. රජයේ බැඳුම් කර නාමනය කෙරෙණුයේ අදාළ විශ්‍රාම වැටුප් බැරකමේ නියමයන්ට සමාන වන පරිදි කල්පිරිය යුතු ප්‍රතිලාභ ගෙවනු ලබන්නා වූ ව්‍යවහාර මුදල් වලිනි.

ආයුගණක ලාභ හා පාඩු, ඒවා පැන නගින අවස්ථාවේදී වෙනත් විස්තීර්ණ ආදායම් වල ක්ෂණිකව හදුනාගැනේ.

නිශ්චිත කාල සීමාවක් (පැවරුම් කාල සීමාව) තුළ සේවයේ යෙදී සිටින සේවකයින්ට විශ්‍රාම වැටුප් සැලැස්මේ වෙනස්වීම් කොන්දේසි සහගත නොවන්නේ නම්, අතීත සේවා පිරිවැය ආදායම් ප්‍රකාශනයට වහාම හඳුනා ගැනේ. මෙම අවස්ථාවේදී, අතීත සේවා පිරිවැය පැවරුම් කාලය ඔස්සේ සරල රේඛා පදනමක් මත ක්‍රමක්ෂය කරනු ලැබේ.

#### අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

සේවා කාලය හා පාරිශ්‍රමිකය වැනි සාධක එකක් හෝ එයට වැඩි ගණනක් මත සාමාන්‍යයෙන් රඳා පවතින, සේවකයෙකු හට විශ්‍රාම ගැනීමේදී ලැබෙන ප්‍රතිලාභ ගණන අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය මගින් අර්ථ නිරූපණය කෙරෙයි. අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම සමන්විත වන්නේ 1983 අංක 12 දරණ පණතෙන් ප්‍රතිපාදිත පාරිතෝෂිකයෙනි. පාරිතෝෂිකය සඳහා ප්‍රතිඥා දී ඇති විශ්‍රාම ප්‍රතිලාභයන්හි ප්‍රවර්තන අගය සමූහය විසින් මනිනු ලබන අතර එම අගය ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය(PUB) මත පාදක වූ ආයු ගණක තක්සේරු ක්‍රමවේදය භාවිතයට ගනිමින් අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්මකි. ආයු ගණක ලාභ හා අලාභ ඒවා සිදුවන කාලසීමාවට අදාළව ආදායම් ප්‍රකාශනයේ සම්පූර්ණයෙන්ම හඳුනා ගනු ලැබේ. පාරිතෝෂික බැදියාව සඳහා අරමුදල් බාහිරව ලබා නොගැනේ. මෙම අයිතමය ශේෂ පත්‍රයේ අනෙකුත් අර්ථ දැක්වූ ප්‍රතිලාභ වගකීම් යටතේ වර්ග කෙරේ.

#### අර්ථ දැක්වූ දායකත්ව සැලැසුම් - සේවක අර්ථ සාධක අරමුදල හා සේවානියුක්ත භාර අරමුදල

අදාල නීති හා රෙගුලාසි ප්‍රකාර සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය හා සේවක භාරකාර අරමුදලේ දායකත්වය ලැබීමට සේවකයෝ සුදුසුකම් ලබති. ලංකා විදුලි බල මණ්ඩලය් සේවකයින්ගේ දළ වැටුපෙන් 15% ක් ලංකා විදුලිබල මණ්ඩල අර්ථ සාධක අරමුදලට දායකත්වය ලබා දෙන ලංකා විදුලිබල මණ්ඩලය හැර, සේවකයින්ගේ දළ වැටුපෙන් පිළිවෙලින් 12% ක් හා 3% ක් සමූහය විසින් අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්ති භාරකාර අරමුදලට දායකවේ.

**2.6.15 ස්වයං රක්ෂණ සංචිතය**

සෑම වසරකදීම වසර අවසානයේ දළ වශයෙන් නැවත තක්සේරු කළ ස්ථාවර වත්කම් වලින් 0.1% ක් ලංකා විදුලි බල මණ්ඩලය විසින් ස්වයං රක්ෂණ සංචිතයකට මාරු කරයි. ලංකා විදුලිබල මණ්ඩලය දේපල, පිරියත හා උපකරණ වල පාඩු හා හානි රක්ෂණ සංචිතයට භර කෙරේ. මෙම කාර්යය සඳහා අරමුදල් සපුරා ගන්නේ බැංකුවක වෙනම ගිණුමක ආයෝජනය කර තිබෙන මුදල් වලිනි.

**2.2.16 රජයේ ප්‍රදාන**

රජයේ ප්‍රදාන මූලික වශයෙන්ම සාධාරණ අගයට හඳුනා ගැනෙන අතර, එකී ප්‍රධාන ලැබෙනු ඇති බවට සාධාරණව තහවුරු කොට ඇති විටක, එකී ප්‍රදාන ආශ්‍රිත කොන්දේසි වලට සමාගම අනුගතවනු ඇත. සමූහය විසින් දරන ලද වියදම් සඳහා වන්දියක් වශයෙන් එකී ප්‍රදාන ලැබෙන අවස්ථාවක ලාභ අලාභ ප්‍රකාශයේ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් යටතේ ආදායම හඳුනා ගන්නා ලද එකී කාලපරිච්ජේදය සඳහා ක්‍රමානුකූල පදනම මත අනෙකුත් ආදායම් වශයෙන් හඳුනා ගැනේ. වත්කම් පිරිවැය වශයෙන් සමූහයට ගෙවන ලද ප්‍රධාන එකී වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය මත ක්‍රමානුකූල පදනම මත ලාභ හෝ අලාභ තුළ හඳුනා ගැනේ.

**2.2.17 මුදල් හා මුදල් හා සමාන දෑ**

මුදල් හා මුදල් හා සමාන වෙනත් දේ ලෙස විග්‍රහ කර ඇත්තේ, අත තිබෙන මුදල්, බැංකු තැන්පතු හා ඉක්මනින් හා පහසුවෙන් මාස තුනක් හෝ ඊට අඩු කාලයකදී නිශ්චිත මුදල් ප්‍රමාණයක් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි හා අගය වෙනස් වීම පිළිබඳව අල්ප අවදානමකට ලක් වන ඉහළ ද්‍රවශීලතාවයෙන් යුත් කෙටි කාලීන ආයෝජනයන්ය.

සමූහයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා මුදල් හා මුදල් වලට සමානදේ, අත තිබෙන මුදල්, බැංකු තැන්පතු හා බැංකු අයිරා වල ශුද්ධ ප්‍රමාණයෙන් සමන්විත වේ.

**2.2.18 පාරිභෝගිකයන් සමග වූ ගිවිසුම වලින් ලද ආදායම්**

පාරිභෝගිකයෙකුට භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා ප්‍රමාණවත් වශයෙන් සමූහය අපේක්ෂා කරන වටිනාකමට පොරොන්දු වූ භාණ්ඩය හෝ සේවාව පාරිභෝගිකයා වෙත ලබාදීමෙන් කාර්ය සාධන වගකීමක් තෘප්තිමත් කිරීමේ දී සමූහය විසින් ආදායම හඳුනාගනු ලැබේ.

ඒ අනුව සමූහය පහත පරිදි ආදායම හඳුනා ගනියි.

**ආ) විදුලි විකිණුම්**

විදුලිය /සේවා සහ භාණ්ඩ අලෙවිය සපයන ලද සේවා සම්බන්ධතාවයන් හරහා පාරිභෝගිකයන් විසින් විදුලිය පාරිභෝජනය කිරීමේදී විදුලිය අලෙවි කිරීමේ ආදායම සමූහය විසින් හඳුනාගනියි. අයකිරීම් කාණ්ඩය සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ගැසට් කරන ලද ගාස්තු මත පදනම්ව ආදායම හඳුනාගන්නා මිල තීරණය කරනු ලැබේ.

නිමැවුම් ක්‍රමය භාවිතා කරමින් කාර්ය සාධන වගකීම් වල ප්‍රගතිය සමූහය මැන බලයි. ප්‍රතිදාන ක්‍රමය මඟින් පිළිගත් ආදායම පදනම් වන්නේ පාරිභෝගිකයා වෙත මාරු කරන ලද වටිනාකම් සෘජුවම මැනීම මත ය. ඒ අනුව, බෙදා හරින ලද විදුලිබල ධාරිතාවය මත පදනම්ව, සමූහය මාසිකව පිරිවැටුම වාර්තා කරයි.

**ආ) පාරිභෝගික දායකත්වය**

සමූහය විසින් සපයන ලද වත්කමේ ප්‍රතිලාභය පාරිභෝගිකයා විසින්, සමස්ත කාලය පුරා විදුලිය පරිභෝජනය කිරීමේ දී සමාන්තරව ලබාගැනීම සහ පරිභෝජනය සිදුකරන බැවින්, විදුලිය සැපයීම උදෙසා වූ වත්කම් සකස් කිරීම සඳහා පාරිභෝගිකයා වෙතින් ආරම්භයේ දී ලැබෙන ප්‍රතිෂ්ඨාව සමස්ත කාලය පුරාම හඳුනාගනු ලැබේ. එබැවින් ලැබෙන ප්‍රතිෂ්ඨාව වත්කමේ ඵලදායී ජීවිත කාලය පුරා ආදායම වශයෙන් හඳුනාගනු ලැබේ.

**ඇ) විද්‍යුත් වාහන ආරෝපණ ආදායම**

මණ්ඩලය විසින් පිහිටුවන ලද විද්‍යුත් වාහන ආරෝපණ මධ්‍යස්ථානවලදී, පාරිභෝගිකයා විසින් තම වාහන ආරෝපණය කිරීමේ දී පරිභෝජනය කරනු ලබන විදුලිය සඳහා මණ්ඩලය විසින්ම සපයන ලද පෙර ගෙවුම් කාඩ්පත් මඟින් ගෙවීමේ දී, වාහන ආරෝපණයෙන් පසුව ආදායම හඳුනාගනු ලැබේ.

**ඈ) ගිවිසුම් වගකීම**

සමූහය වෙත දැනටමත් ප්‍රතිෂ්ඨාවක් ගෙවා ඇති පාරිභෝගිකයකු වෙත සේවාව ලබාදීම සඳහා වූ බැඳීම ගිවිසුම් වගකීමක් වේ. එබැවින් විද්‍යුත් වාහන ආරෝපණය සඳහා වූ විද්‍යුත් කාඩ්පතෙහි ඉතිරිව පවතින පෙර ගෙවුම් ශේෂය සහ සේවා සම්බන්ධතාවයන් සඳහා වූ පාරිභෝගික ගෙවීම්වල ක්‍රමක්ෂය නොවූ අගය සමූහයේ ගිවිසුම්ගත වගකීම් ලෙස සැලකේ.

**2.6.19 මූල්‍ය ආදායම හා වියදම**

ඵලදායී පොළී අනුපාතය (ඊඅයිආර්) උපයෝගී කරගනිමින් පොළී ආදායම හෝ වියදම ගණණය කරන අතර එය ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම්, සුදුසු පරිදි මූල්‍ය වත්කමේ වටිනාකමට වට්ටම්කර වත්කම් සඳහා වූ පොළී ආදායම හෝ වියදම වාර්තා කරනු ලැබේ.

**2.6.20 ලාභාංශ**

ලාභාංශ ආදායම් හඳුනා ගනු ලබන්නේ ගෙවීම ලබා ගැනීමට කොටස්කරුවන්ට ඇති අයිතිය තහවුරුවූ පසුය.

**2.6.21වෙනත් මෙහෙයුම් ආදායම් සහ වියදම්**

**ලාභ හා පාඩු**

දේපල, පිරියත හා උපකරණ සහ ආයෝජන ඇතුළු වෙනත් ජංගම නොවන වත්කම් බැහැර කිරීමෙන් පැනනගින ආදායම් ස්වභාවයකින් යුත් ශුද්ධ ලාභ හා පාඩු ආදායම් ප්‍රකාශයේ ගිණුම් ගත කර තිබෙනුයේ, වත්කම්වල ධාරක ගණන හා ආශ්‍රිත විකිණුම් වියදම්, බැහැර කිරීම්වලට අදාළ ලැබීම්වලින් අඩු කළ පසුවය.

**වෙනත් ආදායම් සහ වියදම්**

වෙනත් ආදායම් හඳුනාගනු ලබන්නේ උපචිත පදනමක් මතය.

**2.6.22. වියදම් හඳුනාගැනීම**

විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම (පීපීඒ) මත පැන නගින වියදම් ඇතුළුව වියදම්, ආදායම අතර වූ ඍජු නිශ්චිත සම්බන්ධතාවන් මත පදනම්ව වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. ව්‍යාපාරයේ දේපළ, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමටත්, ව්‍යාපාරය කාර්යක්ෂමතාවයෙන් පවත්වා ගෙන යාමටත් දරන වියදම් ලාභ හෝ අලාභය ප්‍රකාශයට හඳුනාගනී.

ලාභ හෝ අලාභ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණින් අධ්‍යක්ෂකවරුන්ගේ අදහස වන්නේ "වියදම් කියාත්මක කිරීමේ ක්‍රමය" සාධාරණ ලෙස මණ්ඩලයේ ක්‍රියාකාරීත්වයේ අංගයක් වන අතර එබැවින් එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් අනුගමනය කරන බවයි.

**3. සැළකිය යුතු ගිණුම්කරණ උපකල්පන, තීන්දු හා ඇස්තමේන්තු**

සමූහයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා වාර්තා කිරීමේ කාලය අවසානයේදී ආදායම, වියදම, වත්කම්, වගකීම් සහ අවදානම් වගකීම් හෙළිදරව් කිරීමේ ප්‍රමාණයට බලපෑම් කළ හැකි විනිශ්චය, තක්සේරු කිරීම් සහ උපකල්පනයන් කළමණාකරණයන් විසින් තීරණය කළ යුතුය.

ඇස්තමේන්තු සහ තීන්දු අඛණ්ඩව ඇගයීමට ලක් කෙරෙන අතර ඒ සඳහා ඓතිහාසික අත්දැකීම් සහ වෙනත් සාධක සාධාරණ යැයි විශ්වාස කෙරෙන අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් පදනම්වේ.

මෙම උපකල්පන හා ඇස්තමේන්තු පිලිබඳ අවිනිශ්චිත භාවය හේතුවෙන් අනාගත කාල පරිච්ඡේදයන්හි වත්කම් හෝ බැරකම්වල ධාරණ අගයට ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය වන ප්‍රතිඵල ඇති විය හැක. සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී කළමනාකරණය විසින් විවිධ ගැනීම් සිදුකළ යුතුය. කළමනාකරණයේ මූල්‍ය ප්‍රකාශන වල පිළිගත් ප්‍රමාණයන් කෙරෙහි ඉතාමත් වැදගත් බලපෑමක් ඇති කළ හැකි යැයි තක්සේරු කර ඇති ඒවා පහත සාකච්ඡා කර ඇත.

අලුත් කිරීමේ හා අවසන් කිරීමේ කොන්ත්‍රාත් වල කල්බදු කාලය තීරණය කිරීම - සමූහය බදුකරු වශයෙන් කල්බදු ගිවිසුමක අවලංගු කළ නොහැකි කාල සීමාව සමූහය විසින් තීරණය කරනු ලබන අතර, මෙහිදී යම් කාල සීමාවක් සහිතව බදු ගෙවීම සාධාරණ යැයි නිශ්චිත නම් හෝ බදු නොගැනීම සඳහා ආවරණය කරන ලද කාල සීමාව සාධාරණ ලෙස ක්‍රියාත්මක නොවන බව සහතික නම් කල්බදු කාලය දීර්ඝ කිරීමේ විකල්පයක් මඟින් මෙය ආවරණය කෙරේ.

දිගු කිරීම සහ අවසන් කිරීමේ විකල්ප ඇතුළත් බදු ගිවිසුම් කිහිපයක් සමූහය සතුව ඇත. කල්බදු අලුත් කිරීමේ හෝ අවසන් කිරීමේ විකල්පය ක්‍රියාත්මක කළ යුතුද නැද්ද යන්න සාධාරණද යන්න තක්සේරු කිරීමේදී සමූහය තම විනිශ්චය ක්‍රියාත්මක කරයි. එනම්, එය අලුත් කිරීම හෝ අවසන් කිරීම සිදු කිරීම සඳහා ආර්ථික දිරිගැන්වීමක් ඇති කරන අදාළ සියළුම සාධක සලකා බලයි. ආරම්භක දිනට පසු, සමූහය විසින් පාලනය කළ යුතු සැළකිය යුතු සිදුවීමක් හෝ තත්වයේ වෙනසක් සිදු වුවහොත් බදු දීමේ කාලය නැවත තක්සේරු කරන අතර අලුත් කිරීමේ හෝ අවසන් කිරීමේ විකල්පය භාවිතා නොකිරීමට බලපායි.

තවද අවසන් කිරීමේ විකල්පයන්ගෙන් ආවරණය වන කාල වකවානු බදු කාල සීමාවේ කොටසක් ලෙස ඇතුළත් කරනුයේ ඒවා ක්‍රියාත්මක නොකිරීම සාධාරණ ලෙස තහවුරු වූ විට පමණි.

**මූල්‍ය උපකරණ වල සාධාරණ අගය**

මූල්‍ය තත්ව ප්‍රකාශයේ සටහන්ව තිබෙන මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් වල සාධාරණ අගය ක්‍රියාත්මක වෙළඳපල වලින් ලබාගත නොහැකි විට, ඒවායේ සාධාරණ අගය තීරණය කරනුයේ වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය ඇතුලු තක්සේරු ක්‍රම ශිල්ප යොදා ගනිමිනි. නිරීක්ෂණය කළ හැකි වෙළඳපල වලින් මෙම ක්‍රම වලට අදාළ යෙදවුම් හැකි අවස්ථාවලදී ලබා ගන්නා අතර, මෙසේ කිරීම ඵලදායි නොවන විට සාධාරණ අගයන් ස්ථාපනය කිරීමෙහිලා විචාර බුද්ධි මට්ටමක් අවශ්‍ය වේ.

ද්‍රවශීලතා අවදානම හා වෙළඳපලේ පවත්නා අවිනිශ්චිත භාවය වැනි සළකා බැලීමේ නිර්ණායකයන් (considerations) විනිශ්චයන්ට ඇතුළත්ය. මෙම සාධක සම්බන්ධයෙන් වන උපකල්පනයන්හි වෙනස්වීම් මඟින් මූල්‍ය උපකරණ වල වාර්තා කළ සාධාරණ අගයට බලපෑමක් ඇති කළ හැකිය.

**මූල්‍ය නොවන වත්කම් වල හානි වීමෙන් සිදුවන පාඩු සමාලෝචනය කිරීම**

වත්කම් වලට හානි සිදුවී තිබේ දැයි සමූහය විසින් තීරණය කරණු ලබන්නේ හානි පිළිබඳ සමාලෝචනයක් කිරීමෙනි. මේ සඳහා මුදල් ජනනය කරන ඒකක වල පාවිච්චියේදී අගය (value in use) ඇස්තමේන්තු කිරීම අවශ්‍ය වේ. පාවිච්චියේදී අගය ඇස්තමේන්තු කිරීම සඳහා මුදල් ජනනය කරන ඒකක වලින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වල ඇස්තමේන්තුවක් කළමනාකරණය විසින් සකස් කිරීමද, අදාළ මුදල් ප්‍රවාහ වල වත්මන් අගය ගණනය කිරීම පිණිස යෝග්‍ය වට්ටම් අනුපාතයක් තෝරා ගැනීමද අවශ්‍යය. මෙම තක්සේරුව අනුව අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ හා වට්ටම් අනුපාත පිළිබඳව සමූහය විසින් ඇස්තමේන්තු කිරීම අපේක්ෂිත බැවින් ඒවා අවිනිශ්චිත ස්වභාවයක් ගනී.

**වෙළඳ හා වෙනත් ලැබියයුතු අයිතම හානිකරණයෙන් සිදු වන පාඩු**

තනි තනිව ඇගයීමට ලක් කර හානි වීමේ අවදානමක් නොමැති බව සොයා ගත් වෙළඳ හා වෙනත් ලැබිය යුතු අයිතම සහ තනිව වැදගත් නොවන ලැබිය යුතු අයිතම ඉන්පසු සමාන අවදානම් ලක්ෂණ සහිත වත්කම් කාණ්ඩ අනුව, අදාළ ප්‍රතිඵල තවම ප්‍රත්‍යක්ෂ නොමැති විෂය මූලික සාක්ෂි තිබෙන සිදුව ඇති පාඩු සිද්ධි සඳහා වෙන් කිරීම් කළ යුතු දැයි තීරණය කිරීම පිණිස සාමූහිකව තක්සේරු කරනු ලැබේ. ලැබිය යුතු ඒකතුවෙන් ලැබෙන (හිඟ මුදල් මට්ටම්, ණය උපයෝගී කර ගැනීම් යනාදී) දත්ත, අවදානම් සංකේන්ද්‍රණයේ ප්‍රතිඵල හා ආර්ථික දත්ත (විරැකියා මට්ටම්, නිශ්චල දේපළ මිල දර්ශක, රටට

අදාළ අවදානම හා විවිධ තනි කාණ්ඩායම් වල කාර්ය සාධනය ඇතුලු) සම්බන්ධයෙන් තීන්දු සාමූහික තක්සේරුව විසින් සැළකිල්ලට ගනු ලැබේ.

**අයබදු**

ආදායම් බදු හා වැට් ඇතුලු වෙනත් බදුගෙවනු ලැබීමට සමූහය යටත්ය. මූල්‍ය ප්‍රකාශ වල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වලට අනුගතවීම පිණිස පිළිපැදිය යුතු බදු උපදෙස් මාලව ලැබෙන තෙක් ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදු සඳහා අතිරේක බදු සඳහා සම්පූර්ණ ප්‍රතිපාදන නිශ්චය කිරීම සඳහා සැලකිය යුතු විචාර බුද්ධියක් අවශ්‍යය. බදු මාර්ග සුවක නිකුත් කරන තෙක් බදු පැනවීමේ කාර්යය සඳහා බදු වලට යටත් මූල්‍ය ප්‍රකාශ සකස් කරන අවස්ථාවේදී බදු නීති අදාළවීම ගැන අර්ථ නිරූපණ සම්බන්ධයෙන් අවිනිශ්චිතතා තිබුණි. ප්‍රවර්තන, විලම්බිත හා වෙනත් බදු සඳහා අතිරේක බදු ගෙවිය යුතු වන්නේද යන්න ගැන ඇස්තමේන්තු මත සමූහය විසින් වත්කම් හා බැරකම් හඳුනා ගඳුනා ගන්නා ලදී. මෙම කරුණු වල අවසාන බදු ප්‍රතිඵලය මුලදී සටහන්කරන ලද ගණන් වලට වෙනස් නම්, එම වෙනස්කම් හේතු කොට ගෙන තීරණය ගනු ලබන කාලසීමාවේ ආදායම්, විලම්බිත හා බදු වලට බලපෑමක් ඇති කරයි.

**දේපල, පිරියත හා උපකරණ වල ඵලදායී ආයුකාලය**

සමූහය විසින් වත්කම් වල අවශේෂ වටිනාකම්, සඵල ආයුකාල හා ක්ෂය කිරීමේ ක්‍රම සෑම වාර්තා කරණ දිනයකදීම සමාලෝචනය කරණු ලබයි. මෙම වටිනාකම්, අනුපාතය හා ක්‍රම ඇස්තමේන්තු කිරීමේදී කළමනාකරණය විසින් ඔවුන්ගේ විනිශ්චයන් යොදා ගනු ලබයි.

**අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම- පාරිතෝෂිකය**

අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය තීරණය කරණු ලබන්නේ ආයුගණක තක්සේරුව ශිල්ප ක්‍රමය භාවිතයෙනි. වට්ටම් අනුපාත, වත්කම්වලට අදාළ අපේක්ෂිත ප්‍රතිලාභ හා අනාගත වැටුප් වැඩි කිරීම් සම්බන්ධයෙන් උපකල්පනයන් සකස් කිරීමට ආයුගණක තක්සේරු ශිල්පක්‍රම යොදා ගැනේ. මෙම සැලසුම්වලට දිගු කාලීන ස්වභාවය නිසා ඇතැම් ඇස්තමේන්තු සැළකිය යුතු අවිනිශ්චිතතාවයන්ට යටත් වේ.

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

| 4. අදායම | සමූහය 2022 | සමූහය 2021 | මණ්ඩලය 2022 | මණ්ඩලය 2021 |
|---|---|---|---|---|
| විකුණුම් | 374,626,063 | 290,885,609 | 308,457,234 | 248,776,409 |
| | 374,626,063 | 290,885,609 | 308,457,234 | 248,776,409 |

| 4.1 අදායම් ඛාණ්ඩ | සමූහය 2022 | සමූහය 2021 | මණ්ඩලය 2022 | මණ්ඩලය 2021 |
|---|---|---|---|---|
| විදුලිය විකිණීම් | 317,421,016 | 257,693,960 | 308,457,234 | 248,776,409 |
| භාණ්ඩ විකිණීම | 7,669,372 | 6,889,127 | - | - |
| ගැල්වනයිස් කිරීමේ මෙහෙයුම | 1,911,510 | 1,661,318 | - | - |
| විදුලි බලාගාර කුලියට දීමෙන් ලද ආදායම | 36,830,225 | 16,920,361 | - | - |
| මූල්‍යමය කල්බදු හා බලශක්ති ජනනය | 5,725,037 | 4,098,395 | - | - |
| විදුලි බලාගාර මෙහෙයුම් සහ නඩත්තු සේවා | 5,068,702 | 3,530,556 | - | - |
| වෙනත් මෙහෙයුම් | 201 | 91,892 | - | - |
| | 374,626,063 | 290,885,609 | 308,457,234 | 248,776,409 |

## 5. ගෘහස්ත පාරිභෝගිකයින් සඳහා ලබා දුන් සහන

රු. 195,708,670 (2021) හා රු 764,928 (2022) ක මුදලින් නියෝජනය වන්නේ කොවිඩ් -19 වසංගත තත්වය හේතුවෙන් 2020 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ විදුලි බිල්පත් ගෙවීම සඳහා 2020 ජූලි 15 දිනැති අංක 20/1063/226/062 දරණ කැබිනට් තීරණය මත පදනම්ව ගෘහස්ත පාරිභෝගිකයින් සඳහා ලබා දුන් සහන මුදල වේ.

| 6. වෙනත් මෙහෙයුම් ආදායම් සහ ලාභ | සමූහය 2022 | සමූහය 2021 | මණ්ඩලය 2022 | මණ්ඩලය 2021 |
|---|---|---|---|---|
| ලාභාංශ ආදායම | 516,129 | 6,908,775 | 274,221 | 2,519,496 |
| විදුලි පරිභෝජනය මත දඩ මුදල් | 35,073 | 4,704 | 35,073 | 4,704 |
| පාරිභෝගික අයකිරීම් | 643,575 | 169,496 | - | - |
| දේපළ පිරියත සහ උපකරණ විකිණීමේ ලාභ | 607,304 | 686,309 | 640,044 | 700,770 |
| පාරිභෝගික දායකත්වය මත ක්‍රමක්ෂය | 4,730,906 | 4,481,332 | 4,281,308 | 4,058,249 |
| රජයේ ප්‍රදාන මත ක්‍රමක්ෂය | 21,498 | 20,882 | 15,685 | 15,068 |
| විවිධ ආදායම් | 1,883,225 | 964,956 | 1,769,206 | 898,231 |
| රාජ්‍ය ප්‍රදාන ආදායම් | 84 | 7,850 | 84 | 7,850 |
| රජයේ දෙපාර්තුමේන්තු ආදායම් | 527,969 | 204,145 | 527,969 | 204,145 |
| ඇවර හානි | 1,291,086 | 199,570 | 1,291,086 | 199,570 |
| අළු විකිණීම | 669,461 | 787,226 | 669,461 | 787,226 |
| ටෙන්ඩර් ගාස්තු /ආපසු නොගෙවන තැන්පතු /ඇපකර අහිමි කිරීම් | 291,747 | 72,140 | 291,747 | 72,140 |
| පිරිවැය ප්‍රතිපූර්ණය කර ගැනිමේ කාර්යයන් මත ආදායම | 1,353,176 | 1,425,993 | 1,353,176 | 1,425,993 |
| සේවා රැහැන් අයදුම්පත් ගාස්තු | 6,337 | 9,467 | 6,337 | 9,467 |
| විදුලි බිල මත අයභාර | 425,755 | 563,085 | 425,755 | 563,085 |
| විද්‍යුත් වාහන බලශක්ති කාඩ්පත් විකිණීම | - | 2 | - | 2 |
| විනිමය හුවමාරු මත ලාභ/(අලාභ) | 14,279,142 | 1,564,890 | - | - |
| | 27,282,467 | 18,070,822 | 11,581,152 | 11,465,996 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

| 7.1 මූල්‍ය ආදායම | සමූහය 2022 | සමූහය 2021 | මණ්ඩලය 2022 | මණ්ඩලය 2021 |
|---|---|---|---|---|
| තැන්පතු මත පොලී ආදායම | 2,169,875 | 1,517,556 | - | - |
| ණය පොළී අදායම | 25,649 | 85,702 | - | - |
| රාජ්‍ය සුරැකුම්පත් මත පොලී ආදායම | 700,317 | 312,332 | - | - |
| ආයෝජනවලින් ලද පොලී ආදායම | 221 | 21,313 | 221 | 21,313 |
| ලාභ/ අලාභ හරහා සාධාරණ වටිනාකම හඳුනාගනු ලබන මූල්‍ය වත්කම් වලින් ලද ලාභ/(අලාභ) | (58,920) | 97,874 | - | - |
| කාර්ය මණ්ඩල ණය මත පොලී ආදායම | 1,305,878 | 1,113,238 | 1,308,722 | 971,409 |
| සමෘද්ධි ණය මත පොලී ආදායම | 57,714 | 117,799 | 57,714 | 117,799 |
| සම්බන්ධිත පාර්ශවයන්ට දුන් ණය මත පොලී ආදායම | 22,202 | 1,950 | 22,202 | 1,950 |
| වෙනත් පාරිභෝගික ණය මත පොලී ආදායම | 5,453 | 18,908 | 5,453 | 18,908 |
| | 4,228,389 | 3,286,672 | 1,394,312 | 1,131,379 |

| 7.2 මූල්‍ය පිරිවැය | සමූහය 2022 | සමූහය 2021 ප්‍රතිප්‍රකාශිත | මණ්ඩලය 2022 | මණ්ඩලය 2021 |
|---|---|---|---|---|
| අයිරාවන් මත පොලී වියදම | 5,061,951 | 823,074 | 4,399,216 | 586,294 |
| දිගු කාලීන / කෙටි කාලීන ණය ගැනීම සඳහා පොළී වියදම් | 22,701,601 | 9,228,252 | 18,579,030 | 7,415,826 |
| ව්‍යාපෘති ණය මත පොලී වියදම | 1,419,582 | 2,878,855 | 1,419,582 | 2,878,855 |
| ණය කර පොළී ගිණුම | 1,870,266 | 1,354,504 | 1,870,266 | 1,354,504 |
| කල්බදු පොලී වියදම | 51,293 | 9,529 | 10,747 | 12,775 |
| ස්වාධීන විදුලිබලශක්ති නිෂ්පාදකයින්ගෙන් විදුලි මිලදී ගැනීම් වෙනුවෙන් ප්‍රමාද පොලී | 6,547,727 | 1,730,595 | 6,547,727 | 1,730,595 |
| ලංකා ඛනිජ තෙල් සංස්ථාවට ගෙවූ ප්‍රමාද පොළී | 8,922,460 | 6,448,291 | 8,922,460 | 6,448,291 |
| පාරිභෝගික ණය සඳහා ලබාගත් ණය මත පොලී වියදම | 84,748 | 5,037 | - | 3,501 |
| පාරිභෝගික තැම්පතු මත පොලී වියදම | 30,308 | 39,575 | - | - |
| | 46,689,936 | 22,517,712 | 41,749,028 | 20,430,641 |

| 8. බදු පෙර ලාභ/(අලාභ) ගාස්තු අයකිරීම්/ බැර කිරීම් වලට පසු ප්‍රකාශිත | සමූහය 2022 | සමූහය 2021 ප්‍රතිප්‍රකාශිත | මණ්ඩලය 2022 | මණ්ඩලය 2021 ප්‍රතිප්‍රකාශිත |
|---|---|---|---|---|
| විගණන සේවා ගාස්තු (ප්‍රවර්තන වසර සඳහා) | 23,471 | 28,933 | 9,038 | 17,040 |
| අධ්‍යක්ෂ පාරිශ්‍රමික | 9,136 | 129,906 | 3,580 | 4,061 |
| ක්ෂය | 35,850,511 | 34,542,913 | 33,993,651 | 33,095,689 |
| කාර්ය මණ්ඩල පිරිවැයට ඇතුළත් වන | | | | |
| - නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය - පාරිතෝෂික | 1,655,664 | 1,301,341 | 1,380,133 | 1,067,140 |
| - නිශ්චිත දායක සැලසුම් පිරිවැය - (EPF & ETF) | 4,884,690 | 4,795,792 | 4,404,433 | 4,371,493 |
| - වෙනත් කාර්ය මණ්ඩල පිරිවැය | 45,672,648 | 46,059,399 | 39,130,466 | 42,379,538 |
| දේපළ පිරියත සහ උපකරණ විකිණීම (ලාභය)/අලාභය | 58,394 | 149,507 | 25,654 | 135,046 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම | 78,818 | 60,831 | 45,616 | 48,442 |
| මහජන සබඳතා හා දැන්වීම් ප්‍රචාරණය | 16,771 | 12,810 | - | - |
| ආධාර | 363 | - | - | - |
| රජයේ ප්‍රදාන | 471,096 | 15,068 | 15,685 | 15,068 |
| අභාවිත හා සෙමින් චලනය වන භාණ්ඩ හානිකරණ සඳහා වෙන් කිරීම් | (343,274) | 337,770 | (342,386) | 331,159 |
| ණය ගැතියන් හානිකරණය සඳහා වෙන්කිරීම් | 1,589,841 | 1,649,777 | (1,578,762) | 1,747,552 |

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

| | | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| **9.** | **ආදායම් බදු වියදම්** | **2022** | **2021** | **2022** | **2021** |
| **9.1** | **වර්තමාන ආදායම් බදු** | | | | |
| | වසරේ සාමාන්‍ය කටයුතු සඳහා ආදායම් බදු | 2,084,757 | 2,486,388 | - | - |
| | පෙර වර්ෂ සඳහා ආදායම් බදු වල උණ/(අධි)බදු ප්‍රතිපාදන | (257,360) | (30,939) | - | - |
| | පෙර වර්ෂ සඳහා ගැලපුම් මත වර්තමාන බදු සඳහා වූ ඌන අධි ප්‍රතිපාදන මත අධි භාර අයකිරීම- 25% | - | 714,474 | - | - |
| | | 1,827,397 | 3,169,923 | - | - |
| **9.2** | **විලම්භිත බදු** | | | | |
| | විලම්භිත බදු අයකිරීම්/ (ප්‍රතිවර්ථනය)- ( සටහන 29) | (756,684) | 45,132 | - | - |
| | ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කළ ආදායම් බදු වියදම් | 1,070,713 | 3,215,055 | - | - |

| **9.3** | **ප්‍රවර්තන බදු වියදම් හා ගිණුම්කරණ ලාභය අතර සැසඳුම** | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|---|
| | | **2022** | **2021** | **2022** | **2021** |
| | බදු ගෙවීමට පෙර ලාභය | (238,261,579) | (3,498,430) | (261,868,692) | (21,450,369) |
| | බදු ගෙවීම පිණිස අනුමත කළ නොහැක වියදම්/(ආදායම්) | 133,501,835 | 35,634,075 | 128,938,436 | 33,799,786 |
| | විශ්‍රාම වැටුපේ ශුද්ධ බලපෑම | (110,953) | 717,208 | (110,953) | 717,208 |
| | බදු ගෙවීම පිණිස අනුමත කළ හැකි වියදම්/(ආදායම්) | (81,162,844) | (45,765,389) | (78,772,407) | (43,389,025) |
| | ව්‍යාපාරික නොවන ආදායම/නිදහස් කළ ආදායම | (5,216,579) | (8,337,331) | (359,812) | (2,675,965) |
| | ඒකාබද්ධ කරීමේ ගැලපීම | - | (18,403) | - | - |
| | **වසර සඳහා ව්‍යාපාරික පාඩුව** | (212,173,426) | (32,998,365) | (212,173,428) | (32,998,365) |
| | **බදු සඳහා බදු ගෙවිය යුතු ව්‍යාපාරික ලාභය** | 20,923,307 | 11,730,095 | - | - |
| | අනෙකුත් ප්‍රභවයන් ගෙන් ලද ආදායම් | 3,651,297 | 3,459,735 | 1,013,401 | 1,245,099 |
| | **මුළු ව්‍යවස්ථාපිත ආදායම** | 24,574,605 | 15,189,830 | 1,013,401 | 1,245,099 |
| | වසර තුළ උපයෝජනය කළ බදු අලාභය | (1,013,401) | (1,245,099) | (1,013,401) | (1,245,099) |
| | **බදු ගෙවිය යුතු ආදායම** | 23,561,204 | 13,944,731 | - | - |
| | ආදායම් බදු වියදම පහත අනුපාත යටතේ | | | | |
| | ආයතනික බදු අනුපාතය (වසර තුළ 24% සහ 30%) | 1,681,743 | 2,088,932 | - | - |
| | සහනදායි බදු අනුපාත | 57,430 | 44,065 | - | - |
| | 14% බගින් වූ ලාභාංශ බද්ද | 88,223 | 233,626 | - | - |
| | **ප්‍රවර්තන බදු වියදම** | 1,827,396 | 2,366,623 | - | - |

සමූහයේ බදු වියදම් ගණනය කර ඇත්තේ සමූහය තුළ තනි සමාගම් වශයෙන් උපයන ලද බදු ගෙවිය යුතු ආදායම පදනම් කර ගෙනය.

### 9.3.2 අදාල ආදායම් බදු අනුපාත

සම්පූර්ණ හෝ අර්ධ වශයෙන් බදු නිදහස් කිරීම් භුක්ති විඳින අනුබද්ධ සමාගම්වල පහත සඳහන් ව්‍යාපාර හැර අනෙකුත් සියළුම නේවාසික සමාගම් සඳහා බදු වගකීම 2022 වර්ෂයේ පළමු මාස නවය සඳහා 24% සහ ඊළඟ මාස තුන සඳහා 30% යන සම්මත අනුපාතයට ගණනය කරනු ලැබේ . (24% - 2021)

| **පරිපාලිත/උප පරිපාලිත සමාගම** | **ව්‍යාපාර මෙහෙයුම්** | **බදු අනුපාතය** |
|---|---|---|
| සීමාසහිත නිව්දු (පුද්) සමාගම | විදුලිබල උත්පාදනය | 14% |
| සීමාසහිත නිව්දු අසුපිනිඇල්ල (පුද්) සමාගම | විදුලිබල උත්පාදනය | 14% |
| ඉන්ෆ්‍රා ඇන්ඩ් ඉංජිනියරින් (පුද්) සමාගම | විදේශ ඉදිකිරීම් සහ යටිතල පහසුකම් ව්‍යාපෘති | බදු නිදහස් |
| **විදේශීය උප පරිපාලිත සමාගම** | | |
| සීමාසහිත රාජ් ලංකා පවර් (පුද්) සමාගම | විදුලිබල උත්පාදන - බංගලාදේශය | බදු නිදහස් |
| සීමාසහිත ලක්දනව් බංගලා පවර් සමාගම | විදුලිබල උත්පාදන - බංගලාදේශය | බදු නිදහස් |
| ෆෙනී ලංකා බලශක්ති පුද්ගලික සමාගම | විදුලිබල උත්පාදන - බංගලාදේශය | බදු නිදහස් |
| සීමාසහිත වීෂියාටික් ඉලෙක්ට්‍රිකල් සහ ස්විජ් ගියර්(පුද්) සමාගම | ස්විච් ගියර් විකිණීම- ඉන්දියාව | 33% |
| සීමාසහිත බ්‍රයිට් ඉන්ටර්නැෂනල් පවර් (පුද්) සමාගම | බලාගාර මෙහෙයුම් හා විදුලිබල උත්පාදන සහයක සේවා සැපයුම-සිංගප්පූරුව | 17.5% |

2022 දෙසැම්බර් 31 දිනට

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

**10 දේපල පිරියත හා උපකරණ (ඉතිරි කොටස)**

**10.1 සමූහය (ඉතිරි කොටස)**

| 10.1.1 සින්නක්කර වත්කම් දළ ධාරණ අගය පිරිවැය මත | 2022.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම්/ මාරු කිරීම්/ පවරා ගැනීම් | එකතු කිරීම් /ගැලපීම් | බැහැර කිරීම් / මාරු කිරීම් | බැහැර කිරීම් /ගැලපීම් | 2022.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 11,274,125 | 14,267 | 569,686 | (7,010) | - | 11,851,068 |
| ගොඩනැගිලි | 24,911,841 | 1,372,637 | 125,682 | (1,972,731) | - | 24,437,429 |
| සිවිල් වැඩ යන්ත්‍ර | 234,333,313 | - | 52,086 | - | - | 234,385,399 |
| පිරියත හා යන්ත්‍ර | 1,807,816 | 526,269 | 145,845 | (8,474) | - | 2,471,456 |
| ජනන විදුලි බලාගාර | 323,509,208 | 7,337,503 | 1,536 | - | (46,580) | 330,801,667 |
| සූර්ය බල පිරියත | 213,841 | - | 27,984 | (428) | - | 241,397 |
| සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් රැහැන් | 670,662,056 | 28,714,472 | 118,158 | (1,150,393) | (4,526) | 698,339,767 |
| මෝටර් වාහන | 14,179,440 | 614,963 | 230,433 | (275,183) | - | 14,749,653 |
| අනෙකුත් සැපයුම් යටිතල ව්‍යුහයන් | 24,952,209 | 1,304,416 | - | (130,285) | - | 26,126,340 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 7,979,722 | 670,755 | 97,328 | (97,959) | (28,614) | 8,621,232 |
| ලීබඩු හා සවිකිරීම් | 672,195 | 27,630 | - | (6,506) | (1,439) | 691,880 |
| යන්ත්‍ර හා මෙවලම් | 6,777,375 | 641,840 | - | (8,337) | (582) | 7,410,296 |
| බහාලුම් අංග | 6,744 | - | - | - | - | 6,744 |
| | 1,321,279,885 | 41,224,752 | 1,368,738 | (3,657,306) | (81,741) | 1,360,134,328 |

| 10.1.2 ව්‍යාපෘති වත්කම් දළ ධාරණ අගය පිරිවැය හෝ තක්සේරු අගය මත | 2022.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම්/ මාරු කිරීම් / පවරා ගැනීම් | එකතු කිරීම්/ගැලපීම් | බැහැර කිරීම් / මාරු කිරීම් | බැහැර කිරීම් /ගැලපීම් | 2022.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 238,287 | - | - | - | - | 238,287 |
| ගොඩනැගිලි | 194,030 | - | - | - | - | 194,030 |
| මෝටර් වාහන | 2,218,040 | 547,625 | 178,188 | (218,982) | - | 2,724,871 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 115,601 | 10,062 | - | (8,120) | (224) | 117,319 |
| ලීබඩු හා සවිකිරීම් | 9,344 | 673 | - | (2,062) | - | 7,955 |
| යන්ත්‍ර හා මෙවලම් | 60,009 | 469 | 1,290 | - | - | 61,768 |
| | 2,835,311 | 558,829 | 179,478 | (229,164) | (224) | 3,344,230 |

| 10.1.3 ඉදිවෙමින් පවතින ස්ථාවර වත්කම් | 2022.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | වර්ෂය තුල වැඩිවීම් | ගැලපීම් | වත්කම් සඳහා මාරු කිරීම් | ප්‍රතිවර්ගීකරණය මාරුකිරීම් | 2022.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| ඉදිවෙමින් පවතින ස්ථාවර වත්කම් - (සටහන් 10.3) | 164,908,467 | 87,494,875 | 1,820,849 | (30,013,988) | (7,318,216) | 216,891,987 |
| **මුළු දළ දරණ අගය** | 164,908,467 | 87,494,875 | 1,820,849 | (30,013,988) | (7,318,216) | 216,891,987 |

2022 දෙසැම්බර් 31 දිනට

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

**10 දේපල පිරියත හා උපකරණ (ඉතිරි කොටස)**

**10.1 සමූහය (ඉතිරි කොටස)**

**10.1.4 ක්ෂයවීම්**

| සින්නක් කර වත්කම් | 2022.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | වර්ෂය සඳහා අයකිරීම් | එකතු කිරීම්/ගැලපීම් | බැහැර කිරීම් මාරු කිරීම් | විකුණුම් සඳහා ගැලපීම් | 2022.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | 8,315,241 | 627,506 | 16,105 | (288) | - | 8,958,564 |
| සිවිල් වැඩ | 86,661,203 | 3,575,678 | 5,599 | - | - | 90,242,480 |
| පිරියත හා යන්ත්‍ර | 1,410,026 | 271,123 | 90,234 | (6,799) | - | 1,764,584 |
| ජනන විදුලි බලාගාර | 193,240,882 | 11,233,669 | (5,001) | - | - | 204,469,550 |
| සූර්ය බල පිරියත | 49,661 | 9,405 | - | - | - | 59,066 |
| සම්ප්‍රේෂණ හා බෙදා හැරීම රැහැන් | 290,401,455 | 17,163,872 | (565) | (589,095) | (27) | 306,975,640 |
| මෝටර් වාහන | 8,356,612 | 1,082,809 | 100,912 | (186,224) | - | 9,354,109 |
| අනෙකුත් සැපයුම් යටිතල ව්‍යුහයන් | 16,486,646 | 684,519 | - | (73,479) | - | 17,097,686 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 5,523,152 | 712,632 | 20,839 | (41,676) | 167 | 6,215,114 |
| ලීබඩු හා සවිකිරීම් | 483,954 | 73,785 | 6,475 | (3,524) | - | 560,690 |
| යන්ත්‍ර හා මෙවලම් | 5,186,492 | 609,377 | - | (4,337) | (174) | 5,791,358 |
| බහාලුම් අංග | 6,744 | - | - | - | - | 6,744 |
| | 616,122,068 | 36,044,375 | 234,598 | (905,422) | (34) | 651,495,585 |

**10.1.5 ක්ෂයවීම්**

| ව්‍යාපෘති වත්කම් | 2022.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | කෙරිගෙන යන වැඩ ගිණුමට අයකිරීම් / මාරුකිරීම් | එකතු කිරීම්/ගැලපීම් | බැරකිරීම් /ගැලපීම් | විකුණුම් සඳහා මාරුකිරීම් | 2022.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | 97 | 4,851 | - | - | - | 4,948 |
| මෝටර් වාහන | 991,960 | 135,486 | 178,188 | (114,699) | - | 1,190,935 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 83,268 | 13,798 | 28 | (8,076) | (224) | 88,794 |
| ලීබඩු හා සවිකිරීම් | 6,945 | 555 | - | (1,966) | - | 5,534 |
| යන්ත්‍ර හා මෙවලම් | 51,128 | 5,875 | 1,290 | - | - | 58,293 |
| | 1,133,398 | 160,565 | 179,506 | (124,741) | (224) | 1,348,504 |

**10.1.6 ශුද්ධ පොත් අගය**

| පිරිවැය හෝ තක්සේරු අගය මත | 2022 |
|---|---|
| සින්නක්කර ඉඩම් | 12,089,355 |
| ගොඩනැගිලි | 15,667,947 |
| සිවිල් වැඩ | 144,142,919 |
| පිරියත හා උපකරණ | 706,872 |
| ජනන විදුලි බලාගාර | 126,332,117 |
| සූර්ය බල පිරියත | 182,331 |
| සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ රැහැන් | 391,364,127 |
| මෝටර් වාහන | 6,929,480 |
| අනෙකුත් සැපයුම් යටිතල පහසුකම් | 9,028,654 |
| කාර්යාල හා වෙනත් උපකරණ | 2,434,643 |
| ලී බඩු හා සවිකිරීම් | 133,611 |
| යන්ත්‍ර හා මෙවලම් | 1,622,413 |
| | 710,634,469 |

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

**10 දේපල පිරියත හා උපකරණ (ඉතිරි කොටස්)**

**10.1 සමූහය (ඉතිරි කොටස)**

**10.1.7 භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම් පිරිවැය**

| | 2022.01.01 දිනට ශේෂය | එකතු කිරීම්/ගැලපීම් | අවසන් කිරීම්/ගැලපීම් | 2022.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 912,568 | 158,982 | - | 1,071,550 |
| මෝටර් වාහන | 256,138 | 17,592 | (17,592) | 256,138 |
| | 1,168,706 | 176,574 | (17,592) | 1,327,688 |

| ක්ෂයවීම | 2022.01.01 දිනට ශේෂය | වර්ෂය සඳහා අයකිරීම් | ගැලපීම් | 2022.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 441,685 | 95,032 | 12,363 | 549,080 |
| මෝටර් වාහන | 33,911 | 22,500 | (3,611) | 52,800 |
| | 475,596 | 117,532 | 8,752 | 601,880 |

| ශුද්ධ පොත් අගය | 2022 | 2021 |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 522,470 | 470,883 |
| මෝටර් වාහන | 203,338 | 222,227 |
| | 725,808 | 693,110 |

| 10.1.8 දේපල පිරියත හා උපකරණ ( භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම්ද ඇතුලුව ) | 2022 | 2021 |
|---|---|---|
| **ශුද්ධ පොත් අගය** | | |
| දේපල පිරියත හා උපකරණ (සටහන 10.1.6) | 710,634,469 | 706,859,730 |
| ඉදි වෙමින් පවතින ස්ථාවර වත්කම් (සටහන් 10.1.3) | 216,891,987 | 164,908,467 |
| භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම්ද ඇතුලුව (සටහන 10.1.7) | 725,808 | 693,110 |
| **මුළු දේපල පිරියත හා උපකරණ වල වටිනාකම** | 928,252,264 | 872,461,307 |

**10.1.9** 31.12.2022 දිනට සමූහය සතු සම්පූර්ණයෙන්ම ක්ෂය වූ දේපල, පිරියත සහ උපකරණ වල ධාරණ අගය රු.මි 222,050 කි (2021.12.31 දිනට එය රු.මි 207,710 කි )

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

10 දේපල පිරියත හා උපකරණ (ඉතිරි කොටස්)

10.2 මණ්ඩලය

10.2.1 දළ ධාරණ වටිනාකම

| සින්නක් කර වත්කම් පිරිවැය හෝ තක්සේරු අගය මත | 2022.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම් මාරු කිරීම් පවරා ගැනීම් | එකතු කිරීම්/ ගැලපීම් | බැහැරකිරීම්/ මාරු කිරීම් | බැහැර කිරීම ගැලපීම් | 2022.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 9,575,295 | 4,209 | - | - | - | 9,579,504 |
| ගොඩනැගිලි | 23,494,871 | 1,350,576 | - | (1,972,731) | - | 22,872,716 |
| සිවිල් වැඩ යන්ත්‍ර | 234,333,313 | - | 52,086 | - | - | 234,385,399 |
| පිරියත හා යන්ත්‍ර | 785,687 | 1,564 | - | (7,819) | - | 779,432 |
| ජනන විදුලි බලාගාර | 319,788,027 | 7,202,948 | 1,536 | - | (46,580) | 326,945,931 |
| සූර්ය බල පිරියත | 96,985 | - | 27,984 | - | - | 124,969 |
| සම්ප්‍රේෂණ හා බෙදා හරීම රැහැන් | 670,662,056 | 28,714,472 | 118,158 | (1,150,393) | (4,526) | 698,339,767 |
| මෝටර් වාහන | 12,328,058 | 506,939 | 69,650 | (239,443) | - | 12,665,204 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 3,640,231 | 228,338 | - | (72,823) | (28,614) | 3,767,132 |
| ලිබඩු හා සවිකිරීම් | 576,085 | 20,738 | - | (6,506) | (1,439) | 588,878 |
| යන්ත්‍ර හා මෙවලම් | 6,777,375 | 641,840 | - | (8,337) | (582) | 7,410,296 |
| | 1,282,057,983 | 38,671,624 | 269,414 | (3,458,052) | (81,741) | 1,317,459,228 |

10.2.2 ව්‍යාපෘති වත්කම්

දළ ධාරණ වටිනාකම

| පිරිවැය හෝ තක්සේරු අගය මත | 2022.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | එකතු කිරීම් මාරු කිරීම් පවරා ගැනීම් | එකතු කිරීම්/ ගැලපීම් | බැහැරකිරීම්/ මාරු කිරීම් | ගැලපීම් | 2022.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 238,287 | - | - | - | - | 238,287 |
| ගොඩනැගිලි | 194,030 | - | - | - | - | 194,030 |
| මෝටර් වාහන | 2,218,040 | 547,625 | 178,188 | (218,982) | - | 2,724,871 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 115,601 | 10,062 | - | (8,120) | (224) | 117,319 |
| ලිබඩු හා සවිකිරීම් | 9,344 | 673 | - | (2,062) | - | 7,955 |
| යන්ත්‍ර හා මෙවලම් | 60,009 | 469 | 1,290 | - | - | 61,768 |
| | 2,835,311 | 558,829 | 179,478 | (229,164) | (224) | 3,344,230 |
| ක්ෂය කළ හැකි වත්කම් වල මුළු වටිනාකම | 1,284,893,294 | 39,230,453 | 448,892 | (3,687,216) | (81,965) | 1,320,803,458 |

| 10.2.3 ඉදිවෙමින් පවතින ස්ථාවර වත්කම් | 2022.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | කාල සීමාව තුල සිදුකරන ලද පෙර වසර සඳහා ගැලපීම් | වර්ෂය තුල අයකරන ලද | දේපළ පිරියත උපකරණ වෙත මාරු කිරීම | නැවත වර්ගීකරණය කිරීම/ මාරු කිරීම | 2022.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ | 166,458,857 | (5,961,686) | 76,448,996 | (28,706,056) | (7,151,041) | 201,089,070 |
| දළ ධාරණ අගය | 166,458,857 | (5,961,686) | 76,448,996 | (28,706,056) | (7,151,041) | 201,089,070 |

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

**10 දේපළ පිරියත හා උපකරණ (ඉතිරි කොටස්)**

**10.2 මණ්ඩලය**

**10.2.4 ක්ෂයවීම**

| පිරිවැය හෝ තක්සේරු අගය මත | 2022.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | වර්ෂය සඳහා අයකිරීම් | එකතු කිරීම් / ගැලපීම් | විකුණුම් / මාරුකිරීම්/ අත්හරින ලද | බැහැර කිරීම් සඳහා ගැලපීම් | 2022.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | 8,037,420 | 581,043 | - | (288) | - | 8,618,175 |
| සිවිල් වැඩ යන්ත්‍ර | 86,668,089 | 3,575,678 | 5,599 | - | - | 90,249,366 |
| පිරියත හා යන්ත්‍ර | 649,635 | 34,452 | - | (6,372) | - | 677,715 |
| ජනන විදුලි බලාගාර | 191,614,211 | 10,988,190 | (5,001) | - | - | 202,597,400 |
| සූර්ය බල පිරියත | 19,221 | 2,431 | - | - | - | 21,652 |
| සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් රැහැන් | 290,401,455 | 17,163,872 | (565) | (589,095) | (27) | 306,975,640 |
| මෝටර් වාහන | 6,699,347 | 896,536 | 69,585 | (165,749) | - | 7,499,719 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 2,856,460 | 329,713 | - | (41,271) | 167 | 3,145,069 |
| ලීබඩු හා සවිකිරීම් | 442,026 | 46,947 | - | (3,524) | - | 485,449 |
| යන්ත්‍ර හා මෙවලම් | 5,186,492 | 609,377 | - | (4,337) | (174) | 5,791,358 |
| | 592,574,356 | 34,228,239 | 69,618 | (810,636) | (34) | 626,061,543 |

**10.2.5 ක්ෂයවීම**

| ව්‍යාපෘති වත්කම් පිරිවැය හෝ තක්සේරු අගය මත | 2022.01.01. දිනට ශේෂය ප්‍රතිප්‍රකාශිත | කෙරීගෙන යන කාර්යයන් සඳහා මාරු කිරීම් / අයකිරීම් | එකතු කිරීම් ගැලපීම් | විකුණුම් / මාරුකිරීම් / අත්හරින ලද | බැහැර-කිරීම් සඳහා ගැලපීම් | 2022.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | 97 | 4,851 | - | - | - | 4,948 |
| මෝටර් වාහන | 991,960 | 135,486 | 178,188 | (114,699) | - | 1,190,935 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 83,268 | 13,798 | 28 | (8,076) | (224) | 88,794 |
| ලීබඩු හා සවිකිරීම් | 6,945 | 555 | - | (1,966) | - | 5,534 |
| යන්ත්‍ර හා මෙවලම් | 51,128 | 5,875 | 1,290 | - | - | 58,293 |
| | 1,133,398 | 160,565 | 179,506 | (124,741) | (224) | 1,348,504 |
| **සම්පූර්ණ ක්ෂය වටිනාකම** | 593,707,754 | 34,388,804 | 249,123 | (935,377) | (258) | 627,410,047 |

**10.2.6 ශුද්ධ පොත් අගය**

| පිරිවැය හෝ තක්සේරු අගය මත | 2022 | 2021 ප්‍රතිප්‍රකාශිත |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 9,817,791 | 9,813,581 |
| ගොඩනැගිලි | 14,443,623 | 15,651,383 |
| සිවිල් වැඩ | 144,136,033 | 147,665,223 |
| පිරියත හා යන්ත්‍ර | 101,717 | 136,052 |
| ජනන විදුලි බලාගාර | 124,348,531 | 128,173,816 |
| සූර්ය බල පිරියත | 103,317 | 77,764 |
| සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් රැහැන් | 391,364,127 | 380,260,601 |
| මෝටර් වාහන | 6,699,421 | 6,854,792 |
| කාර්යාල හා අනෙකුත් උපකරණ | 650,588 | 816,104 |
| ලීබඩු හා සවිකිරීම් | 105,850 | 136,457 |
| යන්ත්‍ර හා මෙවලම් | 1,622,413 | 1,599,763 |
| | 693,393,411 | 691,185,536 |

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

**10 දේපල පිරියත හා උපකරණ (ඉතිරි කොටස්)**

**10.2 මණ්ඩලය**

**10.2.7 භාවිතය සඳහා හිමිකම් ඇති වත්කම්**

| පිරිවැය | 2022.01.01 දිනට ශේෂය | එකතු කිරීම්/ගැලපීම් | අවසන් කිරීම්/ගැලපීම් | 2022.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 32,609 | - | - | 32,609 |
| මෝටර් වාහන | 256,138 | 17,592 | (17,592) | 256,138 |
| | 288,747 | 17,592 | (17,592) | 288,747 |

| ක්ෂයවීම | 2022.01.01 දිනට ශේෂය | වර්ෂය සඳහා අයකිරීම් | අවසන් කිරීම්/ගැලපීම් | 2022.12.31. දිනට ශේෂය |
|---|---|---|---|---|
සේවා විශ්‍රාම ප්‍රතිලාභ - සේ.අ.අ. හා සේ.භා.අ. සඳහා ගෙවීම
ප්‍රධාන වශයෙන් දුරකථන විදුලිය සහ ජලය සමන්විත - උපයෝගීතා ගෙවීම්
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සඳහා මෝටර් වාහන වෙනුවෙන් රක්ෂණ වාරික ගෙවීම

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

## 39.2 ලංවිම සම්බන්ධිත සමාගම් සමඟ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

ව්‍යාපාර කටයුතුවලදී මණ්ඩලයේ සම්බන්ධිත ආයතන සමඟ සිදුකරන සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පහත දක්වා ඇත.

| | සම්බන්ධතාවය | ගණුදෙනුවේ ස්භාවය | 2022 | 2021 |
|---|---|---|---|---|
| ලංකා විදුලි (පුද්) සමාගම | විදුලි බලය විකිණීම | | 29,651,359 | 22,917,476 |
| | | | 274,221 | - |
| | | | 817,049 | - |
| | | | (1,597,590) | 1,219,459 |
| සීමාසහිත එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | පරිපාලිත | | - | 2,519,496 |
| | | | (440,912) | (3,119,790) |
| සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම | පරිපාලිත | | 117,337,279 | 58,990,573 |
| | | | 69,008 | 55,464 |
| සීමාසහිත එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්ගලික) සමාගම | උප පරිපාලිත | භාණ්ඩ මිලදී ගැනීම | 1,035,050 | 831,252 |
| සීමාසහිත එල්ටීඑල් ගැල්වනයිස් (පුද්ගලික) සමාගම | උප පරිපාලිත | සේවා ලබා ගැනීම් | 333,397 | 333,424 |
| සීමාසහිත නිව්ඩු (පුද්ගලික) සමාගම | උප පරිපාලිත | | 166,940 | 86,056 |
| සීමාසහිත නිව්ඩු අසුපිනැල්ල (පුද්ගලික) සමාගම | උප පරිපාලිත | | 174,919 | 115,986 |
| සීමාසහිත පවන් දනවි (පුද්ගලික) සමාගම | උප පරිපාලිත | | 396,904 | 157,398 |
| සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම | උප පරිපාලිත | භාණ්ඩ මිලදී ගැනීම | 263,294 | 1,195,641 |
| සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම | උප පරිපාලිත | ශ්‍රී ලංකා එනජීස් පුද්ගලික සමාග මේ සාමාන්‍යාධිකාරිවරයාගේ වේතන ප්‍රතිපූර්ණය කිරීම | | |
| | | | 3,838 | 10,333 |
| සීමාසහිත කුඩලගමුව මිනිහයිඩ්‍රෝ (පුද්ගලික) සමාගම | උප පරිපාලිත | විදුලිබලය මිලදී ගැනීම | 109,203 | 116,108 |
| දැදුරු ඔය මිනි හයිඩ්‍රො (පුද්ගලික) සමාගම | උප පරිපාලිත | විදුලිබලය මිලදී ගැනීම | 106,153 | 94,781 |

## 39.3 සමූහයේ අනෙකුත් සමාගම් අතර සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

| ගණුදෙනුවේ ස්වභාවය | එල්ටීඑල් හෝල්ඩින්ස් සහ පරිපාලිතයන් | ලංකා විදුලිබල සමාගම හා අනුබද්දිත ආයතන | 2022 | 2021 |
|---|---|---|---|---|
| ලංකා විදුලි සමාගම වෙත භාණ්ඩ හා සේවා විකිණීම | 387,412 | - | 387,412 | 254,939 |
| මෙහෙයුම් හා ඉංජිනේරු සේවා | 4,844,749 | - | 4,844,749 | 3,812,889 |

## 39.4 සමූහයේ ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ කරන ගනුදෙනු

මණ්ඩලයේ කාර්යයන් සැලසුම් කිරීම,මෙහෙයවීම හා පාලනය කිරීම සඳහා බලය හා වගකීම තිබෙන පුද්ගලයන් මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරණ මණ්ඩලය ලෙස නිර්වචනය කෙරේ. මණ්ඩලයේ එම ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සහ ප්‍රධාන විධායක නිලධාරියා අයත් වේ.

ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය හා ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ ආසන්න පවුල්වල සාමාජිකයන් (CFMs) වේ නම් එයද පහත සඳහන් හෙළිදරව් කිරීම මඟින් සැලකිල්ලට ගනු ලැබේ.

| | සමූහය | | මණ්ඩලය | |
|---|---|---|---|---|
| **අ) ප්‍රධාන කළමනාකරණය සඳහා ගෙවීම්** | 2022 | 2021 | 2022 | 2021 |
| කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | 137,434 | 132,017 | 3,580 | 4,061 |
| පශ්චාත් - රැකියා ප්‍රතිලාභ | 12,960 | 13,941 | - | - |
| | 150,394 | 145,958 | 3,580 | 4,061 |

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

## 40. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු හා ප්‍රතිපත්ති

### 40.1 විශ්ලේෂණය

සමූහය සිය මූල්‍ය උපකරණ භාවිතයේදී පහත සඳහන් අවදානම් වලට නිරාවරණය වේ.

ණය අවදානම
ද්‍රවශීලතා අවදාන
වෙළඳපල අවදානම

ඉහත දැක් වූ එක් එක් අවදානමට සමූහය නිරාවරණය වීම, සමූහයේ අරමුණු හා අවදානම් මැන දැක්වීම සහ කළමනාකරණය හා සමූහය විසින් ප්‍රාග්ධන කළමනාකරණය සඳහා වූ කාර්ය පරිපාටි හා කාර්ය ක්‍රම ගැන තොරතුරු මෙම සටහනෙන් ඉදිරිපත් කෙරේ.

### 40.2 අවදානම් කළමනාකරණ රාමුව

සමූහයේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීමේ හා සඵල අධීක්ෂණයේ සමස්ථ වගකීම රඳා පවතිනුයේ, අධ්‍යක්ෂක මණ්ඩලය මතය. සමූහයේ අවදානම් කළමනාකරණ කාර්ය පරිපාටි ස්ථාපිත කරනුයේ සමූහය විසින් මුහුණ දෙන අවදානම් සහගත තත්ත්වයන් හඳුනා ගෙන විශ්ලේෂණය කිරීමට, උචිත අවදානම් සීමාවන් හා පාලක නියම කිරීම, අවදානම් හා සීමාවන්ට අනුකූලවීම හා පසු විපරම් සඳහාය.

සමූහයේ අවදානම් සමූහයේ අවදානම් කළමනාකරණ කාර්ය පරිපාටිවලට අනුකූලව කළමනාකරණය විසින් පසුවිපරම් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය කනු ලබන අතර සමූහය විසින් මුහුණපානු ලබන අවදානම් වලට අදාළව අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රමාණවත්බව සමාලෝචනය කරනු ලබයි. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සමූහයේ අධ්‍යක්ෂවරුන්ගේ අධීක්ෂණ භූමිකාවට සහාය ලබා දෙයි.

### 40.3 ණය අවදානම

ණය අවදානම යනු මූල්‍ය වගකීමට සම්බන්ධව බැඳීමක් ඉටු කිරීමට අපොහොසත්වීම තුළින් මූල්‍ය කළමනාකරණයක එක් පාර්ශවයක් අනෙක් පාර්ශවයට මූල්‍ය පාඩුවක් ඇති කිරීමේ අවදානමයි.

**ලංකා විදුලිබල මණ්ඩලයේ හා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ ණය ප්‍රතිපත්තිය පහත දැක්වේ.**

බිල්පත් පියවීම සඳහා තොග පාරිභෝගිකයන්ට දින 15 ක ණය කාලසීමාවක් ලබා දෙන අතර ඉන්පසුව සැපයුම විසන්ධි කිරීමේ නිවේදනයක් නිකුත් කර නිවේදනයේ දින සිට වැඩිමනත් දින 10 ක් ලබා දේ. එයට අවනත නොවන්නේ නම් සැපයුම විසන්ධි කරනු ඇත.

බිල්පත් පියවීම සඳහා සාමාන්‍ය පාරිභෝගිකයන්ට දින 30 ණය කාල සීමාවක් ලබා දෙනු ඇත. මෙයින් අනතුරුව රතු නිවේදනයක් නිකුත් කර වැඩි මනත් දින 10 ක් ලබා දෙයි. දින 40 කින් පසුව එයට අවනත නොවන්නේ නම් සැපයුම විසන්ධි කිරීම පිණිස විසන්ධි කිරීමේ නියෝගයක් නිකුක් කරනු ඇත.

එක් එක් පාරිභෝගිකයාගේ ණය සුදුසුකම් සැලකිල්ලට ගනිමින් පහසුකම් ලබා දීමට පෙර ණය ලබා දීමේ යෝග්‍යතාවය විශ්ලේෂණය කරනු ලැබේ. සඵල පාලනය හා කාලීනව ණය ආපසු ලබා ගැනීම පිණිස ණයකරුවන්ගේ ණය වටිනාකමේ අනුව සිදු කෙරෙන විශ්ලේෂණයකින් ක්‍රියාත්මක කෙරෙන ප්‍රතිඵලදායි ණය පාලන ක්‍රියාවලියක් සමූහය විසින් ක්‍රියාවට නංවා ඇත

### 40.4 ද්‍රවශීලතා අවදානම

පැන නගින අවස්ථාවන්හිදීම සිය බැඳීම් සපුරාලීම පිණිස ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් නොතිබීම නිසා සමූහයේ ද්‍රවශීලතා අවදානම් අවස්ථාවන් ඇතිවේ. ආයෝජක, පාරිභෝගික හා සැපයුම්කරුගේ විශ්වාසය පළුදු වීම තුළින් සමූහයේ තරඟ කාරී තත්වය දුර්වල කරමින් ප්‍රමාණවත් ද්‍රවශීලතා සම්පත් නොතිබීම සමූහයේ මෙහෙයුම්වලට අහිතකර බලපෑමක් ඇති කළ හැකිය.

සියලුම ක්ෂේත්‍ර ආවරණය වන උපාය මාර්ගිකක්‍රියාකාරී ප්‍රාග්ධන කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක වන අතර එමගින් ලැබිය යුතු දෑ ඉතා සමීපව අධීක්ෂණය කර කාල පරාසය අවම කර ගැනීමට කටයුතු කෙරේ. විකුණුම්කරුවන් ප්‍රවේශමෙන් ඇගැයීම හා ප්‍රසම්පාදන උපාය මාර්ග තුලින් ලබා ගැනීම තහවුරු කරනු ලබන අතර උපරිම ණය කාල සීමාවක් ලබාගැනීමෙන් කාරක ප්‍රාග්ධන චක්‍රය ප්‍රශස්ථ මට්ටමට පවත්වා ගැනේ.

මෙහෙයුම් හා වෙනත් මූල්‍ය අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස කෙටි හා මධ්‍ය කාලීන මූල්‍ය උපකරණයන්හි ආයෝජනය කිරීම මගින් සමූහය විසින් සිය ද්‍රවශීලත්වය පවත්වා ගෙන යයි. සහනදායී පොලී අනුපාත මත අයිරා සීමාවන් වැඩි කර ගැනීම පිණිස බැංකුව සමග වන කතිකාවන් තුළින් කෙටි කාලීන ද්‍රවශීලතා ගැටළු ලිහිල් කරගනු ලැබේ. ප්‍රමාණවත් ලෙස ද්‍රවශීලතා වත්කම් නොතිබීම තුලින් සමූහයේ මෙහෙයුම් කටයුතු වලට අහිතකර බලපෑමක් ඇති කල හැකි අතර එමගින් ආයෝජක, පාරිභෝගික හා සැපයුම්කරුවන්ගේ විශ්වාසය පළුදු වී තරඟකාරිත්වය දුර්වල විය හැකිය.

### 40.5 වෙළඳපල අවදානම

,වෙළඳපල අවදානම යනු වෙළඳපල මිල ගණන්වල වෙනස්වීම් නිසා මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහයන්හි සාධාරණ අගය උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපල අවධානම, මුදල් අවධානම හා පොළී අනුපාත අවධානමෙන් සමන්විත වේ. වෙළඳපොල අවධානමෙන් බලපෑමට ලක්වන මූල්‍ය උපකරණවලට පොළී සහිත ණය ගැනීම්, තැන්පතු හා විකිණීමට තිබෙන ආයෝජන ඇතුළත් වේ.

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

**40.5.1 විදේශීය ව්‍යවහාර මුදල් අවදානම**

ව්‍යාපාර සමූහයට අයත් ආයතනයන් හී භාවිතයේ පවත්නා අදාල ව්‍යවහාර මුදල් වලට ඇතුලත් නොවන යම් ව්‍යාවහාර මුදලකින් සිදු කෙරෙන විකුණුම් / මිලදී ගැනීම් වලදී සමූහය ව්‍යවහාර මුදල් අවදානමට අනාවෘතවේ. මෙම ගනුදෙනු ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද ඩොලර් හෝ යුරෝ ව්‍යවහාර මුදල් මගින් නියම කෙරේ. යම් කාලපරාසයක් තුල සිදුවන විනිමය අනුපාත ගනුදෙනුවලට එරෙහිව අභ්‍යන්තර වශයෙන් ආරක්ෂක පියවර ගනිමින් එම ව්‍යාපාර සමූහය විසින් ව්‍යවහාර මුදල් කෙරේ ඇති අවධානම අවම කෙරේ. ගෙවීම් කිරීමට අවශ්‍ය වන එසේ ගෙවීමට සිදුවන විට එම ගෙවීම සිදු කිරීම සඳහා උපයෝගී කර ගැනීම පිණිස අනාගත ගෙවීම් වලට සමාන වන මුදල් ප්‍රමාණයක් කෙටිකාලීන ආදායම් උත්පාදන මෙවලම් වලට යොදනු ලබයි.

**40.5.2 පොලී අනුපාත අවදානම**

පොලී අනුපාත අවදානම යනු වෙළඳපල පොලී අනුපාතයන්හි වෙනස්වීම නිසා මූල්‍ය උපකරණයක අනාගත මුදල් ප්‍රවාහයන්ගේ සාධාරණ අගය උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපල පොලී අනුපාතයන් වෙනස්වීමේ අවදානමට සමූහය නිරාවරණය වීම මූලික වශයෙන් අදාළ වන්නේ පාවෙන පොලී අනුපාත සහිත සමූහයේ දීර්ඝ කාලීන ණය බැඳීම්වලටය. සමූහය විසින් ලබාගන්නා ණය මුදල්වල පොලී අවදානම සමූහය මගින් කළමනාකරණය කරනුයේ, ස්ථාවර හා පාවෙන පොළී අනුපාත වලින් සම්මිශ්‍රණයවූ ණය ලබාගැනීමේ මෙන්ම තැන්පතු ද පවත්වා ගෙන යාමෙන් වන අතර එමගින් වෙළඳපොල පොළී අනුපාත උච්චාවචනයෙන් ආවරණය කෙරේ. පොලී අනුපාතයන් අවම කිරීම පිණිස රජයේ ආයතනයක් වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් වාසිදායක පොලී අනුපාත සඳහා බැංකුව සමග කතිකාවත් පවත්වයි.

**41 සාධාරණ අගය**

වර්තමාන ගණුදෙනුවකදී මිනුම්කරණ දිනයට පෙළඹවීමකින් හෝ බලහත්කාරයෙන් තොරව කැමැත්තෙන් සිටින පාර්ශ්වයන් අතර මූල්‍ය වත්කම් පැවරීමට හෝ වගකීම් බේරුම් කිරීමට ගෙවන වටිනාකම මගින් මූල්‍ය වත්කම් හා වගකීම් වල සාධාරණ අගය සමන්විත වේ.

සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා පහත සඳහන් ක්‍රම සහ උපකල්පන භාවිතා කරන ලදී:

අ) මුදල් හා මුදල් සමාන දෑ, වෙළඳ ලැබිය යුතු, වෙළඳ ගෙවිය යුතු, බැංකු අයිරා සහ අනෙකුත් ජංගම වගකීම් වල පවතින කෙටිකාලිනව කල් පිරීම් ස්වභාවය හේතුවෙන් ඒවා ධාරණ අගයට මිනුම් කිරීමට කළමණාකරණය කටයුතු කරන ලදි.

ආ) පොලී අනුපාත, නිශ්චිත අවධානම් සාධක, එක් එක් ගනුදෙනුකරුගේ ණය සුදුසුකම් සහ මූල්‍යනය කරනු ලබන ව්‍යාපෘතියේ අවදානම වැනි සාධක මත පදනම්ව සමූහය විසින් දිගු කාලීන ස්ථාවර අනුපාත යටතේ සහ විචල්‍ය අනුපාත යටතේ ලැබිය යුතු දේ අගයකරනු ලැබීය. එසේ කරනු ලැබූ ඇගයීම මත පදනම්ව ලැබිය යුතු දේවල අපේක්ෂිත අලාභ සඳහා දීමනා සැලකිල්ලට ගනී. ඒ අනුව 2022 දෙසැම්බර් 31 වන විට, එවැනි ලැබිය යුතු දේ, සහ ශුද්ධ දීමනාවල ධාරණ අගය ඒවායේ ගණනය කරන ලද සාධාරණ අගයන්ගෙන් ප්‍රමාණාත්මකව වෙනස් නොවීය.

**41.1 සාධාරණ අගයට මිණුම්කරණය කරන ලද මූල්‍ය කාර්යසාධනපත්‍ර**

සාධාරණ අගයට මිණුම්කරණය කරන ලද පහත දැක්වෙන මූල්‍ය කාර්යසාධන පත්‍ර සමූහය සතුවේ.

**මූල්‍ය වත්කම්**

වෙනත් විස්තීරණ ආදායම් යටතේ සාධාරණ අගය හදුනා ගනු ලබන මූල්‍ය වත්කම්(සටහන් 15)

ලාභ/ අලාභ ප්‍රකාශය යටතේ සාධාරණ අගය හදුනා ගනු ලබන මූල්‍ය වත්කම්(සටහන් 15)

**41.2 සාධාරණ අගයට මිණුම්කරණය නොකරන ලද මූල්‍ය කාර්යසාධනපත්‍ර**

මූල්‍ය ප්‍රකාශනයන්හී සාධාරණ අගයට මිණුම්කරණය කර දක්වා නොමැති මූල්‍ය කාර්යසාධනපත්‍ර වල ධාරණ අගය හා සාධාරණ අගය අතර සැසදීමක් පහතින් දක්වා ඇති අතර එහි ධාරණ අගය ආසන්න වශයෙන් සාධාරණ අගයට සමාන වන කාර්ය සාධන පත්‍රවල වල තොරතුරු ඇතුලත් නොවේ. තවද මූල්‍ය නොවන වත්කම් හා වගකීම් වල සාධාරණ අගයද මේ සඳහා සැළකිල්ලට ගෙන නොමැත.

| | ධාරණ අගය | | සාධාරණ අගය | |
|---|---|---|---|---|
| | 2022 | 2021 | 2022 | 2021 |
| නැවත ගෙවිය යුතු තැම්පතු | 127,828 | 82,646 | 127,828 | 82,646 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | 17,798,879 | 23,500,045 | 17,798,879 | 23,500,045 |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් වල ආයෝජන | 5,616,938 | 3,350,369 | 5,616,938 | 3,350,369 |
| වෙනත් තැන්පතුවල ආයෝජනය | 71,399 | 125,945 | 71,399 | 125,945 |
| සමාගම් නිලධාරීන්ට ණය | 9,077,306 | 10,519,701 | 9,077,306 | 10,519,701 |
| පාරිභෝගිකයන්ට ණය | 283,404 | 1,237,538 | 283,404 | 1,237,538 |
| ණයකර සඳහා ආයෝජනය කිරීම | 55,034 | 62,406 | 55,034 | 54,828 |
| | 33,030,788 | 38,878,650 | 33,030,788 | 38,871,072 |

සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් දහස් ගණනින් දක්වා ඇත

**41.3 සාධාරණ අගය ධුරාවලිය**

ලයිස්තුගත මිල ගණන් හෝ නිරීක්ෂණය කළ හැකි මිල කරන ක්‍රමයන් භාවිතා කරමින් සාධාරණ අගයන් තීරණය කරනු ලබන සියලුම මූල්‍ය උපකරණ සඳහා ස්වාධීන මිල තීරණය කිරීම් හෝ වලංගු කිරීම් ලබා ගනී. ක්‍රියාකාරී වෙළඳපොලක වෙළඳ මිලක් සෘජුවම නිරීක්ෂණය කළ නොහැකි විය හැකිය. මෙම තත්වයන් තුළ,, සමූහය මූල්‍ය උපකරණ වල සාධාරණ වටිනාකම නිර්ණය කිරීම සඳහා වඩාත් අදාළ හා විශ්වාසදායක යැයි සැලකෙන තොරතුරු වලට වැඩි බරක් ලබා දෙමින් විකල්ප වෙළඳපල තොරතුරු භාවිතා කරයි.

පහත දැක්වෙන අනුපිළිවලට සාධාරණ අගය නිර්ණය කරනු ලබයි

පියවර 1 : සමාන වත්කම් හෝ වගකීම් සඳහා සක්‍රිය වෙළඳපලවල ලයිස්තුගත මිල ගණන් (සකස් නොකළ)

පියවර 2 : වාර්තා කරනු ලබන සාධාරණ වටිනාකම නිරීක්ෂණය කිරීමේදී සෘජුව හෝ වක්‍රව සැලකිය යුතු බලපෑමක් කල හැකි වෙනත් තක්සේරුකරණ ක්‍රම

පියවර 3 : වාර්තා කරනු ලබන සාධාරණ වටිනාකම නිරීක්ෂණය කිරීමේදී සෘජුව හෝ වක්‍රව සැලකිය යුතු බලපෑමක් කල නොහැකි වෙනත් තක්සේරුකරණ ක්‍රම

2020 දෙසැම්බර් 31 දින වන විට සමූහය විසින් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය තුල සාධාරණ අගයට හඳුනාගෙන ඇති මූල්‍ය උපකරණ පහත පරිදිවේ

| සාධාරණ අගයට මිණුම් කරන ලද වත්කම් | තක්සේරු දිනය | 2022 | පියවර 1 | පියවර 2 | පියවර 3 |
|---|---|---|---|---|---|
| **වෙනත් විස්තීරණ ආදායම් යටතේ සාධාරණ අගය හඳුනා ගනු ලබන මූල්‍ය වත්කම්** | | | | | |
| ලයිත්තුගත නොකරන ලද ස්කන්ධ ප්‍රග්ධනය | 31-Dec-22 | 15,343,010 | - | - | 15,343,010 |
| **ලාභ/ අලාභ ප්‍රකාශය යටතේ සාධාරණ අගය හඳුනා ගනු ලබන මූල්‍ය වත්කම්** | | | | | |
| ප්‍රාග්ධන සුරකුම්පත් වල ආයෝජන | 31-Dec-22 | 77,994 | 77,994 | - | - |
| **සාධාරණ අගය හෙළිදරව් කරන වත්කම්** | | | | | |
| සාධාරණ අගය හෙළිදරව් කරන වත්කම් | 31-Dec-22 | 55,034 | - | 55,034 | - |

**සාධාරණ අගය විස්තීර්ණ ආදායම තුලින් ගලපනු ලබන මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේදී භාවිතා කරනු ලබන වැදගත් නිරීක්ෂණය කල නොහැකි යෙදවුම් පිළිබඳ විස්තර**

**ලංකා විදුලි(පුද්ගලික) සමාගම**

ලයිස්තුගත නොකල කොටස් වල ආයෝජනවල සාධාරණ වටිනාකම වෙළඳපල බහුවිධ ක්‍රමවේදය භාවිතයෙන් තක්සේරු කර ඇත. මෙම ක්‍රමය යටතේ ව්‍යාපාරයේ අපේක්ෂිත අනාගත ඉපැයීම් සුදුසු ගුණිතයක් භාවිතයෙන් ගුණකර එය ව්‍යාපාරයේ වටිනාකම ලෙස ප්‍රාග්ධණිතකරයි. සමාගම පොළී හා බදු පෙර ලාභය ඉපැයීමේ පදනම ලෙස භාවිතා කරයි. වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමේ සාධාරණ වටිනාකම සමාලෝචනය කිරීමේදී එක හා සමාන ව්‍යාපාර ස්වභාවයක් ඇති ආයතන අධ්‍යනය කිරීමට අවධානය යොමු කරන ලදී. එහිදී ආසියානු කලාපයේ පොසිල ඉන්ධන භාවිතා කරමින් විදුලිය සැපයීමට සම්බන්ධ ලැයිස්තුගත සමාගම් විශ්ලේෂණය කරන ලද අතර මෙහෙයුම් වල ස්වභාවය සහ ආයතනවල විශාලත්වය මත පදනම්ව මෙම තක්සේරු කිරීම් සිදුකරන ලදී.

වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) ලිමිටඩ් හි සුළු කොටස් අයිතියක් පැවතීම හේතුවෙන් කළමනාකරණයට ව්‍යාපාරයේ අභ්‍යන්තර තොරතුරු සඳහා සෘජුවම ප්‍රවේශ විය නොහැක. කෙසේ වෙතත්, කර්මාන්තයේ ස්වභාවය සහ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමේ පොදු ලක්ෂණ සලකා බැලීමේදී, වත්කම් හා වගකීම්වල වෙළඳපල වටිනාකම් 2019 දෙසැම්බර් 31 දිනට වාර්තා කර ඇති ධාරණ වටිනාකමට සමාන යැයි උපකල්පනය කෙරේ. සමාගම වෙස්ට් කෝස්ට් පවර් පුද්ගලික සමාගමේ සම කොටස් අයිතියෙන් 18.8% ක් හිමිකරගෙන ඇත.

**එල්ටීඑල් හොල්ඩින්ස් (පුද්) සාමාගම**

වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතයෙන් ලයිස්තුගත නොකරන ලද සාමාන්‍ය කොටස්වල සාධාරණ අගයන් තක්සේරු කර ඇත. තක්සේරු කිරීම සඳහා පුරෝකථනය කල මුදල් ප්‍රවාහ සහ වට්ටම් අනුපාතය ආදිය පිළිබද උපකල්පන කළමණාකරණය විසින් සිදුකරනු ලැබේ. පරාසයක් තුළ ඇති විවිධ ඇස්තමේන්තු වල සම්භාවිතාව සාධාරණ ලෙස තක්සේරු කරමින් කළමනාකරණය ඇස්තමේන්තුගත සාධාරණ ආයෝජනය වටිනාකම් නිර්ණය කරනු ලැබේ.

# ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

පී.ඩබ්ලිව්.ආර්/ඒ/සී.ඊ.බී/සී.එෆ්.ඒ/1/22/51

2023 දෙසැම්බර් 29

සභාපති

ලංකා විදුලිබල මණ්ඩලය

**ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම්වල 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

ලංකා විදුලිබල මණ්ඩලයේ ("මණ්ඩලය") සහ එහි පරිපාලිත සමාගම්වල ("සමූහය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. පරිපාලිත සමාගම් වන එල්.ටී.එල් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් සහ ට්‍රින්කොමලී පවර් කම්පැනි ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගම් විසින් විගණනය කරන ලදි.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1.1 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පහත සඳහන් සමාගම්වල මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය කළ මතය පහත සඳහන් නිරීක්ෂණයන් මත පදනම්ව මා විසින් ප්‍රකාශ කරන ලදි.

**(අ) සී ස ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම**

(i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වැට් බදු ශේෂය රු. මිලියන 1,436.33 ක් වූ අතර ඒ අනුව 2017/2018, 2018/2019 සහ 2019/2020 තක්සේරු වර්ෂ සඳහා ගෙවිය යුතු දඩ මුදල රු. මිලියන 1,436.33 ක් විය. කෙසේවෙතත්, ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයෙහි (එල්.කේ.ඒ.එස් 12) 88 වන ඡේදයට අනුව, මෙම ගෙවිය යුතු දඩ මුදල මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. තවද, ඉහත සඳහන් ගෙවිය යුතු බදු මුදල් සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි.

(ii) එස්.එල්.එෆ්.ආර්.එස් 9, මූල්‍ය සාධන පත්‍ර ප්‍රමිතයෙහි 5.5.15 (අ) ඡේදයට අනුව, එස්.එල්.එෆ්.ආර්.එස් 9 හි විෂය පථය තුළ සිදුවන ගනුදෙනු හේතුවෙන් ඇති වන වෙළඳ ලැබිය යුතු මුදල් හෝ කොන්ත්‍රාත්තු වත්කම්වලට ජීවිත කාලය පුරා අපේක්ෂිත ණය පාඩුවලට සමාන අගයකට ආයතනයක් සෑම විටම පාඩු දීමනාව මනිනු ලැබිය යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1,095.6 ක් වූ දිගුකාලීන හිඟ වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රමිතියට අනුව ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(iii) ගල් අඟුරු ආනයනය කිරීමේදී, ඇත්ත වශයෙන්ම නොදරන ලද රේගු අරමුණු සඳහා වටිනාකම නිශ්චය කිරීමේ සාම්ප්‍රදායික ගැලපීමක් ලෙස රේගුවේදී සියයට 10 ක අංකිත මිලක් (mark-up) වටිනකමට එකතු කර තිබුණි. කෙසේ වෙතත්, සමාගම විසින් රු. මිලියන 9,419.6 ක් වූ සියයට 10 ක අංකිත මිල සමාලෝචිත වර්ෂයේ ආදායමට එකතු කර තිබූ අතර එම මුදල ණයගැතියන්ට දුන් වට්ටමක් ලෙස හඳුනාගෙන විකුණුම් පිරිවැයට ගලපා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විකුණුම් පිරිවැය හා ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(iv) පවතින තොරතුරුවලට අනුව, 2016 සැප්තැම්බර් 19 සිට 2018 අප්‍රේල් 09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම ප්‍රකාශයට පත් නොකිරීම මත රු. මිලියන 205 ක දඩ මුදලක් ශ්‍රී ලංකා රේගුවට සමාගම විසින් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. 2019 දී ගෙවන ලද දඩ මුදල අදාළ වර්ෂයේ වියදමට ගිණුම්ගත කිරීම වෙනුවට ශ්‍රී ලංකා රේගු වැට් ගිණුමට, වැට් පාලන ගිණුමට සහ සී.එස්.සී.එල් වගකීම් ගිණුමට ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රඳවා ගත් ඉපැයීම් රු. මිලියන 205 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර ශ්‍රී ලංකා රේගු වැට් ගිණුම, වැට් පාලන ගිණුම සහ සී.එස්.සී.එල් වගකීම් ගිණුම පිළිවෙලින් රු. මිලියන 158.2 කින්, රු. මිලියන 39.97 කින් සහ රු. මිලියන 6.8 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(v) සමාගම විසින් අංක 123 දරන නැව්ගත තොගය සඳහා රේගු වැට් බදු වශයෙන් රු. මිලියන 136.2 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, රේගුවට භාණ්ඩ ප්‍රකාශයට පත් කිරීමේ ලේඛනයට (Cusdec) අනුව, තථ්‍ය වැට් බදු මුදල රු. මිලියන 106.97 ක් විය. ඒ අනුව, සමාගම වැඩිපුර රු. මිලියන 29.2 ක් ගෙවා ඇති බව නිරීක්ෂණය වූ අතර ගෙවිය යුතු හිඟ ශේෂයට එරෙහිව එම මුදල හිලව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(vi) සමාලෝචිත වර්ෂය අවසානයේදී මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂ හතරක වටිනාකම රු. මිලියන 273.3 ක් වූ අතර ඊට අනුරූප ගෙවිය යුතු ශේෂයන් 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි. ඒ අනුව, එම ලැබිය යුතු ශේෂවල නිරවද්‍යතාවය සහ පැවැත්ම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(vii) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු ශේෂය රු. මිලියන 547.7 ක් වූ අතර සීමාසහිත ලංකා නැව් සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද තහවුරු කිරීම් අනුව එය රු. මිලියන 1,271.9 ක් විය. ඒ අනුව, රු. මිලියන 724.2 ක වෙනසක් නිරීක්ෂණය විය.

(viii) සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට ලිබර්ටි කොමඩිටීස් ලිමිටඩ් වෙතින් සහ විවිධ ණය ගැතියන්ගෙන් ලැබිය යුතු එස්.ජී.එස් ගාස්තුවලින් සියයට 50 ක් වන පිළිවෙළින් රු. මිලියන 8 ක් සහ රු. මිලියන 9.8 ක් සම්බන්ධ අදාළ ලේඛනමය සාක්ෂි විගණනය සඳහා ලැබී නොතිබුණු අතර වෙළඳ ණයහිමියන්ට සහ එස්.ජී.එස් ලංකා පුද්ගලික සමාගමට ගෙවිය යුතු ශේෂයන් වන පිළිවෙලින් රු.මිලියන 87.9 ක් සහ රු. මිලියන 12.2 ක් සම්බන්ධ අදාළ ලේඛනමය සාක්ෂිද විගණනය සඳහා ලැබී නොතිබුණි.

### (ආ) සී ස ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්.) සමාගම

(i) එල්.කේ.ඒ.එස් 08, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රමිතියෙහි 42 වැනි ඡේදයේ විධිවිධාන අනුව මූල්‍ය ප්‍රකාශනවල පූර්ව වර්ෂයේ ගැලපීම් සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී පෙර කාලපරිච්ඡේදවලට අදාළව රු. මිලියන 7.39 ක සමහර පරිපාලනමය සහ සෘජු වියදම් හඳුනාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි.

(ii) එල්.කේ.ඒ.එස් 16, දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතියෙහි 51 ඡේදය අනුව වත්කම්වල සුන්බුන් අගය සහ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කිරීමට පියවර නොගෙන රු. මිලියන 79.5 ක ඉන්ජෙක්ෂන් මෝල්ඩින් යන්ත්‍රය ඇතුළුව රු. මිලියන 100.08 ක සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්, සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට සමාගම විසින් භාවිතා කර තිබුණි.

(iii) සමාගම ගලිගමුව ඉඩම සඳහා 2017 ජූලි 07 දින සිට වසර 35 ක් සඳහා බදු ගිවිසුමකට එළැඹ තිබුණි. කෙසේ වෙතත්, එස්.එල්.එෆ්.ආර්.එස් 16, කල්බදු ප්‍රමිතිය ප්‍රකාරව සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල එම කල්බද්දට අදාළව භාවිතා කිරීමට අයිතිය ඇති වත්කම සහ කල්බදු වගකීම හඳුනාගෙන නොතිබුණි.

(iv) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට මව් සමාගම වන මණ්ඩලයෙන් අයවිය යුතු වෙළඳ ලැබිය යුතු මුදල් ශේෂය රු. මිලියන 165.31 ක් විය. කෙසේ වෙතත්, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඊට අනුරූප ගෙවිය යුතු ශේෂය රු. මිලියන 28.21 ක් පමණක් වීමෙන් රු. මිලියන 137.1 ක වෙනසක් නිරීක්ෂණය විය.

(v) සමාලෝචිත වර්ෂය අවසානයේ දී පවා ගෙවිය යුතු ආදායම් බද්දට එරෙහිව සමාගම විසින් රු. මිලියන 2.12 ක් වූ දිගුකාලීන රඳවාගැනීමේ බදු ලැබිය යුතු ශේෂයට හිමිකම් පෑ නොතිබුණි. තවද, රඳවාගැනීමේ බදු සහතික විගණනය සඳහා ලැබී නොතිබුණි.

(vi) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට පුද්ගලික වාණිජ බැංකුවකින් ලබාගත් කාලීන ණය 06 ක මුළු ණය ශේෂය රු. මිලියන 80.86 ක් වූ අතර ශේෂය තහවුරු කිරීමට අනුව, ණය ශේෂය රු. මිලියන 87.65 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන සහ ශේෂය තහවුරු කිරීම අතර රු. මිලියන 6.78 ක වෙනසක් නිරීක්ෂණය විය.

(vii) 2019 වසරේ සිට එකතු වී ඇති සහ මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු මුදල් යටතේ පෙන්වා ඇති රු. මිලියන 7.06 ක හඳුනා නොගත් තැන්පතු හඳුනා ගැනීමට සමාගම නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(viii) 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ආදායම් බද්ද රු. මිලියන 30.77 ක් වූ අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ ආදායම් බදු වාර්තා අනුව (2020/2021 තක්සේරු වර්ෂය දක්වා), එම කාලයට අදාළව ගෙවිය යුතු ආදායම් බද්ද රු. මිලියන 15.2 ක් විය. ඒ අනුව, රු. මිලියන 15.57 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැලපීම් සිදු කර නොතිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ආදායම් බදු ශේෂය රු. මිලියන 43.88 ක් වූ අතර සමාගම 2015/2016 තක්සේරු වර්ෂයේ සිට ආදායම් බදු ගෙවා නොතිබුණි.

(ix) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට තොගය රු. මිලියන 39.22 ක් විය. වසර අවසන් වූ දිනට පසු දිනට පද්ධතිය විසින් ලබා දී ඇති අනුපාතවලට අනුව හරිත සාමාන්‍ය පිරිවැය භාවිතා කරමින් මෙම ශේෂයට එළඹී තිබුණි. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති තොග ශේෂයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය.

**(ඈ) සී ස ලංකා විදුලි (පුද්.) සමාගම**

(i) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුවේ 5.5 ඡේදයට අනුව, ගනුදෙනු හෝ වෙනත් සිදුවීම්වලින් පැන නගින වත්කම් හෝ වගකීම් මූලික වශයෙන් හඳුනා ගැනීම, ආදායම් සහ ඒ ආශ්‍රිත වියදම් යන දෙකම එකවර හඳුනා ගැනීමට හේතු විය හැක. ආදායම සහ ඒ ආශ්‍රිත වියදම් එකවර හඳුනා ගැනීම සමහර විට ආදායම සමඟ වියදම් ගැලපීම ලෙස හැඳින්වේ. කෙසේ වෙතත්, සමාගම විසින් 2017, 2018, 2019, 2020 සහ 2022 යන කාලපරිච්ඡේදය තුළ සූර්ය බලශක්තිය මිලදී ගත් පිරිවැය (ශුද්ධ ගිණුම්කරණය සහ නෙට් ප්ලස්) වූ රු. මිලියන 2,819.6 ක් අදාළ වර්ෂවල විකුණුම් පිරිවැය ලෙස හඳුනාගෙන නොතිබුණද (ඒ වෙනුවට, සමාගම විසින් එම පිරිවැය මණ්ඩලයෙන් ලැබිය යුතු ලෙස හඳුනාගෙන තිබුණි.) මිලදී ගත් සූර්ය බලශක්තියේ විකුණුම් ආදායම අදාළ වර්ෂවල විකුණුම් ලෙස හඳුනාගෙන තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2022 දෙසැම්බර් 31 දිනට රඳවා ගත් ඉපැයීම්, වර්ෂය සඳහා ලාභය සහ ලැබිය යුතු ශේෂය පිළිවෙලින් රු. මිලියන 1,336.9 කින්, රු. මිලියන 1,482.7 කින් සහ රු. මිලියන 2,819.6 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) එල්.කේ.ඒ.එස් 16, දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතියෙහි 51 වන වගන්තියට අනුව, වත්කම්වල සුන්බුන් අගය සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම්, වෙනස්කම් එල්.කේ.ඒ.එස් 8 ට අනුකූලව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතුය. 2022 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් භාවිතා කරනු ලබන රු. මිලියන 9,554.6 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් ඒ අනුව සමාලෝචනය කර නොතිබුණි.

(iii) 2022 දෙසැම්බර් 31 දිනට විවිධ සේවා සඳහා මණ්ඩලයෙන් අයවිය යුතු ශේෂය රු. මිලියන 2,826.6 ක් වූ අතර, මෙම ශේෂය ශුද්ධ ගිණුම්කරණය සහ නෙට් ප්ලස් ක්‍රම භාවිතා කරමින් 2017, 2018, 2019, 2020 සහ 2022 වර්ෂවලදී බලශක්තිය මිලදී ගැනීමේ පිරිවැය සඳහා මණ්ඩලයෙන් අයවිය යුතු රු. මිලියන 2,819.6 කින් සමන්විත විය. මණ්ඩලයේ ශේෂය තහවුරු කිරීම අනුව, සමාගමට ගෙවිය යුතු මුදලක් නොතිබූ අතර ශුද්ධ ගිණුම්කරණය සහ නෙට් ප්ලස් ක්‍රම භාවිතා කරමින් විදුලිය මිලදී ගැනීම සඳහා පාර්ශව දෙක අතර විධිමත් ගිවිසුමක් නොතිබුණි. එබැවින්, එම ශේෂයේ අයකර ගැනීමේ හැකියාව විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද, ඉහත ලැබිය යුතු ශේෂය සඳහා සමාගම විසින් රු. මිලියන 2,449.3 ක හානිකරණ ප්‍රතිපාදනයක් සලසා තිබුණි.

(iv) මණ්ඩලයේ ප්‍රාථමික උපපොළවල් ඉදිකිරීම සඳහා භාවිතා කිරීමට නියමිත ඉඩම් සහ ගොඩනැගිලි මිලදී ගැනීම සඳහා සමාගම රු. මිලියන 206.9 ක් වැය කර තිබූ අතර එම මුදල 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස සටහන් කර තිබුණි. කෙසේවෙතත්, සමාගමේ ඉඩම්වල ප්‍රාථමික උපපොළවල් ඉදිකිරීම සහ ඉහත සඳහන් ඉඩම් සහ

ගොඩනැගිලි භාවිතය සඳහා මණ්ඩලය විසින් ගෙවිය යුතු ගාස්තු සම්බන්ධයෙන් සමාගම සහ මණ්ඩලය අතර විධිමත් ගිවිසුමක් නොතිබුණි.

(v) ස්වයං ජනනය සඳහා මණ්ඩලයෙන් ලැබිය යුතු රු. මිලියන 3.9 ක ලැබිය යුතු ශේෂය වසර පහකට වැඩි කාලයක් තිස්සේ අය නොවී පැවතුණි. ස්වයං ජනනය සම්බන්ධයෙන් සමාගම සහ මණ්ඩලය අතර විධිමත් ගිවිසුමක් නොතිබූ අතර, එම මුදල සඳහා ශේෂ තහවුරු කිරීම විගණනයට ලැබී නොතිබුණි. එබැවින්, එම ශේෂයේ අයකර ගැනීමේ හැකියාව විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.

(vi) මිලදී ගැනීමේ විචල්‍යතා ගිණුමේ, මිලදී ගැනීමේ ඇණවුමේ වටිනාකම සහ තථ්‍ය ගෙවීම අතර වෙනස හඳුනාගෙන තිබුණි. ඒ අනුව, අදාළ පරිදි තොග, වත්කම් හෝ ලාභ හෝ අලාභ ලෙස හඳුනා ගැනීම වෙනුවට මෙහෙයුම් වියදම් ලෙස රු. මිලියන 149.2 ක මුදලක් ලාභ හෝ අලාභවලට අය කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ඉහත ගැලපීම හේතුවෙන් ලාභය හෝ අලාභයට, තොගවලට හෝ වත්කම්වලට වන බලපෑම විගණනයට බැහැර කළ නොහැක.

(vii) 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6.7 ක් වූ හඳුනා නොගත් තැන්පතු විවිධ ණය හිමියන්ට ඇතුළත් කර තිබුණි.

(viii) මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට කැලණිය, මොරටුව, නුගේගොඩ සහ මීගමුව ශාඛාවල කෙරීගෙන යන වැඩවල ශේෂය පිළිවෙලින් රු. මිලියන 45.7 ක්, රු. මිලියන 56 ක්, රු. මිලියන 183.5 ක් සහ රු. මිලියන 41.3 ක් විය. කෙසේ වෙතත්, කෙරීගෙන යන ප්‍රාග්ධන කාර්යයන් පිළිබඳ වාර්තාවට අනුව, ඉහත ශේෂයන් පිළිවෙලින් රු. මිලියන 43.8 ක්, රු. මිලියන 55.3 ක්, රු. මිලියන 181.7 ක් සහ රු. මිලියන 46.7 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල සහ කෙරීගෙන යන ප්‍රාග්ධන කාර්යයන් පිළිබඳ වාර්තාවේ පෙන්වා ඇති ශේෂයන් අතර පිළිවෙලින් රු. මිලියන 1.9 ක, රු. මිලියන 0.7 ක, රු. මිලියන 1.8 ක සහ රු. මිලියන 5.4 ක වෙනස්කම් පැවතුණි.

(ix) 2022 සැප්තැම්බර් 15 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා රු. බිලියන 1.9 ක භාණ්ඩාගාර බැඳුම්කරයට අදාළ රු. මිලියන 3.3 ක භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීමේ වට්ටම් ක්‍රමක්ෂය කිරීම වැරදි ලෙස සටහන් කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2022 දෙසැම්බර් 31 දිනට පොලී ආදායම රු. මිලියන 6.6 කින් අඩුවෙන් දක්වා තිබූ අතර භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන ගිණුමද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(x) සමාගම 2022 වර්ෂය සඳහා ඒකාකාර ජාතික ගාස්තු ගැලපීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. කෙසේ වෙතත්, තොරතුරු නොමැතිකම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයට ඇති බලපෑම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(xi) 2022 දෙසැම්බර් 31 දිනට ලංකා බ්‍රෝඩ් බෑන්ඩ් නෙට්වර්ක් ප්‍රයිවට් ලිමිටඩ් හි සාමාන්‍ය කොටස්වල සිදු කරන ලද රු. මිලියන 5 ක ආයෝජනය සම්බන්ධයෙන් කොටස් සහතික හෝ වෙනත් ප්‍රමාණවත් ලේඛනමය සාක්ෂි විගණනයට ලැබී නොතිබුණි.

(xii) 2022 දෙසැම්බර් 31 දිනට විදුලිය මිලදී ගැනීම් සඳහා මණ්ඩලයට ගෙවිය යුතු ශේෂය රු. මිලියන 1,799.3 ක් වුව ද, මණ්ඩලයේ ශේෂය තහවුරු කිරීමට අනුව, අනුරූප ලැබිය යුතු ශේෂය රු. මිලියන 2,912.7 ක් විය. 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සහ ශේෂය තහවුරු කිරීම අතර රු.මිලියන 1,113.4 ක වෙනසක් නිරීක්ෂණය වී ඇත.

(xiii) 2022 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව හඳුනා නොගත් රු. මිලියන 16.2 ක් වූ බැංකු තැන්පතු සහ බැංකු ගිණුමට හර කර ඇති හඳුනා නොගත් රු. මිලියන 6.2 ක් නිරවුල් කිරීමට සමාගම කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ඉන් රු. මිලියන 14.3 ක් සහ රු. මිලියන 5 ක් පිළිවෙලින් මාස 06 ට වැඩි ය. තවද, එම හඳුනා නොගත් බැංකු තැන්පතු සහ හර කර ඇති මුදල් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(xiv) 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 5.9 ක් වූ නොසැසඳුණු හර ශේෂය වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ශේෂයට ඇතුළත් කර තිබුණි.

(xv) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ඇන්ටේ ලෙකෝ මීටරින් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් වෙත ගෙවිය යුතු ශේෂය රු. මිලියන 38.6 ක් විය. ඇන්ටේ ලෙකෝ මීටරින් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර ඇති ලෙකෝ වෙතින් ලැබිය යුතු අනුරූප ශේෂය රු. මිලියන 22.8 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට සමාගම් දෙක අතර රු. මිලියන 15.8 ක වෙනසක් නිරීක්ෂණය විය.

(xvi) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ඇන්ටේ ලෙකෝ මීටරින් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් වෙත ලබා දී ඇති අත්තිකාරම් මුදල රු. මිලියන 136.3 ක් විය. කෙසේ වෙතත්, ඇන්ටේ ලෙකෝ මීටරින් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශනවලට අනුව, අනුරූප ශේෂය රු. මිලියන 113.3 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට සමාගම් දෙක අතර රු. මිලියන 23 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.2.2 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (එස්.එල්.ඒ.එස්/ එස්.එල්.එෆ්.ආර්.එස්) සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

**(අ) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුව**

(i) සංකල්ප රාමුවේ 4.1 (ආ) ඡේදයට පටහැනිව, වෙනම ආයතනයක් ලෙස මණ්ඩලය යටතේ මෙහෙයවන සේවක අර්ථසාධක අරමුදලේ වියදම වූ රු. මිලියන 51.82 ක් මණ්ඩලයේ වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගෙන තිබුණි.

(ii) සංකල්ප රාමුවේ 4.3 ඡේදයට පටහැනිව, අයිතිය මණ්ඩලය සතු වත්කම් කාණ්ඩ හතරකට අදාළ රු. මිලියන 7.06 ක් වූ ස්ථාවර වත්කම් අයිතම පනස් නවයක් ඉහත සඳහන් සේවක අර්ථසාධක අරමුදල් ඒකකය විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණි.

**(ආ) එල්.කේ.ඒ.එස් 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

(i) ප්‍රමිතියේ 69 වැනි ඡේදයට පටහැනිව, රු. මිලියන 139.48 ක් වූ තොග ගැලපුම් ගිණුමේ හර ශේෂය තොග ශේෂය යටතේ පෙන්වීම වෙනුවට ජංගම වගකීම් යටතේ අනෙකුත් ගෙවිය යුතු ශේෂයට එරෙහිව හිලව් කර තිබුණි.

(ii) සිදු කරන ලද නියදි පරීක්ෂාවට අනුව, වැඩිපුර ගෙවීම ආදිය හේතුවෙන් හටගත් බෙදාහැරීමේ අංශය 01 යටතේ කොළඹ නගර කලාපයට අදාළව අවසන් කළ සාමාන්‍ය ණය ගැතියන් තුළ පැවති රු. මිලියන 41.58 ක අසාමාන්‍ය බැර ශේෂය සහ බෙදාහැරීමේ අංශවල අවසන් කළ තොග ණය ගැතියන් තුළ පැවති රු. මිලියන 13.16 ක අසාමාන්‍ය බැර ශේෂය විමර්ශනය කර පියවීමට හෝ මණ්ඩලයේ ආදායමට ගැනීමට පියවර ගැනීම වෙනුවට ප්‍රමිතියේ 32 වැනි ඡේදයට පටහැනිව ලැබිය යුතු මුදල්වලට එරෙහිව හිලව් කර තිබුණි.

**(ඇ) එල්.කේ.ඒ.එස් 2 - තොග සහ එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ**

ඉහත ප්‍රමිතිවල විධිවිධාන අනුව තථ්‍ය පිරිවැය යොදා ගැනීම වෙනුවට සිය ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන්හි පොදු කාර්ය පිරිවැය තක්සේරු කිරීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පිළිවෙලින් එකතුව රු. බිලියන 2.93 ක් සහ රු. බිලියන 6.54 ක් වූ හිතකර පොදු කාර්ය අනුපාත විචලනයක් සහ අමුද්‍රව්‍ය මිල විචලනයක් පැවති බව හෙළිදරව් විය. එසේම, එකතුව රු. බිලියන 6.57 ක් වූ අහිතකර ගබඩා මිළ විචලනයක් පැවතුණි. ඒ අනුව, එම කාර්යයන්වලට අදාළ අවශ්‍ය තොරතුරු විගණන සඳහා ලැබී නොමැතිවීම හේතුවෙන් එමගින් මූල්‍ය ප්‍රකාශනවල මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම් සහ ස්කන්ධයට වන බලපෑම නිවැරදිව තහවුරු කර ගැනීමට නොහැකි විය.

**(ඈ) එල්.කේ.ඒ.එස් 8-ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි**

(i) දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 16) 51 වැනි ඡේදයට අනුව, වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම්, වෙනස්කම් එල්.කේ.ඒ.එස් 08 අනුව ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට තවමත් භාවිතා කරනු ලබන රු. බිලියන 211.81 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතියේ 41 සහ 42 ඡේදවලට පටහැනිව, පසුගිය වසරවල ව්‍යාපෘති 12 කට අදාළව කෙරීගෙන යන වැඩ ලෙස හඳුනාගෙන තිබූ රු. බිලියන 1.47 ක ශුද්ධ විනිමය අලාභයක් අතීතයානුයෝගීව ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ අලාභයට අය කිරීම මගින් නිවැරදි කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා අලාභය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(iii) 2020 සිට 2022 දක්වා කාලය තුළදී මණ්ඩලය විසින් වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම වෙත කේ.වී 220 යටතේ සැපයූ රු. බිලියන 1.83 ක් වූ විදුලි බලශක්තියේ පිරිවැය, සමාගමෙන් විදුලිය මිලදී ගැනීම වෙනුවෙන් මණ්ඩලයට ලැබෙන සෑම මාසික ඉන්වොයිසියකින්ම අඩු කර තිබුණු අතර ශුද්ධ ඉන්වොයිසි වටිනාකම මිලදී ගත් විදුලි බලශක්තියේ පිරිවැය ලෙස ගිණුම්ගත කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේදී, ප්‍රමිතියේ 41 සහ 42 ඡේදවලට අනුව 2020 සහ 2021 වර්ෂ තුළදී සැපයූ රු. මිලියන 530.95 ක විදුලි බලශක්තියේ පිරිවැය අතීතයානුයෝගීව ගැලපීම වෙනුවට රු. බිලියන 1.83 ක මුළු මුදල තාප බලශක්ති මිලදී ගැනීමේ ගිණුමට (විකුණුම් පිරිවැය) හර කර, මණ්ඩලයේ බෙදාහැරීමේ අංශය 2 යටතේ බස්නාහිර පළාත උතුරට ගෙවිය යුතු ලෙස වෙළඳ ගෙවිය යුතු ගිණුමට බැර කර තිබුණි. තවද, 2022 දෙසැම්බර් 31 දිනට එම මුදල මණ්ඩලයේ බෙදාහැරීමේ අංශය 2 හි ලැබිය යුතු මුදලක් ලෙස දක්වා නොතිබුණි.

**(ඉ) එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ**

වත්කම් කළමනාකරණ අංශයේ රු. මිලියන 4.92 ක් වටිනා කාර්යාල උපකරණ අයිතම සහ මූල්‍ය අංශයේ රු. මිලියන 12.34 ක් වටිනා වත්කම් භෞතිකව නොපවතින, හානි වී ඇති, භාවිතා කළ නොහැකි සහ අක්‍රිය ලෙස පවතින බව පිළිවෙලින් 2021 වර්ෂයේදී සහ 2022 වර්ෂයේදී සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානයේදී ගිණුම් පොත්වල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඊ) එල්.කේ.ඒ.එස් 20 - රාජ්‍ය ප්‍රදානයන් සඳහා ගිණුම්කරණය සහ රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම**

ණය ආපසු ගෙවීමේ වගකීම ශ්‍රී ලංකා රජයට පැවරී ඇති (මණ්ඩලය සමඟ උප ණය ගිවිසුම් නොමැත) ශ්‍රී ලංකා රජය සහ විදේශ ණය දෙන ආයතන දෙකක් විසින් එළැඹි විදේශ ණය ගිවිසුම් යටතේ ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට මණ්ඩලය වෙත ලැබුණු රු. බිලියන 40.9 ක මුදලක් ප්‍රමිතියේ 3 වන ඡේදය අනුව රජයේ ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට මණ්ඩලයේ පොලී දරන ණය සහ ණය ගැනීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඊට අමතරව, අනුබද්ධ ණය ගිවිසුම් ප්‍රකාරව ණය මුදල් ලැබීම් ස්කන්ධය වශයෙන් මණ්ඩලයට ලබා දීමට රජය විසින් එකඟ වී තිබුණු තවත් ව්‍යාපෘති දෙකකට අදාළව ශ්‍රී ලංකා රජය සහ විදේශ ණය දෙන ආයතන දෙකක් විසින් එළැඹි විදේශ ණය ගිවිසුම් යටතේ මණ්ඩලය වෙත ලැබුණු රු. බිලියන 8.2 ක මුදලක් මණ්ඩලයේ පොලී දරන ණය සහ ණය ගැනීම් ලෙසද පෙන්වා තිබුණි.

**(උ) එල්.කේ.ඒ.එස් 21 - විදේශ විනිමය අනුපාතයන්හි වෙනස්කම්වල බලපෑම්**

ප්‍රමිතියේ 23 (අ) වගන්තියට අනුව, වාර්තාකරණ කාල සීමාව අවසානයේදී අවසාන විනිමය අනුපාතය භාවිතා කරමින් විදේශ විනිමය මූල්‍ය අයිතම පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘති හතරකට අදාළව මණ්ඩලය විසින් සෘජුවම ලබා ගත් විදේශ මුදලින් නාමනය කරන ලද ණය හයක වටිනාකම අවසාන විනිමය අනුපාත භාවිතා කරමින් මණ්ඩලය විසින් පරිවර්තනය කර නොතිබූ අතර ඒ අනුව ප්‍රමිතියේ 28 වගන්තියට අනුව මූල්‍ය ප්‍රකාශනවල විදේශ විනිමය ලාභයක්/අලාභයක් හඳුනාගෙන නොතිබුණි. කෙසේ වෙතත්, ඉහත ණය හයෙන් ණය දෙකක් සඳහා ලද ශේෂ තහවුරු කිරීම්වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී පොලී දරන ණය ශේෂය සහ වර්ෂය සඳහා අලාභය දළ වශයෙන් රු. මිලියන 6,485 කින් අඩුවෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය විය.

**(ඌ) එස්.එල්.එෆ්.ආර්.එස් 09 - මූල්‍ය සාධන පත්‍ර**

(i) මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.4.5.4 සහ වෙළඳ ණය ගැතියන් සඳහා හානිකරණ ප්‍රතිපාදන සැලසීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2023 පෙබරවාරි 02 දිනැති ගිණුම් චක්‍රලේඛ අංක 610 අනුව, වසර 1 කට වඩා වැඩි හිඟ ශේෂ සහිත වෙළෙඳ ණය ගැතියන් සඳහා සියයට සියක ප්‍රතිපාදන සැලසිය යුතුය. කෙසේ වෙතත්, බෙදාහැරීමේ අංශ 03 හි පළාත් 4 කට අදාළව වසරකට වැඩි හිඟ ශේෂ සහිත වෙළෙඳ ණය ගැතියන්ගේ ශේෂ සඳහා රු. මිලියන 10.28 ක ඌන වෙන්කිරීමක් සහ රු. මිලියන 56.59 ක අධි වෙන්කිරීමක් සිදු කර තිබූ බව නිරීක්ෂණය විය. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා අලාභය රු. මිලියන 46.31 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) අපේක්ෂිත ණය පාඩු සැලකිල්ලට ගනිමින් සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට පාරිභෝගිකයින්ට ලබා දී ඇති රු. මිලියන 250 ක් වූ ණය සඳහා හානිකරණ ප්‍රතිපාදන සලසා නොතිබුණි. තවද, සමස්ත පාරිභෝගික ණයවලින් රු. මිලියන 196.87 ක් හෙවත් සියයට 79 ක් වසර 5 කට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පවතින බව නිරීක්ෂණය විය.

(iii) මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.4.5.2 ප්‍රකාරව, වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල්, ගනුදෙනුකරුවන්ට ලබා දෙන ණය සහ සේවකයන්ට ලබා දෙන ණයවලින් සමන්විත වන මණ්ඩලයේ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ පසුකාලීනව මනිනු ලබයි. වෙළඳ ණයගැතියන්ගේ අපේක්ෂිත ණය පාඩු හඳුනා ගැනීම සඳහා මණ්ඩලය විසින් නිශ්චිත ප්‍රවේශයක් සහ ක්‍රමවේදයක් හඳුන්වා දී තිබුණද, විවිධ ණයගැතියන්, පූජනීය ස්ථානවලින් අයවිය යුතු මුදල් ආදිය ඇතුළත් අනෙකුත් ණයගැතියන් සඳහා නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. ඒ අනුව, රු. මිලියන 208.06 ක් වූ බෙදාහැරීමේ අංශය 01 හි සහ රු. මිලියන 49.24 ක් වූ බෙදා හැරීමේ අංශය 04 හි වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතු අනෙකුත් ණයගැතියන් සඳහා පිළිවෙලින් රු.මිලියන 33.95 ට සමාන මුදලක් සහ රු. මිලියන 3.1 ට සමාන මුදලක් පමණක් හානිකරණ ප්‍රතිපාදන ලෙස සලසා තිබුණි. කෙසේ වෙතත්, රු. මිලියන 148.47 ක් වූ බෙදාහැරීමේ අංශය 02 හි සහ රු. මිලියන 66.6 ක් වූ බෙදාහැරීමේ අංශය 03 හි වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතු ශේෂ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. එලෙසම, රු. මිලියන 300.24 ක් වූ වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතු අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා අපේක්ෂිත ණය පාඩු නිසි ලෙස හඳුනා ගැනීමෙන් තොරව රු. මිලියන 64.31 ට සමාන මුදලක් පමණක් හානිකරණ ප්‍රතිපාදන ලෙස සලසා තිබුණි. මෙම නිරීක්ෂණ හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මූල්‍ය වත්කම්වල ධාරණ අගයේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(iv) මණ්ඩලයේ සම්ප්‍රේෂණ අංශයේ විවිධ ණයගැතියන් ලෙස රු. බිලියන 1.38 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණු අතර එයින් රු. බිලියන 1.37 ක් ඒ්ඒස් කැළණිතිස්ස (පුද්.) සමාගම වෙතින් 2011 වර්ෂයේ සිට අයවිය යුතුව පැවතුණි. කෙසේ වෙතත්, ඉහත ප්‍රමිතියට අනුව අපේක්ෂිත ණය පාඩු නිසි ලෙස හඳුනා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට රු. 563,330 ක් පමණක් හානිකරණ ප්‍රතිපාදන ලෙස සලසා තිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) තොග හිඟයට අදාළ රු. මිලියන 162.5 ක හර ශේෂයක් සහ තොග අතිරික්තයට අදාළ රු. මිලියන 70.3 ක බැර ශේෂයක් නිරවුල් නොකර වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ තොග ගැලපුම් ගිණුමේ පැවතුණි.

(ආ) හිමිකම් කිව හැකි කාල සීමාව ඉක්ම වූ 2016/17 තක්සේරු වර්ෂයේ සිට 2019/20 තක්සේරු වර්ෂය දක්වා ගෙවන ලද රු. බිලියන 3.91 ක් වූ ආර්ථික සේවා ගාස්තුව (ඊ.එස්.සී) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වර්ෂය ආරම්භයේදී රඳවාගත් අලාභය සහ සමාලෝචිත වර්ෂය සඳහා වූ අලාභය පිළිවෙලින් රු. බිලියන 2.7 කින් සහ රු. බිලියන 1.21 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සම්පූර්ණ කරන ලද රු. බිලියන 16.9 ක් වටිනා කාර්යයන් 11,429 ක් බෙදාහැරීමේ අංශවල අදාළ වත්කම් ගිණුම්වලට මාරු නොකර වසර දෙකකට වඩා වැඩි කාලයක් තිස්සේ කෙරීගෙන යන වැඩ ගිණුමේ පවතී. තවද, වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ වත්කම් කළමනාකරණ අංශයේ කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබූ රු. මිලියන 6.2 ක් වටිනා සම්පූර්ණ කරන ලද කාර්යයන් තුනක් ප්‍රාග්ධනීකරණය කිරීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත්, එම වත්කම්වලට අදාළව ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වන අලාභයට එමගින් ඇති කරන බලපෑම තොරතුරු නොමැතිකම හේතුවෙන් තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඈ) අසාමාන්‍ය බැර ශේෂයන් හිලව් කිරීම හේතුවෙන් බෙදාහැරීමේ අංශවල කෙරීගෙන යන වැඩ ශේෂය රු. මිලියන 12.82 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2018 වසරේ නිම කර තිබූ ගම්පහ ප්‍රදේශයේ ඉංජිනේරු කාර්යාලය ඉදිකිරීම සඳහා වැය වූ රු. මිලියන 107.47 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ප්‍රාග්ධනීකරණය කිරීමට කටයුතු කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබුණි. තවද, විගණනය මගින් කරන ලද ගණනය කිරීම්වලට අනුව, නිම කළ වර්ෂයේ සිට ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් රඳවාගත් අලාභය සහ සමාලෝචිත වර්ෂය සඳහා අලාභය පිළිවෙළින් රු. මිලියන 9.12 කින් සහ රු. මිලියන 2.69 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය (ii) සඳහා මිලදී ගත් රු. මිලියන 124.30 ක් වටිනා වාහන හතරක් 2014 වර්ෂයේදී ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුවද ප්‍රාග්ධනීකරණය කර නොතිබුණු අතර ඒ වෙනුවට එම මුදල කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබුණි. තවද, ව්‍යාපෘතිය නිම කළ දින සිට එම වාහනවලට අදාළව ක්ෂයවීම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. ඊට අමතරව වර්ෂය අවසන් වන විටත් මෙම වාහනවල අයිතිය මණ්ඩලයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) මණ්ඩලය විසින් 2019, 2020 සහ 2021 වර්ෂවලට අදාළව 2021 සහ 2022 වසරවල මූල්‍ය ප්‍රකාශනවල පූර්ව වර්ෂ ගැලපීම් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් 2021 වසර අවසන් වන දිනට රඳවා ගත් අලාභය රු. බිලියන 89.6 කින් විකෘති වී තිබුණි. එබැවින් ඉදිරි වර්ෂවලදී සමාලෝචිත වර්ෂය සඳහා වන ලාභයට ගැලපීම් කිරීමට ඇති හැකියාව විගණනයේදී බැහැර කළ නොහැක.

(ඌ) වයඹ පළාත 2 හි අසාමාන්‍ය බැර ශේෂයන් හිලව් කිරීම හේතුවෙන් බෙදාහැරීමේ අංශය 01 හි පාරිභෝගිකයින් සඳහා ණය ශේෂය රු. මිලියන 23.97 කින් අඩු දක්වා තිබුණි.

(එ) රු. මිලියන 89.57 ක් වූ මාර්ගස්ථ තොග ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ පියවීමට නිසි ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව ගිණුම් පොත්වල පවතුණි. බෙදාහැරීමේ අංශය 01 හි රු. මිලියන 65.26 ක් වූ මාර්ගස්ථ තොග ශේෂය අතරින් රු. මිලියන 60.38 ක් ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් ලිමිටඩ් වෙත ගැල්වනයිස් කිරීම සඳහා වසර 5 කට පෙර යවා ඇති ට්‍රාන්ස්ෆෝමර්ස් නියෝජනය කරන නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒවා නැවත ලැබී නොතිබුණි.

(ඒ) බෙදාහැරීමේ අංශය 03 යටතේ ඇති ආයතනික කාර්යාලයේ සහ සබරගමුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ මාර්ග ස්ථ තොග ශේෂයේ එකතුව රු. මිලියන 26.97 ක අසාමාන්‍ය බැර ශේෂයක් නිරීක්ෂණය විය.

(ඔ) 2002 වර්ෂයේ සිට පියවීමකින් තොරව පැවතුණු බෙදාහැරීමේ අංශය 01 හි සහ බෙදාහැරීමේ අංශය 02 හි අන්තර් අංශවල ජංගම ගිණුමේ රු. මිලියන 557.94 ක හර ශේෂයක් සහ රු. මිලියන 556.81 ක බැර ශේෂයක් විමර්ශනය කර පියවීමකින් තොරව 2004 වර්ෂයේදී ණයගැති පාලන ගිණුමට මාරු කර තිබුණි.

(ඕ) 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 19/2622/113/074 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලක්විජය බලාගාරය ව්‍යාප්ති ව්‍යාපෘතිය සඳහා මණ්ඩලය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 167.31 ක වියදමක් දැරීමෙන් අනතුරුව, 2021 ජූලි 26 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව 2021 ඔක්තෝබර් 26 දින ව්‍යාපෘතිය වසා දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන තිබුණි. කෙසේ වෙතත්, කපා හැරීමට කටයුතු කිරීමෙන් තොරව හෝ මූල්‍ය ප්‍රකාශනවල කිසියම් ප්‍රතිපාදනයක් සැලසීමෙන් තොරව 2022 දෙසැම්බර් 31 දින වන විටත් රු. මිලියන 167.62 ක මුදල කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ යටතේ පැවතුණි.

(ක) ලක්විජය විදුලි බලාගාරයේ වත්කම් ලේඛනයේ වාහන 23 ක වටිනාකම සහ එහි සමුච්චිත ක්ෂයවීම් සටහන් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස තොරතුරු නොමැතිකම හේතුවෙන් ඒවා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ග) 2022 පෙබරවාරි 15 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2267/13 දරන ගැසට් නිවේදනයට අනුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද ඉන්වොයිසිවලට අනුව, 2022 වර්ෂය සඳහා බෙදාහැරීමේ අංශ, ජනන අංශය සහ සම්ප්‍රේෂණ අංශයට අදාළ වාර්ෂික නියාමන ගාස්තු රු. මිලියන 209.68 කි. කෙසේ වෙතත්, රු. මිලියන 167.25 ක් පමණක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබූ අතර ඒ අනුව රු. මිලියන 42.43 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ච) රු. බිලියන 63.54 ක් වටිනා වේලි වැඩ, උමං වැඩ, ටේල් රේස් වැඩ සහ ප්‍රවේශ ඇල, මහවැලි සංකීර්ණයේ දේපළ පිරියත හා උපකරණවල සිවිල් වැඩ යටතේ පෙන්වා තිබුණි. කෙසේ වෙතත්, තොරතුරු නොමැතිකම හේතුවෙන් එම මුදලේ නිරවද්‍යතාවය සහ අදාළ වත්කම් සම්බන්ධව මණ්ඩලයට ඇති හිමිකම පිළිබඳව විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ජ) 2018 වර්ෂයේ සිට පැවෙත එන මහජන බැංකුවේ අංක 85135 දරන ගිණුමට අදාළව රු. මිලියන 7.29 ක් වූ සෘජු බැංකු බැර කිරීම් විමර්ශනය කිරීමට හා නිසි ගිණුම්වලට ගිණුම්ගත කිරීමට කටයුතු කිරීමෙන් තොරව තාවකාලිකව මාර්ගස්ථ ගිණුමට මාරු කර තිබුණි.

(ට) සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමේ 5.2 (ආ) ඡේදයට අනුව, මණ්ඩලය විසින් නියමිත දිනට එනම් මණ්ඩලය බලාගාරයේ සවිකර ඇති මීටරය කියවූ දින සිට දින තිහක් ගත වූ දිනට හෝ ඊට පෙර විකුණුම්කරුට ගෙවිය යුතු අතර නියමිත දිනට පසු නොගෙවූ ඕනෑම අවිවාදිත මුදලක් සඳහා මාසික පදනමින් එකතු කරන ලද ප්‍රාථමික පොලී අනුපාතයට පොලී ගෙවිය යුතුය. කෙසේ වෙතත්, නියමිත දිනට ඉන්වොයිසි නොපියවීමේ ප්‍රතිඵලයක් ලෙස 2023 අගෝස්තු 31 වන විට විදුලිබල නිෂ්පාදකයින් 310 දෙනෙකු වෙත රු. බිලියන 26.9 ක මුදලක් ගෙවීමට ඇති බව නිරීක්ෂණය විය. තවද, කලින් කලට මණ්ඩලයට ඉන්වොයිසි ඉදිරිපත් කරමින් විදුලිබල නිෂ්පාදකයින් විසින් නියමිත දිනට පසු නොගෙවූ ශේෂයන් සඳහා පොලී ඉල්ලා තිබූ බව නිරීක්ෂණය වූ අතර විදුලිබල නිෂ්පාදකයින් විසින් විදුලිබල මණ්ඩලයට ඉදිරිපත් කර ඇති විගණනයට ලැබුණු ඉන්වොයිසිවලට අනුව 2019 අප්‍රේල් සිට 2023 අප්‍රේල් දක්වා කාලයට අදාළව විදුලිබල නිෂ්පාදකයින් 109 දෙනෙකු විසින් නොගෙවූ ශේෂයන් සඳහා පොලී ලෙස රු. බිලියන 2.6 ක් ඉල්ලා තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානයේදී පවා විදුලිබල නිෂ්පාදකයින් විසින් ඉල්ලා සිටි කිසිදු පොලී මුදලක් මණ්ඩලය විසින් ගෙවා නොමැති බවත් ගෙවිය යුතු පොළිය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් මණ්ඩලයේ ගිණුම් පොත්වල සලසා නොතිබූ බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

### 1.2.2.3 නොසැසඳූ වෙනස්කම්

(අ) 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ලෙස දක්වා ඇති ශේෂය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල එදිනට ලැබිය යුතු ලෙස දැක්වෙන ශේෂය අතර රු. බිලියන 4.62 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, ඉහත ශේෂය තුළ 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 753.61 ක විවාදිත ශේෂයක් පැවතී අතර මෙය 2013 සිට අඛණ්ඩව විගණන වාර්තාවල අවධාරණය කර තිබුණි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 22 වන දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ පැවති රැස්වීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව 2013 අප්‍රේල් 19 න් පසුව ගෙවිය යුතු රු. මිලියන 330 ක පොලී සංරචකය (ආසන්න වශයෙන්) මණ්ඩලය විසින් දරන ලෙස නිර්දේශ කර තිබුණි. කෙසේ වෙතත්, 2023 මාර්තු මාසය අවසන් වන විටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට සහ ඒ අනුව කටයුතු කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති විදුලිබල සැපයුමේ චිරස්ථායීතාවය වැඩිදියුණු කිරීමට සහය වීමේ ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ ශේෂය සහ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අනුරූප ශේෂයන් අතර රු. බිලියන 4.49 ක සමස්ත වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) බෙදාහැරීම් අංශය 1 හි හඳුනා නොගත් රු. මිලියන 423.76 ක ණයගැති ශේෂයක් 2012 වසරේ සිට අයනොවී පවතී. කෙසේ වෙතත්, එයින් රු. මිලියන 185.41 ක මුදලක් බලපෑමට ලක් වූ තනි ණයගැති ගිණුම් විමර්ශනය කර ගැලපීමෙන් තොරව 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා බෙදාහැරීමේ අංශවල ණයගැති පාලන ගිණුම්, වෙනත් වගකීම් ගිණුම් ආදිය වෙත මාරු කර තිබුණි.

(ඈ) බිල්පත් ක්‍රමයට අනුව තොග ණයගැතියන්ගේ සහ සාමාන්‍ය ණයගැතියන්ගේ ශේෂයන් සහ සමහර පිරිවැය මධ්‍යස්ථානවලට අදාළ බිල්පත් ණයගැතියන් ලෙස සැසඳීමේ ප්‍රකාශනය වෙත ගෙන ඇති ශේෂය අතර යම් වෙනස්කම් නිරීක්ෂණය විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා තොග ණයගැතියන් සහ සාමාන්‍ය ණයගැතියන්ට අදාළව පිළිවෙළින් රු. මිලියන 5.28 ක සහ රු. මිලියන 423.85 ක වෙනස්කමක් නිරීක්ෂණය විය. ඒ අනුව, වෙළඳ ණයගැතියන්ගේ නිරවද්‍යතාවය විගණනයේදී සාධාරණ ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඉ) 2022 දෙසැම්බර් 31 දිනට එකතු කිරීමේ පාලන ගිණුමේ රු. මිලියන 278.54 ක හර ශේෂයක් සහ රු. බිලියන 1.52 ක බැර ශේෂයක් පැවතුණි. කෙසේ වෙතත්, නිරවුල් නොවූ රු. මිලියන 273.32 ක හර ශේෂයන් සහ රු. මිලියන 913.25 ක බැර ශේෂයන් සැසඳීම විගණනය සඳහා ලැබී නොතිබුණි. එබැවින්, එකතු කිරීමේ පාලන ගිණුමේ ශේෂවල නිරවද්‍යතාවය විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. නිරවුල් කිරීමට නිසි ක්‍රියාමාර්ග නොගෙන රු. මිලියන 38.05 ක හඳුනා නොගත් ආරම්භක බැර ශේෂයක් සහ වසරකට වැඩි කාලයක් තිස්සේ පැවති රු. මිලියන 3.14 ක හර ශේෂයක් සහ රු. මිලියන 3.44 ක බැර ශේෂයක්ද (හඳුනා නොගත් ආරම්භක බැර ශේෂය හැර) එකතු කිරීමේ පාලන ගිණුමේ ඇතුළත් වී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඊ) 1998 සිට 2021 දක්වා කාලය තුළදී ණයගැතියන්ගෙන් එකතු කරන ලද රු. මිලියන 68.99 ක් නිරවුල් කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග නොගෙන අවිනිශ්චිත ගිණුමට ඇතුළත් කර තිබුණි.

(උ) බස්නාහිර පළාත දකුණ II (බෙදාහැරීමේ අංශය 03) ට අදාළව විමර්ශනය කර අයකර ගැනීමට පියවර ගැනීමෙන් තොරව විදුලිය සැපයීම වෙනුවෙන් සෝජිට්ස් කැළණිතිස්ස පුද්. සමාගම වෙතින් රු. මිලියන 38.76 ක් 2019 වර්ෂයේ සිට අයවිය යුතුව පැවතුණි. කෙසේ වෙතත්, සමාගමේ වාර්තාවලට අනුව, එය මණ්ඩලයට ගෙවිය යුතු ලෙසට වාර්තා කර නොතිබුණි.

(ඌ) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට කැලණිතිස්ස ෆ්රේම් V ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියට (860.25) අදාළව රු. මිලියන 752.22 ට සමාන මුදලක් කෙරීගෙන යන වැඩ ගිණුමේ පවතී. කෙසේ වෙතත්, ජනන ව්‍යාපෘති ශාඛාවේ පවත්වාගෙන යන වාර්තාවලට අනුව, එය රු. මිලියන 992.77 ක් වූ අතර එම නිසා රු. මිලියන 240.55 ක නොසැසඳු වෙනසක් නිරීක්ෂණය විය.

(එ) මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය මගින් සිදු කරන ලද කාර්යයන්ට අදාළව රාජ්‍ය ආයතන දෙකකින් ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් මණ්ඩලයේ වාර්තා සහ අදාළ රාජ්‍ය ආයතනවල ගිණුම් පොත් අතර රු. මිලියන 22.24 ක සමස්ත වෙනසක් නිරීක්ෂණය විය.

(ඒ) මණ්ඩලයේ ගිණුම් පොත්වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට මහා භාණ්ඩාගාරයේ දායක ප්‍රාග්ධනය ලෙස රු. බිලියන 865.16 ක මුදලක් පෙන්වා තිබුණි. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරයේ වාර්තාවලට අනුව, රු. බිලියන 864.14 ට සමාන මුදලක් මණ්ඩලයට ලබා දෙන ලද ප්‍රාග්ධන දායකත්වය ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය අවසානයේ දී රු. බිලියන 1.01 ක සමස්ත වෙනසක් නිරීක්ෂණය විය.

(ඔ) මණ්ඩලයේ ගිණුම් පොත්වල දැක්වෙන ශේෂ සහ අදාළ සමාගම්වල මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූප ශේෂ අතර සම්බන්ධිත පාර්ශවවලින් ලැබිය යුතු සහ සම්බන්ධිත පාර්ශවවලට ගෙවිය යුතු පිළිවෙළින් රු. මිලියන 1,126.29 ක සහ රු. මිලියන 447.78 ක සමස්ත නොසැසඳු වෙනස්කම් නිරීක්ෂණය විය.

#### 1.2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

මණ්ඩලය විසින් සෘජුවම ලබාගත් විදේශ ණය හතරක ණය ශේෂ තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනවලට අනුව මෙම ණයවල මුළු හිඟ මුදල රු. මිලියන 55,078.65 ක් විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලය සහ සමූහය විසින් මණ්ඩලයේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතුනිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැළසුම් කිරීම පිණිස මණ්ඩලයේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත මාගේ නිගමන පදනම් වී ඇත. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදි. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා අප වගකිව යුතුය. මාගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති නිරීක්ෂණ ඡේද අංක 1.2.2.1 (අ), (ඇ), (ඈ) (i), (ඉ), 1.2.2.2 (අ), (ආ), (ඇ), (ඈ), (ඊ), (ඔ), (ඕ), (ක), (ච), 1.2.2.3 (අ), (ඇ), (ඈ), (ඉ), (ඊ) සහ (උ) හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.1 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සමඟ සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| (i) | (අ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත | |
| (ii) | 7 (1) සහ 43 (1) වගන්තිය | නියාමකයෙන් බලය ලබා නොගෙන, උත්පාදන බලපත්‍රය කල් ඉකුත් වී ඇති ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් තිදෙනෙකුගෙන් (අයි.පී.පී) සමාලෝචිත වර්ෂය තුළදී රු. බිලියන 5.07 ක් වූ ගිගාවෝට් 60.33 ක බලශක්ති මිලදී ගෙන තිබුණි. |
| (iii) | 28 (3) වගන්තිය | පනතේ නිශ්චිතව දක්වා ඇති පරිදි මණ්ඩලය විසින් පාරිභෝගික තැන්පතු සඳහා පොලී ගෙවා හෝ ඒ සඳහා ගිණුම් පොත්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලද අනුපාතය මත පදනම්ව විගණනය විසින් කරන ලද ගණනය කිරීම්වලට අනුව, ඒ සඳහා ගෙවිය යුතු පොලිය රු. මිලියන 976 ක් වූ අතර ඒ අනුව 2022 දෙසැම්බර් 31 වන දිනට නොගෙවූ සමුච්චිත පොලිය රු. බිලියන 9.06 ක් විය. |
| | (ආ) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13(1)(ඇ) (i) (ආ) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද විදුලි සම්ප්‍රේෂණ සහ තොග සැපයුම් බලපත්‍රයේ 30 වන කොන්දේසියේ 10 වන උපවගන්තිය | කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව, සමාලෝචිත වර්ෂය තුළදී ජනවාරි 06 සිට අප්‍රේල් 04 දක්වා වූ දින 11 ක් ඇතුළතදී පැය 9 යි විනාඩි 30 ක කාලයක් විදුලිය අත්හිටුවීමට මණ්ඩලය විසින් කටයුතු කර තිබුණි. |
| | (i) 3.5 වගන්තිය | 2022 දෙසැම්බර් 31 දින වන විට රේඛීය අමාත්‍යාංශයට මුදා හරින ලද සේවකයින් 33 දෙනෙකුට වැටුප් සහ දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය විසින් රු. මිලියන 51.91 ක් ගෙවා තිබුණි. ඒ අනුව, 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා පමණක් නිදහස් කරන ලද සේවකයින් සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් රු. මිලියන 236.26 ක් මණ්ඩලයට ප්‍රතිපූරණය කළ යුතුය. |

| | |
|---|---|
| (ii) 6.6 වගන්තිය | 2022 වර්ෂය සඳහා වූ මණ්ඩලයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) 7.7 වගන්තිය | අවම වශයෙන් කාර්තුමය වශයෙන් පරිපාලිත ආයතනවල කාර්ය සාධනය පිළිබඳව සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට භාරකාර රාජකාරියක් තිබුණද, 2023 අප්‍රේල් මාසය අවසන් වන විටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පරිපාලිත ආයතන සමාලෝචන කිරීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ඈ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනතේ 47 වන වගන්තිය සහ කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් 2015 සැප්තැම්බර් 12 දිනැති සිය ලිපියෙන් විගණකාධිපතිවරයා වෙත කරන ලද පැහැදිලි කිරීම | ප්‍රතිපාදනයට පටහැනිව, ඉපැයීම් ගණනය කිරීමේදී රදවා ගැනීමේ දීමනාව, පශ්චාත් උපාධි දීමනාව සහ වෘත්තීය දීමනාව /අර්ධ වෘත්තීය දීමනාව යන දිමනා අතුරින් ඉහළම දීමනාව මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන තිබුණි. |
| (ඉ) 2007 ජනවාරි 10 දින වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම සමඟ එළඹී විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුමේ 6.1.3 වගන්තිය | කිලෝවොට් 220 ක ධාරිතාවක් යටතේ සපයන විදුලිබලයට අදාළ වන නියම හා කොන්දේසි නොමැති නම්, කිලෝවොට් 220 ක ධාරිතාවක් යටතේ මණ්ඩලය විසින් වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගමට සපයනු ලබන විදුලිබල ශක්තිය, විදුලිබල පිරිවැය යටතේ අය කර යුතු වේ. කෙසේවෙතත්, ධාරිතා ගාස්තුව සහ අනෙකුත් ගාස්තු නොසලකා සමාගමට මණ්ඩලය විසින් සපයනු ලබන විදුලිබල ශක්තියේ අනුපාතය ගණනය කිරීම සඳහා මණ්ඩලය විසින් බලශක්ති ගාස්තුව පමණක් සැලකිල්ලට ගෙන තිබුණි. |
| (ඊ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන චක්‍රලේඛය සහ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 9.1 වගන්තිය | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන විශ්‍රාමික සේවකයින් දෙදෙනෙකු මණ්ඩලයේ උපදේශකයින් ලෙස පත් කර තිබූ අතර ඔවුන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා උපදේශන ගාස්තු ලෙස රු. මිලියන 1.2 ක මුදලක් ගෙවා තිබුණි. |
| (උ) 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායක බදු පනතේ V වන කොටසෙහි 17 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ සිව්වන කාර්තුව සඳහා ලංකා විදුලි සමාග මට විදුලිය සැපයීමේදී අය කරන ලද රු. මිලියන 223.31 ක සමාජ ආරක්ෂණ දායක බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත 2023 අප්‍රේල් මාසය අවසන් වන විටත් ගෙවා නොතිබුණි. |
| (ඌ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාරිභෝගික සේවා) විසින් නිකුත් කරන ලද 1998 මාර්තු 31 දිනැති ඩීජීඑම්(සීඑස්)/චක්‍රලේඛ අංක 1998-4 | විසන්ධි කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත, නීතිමය අංශය මගින් හිඟ ණයගැති ශේෂය අයකර ගැනීමට නීතිමය පියවර ගත යුතුය. කෙසේ වෙතත්, නියදි විගණන පරීක්ෂණයට අනුව, කොළඹ නගර කලාපයට අදාළව එකතුව රු. මිලියන 272.15 ක් වූ හිඟ ණයගැති (අවසන් කළ) ශේෂය අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. |
| (එ) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සියයට 10 සිට සියයට 14 දක්වා වූ පරාසයක පොලී අනුපාත යටතේ වාහන ණය ලබා දිය යුතුය. කෙසේවෙතත්, මණ්ඩලයේ ද්‍රවශීලතා ගැටලු සලකා බැලීමකින් තොරව මණ්ඩලය විසින් සියයට 4.2 ක පොලී අනුපාතයක් යටතේ වාහන ණය එහි සේවකයන් වෙත ලබා දී තිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) "ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ට දීමනා ගෙවීම"යන මාතෘකාව යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2007 ඔක්තෝබර් 31 දිනැති අංක 07/1955/332/045 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය, 2008 මාර්තු 31 දිනැති ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභා වාර්තාව සමඟ 2008 අප්‍රේල් 09 දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලා තිබුණු අතර අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් 2008 මාර්තු 31 දිනැති වාර්තාවේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව මේ සම්බන්ධයෙන් පත් කරන ලද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) එකී අමාත්‍ය මණ්ඩලය තීරණයට පටහැනිව, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද දීමනා ලැයිස්තුවට ඇතුළත් කර නොතිබූ ඉංජිනේරු දීමනාව, දිරි දීමනාව, තාවකාලික දීමනාව, සුදුසුකම් පදනම් කරගත් දිරි දීමනාව, ඕ.එච් සහ එස් දිරි දීමනාව, කාර්ය මණ්ඩල දීමනාව, සම්ප්‍රේෂණ සහ ජනන සැලසුම් දීමනාව, පද්ධති පාලන දීමනාව, දෙමළ භාෂා

දීමනාව සහ වෙනත් දීමනා මණ්ඩලයේ අදාළ සේවකයන්ට ගෙවා තිබුණි. සිදු කරන ලද නියදි විගණන පරීක්ෂණයට අනුව, 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ 2018 ජූලි 18 දිනැති අංක 3/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2022 වර්ෂය සඳහා ඉහත දීමනා ලෙස රු. මිලියන 417.65 ක් ගෙවා තිබුණු බව හෙළිදරව් විය.

(i) එකී අමාත්‍ය මණ්ඩලය තීරණයට පටහැනිව, වෘත්තීය දීමනාවට හිමිකම් කියන නිලධාරීන්ට රඳවා ගැනීමේ දීමනාව ගෙවනු ලැබේ. ඒ අනුව, දීමනා දෙකම එනම් රඳවා ගැනීමේ දීමනාව සහ වෘත්තීය දීමනාව අදාළ නිලධාරියාට ගෙවනු ලැබේ. 2022 ජූනි මාසය සඳහා පමණක් වෘත්තීය දීමනාවට හිමිකම් කියන නිලධාරීන් 487 දෙනෙකුට රඳවා ගැනීමේ දීමනාව ලෙස රු. මිලියන 11.99 ක් ගෙවා තිබුණු බව නියදි විගණන පරීක්ෂණයෙන් හෙළිදරව් විය.

(i) නිලධාරීන් 136 දෙනෙකුට දීමනා වශයෙන් 2022 ජූනි මාසය සඳහා පමණක් ඔවුන්ගේ වැටුපෙන් සියයට 65 ක් ඉක්මවා රු. මිලියන 3.65 ක් ගෙවා තිබූ බව නියදි විගණන පරීක්ෂණයෙන් හෙළිදරව් වූ අතර එය එකී අමාත්‍ය මණ්ඩලය තීරණයට පටහැනි විය. තවද, එකී අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව, යම් තනතුරක් විසින් ඉටු කරනු ලබන රාජකාරිවලට අදාළව දීමනා කිහිපයක් ගෙවනු ලැබේ. ඒ අනුව, මෙම දීමනා වෙනුවෙන් 2022 ජූනි මාසය සඳහා පමණක් එකතුව රු, මිලියන 21.67 ක් ගෙවා තිබුණු බව හෙළිදරව් විය.

(ii) එකී අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව, 2008 අප්‍රේල් 01 දිනෙන් පසුව බඳවා ගන්නා ලද සේවකයින් සඳහා කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා ක්‍රමයක් හඳුන්වා දීම වෙනුවට අනුමත දීමනා 25 ක් ගෙවනු ලැබේ.

(ආ) වැටුප් සංශෝධනය කරන අවස්ථාවකදී 2007 දෙසැම්බර් 13 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති තීරණය සහ 2015 මැයි 20 වන දින එළඹී සාමූහික ගිවිසුම අනුව, උපයන විට ගෙවන (PAYE) බදු/ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) වගකීම මණ්ඩලයේ සේවකයින් වෙත මාරු කිරීමට තීරණය කර තිබුණි. කෙසේවෙතත්, 2010 සිට 2020 දක්වා කාල සීමාව තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ඉහත තීරණවලට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 3/2016 දරන චක්‍රලේඛ උපදේස්වලට පටහැනිව අදාළ සේවකයින්ගේ වැටුපෙන් අඩු නොකර මණ්ඩලය විසින් සිය අරමුදලෙන් රු. බිලියන 4.98 ක PAYE/ APIT බදු ගෙවා තිබුණි. කෙසේ වෙතත්, මෙම ගෙවීම හේතුවෙන් මණ්ඩලයට සිදුවූ පාඩුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ සේවකයින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය අනුව විදුලි බලය සඳහා සාධාරණ ලෙස කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට උත්පාදනය කිරීමේ පිරියතෙන් ලබා ගත හැකි ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බවට සහතික වීමට මණ්ඩලය හැකි විය යුතුය. 2018 - 2037 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2018, 2019, 2020 සහ 2021 වර්ෂයන් තුළදී පිළිවෙලින් එකතුව මෙගාවොට් 500 ක, මෙගාවොට් 657 ක, මෙගාවොට් 430 ක සහ මෙගාවොට් 445 ක ධාරිතාවයකින් යුත් නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කරන ලද මෙගාවොට් 2,032 ක නව ධාරිතාවයෙන් එකතුව මෙගාවොට් 661.6 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එසේම, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද විදුලිබල කර්මාන්තය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව 2022 - 2041 අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම සඳහා 2021 ඔක්තෝබර් 05 දින මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් කොන්දේසි සහිත අනුමැතිය ලබා දී තිබුණි. කොන්දේසි සහිතව අනුමත කරන ලද 2022 - 2041 අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2022 වර්ෂයේදී මෙගාවොට් 544 ක පුනර්ජනනීය බලශක්ති ධාරිතාවක් එකතු කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, එකතුව මෙගාවොට් 211 ක ධාරිතාවයකින් යුත් නව පුනර්ජනනීය බලශක්ති බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එම නිසා, නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සැලකිය යුතු ලෙස අඩු වී තිබුණු අතර සැලසුමේ අරමුණ වූ අඩු පිරිවැයකින් යුත් විදුලි බලය සැපයීම ඉටු කර ගැනීමට නොහැකි වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය තුලදී රු. බිලියන 5.07 ක් වටිනා ගිගාවොට් පැය 60.33 ක අතිරේක විදුලිබලයක් ලෙස මිලදී ගැනීමට සිදු වී තිබුණි.

**2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.**

(අ) 2018-2037 දීර්ඝකාලීන විදුලි ජනන සැලැස්මට අනුව, සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතිය 2022 වන විට ක්‍රියාත්මක කළ යුතුව තිබුණු අතර මූලික කටයුතු සඳහා 2020 වර්ෂය අවසන් වන විටදී රු. මිලියන 301.19 ක වියදමක් දරා තිබුණි. කෙසේ වෙතත්, අරමුදල් ගැටළු හේතුවෙන් ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට සහ මෙම ව්‍යාපෘතිය සී.ස ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්.) සමාගම හරහා සංවර්ධනය කිරීමට 2020 දෙසැම්බර් 20 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, 2023 අප්‍රේල් මාසය අවසන් වන විටත් අදාළ සමාගම සමඟ සාකච්ඡා කර ගැටලුව නිරාකරණය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එබැවින්, මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම අනාර්ථික වියදමක් බවට පත් වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) නියමිත වේලාවට ගෙවීම් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් පිළිවෙළින් විදුලිය මිලදී ගැනීම් සහ ඉන්ධන මිලදී ගැනීම් (සී.පී.සී) සඳහා ප්‍රමාද පොලිය ලෙස සමාලෝචිත වර්ෂය තුළදී පිළිවෙලින් රු. බිලියන 6.55 ක් සහ රු. බිලියන 8.92 ක මුදලක් දරා තිබුණි. තවද, දේශීය බැංකු ණය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ණය වාරික ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන් රු. මිලියන 11.17 කට සමාන මුදලක් පැහැර හැරීමේ පොලී ලෙස ද දරා තිබුණි.

(ඇ) සංශෝධිත 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, 2013 අගෝස්තු 06 න් පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. කෙසේ වෙතත්, කිලෝවොට් පැයට රු. 36.20 ක ගාස්තුවක් යටතේ (වසර 20 ක් සඳහා ස්ථාවර ගාස්තුව) අපද්‍රව්‍ය බලශක්තියට හැරවීමේ තාක්ෂණය මත පදනම්ව ක්‍රියාත්මක කිරීමට නියමිත නාගරික ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාර පහක් සඳහා 2017 දී අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි, මුළු ගාස්තු වන කිලෝවොට් පැයට රු.36.20 න් රු.13.10 ක් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කළ යුතුය. ඒ අනුව, එක් ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාරයක් සඳහා විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම 2020 දෙසැම්බර් මාසයේදී ස්වාධීන බලශක්ති නිෂ්පාදකයෙකු සමග අත්සන් කරන ලද අතර කිලෝවොට් පැයකට මුළු ගාස්තුව රු. 36.20 ක් මණ්ඩලය විසින් දරා තිබුණි. කෙසේවෙතත්, කිලෝවොට් පැයකට රු.13.10 ක් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කර නොතිබුණි. එබැවින්, 2022 දෙසැම්බර් 31 දිනට මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුළු මුදල රු. බිලියන 1.85 ක් විය.

(ඈ) ඉහත සඳහන් කළ පරිදි, NCRE ව්‍යාපෘති සඳහා එකතුව මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ප්‍රසම්පාදන 7 ක් පමණක් 2021 දෙසැම්බර් 31 දින දක්වා ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත්, මෙම විදුලිබලාගාර අතුරින් 2022 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 81 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

(ඉ) කොන්ත්‍රාත් මුදල රු. මිලියන 304.6 ක් වූ යෝජිත මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණයේ පයිලින් වැඩ සඳහා වන කොන්ත්‍රාත්තුව 2012 ඔක්තෝබර් 22 දින ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් මුදල රු, මිලියන 4,774.6 ක් වූ (වැට් බද්ද හැර) මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ සහ ඉදිකිරීම් දෝෂ නිවැරදි කිරීමේ කොන්ත්‍රාත්තුව 2021 අගෝස්තු 02 දින ප්‍රදානය කර තිබූ අතර ආරම්භ කළ දිනය 2021 අගෝස්තු 16 විය. ඉදිකිරීම් 2023 අගෝස්තු 15 වැනි දින අවසන් කළ යුතුය (ආරම්භ කළ දින සිට 730 කින්). යෝජිත මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණයේ මූලික ඇස්තමේන්තුගත පිරිවැය 2011 වර්ෂයේදී රු. මිලියන 1,000 ක් ලෙස ගණනය කර තිබූ අතර ප්‍රධාන වශයෙන් කොන්ත්‍රාත්තු දෙක අතර ඇති විශාල කාල පරතරය හේතුවෙන් එය 2021 අගෝස්තු 02 දිනට රු. මිලියන 5,079.2 ක් දක්වා (කොන්ත්‍රාත් දෙකේ සම්පූර්ණ මුදල) වැඩි වී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටදී ඉදිකිරීම් කටයුතු සඳහා රු. බිලියන 1.19 ක් මුදලක් වැය කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටදී ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 12.7 ක් පමණ විය. නව ගොඩනැගිල්ලක් 2023 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබියදී ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට පියවර නොගෙන, 2017 සිට 2022 දක්වා කාලය තුළදී පවතින ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු. මිලියන 319.19 ක මුදලක් මණ්ඩලය විසින් වැය කර ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඊ) ඒකකයක (කිලෝවොට් පැයක) සාමාන්‍ය පිරිවැය රු. 33.65 ක් වන විට විශ්‍රාම ලත් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ගේ බලාගාර තුනකින් සමාලෝචිත වර්ෂය තුළදී මිළදී ගත් බලශක්ති ඒකකයක පිරිවැය පිළිවෙලින් රු. 63.51 ක්, රු. 78.20 ක් සහ රු. 122.50 ක් විය. එම නිසා, අධික පිරිවැයකට හදිසි විදුලි බලාගාර භාවිතා කිරීම වෙනුවට තථ්‍ය කාලීන ඉල්ලුම සපුරාලීම සඳහා අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව බලාගාර ක්‍රියාත්මක කළේ නම් බලශක්ති මිලදී ගැනීමේ අධික පිරිවැය අඩු කර ගැනීමට හැකිව තිබුණි.

(උ) සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා (විශේෂයෙන් කුඩා ජලවිදුලි බලාගාර සඳහා) 2000 වර්ෂයට පෙර වළකාලන ලද පිරිවැය මත පදනම් වූ ගාස්තු ක්‍රමය හඳුන්වා දී තිබුණි. 2007 ට පෙර අනුමත කර ඇති NCRE ව්‍යාපෘති සඳහා පමණක් වර්තමානයේදී මෙම ගාස්තු අදාළ වන අතර දැනට NCRE ව්‍යාපෘති 28 ක් ක්‍රියාත්මක වේ. වළකාලන ලද පිරිවැය ක්‍රමය තාප විදුලි බලාගාර යැවුම් (dispatch) මත පදනම් වන අතර එය ඉන්ධන පිරිවැය අනුව වෙනස් වේ. 2020 ජනවාරි 16 දිනැති අංක ඩීජීඑම්/එස්වයිසී/ටීසීඑච්/41 දරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පද්ධති පාලන) ලිපියට අනුව නව බලාගාරද ඇතුළුව ජල විදුලි බලාගාරයක තථ්‍ය ඒකක පිරිවැය රු. 10 ට වඩා අඩු විය යුතුය. කෙසේවෙතත්, 2022 වර්ෂය සඳහා වළකාලන ලද පිරිවැය ක්‍රමය මත තීරණය කරන ලද කුඩා ජල විදුලි බලාගාරවලට අදාළ ගාස්තුව තෙත් කාලය සඳහා රු. 18.19 ක් සහ වියළි කාලය සඳහා රු. 18.67 ක් විය. තවද, 2022 ජූනි මාසය සඳහා මහජන උපයෝගිතා කොමිසම් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද බලාගාරවලට අදාළ පිරිවැයන්ට අනුව, මණ්ඩලයට ජලවිදුලි ඒකකයක් සඳහා පිරිවැය රු.4.85 ක් විය. කෙසේ වෙතත්, 2022 අගෝස්තු 16 වැනි දින මෙම කාරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ලබා දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, වළකාලන ලද පිරිවැය ක්‍රමය මත පදනම් වූ කුඩා ජල විදුලි බලාගාර සඳහා සාධාරණ උපරිම මිලක් යෙදීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) ලක්ෂපාන ජලවිදුලි බලාගාරයෙන් බැහැර කරන ලද ටර්බයින යොදා ගනිමින් කැලණිතිස්ස බලාගාරයේ ස්මාරකයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව එහි ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර වසර 04 ක ප්‍රමාදයකින් පසු 2017 වසරේ දී ප්‍රදානය කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව රු. මිලියන 25.12 කට ලබාදී තිබූ අතර එය දින 180 ක කොන්ත්‍රාත්තු කාලයක් සහිතව 2018 ජනවාරි 05 දින නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපොහොසත් වී තිබූ අතර එදිනට ඉදිකිරීම් කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 43 ක් පමණ විය. තවද, කොන්ත්‍රාත්කරුට කිසිදු කාලය දීර්ඝ කිරීමක් ලබා දී නොමැති බව නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. මිලියන 19.65 ක් (උපදේශන ගාස්තු ඇතුළුව) දැරීමෙන් පසුවත් දින 1746 ක ප්‍රමාදයක් නිරීක්ෂණය විය. ඊට අමතරව, විගණනය විසින් සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී, නිම නොකළ ස්මාරකය පිහිටි පරිශ්‍රය වල් පැළෑටිවලින් වැසී ඇති බවත්, ඉදිකිරීම් කටයුතු අත්හැර දමා ඇති බවත් නිරීක්ෂණය විය. ඒ අනුව, මෙම ඉදිකිරීමේ නියමිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබූ අතර ඒ සඳහා වැය වූ මුදල් අනාර්ථික වියදමක් බවට පත් වී තිබුණි.

(එ) මණ්ඩලයෙන් ලද තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට මණ්ඩලය සතු වාහන හතක් රේඛීය අමාත්‍යාංශය වෙත මුදා හැර ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අමාත්‍යාංශයෙන් ලද තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට අමාත්‍යාංශය විසින් එක් වාහනයක් පමණක් භාවිත කරනු ලබයි.

(ඒ) කැලණිතිස්ස බලාගාරයේ V ගෑස් ටර්බයින් ජනන යන්ත්‍ර හතරක් පුනරුත්ථාපනය කිරීම 2017 ජූලි 07 දින ආරම්භ කර තිබුණු අතර 2018 අගෝස්තු 11 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටදී ආරම්භ කළ දින සිට අවුරුදු 5 ක් සහ මාස 5 ක් ගත කිරීමෙන් පසුව ජනක යන්ත්‍ර 3 ක් පමණක් පුනරුත්ථාපනය කර තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටදී සියලුම ටර්බයින සඳහා රු. මිලියන 752.22 ක් වැය කර පුනරුත්ථාපනය කරන ලද ජනක යන්ත්‍ර 3 කින් මෙහෙයුම් කටයුතු සඳහා එක් ගෑස් ටර්බයිනයක් පමණක් යොදාගෙන තිබුණි.

(ඔ) විදේශීය අරමුදල් සපයන ව්‍යාපෘති තුනක් සම්බන්ධයෙන්, නිම කිරීමට නියමිත දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා මාස 14 සිට මාස 39 දක්වා සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්කරුවන්ට ලබාදුන් පළමු දින දීර්ඝ කිරීම තුළදී පවා එම ව්‍යාපෘති අවසන් කර නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඕ) 2000 වසරේ සිට ව්‍යාපෘති කටයුතු, ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සහ ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම සඳහා රු. මිලියන 188.38 ක වියදමින් මිලදී ගත් ඉඩම් 18 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අවුරුදු 1 සිට අවුරුදු 22 දක්වා වූ කාල පරාසයක් තිස්සේ අපේක්ෂිත අරමුණු සඳහා ප්‍රයෝජනයට ගෙන නොමැති බව නිරීක්ෂණය විය. එම ඉඩම් අතරින් රු. මිලියන 86.52 ක් වටිනා ඉඩම් 8 ක් බෙදාහැරීමේ අංශවල සහ ව්‍යාපෘති අංශවල ස්ථාවර වත්කම් ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. තවද, අහඹු විගණන පරීක්ෂණයට අනුව, මීට වසර 5 කට පෙර අදාළ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කර තිබුණද, ව්‍යාපෘති සඳහා අත්කර ගත් ඉඩම් හතරක් පවරා ගැනීමේ කටයුතු සම්පූර්ණ කිරීමට මණ්ඩලය අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

(ක) රත්නපුර, සිරිපාගම, කාර්නි වත්ත, ඉඩමේ කුළුණු ඉදිකිරීම සහ ඉඩම උඩින් කේබල් ඇදීම සඳහා අවසරය ඉල්ලා සිටි දින සිට (2018 මැයි 31) එකී අවසරය ලද දිනය (2023 අගෝස්තු 11) දක්වා දින 1,898 ක් හෝ වසර 5 යි මාස 2 ක කාලයක් පැවති බව නිරීක්ෂණය විය. එබැවින්, ශ්‍රී ලංකාවේ දකුණු පළාතට විශ්වාසනීය විදුලිබල සැපයීමක් සඳහා තීරණාත්මක යටිතල පහසුකම් ලෙස හඳුනාගෙන තිබූ පොල්පිටිය - හම්බන්තොට කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කි.මී 150 ක සම්ප්‍රේෂණ මාර්ගයේ ඉදිකිරීම් නිම කිරීම සැලකිය යුතු කාලයක් ප්‍රමාද වී තිබුණු අතර විදුලිබල සැපයුමේ හිඟයට ඉදිකිරීම්වල ප්‍රමාදය හේතු වී තිබුණි. තවද, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2016 ජනවාරි 25 දිනැති විදුලි (ආරවුල් විසඳීමේ ක්‍රියාපටිපාටිය) රීති ප්‍රකාරව මෙම ආරවුල කලින්ම මණ්ඩලයේ කළමනාකාරීත්වය විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබුවේ නම්, ශ්‍රී ලංකාවේ දකුණු පළාතට විශ්වාසනීය විදුලිබල සැපයීමක් සඳහා තීරණාත්මක යටිතල පහසුකමක් වූ මෙම සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම කලින්ම නිම කිරීමට හැකිව තිබුණු අතර ඉදිකිරීම් ප්‍රමාදය හේතුවෙන් සියලුම පාර්ශ්වකරුවන් මුහුණ දුන් දුෂ්කරතා අවම කර ගත හැකිව තිබුණි. තවද, ඉඩම් හිමියා කිසිදු වන්දියක් නොමැතිව ඉඩම ලබා දීමට එකඟ වී තිබියදී ඉඩම් හිමියාට ගෙවිය යුතු වන්දිය වෙනුවෙන් පිළිවෙළින් රත්නපුර ප්‍රාදේශීය ලේකම් සහ රත්නපුර දිස්ත්‍රික් ලේකම් වෙත තැන්පත් කර ඇති රු. මිලියන 1.7 ක සහ රු. මිලියන 7.9 ක මුදල 2023 ඔක්තෝම්බර් මස අවසන් වන විටත් අය කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 2.1 වෙනත් කරුණු

**(අ)** 2022 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 46.41 ක් වූ වෙළඳ ණයගැති ශේෂය අතරින්, සාමාන්‍ය සහ තොග සැපයුම්වලට අදාළව රු. මිලියන 4,003 ක් වූ ණය ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණු අතර ඉන් රු. මිලියන 2,210 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් වැඩිදුර නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i) ඉහත මුළු ණයගැති ශේෂය අතරින්, දීර්ඝ කාලයක් තිස්සේ හිඟ මුදල් අයකර නොගැනීම හේතුවෙන් රු. බිලියන 2.4 ක් හෙවත් සියයට 4.9 ක් අවසන් කරන ලද ණයගැති ශේෂ යටතේ වර්ගීකරණය කර තිබූ අතර එයින් රු. මිලියන 984 ක් හෙවත් සියයට 43 ක් බෙදාහැරීමේ අංශය 01ට අදාළ විය.

(ii) බෙදාහැරීමේ අංශය 01 හි අවසන් කරන ලද රු. මිලියන 872.39 ක සාමාන්‍ය සැපයුම් ණයගැතියන් අතරින්, වැඩිම මුදල වන රු. මිලියන 230.58 ක් කොළඹ නගර කලාපය නියෝජනය කරන අතර මණ්ඩලයේ ඩීසීසී/සීඕච්මිරු/03/2009 චක්‍රලේඛය අනුව පියවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව එම ශේෂයේ පාරිභෝගික ගිණුම් 13,710 කට අදාළ රු. මිලියන 41.58 ක මුදලක් බැර ශේෂ ලෙස පැවති බව නිරීක්ෂණය විය. ඊට අමතරව, පියවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව තොග ණය ගැතියන් (අවසන් කරන ලද) තුළ පාරිභෝගික ගිණුම් 216 කට අදාළ රු. මිලියන 13.15 ක බැර ශේෂයන් ද පැවතුණි.

(iii) අහඹු විගණන පරීක්ෂණයට අනුව, අවසන් කළ තොග සැපයුම් සම්බන්ධතා 413 අතරින් පාරිභෝගිකයන් 137 දෙනෙකුට කිසිදු තැන්පතු මුදලක් ලබා නොගෙන විදුලි සැපයුම් සම්බන්ධතා ලබා දී තිබූ අතර එම ගිණුම්වල මුළු හිඟ ශේෂය රු. මිලියන 266.84 ක් බව නිරීක්ෂණය විය. ඉහත අවසන් කළ තොග සැපයුම් සම්බන්ධතා 413 අතරින් පාරිභෝගිකයින් 147 දෙනෙකුගේ ගිණුම්වල ඇති මුළු තැන්පතු මුදලට වඩා එම ගිණුම්වල මුළු හිඟ ශේෂය රු. මිලියන 203.15 කින් ඉක්මවා ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

(iv) සිදු කරන ලද අහඹු විගණන පරීක්ෂණයට අනුව, පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ නිල නිවාස සඳහා ලබාදී ඇති විදුලි සම්බන්ධතා 74 ක් සම්බන්ධයෙන් රු. මිලියන 16.32 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට අයකර ගැනීමෙන් තොරව පැවති බව නිරීක්ෂණය විය. එයින් සම්බන්ධතා 29 කට අදාළ රු. මිලියන 5.31 ක මුදලක් වසර හයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව පැවති අතර සම්බන්ධතා 30 ට අදාළ තවත් රු. මිලියන 3.13 ක් වසරකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ආ) අනෙකුත් ණයගැති ශේෂය වන රු. බිලියන 38.38 අතරින් රු. බිලියන 14.59 ක් හෙවත් සියයට 38 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට වසර 2 කට වැඩි කාලයක් තිස්සේ අය නොවී පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් වැඩිදුරටත් නිරීක්ෂණ සිදු කර ඇත.

(i) අනෙකුත් ණයගැති ශේෂය අතරින් රු. මිලියන 12.67 කට සමාන මුදලක් බෙදාහැරීමේ අංශය 04 ට අදාළව රාජ්‍ය ආයතනවලින් වසර 5 කට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ii) 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය විසින් සෝපාන, වායුසමීකරණ යන්ත්‍ර සහ විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රාජ්‍ය ආයතන 93 කින් රු. මිලියන 346.95 ක මුදලක් අය නොවී පැවතුණි. එයින් රු. මිලියන 114.04 ක මුදලක් සහ රු. මිලියන 82.84 ක මුදලක් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන පිළිවෙලින් වසරකට සහ වසර පහකට වැඩි කාලයක් තිස්සේ හිඟව පැවතුණි. තවද, අනෙකුත් ශේෂවල අයකරගත හැකි වටිනාකම තක්සේරු කිරීමෙන් තොරව වසර පහකට වැඩි හිඟ ශේෂය සඳහා පමණක් හානිකරණ ප්‍රතිපාදන සිදු කර තිබුණි.

(iii) ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම (රු. මිලියන 478.18 ක්) සහ ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් (රු. මිලියන 236.78 ක්) හරහා ලංකා ගල් අඟුරු සමාගමෙන් අය විය යුතු රු. මිලියන 714.96 ක් වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග නොගෙන හිඟව පැවතුණි.

(iv) සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට විදුලිය සැපයීම වෙනුවෙන් පූජනීය ස්ථානවලින් රු. මිලියන 253.7 ක මුදලක් අය විය යුතුව පැවති අතර එයින් රු. මිලියන 81.58 ක මුදලක් වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමට ක්‍රියාමාර්ග නොගෙන හිඟව පැවතුණි.

(ඇ) ගෙවිය යුතු රු. බිලියන 26.67 ක ටෙන්ඩර් තැන්පතු, සුරැකුම් සහ අනෙකුත් තැන්පතු අතරින් රු. බිලියන 2.79 ක මුදලක් පියවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන වසර 5 කට වැඩි කාලයක් තිසිසේ හිඟව පැවතුණි. තවද, ඉහත වසර 5 ට වැඩි ශේෂය අතරින් රු. මිලියන 1,312.94 ක් සහ රු. මිලියන 2.57 ක් හෝ සියයට 47 ක් පිළිවෙලින් බෙදාහැරීමේ අංශය 01 හි සහ මූලස්ථානයේ ප්‍රාග්ධන කාර්යයන් සඳහා ලැබුණු පාරිභෝගික තැන්පතු නියෝජනය කරයි. කෙසේ වෙතත් අදාළ ප්‍රාග්ධන කාර්යයන් අවසන් කර තිබේද නැද්ද යන්න තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් ලැබී නොතිබුණි.

(ඈ) රු. මිලියන 12.34 ක අසාමාන්‍ය බැර ශේෂයක් විමර්ශනය කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන බෙදාහැරීමේ අංශය 01 හි ඉතිරිකිරීමේ ගිණුමේ පැවතුණි. කෙසේ වෙතත්, අදාළ බැංකු තහවුරු කිරීම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් 2013/14 තක්සේරු වර්ෂය සඳහා වන උද්දේශිත ලාභාංශ (deemed dividend) බදුවලට අදාළව රු. බිලියන 1.27 ක් දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවට පියවා නොතිබුණි.

(ඊ) 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 230.63 ක ගල් අඟුරු තොග හිඟයක් (මෙට්‍රික් ටොන් 2ල161.98) ආදායම් ප්‍රකාශනයට ගෙන තිබුණි. 2022 නොවැම්බර් 19 වැනි දින සිදු කරන ලද ගල් අඟුරු තොග සමීක්ෂණයට අනුව, ගල් අඟුරු තොග සමීක්ෂණය සිදු කරන ලද කාල සීමාව තුළ පැවති අධික වර්ෂාපතනය හේතුවෙන් ගල් අඟුරු අංගනයේ ජල අන්තර්ගතය සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවතීම නිසා මෙට්‍රික් ටොන් 1,046'32 ක අතිරික්ත ගල් අඟුරු තොගයක් පැවතුණි. ඒ අනුව, ගල් අඟුරුවල සාමාන්‍ය ඝනත්වයේ සුළු වැඩිවීමක් සිදු විය. එබැවින්, මෙම වර්ෂයේ ගල් අඟුරුවල සාමාන්‍ය ඝනත්වය වෙනුවට පසුගිය වර්ෂයේ ගල් අඟුරුවල සාමාන්‍ය ඝනත්වය යොදා ගනිමින් භෞතික ගල් අඟුරු තොගය ගණනය කිරීමට සමීක්ෂණ කමිටුව තීරණය කර තිබුණි. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට මෙට්‍රික් ටොන් 2ල161.98 ක ගල් අඟුරු තොග හිඟයක් පැවතුණි. කෙසේ වෙතත්, විශාල ගල් අඟුරු තොගයක් සත්‍යාපනය කිරීම සඳහා ඝන මීටරයකට ගල් අඟුරුවල සාමාන්‍ය ඝනත්වය මැනීම සඳහා වළවල්වලින් කැණීම් කරන ලද ගල් අඟුරු කිලෝග්‍රෑම් 35 ක් පමණක් යොදා ගෙන තිබුණු නිසා පසුගිය වර්ෂයේ ගල් අඟුරුවල සාමාන්‍ය ඝණත්වයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

(උ) මණ්ඩලයේ වාර්තාවලට අනුව, හරිත බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැන්වීමේ ආයෝජන වැඩසටහන (ණය වාරික 1) සහ හරිත බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැන්වීමේ ආයෝජන වැඩසටහන (ණය වාරික 2) සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළදී ලද මුළු ණය මුදල රු. මිලියන 6ල253ග39 ක් විය. කෙසේ වෙතත්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව එය රු. මිලියන 4,488'06 ක් ලෙස දක්වා තිබුණි. එබැවින්, එකතුව රු. මිලියන 1,765'33 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) 2023 පෙබරවාරි 01 දිනැති අංක 3/0154/504/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට සහ 2023 පෙබරවාරි 17 දිනැති අංක. පීඊඩී/1/iSBî/02/11(ස) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව, ව්‍යාපෘති හතකින් ලද රු. බිලියන 60.97 ක් වූ ණය මුදල් රජයෙන් ලද ස්කන්ධය ලෙස මාරු කර තිබුණි. ඉහත ණයවලින් හබරණ වේයන්ගොඩ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතියට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට ලද රු. මිලියන 13,736.28 ක් භාණ්ඩාගාරය විසින් රජයේ ස්කන්ධය ලෙස මාරු කර තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලයේ වාර්තාවලට අනුව, රජයෙන් ලද ස්කන්ධය ලෙස රු. මිලියන 13,729.29 ක් පමණක් මාරු කර තිබුණි. එබැවින්, රු. මිලියන 6.99 ක වෙනසක් නිරීක්ෂණය විය.

(එ) මණ්ඩලය විසින් වසර ගණනාවක් තිස්සේ ලංකා විදුලි පුද්ගලික සමාගම වෙත විදුලිය විකිණීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගැනීම සිදු කළ ඇතත්, මෙම ආයතන සමඟ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා එම පාර්ශව දෙක සමඟ එළඹී විකුණුම් හා මිලදී ගැනීමේ ගිවිසුම් නොතිබුණි.

(ඒ) උතුරු වසන්තය ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයේදී හඳුනාගත් රු. මිලියන 37.27 ක තොග හිඟය සම්බන්ධයෙන් මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ශාඛාව මගින් විශේෂ පරීක්ෂණයක් සිදු කර තිබුණි. පසුව. විශේෂ කමිටුවක් විසින් කරන ලද විමර්ශනයට අනුව, එම හිඟය රු. මිලියන 46.33 ක් වන බවට අනාවරණය වී ඇති අතර එය අදාළ ගබඩා භාරකරුගෙ න් ලැබිය යුතු බවට ගිණුම්ගත කර තිබුණි. කෙසේ වෙතත්, කිසිදු අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් ලබා නොගෙන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාගේ (උතුරු) සහ අතිරේක සාමාන්‍යාධිකාරීවරයාගේ අනුමැතිය මත පමණක් 2019 සිට 2020 දක්වා කාලය තුළදී එම මුදල රු. මිලියන 8.29 ක් දක්වා කපා හැර තිබුණි. එසේ වුවද, වසර අවසානයේදී පවා රු. මිලියන 46.33 ක ඉහත සඳහන් තොග හිඟය වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට අසමත් වී තිබුණි.

(ඔ) 2020 වර්ෂයේදී හෙයියන්තුඩුව ගබඩාවේ තොග සත්‍යාපනය කිරීමේදී හඳුනාගත් රු. මිලියන 12.65 ක තොග හිඟය සම්බන්ධයෙන් ගබඩා භාරකරු සහ තවත් විදුලි අධිකාරීවරුන් දෙදෙනෙකු පිළිවෙලින් රු. මිලියන 6.47 ක් සහ රු. මිලියන 2.49 ක් සඳහා වගකිව යුතු බව මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය සිදුකළ විශේෂ විමර්ශනයට අනුව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, 2023 පෙබරවාරි මාසය අවසන් වන විටත් විධිමත් පරීක්ෂණයක් පවත්වා ඔවුන්ගෙන් පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) විධිමත් පරීක්ෂණය අවසන් වී තිබියදීත්, වත්කම් කළමනාකරණ අංශයේ (බලාගාරය) 2006 නොවැම්බර් 20 සිට 2012 පෙබරවාරි 20 දක්වා කාලය තුළ සිදුවී ඇති රු. මිලියන 3.67 ක තොග හිඟයට වගකිව යුතු පුද්ගලයාට එරෙහිව මණ්ඩලය විසින් වර්ෂය අවසන් වන විටත් කඩිනම් පියවර ගෙන නොතිබුණි.

(ක) පරීක්ෂණය සඳහා පත්කළ කමිටුව නිර්දේශ කර පරිදි අලාභ අයකර ගැනීමෙන් තොරව වත්කම් කළමනාකරණ අංශයේ රු. මිලියන 3.79 ක තොගය හිඟය සඳහා වගකිය යුතු නිලධාරියකුට 2011 ඔක්තෝබර් 15 වන දින විශ්‍රාම යාමට අවසර දී තිබුණි. තවද, 2022 සැප්තැම්බර් 12 වැනි දින පැවති කමිටු රැස්වීමේදී හිඟය රු. 2,537,695 ක් විය යුතු බවට තීරණය කර තිබූ අතර, මණ්ඩලයේ වැඩබලන සාමාන්‍යාධිකාරීවරයා ඔහුගේ පාරිතෝෂික සහ විශ්‍රාම වැටුප් අරමුදලින් හිඟය අයකර ගන්නා ලෙස උපදෙස් දී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වගකිවයුතු නිලධාරියාගෙන් හිඟය අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන එම මුදල ගිණුම් පොත්වල අයනොවී පැවතී බව නිරීක්ෂණය විය.

(ග) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර උතුරු පළාත) යටතේ ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ප්‍රාදේශීය ගබඩාවේ 2014 සැප්තැම්බර් මාසයේදී හඳුනාගත් රු. මිලියන 1.15 ක තොග හිඟයට වගකිව යුතු ගබඩා භාරකරු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදු කරන ලද විධිමත් පරීක්ෂණය අවසන් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ච) බෙදාහැරීම් අංශ 02 සහ 03 ට අදාළව තොග හිගයන් ලෙස තොග ගැලපුම් ගිණුමට අයකර තිබූ රු. මිලියන 14.98 ක් සහ රු. මිලියන 60.44 ක් 2004 වසරේ සිට විමර්ශනය කර පියවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන ගිණුම් පොත්වල පැවතුණි. කෙසේ වෙතත්, මෙම තොග හිඟය සම්බන්ධ විස්තර විගණනයට සපයා නොතිබුණි.

(ජ) 2022 දෙසැම්බර් 31 දිනට ජනන අංශයේ කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ ගිණුමේ වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ රු. මිලියන 22.42 ක් වටිනා චලනය නොවන අයිතම තිබූ බව නිරීක්ෂණය විය.

(ට) රු. බිලියන 32.54 ක මුළු පරිභෝජන කළ හැකි තොගයෙන් සියයට 6.5 ක් නියෝජනය කරන රු. බිලියන 2.12 ක්, 2022 දෙසැම්බර් 31 වන විට සෙමින් චලනය වන, චලනය නොවන සහ හානි වූ තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබූ අතර එමගින් තොග හානිවලට, රඳවා ගැනීමේ පිරිවැය වැඩි වීමට සහ වංචා සඳහා අවස්ථාවක් නිර්මාණය කිරීමට හේතු විය හැකිය. තවද, අභ්‍යන්තර විගණන පරීක්ෂණයට අනුව, බෙදාහැරීමේ අංශ හතරෙහි සහ වත්කම් කළමනාකරණ අංශයේ පැවති රු. මිලියන 217.7 ක් වටිනා හානි වූ සහ යල් පැන ගිය තොග අපහරණය කිරීම සඳහා 2019 සිට 2022 දක්වා අවස්ථා කිහිපයකදී අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා දී තිබියදීත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඩ) මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය සිදුකළ විශේෂ විමර්ශනයට අනුව, 2022 ජූනි 09 වැනි දින මණ්ඩලයේ වෘත්තීය සමිති විසින් ගනු ලැබූ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග නිසා රන්දෙණිගල සහ රන්ටැඹේ ජලාශවලින් නිකුත් කරන ලද ජලයෙන් නිපදවිය හැකි විදුලි ඒකක පිළිවෙළින් කි.වෝ 160,000 ක් සහ කි.වෝ 35,000 ක් මණ්ඩලයට අහිමි කර ඇති බව අනාවරණය වී තිබුණි. එම නිසා, එදිනට පුද්ගලික විදුලිය මිලදී ගැනීම් සඳහා රු. මිලියන 262.6 ක අමතර වියදමක් දැරීමට මණ්ඩලයට සිදු වූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, 2023 පෙබරවාරි අවසන් වන විටත් 2022 දෙසැම්බර් 08 දින ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ දක්වා ඇති පරිදි විධිමත් පරීක්ෂණයක් පවත්වා එම අලාභය වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ණ) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවීමට පියවර නොගෙන රු. බිලියන 3.15 ක වෙළඳ ගෙවිය යුතු ශේෂය වසර 3 කට වැඩි කාලයක් තිස්සේ ගිණුම් පොත්වල පැවතුණි. ඒ අතරින් රු. බිලියන 2.9 ක් සම්ප්‍රේෂණ අංශයට අදාළව මීට වසර 4 කට පෙර නොර්දන් පවර් කම්පැනි පයිවට් ලිමිටඩ් නම් තාප විදුලිබල සැපයුම්කරු වෙත ගෙවිය යුතු බවට ගිණුම්ගත කර තිබුණි. කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් පසුව නීතිපතිවරයාගෙන් ලැබුණු පැහැදිලි කිරීම් අනුව මෙම ඉන්වොයිසි පියවීමට මණ්ඩලයට වගකීමක් නොමැති බවට තීරණය කර ඇති බව නිරීක්ෂණය විය. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම ගෙවිය යුතු ශේෂයට අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ත) සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැවති රු. බිලියන 10.36 ක් වූ ආපදා සහ ප්‍රවාහන ණය ශේෂ අතරින් රු. මිලියන 446 ක් ප්‍රධාන කාර්යාලයේ නොගෙවූ ණය නියෝජනය කරන අතර ඉන් රු. මිලියන 41.88 ක ණය ශේෂය වසර 4 කට වැඩි කාලයක් තිස්සේ හිඟව පැවතුණි. එසේ වුවද, අභ්‍යන්තර විගණන පරීක්ෂාවකට අනුව, අදාළ සේවකයින් මේ වන විටත් සේවයෙන් ඉවත් වී සිටීම සහ වසර 2 කට වැඩි කාලයක් වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති බැවින් රු. මිලියන 2.32 ක ණය ආපසු අයකර ගැනීමේ හැකියාව සැක සහිත බව නිරීක්ෂණය විය.

(ද) මීට වසර 3කට පෙර ගෙවිය යුතු බවට ගිණුම් පොත්වල හඳුනාගෙන තිබූ ජාතිය ගොඩනැගීමේ බදුවල හිඟ ශේෂය රු. මිලියන 30.95 ක් විමර්ශණය කර පියවීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගොනු කළ අවසන් වාර්ෂික බදු වාර්තාවට අනුව, මණ්ඩලය විසින් ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්දක් නොමැති බව නිරීක්ෂණය විය.

(ධ) 2023 ජනවාරි 20 වැනි දින නිකුත් කරන ලද මණ්ඩලය විසින් ඒස් පවර් ඇඹිලිපිටිය පෞද්ගලික සමාගමෙන් විදුලිය මිලට ගැනීම් පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ පහත නිරීක්ෂණ ඇතුළත් විය.

(ස) ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්ගලික) සමාගමෙන් වර්ෂ 10 ක කාලයක් සඳහා විදුලිය මිලදී ගැනීම සඳහා එම සමාගම සමග මණ්ඩලය 2003 මැයි 09 වන දින ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමෙහි වලංගු කාලය වූ වසර 10 ක කාලය 2005 අප්‍රේල් 06 සිට 2015 අප්‍රේල් 06 වන දිනෙන් අවසන් වූ පසු මෙම බලාගාරය මණ්ඩලය මගින් මිලදී ගැනීම සඳහා සලකා බැලීමට 2016 මාර්තු 23 දින රැස්වූ අමාත්‍ය මණ්ඩලයේ දී තීරණය කර තිබුණි. මණ්ඩලය විසින් කරන ලද ඉල්ලීමට අනුව, බලාගාරයේ වටිනාකම රු. මිලියන 2,370 ක් ලෙස රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කර තිබුණි. සියයට 66.9 ක ධාරිතා අගය සහ සියයට 55 ක් වූ දළ ලාභයෙන් වෙනත් මෙහෙයුම් වියදම ආදේශ කිරීමෙන් බලාගාරයේ වටිනාකම තක්සේරු කල විට බලාගාරයේ වටිනාකම රු. මිලියන 4,176 කට ආසන්න අගයක් විය යුතු බව විගණනයට නිරීක්ෂණය විය. එම

නිසා, තක්සේරු වටිනාකම වන රු.මිලියන 2,370 සමඟ සැසඳීමේදී බලාගාරයේ වටිනාකම රු.1,806 කින් අවප්‍රමාණය වී තිබූ බව නිරීක්ෂණය විය. තවද, වසර 10 ක මුල් ගිවිසුම් කාලය තුළදී ගිණුම්ගත කරන ලද ශුද්ධ ලාභයේ සාමාන්‍ය ඉදිරි වසර 8 ක් සඳහා සියයට 9.5 ක වට්ටම් සාධකය යටතේ වට්ටම් කිරීමෙන් බලාගාරයේ වටිනාකම රු. මිලියන 4,192 කට ආසන්න අගයක් වන බව විගණනයට නිරීක්ෂණය වු අතර එය තක්සේරු වටිනාකම සමඟ සැසඳීමේදී බලාගාරයේ වටිනාකම රු.1,822 කින් අවප්‍රමාණය වී තිබූ බව නිරීක්ෂණය විය.

(ii) ඒ අනුව, තක්සේරු වටිනාකම බලාගාරයේ හිමිකරුවන් විසින් එය මණ්ඩලයට අලෙවි කිරීමට එකඟ වූ ලංසු මිළ වන රු.මිලියන 2,446 ට වඩා පහළ අගයක් ගෙන තිබුණි. මෙම බලාගාරය මිලදී ගැනීමට කටයුතු කිරීමකින් තොරව 2016 අප්‍රේල් 6 දින සිට 2022 සැප්තැම්බර් 8 දින දක්වා අවස්ථා 4 කදී වසර 05 යි මාස 06 ක කාලයක් සඳහා මූලික ගිවිසුම දීර්ඝ කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, රජයේ තක්සේරුකරුගේ තක්සේරු වටිනාකම සමාගමේ හිමිකරුවන් විසින් බලාගාරය විකිණීමට එකඟ වූ ලංසු මිළට වඩා අඩු අගයක් වීම හේතුවෙන් බලාගාරය මණ්ඩලයට අත්කර ගෙන රජයට වඩා වාසිදායක ලෙස පවත්වාගෙන යාමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

(iii) 2003 වර්ෂයේදී ඇතිකර ගත් මුල් ගිවිසුම වර්ෂ 10 කින් අවසන් වුවද 10 වන වර්ෂය අවසානයේදී ගිවිසුම අවසන් වීම, මුල් ගිවිසුමේ 11 වන ව්‍යවස්ථාවේ සඳහන් Buy out Event අවස්ථාවක් ලෙස ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව, මෙම ගිවිසුම අනුව ගිවිසුම් කාලය අවසන් වීම මත Buy out Event අවස්ථාවක් ලෙස මෙම බලාගාරය මිළදී ගැනීමේ අයිතිය (සමාගම විසින් බලාගාරය මණ්ඩලයට අලෙවි කිරීමට යෝජනා නොකළද) මණ්ඩලයට අහිමි වී තිබුණි. තවද, වසර 20 ක ඵලදායි ජීව කාලයක් සහිත වත්කමක් සඳහා එම වත්කමෙහි පූර්ණ වටිනාකම වසර 10 ක කාලයක් තුළ මණ්ඩලය විසින් ඒස් පවර් ඇඹිලිපිටිය සමාගම වෙත ගෙවා තිබුණි.

(iv) ධරිතා ගාස්තු ලෙස ගිවිසුම දීර්ඝ කිරීමෙන් පසු වසර පහක කාලයට අදාළව ඒ.ජ.ඩො 29,085,134 ක් ගෙවා තිබුණි. එයින්, ස්කන්ධ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ වෙනුවෙන් ගෙවන ධාරිතා ගාස්තුවේ Non-Escalable කොටස සඳහා පමණක් ඒ.ජ.ඩො 21,701,362 (රු.මිලියන 3,650) ක් ගෙවා තිබුණි. එය බලාගාරයේ හිමිකරුවන් විසින් බලගාරය මණ්ඩලයට අලෙවි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ලංසුව වූ ඇ.ඩො 17,000,000 (රු.මිලියන 2,446) මෙන් සියයට 127.7 ක් බව නිරීක්ෂණය විය.

(v) මුල් ගිවිසුම් කාලය තුළදී ඒස් පවර් ඇඹිලිපිටිය පෞද්ගලික සමාගම රු. මිලියන 8,572 ක ශුද්ධ ලාභයක් ලබා තිබූ අතර එය 2003 වර්ෂයේදී සමාගම විසින් සිදුකර තිබූ මූලික ප්‍රාග්ධන ආයෝජනය වූ රු. මිලියන 1,676 ට සාපේක්ෂව සියයට 511 ක් වී තිබුණි. තවද, ගිවිසුම දීර්ඝ කිරීමෙන් පසු වසර පහක කාලය සඳහා රු. මිලියන 6,270 ක ශුද්ධ ලාභයක් උපයාගෙන තිබුණු අතර එය මූලික ආයෝජනයට ප්‍රතිශතයක් ලෙස සියයට 406 කි. ඒ අනුව, 2021 මාර්තු 31 වන දිනට ඒස් ඇඹිලිපිටිය පෞද්ගලික සමාගම උපයාගෙන ඇති මුළු ශුද්ධ ලාභය රු. මිලියන 14,841 ක් වූ අතර එය මූලික ආයෝජනයට සාපේක්ෂව සියයට 885 කි.

(vi) ඒස් පවර් ඇඹිලිපිටිය පෞද්ගලික විදුලි බලාගාරයේ ගිවිසුම් දිර්ඝ කරමින් විදුලිය මිලදී ගැනීමේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණ ද පෞද්ගලික විදුලි බලාගාර වෙතින් විදුලිය මිලදී ගැනීමේ දී 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනතේ 43 වන වගන්තිය ප්‍රකාරව විදුලිය මිලදී ගැනීමේදී අනුගමනය කළ යුතු නියමයන් කෙරෙහි එහිදී ප්‍රමාණවත් අවධානය යොමු කර තිබූ බවට කරුණු නිරීක්ෂණය නොවීය.

(vii) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ නියමයන් ප්‍රකාරව විදුලි ජනනය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙතින් විදුලි ජනනය සඳහා බලපත්‍ර ලබාගත යුතුය. ඒ අනුව උක්ත පනතේ 43 (1) වගන්තිය ප්‍රකාරව එසේ බලපත්‍ර හිමිවූ සමාගම් වෙතින් පමණක් විදුලිය ජනනය සහ සැපයීම සිදුකළ යුතු වුවද එසේ ජනන බලපත්‍ර ලබාගෙන නොමැති ඒස් පවර් ඇඹිලිපිටිය සමාගමෙන් 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා විදුලිය මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි.

(viii) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ නියමයන්ට අනුව සියයට 100 ක හිමිකාරීත්වයක් දරන පෞද්ගලික සමාගම්වලට මෙ.වො.25 කට වඩා ධාරිතාවයක් සහිත විදුලි බලාගාර පවත්වාගෙන යාමට ප්‍රතිපාදන නොමැත. කෙසේ වෙතත්, මෙ.වො. 100 ධාරිතාවයකින් යුත් සියයට 100 ක පෞද්ගලික හිමිකාරීත්වයක් දරන ඒස් පවර් ඇඹිලිපිටිය විදුලි බලාගාර සමඟ කෙටිකාලීන විදුලිය මිලදී ගැනීම සඳහා වන ගිවිසුම 2016 අප්‍රේල් 06 වන දින අත්සන් කර තිබුණි.



**ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න**
විගණකාධිපති

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු

**ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම්වල 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට පිළිතුරු**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**1.1** **මතය**

තොරතුරු සහිතයි.

**1.2** **මතය සඳහා පදනම**

තොරතුරු සහිතයි.

**1.2.1** **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

තොරතුරු සහිතයි.

**1.2.1.1** **(අ) සී/ස ලංකා ගල්අඟුරු (පුද්.) සමාගම**

(i) **දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වැට් බදු ශේෂය රු. මිලියන 1,436.33 ක් වූ අතර ඒ අනුව 2017/2018, 2018/2019 සහ 2019/2020 තක්සේරු වර්ෂ සඳහා ගෙවිය යුතු දඩ මුදල රු. මිලියන 1,436.33 ක් විය. කෙසේවෙතත්, ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයෙහි (එල්.කේ.ඒ.එස් 12) 88 වන ඡේදයට අනුව, මෙම ගෙවිය යුතු දඩ මුදල මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. තවද, ඉහත සඳහන් ගෙවිය යුතු බදු මුදල් සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි.**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ලද නිමැවුම් වැට් බදු සමඟ ලංකා ගල්අඟුරු සමාගම එකඟ නොවූ බැවින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වැට් බදු තක්සේරු කිරීම් සඳහා වන අභියාචනය සමඟින් ලංකා ගල්අඟුරු සමාගම විසින් සංශෝධිත වැට් බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට වෙත ඉදිරිපත් කර ඇත. මෙම කාරණය සාකච්ඡා කරමින් පවතී. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව අවශ්‍ය නම්, ඉදිරි මූල්‍ය වර්ෂයේදී හෙළිදරව් කිරීම කරනු ඇත. එසේම, අධ්‍යක්ෂක මණ්ඩලයේ අවසරය ඇතිව, 2021/08/11 දිනැති දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ උපලේඛණයේ අදාළ දඩ මුදල් ඉවත් කර ඇති බව පෙන්නුම් කර ඇති බැවින් ඒ මත පදනම්ව ලංකා ගල්අඟුරු සමාගම විසින් වාර්තා කරන ලද දඩ මුදල් සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇත.

(ii) **එස්.එල්.එෆ්.ආර්.එස් 9, මූල්‍ය සාධන පත්‍ර ප්‍රමිතයෙහි 5.5.15 (අ) ඡේදයට අනුව, එස්.එල්.එෆ්.ආර්.එස් 9 හි විෂය පථය තුළ සිදුවන ගනුදෙනු හේතුවෙන් ඇති වන වෙළඳ ලැබිය යුතු මුදල් හෝ කොන්ත්‍රාත්තු වත්කම්වලට ජීවිත කාලය පුරා අපේක්ෂිත ණය පාඩුවලට සමාන අගයකට ආයතනයක් සෑම විටම පාඩු දීමනාව මනිනු ලැබිය යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1,095.6 ක් වූ දිගුකාලීන හිඟ වෙළඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රමිතියට අනුව ප්‍රතිපාදන සලසා නොතිබුණි.**

දිගු කාලීන ලැබිය යුතු මුදල්වල හානිකරණ දර්ශක නැවත තක්සේරු කිරීමට සහ හානිකරණ දර්ශක මත පදනම්ව අනාගත මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමට ලංවිම ලංකා ගල්අඟුරු සමාගම වෙත උපදෙස් දෙනු ඇත.

(iii) **ගල් අඟුරු ආනයනය කිරීමේදී, ඇත්ත වශයෙන්ම නොදරන ලද රේගු අරමුණු සඳහා වටිනාකම නිශ්චය කිරීමේ සාම්ප්‍රදායික ගැලපීමක් ලෙස රේගුවේදී සියයට 10 ක අංකිත මිලක් (mark-up) වටිනාකමට එකතු කර තිබුණි. කෙසේ වෙතත්, සමාගම විසින් රු. මිලියන 9,419.6 ක් වූ සියයට 10 ක අංකිත මිල සමාලෝචිත වර්ෂයේ ආදායමට එකතු කර තිබූ අතර එම මුදල ණයගැතියන්ට දුන් වට්ටමක් ලෙස හඳුනාගෙන විකුණුම් පිරිවැයට ගලපා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විකුණුම් පිරිවැය හා ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.**

ලංවිම වෙත වැට් ඉන්වොයිසි නිකුත් කිරීමේදී සියයට 10 ක රේගු ආන්තිකය පිරිවැයට එකතු කරන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලංකා ගල්අඟුරු සමාගම වෙත නියෝගයක් ලබා දී ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගේ සහභාගීත්වයෙන් 2018 ජුනි 28 වන දින අමාත්‍යාංශයේ පැවති රැස්වීමකින් අනතුරුව මෙම මිලකරණ යාන්ත්‍රණය සම්මත කර ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරියාට අනුව, ලංවිමට ලැබෙන ඉන්වොයිසි මත වැට් බද්ද සඳහා වන මූලික අගය රේගු අරමුණු සඳහා වන අගයට වඩා අඩු විය නොහැක. එබැවින්, සියයට 10 එකතු කරනු ලබන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේහි නියෝගය මත පමණි. ආදායමේ ඇතුළත් සියයට 10 ක සංකල්පීය ආන්තිකය ඉවත් කර නිමැවුම් වැට් බද්ද ගණනය කිරීමේ හැකියාව පිළිබඳව විසින් ලංකා ගල්අඟුරු සමාගම විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ද විමසා ඇති අතර, ප්‍රතිචාරය තවමත් ලැබී නැත. තවද, 2022 අප්‍රේල් 04 වැනි දින ලංවිම සාමාන්‍යාධිකාරීවරයා විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලිපියක් යවමින් ගල් අඟුරු ආනයනය සහ සැපයීම සඳහා වැට් බද්දෙන් නිදහස් කරන ලෙස ඉල්ලා ඇත.

තවද, ලංවිම විසින් 2023 ජනවාරි 17 දිනැති ලිපියක් මගින් ආදායම් සහ විකුණුම් පිරිවැය අධිප්‍රමාණය කිරීමේ ගැටලුව විසඳීම සඳහා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවලට අවශ්‍ය ගැලපීම් සිදු කරන ලෙස ලංකා ගල්අඟුරු සමාගම වෙත නියෝග කර ඇත.

(iv) **පවතින තොරතුරුවලට අනුව, 2016 සැප්තැම්බර් 19 සිට 2018 අප්‍රේල් 09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම ප්‍රකාශයට පත් නොකිරීම මත රු. මිලියන 205 ක දඩ මුදලක් ශ්‍රී ලංකා රේගුවට සමාගම විසින් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. 2019 දී ගෙවන ලද දඩ මුදල අදාළ වර්ෂයේ වියදමට ගිණුම්ගත කිරීම වෙනුවට ශ්‍රී ලංකා රේගු වැට් ගිණුමට, වැට් පාලන ගිණුමට සහ සී.එස්.සී.එල් වගකීම් ගිණුමට ගිණුම්ගත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රඳවා ගත් ඉපැයීම් රු. මිලියන 205 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර ශ්‍රී ලංකා රේගු වැට් ගිණුම, වැට් පාලන ගිණුම සහ සී.එස්.සී.එල් වගකීම් ගිණුම පිළිවෙලින් රු. මිලියන 158.2 කින්, රු. මිලියන 39.97 කින් සහ රු. මිලියන 6.8 කින් අඩුවෙන් දක්වා තිබුණි.**

විගණකගේ නිර්දේශ අනුව ගිණුම් සටහන නිවැරදි කිරීම සඳහා ලංවිම විසින් 2023 ජනවාරි 17 දිනැති ලිපියක් මගින් ලංකා ගල්අඟුරු සමාගම වෙත නියෝග කර ඇත.

(v) **සමාගම විසින් අංක 123 දරන නැව්ගත තොගය සඳහා රේගු වැට් බදු වශයෙන් රු. මිලියන 136.2 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, රේගුවට භාණ්ඩ ප්‍රකාශයට පත් කිරීමේ ලේඛනයට (Cusdec) අනුව, තථ්‍ය වැට් බදු මුදල රු. මිලියන 106.97 ක් විය. ඒ අනුව, සමාගම වැඩිපුර රු. මිලියන 29.2 ක් ගෙවා ඇති බව නිරීක්ෂණය වූ අතර ගෙවිය යුතු හිඟ ශේෂයට එරෙහිව එම මුදල හිලව් කිරීමට කටයුතු කර නොතිබුණි.**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විසින් රු.29,266,965 ක මෙම වැට් බදු වැඩිපුර ගෙවීම වාර්තා කර ඇති බව ලංකා ගල්අඟුරු සමාගම විසින් සොයා ගත් අතර ලංකා ගල්අඟුරු සමාගම විසින් රේගුවට ගෙවිය යුතු හිඟ මුදල්වලට එරෙහිව මෙම වැඩිපුර ගෙවන ලද වැට් බද්ද හිලව් කිරීමට ලංකා ගල්අඟුරු සමාගම විසින් සුදුසු විධිවිධාන ආරම්භ කරනු ඇත.

(vi) **සමාලෝචිත වර්ෂය අවසානයේදී මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂ හතරක වටිනාකම රු. මිලියන 273.3 ක් වූ අතර ඊට අනුරූප ගෙවිය යුතු ශේෂයන් 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි. ඒ අනුව, එම ලැබිය යුතු ශේෂවල නිරවද්‍යතාවය සහ පැවැත්ම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.**

2023 ජනවාරි 17 දිනැති ලිපියක් මගින් ලංවිම මූල්‍ය ප්‍රකාශනවල එවැනි ගෙවිය යුතු ශේෂයන් නොමැති බව ලංවිම විසින් ලංකා ගල්අඟුරු සමාගම වෙත දන්වා ඇත.

(vii) **සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු ශේෂය රු. මිලියන 547.7 ක් වූ අතර සීමාසහිත ලංකා නැව් සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද තහවුරු කිරීම් අනුව එය රු. මිලියන 1,271.9 ක් විය. ඒ අනුව, රු. මිලියන 724.2 ක වෙනසක් නිරීක්ෂණය විය.**

2022 දෙසැම්බර් 31 වන දිනට ලංකා නැව් සංස්ථාවට ගෙවිය යුතු ශේෂයේ වෙනස සඳහා අයිතම හඳුනා ගනිමින් ලංකා ගල්අඟුරු සමාගම සැසඳුම් ප්‍රකාශයක් සකස් කර ඇත. බොහෝ අයිතම සාධාරණ හේතු මත ලංකා ගල්අඟුරු සමාගම විසින් ගිණුම්ගත කර නොමැති අතර සටහන අංක 24, ලබැදීම් සහ හදිසි අවස්ථාවල යටතේ අනාවරණය කර ඇත. 2022 දෙසැම්බර් 31 වන දිනට වසර අවසාන ශේෂවල පවතින විෂමතා විසඳීමට ලංකා ගල්අඟුරු සමාගම සහ ලංකා නැව් සංස්ථාව වර්තමානයේදී සාකච්ඡා කරමින් සිටින අතර මේ වන විට පහත වෙනස්කම් විසඳා ඇත.

i. 2022/12/31 දිනට ලංකා නැව් සංස්ථාවේ ශේෂ තහවුරු කිරීම අනුව, ගොඩබෑමේ වරායේ යැවීම (dispatch) සඳහා රු. 256,153,519 ක ගෙවිය යුතු ශේෂයක් පවතී. නමුත් 2022/12/31 දින වන විට විරාම කාලය (laytime) ගණනය කිරීම් සඳහා අදාළ පාර්ශවයන් තවමත් එකඟ වී නොමැති නිසා ලංකා ගල්අඟුරු සමාගම විසින් එය වාර්තා කර නොමැත. කළමනාකාරීත්වයේ සාකච්ඡා මත පදනම්ව, ලංකා ගල්අඟුරු සමාගම විසින් 2023 ජනවාරි 04 වන දින ලංවිම වෙතින් ලද අරමුදල්වලින් රු. මිලියන 107 ක අත්තිකාරම් ගෙවීමක් සිදු කර ඇත.

ii. 2021-2022 ගල් අඟුරු වාරය සඳහා විනිමය ලාභ සහ අලාභ සඳහා එකතුව රු. මිලියන 187 ක ඉන්වොයිසි ලංකා නැව් සංස්ථාව විසින් ලබා දී ඇත. ලංවිම රු. මිලියන 155 ක් සඳහා පමණක් එකඟ වී ඇති අතර එම මුදලින් රු. මිලියන 75 ක් 2023/5/26 දිනට ගෙවා ඇත.

(viii) **සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට ලිබර්ටි කොමඩිටීස් ලිමිටඩ් වෙතින් සහ විවිධ ණය ගැතියන්ගෙන් ලැබිය යුතු එස්.ජී.එස් ගාස්තුවලින් සියයට 50 ක් වන පිළිවෙළින් රු. මිලියන 8 ක් සහ රු. මිලියන 9.8 ක් සම්බන්ධ අදාළ ලේඛනමය සාක්ෂි විගණනය සඳහා ලැබී නොතිබුණු අතර වෙළඳ ණයහිමියන්ට සහ එස්.ජී.එස් ලංකා පුද්ගලික සමාගමට ගෙවිය යුතු ශේෂයන් වන පිළිවෙලින් රු.මිලියන 87.9 ක් සහ රු. මිලියන 12.2 ක් සම්බන්ධ අදාළ ලේඛනමය සාක්ෂිද විගණනය සඳහා ලැබී නොතිබුණි.**

i. ලිබර්ටි කොමඩිටීස් ලිමිටඩ් වෙතින් ලැබිය යුතු සියයට 50 ක එස්.ජී.එස් ගාස්තු - රු. 8,048,531
2015/16 වාරයේ යාත්‍රා 17 ක් සඳහා ගොඩබෑමේ වරායේ තොග සමීක්ෂණ (draft survey) ගාස්තු මෙයට ඇතුළත් වේ. අත්සන් කරන ලද ගිවිසුම මත පදනම්ව මෙම ගෙවීම සිදු කරන ලෙස දන්වමින් ලිබර්ටි කොමඩිටීස් ලිමිටඩ් වෙත 2019 දී විද්‍යුත් තැපෑලක් යවා ඇත. මේ සම්බන්ධයෙන් බේරුම්කරණ ක්‍රියාවලියක් සිදුවෙමින් පවතී.

ii. විවිධ ණය ගැතියන් - රු. 9,808,968
එම මුදල ආපසු අයකරගත නොහැකි ජාතිය ගොඩනැගීමේ බදු (NBT) සහ වරාය අධිකාරියේ බදුවලින් (PAL) සමන්විත වන බව මූලික විමර්ශණවලින් හෙළිදරව් විය.

iii. වෙළඳ ණය හිමියන්:

අ. ගෙවිය යුතු ගිණුම් - රු. 3,193,886.36
රු. 2,362,129.03 - ලංවිම අභ්‍යන්තර විගණන ශාඛාව විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තාවට අනුව, 2018 සහ ඊට පෙර වර්ෂවල සිදු කරන ලද වැරදි ගිණුම් සටහන් හේතුවෙන් මෙම ගෙවිය යුතු මුදල ඇති වී ඇත. ලංවිම අභ්‍යන්තර විගණන ශාඛාව විසින් කරන ලද නිර්දේශවලට අනුකූලව නිවැරදි කරන ලද සටහන් යොදන ලෙස ලංවිම විසින් ලංකා ගල්අඟුරු සමාගම වෙත උපදෙස් දී ඇත.

රු. 831,757.33 - පසුව පියවන ලද 2022 වර්ෂයට අදාළ උපචිත වියදම්.

ආ. රු. 84,771,789.21- නොබල් රිසෝසස් ඉන්ටනැෂනල් වෙත ගෙවිය යුතු මුදල්
ණයවර ලිපි වලංගු කාලය අවසන් වීමේ ප්‍රතිඵලයක් ලෙස මූලික වශයෙන් නොබල් රිසෝසස් ඉන්ටනැෂනල් පුද්ගලික සමාගම වෙත අඩුවෙන් ගෙවන ලද මුදලකින් සමන්විත වේ. වෙනත් දේ අතර ගල් අඟුරු ආශ්‍රිත ගෙවීම් සහ කළමනාකරණ ගාස්තු වෙනුවෙන් ලංවිම සමඟ කලක සිට හිඟව තිබූ හිමිකම් හේතුවෙන් මෙහෙයුම් අවශ්‍යතා මත ගෙවිය යුතු අනෙකුත් ගෙවීම් පියවීමට මෙම අරමුදල් යොදා ගෙන ඇත.

ඇ. එස්.ජී.එස් ලංකා පුද්ගලික සමාගම - රු. 12,161,313
එස්.ජී.එස් ලංකා පුද්ගලික සමාගම වෙත ගෙවිය යුතු මෙම ශේෂය සමාගම විසින් තහවුරු කර ඇති අතර විගණන සමාලෝචනය සඳහා විස්තරාත්මක උපලේඛණය ලබා ගත හැක.

### (ආ) සී/ස ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්.) සමාගම

(i) **එල්.කේ.ඒ.එස් 08, ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රමිතියෙහි 42 වැනි ඡේදයේ විධිවිධාන අනුව මූල්‍ය ප්‍රකාශනවල පූර්ව වර්ෂයේ ගැලපීම් සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී පෙර කාලපරිච්ඡේදවලට අදාළව රු. මිලියන 7.39 ක සමහර පරිපාලනමය සහ සෘජු වියදම් හඳුනාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි.**
විගණනයට විස්තර කර ඇති පරිදි දැනටමත් සෘජු වියදම් සඳහා පමණක් ගැලපීම් සිදු කර ඇති අතර පරිපාලන වියදම් සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නොමැත. සෘජු වියදම් යටතේ, සටහන් අංක 22 මගින් විස්තර කර ඇති පරිදි ගැලපීම් සිදු කරන ලද අතර එහිදී 2021 වසරේ ආරම්භක ශේෂයන් දේපළ, පිරියත හා උපකරණ සඳහා වන සටහනේ නිවැරදි කර ඇත. ඇලුමිනියම් ප්‍රතිචක්‍රීකරණය සඳහා ව්‍යාපෘති වියදම් වර්ගීකරණය කිරීම දෙවන ගැලපුම විය.

(ii) **එල්.කේ.ඒ.එස් 16, දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතියෙහි 51 ඡේදය අනුව වත්කම්වල සුන්බුන් අගය සහ ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කිරීමට පියවර නොගෙන රු. මිලියන 79.5 ක ඉන්ජෙක්ෂන් මෝල්ඩින් යන්ත්‍රය ඇතුළුව රු. මිලියන 100.08 ක සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්, සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට සමාගම විසින් භාවිතා කර තිබුණි.**
නැවත ඇගයීම් කටයුතු කරගෙන යාමට කටයුතු කරමින් පවතී.

(iii) **සමාගම ගලිගමුව ඉඩම සඳහා 2017 ජූලි 07 දින සිට වසර 35 ක් සඳහා බදු ගිවිසුමකට එළැඹ තිබුණි. කෙසේ වෙතත්, එස්.එල්.එෆ්.ආර්.එස් 16, කල්බදු ප්‍රමිතිය ප්‍රකාරව සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල එම කල්බද්දට අදාළව භාවිතා කිරීමට අයිතිය ඇති වත්කම සහ කල්බදු වගකීම හඳුනාගෙන නොතිබුණි.**

මෙම දෝෂය හඳුනාගෙන ඇති අතර ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී එස්.එල්.එෆ්.ආර්.එස් -16 ට අනුකූලව එය නිවැරදි කරනු ඇත.

(iv) **සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට මව් සමාගම වන මණ්ඩලයෙන් අයවිය යුතු වෙළඳ ලැබිය යුතු මුදල් ශේෂය රු. මිලියන 165.31 ක් විය. කෙසේ වෙතත්, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඊට අනුරූප ගෙවිය යුතු ශේෂය රු. මිලියන 28.21 ක් පමණක් වීමෙන් රු. මිලියන 137.1 ක වෙනසක් නිරීක්ෂණය විය.**

වෙනස්කම් හඳුනා ගැනීමට සැසඳීම් සිදු කර ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල වෙනස්කම් නිවැරදි කරනු ඇත.

(v) **සමාලෝචිත වර්ෂය අවසානයේ දී පවා ගෙවිය යුතු ආදායම් බද්දට එරෙහිව සමාගම විසින් රු. මිලියන 2.12 ක් වූ දිගුකාලීන රඳවාගැනීමේ බදු ලැබිය යුතු ශේෂයට හිමිකම් පෑ නොතිබුණි. තවද, රඳවාගැනීමේ බදු සහතික විගණනය සඳහා ලැබී නොතිබුණි.**

රඳවාගැනීමේ බදු සහතිකය විගණනයට භාර දී ඇත. 2022/2023 තක්සේරු වර්ෂය සඳහා වන ආදායම් බදුවලට එරෙහිව ලැබිය යුතු රඳවාගැනීමේ බදු ශේෂය හිලව් කිරීමට ශ්‍රී ලංකා එනර්ජීස් සමාගම වෙත දැනුම් දීමට කටයුතු කරනු ඇත.

(vi) **සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට පුද්ගලික වාණිජ බැංකුවකින් ලබාගත් කාලීන ණය 06 ක මුළු ණය ශේෂය රු. මිලියන 80.86 ක් වූ අතර ශේෂය තහවුරු කිරීමට අනුව, ණය ශේෂය රු. මිලියන 87.65 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන සහ ශේෂය තහවුරු කිරීම අතර රු. මිලියන 6.78 ක වෙනසක් නිරීක්ෂණය විය.**

වෙනස්කම් හඳුනා ගැනීමට සැසඳීම් සිදු කර ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල වෙනස්කම් නිවැරදි කරනු ඇත.

(vii) **2019 වසරේ සිට එකතු වී ඇති සහ මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු මුදල් යටතේ පෙන්වා ඇති රු. මිලියන 7.06 ක හඳුනා නොගත් තැන්පතු හඳුනා ගැනීමට සමාගම නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.**

මෙම ශේෂයේ ප්‍රධාන කොටසක් දැනටමත් නිරවුලු කර ඇත. ඒ අනුව ඊආර්පී පද්ධතිය යාවත්කාලීන කරනු ඇත.

(viii) **2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ආදායම් බද්ද රු. මිලියන 30.77 ක් වූ අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ ආදායම් බදු වාර්තා අනුව (2020/2021 තක්සේරු වර්ෂය දක්වා), එම කාලයට අදාළව ගෙවිය යුතු ආදායම් බද්ද රු. මිලියන 15.2 ක් විය. ඒ අනුව, රු. මිලියන 15.57 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැලපීම් සිදු කර නොතිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ආදායම් බදු ශේෂය රු. මිලියන 43.88 ක් වූ අතර සමාගම 2015/2016 තක්සේරු වර්ෂයේ සිට ආදායම් බදු ගෙවා නොතිබුණි.**

ආදායම් බදු වාර්තා ඉදිරිපත් කිරීමේ අත පසුවූ වැඩ 2023 අප්‍රේල් මාසයේදී අවසන් කර ඇත. මීට පෙර මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් පමණක් සිදු කර ඇති අතර දැන් ආදායම් බදු වාර්තාවලට අනුව මූල්‍ය ප්‍රකාශන ගලපනු ඇත.

(ix) **සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට තොගය රු. මිලියන 39.22 ක් විය. වසර අවසන් වූ දිනට පසු දිනට පද්ධතිය විසින් ලබා දී ඇති අනුපාතවලට අනුව බරිත සාමාන්‍ය පිරිවැය භාවිතා කරමින් මෙම ශේෂයට එළඹී තිබුණි. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති තොග ශේෂයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය.**

ඊආර්පී ක්ලවුඩ් පද්ධතිය යටතේ තොග අගය කිරීමට බරිත සාමාන්‍ය පිරිවැය යොදා ගැනේ. ඒ අනුව, තොග චලනයන් සමඟ තොග අයිතමයක ඒකක මිල වෙනස් වේ. 2022 දෙසැම්බර් 31 දිනට ස්වාධීන භෞතික සත්‍යාපන වාර්තාව සහ පද්ධති වාර්තාවට අනුව එක් එක් තොග අයිතමයේ ප්‍රමාණය විගණකයින් ඉල්ලා සිටින්නේ නම් ලබා දිය හැකි අතර ප්‍රමාණයේ කිසිදු විචලනයක් හඳුනාගෙන නොමැත.

**(ඇ) සී/ස ලංකා විදුලි (පුද්.) සමාගම**

**(i)** **මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුවේ 5.5 ඡේදයට අනුව, ගනුදෙනු හෝ වෙනත් සිදුවීම්වලින් පැන නගින වත්කම් හෝ වගකීම් මූලික වශයෙන් හඳුනා ගැනීම, ආදායම් සහ ඒ ආශ්‍රිත වියදම් යන දෙකම එකවර හඳුනා ගැනීමට හේතු විය හැක. ආදායම සහ ඒ ආශ්‍රිත වියදම් එකවර හඳුනා ගැනීම සමහර විට ආදායම සමග වියදම් ගැලපීම ලෙස හැඳින්වේ. කෙසේ වෙතත්, සමාගම විසින් 2017, 2018, 2019, 2020 සහ 2022 යන කාලපරිච්ඡේදය තුළ සූර්ය බලශක්තිය මිලදී ගත් පිරිවැය (ශුද්ධ ගිණුම්කරණය සහ නෙට් ප්ලස්) වූ රු. මිලියන 2,819.6 ක් අදාළ වර්ෂවල විකුණුම් පිරිවැය ලෙස හඳුනාගෙන නොතිබුණද (ඒ වෙනුවට, සමාගම විසින් එම පිරිවැය මණ්ඩලයෙන් ලැබිය යුතු ලෙස හඳුනාගෙන තිබුණි.) මිලදී ගත් සූර්ය බලශක්තියේ විකුණුම් ආදායම අදාළ වර්ෂවල විකුණුම් ලෙස හඳුනාගෙන තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2022 දෙසැම්බර් 31 දිනට රඳවා ගත් ඉපැයීම්, වර්ෂය සඳහා ලාභය සහ ලැබිය යුතු ශේෂය පිළිවෙලින් රු. මිලියන 1,336.9 කින්, රු. මිලියන 1,482.7 කින් සහ රු. මිලියන 2,819.6 කින් වැඩියෙන් දක්වා තිබුණි.**

මෙම සූර්යබලය ජනනය සඳහා ගෙවීමේ පිරිවැය වෙනමම මිලදී ගැනීමේ පිරිවැය ලෙස නොසලකන අතර, නිර්යාත (Export) කරන ලද මුළු සූර්ය බලශක්තිය භූමිප්‍රදේශය තුළ පරිභෝජනය කරන්නේ නම් එය ආදායමක් ලෙස සැලකිය හැකිය. සමහර විට එය ජාතික විදුලිබල පද්ධතියට නිර්යාත කළ හැකිය. එබැවින්, ලාභ හෝ අලාභ එකම අගයකින් වැඩි වේයැයි පැවසිය නොහැක. ඒකාකාර ජාතික ගාස්තු (යුඑන්ටී) ගැලපීම මගින් මෙම ගැටළුව නිරාකරණය කරනු ඇත. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් යුඑන්ටී අනුමත කළ පසු මෙය විකුණුම් පිරිවැය සඳහා ගැලපීමක් ලෙස සලකනු ඇත.

**(ii)** **එල්.කේ.ඒ.එස් 16, දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතියෙහි 51 වන වගන්තියට අනුව, වත්කම්වල සුන්බුන් අගය සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම්, වෙනස්කම් එල්.කේ.ඒ.එස් 8 ට අනුකූලව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතුය. 2022 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් භාවිතා කරනු ලබන රු. මිලියන 9,554.6 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් ඒ අනුව සමාලෝචනය කර නොතිබුණි.**

විගණකවරුන්ගේ අදහස සමඟ එකඟ වන නමුත්, අදාළ ක්ෂයවීම් අනුපාත කර්මාන්තයේ අනුපාතවලට සමාන බව කරුණාවෙන් සලකන්න. තවද, විශාල භූගෝලීය ප්‍රදේශයක් පුරා පැතිර ඇති සමස්ත වත්කම් පන්තිවල භාවිත කළ හැකි ආයු කාලය සමාලෝචනය කිරීම ප්‍රායෝගික නොවේ. (යටිතල පහසුකම් පද්ධතිය ලෙකෝහි ඉහළම වටිනාකමක් සහිත වත්කමකි).

**(iii)** **2022 දෙසැම්බර් 31 දිනට විවිධ සේවා සඳහා මණ්ඩලයෙන් අයවිය යුතු ශේෂය රු. මිලියන 2,826.6 ක් වූ අතර, මෙම ශේෂය ශුද්ධ ගිණුම්කරණය සහ නෙට් ප්ලස් ක්‍රම භාවිතා කරමින් 2017, 2018, 2019, 2020 සහ 2022 වර්ෂවලදී බලශක්තිය මිලදී ගැනීමේ පිරිවැය සඳහා මණ්ඩලයෙන් අයවිය යුතු රු. මිලියන 2,819.6 කින් සමන්විත විය. මණ්ඩලයේ ශේෂය තහවුරු කිරීම අනුව, සමාගමට ගෙවිය යුතු මුදලක් නොතිබූ අතර ශුද්ධ ගිණුම්කරණය සහ නෙට් ප්ලස් ක්‍රම භාවිතා කරමින් විදුලිය මිලදී ගැනීම සඳහා පාර්ශව දෙක අතර විධිමත් ගිවිසුමක් නොතිබුණි. එබැවින්, එම ශේෂයේ අයකර ගැනීමේ හැකියාව විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද, ඉහත ලැබිය යුතු ශේෂය සඳහා සමාගම විසින් රු. මිලියන 2,449.3 ක හානිකරණ ප්‍රතිපාදනයක් සලසා තිබුණි.**

නියාමකයාගේ (ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව) සහ අමාත්‍යාංශයේ උපදෙස් අනුව මෙම මුදල ගිණුම්වලට ගෙන ඇත. කෙසේ වෙතත්, ලැබිය යුතු ශේෂයේ අවදානම් සාධකය සංසන්දනය කිරීමේදී, අදාළ ප්‍රතිපාදන දැනටමත් ලෙකෝ ගිණුම්වල සලසා ඇත. විධිමත් ගිවිසුමක් නොමැති අතර ලංවිම විසින් තවමත් තහවුරු කිරීමක් ඉදිරිපත් කර නොමැත.

**(iv)** **මණ්ඩලයේ ප්‍රාථමික උපපොලවල් ඉදිකිරීම සඳහා භාවිතා කිරීමට නියමිත ඉඩම් සහ ගොඩනැගිලි මිලදී ගැනීම සඳහා සමාගම රු. මිලියන 206.9 ක් වැය කර තිබූ අතර එම මුදල 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස සටහන් කර තිබුණි. කෙසේවෙතත්, සමාගමේ ඉඩම්වල ප්‍රාථමික උපපොළවල් ඉදිකිරීම සහ ඉහත සඳහන් ඉඩම් සහ ගොඩනැගිලි භාවිතය සඳහා මණ්ඩලය විසින් ගෙවිය යුතු ගාස්තු සම්බන්ධයෙන් සමාගම සහ මණ්ඩලය අතර විධිමත් ගිවිසුමක් නොතිබුණි.**

ලෙකෝ විසින් ලංවිම හා එක්ව ප්‍රාථමික උපපොළවල් පහක් ඉදිකර ඇත. ඒවා කිරිබත්ගොඩ, කටුනායක, කොටිකාවත, නාවල සහ හික්කඩුව යන ස්ථානවල ඉදිකර ඇත. මෙහිදී, ඉඩම් 5 ක් ලෙකෝ විසින් මිලදී ගෙන ඇති අතර ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් යොදවා ලංවිම මගින් ප්‍රාථමික උපපොළවල් ඉදිකර ඇත. ලංවිම විසින් ඉහත ඉඩම් තවමත් පවරාගෙන නොමැති අතර මෙම ඉඩම්වල පිරිවැය ලෙකෝ වෙත ගෙවා නොමැත. ලෙකෝහි මූල්‍ය ප්‍රකාශනවල මෙය ලැබිය යුතු බවට හඳුනාගෙන ඇත. ලංවිම සහ ලෙකෝ අතර මේ වන විට සාකච්ඡාව පැවැත්වෙන අතර ගැටලුව තවමත් අවසන් වී නොමැත. සමාදාන විසඳුමකට එළඹීමෙන් පසු අදාළ ක්‍රියාමාර්ග ගනු ඇත.

(v) **ස්වයං ජනනය සඳහා මණ්ඩලයෙන් ලැබිය යුතු රු. මිලියන 3.9 ක ලැබිය යුතු ශේෂය වසර පහකට වැඩි කාලයක් තිස්සේ අය නොවී පැවතුණි. ස්වයං ජනනය සම්බන්ධයෙන් සමාගම සහ මණ්ඩලය අතර විධිමත් ගිවිසුමක් නොතිබූ අතර, එම මුදල සඳහා ශේෂ තහවුරු කිරීම විගණනයට ලැබී නොතිබුණි. එබැවින්, එම ශේෂයේ අයකර ගැනීමේ හැකියාව විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.**

ලංවිම සහ ලෙකෝ සමග ඇති ආරවුලක් හේතුවෙන් මෙම ශේෂය නිරවුල් නොවී පවතී (රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් ලංවිම සහ ලෙකෝ විසින් නොසලකා හරින බැවින්). කෙසේ වෙතත්, විධිමත් ගිවිසුමක් නොමැති වුවද, අදාළ ප්‍රතිපාදන දැනටමත් ලෙකෝ ගිණුම්වල සලසා ඇත.

(vi) **මිලදී ගැනීමේ විචල්‍යතා ගිණුමේ, මිලදී ගැනීමේ ඇණවුමේ වටිනාකම සහ තථ්‍ය ගෙවීම අතර වෙනස හඳුනාගෙන තිබුණි. ඒ අනුව, අදාළ පරිදි තොග, වත්කම් හෝ ලාභ හෝ අලාභ ලෙස හඳුනා ගැනීම වෙනුවට මෙහෙයුම් වියදම් ලෙස රු. මිලියන 149.2 ක මුදලක් ලාභ හෝ අලාභවලට අය කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ඉහත ගැලපීම හේතුවෙන් ලාභය හෝ අලාභයට, තොගවලට හෝ වත්කම්වලට වන බලපෑම විගණනයට බැහැර කළ නොහැක.**

මෙය ඊආර්පී පද්ධතියේ ආවේනික ගැටළුවකි. මිලදී ගැනීමේ ඇණවුමේ වටිනාකම වඩා ගෙවන ලද ඕනෑම අතිරික්ත මුදලක් (මිල වෙනස්වීම් / එස්එස්සීඑල් යනාදි නව බදු ක්‍රියාත්මක කිරීම්) අදාළ භාණ්ඩ ලැබීම් සටහනේ අගයට මාරු කළ නොහැක. එබැවින්, ශේෂය ආදායම් ප්‍රකාශයට අය කෙරේ.

(vii) **2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 6.7 ක් වූ හඳුනා නොගත් තැන්පතු විවිධ ණය හිමියන්ට ඇතුළත් කර තිබුණි.**

2021 දී ප්‍රතික්ෂේප වූ ගනුදෙනු ගිණුම් ශේෂය විවිධ ණය හිමියන්ගේ ගිණුමට මාරු කිරීම හේතුවෙන් මෙම හිඟ ශේෂයන් ගිණුම්වල නිරූපණය විය. පසුව, මෙම ශේෂයන් ලංවිම සමඟ පරීක්ෂා කර නිරවුල් කර ඇත. රු. මිලියන 10 ක් ලංවිම සමඟ හඳුනාගෙන නිරවුල් කර ඇත. නිරවුල් කිරීම සඳහා තවත් රු. මිලියන 6 ක ශේෂයක් මෙම ගිණුමේ පවතී. මෙය අඛණ්ඩ ක්‍රියාකාරකමක් වන අතර කලින් කලට නව ශේෂයන් එකතු වී නිරවුල් වන බැවින් සම්පූර්ණයෙන්ම නිරවුල් කළ නොහැක.

(viii) **මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට කැලණිය, මොරටුව, නුගේගොඩ සහ මීගමුව ශාඛාවල කෙරීගෙන යන වැඩවල ශේෂය පිළිවෙලින් රු. මිලියන 45.7 ක්, රු. මිලියන 56 ක්, රු. මිලියන 183.5 ක් සහ රු. මිලියන 41.3 ක් විය. කෙසේ වෙතත්, කෙරීගෙන යන ප්‍රාග්ධන කාර්යයන් පිළිබඳ වාර්තාවට අනුව, ඉහත ශේෂයන් පිළිවෙලින් රු. මිලියන 43.8 ක්, රු. මිලියන 55.3 ක්, රු. මිලියන 181.7 ක් සහ රු. මිලියන 46.7 ක් විය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල සහ කෙරීගෙන යන ප්‍රාග්ධන කාර්යයන් පිළිබඳ වාර්තාවේ පෙන්වා ඇති ශේෂයන් අතර පිළිවෙලින් රු. මිලියන 1.9 ක, රු. මිලියන 0.7 ක, රු. මිලියන 1.8 ක සහ රු. මිලියන 5.4 ක වෙනස්කම් පැවතුණි.**

මෙම පද්ධති දෙක (කාර්යය පිරිවැය සහ පොදු ලෙජරය) අතර ඇති කාල පරතරයන් හේතුවෙන් මෙම වෙනස්කම් ඇති වූ අතර ලෙකෝහි තොරතුරු තාක්ෂණ අංශයේ සහාය ඇතිව ඒවා නිරවුල් කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇත.

(ix) **2022 සැප්තැම්බර් 15 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා රු. බිලියන 1.9 ක භාණ්ඩාගාර බැඳුම්කරයට අදාළ රු. මිලියන 3.3 ක භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීමේ වට්ටම් ක්‍රමක්ෂය කිරීම වැරදි ලෙස සටහන් කර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2022 දෙසැම්බර් 31 දිනට පොලී ආදායම රු. මිලියන 6.6 කින් අඩුවෙන් දක්වා තිබූ අතර භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන ගිණුමද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.**

විගණකගේ නිරීක්ෂණයට එකඟ වේ. ගැලපීම් 2023 වර්ෂයේදී සිදු කරනු ඇත.

(x) **සමාගම 2022 වර්ෂය සඳහා ඒකාකාර ජාතික ගාස්තු ගැලපීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. කෙසේ වෙතත්, තොරතුරු නොමැතිකම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයට ඇති බලපෑම විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.**

අවසාන තහවුරු කිරීම තවමත් නියාමකගෙන් (ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව) ලැබී නොමැත, එබැවින්, ජර්නල් සටහන් ගැලපීමක් සිදු කර නොමැත.

(xi) **2022 දෙසැම්බර් 31 දිනට ලංකා බ්‍රෝඩ් බෑන්ඩ් නෙට්වර්ක් ප්‍රයිවට් ලිමිටඩ් හි සාමාන්‍ය කොටස්වල සිදු කරන ලද රු. මිලියන 5 ක ආයෝජනය සම්බන්ධයෙන් කොටස් සහතික හෝ වෙනත් ප්‍රමාණවත් ලේඛනමය සාක්ෂි විගණනයට ලැබී නොතිබුණි.**

මේ කාරණය නීතිපතිවරයාට යොමු කර ඇත. නීතිපතිවරයාගෙන් උපදෙස් ලැබුණු පසු ගැටලුව සමථයකට පත් කිරීමට අදාළ සියලුම නීතිමය ක්‍රියාමාර්ග නීති අංශය මගින් ගනු ඇත.

(xii) **2022 දෙසැම්බර් 31 දිනට විදුලිය මිලදී ගැනීම් සඳහා මණ්ඩලයට ගෙවිය යුතු ශේෂය රු. මිලියන 1,799.3 ක් වුව ද, මණ්ඩලයේ ශේෂය තහවුරු කිරීමට අනුව, අනුරූප ලැබිය යුතු ශේෂය රු. මිලියන 2,912.7 ක් විය. 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සහ ශේෂය තහවුරු කිරීම අතර රු. මිලියන 1,113.4 ක වෙනසක් නිරීක්ෂණය වී ඇත.**
රු. 1,113,389,481 ක වෙනස පහත පරිදි සැසඳේ. මෙම වෙනස සඳහා හේතු තුනක් ඇත.

1. 2021 සඳහා නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ යුවින්ටි ගැලපුම් වාර්තාවට අනුව, ලංවිම විසින් ලෙකෝ වෙත ප්‍රතිපූරණය කළ යුතු නෙට් ප්ලස්/ශුද්ධ ගිණුම්කරණය යටතේ මිළදී ගත් සූර්යබලයට අදාළ යුවින්ටි ගැලපුම් මගින් රු. 1,112,404,347 ක් ලෙකෝ විසින් අඩු කර ඇත. ලංවිම එය ඔවුන්ගේ ගිණුම් පොත්වල ලෙකෝ වෙත ගෙවිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර නොමැත.
2. ලංවිම විසින් ගණනය කරන ලද ඇස්තමේන්තුගත 2022 යුවින්ටි මුදල වූ රු. 3,163,131 ක් ලෙකෝ වෙත ගෙවිය යුතු ලෙස ලංවිම විසින් ගිණුම්ගත කර ඇත. කෙසේ වෙතත්, එය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නිල වශයෙන් ප්‍රකාශයට පත් කර නොමැති බැවින් ලෙකෝ විසින් එය ගිණුම්ගත කර නොමැත.
3. 2020 හතරවන කාර්තුවට අදාළව ලංවිමට ගෙවිය යුතු යුවින්ටි ගැලපුම රු. 84,941,899.79 ක් විය. මෙම මුදල 2022 දෙසැම්බර් මාසයේදී ඉන්වොයිස් කර ඇත. කෙසේ වෙතත්, රු. 2,177,997.43 ක මෙම එස්එස්සීඑල් මුදල එහි ඇතුළත් කර නොමැත. එබැවින්, ලෙකෝ එය ගිණුම්ගත කර නොමැත.

| | |
|---|---|
| ලංවිම ගිණුම් අනුව 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය | 2,912,676,629.00 |
| ශුද්ධ ගිණුම්කරණය/නෙට් ප්ලස් -කාර්තුව 1,2021 | (266,668,917.50) |
| ශුද්ධ ගිණුම්කරණය/නෙට් ප්ලස් -කාර්තුව 2,2021 | (278,529,555.00) |
| ශුද්ධ ගිණුම්කරණය/නෙට් ප්ලස් -කාර්තුව 3,2021 | (277,006,208.00) |
| ශුද්ධ ගිණුම්කරණය/නෙට් ප්ලස් -කාර්තුව 4,2021 | (290,199,667.00) |
| 2022 යුවින්ටි සඳහා ඇස්තමේන්තුව | (3,163,131.00) |
| 2020 හතරවන කාර්තුවේ යුවින්ටි සඳහා එස්එස්සීඑල් | 177,997.43 |
| ලෙකෝ ගිණුම් අනුව 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,799,287,147.93 |

(xiii) **2022 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව හඳුනා නොගත් රු. මිලියන 16.2 ක් වූ බැංකු තැන්පතු සහ බැංකු ගිණුමට හර කර ඇති හඳුනා නොගත් රු. මිලියන 6.2 ක් නිරවුල් කිරීමට සමාගම කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ඉන් රු. මිලියන 14.3 ක් සහ රු. මිලියන 5 ක් පිළිවෙලින් මාස 06 ට වැඩි ය. තවද, එම හඳුනා නොගත් බැංකු තැන්පතු සහ හර කර ඇති මුදල් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.**
භාණ්ඩාගාර දෙපාර්තුමේන්තුව අදාළ බැංකු සමඟ සම්බන්ධ වෙමින් මෙම ගනුදෙනු වරින් වර හඳුනාගෙන ඒ අනුව අවශ්‍ය ගැලපීම් සිදු කරයි.

(xiv) **2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 5.9 ක් වූ නොසැසඳුණු හර ශේෂය වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ශේෂයට ඇතුළත් කර තිබුණි.**
මෙය අන්තර් ශාඛා ගිණුම් අතර වන නොසැසඳු ගනුදෙනු ශේෂයන්ට අදාළ වේ. නියමිත වේලාවට එවා සැසඳීමට අවශ්‍ය දේ ලෙකෝ විසින් කරනු ඇත.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

(xv) **සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ඇන්ටේ ලෙකෝ මීටරින් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් වෙත ගෙවිය යුතු ශේෂය රු. මිලියන 38.6 ක් විය. ඇන්ටේ ලෙකෝ මීටරින් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර ඇති ලෙකෝ වෙතින් ලැබිය යුතු අනුරූප ශේෂය රු. මිලියන 22.8 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට සමාගම් දෙක අතර රු. මිලියන 15.8 ක වෙනසක් නිරීක්ෂණය විය.**
සැසඳීම පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| අංකය - 12(අ) | | | |
| | | | |
| 2022/12/31 දිනට ලෙකෝ ගිණුම්වල ගෙවිය යුතු මුදල | | | 38,614,045.41 |
| | | | |
| <u>එකතු කළා</u> | | | |
| ඉන්වොයිස් අංකය - ලෙකෝ/ටී029 | | 9,093.60 | |
| ඉන්වොයිස් අංකය - 2022/ලෙකෝ/ඩීවන්/01 (3පේස් ටෙස්ට් බෙන්චස්) | | 659,509.20 | |
| ඉන්වොයිස් අංකය - ලෙකෝ/ජීඅයිඑස්/01 (පෝල් සවේ, ගාල්ල) | | 1,019,807.22 | |
| ඉන්වොයිස් අංකය - ලෙකෝ/ජීඅයිඑස්/02 (පෝල් සවේ, මොරටුව) | | 3,546,241.82 | |
| | | | 5,234,651.84 |
| | | | |
| <u>අඩු කළා</u> | | | |
| පීඕ අංකය - 459505 ඒඒ | | (17,573,305.10) | |
| පීඕ අංකය - 459505 ඒබී (නොපියවූ මුදල) | | (3,461,814.15) | |
| | | | (21,035,119.25) |
| 2022/12/31 දිනට ඒඑල්එම්සී ගිණුම්වල ලැබිය යුතු මුදල | | | 22,813,578.00 |

මෙම ඉන්වොයිසි 2023 වර්ෂයේදී පියවා ඇති බැවින් ගිණුම් ගැලපීමට අවශ්‍ය නොවේ.

(xvi) **සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ඇන්ටේ ලෙකෝ මීටරින් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් වෙත ලබා දී ඇති අත්තිකාරම් මුදල රු. මිලියන 136.3 ක් විය. කෙසේ වෙතත්, ඇන්ටේ ලෙකෝ මීටරින් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශනවලට අනුව, අනුරූප ශේෂය රු. මිලියන 113.3 ක් වූ අතර 2022 දෙසැම්බර් 31 දිනට සමාගම් දෙක අතර රු. මිලියන 23 ක වෙනසක් නිරීක්ෂණය විය.**
පහත පරිදි ඇන්ටේ ලෙකෝ සමාගමට අත්තිකාරම් ගෙවීම මෙම ගැටලුවට හේතු වූ අතර අත්තිකාරම් පියවීම ද පහත දක්වා ඇත.

| | |
|---|---|
| <u>අංකය - 12(ආ)</u> | |
| 2022/12/31 දිනට ලෙකෝ ගිණුම්වල අත්තිකාරම් ගෙවීම් | 136,278,265.26 |
| | |
| <u>අඩු කළා</u> | |
| පීඕ අංකය - | (22,891,404.36) |
| පීඕ අංකය - 457519 සහ ජීඅයිඑස් අත්තිකාරම් | (97,128.23) |
| | |
| 2022/12/31 දිනට ඒඑල්එම්සී ගිණුම්වල අත්තිකාරම් ගෙවීම් | 113,289,732.67 |

**1.2.2 මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (එස්.එල්.ඒ.එස්/ එස්.එල්.එෆ්.ආර්.එස්) සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

**(අ) මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුව**

(i) **සංකල්ප රාමුවේ 4.1 (ආ) ඡේදයට පටහැනිව, වෙනම ආයතනයක් ලෙස මණ්ඩලය යටතේ මෙහෙයවන සේවක අර්ථසාධක අරමුදලේ වියදම වූ රු. මිලියන 51.82 ක් මණ්ඩලයේ වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගෙන තිබුණි.**
''වාර්තා කිරීමේ ආයතනයක මූල්‍ය කාර්ය සාධනයට අදාළ ආදායම සහ වියදම්'' මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පීය රාමුවේ 4.1 (ආ) ඡේදයේ සඳහන් වේ.

2003 දෙසැම්බර් 31 වන දින ගැසට් කරන ලද අර්ථසාධක අරමුදල් රීතිවල වගන්ති අංක 5 ට අනුව, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවක් මගින් අරමුදල කළමනාකරණය සහ පරිපාලනය කරනු ලබයි. එබැවින් අරමුදල කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. එබැවින් අරමුදල කළමනාකරණය සහ පරිපාලනය කිරීමේ පිරිවැය ලංවි විසින් දරනු ලබයි.

තවද, එම රීතිවල වගන්ති අංක 20 (i) ට අනුව, නිවාස ණය පරීක්ෂාවට අදාළ වියදම් හැර අරමුදලේ සියලුම පරිපාලන වියදම් ලංවිම විසින් දරනු ලබන අතර මෙම ප්‍රතිපත්තිය අරමුදල ආරම්භයේ සිටම ක්‍රියාත්මක විය. (1969 නොවැම්බර් 01 දින සිට. කෙසේ වෙතත්, මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුව අනුව කරුණු වාර්තා කිරීම ඊළඟ මූල්‍ය වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ඇත.

(ii) **සංකල්ප රාමුවේ 4.3 ඡේදයට පටහැනිව, අයිතිය මණ්ඩලය සතු වත්කම් කාණ්ඩ හතරකට අදාළ රු. මිලියන 7.06 ක් වූ ස්ථාවර වත්කම් අයිතම පනස් නවයක් ඉහත සඳහන් සේවක අර්ථසාධක අරමුදල් එකකය විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණි.**
''වාර්තා කිරීමේ ආයතනයක මූල්‍ය කාර්ය සාධනයට අදාළ ආදායම සහ වියදම්'' මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පීය රාමුවේ 4.1 (ආ) ඡේදයේ සඳහන් වේ.

2003 දෙසැම්බර් 31 වන දින ගැසට් කරන ලද අර්ථසාධක අරමුදල් රීතිවල වගන්ති අංක 5 ට අනුව, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවක් මගින් අරමුදල කළමනාකරණය සහ පරිපාලනය කරනු ලබයි. එබැවින් අරමුදල කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. එබැවින්, අරමුදල කළමනාකරණය සහ පරිපාලනය කිරීමේ පිරිවැය මණ්ඩලය මගින් දරනු ලබයි.

තවද, එම රීතිවල වගන්ති අංක 20 (i) අනුව, නිවාස ණය පරීක්ෂාවට අදාළ වියදම් හැර අරමුදලේ සියලුම පරිපාලන වියදම් මණ්ඩලය විසින් දරනු ලබන අතර මෙම ප්‍රතිපත්තිය අරමුදල ආරම්භයේ සිටම ක්‍රියාත්මක විය. (1969 නොවැම්බර් 1 දින සිට). කෙසේ වෙතත්, මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්ප රාමුව අනුව කරුණු වාර්තා කිරීම ඊළඟ මූල්‍ය වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ඇත.

**(ආ) එල්.කේ.ඒ.එස් 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

(i) **ප්‍රමිතියේ 69 වැනි ඡේදයට පටහැනිව, රු. මිලියන 139.48 ක් වූ තොග ගැලපුම් ගිණුමේ හර ශේෂය තොග ශේෂය යටතේ පෙන්වීම වෙනුවට ජංගම වගකීම් යටතේ අනෙකුත් ගෙවිය යුතු ශේෂයට එරෙහිව හිලව් කර තිබුණි.**
තොග ගැලපුම් ගිණුම, වාර්ෂික තොග සත්‍යාපනයේදී හඳුනාගත් තොගවල අතිරික්තයට හෝ තොගවල කිසියම් හිඟයකට අදාළ තාවකාලික ශේෂයක් නියෝජනය කරන අතර එය ඉතා මැනවින් ගිණුම්කරණ වර්ෂය අවසන් වීමට පෙර නිරවුල් කළ යුතුය. කෙසේ වෙතත්, 2023 සැප්තැම්බර් මූල්‍ය ප්‍රකාශනවල තොග ගැලපුම සැලකිය යුතු ලෙස රු. මිලියන 78 ක් දක්වා අඩු කර ඇති අතර තොග හිඟයන් වෙනත් ලැබිය යුතු ලෙස සහ තොග අතිරික්තයන් වෙනත් ගෙවිය යුතු ලෙස පෙන්නුම් කරමින් 2023 සැප්තැම්බර් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමේ වෙනස්කම් ද සිදු කර ඇත.

(ii) **සිදු කරන ලද නියදි පරීක්ෂාවට අනුව, වැඩිපුර ගෙවීම ආදිය හේතුවෙන් හටගත් බෙදාහැරීමේ අංශය 01 යටතේ කොළඹ නගර කලාපයට අදාළව අවසන් කළ සාමාන්‍ය ණය ගැතියන් තුළ පැවති රු. මිලියන 41.58 ක අසාමාන්‍ය බැර ශේෂය සහ බෙදාහැරීමේ අංශවල අවසන් කළ තොග ණය ගැතියන් තුළ පැවති රු. මිලියන 13.16 ක අසාමාන්‍ය බැර ශේෂය විමර්ශනය කර පියවීමට හෝ මණ්ඩලයේ ආදායමට ගැනීමට පියවර ගැනීම වෙනුවට ප්‍රමිතියේ 32 වැනි ඡේදයට පටහැනිව ලැබිය යුතු මුදල්වලට එරෙහිව හිලව් කර තිබුණි.**

අංක ඩීසීසී/සීඕඑම්/03/2009 දරන චක්‍රලේඛයට අනුව, ඒජීඑම් (ඩීඩී1) හි අනුමැතිය ඇතිව ණය ගැතියන්ගේ බැර ශේෂ දත්ත පද්ධතියෙන් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. තොග පාරිභෝගිකයින්ගේ අවසන් කළ බැර ශේෂයන් ඉවත් කිරීමට තවදුරටත් ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

රු. මිලියන 4.75 ක් වූ බෙදාහැරීමේ අංශය 2 (ඩීඩී2) හි බැර ශේෂය සම්බන්ධයෙන්, ඩීසීසී/සීඕඑම්/03/2009 දරන චක්‍රෙල්ඛය අදාළ කර ගනිමින් බැර ශේෂ නිරවුල් කිරීමට උපදෙස් ලබා දී ඇත. බැර ශේෂ ගිණුම් 08 න් අතරින්, මධ්‍යම පළාත -02 නියෝජනය කරන ගිණුම් 03 ක් (වටිනාකම රු. 157,288.32 කි) දැනටමත් නිරවුල් කර ඇති (ආදායම ලෙස හඳුනාගෙන ඇත) අතර අනෙකුත් ඒවා මෙම වසර තුළ නිරවුල් කෙරේ. රු. 898,751.84 ක් වටිනා බැර ශේෂ ගිණුම් 07 ක් 2023 වර්ෂයේ මේ දක්වා නිරවුල් කර ඇත.

ඩීඩී3 හි ශේෂයට බස්නාහිර පළාත දකුණ 02 හි අවසන් කළ ණයගැති ශේෂය ඇතුළත් වේ. 2022 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත දකුණ 02 හි එවැනි බැර ශේෂයන් රු. 124,616.25 ක් වූ අතර එයින් රු. 108,092.00 ක් ගිණුම් අංක 4270003545 ට අයත් වේ. අතිරික්ත ගෙවීම තහවුරු කර ගැනීම සඳහා පාරිභෝගිකයා සම්බන්ධ කර ගැනීමට පියවර ගෙන ඇත. එහෙත් පාරිභෝගිකයාගෙන් ප්‍රතිචාරයක් ලැබී නොමැත. බැර ශේෂයන් නිරවුල් කිරීමට තවදුරටත් කටයුතු කරනු ඇත. සබරගමුව සහ ඌව පළාතේ පවතින වාර්තාවලට අනුව, තොග සැපයුම් අවසන් කළ ණය ගැතියන් තුළ බැර ශේෂයන් නොමැත.

**(ඇ) එල්.කේ.ඒ.එස් 2 - තොග සහ එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ**

**ඉහත ප්‍රමිතිවල විධිවිධාන අනුව තථ්‍ය පිරිවැය යොදා ගැනීම වෙනුවට සිය ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන්හි පොදු කාර්ය පිරිවැය තක්සේරු කිරීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පිළිවෙලින් එකතුව රු. බිලියන 2.93 ක් සහ රු. බිලියන 6.54 ක් වූ හිතකර පොදු කාර්ය අනුපාත විචලනයක් සහ අමුද්‍රව්‍ය මිළ විචලනයක් පැවති බව හෙළිදරව් විය. එසේම, එකතුව රු. බිලියන 6.57 ක් වූ අහිතකර ගබඩා මිළ විචලනයක් පැවතුණි. ඒ අනුව, එම කාර්යයන්වලට අදාළ අවශ්‍ය තොරතුරු විගණන සඳහා ලැබී නොමැතිවීම හේතුවෙන් එමගින් මූල්‍ය ප්‍රකාශනවල මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම් සහ ස්කන්ධයට වන බලපෑම නිවැරදිව තහවුරු කර ගැනීමට නොහැකි විය.**

එල්.කේ.ඒ.එස් 2 - තොග, ඡේද අංක 25 අනුව, FIFO හෝ බරිත සාමාන්‍ය පිරිවැය සූත්‍රය භාවිතා කිරීමෙන් තොගවල පිරිවැය පැවරිය යුතුය. ආයතනයක් සමාන ස්වභාවයක් සහ ආයතනයට භාවිතයට ඇති සියලුම තොග සඳහා පිරිවැය සූත්‍රය භාවිතා කළ යුතුය. ඒ අනුව, මණ්ඩලය එහි තොග අගය කිරීම සඳහා FIFO ක්‍රමය භාවිතා කරන අතර ජනන, සම්ප්‍රේෂණය, වත්කම් කළමනාකරණ සහ ව්‍යාපෘති අංශයේ ශ්‍රම පිරිවැය වාර්තා කිරීම සඳහා සත්‍ය පිරිවැය භාවිතා කරනු ලබන අතර එය 2022 දෙසැම්බර් 31 දිනට කෙරිගෙන යන වැඩවලින් සියයට 79 ක්, දේපල පිරියත සහ උපකරණවලින් සියයට 63 ක් සහ ලංවිම තොගවලින් සියයට 47 කි. එබැවින්, දේපල පිරියත සහ උපකරණ, තොග සහ කෙරිගෙන යන වැඩවලින් වැඩි කොටසක් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිරිවැයට ඉදිරිපත් කෙරේ.

කෙසේ වෙතත්, සංකීර්ණත්වය සහ තොගවල විශාල ප්‍රමාණය හේතුවෙන්, ලංවිම බෙදාහැරීමේ අංශ සම්මත පිරිවැය ක්‍රමය භාවිතා කරයි.

එල්.කේ.ඒ.එස් 02, තොගවල ඡේද අංක 25 මගින් ප්‍රතිඵල පිරිවැයට ආසන්න නම්, තොග තක්සේරු කිරීම සඳහා සම්මත පිරිවැය ක්‍රමය භාවිතා කිරීමට අවසර දී ඇත. (''ප්‍රතිඵල පිරිවැයට ආසන්න නම්, සම්මත පිරිවැය ක්‍රමය වැනි තොගවල පිරිවැය මැනීමේ තාක්ෂණික ක්‍රම භාවිතා කළ හැකිය''). ද්‍රව්‍යවල මිල වෙනස්වීම් නොසලකා ඕනෑම ප්‍රදේශයක සෑම පාරිභෝගිකයෙකුටම සම්මත පිරිවැය පදනමක් තිබිය යුතු වීම, ලංවිම විසින් තොග තක්සේරු කිරීම සඳහා සම්මත පිරිවැය ක්‍රමය භාවිතා කිරීමට තවත් හේතුවක් වේ. ''ගාස්තු සඳහා ක්‍රමවේදය'' සඳහා වන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ මගින් ද ''එක් එක් බලපත්‍රලාභියා මෙහෙයුම් සිදුකරනු ලබන ප්‍රදේශවල විදුලි සැපයුම් සේවා සැපයීම සඳහා භාවිතා කරන සියලුම ද්‍රව්‍ය සඳහා සම්මත මිල ගණන් ගණනය කළ යුතුය'' යනුවෙන්ද අර්ථ දක්වා ඇත.

කෙසේ වෙතත්, ද්‍රව්‍ය සහ අනෙකුත් ගාස්තුවල මිල ඉහළ යාම හේතුවෙන් විචල්‍යයන් ඇති විය හැකි බව පිළිගැනේ. නඩත්තු පිරිවැය ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති අවස්ථාවක, සම්මත පිරිවැය සහ සත්‍ය පිරිවැය අතර වෙනස එම ප්‍රකාශයේ ඇති විචලන ගිණුම්වල පිළිබිඹු වන අතර ප්‍රතිඵල හිලව් වනු ඇත.

තවද, එල්.කේ.ඒ.එස් 02 (21 වන ඡේදය) අනුව තොග මැනීම සඳහා වන සම්මත පිරිවැය ක්‍රමය වර්තමාන තත්ත්වයන් මත පදනම්ව නිතිපතා සමාලෝචනය සහ සංශෝධනයට යටත්ව නිර්දේශ කරනු ලැබේ. ඒ අනුව, සත්‍ය මිල සහ සම්මත මිල අතර පරතරය අවම කර ගැනීම සඳහා ද්වි වාර්ෂිකව සම්මත මිල ගණන් සමාලෝචනය කරන ලෙස මිල කමිටුවට උපදෙස් දී ඇත.

ඉහත සඳහන් කරුණුවලට අමතරව, බරිත සාමාන්‍ය තොග තක්සේරු ක්‍රමය සමඟ ERP පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ ලංවිම යෙදී සිටී. ලංවිම ERP ක්‍රමය හඳුන්වා දීමත් සමඟ මෙම ගැටළු ඉවත් වනු ඇත.

තවද, ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන් සඳහා පොදු කාර්ය පිරිවැය අවශෝෂණය කර ගැනීමට වෙන්කිරීමේ ක්‍රමයක් තිබිය යුතුය.

පොදු කාර්ය අනුපාතිකය ගණනය කරනු ලබන්නේ අදාළ ප්‍රාග්ධන හෝ නඩත්තු කාර්යයන්ට අදාළව සෘජු ලෙස ආරෝපණය කළ හැකි පොදු කාර්ය භාවිතා කර එම කාර්යයන්ට අවශෝෂණය කිරීමෙන් වේ.

### (ඈ) එල්.කේ.ඒ.එස් 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි

(i) **දේපළ, පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (එල්.කේ.ඒ.එස් 16) 51 වැනි ජේදයට අනුව, වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම්, වෙනස්කම් එල්.කේ.ඒ.එස් 08 අනුව ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට තවමත් භාවිතා කරනු ලබන රු. බිලියන 211.81 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.**

එල්.කේ.ඒ.එස් 16 හි 51 වන ඡේදයේ අවශ්‍යතාවයට අනුව, වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම් වෙනස්කම් ගිණුම්ගත කළ යුතුය. 2021 වර්ෂයේ මෝටර් රථවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය ලංවිම විසින් සමාලෝචනය කර ඇති අතර, ඒ අනුව, ලංවිම මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර ඇත. ලංවිම බලාගාර සහ ජනක යන්ත්‍ර වැනි සම්පූර්ණ ක්ෂය වූ ප්‍රධාන වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය, උපකරණවල මුල් නිෂ්පාදකයාගේ නිර්දේශ මත පදනම්ව බොහෝ දුරට තීරණය කරයි. ලංවිම බලාගාර සහ ජනක යන්ත්‍ර හොඳින් නඩත්තු කර ඇති බැවින් ඒවා උපකරණවල මුල් නිෂ්පාදකයාගේ අපේක්ෂිත ආයු කාලය ඉක්මවා ක්‍රියාත්මක වේ. අනෙක් අතට, ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය අවසන් වූ පසු, ක්ෂය කිරීම් සඳහා හිමිකම් ලබා දෙන ඉහළ නඩත්තු පිරිවැයක් සහිත වත්කම් ලංවිම භාවිතා කරයි. තවද, ලංවිම රු. බිලියන 900 ක වත්කම් පදනමක් ඇති සංවිධානයක් වන අතර බලාගාර වැනි ප්‍රධාන වත්කම් සංරචකවල සුවිශේෂත්වය සහ සංකීර්ණත්වය සැලකිල්ලට ගනිමින් වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කිරීම පහසු සහ ප්‍රායෝගික නොවේ. කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල අංක 13.11 දරන සටහන යටතේ එල්.කේ.ඒ.එස් 16 හි 79 වන ඡේදයේ අවශ්‍යතාවයට අනුව ලංවිම විසින් සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම්වල දළ ධාරණ අගය වෙන වෙනම අනාවරණය කරයි.

(ii) **ප්‍රමිතියේ 41 සහ 42 ඡේදවලට පටහැනිව, පසුගිය වසරවල ව්‍යාපෘති 12 කට අදාළව කෙරීගෙන යන වැඩ ලෙස හඳුනාගෙන තිබූ රු. බිලියන 1.47 ක ශුද්ධ විනිමය අලාභයක් අතීතයානුයෝගීව ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ අලාභයට අය කිරීම මගින් නිවැරදි කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා අලාභය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.**

| ලෙජර් ගිණුම් කේතය | ව්‍යාපෘතියේ නම | වත්මන් වර්ෂයේ අලාභයට එරෙහිව අය කරන ලද විනිමය ලාභය/(අලාභය) රු. |
|---|---|---|
| 980.30 | හබරණ වේයන්ගොඩ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය | 106,255,486.57 |
| 980.45 | බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි ව්‍යාපෘතිය | (1,018,906,434.26) |
| 980.62 | මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය | 45,850,099.35 |
| 980.63 | හරිත බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැන්වීමේ ආයෝජන වැඩසටහන (ණය වාරික 1, 2 කොටස) | (147,988,708.47) |
| 980.70 | හරිත බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැන්වීමේ ආයෝජන වැඩසටහන (ණය වාරික 2) | (143,264,745.37) |
| 980.71 | SPMU 1) මන්නාරම, වාලච්චේන සහ හම්බන්තොට මාර්ගය සහ ග්‍රිඩ් | (124,541,824.50) |
| 980.72 | SPMU 2) කොළඹ, කොටුගොඩ, කොලන්නාව සහ බියගම උපපොළ | (3,837,239.87) |
| 980.73 | SPMU 3 ) උපපොළ - බියගම, පන්නිපිටිය මාර්ගය සහ ග්‍රිඩ් | 9,480,927.04 |
| 980.74 | PM-SPMU 4 - කෙරවලපිටියේ කි.වෝ 220 ක ස්විචින් ස්ටේෂන් | (16,831,368.69) |
| 980.75 | PM- 7 වන පැකේජය, SESRIP ව්‍යාපෘතිය | 19,760,879.37 |
| 980.80 | ජාතික සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාල සංවර්ධනය | (264,903,382.66) |
| 980.85 | මන්නාරම සුළං විදුලිබල ව්‍යාපෘතිය | 65,466,710.39 |
| | | **(1,473,459,601.10)** |

ඉහත සඳහන් වැරැද්ද 2022 නොවැම්බර් මාසයේදී සොයා ගන්නා ලද අතර සීමිත කාලය හේතුවෙන් ඉදිරිපත් කරන ලද පූර්ව කාල පරිච්ඡේද සඳහා සංසන්දනාත්මක තොරතුරු මත වැරැද්දේ කාල පරිච්ඡේදයට අදාළ නිශ්චිත බලපෑම් තීරණය කිරීමට නොහැකි විය. එබැවින්, එය සමාලෝචිත වර්ෂයේදී (2022 මූල්‍ය ප්‍රකාශන) ගලපා ඇත. පෙර කාල පරිච්ඡේදවලදී වැරැද්දේ බලපෑම් අතීතයානුයෝගීව නිවැරදි කිරීමට අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කරමින් පවතී.

(iii) **2020 සිට 2022 දක්වා කාලය තුළදී මණ්ඩලය විසින් වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම වෙත කේ.වී 220 යටතේ සැපයූ රු. බිලියන 1.83 ක් වූ විදුලි බලශක්තියේ පිරිවැය, සමාගමෙන් විදුලිය මිලදී ගැනීම වෙනුවෙන් මණ්ඩලයට ලැබෙන සෑම මාසික ඉන්වොයිසියකින්ම අඩු කර තිබුණු අතර ශුද්ධ ඉන්වොයිසි වටිනාකම මිලදී ගත් විදුලි බලශක්තියේ පිරිවැය ලෙස ගිණුම්ගත කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේදී, ප්‍රමිතියේ 41 සහ 42 ඡේදවලට අනුව 2020 සහ 2021 වර්ෂ තුළදී සැපයූ රු. මිලියන 530.95 ක විදුලි බලශක්තියේ පිරිවැය අතීතයානුයෝගීව ගැලපීම වෙනුවට රු. බිලියන 1.83 ක මුළු මුදල තාප බලශක්ති මිලදී ගැනීමේ ගිණුමට (විකුණුම් පිරිවැය) හර කර, මණ්ඩලයේ බෙදාහැරීමේ අංශය 2 යටතේ බස්නාහිර පළාත උතුරට ගෙවිය යුතු ලෙස වෙළඳ ගෙවිය යුතු ගිණුමට බැර කර තිබුණි. තවද, 2022 දෙසැම්බර් 31 දිනට එම මුදල මණ්ඩලයේ බෙදාහැරීමේ අංශය 2 හි ලැබිය යුතු මුදලක් ලෙස දක්වා නොතිබුණි.**

බෙදාහැරීමේ බලපත්‍රය යටතේ ඩීඩී2 හි සැපයුම් සේවා කේත අංක 3.1.1 අනුව, කි.වෝ 132 කට සමාන හෝ වැඩි සේවා සම්බන්ධතා බෙදාහැරීමේ සේවා කේතය යටතේ ආවරණය නොවේ. වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගමේහි බලාගාරය කෙරවලපිටිය කි.වෝ 220 GIS උපපොළේදී කි.වෝ 220 කදී සම්ප්‍රේෂණ ජාලයට සම්බන්ධ කර ඇත. මෙම බලාගාරයේ සියලුම බලශක්ති නිර්යාත (Export) සහ ආයාත (Import) කි.වෝ 220 අන්තර් සම්බන්ධතා ස්ථානයේදී එකම මීටර කට්ටලයක් භාවිතා කරමින් මනිනු ලබයි. එබැවින්, බෙදාහැරීමේ බලපත්‍රලාභියා යටතේ බිල්පත් නිකුත් කිරීමට බෙදාහැරීමේ අංශය 02 ට නීත්‍යානුකූලව අවසර නොමැත. එබැවින්, සම්ප්‍රේෂණ බලපත්‍රය සහ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමේ වගන්ති අංක 6.1.3 අනුව වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම තවදුරටත් බෙදාහැරීමේ අංශය 02 හි පාරිභෝගිකයෙකු නොවේ. එබැවින්, බෙදාහැරීමේ අංශය 02 ට මෙය වෙළඳ ලැබිය යුතු ශේෂයක් ලෙස සටහන් කළ නොහැක. ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල බෙදාහැරීමේ අංශය 02 වෙත වෙළඳ ගෙවිය යුතු ශේෂයක් ලෙස සටහන් කිරීමෙන් තොරව සම්ප්‍රේෂණ බලශක්ති මිලදී ගැනීමේ අංශය මගින් අවශ්‍ය ගැලපීම් සහ ඉදිරිපත් කිරීමේ වෙනස්කම් සිදු කරනු ඇත.

**(ඉ) එල්.කේ.ඒ.එස් 16 - දේපළ, පිරියත හා උපකරණ**

**වත්කම් කළමනාකරණ අංශයේ රු. මිලියන 4.92 ක් වටිනා කාර්යාල උපකරණ අයිතම සහ මූල්‍ය අංශයේ රු. මිලියන 12.34 ක් වටිනා වත්කම් භෞතිකව නොපවතින, හානි වී ඇති, භාවිතා කළ නොහැකි සහ අක්‍රීය ලෙස පවතින බව පිළිවෙළින් 2021 වර්ෂයේදී සහ 2022 වර්ෂයේදී සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානයේදී ගිණුම් පොත්වල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.**

අංක: AGM(AM)/AFM(AM)/Acct (L,P)I)/ දේපල, පිරියත සහ උපකරණ සත්‍යාපනය 2021, හානි වී ඇති සහ භාවිතා කළ නොහැකි ස්ථාවර වත්කම් අපහරණය කිරීම - භෞතික සත්‍යාපනය 2021 දරන ලිපිය මගින් වත්කම් කළමනාකරණ අංශයේ අතිරේක සාමාන්‍යාධිකාරීවරයා විසින් ස්ථාවර වත්කම් සත්‍යාපනයෙන් හඳුනාගත් අයිතම සඳහා අපහරණය කිරීමේ ක්‍රියාවලිය සිදු කරන ලෙස දැනටමත් අදාළ ශාඛා ප්‍රධානීන්ට දන්වා ඇත. වහාම අපහරණය කිරීමේ ක්‍රියා පටිපාටි ආරම්භ කරන ලෙස අදාළ ශාඛාවට උපදෙස් දී ඇති අතර ඒ අනුව 2023 මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කරනු ඇත. 960.10 යන ශාඛාවේ ස්ථාවර වත්කම් අපහරණය කිරීමේ ක්‍රියාවලිය 2023.07.20 දින අවසන් කරන ඇත. නවතම ස්ථාවර වත්කම් සත්‍යාපන ප්‍රතිඵල මත පදනම්ව අනෙකුත් ශාඛාවල අපහරණය කිරීමේ ක්‍රියාවලි ශාඛා මට්ටමින් සිදු කරනු ඇත.

අතිරේක මූල්‍ය කළමනාකරු (මූලස්ථානය) හි පවත්වාගෙන යන දේපල, පිරියත සහ උපකරණ ලේඛනයට අනුව වත්කම් පදනමේ මුළු වටිනාකම රු. 2,197,464,491 ක් වන අතර 2022 වර්ෂය සඳහා වන වාර්ෂික සත්‍යාපනයේදී අදාළ ශාඛා විසින් රු. 2,184,961,820 ක් වටිනා වත්කම් පවතින බවත් ඔවුන් විසින් ඒවා භාවිතා කර ඇති බවත් තහවුරු කර ඇත. කෙසේ වෙතත්, විගණකවරුන් විසින් පෙන්වා දෙන ලද පරිදි රු. 12,502,671 ක් වටිනා වත්කම් අදාළ ශාඛා මගින් තහවුරු කර නොමැති අතර ඒ අනුව වාර්තා සැසඳීමට සහ නිවැරදි කිරීමට කටයුතු ආරම්භ කර ඇත.

**(ඊ) එල්.කේ.ඒ.එස් 20 - රාජ්‍ය ප්‍රදානයන් සඳහා ගිණුම්කරණය සහ රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම**

**ණය ආපසු ගෙවීමේ වගකීම ශ්‍රී ලංකා රජයට පැවරී ඇති (මණ්ඩලය සමඟ උප ණය ගිවිසුම් නොමැති) ශ්‍රී ලංකා රජය සහ විදේශ ණය දෙන ආයතන දෙකක් විසින් එළැඹි විදේශ ණය ගිවිසුම් යටතේ ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට මණ්ඩලය වෙත ලැබුණු රු. බිලියන 40.9 ක මුදලක් ප්‍රමිතියේ 3 වන ඡේදය අනුව රජයේ ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට මණ්ඩලයේ පොලී දරන ණය සහ ණය ගැනීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඊට අමතරව, අනුබද්ධ ණය ගිවිසුම් ප්‍රකාරව ණය මුදල් ලැබීම් ස්කන්ධය වශයෙන් මණ්ඩලයට ලබා දීමට රජය විසින් එකඟ වී තිබුණු තවත් ව්‍යාපෘති දෙකකට අදාළව ශ්‍රී ලංකා රජය සහ විදේශ ණය දෙන ආයතන දෙකක් විසින් එළැඹි විදේශ ණය ගිවිසුම් යටතේ මණ්ඩලය වෙත ලැබුණු රු. බිලියන 8.2 ක මුදලක් මණ්ඩලයේ පොලී දරන ණය සහ ණය ගැනීම් ලෙසද පෙන්වා තිබුණි.**

එල්.කේ.ඒ.එස් 20 හි 3 වන ඡේදයට අනුව රජයේ ප්‍රදාන යනු ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට අදාළ ඇතැම් කොන්දේසිවලට අතීතයේදී හෝ අනාගතයේදී අනුකූල වීම සඳහා ප්‍රතිලාභ ලෙස ආයතනයකට සම්පත් පැවරීමේ ස්වරූපයෙන් රජය විසින් කරනු ලබන අනුග්‍රහයයි. ඉහත සඳහන් ණය ගිවිසුම්වලට අදාළව රු. බිලියන 9.1 ක ණය දෙක සඳහා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව සමඟ එළඹි උප ණය ගිවිසුම් පවතින අතර උප ණය ගිවිසුම්වලට අනුව, ලංවිම විසින් ණය ලැබීම් ස්කන්ධය ලෙස සැලකිය යුතුය. භාණ්ඩාගාරයෙන් උපදෙස් ලැබීමෙන් පසු ස්කන්ධය ලෙස ගිණුම්ගත කරනු ඇත. එබැවින්, මෙම ණය දෙක රජයේ ප්‍රදාන ලෙස සැලකිය නොහැකිය. තවද, රු. බිලියන 40.9 ක අනෙත් ණය දෙක රජයේ ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීමට භාණ්ඩාගාරයෙන් උපදෙස් ලැබී නොමැත. ඉතිරි ණය ස්කන්ධයට පරිවර්තනය කිරීමට සලකා බලන ලෙස භාණ්ඩාගාරයෙන් ඉල්ලමින් 2023 සැප්තැම්බර් 21 වැනි දින ලිපියක් යවා ඇත. එබැවින්, ශ්‍රී ලංකා රජය සහ විදේශ ණය දෙන ආයතන අතර ඇති කරගත් විදේශ ණය ගිවිසුම් හරහා මණ්ඩලයට ලද ඉහත සඳහන් රු. බිලියන 50 ක් රජයේ ප්‍රදාන ලෙස සැලකිය නොහැකිය.

**(උ) එල්.කේ.ඒ.එස් 21 - විදේශ විනිමය අනුපාතයන්හි වෙනස්කම්වල බලපෑම්**

**ප්‍රමිතියේ 23 (අ) වගන්තියට අනුව, වාර්තාකරණ කාල සීමාව අවසානයේදී අවසාන විනිමය අනුපාතය භාවිතා කරමින් විදේශ විනිමය මූල්‍ය අයිතම පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘති හතරකට අදාළව මණ්ඩලය විසින් සෘජුවම ලබා ගත් විදේශ මුදලින් නාමනය කරන ලද ණය හයක වටිනාකම අවසාන විනිමය අනුපාත භාවිතා කරමින් මණ්ඩලය විසින් පරිවර්තනය කර නොතිබූ අතර ඒ අනුව ප්‍රමිතියේ 28 වගන්තියට අනුව මූල්‍ය ප්‍රකාශනවල විදේශ විනිමය ලාභයක්/අලාභයක් හඳුනාගෙන නොතිබුණි. කෙසේ වෙතත්, ඉහත ණය හයෙන් ණය දෙකක් සඳහා ලද ශේෂ තහවුරු කිරීම්වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී පොලී දරන ණය ශේෂය සහ වර්ෂය සඳහා අලාභය දළ වශයෙන් රු. මිලියන 6,485 කින් අඩුවෙන් දක්වා තිබූ බව නිරීක්ෂණය විය.**

ණය සඳහා විදේශ ණය දෙන නියෝජිතායතනය විසින් ලබා දී ඇති තහවුරු කිරීම පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකි අතර ඒවායේ පිටපත් විගණන වාර්තා සඳහා ලංවිම පිළිතුරු සමඟ ඉදිරිපත් කරනු ලබයි. මූල්‍ය වර්ෂය අවසානයේදී ණය පරිවර්තනයේ විදේශ විනිමය බලපෑම මිනිනු ලබන අතර පසුව ගිණුම්ගත කරනු ඇත.

විදේශ මුදලින් නාමනය කරන ලද ණය පරිවර්තනය කිරීමට කටයුතු කරනු ඇති අතර විනිමය අනුපාත ලාභ හෝ අලාභ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවලට අවශ්‍ය ගැලපීම් 2023 වර්ෂය අවසාන මූල්‍ය ප්‍රකාශනවල සිදු කරනු ඇත.

**(උෟ) එස්.එල්.එෆ්.ආර්.එස් 09 - මූල්‍ය සාධන පත්‍ර**

(i) **මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.4.5.4 සහ වෙළඳ ණය ගැතියන් සඳහා හානිකරණ ප්‍රතිපාදන සැලසීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2023 පෙබරවාරි 02 දිනැති ගිණුම් චක්‍රලේඛ අංක 610 අනුව, වසර 1 කට වඩා වැඩි හිඟ ශේෂ සහිත වෙළෙඳ ණය ගැතියන් සඳහා සියයට සියක ප්‍රතිපාදන සැලසිය යුතුය. කෙසේ වෙතත්, බෙදාහැරීමේ අංශ 03 හි පළාත් 4 කට අදාළව වසරකට වැඩි හිඟ ශේෂ සහිත වෙළෙඳ ණය ගැතියන්ගේ ශේෂ සඳහා රු. මිලියන 10.28 ක ඌන වෙන්කිරීමක් සහ රු. මිලියන 56.59 ක අධි වෙන්කිරීමක් සිදු කර තිබූ බව නිරීක්ෂණය විය. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා අලාභය රු. මිලියන 46.31 කින් වැඩියෙන් දක්වා තිබුණි.**
2022 අදාළ උපලේඛනවල ඌණ/අධි වෙන්කිරීම්වල ගැලපීම් දැනටමත් සිදු කර ඇති අතර අනාගත මූල්‍ය ප්‍රකාශනවලදී මෙම වැරදි මඟ හරිනු ඇත.

(ii) **අපේක්ෂිත ණය පාඩු සැලකිල්ලට ගනිමින් සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට පාරිභෝගිකයින්ට ලබා දී ඇති රු. මිලියන 250 ක් වූ ණය සඳහා හානිකරණ ප්‍රතිපාදන සලසා නොතිබුණි. තවද, සමස්ත පාරිභෝගික ණයවලින් රු. මිලියන 196.87 ක් හෙවත් සියයට 79 ක් වසර 5 කට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පවතින බව නිරීක්ෂණය විය.**
හානිකරණ ක්‍රියාවලිය සමාලෝචනය කිරීමට කටයුතු කරනු ලබන අතර පාරිභෝගික ණය සඳහා වන හානිකරණ ප්‍රතිපාදන ඊළඟ මූල්‍ය ප්‍රකාශනවල සිදු කරනු ඇත. බෙදාහැරීමේ අංශය 4 විසින් පාරිභෝගික ණය සඳහා හානිකරණ ප්‍රතිපාදන වෙළඳ ණයගැති හානිකරණ උපලේඛනයට ඇතුළත් කර ඇත. පාරිභෝගික ණයවල වසර 5 කට වැඩි හිඟ ශේෂයන් නිරවුල් කිරීමට තවදුරටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

(iii) **මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.4.5.2 ප්‍රකාරව, වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල්, ගනුදෙනුකරුවන්ට ලබා දෙන ණය සහ සේවකයන්ට ලබා දෙන ණයවලින් සමන්විත වන මණ්ඩලයේ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ පසුකාලීනව මිනිනු ලබයි. වෙළඳ ණයගැතියන්ගේ අපේක්ෂිත ණය පාඩු හඳුනා ගැනීම සඳහා මණ්ඩලය විසින් නිශ්චිත ප්‍රවේශයක් සහ ක්‍රමවේදයක් හඳුන්වා දී තිබුණද, විවිධ ණයගැතියන්, පූජනීය ස්ථානවලින් අයවිය යුතු මුදල් ආදිය ඇතුළත් අනෙකුත් ණයගැතියන් සඳහා නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. ඒ අනුව, රු. මිලියන 208.06 ක් වූ බෙදාහැරීමේ අංශය 01 හි සහ රු. මිලියන 49.24 ක් වූ බෙදා හැරීමේ අංශය 04 හි වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතු අනෙකුත් ණයගැතියන් සඳහා පිළිවෙලින් රු.මිලියන 33.95 ට සමාන මුදලක් සහ රු. මිලියන 3.1 ට සමාන මුදලක් පමණක් හානිකරණ ප්‍රතිපාදන ලෙස සලසා තිබුණි. කෙසේ වෙතත්, රු. මිලියන 148.47 ක් වූ බෙදාහැරීමේ අංශය 02 හි සහ රු. මිලියන 66.6 ක් වූ බෙදාහැරීමේ අංශය 03 හි වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතු ශේෂ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. එලෙසම, රු. මිලියන 300.24 ක් වූ වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතු අනෙකුත් ලැබිය යුතු මුදල් සඳහා අපේක්ෂිත ණය පාඩු නිසි ලෙස හඳුනා ගැනීමෙන් තොරව රු. මිලියන 64.31 ට සමාන මුදලක් පමණක් හානිකරණ ප්‍රතිපාදන ලෙස සලසා තිබුණි. මෙම නිරීක්ෂණ හේතුවෙන්, මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මූල්‍ය වත්කම්වල ධාරණ අගයේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.**
අනෙකුත් ණය ගැතියන්ගේ ණය පාඩු හඳුනා ගැනීම සඳහා විශේෂිත ප්‍රවේශයක් හෝ ක්‍රමවේදයක් කෙටුම්පත් කරමින් පවතී. මීට අමතරව දීර්ඝ කාලීනව අයකරගත නොහැකි වූ ශේෂයන් අයකර ගැනීමට හෝ කපා හැරීමට පහත ක්‍රියාමාර්ග ගනිමින් ඇත.

අනෙකුත් ණය ගැතියන් ප්‍රධාන වශයෙන් නොමිලේ සපයන ලද සේවා සම්බන්ධතා, පූජනීය ස්ථානවලින් ලැබිය යුතු මුදල් සහ විවිධ ණය ගැතියන්ගෙන් සමන්විත වේ.

**නොමිලේ සපයන ලද සේවා සම්බන්ධතා**
මේවා විදුලිබල අමාත්‍යාංශයෙන් මුදල් ලැබී නැති ණීසැමට විදුලිය□ නැමති රජයේ යෝජනා ක්‍රමය හරහා ලබාදුන් සම්බන්ධතා වේ. ඉදිරියේදී මේවා කපා හැරීමට කටයුතු කරනු ඇත.

**පූජනීය ස්ථානවලින් ලැබිය යුතු මුදල්**

රජයෙන් අයකර ගැනීමට නියමිත ලංවීම විසින් පියවා ඇති පූජනීය ස්ථාන විසින් පරිභෝජනය කරන ලද බලශක්ති පිරිවැයෙන් මෙය සමන්විත වේ. රජයෙන් මුදල් නොලැබුණු බැවින් 2022 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය කපා හැරීම සඳහා අනුමැතිය ඉල්ලා අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් දැනටමත් අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, නව ගාස්තු අනුපාත හඳුන්වාදීමත් සමඟ ලංවීම බලශක්ති පිරිවැය පියවීම නතර කර ඇත.

**විවිධ ණය ගැතියන්**

එක් එක් ශේෂය පරීක්ෂා කර සුදුසු පරිදි ප්‍රතිපාදන සැලසීමට කටයුතු කරනු ඇත.

(iv) **මණ්ඩලයේ සම්ප්‍රේෂණ අංශයේ විවිධ ණයගැතියන් ලෙස රු. බිලියන 1.38 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණු අතර එයින් රු. බිලියන 1.37 ක් ඒඊඑස් කැළණිතිස්ස (පුද්.) සමාගම වෙතින් 2011 වර්ෂයේ සිට අයවිය යුතුව පැවතුණි. කෙසේ වෙතත්, ඉහත ප්‍රමිතියට අනුව අපේක්ෂිත ණය පාඩු නිසි ලෙස හඳුනා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට රු. 563,330 ක් පමණක් හානිකරණ ප්‍රතිපාදන ලෙස සලසා තිබුණි.**

2022 වන තෙක්, ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඉන්ධන මිල වෙනස ඒඊඑස් කැළණිතිස්ස (පුද්.) සමාගමට ගෙවීමෙන් පසුව මෙම මුදල ලංවීමට ලැබේනු ඇතැයි ලංවීම විශ්වාස කර ඇත. හානිකරණ දර්ශක ඇගයීමෙන් පසුව ප්‍රතිපාදන සලසා නොමැත. කෙසේ වෙතත්, 2023 දී, අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අංක 23.08.228.ජී අනුව, මෙම මුදල ලංවීමට නොලැබෙන බව නිසැක බැවින් 2023 මූල්‍ය ප්‍රකාශනවලින් රු. 1,368,964,445 ක් දැනටමත් ලියාහැර ඇත.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) තොග හිඟයට අදාළ රු. මිලියන 162.5 ක හර ශේෂයක් සහ තොග අතිරික්තයට අදාළ රු. මිලියන 70.3 ක බැර ශේෂයක් නිරවුල් නොකර වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ තොග ගැලපුම් ගිණුමේ පැවතුණි.**

| අංශය | 2022 දෙසැම්බර් 31 දිනට තොග හිඟ මුදල (ශුද්ධ) අතිරික්තය/ (හිඟය) | පිළිතුරු |
|---|---|---|
| **ඩීඩී01** | **ශුද්ධ - (රු. මිලියන 13.96)** | 2023.09.30 දිනට ඩීඩී1 හි තොග ගැලපුම් ගිණුම් ශේෂය රු. මිලියන 15.16 ක් වන අතර එයින් වසර 1 කට වැඩි ශේෂය රු. මිලියන 12.43 (හිඟය) ක් වේ. එය P&HM හෙයියන්තුඩුව ගබඩාවලට අයත් වේ. PHM යටතේ පවතින හෙයියන්තුඩුව ගබඩාවල තොග හිඟය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කරන ලද පරීක්ෂණයක් පවතින අතර එම වාර්තාව මත ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත. |
| **ඩීඩී02** | **ශුද්ධ - (රු. මිලියන 9.00) අතිරික්තය රු. මිලියන 8.4 හිඟය (රු. මිලියන 17.54)** | ඩීඩී2 හා සම්බන්ධ ශේෂය ප්‍රධාන වශයෙන් නැගෙනහිර පළාත සහ බස්නාහිර පළාත උතුරට අදාළ වේ. බස්නාහිර පළාත උතුර සම්බන්ධයෙන්, අවුරුදු 2-3 ත් සහ අවුරුදු 3-4 ත් අතර පවතින ශේෂයන් හඳුනාගෙන ඇති අතර, තොරතුරු තාක්ෂණ නිලධාරීන්ගේ සහාය ඇතිව මෙම වර්ෂය තුළදී නිරවුල් කරනු ඇත. වසර 4-5 ත් අතර වන රු. 8,417,459.03 ක් වූ තොග අතිරික්ත ශේෂය තවමත් විමර්ශන මට්ටමේ පවතින අතර තවමත් අවසන් කර නැත.<br>තවද, වසර 5 කට වැඩි රු. (14,984,464) ක් වූ හිඟ ශේෂය නඩු දෙකකට අදාළ වේ. ඒ අනුව, රු.(14,033,469.83) ක් වැඩ තහනමට ලක්වූ එච්.පී. කරුණාරත්න මහතාගෙන් ලැබිය යුතු අතර නඩුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබයි. ඉතිරි රු. (950,995) ක් 2022 නොවැම්බර් මාසයේදී විශ්‍රාම ගොස් ඇති ඩී.පී. ආනන්ද කුමාර මහතාට අදාළ වේ. මෙම මුදල අයකරගෙන ඇති අතර අදාළ සටහන් 2023 වර්ෂයේදී ලේජරයට පිටපත් කරනු ඇත. |

| | | |
|---|---|---|
| **ඩීඩී03** | **ශුද්ධ - (රු. මිලියන 51.69)**<br>**අතිරික්තය - රු. මිලියන 11.3**<br>**හිඟය - (රු. මිලියන 63)** | ඩීඩී3 හි රු. මිලියන 11.3 ක තොග අතිරික්ත ශේෂයක් සහ රු. මිලියන 63 ක තොග හිඟ ශේෂයක් ඇත. (ශුද්ධ ශේෂය රු. මිලියන 51 කි).<br>රු. මිලියන 51 ක් වූ ශුද්ධ තොග ගැලපුම් ශේෂයෙන්, ඌව පළාතට අදාළ රු. මිලියන 3.3 ක් නිරවුල් කිරීමේ ක්‍රියාවලියේ පවතින නොසැසඳුනු ශේෂයකි.<br>සබරගමුව පළාතට අදාළ රු. මිලියන 1.7 ක ශේෂය දැනටමත් නිරවුල් කර ඇත. ඉතිරි රු. මිලියන 0.5 ක් නිරවුල් කිරීමට කමිටු පත් කර ඇත.<br>ඉතිරි ශේෂය බස්නාහිර පළාත දකුණ 2 හා සම්බන්ධ වන අතර වසර 5 ක් තිස්සේ තොග ගැලපුම් ගිණුමේ පවතින රු. මිලියන 60 ක හිඟ ශේෂයන් පරීක්ෂා කර නිරවුල් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමට අවශ්‍ය අනුමැතීන් සහිතව කමිටුවක් පත් කරනු ඇත. |
| **ඩීඩී04** | **ශුද්ධ - (රු. මිලියන 0.04)** | 2021 වසර සඳහා දකුණ පළාත 1 ට අදාළ තොග ගැලපුම් ගිණුමේ රු. 35,400 ක ශේෂය ඇත. වොට් 100 LED FLOOD LIGHT 10 කින් මෙම හිඟය සිදු වී ඇත. මෙම තොග අයිතම අමාත්‍යාංශයට ලබා දී තිබුණි. මෙම බල්බ ආපසු ලබා දෙන ලෙස සඳහන් කරමින් 2023.09.04 දින විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දකුණ පළාත 1 හි ප්‍රධාන ඉංජිනේරුවරයා (වාණිජ්‍ය) විසින් ලිපියක් යොමු කරන ලද අතර අද වනතුරු මෙම අයිතම අමාත්‍යාංශය විසින් ආපසු ලබා දී නොමැත. |
| **ජනන** | **ශුද්ධ - (රු. මිලියන 12.58)**<br>**අතිරික්තය - රු. මිලියන 50.46**<br>**හිඟය - (රු. මිලියන 63)** | <u>ලක්විජය විදුලි බලාගාරය</u><br>2022 දෙසැම්බර් 31 දිනට රු. 57,497,143 ක් වූ අතිරික්ත ශේෂයක් සහ රු. 52,212,611 ක් වූ හිඟ ශේෂයක් තොග ගැලපුම් ගිණුමේ පැවතුණි. අතිරික්ත හා හිඟයට හේතු අධ්‍යයනය කිරීමට කමිටු පත් කර ඇත. කමිටු තීරණ ලැබුණු පසු අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර 2023 දී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව මෙම ශේෂය නිරවුල් කරනු ඇත.<br><u>තාප සංකීර්ණය</u><br>2023 වර්ෂය තුළදී තාප සංකීර්ණයට අදාළ හිඟ ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.<br><u>සමනල සංකීර්ණය</u><br>ගබඩා භාරකරුවන්ගෙන් පැහැදිලි කිරීම් කැඳවා ඇති අතර 2021 සහ 2022 වසරවල හිඟ සහ අතිරික්තයන් සඳහා පැහැදිලි කිරීම් බලාපොරොත්තු වේ. 2021 වර්ෂය සඳහා කුකුළේ ගඟ බලාගාරයේ හිඟ සහ අතිරික්තයන් සඳහා කමිටුවක් පත් කර ඇත. |
| **වත්කම් කළමනාකරණ** | **ශුද්ධ - (රු. මිලියන 4.93)** | ආර්.බී. වෙදගෙදර සහ එන්.පී.එල් සමරසිංහ වෙතින් අයකරගත යුතු තොග හිඟයන්ගෙන් මෙම ශේෂය ප්‍රධාන වශයෙන් සමන්විත වේ. ආර්.බී වෙදගෙදර මහතාට අදාළව නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට යටත්ව ලංවිම නීති අංශය විසින් තොග හිඟය පියවා ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගනු ඇත. එසේම, එන්.පී.එල් සමරසිංහ වෙතින් අයකරගත යුතු ශේෂය සම්බන්ධයෙන් පාරිතෝෂික හා විශ්‍රාම වැටුප් අරමුදලින් හිඟය අයකර ගැනීමට ලංවිම විසින් විශ්‍රාම වැටුප් අරමුදලට දැනුම් දී ඇත. |
| **එකතුව** | **(රු. මිලියන 92.20)** | |

**(ආ) හිමිකම් කිව හැකි කාල සීමාව ඉක්ම වූ 2016/17 තක්සේරු වර්ෂයේ සිට 2019/20 තක්සේරු වර්ෂය දක්වා ගෙවන ලද රු. බිලියන 3.91 ක් වූ ආර්ථික සේවා ගාස්තුව (ඊ.එස්.සී) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වර්ෂය ආරම්භයේදී රඳවාගත් අලාභය සහ සමාලෝචිත වර්ෂය සඳහා වූ අලාභය පිළිවෙලින් රු. බිලියන 2.7 කින් සහ රු. බිලියන 1.21 කින් අඩුවෙන් දක්වා තිබුණි.**

හිමිකම් කිව හැකි කාල සීමාව ඉක්මවා ඇති බැවින් සහ හිමිකම් කිව හැකි කාල සීමාව තුළ ලංවිම බදු අය කළ හැකි අලාභ ලබා ඇති බැවින් ආදායම් බදු වගකීම් ගණනය කිරීම සඳහා ආර්ථික සේවා ගාස්තුව බදු බැරක් ලෙස හිමිකම් පෑ නොහැක. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2023 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල වියදමක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට මෙම මුදල අය කරනු ඇත. 2023 නොවැම්බර් 20 වැනි දින පැවැත්වෙන මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සලකා බැලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව දැනටමත් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

**(ඇ) සම්පූර්ණ කරන ලද රු. බිලියන 16.9 ක් වටිනා කාර්යයන් 11,429 ක් බෙදාහැරීමේ අංශවල අදාළ වත්කම් ගිණුම්වලට මාරු නොකර වසර දෙකකට වඩා වැඩි කාලයක් තිස්සේ කෙරීගෙන යන වැඩ ගිණුමේ පවතී. තවද, වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ වත්කම් කළමනාකරණ අංශයේ කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබූ රු. මිලියන 6.2 ක් වටිනා සම්පූර්ණ කරන ලද කාර්යයන් තුනක් ප්‍රාග්ධනීකරණය කිරීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත්, එම වත්කම්වලට අදාළව ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා වන අලාභයට එමගින් ඇති කරන බලපෑම තොරතුරු නොමැතිකම හේතුවෙන් තහවුරු කර ගැනීමට නොහැකි විය.**

<table>
<tr><th>අංශය</th><th>කාර්යයන් සංඛ්‍යාව</th><th>වසර 2 කට වැඩි මුදල (රු. මිලියන)</th><th>පිළිතුර</th></tr>
<tr><td>ඩීඩී-01</td><td>10214</td><td>3816</td><td>
<table>
<tr><th>පළාත</th><th>2022/12/31 දිනට කාර්යයන් සංඛ්‍යාව</th><th>2022/12/31 දිනට වටිනාකම (රු. මිලියන)</th><th>2023/03/31 දිනට කාර්යයන් සංඛ්‍යාව</th><th>2023/03/31 දිනට වටිනාකම</th></tr>
<tr><td>CC</td><td>14</td><td>95.79</td><td>114</td><td>741.81</td></tr>
<tr><td>NWP 1</td><td>1049</td><td>986.92</td><td>6657</td><td>1830.70</td></tr>
<tr><td>NWP 2</td><td>15</td><td>42.16</td><td>3694</td><td>567.02</td></tr>
<tr><td>NCP</td><td>643</td><td>135.09</td><td>7904</td><td>1027.23</td></tr>
<tr><td>NP</td><td>85</td><td>373.67</td><td>1340</td><td>1066.11</td></tr>
<tr><td>PHM</td><td>10</td><td>170.85</td><td>42</td><td>415.55</td></tr>
<tr><td>SESRIP</td><td>1</td><td>-</td><td>-</td><td>-</td></tr>
<tr><td>එකතුව</td><td>1816</td><td>1804.48</td><td>19751</td><td>5648.42</td></tr>
</table>
2022.12.31 දිනට රු. බිලියන 1.8 ක් වූ මුළු කෙරීගෙන යන කාර්යයන් සංඛ්‍යාව 1816 ක් පමණක් බව සොයා ගන්නා ලද එය කාර්යයන් 10214 ක් ලෙස ඩීඩී1 හි මූල්‍ය ප්‍රකාශනවල වැරදි ලෙස පෙන්වා ඇත.<br><br>SESRIP ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩවල වටිනාකම 2023 මැයි මාසයේ මූල්‍ය ප්‍රකාශනවල ව්‍යාපෘති අංශය වෙත මාරු කර ඇත. ඉහත කරුණුවලට අමතරව, සම්පූර්ණ කරන ලද කර්යයන් නිතිපතා වත්කම්වලට මරු කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාවලියක් සිදු කරයි.</td></tr>
<tr><td>ඩීඩී-02</td><td>3240</td><td>5,510</td><td>වාර්තාවට අනුව, ඩීඩී 02 හි කෙරීගෙන යන වැඩ ශේෂයන්හි ''වසර 4-5 ත් අතර'' සහ ''වසර 5 ට වැඩි'' යටතේ පෙන්වා ඇති පිරිවැය රු. 1,596,732,204.60 ක් වූ කාර්යයන් 904, සම්පූර්ණ කරන ලද කාර්යයන්වල වටිනාකම ලෙස සහ වත්කම් වෙත මාරු කර නොමැති ලෙස සලකාබලා ඇත. කෙරීගෙන යන වැඩ ඉහත වයස් කාණ්ඩ යටතේ වර්ග කර ඇතත්, තෙවන පාර්ශවයන්ගේ විරෝධතා, මාර්ග අවසරයන් නොලැබීම, පරිභෝගිකයාගේ අවශ්‍යතා වෙනස් වීම වැනි විවිධ හේතූන් මත සත්‍ය වශයෙන්ම සම්පූර්ණ කර නොමැති කාර්යයන් ඇති බැවින් කෙරීගෙන යන වැඩ යටතේ සම්පූර්ණ නොකළ කාර්යයන් ඇති අතර ඒවා කෙරීගෙන යන වැඩ යටතේ පෙන්විය යුතුය.<br><br>2022.12.31 දිනට වසර 02 කට වඩා වැඩි කාර්යයන් 3240 ක් අතරින් රු. 2,490,295,105 ක් වටිනා කාර්යයන් 1656 ක් දැනට ස්ථාවර වත්කම් වෙත මාරු කර ඇත.</td></tr>
<tr><td>ඩීඩී-03</td><td>5200</td><td>4,170</td><td>වසර දෙකකට වැඩි කාර්යයන් අතරින් රු. මිලියන 1,562 ක වටිනාකමක් ඇති කාර්යයන් 3,946 ක්. 2023 සැප්තැම්බර් වන විට නිරවුල් කර ඇති අතර ඉතිරි ශේෂය නිරවුල් කිරීමට දැනටමත් කටයුතු ආරම්භ කර ඇත.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| ඩීඩී-04 | 1171 | 4,419 | 2023.12.31 දිනට කෙරීගෙන යන වැඩවල බොහෝ කාර්යයන් 2023 දී නිරවුල් කර ඇති අතර ඉදිකිරීම් ඒකකය / වාණිජ ඒකකය සහ ගිණුම් අංශය අතර අඛණ්ඩ සහයෝගී ප්‍රයත්නයන් ඇතිව කෙරීගෙන යන වැඩ ගිණුමෙන් සම්පූර්ණ කරන ලද කාර්යයන්වල පිරිවැය වත්කම්වලට පැවරීමට ප්‍රගතිශීලී ක්‍රියාමාර්ග ගෙන ඇත. එබැවින්, අංශයේ හිඟ කෙරීගෙන යන වැඩවල සැලකිය යුතු අඩුවීමක් (සියයට 26.4ක්) දැකිය හැකිය. |
| වත්කම් කළමනාකරණ | | 6.2 | ඩීඩී3 හි ඩීජීඑම් විසින් ජනන යන්ත්‍රයක් ස්ථාපනය කරන ලෙස ඉල්ලා සිටි අතර ඒ අනුව, ප්‍රධාන ඉංජිනේරු (PP) විසින් ඩීඩී3 වෙනුවෙන් ජනන යන්ත්‍රයක් මිලදී ගෙන ඇත. පසුව ඩීඩී3 හි ඩීජීඑම් විසින් ජනන යන්ත්‍ර ලබාගෙන නොතිබුණි. මෙම ගැටළුව හේතුවෙන්, ප්‍රධාන ඉන්ජිනේරු (PP) ඒකකයේ රු. මිලියන 6.1 ක කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ පැවතුණි. කෙසේ වෙතත්, දැනට ප්‍රධාන ඉන්ජිනේරු (PP) මෙම ගැටළුව අවසන් කිරීම සඳහා ඩීඩී3 හි ඩීජීඑම් සමඟ සම්බන්ධීකරණය කරමින් සිටී. |
| එකතුව | 19825 | 17,916 | |

**(ඈ) අසාමාන්‍ය බැර ශේෂයන් හිලව් කිරීම හේතුවෙන් බෙදාහැරීමේ අංශවල කෙරීගෙන යන වැඩ ශේෂය රු. මිලියන 12.82 කින් අඩුවෙන් දක්වා තිබුණි.**

| අංශය | කෙරීගෙන යන වැඩවල බැර සටහන් රු. මිලියන | පිළිතුරු |
|---|---|---|
| ඩීඩී-01 | 2.03 | 2022 වර්ෂයේ ද්‍රව්‍ය ආපසු ලැබීම් සහ හිතකර මිල විචලනය ගිණුම්ගත කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. කොළඹ නගර ශාඛාවේ ශේෂය දැනටමත් නිරවුල් කර ඇති අතර ශේෂයන් නිරවුල් කරන ලෙස උතුරු මැද පළාතේ පළාත් වියදම් ගණකාධිකාරීවරුන්ටද උපදෙස් ලබා දී ඇති අතර 2023 වර්ෂයේදී එම ශේෂයන් නිරවුල් කර ඇත. |
| ඩීඩී-02 | 9.16 | කෙරීගෙන යන වැඩ ගිණුමට සිදු කරන ලද බොහෝ බැර සටහන්, ආපසු ලැබුණු කාර්යයන්වලින් ඉතිරි වූ ද්‍රව්‍යවල වටිනාකම හෝ විවිධ හේතූන් මත කාර්යයන් අවලංගු කිරීම හේතුවෙන් ආපසු ලද ද්‍රව්‍යවල පිරිවැය නියෝජනය කරයි. |
| ඩීඩී-03 | 1.63 | මුළු ශේෂයම සබරගමුව පළාතට අදාළ වේ. කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් සම්පූර්ණ කර ඇති බවට හඳුනාගෙන ඇති කාර්යයන් වත්කම් ගිණුම් වෙත මාරු කිරීමේ ක්‍රියාවලිය හරහා 2023 මූල්‍ය කාලපරිච්ඡේදය තුළදී කෙරීගෙන යන වැඩවල අසාමාන්‍ය බැර ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර ලයිට්ං රත්නපුර ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ ගිණුම්වල වාර්තා කර ඇති බැර ශේෂයන් නිරවුල් කිරීමට වැඩිදුරටත් අවශ්‍ය පියවර ගෙන ඇත. (පිරිවැය මධ්‍යස්ථානය - 710.00). |
| එකතුව | 12.82 | |

**(ඉ) 2018 වසරේ නිම කර තිබූ ගම්පහ ප්‍රදේශයේ ඉංජිනේරු කාර්යාලය ඉදිකිරීම සඳහා වැය වූ රු. මිලියන 107.47 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ප්‍රාග්ධනීකරණය කිරීමට කටයුතු කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබුණි. තවද, විගණනය මගින් කරන ලද ගණනය කිරීම්වලට අනුව, නිම කළ වර්ෂයේ සිට ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් රඳවාගත් අලාභය සහ සමාලෝචිත වර්ෂය සඳහා අලාභය පිළිවෙළින් රු. මිලියන 9.12 කින් සහ රු. මිලියන 2.69 කින් අඩුවෙන් දක්වා තිබුණි.**

2023 මූල්‍ය ප්‍රකාශනවල මෙම ශේෂය ප්‍රාග්ධනීකරණය කර වත්කම්වලට පැවරීමට කටයුතු කර ඇත.

**(ඊ) පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය (ii) සඳහා මිලදී ගත් රු. මිලියන 124.30 ක් වටිනා වාහන හතරක් 2014 වර්ෂයේදී ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුවද ප්‍රාග්ධනීකරණය කර නොතිබුණු අතර ඒ වෙනුවට එම මුදල කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුළත් කර තිබුණි. තවද, ව්‍යාපෘතිය නිම කළ දින සිට එම වාහනවලට අදාළව ක්ෂයවීම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. ඊට අමතරව වර්ෂය අවසන් වන විටත් මෙම වාහනවල අයිතිය මණ්ඩලයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.**

මෙම වාහන CMEC (කොන්ත්‍රාත්කරු) විසින් තවමත් ලංවිමට භාරදී නොමැති අතර වාහනවල අයිතිය තවමත් ලංවිම වෙත පවරා නොමැත. එබැවින්, ඒවා ලංවිමේ නීත්‍යානුකූල හිමිකාරීත්වය යටතේ නොමැති අතර එය ප්‍රාග්ධනිත කිරීමට හෝ ක්ෂය කිරීමට නොහැකි ය. හිමිකාරීත්වය ලංවිමට පැවරීමෙන් පසු ඉහත වාහන ප්‍රාග්ධනිත කිරීමට සහ ඒ අනුව ක්ෂය කිරීමට කටයුතු කරනු ඇත. මෙම ගැටලුව සම්බන්ධයෙන් CMEC සමඟ පසු විපරම් කිරීමට ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා දැනටමත් කටයුතු කර ඇති අතර, ලංවිම සහ CMEC අතර අත්සන් කර ඇති මෙහෙයුම් සහ නඩත්තු ගිවිසුම අවසන් වූ පසු වාහන භාර දෙන බවට වන අවබෝධතා ගිවිසුමේ කොන්දේසිය සඳහන් කරමින් CMEC පිළිතුරු දී ඇත.

**(උ) මණ්ඩලය විසින් 2019, 2020 සහ 2021 වර්ෂවලට අදාළව 2021 සහ 2022 වසරවල මූල්‍ය ප්‍රකාශනවල පූර්ව වර්ෂ ගැලපීම් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් 2021 වසර අවසන් වන දිනට රඳවා ගත් අලාභය රු. බිලියන 89.6 කින් විකෘති වී තිබුණි. එබැවින් ඉදිරි වර්ෂවලදී සමාලෝචිත වර්ෂය සඳහා වන ලාභයට ගැලපීම් කිරීමට ඇති හැකියාව විගණනයේදී බැහැර කළ නොහැක.**

| | 2021<br>රු.000 | 2022<br>රු.000 |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂ ගැලපීම් | 8,088,753 | - |
| 2020 දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂ ගැලපීම් | (6,602,605) | (78,397,384) |
| 2021 දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂ ගැලපීම් | - | (12,688,648) |
| **එකතුව** | 1,486,148 | (91,086,032) |

ඉදිරියේදී එවැනි නැවත සකස් කිරීම් අවම කිරීමට කටයුතු කර ඇත. ලංවිම මෙහෙයුම් සහ ගනුදෙනුවල ඇති සංකීර්ණත්වය හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවලින් තොර බවට සහතික කර ගැනීම සඳහාත්, පෙර වර්ෂවල යම් සාවද්‍ය ප්‍රකාශන සිදුවී ඇත්නම් ඒවා නිවැරදි කර ගැනීම සඳහාත් මූල්‍ය ප්‍රකාශන නැවත සකස් කිරීමට අවශ්‍ය වන අවස්ථා ඇත.

තවද, 2018 ට පෙර සිදු කරන ලද ණය ගෙවීම් සඳහා 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ගැලපීම් කිරීමට සහ අවසන් විනිමය අනුපාතිකය මත 2022.12.31 දිනට මුළු හිඟ ණය ස්කන්ධය බවට පරිවර්තනය කිරීමට 2023-02-01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2023-02-17 දිනැති ලිපිය මගින් ලංවිමට උපදෙස් ලබාදී ඇති බැවින් පුත්තලම ගල් අඟුරු බලාගාරයේ ණය සම්බන්ධයෙන් සිදු කරන ලද පූර්ව වර්ෂයේ ගැලපීම් නොවැළැක්විය හැකි අතර එය අපගේ පාලනයෙන් තොර වේ.

මීට අමතරව, 2022-07-18 දිනැති PED/I/CEB/02/11(i) ලිපිය මගින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ පළමු ණය වාරිකය ස්කන්ධය බවට පරිවර්තනය කරන ලෙස ලංවිමට නියෝග කර ඇත. ඒ අනුව, 2021 දී රු. බිලියන 12.18 ක් සහ 2021 ට පෙර රු. බිලියන 77.4 ක් 2022 දී ඉහත ණය යටතේ ගැලපීම් කර ඇත.

**(ඌ) වයඹ පළාත 2 හි අසාමාන්‍ය බැර ශේෂයන් හිලව් කිරීම හේතුවෙන් බෙදාහැරීමේ අංශය 01 හි පාරිභෝගිකයින් සඳහා ණය ශේෂය රු. මිලියන 23.97 කින් අඩු දක්වා තිබුණි.**

සාමාන්‍යයෙන් පාරිභෝගිකයින් සඳහා ණය ගිණුම්වල හර ශේෂයන් ඇති අතර, වැඩිපුර ගෙවීම්, ගැලපීම් ආදිය හේතුවෙන් සමහර පාරිභෝගික ණය ගිණුම්වල බැර ශේෂයන් පවතී. ගිණුම්කරණ ප්‍රමිතීන් බැර ශේෂයන් සමඟ හර ශේෂයන් හිලව් කිරීමට අවසර දෙයි. මීට අමතරව, 2010.12.23 දිනැති අංක: 2010/GM/23/FM දරන ලංවිම චක්‍රලේඛයේ ඡේද අංක: 5 මගින් ණයවල බැර ශේෂයන් සමඟ ලැබිය යුතු ණය ගිණුම් හිලව් කිරීමට ප්‍රතිපාදන සපයයි.

**(එ) රු. මිලියන 89.57 ක් වූ මාර්ගස්ථ තොග ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ පියවීමට නිසි ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව ගිණුම් පොත්වල පවතුණි. බෙදාහැරීමේ අංශය 01 හි රු. මිලියන 65.26 ක් වූ මාර්ගස්ථ තොග ශේෂය අතරින් රු. මිලියන 60.38 ක් ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් ලිමිටඩ් වෙත ගැල්වනයිස් කිරීම සඳහා වසර 5 කට පෙර යවා ඇති ට්‍රාන්ස්ෆෝමර්ස් නියෝජනය කරන නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒවා නැවත ලැබී නොතිබුණි.**

| අංශය | අවු. 1 කට වැඩි මාර්ග ස්ථ තොග වටිනාකම රු. මිලියන | පිළිතුරු |
|---|---|---|
| ඩීඞී-01 | රු. මිලියන 65.2 | රු. මිලියන 65.26 ක ශේෂය ඩීඞී1 ට අදාළ වන බවටත් එම වටිනාකමින් රු. මිලියන 60.38 ක් සීමාසහිත ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගමට යවා තිබූ ට්‍රාන්ස්ෆෝමර්වලට අදාළ වන බවටත් එකඟ වේ. මේ සම්බන්ධයෙන් ලේඛනගත සාක්ෂි සොයා ගැනීමට අපහසු වූ අතර ලේඛනගත සාක්ෂි ලැබුණු පසු එම ශේෂයන් නිරවුල් කරනු ඇත. |
| ඩීඞී-02 | රු. මිලියන 17.8 | මිල දී ගෙන ගැල්වනයිස් කිරීම සඳහා බඹබ ගැල්වනයිසර් වෙත ලබා දුන් භාණ්ඩවලින් මාර්ගස්ථ තොග ගිණුමේ ශේෂය නියෝජනය කරයි. එම තොග අයිතම නැවත ලංවීමට ලැබෙන තුරු මාර්ගස්ථ තොග ගිණුමේ ගිණුම්ගත කර ඇත. එක් එක් ටෙන්ඩරය අනුව මාර්ගස්ථ තොග ගිණුමේ ඇති භාණ්ඩ පිළිබඳ සවිස්තර ලැයිස්තුව 2022 දෙසැම්බර් මාසයෙන් අවසන් වූ වර්ෂය සඳහා වන අවසන් ගිණුම් සමඟ අමුණා ඇත. මෙම ශේෂයන් නිරවුල් කිරීම සඳහා ඩීඞී2 හි P&D ශාඛාව විසින් පසු විපරම් ක්‍රියාමාර්ග සිදු කරමින් ඇත.<br>2022.12.31 දිනට වසර 05 කට වඩා වැඩි රු. 1, 298,448.25 ක් වටිනා මාර්ගස්ථ තොග ශේෂය 2023 දී නිරවුල් කර ඇත. |
| ඩීඞී-03 | රු. මිලියන 2.1 | රු. මිලියන 2 ක් ඩීඞී3 හි සබරගමුව පළාතට අදාළ වන අතර ශේෂය නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| ඩීඞී-04 | රු. මිලියන 4.3 | මිලියන 4.3 වසර 1 කට වඩා වැඩි මාර්ගස්ථ තොග ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. |
| එකතුව | රු. මිලියන 89.57 | |

**(ඒ) බෙදාහැරීමේ අංශය 03 යටතේ ඇති ආයතනික කාර්යාලයේ සහ සබරගමුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ මාර්ගස්ථ තොග ශේෂයේ එකතුව රු. මිලියන 26.97 ක අසාමාන්‍ය බැර ශේෂයක් නිරීක්ෂණය විය.**

ආයතනික කාර්යාලයේ රු. මිලියන 24 ක ශේෂයක් ගිණුම්කරණ දෝෂයක් නිසා ඇති වූ අතර එය දැනටමත් නිවැරදි කර ඇත. සබරගමුව පළාතට අදාළ ඉතිරි රු. මිලියන 2 ක ශේෂය නිරවුල් කරනු ඇත.

**(ඔ) 2002 වර්ෂයේ සිට පියවීමකින් තොරව පැවතුණු බෙදාහැරීමේ අංශය 01 හි සහ බෙදාහැරීමේ අංශය 02 හි අන්තර් අංශවල ජංගම ගිණුමේ රු. මිලියන 557.94 ක හර ශේෂයක් සහ රු. මිලියන 556.81 ක බැර ශේෂයක් විමර්ශනය කර පියවීමකින් තොරව 2004 වර්ෂයේදී ණයගැති පාලන ගිණුමට මාරු කර තිබුණි.**

2004 දී බෙදාහැරීමේ අංශ විමධ්‍යගත කරන අවස්ථාවේ දී ඩීඞී1 සහ ඩීඞී2 ට අදාළව රු. මිලියන 556.81 ක් වූ මාර්ගස්ථ බැර ශේෂයක් සහ රු. මිලියන 557.94 ක් වූ හර ශේෂයක් පැවතුණි. මීට අමතරව, හර සහ බැර ශේෂයේ ස්වභාවය සහ විස්තර තහවුරු කිරීමට ලේඛනගත සාක්ෂි නොමැත. එබැවින්, මූල්‍ය ප්‍රකාශන වඩාත් හොඳින් ඉදිරිපත් කිරීමේ අරමුණින් එය වෙළඳ ණයගැති ගිණුමට මාරු කර ඇත.

කෙසේ වෙතත්, විගණකගේ නිර්දේශයට අනුකූල වීම සඳහා ඉහත ශේෂයන් විනිවිද පෙනෙන පරිදි එකිනෙකට හිලව් කිරීමෙන් තොරව Mitfin පද්ධතිය තුළ නැවත වර්ගීකරණය කර පෙන්වා ඇත.

**(ඕ) 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 19/2622/113/074 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ලක්විජය බලාගාරය ව්‍යාප්ති ව්‍යාපෘතිය සඳහා මණ්ඩලය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 167.31 ක වියදමක් දැරීමෙන් අනතුරුව, 2021 ජූලි 26 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව 2021 ඔක්තෝබර් 26 දින ව්‍යාපෘතිය වසා දැමීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන තිබුණි. කෙසේ වෙතත්, කපා හැරීමට කටයුතු කිරීමෙන් තොරව හෝ මූල්‍ය ප්‍රකාශනවල කිසියම් ප්‍රතිපාදනයක් සැලසීමෙන් තොරව 2022 දෙසැම්බර් 31 දින වන විටත් රු. මිලියන 167.62 ක මුදල කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ යටතේ පැවතුණි.**

වියදම් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් විගණන කමිටුවට ඉදිරිපත් කර ඇති අතර විගණන කමිටුව එය සමාලෝචනය කර ඇත. විගණන කමිටුවේ තීරණය ලැබුණු පසු සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත.

**(ක) ලක්විජය විදුලි බලාගාරයේ වත්කම් ලේඛනයේ වාහන 23 ක වටිනාකම සහ එහි සමුච්චිත ක්ෂයවීම් සටහන් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස තොරතුරු නොමැතිකම හේතුවෙන් ඒවා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.**
වත්කම් රෙජිස්ටරයේ සටහන් කිරීමට මෙම වාහනවල පිරිවැය නොමැති බැවින් වාහන 23 සඳහා සුදුසු ගිණුම්කරණ ක්‍රමවේදයක් නිර්දේශ කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත. මෑතකදී එම කමිටුව විසින් සිය වාර්තාව ඉදිරිපත් කර ඇත. වාහන 23 න් වාහන 21 ක පිරිවැය සොයා ගැනීමට කමිටුවට හැකි වූ අතර පහත දක්වා ඇති කමිටුවේ නිර්දේශ 2023 ඊළඟ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කරනු ඇත.

- වාහන 21 ක පිරිවැය. වාහනවල අයිතිය ලංවිම වෙත පැවරූ මුල් ස්ථානයේ වාහනවල සටහන් කළ යුතු අතර ආරම්භයේ සිට ක්ෂයවීම් සටහන් කළ යුතුය.

- මෙම වාහනවල පිරිවැය, ලක්විජය බලාගාරයේ ගිණුම් පොත්වල දේපල පිරියත සහ උපකරණවල දැනටමත් වාර්තා කර ඇති වත්කම් පිරිවැයට ඇතුළත් කර ඇති බව උපකල්පනය කර වාහන වෙන වෙනම හඳුනා ගැනීම සඳහා දේපල පිරියත සහ උපකරණවල අදාළ සටහන් සිදු කිරීම.

- පිරිවැය සොයා ගැනීමට නොහැකි වූ වාහන දෙකක වටිනාකම සහ ආයු කාලය සොයා බැලීම සඳහා කමිටුවක් පත් කරනු ඇත.

පිරිවැය නොමැතිකම හේතුවෙන් මෙම වාහන 2022 වසරේ ගිණුම් පොත්වලට ඇතුළත් කර නොමැත. කෙසේ වෙතත්, මෙම වාහනවල වටිනාකම කමිටුවක් විසින් තීරණය කර ඇති අතර ඒ අනුව 2023 අගෝස්තු මාසයේදී ගිණුම් පොත්වලට ගෙන ඇත.

**(ග) 2022 පෙබරවාරි 15 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2267/13 දරන ගැසට් නිවේදනයට අනුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද ඉන්වොයිසිවලට අනුව, 2022 වර්ෂය සඳහා බෙදාහැරීමේ අංශ, ජනන අංශය සහ සම්ප්‍රේෂණ අංශයට අදාළ වාර්ෂික නියාමන ගාස්තු රු. මිලියන 209.68 කි. කෙසේ වෙතත්, රු. මිලියන 167.25 ක් පමණක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබූ අතර ඒ අනුව රු. මිලියන 42.43 ක් අඩුවෙන් දක්වා තිබුණි.**
2022 වාර්ෂික ගාස්තු ගෙවීම පිළිබඳ විගණන විමසුමට පිළිතුරු
2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 46 (2) වගන්තියට අනුව මෙන්ම 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනතේ 33 වැනි වගන්තියට අනුව කොමිෂන් සභාව විසින් කිසියම් වර්ෂයක් සඳහා වාර්ෂික ගාස්තු තීරණය කිරීමේදී පහත සඳහන් කරුණු සලකා බැලිය යුතුය.

- පෙර වර්ෂයේ සිට අයකර නොගත් වියදම් තිබේ නම්.
- කිසියම් වර්ෂයක කොමිෂන් සභාවේ වියදම් ඉක්මවා ඇති ආදායම් අතිරික්තයෙන් ඊළඟ වර්ෂවල එහි වියදම් පියවා ගැනීම.

මේ අනුව, ''වාර්ෂික ගාස්තු ගණනය'' තහවුරු කිරීම සඳහා අදාළ තොරතුරු සපයන ලෙස ලංවිම විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) වෙතින් ඉල්ලා ඇත. ප්‍රතිචාර වශයෙන්, PUCSL විසින් 2022-10-03 දිනැති PUC/LIC/CEB/2022/74 දරන ලිපිය මගින් ඉල්ලා සිටින ලද තොරතුරු ඉදිරිපත් කර ඇත. ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව, 2021 වර්ෂයේ විදුලිබල අංශයේ නියාමන කටයුතු සඳහා PUCSL විසින් රු. මිලියන 212.5 ක් වැය කර ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, 2021 වර්ෂය සඳහා ලංවිම විසින් ගෙවා ඇති ගාස්තුව රු. මිලියන 159.9 ක් වූ අතර එය PUCSL විසින් වැය කළ මුදලට වඩා අඩුය.

එපමණක් නොව, ''මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය'' අනුව 2021 දෙසැම්බර් 31 දිනට රු. 784,517,162 ක් වූ සමුච්චිත අරමුදලක් සහ රු. 109,578,047 ක් වූ මෙහෙයුම් අතිරික්තයක් ඇති බව පෙන්වයි. 2002 අංක 35 දරන PUCSL පනතේ 33 (1) වගන්තියට අනුව, කිසියම් වර්ෂයක කොමිෂන් සභාවේ වියදම් ඉක්මවා ඒ වර්ෂය සඳහා කොමිෂන් සභාවේ ආදායම් අතිරික්තයක් ඇත්නම් ඊළඟ වර්ෂවල එහි වියදම් පියවා ගැනීම සඳහා ඉදිරියට ගෙන යා යුතුය. ඊට පටහැනිව, ආදායම් අතිරික්තය ඉදිරියට ගෙන යාමෙන් තොරව PUCSL විසින් වසර ගණනාවක් පුරා අරමුදලක් රැස්කරගෙන ඇති බව නිරීක්ෂණය විය.

ඉහත කරුණු වලට අමතරව, PUCSL විසින් 2022 වර්ෂය සඳහා වන ධාරිතාව, ඉල්ලුම සහ බලශක්ති අනුපාත 2021 වර්ෂය සඳහා වූ අනුපාතවලට වඩා සියයට 25 කින් පමණ වැඩි කර ඇත.

ඉහත තත්ත්වයන් යටතේ, 2021 වර්ෂය සඳහා ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කරන ලද (2021.04.23 දිනැති අංක. 2224/47) අනුපාත මත වාර්ෂික ගාස්තුව නැවත ගණනය කිරීමෙන් පසු 2022 වර්ෂය සඳහා ''වාර්ෂික ගාස්තුව'' ගෙවීමට මණ්ඩලය තීරණය කරයි. ඒ අනුව, මණ්ඩලය විසින් අනුමත කරන ලද PUCSL වෙත කරනු ලබන 2022 වර්ෂය සඳහා වන සම්පූර්ණ වාර්ෂික නියාමන ගාස්තුව සහ 2022 වර්ෂය සඳහා PUCSL විසින් හිමිකම් පෑ නියාමන ගාස්තුව පහත පරිදි වේ.

| | |
|---|---|
| 2022 වර්ෂය සඳහා ලංවිම විසින් සකස් කරන ලද සම්පූර්ණ ගාස්තු ගෙවීම | රු. 167,252,510.00 |
| 2022 වර්ෂය සඳහා PUCSL විසින් ඉන්වොයිස් කරන ලද මුළු ගාස්තුව | රු. 209,676,300.00 |
| වෙනස | රු. 42,423,790.00 |

ඒ අනුව, ලංවිම විසින් 2022 වර්ෂය සඳහා බලපත්‍ර 6 ක් වෙනුවෙන් සකස් කරන ලද රු. 167,252,510 ක් වූ ගාස්තු ගෙවීම පහත පරිදි වේ.

| | අංශය | බලපත්‍ර අංකය | මුදල (රු.) |
|---|---|---|---|
| 1 | ජනන | EL/GB/09-001 | 41,869,000 .00 |
| 2 | සම්ප්‍රේෂණය | EL/T/09-002 | 25,778,400.00 |
| 3 | ඩීඩී 1 | EL/D/09-003 | 30,088,400.00 |
| 4 | ඩීඩී 2 | EL/D/09-004 | 35,003,110.00 |
| 5 | ඩීඩී 3 | EL/D/09-005 | 19,772,800.00 |
| 6 | ඩීඩී 4 | EL/D/09-006 | 14,740,800.00 |
| | එකතුව | | 167,252,510.00 |

2022-12-08 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඉහත ගාස්තු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ද ලැබී ඇත.

**(ච) රු. බිලියන 63.54 ක් වටිනා වේලි වැඩ, උමං වැඩ, ටේල් රේස් වැඩ සහ ප්‍රවේශ ඇළ, මහවැලි සංකීර්ණයේ දේපළ පිරියත හා උපකරණවල සිවිල් වැඩ යටතේ පෙන්වා තිබුණි. කෙසේ වෙතත්, තොරතුරු නොමැතිකම හේතුවෙන් එම මුදලේ නිරවද්‍යතාවය සහ අදාළ වත්කම් සම්බන්ධව මණ්ඩලයට ඇති හිමිකම පිළිබඳව විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය.**

| පිරිවැය මධ්‍යස්ථානය | බලාගාරය | විස්තරය | වත්කම්වල වටිනාකම රු. |
|---|---|---|---|
| 831.00 | වික්ටෝරියා විදුලි බලාගාරය | වේලි වැඩ | 9,287,094,251.25 |
| | | උමං වැඩ | 5,125,656,824.00 |
| | | **එකතුව** | 14,412,751,075.25 |
| 832.00 | කොත්මලේ විදුලි බලාගාරය | වේලි වැඩ | 11,712,155,418.43 |
| | | උමං වැඩ | 10,374,925,875.87 |
| | | **එකතුව** | 22,087,081,294.30 |
| 833.00 | උකුවෙල විදුලි බලාගාරය | ටේල් රේස් වැඩ | 65,534,014.42 |
| | | වේලි වැඩ | 1,965,525,213.05 |
| | | උමං වැඩ | 550,353,662.58 |
| | | **එකතුව** | 2,581,412,890.05 |
| 834.00 | බෝවතැන්න විදුලි බලාගාරය | වේලි වැඩ | 1,867,251,703.63 |
| | | ටේල් රේස් වැඩ | 101,574,971.11 |
| | | **එකතුව** | 1,968,826,674.74 |
| 835.00 | රන්දෙණිගල විදුලි බලාගාරය | වේලි වැඩ | 1,735,715,967.72 |
| | | උමං වැඩ | 11,011,007,493.48 |

| | | | |
|---|---|---|---|
| | | **එකතුව** | 12,746,723,461.20 |
| 836.00 | රන්ටැඹේ විදුලි බලාගාරය | ටේල් රේස් වැඩ | 2,075,133,740.94 |
| | | උමං වැඩ | 7,075,885,264.60 |
| | | **එකතුව** | 9,151,019,005.54 |
| 837.00 | නිල්ලඹේ විදුලි බලාගාරය | ප්‍රවේශ ඇළ | 347,258,744.71 |
| | | උමං වැඩ | 248,957,723.10 |
| | | **එකතුව** | 596,216,467.81 |
| **මුළු එකතුව** | | | 63,544,030,868.89 |

මණ්ඩලය දැනටමත් නිල්ලඹේ වේල්ල අත්පත් කරගෙන ඇති අතර එය ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම සම්පූර්ණයෙන්ම ලංවිම මගින් සිදු කරයි. කෙසේ වෙතත්, ඉහත සඳහන් කළ බලාගාරවලට අදාළ අනෙකුත් සියලුම වේලි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් එහි පනත මගින් ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම සිදු කරයි. නමුත් අදාළ විදුලි බලාගාර මගින් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන, නඩත්තු කරන සහ කළමනාකරණය කරන ජලාශවල විදුලිය ලබාගැනීම දක්වා වූ ජල මාර්ග පමණක් මණ්ඩලය විසින් අත්පත් කරගෙන ඇත.
ලේඛනගත සාක්ෂි අනුව ජලවිදුලි වත්කම්වල වටිනාකම 1991 වර්ෂයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ලංවිම වෙත පවරා ඇති අතර 2023 වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නිලධාරීන් සමඟ සාකච්ඡා කර වත්කම් පැවරීම සම්බන්ධ ආරවුල් විසඳීමට කටයුතු කරනු ඇත.

**(ජ) 2018 වර්ෂයේ සිට පැවෙත එන මහජන බැංකුවේ අංක 85135 දරන ගිණුමට අදාළව රු. මිලියන 7.29 ක් වූ සෘජු බැංකු බැර කිරීම් විමර්ශනය කිරීමට හා නිසි ගිණුම්වලට ගිණුම්ගත කිරීමට කටයුතු කිරීමෙන් තොරව තාවකාලිකව මාර්ගස්ථ ගිණුමට මාරු කර තිබුණි.**
මෙය 2022 වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගෙන ඇත.

**(ට) සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමේ 5.2 (ආ) ඡේදයට අනුව, මණ්ඩලය විසින් නියමිත දිනට එනම් මණ්ඩලය බලාගාරයේ සවිකර ඇති මීටරය කියවූ දින සිට දින තිහක් ගත වූ දිනට හෝ ඊට පෙර විකුණුම්කරුට ගෙවිය යුතු අතර නියමිත දිනට පසු නොගෙවූ ඕනෑම අවිවාදිත මුදලක් සඳහා මාසික පදනමින් එකතු කරන ලද ප්‍රාථමික පොලී අනුපාතයට පොලී ගෙවිය යුතුය. කෙසේ වෙතත්, නියමිත දිනට ඉන්වොයිසි නොපියවීමේ ප්‍රතිඵලයක් ලෙස 2023 අගෝස්තු 31 වන විට විදුලිබල නිෂ්පාදකයින් 310 දෙනෙකු වෙත රු. බිලියන 26.9 ක මුදලක් ගෙවීමට ඇති බව නිරීක්ෂණය විය. තවද, කලින් කලට මණ්ඩලයට ඉන්වොයිසි ඉදිරිපත් කරමින් විදුලිබල නිෂ්පාදකයින් විසින් නියමිත දිනට පසු නොගෙවූ ශේෂයන් සඳහා පොලී ඉල්ලා තිබූ බව නිරීක්ෂණය වූ අතර විදුලිබල නිෂ්පාදකයින් විසින් විදුලිබල මණ්ඩලයට ඉදිරිපත් කර ඇති විගණනයට ලැබුණු ඉන්වොයිසිවලට අනුව 2019 අප්‍රේල් සිට 2023 අප්‍රේල් දක්වා කාලයට අදාළව විදුලිබල නිෂ්පාදකයින් 109 දෙනෙකු විසින් නොගෙවූ ශේෂයන් සඳහා පොලී ලෙස රු. බිලියන 2.6 ක් ඉල්ලා තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානයේදී පවා විදුලිබල නිෂ්පාදකයින් විසින් ඉල්ලා සිටි කිසිදු පොලී මුදලක් මණ්ඩලය විසින් ගෙවා නොමැති බවත් ගෙවිය යුතු පොලිය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් මණ්ඩලයේ ගිණුම් පොත්වල සලසා නොතිබූ බවත් විගණනයේදී නිරීක්ෂණය විය.**

2021 වසරේ සිට විදුලිබල මණ්ඩලයේ අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් පුනර්ජනනීය බලශක්ති ඉන්වොයිසි පියවීමේ සැලකිය යුතු ප්‍රමාදයක් සිදු විය. 2022 වර්ෂයේ මැද භාගය වන විට එම ප්‍රමාදය මාස 15 කට ආසන්න විය. කෙසේ වෙතත් දැන් ප්‍රමාදය අඩු වී ඇත.

2022 වර්ෂයට පෙර, ඉතා සුළු සංවර්ධකයින් විසින් ප්‍රමාද වූ පොලී සඳහා ඉන්වොයිස් ඉදිරිපත් කර ඇත. නමුත් ඉහළ බැංකු පොලී අනුපාත සමඟ ඉන්වොයිසි පියවීමේ සමුච්චිත ප්‍රමාදය නිසා, ප්‍රමාද වූ පොලී සඳහා ඉන්වොයිස් ඉදිරිපත් කර ඇති සංවර්ධකයින් සංඛ්‍යාව වැඩි වී ඇත. 2023 අගෝස්තු වන විට, සංවර්ධකයින් විසින් රු. බිලියන 2.6 ක මුළු මුදලක් ඉල්ලා ඇත. මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම සඳහා ලංවිම දැන් එවැනි හිමිකම් පෑමේ සුදුසුකම් ඇගයීමට ලක් කරමින් සහ එම පොලී හිමිකම් සඳහා අවශ්‍ය ගිණුම් කටයුතු සකස් කරමින් සිටී.

**1.2.2.3 නොසැසඳු වෙනස්කම්**

**(අ) 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ලෙස දක්වා ඇති ශේෂය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල එදිනට ලැබිය යුතු ලෙස දැක්වෙන ශේෂය අතර රු. බිලියන 4.62 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, ඉහත ශේෂය තුළ 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 753.61 ක විවාදිත ශේෂයක් පැවති අතර මෙය 2013 සිට අඛණ්ඩව විගණන වාර්තාවල අවධාරණය කර තිබුණි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 22 වන දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ පැවති රැස්වීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව 2013 අප්‍රේල් 19 න් පසුව ගෙවිය යුතු රු. මිලියන 330 ක පොලී සංරචකය (ආසන්න වශයෙන්) මණ්ඩලය විසින් දරන ලෙස නිර්දේශ කර තිබුණි. කෙසේ වෙතත්, 2023 මාර්තු මාසය අවසන් වන විටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට සහ ඒ අනුව කටයුතු කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) වෙත ගෙවිය යුතු ශේෂය සහ CPC හි ගිණුම්වල ඊට අනුරූප ලැබිය යුතු ශේෂය 2020 දෙසැම්බර් 31 දක්වා සසඳා ඇත.

2020.12.31 න් පසු වෙනස සඳහා හේතු.

- CPC හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ඒකපාර්ශ්වික තීරණයක් මත 2021 සිට ලංවිම විසින් නිතිපතා කරන ලද ගෙවීම්වලින් ප්‍රමාද වූ පොලී අයකර ගැනීම CPC විසින් ආරම්භ කර ඇත.
- කෙසේ වෙතත්, සජක හි තීරණයට ලංවිම එකඟ වී නැති අතර තීරණය ඉල්ලා අස්කර ගන්නා ලෙස කිහිප වතාවක්ම CPC වෙතින් ඉල්ලා ඇත.
- ලංවිම ගිණුම්වල, CPC වෙත නිතිපතා කරන ලද ගෙවීම්වලින් හිඟ වටිනාකම් පියවා ඇති අතර, ඉතිරි මුදල මත ප්‍රමාද වූ පොලී ගණනය කර ගෙවනු ලබයි.
- CPC විසින් වරින් වර ණය කාලය ඒකමතිකව අඩු කර ඇත.

කෙසේ වෙතත්, CPC ශේෂයේ විස්තර සමඟ සියලුම ගෙවීම් හා සම්බන්ධ ලියකියවිලි පවතී. මෙම කාරණය සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවත් ඉදිරිපත් කරනු ඇත.

**රු. මිලියන 753.61 ක විවාදිත ශේෂය**

2023.04.30 දිනට CPC වෙත ලංවිම විසින් ගෙවිය යුතු මුදල් භාණ්ඩාගාරයට භාර ගැනීමට 2023.06.26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමෙන් තීරණය කර ඇත. අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, 2023 අප්‍රේල් 30 දිනට CPC හි මූල්‍ය ප්‍රකාශන අනුව ලංවිම විසින් ගෙවිය යුතු රු. බිලියන 84.3 ක් ලංවිමට කරන ලද ස්කන්ධ ආයෝජනයක් මගින් පියවනු ඇත. මෙම විවාදිත මුදල ද ඉහත මුදලට ඇතුළත් වන අතර, එබැවින් ලංවිම විසින් රු. මිලියන 330 (ආසන්න වශයෙන්) ක් තවදුරටත් දැරිය යුතු නොවේ.

කෙසේ වෙතත්, රු. මිලියන 330 ක් මූල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස හඳුනාගනු ලබන අතර භාණ්ඩාගාරයෙන් උපදෙස් ලැබීමෙන් පසු මෙම මුදල ලංවිම මූල්‍ය ප්‍රකාශනවල රජයේ ස්කන්ධය බවට පරිවර්තනය කරනු ඇත.

**(ආ) සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති විදුලිබල සැපයුමේ චිරස්තායීතාවය වැඩිදියුණු කිරීමට සහය වීමේ ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ ශේෂය සහ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අනුරූප ශේෂයන් අතර රු. බිලියන 4.49 ක සමස්ත වෙනසක් නිරීක්ෂණය විය.**

ලංවිම හි ව්‍යවස්ථාපිත මූල්‍ය ප්‍රකාශනවල, පරිපාලන උපදෙස් අනුව අප විසින් ගනුදෙනු සටහන් කර ව්‍යාපෘති අනුව කෙරීගෙන යන වැඩ ශේෂයන් ඒකාබද්ධ කරයි. කෙසේ වෙතත්, පරිත්‍යාගශීලියාගේ අවශ්‍යතා මත පදනම්ව ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන ණය අනුව සකස් කර ඇත. එබැවින්, නිශ්චිත ණය මුදලක අරමුදල් භාවිතා කරමින් සිදු කරන ලද සියලුම අංශවල කෙරීගෙන යන වැඩ ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන මගින් ඒකාබද්ධ කර ඇත. එබැවින්, නිසැකවම වෙනස්කම් පවතී.

විදුලිබල සැපයුමේ චිරස්තායීතාවය වැඩිදියුණු කිරීමට සහය වීමේ ව්‍යාපෘතිය  බෙදාහැරීමේ අංශය 01, බෙදාහැරීමේ අංශය 02 සහ ව්‍යාපෘති අංශය මගින් ක්‍රියාත්මක කරයි.

| SESRIP - 3409 | කෙරීගෙන යන වැඩ (රු.) |
|---|---|
| ඩීඩී1 | 4,700,485,723.53 |
| ඩීඩී2 | 4,244,417,042.18 |
| ව්‍යාපෘත් | 5,219,744,391.04 |
| එකතුව | 14,164,647,156.75 |

එබැවින්, ලංවිම මූල්‍ය ප්‍රකාශනවල එක් එක් අංශ යටතේ (ණය අනුව නොව) එකී ව්‍යාපෘතිවල කෙරීගෙන යන වැඩ සඳහන් කර ඇත.

තවද, විදුලිබල සැපයුමේ චිරස්තායීතාවය වැඩිදියුණු කිරීමට සහය වීමේ ව්‍යාපෘතියේ ඩීඩී2 හි කාර්යභාරය වනුයේ ලංවිමහි බෙදාහැරීමේ කාර්යයන් සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය ප්‍රසම්පාදනයයි. (රු. බිලියන 4.24 ක). එබැවින්, විවිධ කාර්යයන් සඳහා ප්‍රසම්පාදනය කර නිකුත් කරන බැවින් ලංවිම මූල්‍ය ප්‍රකාශනවල ශේෂය වෙන වෙනම හඳුනාගත නොහැක.

**(ඈ) බෙදාහැරීම් අංශය 1 හි හඳුනා නොගත් රු. මිලියන 423.76 ක ණයගැති ශේෂයක් 2012 වසරේ සිට අයනොවී පවතී. කෙසේ වෙතත්, එයින් රු. මිලියන 185.41 ක මුදලක් බලපෑමට ලක් වූ තනි ණයගැති ගිණුම් විමර්ශනය කර ගැලපීමෙන් තොරව 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා බෙදාහැරීමේ අංශවල ණයගැති පාලන ගිණුම්, වෙනත් වගකීම් ගිණුම් ආදිය වෙත මාරු කර තිබුණි.**

මුල් වටිනාකම රු. මිලියන 423.76 ක් වූ ණයගැති ශේෂයන් අතරින් රු. මිලියන 185.41 ක මුදලක්, 2018 අගෝස්තු 17 දිනැති AFM(DD1)/Acct(A)MI)/ ආදායම් ණය ගැතියන් /2018 දරන  ලිපිය මත පදනම්ව ඩීඩී3 හි අතිරේක මූල්‍ය කළමනාකරුගේ ශාඛාවේම බිල්පත් සහ ලෙජර පද්ධතිය සැසඳීමෙන් පසුව ලෙජර් ශේෂය සමඟ එම ශාඛාව වෙත මාරු කර ඇත. 2002 දී කොහේ හරි විමධ්‍යගත කිරීමේ ක්‍රියාවලියේදී මෙම මුදල මාරු කර ඇත.

ඉහත දක්වා ඇති කරුණුවලට වැඩිමනක් වශයෙන්, ශේෂය මාරු කිරීම බලපැවැත්වීම සඳහා කිසියම් ශේෂයක් තම අංශවලට අයත් දැයි පරීක්ෂා කිරීම සඳහා සියලුම ප්‍රාදේශීය අතිරේක මූල්‍ය කළමනකරුවන් වෙත නැවත දැනුම් දෙනු ලබයි.

**(ඈ) බිල්පත් ක්‍රමයට අනුව තොග ණයගැතියන්ගේ සහ සාමාන්‍ය ණයගැතියන්ගේ ශේෂයන් සහ සමහර පිරිවැය මධ්‍යස්ථානවලට අදාළ බිල්පත් ණයගැතියන් ලෙස සැසඳීමේ ප්‍රකාශනය වෙත ගෙන ඇති ශේෂය අතර යම් වෙනස්කම් නිරීක්ෂණය විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා තොග ණයගැතියන් සහ සාමාන්‍ය ණයගැතියන්ට අදාළව පිළිවෙළින් රු. මිලියන 5.28 ක සහ රු. මිලියන 423.85 ක වෙනස්කමක් නිරීක්ෂණය විය. ඒ අනුව, වෙළඳ ණයගැතියන්ගේ නිරවද්‍යතාවය විගණනයේදී සාධාරණ ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.**

| අංශය | පිළිතුරු |
|---|---|
| ඩීඩී01 | බිල්පත් ක්‍රමය සහ තොග සහ සාමාන්‍ය ණයගැතියන්ගේ ලෙජර් ශේෂයන්හි යම් යම් වෙනස්කම් ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, පළාත් වශයෙන් පහත විස්තර කර ඇති එවැනි වෙනස්කම් විගණන සොයාගැනීම් සමඟ වෙනස් වේ. |

| | |
|---|---|
| **කොළඹ නගරය** | කොළඹ නගරයට අදාළ විගණන විමසුම වැරදි බව පෙනේ. එබැවින්, විගණන විමසුම සහ තථ්‍ය ශේෂයන් අතර වෙනස විශ්ලේෂණය කළ හැක.<br>බිල්පත් ක්‍රමයට අනුව ශේෂය රු. මිලියන 2,905.77 ක් වූ අතර එච්.එස් සහ සාමාන්‍ය සැපයුම් ශේෂවල වෙනස පහත පරිදි විශ්ලේෂණය කර ඇත.<br><br><u>පද්ධතිය සමඟ තොග සැපයුම් ණයගැති ශේෂ වෙනස</u><br><br>ලෙජරය අනුව ශේෂය, එච්.එස් සක්‍රීය — රු. 2,872,030,520.28<br>තොරතුරු තාක්ෂණ පද්ධතිය අනුව ශේෂය, එච්.එස් සක්‍රීය — රු. 2,872,029,106.32<br>වෙනස — රු. 1,413.96<br>ලෙජරය අනුව ශේෂය, එච්.එස් අවසන් කළ — රු. 33,997,534.69<br>තොරතුරු තාක්ෂණ පද්ධතිය අනුව ශේෂය, එච්.එස් අවසන් කළ — රු. 33,737,372.48<br>වෙනස — රු. 260,162.21<br><br>(2022 අවසාන ගිණුම්වල ඇමුණුම-5 හි නොසැසඳුනු වෙනස පෙන්වා ඇත). |
| **වයඹ පළාත 2** | 2022.12.31 දිනට සාමාන්‍ය ණය ගැති ශේෂය රු. 5,521,883/- ක් වූ අතර එහි ශේෂ පත්‍රයේ දිනට හඳුනා නොගත් අවිනිශ්චිත ගිණුම් ශේෂය ඇතුළත් වේ. පසුව, පාරිභෝගිකයාගේ ඉල්ලීම මත අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් වෙමින් පවතී. මෙය අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර එමඟින් අද වන විට ගිණුම් ශේෂය අඩුවී ඇත. |
| **උතුරු මැද** | **සාමාන්‍ය සැපයුම** — **රු. මිලියන**<br>සැසඳුම අනුව ශේෂය — 1,562.03<br>බිල්පත් ක්‍රමය අනුව ශේෂය — 1,569.87<br>වෙනස් — (7.83)<br>මෙම වෙනස අවිනිශ්චිත ශේෂය වේ<br><br>**තොග සැපයුම** — **රු. මිලියන**<br>සැසඳුම අනුව ශේෂය — 775.78<br>2022-12-31 දිනට බිල්පත් ක්‍රමය අනුව ශේෂය — 747.53<br>වෙනස — 28.25<br><br>මෙම වාර්තාවට අනුව, පද්ධති ශේෂය රු. මිලියන 745.58 කි. නමුත් 2022-12-31 දිනට අප පද්ධතියෙන් ලබාගත් වාර්තාවට අනුව (2023-01-12 දින ජනනය කරන ලද වාර්තාව), ශේෂය රු. මිලියන 747.53 කි. එබැවින්, ඉහත වෙනස අවසන් කළ ගිණුම් ශේෂයක් නිසා වේ. |

| | |
|---|---|
| **ඩීඩී02** | ලෙජරය සහ බිල්පත් ක්‍රමයට අනුව සියලුම සාමාන්‍ය සහ තොග සැපයුම් ණයගැති ශේෂයන් සසඳා මූල්‍ය ප්‍රකාශන සමඟ අමුණා ඇත.<br><br>බිල්පත් ක්‍රමයට අනුව සාමාන්‍ය සැපයුම් ශේෂයට අවසන් කළ ණයගැති ශේෂය ඇතුළත් වූ අතර තොග සැපයුම් ණයගැති බිල්පත් සාරාංශයට සක්‍රීය ණය ගැතියන් පමණක් ඇතුළත් විය. සාමාන්‍ය ණය ගැතියන්ගේ ලෙජර් ශේෂය සක්‍රීය සහ තොග සැපයුම් ශේෂ දෙකෙන්ම සමන්විත වන බැවින්, ලෙජරයට අනුව සහ බිල්පත් සාරාංශයට අනුව තොග සැපයුම් ණය ගැතියන්ගේ ප්‍රධාන වෙනස, අවසන් කළ තොග සැපයුම් ශේෂය පමණක් වේ.<br><br>සාමාන්‍ය සැපයුම් ණය ගැතියන්ගේ සැසඳුම් ආකෘති සඳහා, බිල්පත් සාරාංශයේ සාමාන්‍ය සැපයුම් අවසන් කළ ශේෂය නොසලකා හරමින් බිල්පත් සාරාංශයට අනුව සක්‍රීය ණයගැති ශේෂය පමණක් ශේෂය ලෙස සලකනු ලැබේ. එබැවින්, ලෙජරයට අනුව ශේෂයන් සහ තථ්‍ය බිල්පත් සාරාංශය අතර ඇති වෙනස්කම්, ප්‍රාදේශීය අවිනිශ්චිත ගිණුම් ශේෂය හැර අවසන් කළ සාමාන්‍ය සැපයුම් ණය ගැතියන්ගේ ශේෂය පිළිබිඹු කරයි. (අවිනිශ්චිත ගිණුම් ශේෂය ලෙජරයේ සටහන් කර නොමැති බැවින්).<br><br>ඒ අනුව, විගණන විමසුමෙන් ඉස්මතු කර ඇති සැසඳුම සඳහා ගන්නා ලද බිල්පත් සාරාංශ ශේෂය අනුව ඇති වෙනස්කම් වනුයේ එක් එක් පළාතේ සාමාන්‍ය සැපයුම් අවසන් කළ ණයගැති ශේෂයයි. 2023 වර්ෂයේ සිට අවශ්‍යතාවය අනුව ආකෘතිය වෙනස් කරනු ඇත. |
| **ඩීඩී03** | නියෝජිතයන් හරහා සිදු කරන ලද එකතු කිරීම් හේතුවෙන් ඇති වූ ප්‍රාදේශීය අවිනිශ්චිත ශේෂය මෙම වෙනසට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. එබැවින්, එය ප්‍රධාන කාර්යාල ලෙජරයේ සටහන් කර ඇත. |
| **ඩීඩී04** | ලෙජර ශේෂය සහ පද්ධති ශේෂය අතර වෙනස වනුයේ බිල්පත් සාරාංශවල සටහන් කර ඇති අවිනිශ්චිත ශේෂය වේ. අංශවල ලෙජරයේ සටහන් කර නොමැති අතර ඒ වෙනුවට මූලස්ථානයේ අවිනිශ්චිත ලෙජර ගිණුමේ සටහන් කර ඇත. |

**(ඉ) 2022 දෙසැම්බර් 31 දිනට එකතු කිරීමේ පාලන ගිණුමේ රු. මිලියන 278.54 ක හර ශේෂයක් සහ රු. බිලියන 1.52 ක බැර ශේෂයක් පැවතුණි. කෙසේ වෙතත්, නිරවුල් නොවූ රු. මිලියන 273.32 ක හර ශේෂයන් සහ රු. මිලියන 913.25 ක බැර ශේෂයන් සැසඳීම විගණනය සඳහා ලැබී නොතිබුණි. එබැවින්, එකතු කිරීමේ පාලන ගිණුමේ ශේෂවල නිරවද්‍යතාවය විගණනයේදී සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය. නිරවුල් කිරීමට නිසි ක්‍රියාමාර්ග නොගෙන රු. මිලියන 38.05 ක හඳුනා නොගත් ආරම්භක බැර ශේෂයක් සහ වසරකට වැඩි කාලයක් තිස්සේ පැවති රු. මිලියන 3.14 ක හර ශේෂයක් සහ රු. මිලියන 3.44 ක බැර ශේෂයක්ද (හඳුනා නොගත් ආරම්භක බැර ශේෂය හැර) එකතු කිරීමේ පාලන ගිණුමේ ඇතුළත් වී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.**

<table>
<tr><th>අංශය</th><th>නොසැසඳූ ශේෂය (රු.) මිලියන</th><th>පිළිතුරු</th></tr>
<tr><td>ඩීඩී01</td><td>(227)</td><td>
එකතු කිරීමේ පාලන ගිණුම්වල සැසඳුම් ප්‍රකාශයන් සාමාන්‍ය ක්‍රියාකාරකමක් වන අතර එකතු කිරීමේ පාලන ගිණුම්වල මාසික සැසඳුම් ප්‍රකාශ සකස් කරන ලෙස පළාත් ආදායම් ගණකාධිකාරීවරුන්ට උපදෙස් දී ඇත.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, කොළඹ නගරය සම්බන්ධයෙන්, කැලැන්ඩර මාසය තුළ සාමාන්‍ය සැපයුම් පාරිභෝගිකයින්ගෙන් සහ තොග පාරිභෝගිකයින්ගෙන් මුදල් එකතු කිරීමේ චක්‍රය හේතුවෙන් මෙම වෙනස ඇති වී ඇත. ඒ අනුව, එකතු කිරීමේ පාලන ගිණුම්වල ශේෂය රු. 3,727,977.37 ක් වන අතර එයට 2022/12/30 සහ 2022/12/30 දින එකතු කිරීමේ මුදල ඇතුළත් වේ. මේ සම්බන්ධයෙන්, ආදායම් මෙහෙයුම් කමිටුවේ මාර්ගෝපදේශ අනුව තොරතුරු තාක්ෂණ පද්ධතිය සංවර්ධනය කිරීමට දැනටමත් කටයුතු කර ඇත.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, වයඹ පළාත 2 සම්බන්ධයෙන්, පහත දැක්වෙන එකතු කිරීමේ පාලන ගිණුමේ සැසඳුම් ප්‍රකාශය සකස් කර ඇත.
<table>
<tr><th colspan="3">2022 දෙසැම්බර් 31 වැනි දිනට එකතු කිරීමේ පාලන ගිණුමේ සැසඳුම් ප්‍රකාශය</th></tr>
<tr><td>එල්5105 - වයඹ පළාත 2</td><td>රු.</td><td>රු.</td></tr>
<tr><td>2022.12.31 දිනට ශේෂය</td><td></td><td>(192,860,964.18)</td></tr>
<tr><td>ප්‍රධාන කාර්යාලයෙන් වැඩිපුර මාරු කළ ශේෂය</td><td>(247,414,941.72)</td><td></td></tr>
<tr><td>අනෙකුත් පළාත් විසින් අඩුවෙන් ශේෂය පවරා ගැනීම</td><td>8,804,696.27</td><td></td></tr>
<tr><td>නිරවුල් කළ යුතු හඳුනා නොගත් ශේෂය</td><td>45,749,281.27</td><td>(192,860,964.18)</td></tr>
<tr><td>වෙනස</td><td></td><td>-</td></tr>
</table>
මාසික සැසඳුම් ප්‍රකාශ නිතිපතා සකස් කිරීම ආරම්භ කරන ලෙස ආදායම් ගණකාධිකාරීවරයාට, වයඹ පළාත 1 උපදෙස් දී ඇත.
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, උතුරු මැද පළාත සම්බන්ධයෙන්, සැසඳුම් ප්‍රකාශ සකස් කර ඇති අතර පහත සඳහන් හේතූන් මත එකතු කිරීමේ පාලන ගිණුමේ රු.මිලියන 160.9 ක වෙනස්කම් සිදුවී ඇත.
<ol>
<li>2011-12-31 දින හඳුනා නොගත් පද්ධති ගැලපුම් මුදල රු. මිලියන 196.5 කි.</li>
<li>උතුරු මැද පළාත වෙනුවෙන් අනෙකුත් පළාත්වලින් සාමාන්‍ය එකතු කිරීම් සහ බිල්පත් සාරාංශය භාවිතයෙන් එක් එක් මාසය තුළ මාරු කළ ශේෂයන් අතර වෙනස්කම්.</li>
<li>එක් එක් චක්‍රයේ දිනවල වෙනස (බිල්පත් චක්‍රය සහ එකතු කිරීමේ චක්‍රය). එකතු කිරීමේ චක්‍රය කැලැන්ඩර මාසයකට (1-30/31) සමාන වන අතර සාමාන්‍ය සැපයුම් බිල්පත් චක්‍ර දිනය කැලැන්ඩර මාසයක මධ්‍යයේ වේ. (උදා. එකතු කිරීමේ චක්‍රය මාසයේ 31 වන දින අවසන් වන අතර එම මාසය සඳහා බිල්පත් චක්‍රය අප්‍රේල් 15 දිනෙන් අවසන් වේ.)</li>
</ol>
</td></tr>
<tr><td>ඩීඩී02</td><td>(193)</td><td>
එකතු කිරීමේ පාලන ගිණුම් ශේෂයන් සැසඳීමේ අරමුණින්, සාමාන්‍ය සහ තොග සැපයුම් ණය ගැතියන්ගේ බිල්පත් කාලය, කැලැන්ඩර මාසය බවට පරිවර්තනය කර ඇත.
මෙම කාර්යය සාර්ථකව නිම කිරීම සඳහා, මාසය සඳහා වන සියලුම ලංවිම POS එකතු කිරීම්, බිල්පත් පද්ධතියට ලබා ගත යුතු අතර, පළාත් ආදායම් ගණකාධිකාරීවරුන් විසින් දිනය අවසන් කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට පෙර මෙම නිස්සාරණ ක්‍රියාවලිය සහතික කිරීමට නියමිතය.
මෙම ක්‍රියාවලිය පද්ධතිය හරහාම සත්‍යාපනය කිරීම සඳහා ගෙවීම් සිදු කරන අවස්ථාවේදීම පාරිභෝගිකයාගේ ගෙවීම් ලබා ගැනීමේ පහසුකම තිබිය යුතු අතර මෙම පද්ධති වෙනස් කිරීම සිදු කරමින් පවතී.
</td></tr>
</table>

| | | |
|---|---|---|
| ඩීඩී03 | (230) | බස්නාහිර පළාත, දකුණ 2 සහ සබරගමුව පළාත් සඳහා සකස් කරන ලද සැසඳීම් පහත පරිදි වේ. |

**<u>බස්නාහිර පළාත, දකුණ 2 - 2022 දෙසැම්බර් 31 දිනට එකතු කිරීමේ පාලන ගිණුම සඳහා සැසඳුම</u>**

| | |
|---|---|
| 2022 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 98,757,289.26 |
| ගිණුම්වලට පෙර වර්ෂයේ බලපෑම | <u>5,100,726.90</u> |
| ගලපන ලද ශේෂය | 93,656,562.36 |
| බිල්පත් සාරාංශයේ යාවත්කාලීන කර නොමැති මූලස්ථාන POS කවුන්ටර මගින් දෙසැම්බර් මාසයේ එකතු කිරීම් | 120,907,424.58 |
| බිල්පත් සාරාංශයේ යාවත්කාලීන කර නොමැති පළාත් POS කවුන්ටරවලින් එකතු කිරීම් | 20,985,689.46 |
| **<u>2022 දෙසැම්බර් 31 දිනට ශේෂය</u>** | 235,549,676.40 |

එකතු කිරීමේ පාලන ගිණුම සැසඳුම - සබරගමුව පළාත

| | රු. | රු. |
|---|---|---|
| 2022.12.31දිනට ලේජර - හර | | 5,217,355.80 |
| <u>එකතු කළා</u> | | |
| 22.10.31 වයඹ පළාත 11 සබරගමුව පළාත විසින් එකතු කරන ලද සාමාන්‍ය එකතු කිරීම් | 3,000.00 | |
| 2021.12.31 රත්නපුර ප්‍රධාන කාර්යාලය මගින් එකතු කරන ලද සාමාන්‍ය සැපයුම් එකතු කිරීම් | 16,156,670.74 | |
| 2021.12.31 කහවත්ත ප්‍රධාන කාර්යාලය මගින් එකතු කරන ලද සාමාන්‍ය සැපයුම් එකතු කිරීම් | 15,705,242.87 | |
| 2021.12.31 රුවන්වැල්ල ප්‍රධාන කාර්යාලය විසින් එකතු කරන ලද සාමාන්‍ය සැපයුම් එකතු කිරීම් | 15,586,907.81 | |
| 2021.12.31 ඇහැලියගොඩ ප්‍රධාන කාර්යාලය විසින් එකතු කරන ලද සාමාන්‍ය සැපයුම් එකතු කිරීම් | 13,569,214.51 | |
| ඇඹිලිපිටිය ප්‍රධාන කාර්යාලය විසින් එකතු කරන ලද සාමාන්‍ය සැපයුම් එකතු කිරීම් | 15,371,083.32 | |
| 2022.12.31 දෙසැම්බර් මාසයේ මාසික එකතු කිරීම් | 2,638,731.89 | |
| ආරක්ෂක තැන්පතු, අවසන් කළ ගිණුම් | 1,004,700.00 | |
| අවිනිශ්චිත - තොග සැපයුම 2019/2020/2021/2022 | 230,081.18 | |
| වගුගත කිරීම සහ මූලස්ථාන TV අතර වෙනස | 6,713,082.95 | |
| ටැබ් දෝෂය | 53,626.47 | 87,032,341.74 |
| | | 92,249,697.54 |
| අඩු කළා<br>හිඟ ගෙවීම සඳහා වෙනස - 2020 මාර්තු සබරගමුව (පද්ධති දෝෂය) | 1,320,503.30 | |

<table>
<tr>
<td></td>
<td></td>
<td>
<table>
<tr><td></td><td>රු.</td><td>රු.</td></tr>
<tr><td>අඩු කළා<br>හිඟ ගෙවීම සඳහා වෙනස - 2020 මාර්තු සබරගමුව (පද්ධති දෝෂය)</td><td>1,320,503.30</td><td></td></tr>
<tr><td>සබරගමුව පළාතට අදාළ නොවේ - දකුණු පළාත 520.70/ඔඩ්ඊ/20/0088 (පද්ධති දෝෂය)</td><td>789,885.90</td><td></td></tr>
<tr><td>සබරගමුව පළාතට අදාළ නොවේ - උතුරු මැද පළාත 420.70/TVB/20/0038 (පද්ධති දෝෂය)</td><td>2,845,883.80</td><td></td></tr>
<tr><td>මාරු කළ මුදල් ශේෂය</td><td>33,523.89</td><td></td></tr>
<tr><td>අංක 570/SD/20/12/16 දරන කහවත්ත ආරක්ෂිත තැන්පතු සඳහා Tv</td><td>67,812.07</td><td></td></tr>
<tr><td>SSCL</td><td>86,565,310.12</td><td></td></tr>
<tr><td>tvb/22/0395 සඳහා වැඩිපුර මාරු කිරීම - බස්නාහිර පළාත, දකුණ 2</td><td>10,478.00</td><td></td></tr>
<tr><td>ආරක්ෂක තැන්පතුවලින් ආවරණ වූ අවසන් කළ ගිණුම්</td><td>142,739.00</td><td></td></tr>
<tr><td>නිවැරදි කළ යුතු (නොවැ, මැයි)</td><td>246,781.76</td><td></td></tr>
<tr><td>අඩුවෙන් ගිණුම්ගත කළ ජෂඩ 554.20/P58/22/0087</td><td>8,279.70</td><td></td></tr>
<tr><td>වගුගත කිරීම සහ මූලස්ථාන TV අතර වෙනස</td><td>218,500.00</td><td>92,249,697.54</td></tr>
<tr><td>2022.12.31 දිනට ඡඩී එකතු කිරීම්, ප්‍රධාන කාර්යාලය සහ බැංකු එකතු කිරීම් ශේෂය</td><td></td><td>0ග00</td></tr>
</table>
</td>
</tr>
<tr>
<td>ඩීඩී04</td>
<td>(315)</td>
<td>බස්නාහිර පළාත, දකුණ 1 - දත්ත සහ පරිමාව නොමැති වීම හේතුවෙන් සැසඳීමට නොහැකි ආරම්භ ශේෂයක් ඇත. කෙසේ වෙතත්, 2022/05/01 සිට නිසි සැසඳීමක් සිදු කරමින් පවතී. දකුණ පළාත 1 සහ දකුණ පළාත 2 සඳහා එකතු කිරීමේ පාලන ගිණුමේ සැසඳීම සිදු කරමින් පවතී.</td>
</tr>
<tr>
<td>මූලස්ථානය</td>
<td>(38)</td>
<td>මූල්‍ය වර්ෂය අවසානයේදී එකතු කිරීමේ පාලන ගිණුම් ශේෂය වූ රු. මිලියන 38.05 ක් 2016 ට පෙර පද්ධතිය තුළ නිර්මාණය කරන ලද හඳුනා නොගත් ශේෂයට අදාළ විය. ඉහත සඳහන් ශේෂය සඳහා සැසඳීම සිදු කරන ලද අතර සියලුම අතීත ගනුදෙනු සමාලෝචනය කර සිදු වූ දෝෂ හඳුනාගෙන ඇත. ඒවා 2023 අවසන් ගිණුම්වල නිවැරදි කරනු ඇත.</td>
</tr>
</table>

<table>
<tr>
<td>ජනන</td>
<td>(21)</td>
<td>2022.12.31 දිනට ජනන අංශයට අදාළව එකතු කිරීමේ පාලන ගිණුම් ශේෂය රු. 21,024,590.11 කි.
<table>
<tr><td>ජනන මූලස්ථානය</td><td>එකතු කිරීමේ පාලන ගිණුමේ රු. 8,601,448.62 ක ශේෂයක් ජනන මූලස්ථානය නියෝජනය කරන අතර රු. 6,156,120 ක් සේවකයෙකුගෙන් ලද මුදලක් නියෝජනය කරයි. මෙම ශේෂය 2023 අවසන් වන විට නිරවුල් විය.</td></tr>
<tr><td>සමනල සංකීර්ණය</td><td>එකතු කිරීමේ පාලන ගිණුමේ රු. 97,000 ක ශේෂයක් සමනල සංකීර්ණය නියෝජනය කර ඇති අතර රු. 67,000 2023 දී නිරවුල් කර ඇත. ඉතිරි රු. 30,000 ක් නිරවුල් කිරීමේ ක්‍රියාවලියේ පවතී.</td></tr>
<tr><td>මහවැලි සංකීර්ණය</td><td>මහවැලි සංකීර්ණයේ 2022.12.31 දිනට එකතු කිරීමේ පාලන ගිණුම පහත දැක්වේ.
<table>
<tr><td>2022.01.01 දිනට ආරම්භක ශේෂය</td><td>(329,019.00)</td></tr>
<tr><td>බැංකු තැන්පතු (2022.01.01 සිට 2022.12.31)</td><td>(25,605,365.01)</td></tr>
<tr><td>හඳුනාගෙන නිරවුල් කර ඇති (2022.01.01 සිට 2022.12.31)</td><td>24,219,532.15</td></tr>
<tr><td>2022.12.31 දිනට අවසාන ශේෂය</td><td>(1,714,851.86)</td></tr>
</table>
2023.04.30 දිනට රු.90,408.00 ක් නිරවුල් කර ඇති අතර ඉතිරිය 2023 දී නිරවුල් කරනු ඇත.</td></tr>
<tr><td>තාප සංකීර්ණය</td><td>මුළු ශේෂය රු. 23,359 කි.<br>ටෙන්ඩර් ලේඛන සඳහා බැංකුවේ තැන්පත් කර ඇති මුදල් සහ තැන්පත්කරුවන් පී.අයි.වී නිකුත් කිරීම සඳහා තම තැන්පතු පත්‍රිකා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මෙම ශේෂය නිර්මාණය වී ඇත. රු. 14,134.19 ක් 2021.01.01 සිට 2021.12.31 කාලයට අයත් වන අතර රු. 9,225 ක් 2022.1.01 - 2022.12.31 කාලයට අයත් වේ. එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.</td></tr>
</table>
</td>
</tr>
</table>

**(ඊ) 1998 සිට 2021 දක්වා කාලය තුළදී ණයගැතියන්ගෙන් එකතු කරන ලද රු. මිලියන 68.99 ක් නිරවුල් කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග නොගෙන අවිනිශ්චිත ගිණුමට ඇතුළත් කර තිබුණි.**

මෙහි සඳහන් කළ අවිනිශ්චිත ගිණුමේ ඇති රු. මිලියන 68.99 ක්, එම ගනුදෙනු පාරිභෝගිකයාට බැරක් ලෙස හෝ ආදායමට අය කිරීමක් ලෙස හඳුනා ගැනීමට ලංවීමට කිසිදු හෝඩුවාවක් නොමැති මුදලක් නිරූපනය කරයි. පාරිභෝගික පැමිණිලි ලැබීමෙන් පසු අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කළ හැක. පාරිභෝගිකයා නිවැරදි පාරිභෝගික ගිණුම් අංකය දැනුම් දුන් විට, අදාළ මුදල පාරිභෝගිකයාගේ ගිණුමට මාරු කළ හැකිය. ඊට අමතරව, එකතු කිරීමේ නියෝජිතයින්ගෙන් විස්තර ලබාගෙන, අවිනිශ්චිත එකතු කිරීම් නිරවුල් කිරීමට පසු විපරම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන නමුත්, එම පාරිභෝගිකයා ඉදිරිපත් වී නිවැරදි කරන ලෙස ඉල්ලා සිටින තෙක් මේ සම්බන්ධයෙන් සහය දැක්වීමට එකතු කිරීමේ නියෝජිතයින්ද හැකියාවක් නොමැත.

වාණිජ බැංකු සහ අනෙකුත් වෙළඳුන් විසින් මුදල් තැන්පතු යන්ත්‍ර හඳුන්වා දීමත් සමඟම අවිනිශ්චිතතා ඇති වන අවස්ථා ඉහළ ගොස් තිබේ. බොහෝ අවස්ථාවලදී, මුදල් තැන්පතු යන්ත්‍රය පාරිභෝගිකයා විසින්ම ක්‍රියාත්මක කරන බැවින් සහ නිවැරදි ගිණුම් අංකය පිහිටුවීමට වෙනත් ලේඛනගත සාක්ෂි නොමැති බැවින් අවිනිශ්චිතතා නිරවුල් කිරීමට අමතර තොරතුරු කිසිවක් අපට ලබා දීමට බැංකුවලට නොහැකි වේ.

දිගුකාලීන හිඟ අවිනිශ්චිත ශේෂය සම්බන්ධයෙන්, දිගුකාලීන හිඟ අවිනිශ්චිත ගෙවීම් (වසර දෙකකට පෙර සිදු කරන ලද ගෙවීම්) විවිධ ආදායම්වලට අවශෝෂණය කර ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා පියවර ගැනීමට සැලසුම් කර ඇත. ගෙවීම් විමසීම්, ගෙවන දින සිට වසර 2 ක් දක්වා පමණක් සිදු කර හැකි බව ලංවිම විදුලි බිල්පතේහි පැහැදිලිව දක්වා ඇති බැවින් මෙය සිදු කළ හැකිය. කෙසේ වෙතත්, පසුගිය කාලසීමාව තුළ නොපසුබස්නා උත්සාහයෙන්, පාරිභෝගිකයින්ගේ ඉල්ලීම මත පදනම්ව අවිනිශ්චිත ගිණුමේ තිබූ පහත බැර ශේෂයන් හඳුනා ගැනීමට සහ නිරවුල් කිරීමට ලංවිම සමත් විය.

| වර්ෂය | ගිණුම් සංඛ්‍යව | මුදල (රු) |
|---|---|---|
| 2014 | 285 | 13,402,956.51 |
| 2015 | 478 | 5,514,790.32 |
| 2016 | 2401 | 10,292,659.07 |
| 2017 | 2813 | 11,107,169.99 |
| 2018 | 3343 | 8,916,510.66 |
| 2019 | 2245 | 8,619,676.30 |
| 2020 | 3033 | 10,852,609.45 |
| 2021 | 4246 | 13,180,531.03 |
| TOTAL | 18844 | 81,886,903.33 |

**(උ) බස්නාහිර පළාත දකුණ ෂෂ (බෙදාහැරීමේ අංශය 03) ට අදාළව විමර්ශනය කර අයකර ගැනීමට පියවර ගැනීමෙන් තොරව විදුලිය සැපයීම වෙනුවෙන් සෝජිට්ස් කැළණිතිස්ස පුද්. සමාගම වෙතින් රු. මිලියන 38.76 ක් 2019 වර්ෂයේ සිට අයවිය යුතුව පැවතුණි. කෙසේ වෙතත්, සමාගමේ වාර්තාවලට අනුව, එය මණ්ඩලයට ගෙවිය යුතු ලෙසට වාර්තා කර නොතිබුණි.**

විදුලිබල (ආරවුල් විසඳීමේ ක්‍රියාපටිපාටිය) රීතිවලට අනුව, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත දකුණ 2) විසින් සෝජිට්ස් කැළණිතිස්ස පුද්. සමාගමේහි කළමනාකාරිත්වය සමඟ රැස්වීම් කිහිපයක් සිදු කර ඇතත්, කාරණය විසඳී නොමැත. සෝජිට්ස් කැළණිතිස්ස පුද්. සමාගමේහි කළමනාකාරිත්වය සමථයකට එකඟ වී නොමැත. නොවිසඳුණු ආරවුල 2023.02.22 දින මහජන උපයෝගිතා කොමිසම වෙත යොමු කර ඇත. ආරවුල විසඳීම සඳහා මහජන උපයෝගිතා කොමිසම විසින් 2023.03.28 දින සමථකරණ රැස්වීමක් පවත්වා ඇත. කෙසේ වෙතත්, පාර්ශවයන්ට එකඟතාවකට පැමිණීමට නොහැකි විය. අඩුවෙන් ගෙවීම මගින් (සෝජිට්ස් කැළණිතිස්ස පුද්. සමාගම සමඟ ඇති විදුලි බලය මිළදී ගැනීමේ ගිවිසුම යටතේ) විවාදිත මුදල ලංවිමට අභ්‍යන්තරව පියවා ගත හැකිද යන්න පිළිබඳව සොයා බලා අවසාන තීරණය සියලු පාර්ශවයන් වෙත දැනුම් දීමට ලංවිම තීරණය කර ඇත. ඒ අනුව, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර පළාත දකුණ 2) විසින් විදුලි බලය මිළදී ගැනීම සඳහා ලංවිම විසින් ගෙවිය යුතු මුදල් අඩුවෙන් ගෙවීම හරහා විසඳුම් විකල්පයක් සඳහා අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණය - රැහැන් රහිත මෙහෙයුම) වෙත දැනුම් දී ඇත.

එබැවින්, ආරවුල විසඳීමට සහ සෝජිට්ස් කැළණිතිස්ස පුද්. සමාගම වෙතින් ලැබිය යුතු ඉතිරි මුදල් අයකර ගැනීමට ලංවිම සියලු ක්‍රියාමාර්ග ගෙන ඇති බව පැහැදිලිය.

**(ඌ) මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට කැළණිතිස්ස ෆ්රේම් V ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියට (860.25) අදාළව රු. මිලියන 752.22 ට සමාන මුදලක් කෙරීගෙන යන වැඩ ගිණුමේ පවතී. කෙසේ වෙතත්, ජනන ව්‍යාපෘති ශාඛාවේ පවත්වාගෙන යන වාර්තාවලට අනුව, එය රු. මිලියන 992.77 ක් වූ අතර එම නිසා රු. මිලියන 240.55 ක නොසැසඳු වෙනසක් නිරීක්ෂණය විය.**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (GP) ශාඛාව විසින් අනුමත කරන ලද ගෙවීම් සහ මාරු වවුචර අනුව, 2022.12.31 දින දක්වා මෙම ව්‍යාපෘතියේ පිරිවැය ලෙස රු. මිලියන 752.22 ක් වාර්තා කර ඇත. වෙනස සැසඳීම් කර ගිණුම්කරණ ගැලපීම් ඇත්නම් 2023 ගිණුම්වල සටහන් කරනු ඇත.

**(එ) මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය මගින් සිදු කරන ලද කාර්යයන්ට අදාළව රාජ්‍ය ආයතන දෙකකින් ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් මණ්ඩලයේ වාර්තා සහ අදාළ රාජ්‍ය ආයතනවල ගිණුම් පොත් අතර රු. මිලියන 22.24 ක සමස්ත වෙනසක් නිරීක්ෂණය විය.**

| විස්තරය<br>රු. | ලංවිම වාර්තා අනුව ශේෂය<br>රු. | ආයතනයේ වාර්තා අනුව ශේෂය<br>රු. | වෙනස<br>රු. |
|---|---|---|---|
| ජනාධිපති ලේකම් කාර්යාලය | 23,370,196 | 28,214,891 | 4,844,695 |
| අගමැති කාර්යාලය | 36,536,343 | 53,936,886 | 17,400,543 |
| **එකතුව** | | | 22,245,238 |

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (W&AS) හි වාර්තා අනුව ලංවිම ලෙජරයේ පිළිබිඹු වන ශේෂය නිවැරදිය.

**(ඒ) මණ්ඩලයේ ගිණුම් පොත්වලට අනුව, සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට මහා භාණ්ඩාගාරයේ දායක ප්‍රාග්ධනය ලෙස රු. බිලියන 865.16 ක මුදලක් පෙන්වා තිබුණි. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරයේ වාර්තාවලට අනුව, රු. බිලියන 864.14 ට සමාන මුදලක් මණ්ඩලයට ලබා දෙන ලද ප්‍රාග්ධන දායකත්වය ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය අවසානයේ දී රු. බිලියන 1.01 ක සමස්ත වෙනසක් නිරීක්ෂණය විය.**

**වෙනස සඳහා සැසඳුම පහත පරිදි වේ.**

| | | |
|---|---|---|
| ලංවිම ගිණුම්වලට අනුව 2022-12-31 දිනට අවසන් ශේෂය | රු. | 865,159,371,359 |
| අඩුකළා - භාණ්ඩාගාරය විසින් වාර්තා කර නොමැති මුදල - CPC ගෙවීම | රු. | (1,022,280,600) |
| HVPTL ව්‍යාපෘතිය සම්බන්ධයෙන් භාණ්ඩාගාරය විසින් ගැලපිය යුතු මුදල | රු. | 6,938,206 |
| භාණ්ඩාගාර පොත්වලට අනුව 2022-12-31 දිනට අවසන් ශේෂය | රු. | 864,144,028,965 |

ලංවිම ආයෝජනය ලෙස 2022 මූල්‍ය ප්‍රකාශනවල මහා භාණ්ඩාගාරය විසින් සටහන් නොකළ මුදල (CPC ගෙවීම - රු.1,022,280,600) 2023 දී වාර්තා කර ඇති බව මහා භාණ්ඩාගාරය 2023 දී දන්වා ඇත. එබැවින්, මෙම වෙනස දැන් විසඳා ඇත. හබරණ වේයන්ගොඩ ව්‍යාපෘතියට අදාළව භාණ්ඩාගාරය විසින් ගැලපිය යුතු මුදල ඔවුන්ගේ ගිණුම් පොත් නිවැරදි කිරීම සඳහා මහා භාණ්ඩාගාරයට දන්වා ඇත.

**(ඔ) මණ්ඩලයේ ගිණුම් පොත්වල දැක්වෙන ශේෂ සහ අදාළ සමාගම්වල මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූප ශේෂ අතර සම්බන්ධිත පාර්ශවවලින් ලැබිය යුතු සහ සම්බන්ධිත පාර්ශවවලට ගෙවිය යුතු පිළිවෙලින් රු. මිලියන 1,126.29 ක සහ රු. මිලියන 447.78 ක සමස්ත නොසැසඳු වෙනස්කම් නිරීක්ෂණය විය.**

**ලෙකෝ වෙනස**

2022/12/31 දිනට ලංකා විදුලි පුද්. සමාගමට (ලෙකෝ) අදාළව සම්ප්‍රේෂණ අංශයේ වාර්තා අනුව ශේෂයන් තහවුරු කිරීමට අදාළ සැසඳුම විගණන වාර්තාව සඳහා වන පිළිතුරු සමඟ විගණනයට ඉදිරිපත් කර ඇත. ලංවිම ගිණුම් පොත් අනුව ලැබිය යුතු ශේෂය රු. මිලියන 2,912.67 කි. කෙසේ වෙතත්, ලෙකෝ වෙතින් ලද ශේෂ තහවුරු කිරීමේ ලිපියට අනුව ගෙවිය යුතු ශේෂය රු. මිලියන 1799.28 කි. 2022 වර්ෂය සඳහා ලෙකෝ විසින් ඇස්තමේන්තුගත UNT ගැලපුම් ගිණුම්ගත නොකිරීම සහ වහලය මත සූර්ය බලශක්ති මිලදී ගැනීම් සම්බන්ධයෙන් සිදු කරන ලද ගෙවීම් සඳහා ලෙකෝ විසින් වාර්තා කරන ලද මුදල, රු. මිලියන 1,113.38 ක් වූ වෙනසට හේතු වේ.

**ලංකා ගල් අඟුරු සමාගමේ (LCC) වෙනස**

ලංවිම විසින් 2016 සිට 2021 දක්වා වූ වර්ෂ සඳහා කළමණාකරණ ගාස්තු සම්බන්ධයෙන් සියලුම ගෙවිය යුතු මුදල් ගෙවා ඇත. කොන්ත්‍රාත් ගිවිසුම් වගන්ති අංක 2.3 (LCC කළමනාකරණ ගාස්තු ගෙවීම) අනුව ඉතිරි නොගෙවූ මුදල ලංවිම විසින් ගෙවීමට එකඟ වී නොතිබුණි. මෙය දැනටමත් බකඝ වෙත දන්වා ඇත. කෙසේ වෙතත්, 2019, 2020,2021 වර්ෂවලට අදාළව තවමත් අවසන් කර නොමැති බදු ඉන්වොයිසි කිහිපයක් තිබේ.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

**1.2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**මණ්ඩලය විසින් සෘජුවම ලබාගත් විදේශ ණය හතරක ණය ශේෂ තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මූල්‍ය ප්‍රකාශනවලට අනුව මෙම ණයවල මුළු හිඟ මුදල රු. මිලියන 55,078.65 ක් විය.**

ආසියානු සංවර්ධන බැංකුවෙහි (ADB) ණය ශේෂයන් ADB LFIS පද්ධතියෙන් ඕනෑම දිනයකදී බාගත කර ගැනීම සඳහා පවතී. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රකාශයන් විගණන ශාඛාව වෙත ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, ශේෂය සෘජුවම විගණක වෙත තහවුරු කිරීම සඳහා ADB, HNB සහ ICBC වෙත වෙන වෙනම ඉල්ලීම් ලිපි යවා ඇත. කෙසේ වෙතත්, විගණකවරුන් විසින් ADB වෙත ඉල්ලීමක් යවා ඇත්නම් සෘජුවම තහවුරු කිරීම් එවිය හැකි බව සහ එය දැනටමත් විගණකවරුන් වෙතද දන්වා ඇති බව ADB අරමුදල් නියෝජිතායතනය විසින් ලංවිමට දන්වා ඇත.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

තොරතුරු සහිතයි.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

තොරතුරු සහිතයි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

තොරතුරු සහිතයි.

**2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.**

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ | පිළිතුරු |
|---|---|---|
| (අ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත<br>(i) 7 (1) සහ 43 (1) වගන්තිය | නියාමකගෙන් බලය ලබා නොගෙන, උත්පාදන බලපත්‍රය කල් ඉකුත් වී ඇති ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් තිදෙනෙකුගෙන් (අයි.පී.පී) සමාලෝචිත වර්ෂය තුළදී රු. බිලියන 5.07 ක් වූ ගිගාවෝට් 60.33 ක බලශක්ති මිලදී ගෙන තිබුණි. | විශ්‍රාමලත් අයි.පී.පී බලාගාර වන්නේ ඒස් පවර් ඇඹිලිපිටිය, ඒස් පවර් ජෙනරේෂන් මාතර සහ ඒසියා පවර්.<br><br>සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට විශ්‍රාමික අයි.පී.පී බලාගාරවලින් විදුලි බලය මිලදී ගැනීමට 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධිත) පනතේ 7(1) හෝ 43(1) වගන්තිවලින් කිසිදු නීතිමය බාධාවක් නොමැත. මෙම විශ්‍රාමික අයි.පී.පී බලාගාර තුනේ කල් ඉකුත් වූ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් දීර්ඝ කිරීම සඳහා ලංවිම මහජන උපයෝගීතා කොමිසම වෙතින් අනුමැතිය ඉල්ලා ඇති අතර අනුමැතිය සඳහා ඔවුන් වෙත දීර්ඝ කරන ලද බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් ඉදිරිපත් කර ඇත.<br><br>ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය යටතේ කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් ජනන ධාරිතාවක් ඇති බවට සහතික වීමේ ලංවිම වගකීමට (සම්ප්‍රේෂණ බලපත්‍රයක් දරන්නෙකු වශයෙන්) අනුකූල වීමට ලංවිමට මෙම බලාගාරවල බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් දීර්ඝ කිරීමට සිදු විය. කිසියම් විදුලි කප්පාදුවක් පනවනු ලැබුවහොත්, කර්මාන්ත/හෝටල් සහ වාණිජ ගොඩනැගිලි සඳහා සපයනු නොලබන බලශක්තිය හේතුවෙන් ආර්ථිකයට සිදුවන බලපෑම පිළිබඳව ලංවිම තවදුරටත් සලකා බලා ඇත. ලංවිම අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව එය සිදු කර ඇත. |

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ | පිළිතුරු |
|---|---|---|
| (ii) 28 (3) වගන්තිය | පනතේ නිශ්චිතව දක්වා ඇති පරිදි මණ්ඩලය විසින් පාරිභෝගික තැන්පතු සඳහා පොලී ගෙවා හෝ ඒ සඳහා ගිණුම් පොත්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලද අනුපාතය මත පදනම්ව විගණනය විසින් කරන ලද ගණනය කිරීම්වලට අනුව, ඒ සඳහා ගෙවිය යුතු පොලිය රු. මිලියන 976 ක් වූ අතර ඒ අනුව 2022 දෙසැම්බර් 31 වන දිනට නොගෙවූ සමුච්චිත පොළිය රු. බිලියන 9.06 ක් විය. | 2023 ජූනි 20 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ අංක 23.09.251 දරන තීරණයට අනුව, තොග පාරිභෝගිකයින් සහ සිල්ලර පාරිභෝගිකයින් සඳහා පොළී ගෙවීම 2023 පෙබරවාරි 15 දින සිට ක්‍රියාත්මක වේ. 2023 පෙබරවාරි 15 සිට 2023 ජූනි 30 දක්වා කාල සීමාව සඳහා ආරක්ෂක තැන්පතුවට අදාළ මාසික පොලිය තොග පාරිභෝගිකයින්ගේ 2023 ජූලි විදුලි බිලට බැර කර ඇත.<br><br>සිල්ලර පාරිභෝගිකයින් සඳහා පොළිය 2024 ජනවාරි සිට පාරිභෝගිකයාගේ සත්‍යාපිත විදුලි ගිණුමට වාර්ෂිකව බැර කරනු ලැබේ. 2023 පෙබරවාරි 15 සිට 2023 දෙසැම්බර් 31 දක්වා ගෙවිය යුතු පොලිය සඳහා ප්‍රතිපාදන සලසනු ඇත. |
| (ආ) 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13(1)(ඇ) (ස) (ආ) වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද විදුලි සම්ප්‍රේෂණ සහ තොග සැපයුම් බලපත්‍රයේ 30 වන කොන්දේසියේ 10 වන උපවගන්තිය | කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව, සමාලෝචිත වර්ෂය තුළදී ජනවාරි 06 සිට අප්‍රේල් 04 දක්වා වූ දින 11 ක් ඇතුළතදී පැය 9 යි විනාඩි 30 ක කාලයක් විදුලිය අත්හිටුවීමට මණ්ඩලය විසින් කටයුතු කර තිබුණි. | ලංවිම සහ අයි.පී.පී තාප බලාගාරවල ඉන්ධන හිඟය, ජල සීමා කිරීම් සහ ගල් අඟුරු බලාගාර ඇනහිටීම් හේතුවෙන් 2022 ජනවාරි 03 වන දින සිට ඉල්ලුම කළමනාකරණයේ අවශ්‍යතාවය ලංවිම හඳුනාගෙන ඇත.<br><br>ලංවිම දෛනික ඉල්ලුම් කළමනාකරණ කාලසටහන් අවශ්‍ය විටෙක කල්තියා ඉදිරිපත් කර ඇත. එම කාලසීමාව තුළ මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ලංවිම ඉල්ලුම කළමනාකරණය කර ඇත.<br><br>කෙසේ වෙතත්, අනපේක්ෂිත විදුලි ජනක යන්ත්‍ර බිඳවැටීම් සහ සම්ප්‍රේෂණයේ තාක්ෂණික සීමා කිරීම් හේතුවෙන්, සමස්ත පද්ධතියේ ස්ථායිතාව පවත්වා ගැනීම සඳහා manual load shedding සිදු කිරීමට ලංවිමට සිදුව ඇත. |
| (ඇ) 2021 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත | | |

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ | පිළිතුරු |
|---|---|---|
| (i) 3.5 වගන්තිය | 2022 දෙසැම්බර් 31 දින වන විට රේඛීය අමාත්‍යාංශයට මුදා හරින ලද සේවකයින් 33 දෙනෙකුට වැටුප් සහ දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය විසින් රු. මිලියන 51.91 ක් ගෙවා තිබුණි. ඒ අනුව, 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා පමණක් නිදහස් කරන ලද සේවකයින් සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් රු. මිලියන 236.26 ක් මණ්ඩලයට ප්‍රතිපූරණය කළ යුතුය. | ලංවිමට රේඛීය අමාත්‍යාංශය විසින් සිය සේවකයන් අමාත්‍යාංශය වෙත මුදාහරින ලෙස කරන ලද ඉල්ලීම් අත්හිටුවීමට හැකියාවක් නොමැති අතර මේ සම්බන්ධයෙන් දරන වියදම් ලංවිම පාලනය කළ නොහැක. කෙසේ වෙතත්, අමාත්‍යාංශයට මුදාහරින ලද සේවකයින්ගේ වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ සම්බන්ධයෙන් ලංවිම විසින් දරන ලද වියදම් ප්‍රතිපූරණය කරන ලෙස ඉල්ලමින් ලංවිම සාමාන්‍යාධිකාරීවරයා විසින් විදුලිබල අමාත්‍යාංශයට ලිපියක් යවා ඇත. |
| (ii) 6.6 වගන්තිය | 2022 වර්ෂය සඳහා වූ මණ්ඩලයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා වන කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ මෘදු පිටපතක් 2023 ජූනි 27 වැනි දින රජයේ විගණන ශාඛාවේ විගණන අධිකාරී වෙත යොමු කර ඇත. |
| (iii) 7.7 වගන්තිය | අවම වශයෙන් කාර්තුමය වශයෙන් පරිපාලිත ආයතනවල කාර්ය සාධනය පිළිබඳව සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට භාරකාර රාජකාරියක් තිබුණද, 2023 අප්‍රේල් මාසය අවසන් වන විටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පරිපාලිත ආයතන සමාලෝචන කිරීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ඉහත මාර්ගෝපදේශයේ 2.2.5 වගන්තියට අනුව (අයතනයේ පරිපාලිත සමාගම් සමඟ සබඳතා කළමනාකරණය කිරීම), ලාභාංශ, ස්කන්ධයේ වෙනස්වීම්, කොටස් හිමිකම සහ ප්‍රධාන ගනුදෙනු ඇතුළු ගැටළුවලට විසඳුම් සපයන අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත පරිපාලිත ප්‍රතිපත්තියක් තිබීම අනිවාර්ය බව අධ්‍යක්ෂ මණ්ඩලය නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, නියාමන සහ නීතිමය රාමුව තුළ පරිපාලිත සමාගම්වල කටයුතු සමාලෝචනය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය භාරගත යුතුය.<br><br>විගණකාධිපතිවරයා විසින් විදුලිබල මණ්ඩලයේ පරිපාලිත ප්‍රතිපත්තිය පිළිබඳ තොරතුරු ඉල්ලා ඇති නමුත් එවැනි අනුමත ප්‍රතිපත්තියක් දැනට නොමැති බව සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයට දන්වා ඇත. විදුලිබල ක්ෂේත්‍රයේ යෝජිත ආයතනික ප්‍රතිසංස්කරණවලට අනුව, ලංවිම කොටස් කිරීම ආරම්භ වනු ඇති බවත් ලංවිම ව්‍යාපාර භාර ගැනීම සඳහා සමාගම් පනත යටතේ නව ස්වාධීන සමාගම් ස්ථාපිත වනු ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය අවධාරණය කර ඇත. යෝජිත ප්‍රතිසංස්කරණ සාක්ෂාත් කර ගැනීමෙන් පසු විදුලිබල ක්ෂේත්‍රයේ සියලු අංශ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නව විදුලි පනතක් සම්පාදනය වනු ඇත. එබැවින්, සාකච්ඡාවෙන් පසුව, ලංවිම ආයතනික පරිවර්තනයක ක්‍රියාවලියක යෙදී සිටින බැවින් ඉහත (I) ඡේදයේ සඳහන් පරිදි පරිපාලිත ප්‍රතිපත්තියක් සැකසීම මෙම අවස්ථාවේදී අවශ්‍ය නොවන බව මණ්ඩලය තීරණය කර ඇත. |

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ | පිළිතුරු |
|---|---|---|
| (ඈ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනතේ 47 වන වගන්තිය සහ කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් 2015 සැප්තැම්බර් 12 දිනැති සිය ලිපියෙන් විගණකාධිපතිවරයා වෙත කරන ලද පැහැදිලි කිරීම | ප්‍රතිපාදනයට පටහැනිව, ඉපැයීම් ගණනය කිරීමේදී රදවා ගැනීමේ දීමනාව, පශ්චාත් උපාධි දීමනාව සහ වෘත්තීය දීමනාව /අර්ධ වෘත්තීය දීමනාව යන දීමනා අතුරින් ඉහළම දීමනාව මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන තිබුණි. | 1958 අංක 15 දරන අර්ථසාධක අරමුදල් පනතේ 47 වැනි වගන්තියේ (f) උපවගන්තියේ සේවක අර්ථසාධක අරමුදල සඳහා ගෙවිය යුතු මුදල ගණනය කිරීම සඳහා ''නියම කළ හැකි වෙනත් ආකාරයේ වැටුප්'' භාවිතා කළ හැකි බව සඳහන් වේ. මෙම වගන්තියට අනුකූලව, සේවක අර්ථසාධක අරමුදල සඳහා ඉපැයීම් ගණනය කිරීමේදී රදවා ගැනීමේ දීමනාව, පශ්චාත් උපාධි දීමනා ගෙවීම් හෝ වෘත්තීය දීමනාව / අර්ධ වෘත්තීය දීමනා අතුරින් ඉහළ දීමනාව සලකා බැලීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. ඒ අනුව මෙය නීතියට පටහැනි නොවේ. |
| (ඉ) 2007 ජනවාරි 10 දින වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම සමග එළඹි විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුමේ 6.1.3 වගන්තිය | කිලෝවොට් 220 ක ධාරිතාවක් යටතේ සපයන විදුලිබලයට අදාළ වන නියම හා කොන්දේසි නොමැති නම්, කිලෝවොට් 220 ක ධාරිතාවක් යටතේ මණ්ඩලය විසින් වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගමට සපයනු ලබන විදුලිබල ශක්තිය, විදුලිබල පිරිවැය යටතේ අය කර යුතු වේ. කෙසේවෙතත්, ධාරිතා ගාස්තුව සහ අනෙකුත් ගාස්තු නොසලකා සමාගමට මණ්ඩලය විසින් සපයනු ලබන විදුලිබල ශක්තියේ අනුපාතය ගණනය කිරීම සඳහා මණ්ඩලය විසින් බලශක්ති ගාස්තුව පමණක් සැලකිල්ලට ගෙන තිබුණි. | වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගමේ කෙරවලපිටිය බලාගාරය 220 නඩ වෝල්ටීයතා මට්ටමින් ලංවිම ජාලයට සම්බන්ධ කර ඇති අතර එම වෝල්ටීයතා මට්ටමින් විදුලි මිනුම් පද්ධතිය සවි කර ඇත. 2021-12-16 දිනැති අතිරේක සාමාන්‍යාධිකාරී (ඩීඩී 2) ලිපිය මගින් වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම සම්ප්‍රේෂණ පාරිභෝගිකයෙකු ලෙස සලකා බැලීමට පියවර ගන්නා ලෙස ඉල්ලා ඇත.<br><br>2014-11-12 දිනැති අතිරේක සාමාන්‍යාධිකාරී (ආයතනික උපායමාර්ග) ලිපිය අනුව විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුමේ 6.1.3 වගන්තියට අනුව ලංවිමෙන් පරිභෝජනය කරන විදුලිය හිලව් කිරීම, වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගමට ගෙවිය යුතු බලශක්ති ගාස්තුවෙන් පමණක් සිදු කළ හැක. එම විධානයට අනුව, 2014 ඔක්තෝබර් මාසයේ සිට වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම ලබා ගන්නා බලශක්තියේ වටිනාකම ලංවිම විසින් හිලව් කර ගැනීම ආරම්භ කර ඇත.<br><br>සැසඳීමට අනුව, හිලව් කිරීමේ ක්‍රමයෙන් ලංවිම විසින් වෙස්ට් කෝස්ට් වෙත අය කරන මුදල, අදාළ මුළු කාලය සඳහා ෂ3 ගාස්තු ක්‍රමයේ මුදලට වඩා වැඩිය.<br><br>විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුමේ යටතේ සමාගමට ගෙවනු ලබන ධාරිතා ගාස්තුව, ණය සේවාවල පිරිවැය සහ බලාගාරයේ වාර්ෂික ඉලක්ක ධාරිතාවට අදාළව ස්කන්ධය මත ප්‍රතිලාභ මත පදනම් වේ. සමාගම විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුමේ යටතේ විස්තර කර ඇති අවම ක්‍රියාකාරී පිරිවිතරයන්ට අනුකූල වීමට අපොහොසත් වුවහොත් පමණක් ධාරිතා ගාස්තුව සීමා කළ හැක. සමාගමේ පැහැර හැරීම් මත පදනම්ව ද්‍රවශීලතා හානි යෙදීමෙන් ධාරිතා ගාස්තුව සීමා කිරීමට විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුමෙන් ප්‍රතිපාදන ලබා දී ඇත. විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම යටතේ ව්‍යුත්පන්න වූ ධාරිතා ගාස්තුව, තොග සැපයුම් සම්බන්ධතා යටතේ අය කෙරෙන නඩ මත පදනම් නොවේ.<br><br>සමාගම ලබා ගන්නා බලශක්ති සඳහා ධාරිතා ගාස්තුව අඩු කිරීමෙන් සමාගම සමඟ ආරවුලක් ඇති වනු ඇති අතර ජාත්‍යන්තර බේරුම්කරණයට එය මඟ පාදනු ඇත. බේරුම්කරණය යටතේ දුර්වල තර්ක ලංවිමට අහිතකර ලෙස බලපානු ඇති අතර එම බේරුම්කරණ පිරිවැයට පොලිය සමඟ පැහැර හරින ධාරිතා ගාස්තු ගෙවීමට සිදු විය හැක. |

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ | පිළිතුරු |
|---|---|---|
| (ඊ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2018 ජූලි 18 දිනැති අංක 03/2018 දරන චක්‍රලේඛය සහ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 9.1 වගන්තිය | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන විශ්‍රාමික සේවකයින් දෙදෙනෙකු මණ්ඩලයේ උපදේශකයින් ලෙස පත් කර තිබූ අතර ඔවුන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා උපදේශන ගාස්තු ලෙස රු. මිලියන 1.2 ක මුදලක් ගෙවා තිබුණි. | 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 13 වැනි වගන්තිය අනුව, ''මණ්ඩලයට වරින් වර ඉංජිනේරුවන් ලෙස සුදුසුකම් ලත් පුද්ගලයින් මණ්ඩලයට උපදේශකයින් ලෙස පත් කර ඔවුන්ට සුදුසු යැයි සිතන පරිදි වේතනයක් ගෙවිය හැකිය.'' ඒ අනුව, මණ්ඩලයට උපදේශකයින් ලෙස විශ්‍රාමික ඉංජිනේරුවන් දෙදෙනෙකු මණ්ඩලය විසින් පත් කර ඇත. |
| (උ) 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායක බදු පනතේ V වන කොටසෙහි 17 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ සිව්වන කාර්තුව සඳහා ලංකා විදුලි සමාගමට විදුලිය සැපයීමේදී අය කරන ලද රු. මිලියන 223.31 ක සමාජ ආරක්ෂණ දායක බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත 2023 අප්‍රේල් මාසය අවසන් වන විටත් ගෙවා නොතිබුණි. | පිළිතුර ඇමුණුම-01 හි අමුණා ඇත. |
| (ඌ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාරිභෝගික සේවා) විසින් නිකුත් කරන ලද 1998 මාර්තු 31 දිනැති ඩීජීඑම්(සීඑස්)/චක්‍රලේඛ අංක 1998-4 | විසන්ධි කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත, නීතිමය අංශය මගින් හිඟ ණයගැති ශේෂය අයකර ගැනීමට නීතිමය පියවර ගත යුතුය. කෙසේ වෙතත්, නියදි විගණන පරීක්ෂණයට අනුව, කොළඹ නගර කලාපයට අදාළව එකතුව රු. මිලියන 272.15 ක් වූ හිඟ ණයගැති (අවසන් කළ) ශේෂය අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | විදුලිය විසන්ධි කිරීමෙන් පසු හිඟ අවසන් කළ ණයගැතියන් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බව සඳහන් වේ. කෙසේ වෙතත්, යම් යම් හේතු නිසා නීතිමය පියවර ගැනීම ප්‍රමාද වී ඇත. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාරිභෝගික සේවා) විසින් නිකුත් කරන ලද 1998 මාර්තු 31 දිනැති DGM(CS)/ චක්‍රලේඛ අංක 1998-4 පිළිපදින ලෙස වගකිවයුතු නිලධාරීන්ට උපදෙස් දී ඇත. |
| (එ) 1998 මාර්තු 08 දිනැති අංක 130 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සියයට 10 සිට සියයට 14 දක්වා වූ පරාසයක පොලී අනුපාත යටතේ වාහන ණය ලබා දිය යුතුය. කෙසේවෙතත්, මණ්ඩලයේ ද්‍රවශීලතා ගැටලු සලකා බැලීමකින් තොරව මණ්ඩලය විසින් සියයට 4.2 ක පොලී අනුපාතයක් යටතේ වාහන ණය එහි සේවකයන් වෙත ලබා දී තිබුණි. | 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතට අනුව මණ්ඩලයේ බලතල 12 වැනි වගන්තිය යටතේ ලැයිස්තුගත කර ඇත.<br><br>12 (m) වැනි වගන්තිය: මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් නීති රීති සැකසීම<br><br>12 (n) වැනි වගන්තිය: මණ්ඩලයේ මතය අනුව එහි ව්‍යාපාරය නිසි ලෙස පවත්වාගෙන යාමට පහසුකම් සැලසීමට අවශ්‍ය අනෙකුත් සියලුම දේ කිරීමට<br><br>ඒ අනුව, සඳහන් කරන ලද නිරීක්ෂණ, ආයතනයේ අභිවෘද්ධිය සඳහා ක්‍රියා කිරීමට ඔවුන් පෙළඹවීම සඳහා මණ්ඩලය විසින් එහි සේවකයින්ට ලබා දෙන ප්‍රතිලාභවලට අදාළ වේ. තවද, මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් නීති රීති සෑදීමේ බලය මණ්ඩලයට මෙම පනත මගින්ම සපයයි. |

**2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.**

**(අ) "ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ට දීමනා ගෙවීම" යන මාතෘකාව යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2007 ඔක්තෝබර් 31 දිනැති අංක 07/1955/332/045 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය, 2008 මාර්තු 31 දිනැති ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභා වාර්තාව සමඟ 2008 අප්‍රේල් 09 දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලා තිබුණු අතර අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් 2008 මාර්තු 31 දිනැති වාර්තාවේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව මේ සම්බන්ධයෙන් පත් කරන ලද කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.**

**(i) එකී අමාත්‍ය මණ්ඩලය තීරණයට පටහැනිව, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද දීමනා ලැයිස්තුවට ඇතුළත් කර නොතිබූ ඉංජිනේරු දීමනාව, දිරි දීමනාව, තාවකාලික දීමනාව, සුදුසුකම් පදනම් කරගත් දිරි දීමනාව, ඕ.එච් සහ එස් දිරි දීමනාව, කාර්ය මණ්ඩල දීමනාව, සම්ප්‍රේෂණ සහ ජනන සැලසුම් දීමනාව, පද්ධති පාලන දීමනාව, දෙමළ භාෂා දීමනාව සහ වෙනත් දීමනා මණ්ඩලයේ අදාළ සේවකයන්ට ගෙවා තිබුණි. සිදු කරන ලද නියදි විගණන පරීක්ෂණයට අනුව, 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ 2018 ජූලි 18 දිනැති අංක 3/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2022 වර්ෂය සඳහා ඉහත දීමනා ලෙස රු. මිලියන 417.65 ක් ගෙවා තිබුණු බව හෙළිදරව් විය.**

2022 ජූලි 27 දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්ය මණ්ඩල දීමනා වැටුපෙන් සියයට 65 කට සීමා කිරීමට මණ්ඩලය තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් චක්‍රලේඛයක් නිකුත් කර ඇත.

**(ii) එකී අමාත්‍ය මණ්ඩලය තීරණයට පටහැනිව, වෘත්තීය දීමනාවට හිමිකම් කියන නිලධාරීන්ට රඳවා ගැනීමේ දීමනාව ගෙවනු ලැබේ. ඒ අනුව, දීමනා දෙකම එනම් රඳවා ගැනීමේ දීමනාව සහ වෘත්තීය දීමනාව අදාළ නිලධාරියාට ගෙවනු ලැබේ. 2022 ජූනි මාසය සඳහා පමණක් වෘත්තීය දීමනාවට හිමිකම් කියන නිලධාරීන් 487 දෙනෙකුට රඳවා ගැනීමේ දීමනාව ලෙස රු. මිලියන 11.99 ක් ගෙවා තිබුණු බව නියදි විගණන පරීක්ෂණයෙන් හෙළිදරව් විය.**

2022 ජූලි 27 දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්ය මණ්ඩල දීමනා වැටුපෙන් සියයට 65 කට සීමා කිරීමට මණ්ඩලය තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් චක්‍රලේඛයක් නිකුත් කර ඇත.

**(iii) නිලධාරීන් 136 දෙනෙකුට දීමනා වශයෙන් 2022 ජූනි මාසය සඳහා පමණක් ඔවුන්ගේ වැටුපෙන් සියයට 65 ක් ඉක්මවා රු. මිලියන 3.65 ක් ගෙවා තිබූ බව නියදි විගණන පරීක්ෂණයෙන් හෙළිදරව් වූ අතර එය එකී අමාත්‍ය මණ්ඩලය තීරණයට පටහැනි විය. තවද, එකී අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව, යම් තනතුරක් විසින් ඉටු කරනු ලබන රාජකාරිවලට අදාළව දීමනා කිහිපයක් ගෙවනු ලැබේ. ඒ අනුව, මෙම දීමනා වෙනුවෙන් 2022 ජූනි මාසය සඳහා පමණක් එකතුව රු. මිලියන 21.67 ක් ගෙවා තිබුණු බව හෙළිදරව් විය.**

2022 ජූලි 27 දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්ය මණ්ඩල දීමනා වැටුපෙන් සියයට 65 කට සීමා කිරීමට මණ්ඩලය තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් චක්‍රලේඛයක් නිකුත් කර ඇත.

**(iv) එකී අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව, 2008 අප්‍රේල් 01 දිනෙන් පසුව බඳවා ගන්නා ලද සේවකයින් සඳහා කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා ක්‍රමයක් හඳුන්වා දීම වෙනුවට අනුමත දීමනා 25 ක් ගෙවනු ලැබේ.**

2022 ජූලි 27 දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්ය මණ්ඩල දීමනා වැටුපෙන් සියයට 65 කට සීමා කිරීමට මණ්ඩලය තීරණය කර ඇත. මේ සම්බන්ධයෙන් චක්‍රලේඛයක් නිකුත් කර ඇත.

**(ආ) වැටුප් සංශෝධනය කරන අවස්ථාවකදී 2007 දෙසැම්බර් 13 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති තීරණය සහ 2015 මැයි 20 වන දින එළඹී සාමූහික ගිවිසුම අනුව, උපයන විට ගෙවන (PAYE) බදු/ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) වගකීම මණ්ඩලයේ සේවකයින් වෙත මාරු කිරීමට තීරණය කර තිබුණි. කෙසේවෙතත්, 2010 සිට 2020 දක්වා කාල සීමාව තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ඉහත තීරණවලට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 3/2016 දරන චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව අදාළ සේවකයින්ගේ වැටුපෙන් අඩු නොකර මණ්ඩලය විසින් සිය අරමුදලෙන් රු. බිලියන 4.98 ක PAYE/ APIT බදු ගෙවා තිබුණි. කෙසේ වෙතත්, මෙම ගෙවීම හේතුවෙන් මණ්ඩලයට සිදුවූ පාඩුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ සේවකයින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.**

2020 නොවැම්බර් මාසයේ සිට, අත්තිකාරම් පුද්ගලික ආදායම් බද්ද (APIT) ලංචිම සේවකයින් විසින් ගෙවනු ලැබේ.

**(ඇ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 24 (1) (ඇ) වගන්තිය අනුව විදුලි බලය සඳහා සාධාරණ ලෙස කලින් සිතා ගත් ඉල්ලුම සපුරාලීමට උත්පාදනය කිරීමේ පිරියතෙන් ලබා ගත හැකි ප්‍රමාණවත් ධාරිතාවක් ඇති බවට සහතික වීමට මණ්ඩලය හැකි විය යුතුය. 2018 - 2037 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2018, 2019, 2020 සහ 2021 වර්ෂයන් තුළදී පිළිවෙලින් එකතුව මෙගාවොට් 500 ක, මෙගාවොට් 657 ක,**

**මෙගාවොට් 430 ක සහ මෙගාවොට් 445 ක ධාරිතාවයකින් යුත් නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කරන ලද මෙගාවොට් 2,032 ක නව ධාරිතාවයෙන් එකතුව මෙගාවොට් 661.6 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එසේම, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද විදුලිබල කර්මාන්තය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය මත පදනම්ව 2022 - 2041 අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම සඳහා 2021 ඔක්තෝබර් 05 දින මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් කොන්දේසි සහිත අනුමැතිය ලබා දී තිබුණි. කොන්දේසි සහිතව අනුමත කරන ලද 2022 - 2041 අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, 2022 වර්ෂයේදී මෙගාවොට් 544 ක පුනර්ජනනීය බලශක්ති ධාරිතාවක් එකතු කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, එකතුව මෙගාවොට් 211 ක ධාරිතාවයකින් යුත් නව පුනර්ජනනීය බලශක්ති බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි. එම නිසා, නව විදුලි ජනන බලාගාර ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සැලකිය යුතු ලෙස අඩු වී තිබුණු අතර සැලසුමේ අරමුණ වූ අඩු පිරිවැයකින් යුත් විදුලි බලය සැපයීම ඉටු කර ගැනීමට නොහැකි වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය තුලදී රු. බිලියන 5.07 ක් වටිනා ගිගාවොට් පැය 60.33 ක අතිරේක විදුලිබලයක් ලෙස මිලදී ගැනීමට සිදු වී තිබුණි.**

2022 වර්ෂය තුළ එකතුව මෙගාවොට් 216 ක ධාරිතාවකින් යුත් පුනර්ජනනීය බලශක්ති බලාගාර ක්‍රියාත්මක කර ඇත. 2030 වන විට සියයට 70 ක පුනර්ජනනීය බලශක්තිය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රතිපත්ති ඉලක්කයක් අපේක්ෂා කරමින් දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මේ අනුවාදය, 2023-2042 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට යාවත්කාලීන කර ඇත. 2023-2042 දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්ම, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇත. සාරාංශයක් ලෙස 2 ෦ මෙගාවොට් 350 ක ඒකාබද්ධ චක්‍රීය බලාගාර, මෙගාවොට් 230 ක ගෑස් ටර්බයින බලාගාර සහ මෙගාවොට් 200 ක ගෑස් එන්ජින් බලාගාරය 2027 වසර වන විට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වේ. සූර්ය, සුලං, කුඩා ජලවිදුලි සහ ජෛව ස්කන්ධය බලාගාර වැනි පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් මෙගාවොට් 3,335 ක විශාල ධාරිතාවක් එකතු කිරීම ඉදිරි වසර 5 තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වේ. මීට අමතරව, උපයෝගිතා පරිමාණයේ බැටරි ගබඩා කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන අතර පළමු පොම්ප කරන ලද ජල ව්‍යාපෘතියට අදාළ අධ්‍යයනයන් ඉදිරි වසර පහ තුළ සිදු කිරීමට නියමිතය.

**2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඟ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.**

**(අ) 2018-2037 දීර්ඝකාලීන විදුලි ජනන සැලැස්මට අනුව, සීතාව ගඟ ජල විදුලි ව්‍යාපෘතිය 2022 වන විට ක්‍රියාත්මක කළ යුතුව තිබුණු අතර මූලික කටයුතු සඳහා 2020 වර්ෂය අවසන් වන විටදී රු. මිලියන 301.19 ක වියදමක් දරා තිබුණි. කෙසේ වෙතත්, අරමුදල් ගැටළු හේතුවෙන් ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට සහ මෙම ව්‍යාපෘතිය සී ස ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්.) සමාගම හරහා සංවර්ධනය කිරීමට 2020 දෙසැම්බර් 20 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, 2023 අප්‍රේල් මාසය අවසන් වන විටත් අදාළ සමාගම සමඟ සාකච්ඡා කර ගැටලුව නිරාකරණය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එබැවින්, මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම අනාර්ථික වියදමක් බවට පත් වී ඇති බව නිරීක්ෂණය විය.**

දරන ලද වියදම් කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර ඇති අතර එය විගණන කමිටුව විසින් සමාලෝචනය කර ඇත. ව්‍යාපෘතියේ ඇති කරන ලද වත්කම් ක්‍රියාත්මක කිරීමේ අයිතිය සලකා සාධාරණ මිලකට ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්.) සමාගම සමඟ සාකච්ඡා කර එම මුදලින් ලංවිම ආයෝජනය වැඩි කිරීමට විගණන කමිටුව නිර්දේශ කර ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ පෙර සහ වත්මන් අදියර අතර මූලධර්මවල සැලකිය යුතු වෙනස්කම් විගණන කමිටුවට අවධාරණය කරන ලද අතර, ව්‍යාපෘති අතර සංකල්පවල මූලික වෙනස්කම් හේතුවෙන් ලංවිම විසින් දරන ලද පිරිවැය ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්.) සමාගම වෙත පැවරීම ශක්‍ය නොවන බව අවධාරණය කර ඇත. එබැවින්, දරන ලද වියදම් කපා හැරීම සඳහා අනුමැතිය ඉල්ලා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස විගණන කමිටුව නියම කර ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසු මෙම මුදල මූල්‍ය ප්‍රකාශනවලින් කපා හරිනු ඇත.

**(ආ) නියමිත වේලාවට ගෙවීම් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් පිළිවෙළින් විදුලිය මිලදී ගැනීම් සහ ඉන්ධන මිලදී ගැනීම් (සී.පී.සී) සඳහා ප්‍රමාද පොලිය ලෙස සමාලෝචිත වර්ෂය තුළදී පිළිවෙලින් රු. බිලියන 6.55 ක් සහ රු. බිලියන 8.92 ක මුදලක් දරා තිබුණි. තවද, දේශීය බැංකු ණය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ණය වාරික ගෙවීම ප්‍රමාද කිරීම හේතුවෙන් රු. මිලියන 11.17 කට සමාන මුදලක් පැහැර හැරීමේ පොලී ලෙස ද දරා තිබුණි.**

වසර ගණනාවක් පුරා පිරිවැය පරාවර්තක විදුලි ගාස්තු ක්‍රමයක් නොලැබීම හේතුවෙන් 2016 වසරේ සිට ලංවිම විශාල අලාභයන් ලබා ඇත. එබැවින්, ඉන්ධන සඳහා ගෙවීම් ඇතුළුව සියලුම මුදල් ගෙවීම් සපුරාලීම සඳහා ලංවිම ද්‍රවශීලතාවය අතින් ඉතා අසීරු තත්ත්වයක සිටී. කෙසේ වෙතත්, ලංවිම 2022 පෙබරවාරි දක්වා නියමිත ගෙවීම් කර ඇති අතර වසර ගණනාවක් තිසසේ මෙම ප්‍රමාද වූ පොලී සංරචකය සපුරාලීම සඳහා මහා භාණ්ඩාගාරය වෙනම අරමුදල් ලබා දී ඇත. තවද, 2023.06.26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී 2023.04.30 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු මුදල් භාණ්ඩාගාරයට භාර ගැනීමට තීරණය කර ඇත. අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශය අනුව 2023 අප්‍රේල් 30 දිනට ලංවිම ගෙවිය යුතු රු. බිලියන 84.3 ක් (ඉන්වොයිස් වටිනාකම සහ ප්‍රමාද වූ පොලී) ලංවිමට ස්කන්ධ ආයෝජනය ලෙස හිලව් කරනු ඇත.

තවද, ලංවිම ඉහල පොලී අනුපාතයක් යටතේ අයිරාවක් මත ක්‍රියාත්මක වන අතර එය ණය ආපසු ගෙවීම සඳහා වන රු. මිලියන 11.17 ක ඉහත පැහැර හැරීමේ පොලියට ඇතුළත් පොළිය හා ප්‍රමාද පොලිය හා සැසඳීමේදී අතිශයින් ඉහළ අගයක් ගනී.

**(ඈ) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතට අනුව, 2013 අගෝස්තු 06 න් පසුව සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කළ යුතුය. කෙසේ වෙතත්, කිලෝවොට් පැයට රු. 36.20 ක ගාස්තුවක් යටතේ (වසර 20 ක් සඳහා ස්ථාවර ගාස්තුව) අපද්‍රව්‍ය බලශක්තියට හැරවීමේ තාක්ෂණය මත පදනම්ව ක්‍රියාත්මක කිරීමට නියමිත නාගරික ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාර පහක් සඳහා 2017 දී අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද පරිදි, මුළු ගාස්තු වන කිලෝවොට් පැයට රු.36.20 න් රු.13.10 ක් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කළ යුතුය. ඒ අනුව, එක් ඝන අපද්‍රව්‍ය විදුලි බලාග ාරයක් සඳහා විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම 2020 දෙසැම්බර් මාසයේදී ස්වාධීන බලශක්ති නිෂ්පාදකයෙකු සමග අත්සන් කරන ලද අතර කිලෝවොට් පැයකට මුළු ගාස්තුව රු. 36.20 ක් මණ්ඩලය විසින් දරා තිබුණි. කෙසේවෙතත්, කිලෝවොට් පැයකට රු.13.10 ක් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කර නොතිබුණි. එබැවින්, 2022 දෙසැම්බර් 31 දිනට මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුළු මුදල රු. බිලියන 1.85 ක් විය.**

2017-02-21 දින අමාත්‍ය මණ්ඩලය විසින් නාගරික ඝන අපද්‍රව්‍ය පිරිසැකසුම් කිරීම තුළින් ජනනය කරන විදුලිය සඳහා කිලෝවොට් පැයකට රු. 36.20 ක් අනුමත කර තිබුණි. රට තුළ ජනනය වන අපද්‍රව්‍ය ඵලදායී ලෙස බැහැර කරන හෝ විනාශ කරන පරිසර හිතකාමී අපද්‍රව්‍ය පිරිසැකසුම් පහසුකම් ක්‍රියාත්මක කිරීමේ ජාතික අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, 2017-07-24 දින, අපද්‍රව්‍ය බලශක්තියට හැරවීමේ තාක්ෂණය මත පහත සඳහන් සංවර්ධකයින් සමඟ ප්‍රමිතිගත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමට ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.

- KCHT ලංකා ජෑන්ග් (පුද්ගලික) සමාගම
- ෆෙයාර්වේ හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම
- වෙස්ටර්න් පවර් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්
- සොල්වෙන්ටර් ලිමිටඩ්, ක්සෑජ ප්‍රයිවට් ලිමිටඩ් සහ රීසකල් එනර්ජ ප්‍රයිවට් ලිමිටඩ්

මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් වඩාත් සැලකිය යුතු ප්‍රතිචාරයක් දක්වන ලංසුකරු ලෙස ඉහත සමාගම් ලංසු තැබීමේ ක්‍රියාවලියක් හරහා තෝරාගෙන ඇත. කෙසේ වෙතත්, වෙස්ටර්න් පවර් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් පමණක් අද වන විට වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමට හැකි වූ අතර අනෙත් කිසිදු ව්‍යාපෘතියක් ඉදිකිරීම් මට්ටමේ හෝ නොමැත. ජාතික වැදගත්කම සැලකිල්ලට ගනිමින් පමණක් මෙම ව්‍යාපෘතියට පහසුකම් සැලසීමට ලංවිම සලකා බලා ඇති අතර අපද්‍රව්‍ය බලශක්තියට හැරවීමේ තාක්ෂණයට අදාළව අවසන් වරට අනුමත ගාස්තුවට සමාන ගාස්තුවක්, එනම් කිලෝවොට් පැයකට රු. 23.10 ක් ගෙවීමට පමණක් බැඳී ඇත. ඉතිරි මුදල වන කිලෝවොට් පැයකට රු. 13.10 ක් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කර ගත යුතුය. අද වන විට, මුළු මුදල රු. 1,913,129,240.00 ක් ප්‍රතිපූරණය කරන ලෙස භාණ්ඩාගාරයෙන් ඉල්ලා ඇතත් ලංවිමට කිසිදු මුදලක් ලැබී නැත. ලංවිම මුදල් නොගෙවීම හේතුවෙන් වෙස්ටර්න් පවර් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් විසින් කොළඹ මහ නගර සභාව වෙතින් ඝන අපද්‍රව්‍ය භාර ගැනීම නවතා දැමීම නිසා සාකච්ඡා/රැස්වීම් කිහිපයක් ද පවත්වා ඇත. මෙම ගැටළුව විසඳීම සඳහා නාගරික කොමසාරිස්, කොළඹ මහ නගර සභාව විසින් මුදල් ලේකම් වෙත ලිපි කිහිපයක් යවා ඇත, වගකීම භාර ගන්නා නමුත් වර්තමාන මූල්‍ය අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් මෙම වර්ෂය තුළ ඉහත මුදල මුදා හැරීමේ හැකියාවක් නොමැති බව 2023-04-11 වන දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇත.

**(ඇ) ඉහත සඳහන් කළ පරිදි, NCRE ව්‍යාපෘති සඳහා එකතුව මෙගාවොට් 390 ක ධාරිතාවයකින් යුත් ප්‍රසම්පාදන 7 ක් පමණක් 2021 දෙසැම්බර් 31 දින දක්වා ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත්, මෙම විදුලිබලාගාර අතුරින් 2022 දෙසැම්බර් 31 දිනට එකතුව මෙගාවොට් 81 ක ධාරිතාවයකින් යුත් විදුලි බලාගාර පමණක් ක්‍රියාත්මක කර තිබුණි.**

මේ වන විට එකතුව මෙගාවොට් 101 ක ධාරිතාවයක් යුත් බලාගාර ක්‍රියාත්මක කර ඇත.

ශ්‍රී ලංකා විදුලිබල පනතේ නව සංශෝධන සමඟ ප්‍රමිතිගත බලශක්ති මිලදී ගැනීමේ ගාස්තු යටතේ එකතුව මෙගාවොට් 86.8 ක (සූර්ය, සුළං, ජෛව ස්කන්ධ, කෘෂි අපද්‍රව්‍ය, නාගරික අපද්‍රව්‍ය, කුඩා ජලවිදුලි) ධාරිතාවයෙන් යුත් පුනර්ජනනීය බලශක්ති බලාගාර සඳහා ප්‍රමිතිගත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් 28 ක් අත්සන් කර ඇත.

**(ඉ) කොන්ත්‍රාත් මුදල රු. මිලියන 304.6 ක් වූ යෝජිත මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණයේ පයිලින් වැඩ සඳහා වන කොන්ත්‍රාත්තුව 2012 ඔක්තෝබර් 22 දින ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් මුදල රු, මිලියන 4,774.6 ක් වූ (වැට් බද්ද හැර) මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ සහ ඉදිකිරීම් දෝෂ නිවැරදි කිරීමේ කොන්ත්‍රාත්තුව 2021 අගෝස්තු 02 දින ප්‍රදානය කර තිබූ අතර ආරම්භ කළ දිනය 2021 අගෝස්තු 16 විය. ඉදිකිරීම් 2023 අගෝස්තු 15 වැනි දින අවසන් කළ යුතුය (ආරම්භ කළ දින සිට 730 කින්). යෝජිත මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණයේ මූලික ඇස්තමේන්තුගත පිරිවැය 2011 වර්ෂයේදී රු. මිලියන 1,000 ක් ලෙස ගණනය කර තිබූ අතර ප්‍රධාන වශයෙන් කොන්ත්‍රාත්තු දෙක අතර ඇති විශාල කාල පරතරය හේතුවෙන් එය 2021 අගෝස්තු 02 දිනට රු. මිලියන 5,079.2 ක් දක්වා (කොන්ත්‍රාත් දෙකේ සම්පූර්ණ මුදල) වැඩි වී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටදී ඉදිකිරීම් කටයුතු සඳහා රු. බිලියන 1.19 ක් මුදලක් වැය කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටදී ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 12.7 ක් පමණ විය. නව ගොඩනැගිල්ලක් 2023 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබියදී ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට පියවර නොගෙන, 2017 සිට 2022 දක්වා කාලය තුළදී පවතින ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු. මිලියන 319.19 ක මුදලක් මණ්ඩලය විසින් වැය කර ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.**

පයිලින් වැඩ සඳහා කොන්ත්‍රාත්තුව සියෙරා කන්ස්ට්‍රක්ෂන් ප්‍රයිවට් ලිමිටඩ් වෙත 2012-02-23 දින ප්‍රදානය කරන ලද අතර එය ආරම්භ කරන ලද දිනය 2012-03-12 විය. මූලස්ථාන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සන්කෙන් කන්ස්ට්‍රක්ෂන් ප්‍රයිවට් ලිමිටඩ් වෙත 2021.08.02 දින ප්‍රදානය කරන ලද අතර එය ආරම්භ කරන ලද දිනය 2021.08.16 විය. එබැවින්, මේවා විවිධ ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රදානය කරන ලද වෙනම කොන්ත්‍රාත් වැඩ දෙකකි.

පෙර උපදේශකයා විසින් 2015 දී සකස් කරන ලද ගොඩනැගිල්ලේ ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 2542 කි. 2019 මැයි 23 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් අමාත්‍ය මණ්ඩලයට දැනුම් දුන් පරිදි, 2018 දී එම උපදේශකයා විසින් පැවති වර්ග මීටර් 27,750 ක බිම් ප්‍රමාණය සඳහාම එකී ඇස්තමේන්තුව රු. මිලියන 3149 ක් දක්වා සංසෝධනය කර ඇත..

ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ අවශ්‍යතා සපුරාලීමට උපරිම භාවිතය සඳහා කාර්යාල අවකාශය වැඩි කිරීම සඳහා උපදේශක වශයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් අභ්‍යන්තර සැකැස්ම සංශෝධනය කර ඇත. එබැවින්, බිම් ප්‍රමාණය වර්ග මීටර් 6068 කින් වැඩි කර ඇත. එබැවින්, දැන් මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර් 33,818 කි. අමතර අවකාශ අවශ්‍යතා, විෂය පථයේ වෙනස්වීම් සහ සිදු වූ මිල උද්ධමනය හේතුවෙන් ඇස්තමේන්තුගත පිරිවැය වැඩි වී ඇත. මීට අමතරව, මෝටර් රථ ආරෝපණ පහසුකම්, මුදල් කවුන්ටර, ඹළු පහසුකම්, අභ්‍යන්තර පාටිෂන් සැකසීම, ශ්‍රවණාගාරයේ ගෘහභාණ්ඩ ආදියද එකතු විය. උපදේශක වශයෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් 2021 මාර්තු මාසයේදී සකස් කරන ලද අවසාන ඇස්තමේන්තුව රු. මිලියන 4910 ක් (උපදේශන ගාස්තු, හදිසි අවස්ථා සහ බදු හැර) විය.

කෙසේ වෙතත්, රු. මිලියන 4774 ක් වූ (උපදේශන ගාස්තු, හදිසි අවස්ථා සහ බදු හැර) අගයන ලද වටිනාකමකට ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට ලංවිම සමත් විය.

2022.12.31 දිනට භෞතික ප්‍රගතිය සියයට 11 ක් වන අතර බදු හැර මුළු මුදල වූ රු. 947,330,534.19 ක් 2022 දෙසැම්බර් 31 දක්වා ගෙවා ඇත. (අත්තිකාරම් ගෙවීම ඇතුළුව)

දැනට පවතින ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල දශක පහකට පමණ පෙර ඉදිකරන ලද අතර තවමත් ක්‍රියාත්මක වේ. CECB උපදේශකගේ නිර්දේශය පරිදි තවත් වසර විස්සක් ඔරොත්තු දීම සඳහා ගොඩනැගිල්ලේ වයස සමඟ දැනට පවතින ගොඩනැගිල්ල තුළ අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු කිහිපයක් සිදු කර ඇත. එබැවින්, දැනට පවතින ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම වෙනස් කටයුත්තක් වන අතර එය නාරාහේන්පිට නව ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ නොවේ.

**(ඊ) ඒකකයක (කිලෝවොට් පැයක) සාමාන්‍ය පිරිවැය රු. 33.65 ක් වන විට විශ්‍රාම ලත් ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින්ගේ බලාගාර තුනකින් සමාලෝචිත වර්ෂය තුළදී මිළදී ගත් බලශක්ති ඒකකයක පිරිවැය පිළිවෙලින් රු. 63.51 ක්, රු. 78.20 ක් සහ රු. 122.50 ක් විය. එම නිසා, අධික පිරිවැයකට හදිසි විදුලි බලාගාර භාවිතා කිරීම වෙනුවට තථ්‍ය කාලීන ඉල්ලුම සපුරාලීම සඳහා අවම පිරිවැය දීර්ඝකාලීන විදුලි ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව බලාගාර ක්‍රියාත්මක කළේ නම් බලශක්ති මිලදී ගැනීමේ අධික පිරිවැය අඩු කර ගැනීමට හැකිව තිබුණි.**

විශ්‍රාමික බලාගාර 03 ක ඒකක පිරිවැය

වසරේ මුල් මාස 04 තුළ වියළි කාලගුණ තත්ත්වයක් පැවතීම, පද්ධති ඉල්ලුම වැඩි වීම සහ එම කාලය තුළ ජල විදුලි ජනනය අවම බැවින් සියලුම තාප බලාගාර උපරිම බලාගාර සාධකයෙන් ක්‍රියාත්මක වේ. එබැවින් එම කාලය තුළ සියලුම තාප බලාගාරවල විදුලිය ජනනය කිරීමේ ඒකක පිරිවැය (ධාරිතා ගාස්තු සහ බලශක්ති ගාස්තු සැලකිල්ලට ගනිමින්) සාපේක්ෂව අඩුය. එමෙන්ම, වැසි සමය ආරම්භ වීමත් සමඟ පද්ධති ඉල්ලුම අඩු වන අතර ජල විදුලි බලාගාර උපරිම බලාගාර සාධකය යටතේ ක්‍රියාත්මක වන අතර තාප බලාගාර භාවිතා කිරීමේ අවශ්‍යතාවය අඩු වේ. එහිදී බලශක්ති ගාස්තුවට වඩා ඉන්ධන පිරිවැය අඩු වන අතර ධාරිතා ගාස්තුව ගෙවීමට සිදුවේ. එමෙන්ම රාත්‍රී උපරිම ඉල්ලුම සපුරාලීම සඳහා වර්ෂා කාලයේදී පවා මෙම බලාගාර භාවිතා කිරීමට සිදුවේ. වර්ෂයේ විවිධ කාලවලදී විදුලිය

මිලදී ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ඉහත සඳහන් ඕනෑම ජනන යන්ත්‍රයක විදුලිය නිපදවීමේ ඒකක පිරිවැය ඉහළ හෝ පහළ යනු ඇත.

ගිවිසුම් කාලය කල් ඉකුත් වූ ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්.) සමාගම, ඒස් පවර් ජෙනරේෂන් මාතර (පුද්.) සමාගම සහ ඒසියා පවර් (පුද්.) සමාගමේ බලාගාර වියළි කාලය තුළදී උපරිම බලාගාර සාධකය (සියයට 50 - සියයට 70) යටතේ අවම ඒකක පිරිවැයක් (කි.වො.පැය එකක් රු. 21.00 - රු. 25.00) පෙන්වා ඇත. කෙසේ වෙතත්, කදඩසා 19 බලපෑම හේතුවෙන් විදුලි ඉල්ලුම අඩුවීම සහ මෙහෙයුම් කාලය තුළ පැවති අධික වර්ෂාපතනය හේතුවෙන් වාලච්චේන බලාග ාරය සමස්තයක් ලෙස ඉතා අඩු බලාගාර සාධකයක් (සියයට 5.4) යටතේ ක්‍රියාත්මක විය. එබැවින් ඉහළ ඒකක පිරිවැයක් පෙන්නුම් කරමින් මෙම තාප බලාගාරයේ විදුලිය නිපදවීමේ ඒකකයක පිරිවැය රු. 88.00 ක් විය.

අයි.පී.පී විශ්‍රාමලත් බලාගාර යනු අඩු වියදම් HFO වලින් ක්‍රියාත්මක වන, base load බලාගාර වේ. බලශක්ති ගාස්තුවේ ඒකක පිරිවැය ලංවිමේ ඍතඨ වලින් ක්‍රියාත්මක වන සමහර බලාගාරවල එකක පිරිවැයට වඩා අඩුය. මෙම බලාගාර හදිසි බලාගාර ලෙස සැලකිය නොහැකිය.

**(උ) සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ව්‍යාපෘති සඳහා (විශේෂයෙන් කුඩා ජලවිදුලි බලාගාර සඳහා) 2000 වර්ෂයට පෙර වළකාලන ලද පිරිවැය මත පදනම් වූ ගාස්තු ක්‍රමය හඳුන්වා දී තිබුණි. 2007 ට පෙර අනුමත කර ඇති NCRE ව්‍යාපෘති සඳහා පමණක් වර්තමානයේදී මෙම ගාස්තු අදාළ වන අතර දැනට NCRE ව්‍යාපෘති 28 ක් ක්‍රියාත්මක වේ. වළකාලන ලද පිරිවැය ක්‍රමය තාප විදුලි බලාගාර යැවුම් (NCRE) මත පදනම් වන අතර එය ඉන්ධන පිරිවැය අනුව වෙනස් වේ. 2020 ජනවාරි 16 දිනැති අංක ඩීජීඑම්/එස්වයිසී/ටීසීඑච්/41 දරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පද්ධති පාලන) ලිපියට අනුව නව බලාගාරද ඇතුළුව ජල විදුලි බලාගාරයක තථ්‍ය ඒකක පිරිවැය රු. 10 ට වඩා අඩු විය යුතුය. කෙසේවෙතත්, 2022 වර්ෂය සඳහා වළකාලන ලද පිරිවැය ක්‍රමය මත තීරණය කරන ලද කුඩා ජල විදුලි බලාගාරවලට අදාළ ගාස්තුව තෙත් කාලය සඳහා රු. 18.19 ක් සහ වියළි කාලය සඳහා රු. 18.67 ක් විය. තවද, 2022 ජූනි මාසය සඳහා මහජන උපයෝගිතා කොමිසම් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද බලාගාරවලට අදාළ පිරිවැයන්ට අනුව, මණ්ඩලයට ජලවිදුලි ඒකකයක් සඳහා පිරිවැය රු.4.85 ක් විය. කෙසේ වෙතත්, 2022 අගෝස්තු 16 වැනි දින මෙම කාරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ලබා දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, වළකාලන ලද පිරිවැය ක්‍රමය මත පදනම් වූ කුඩා ජල විදුලි බලාගාර සඳහා සාධාරණ උපරිම මිලක් යෙදීමට කටයුතු කර නොතිබුණි.**

වළකාලන ලද පිරිවැය ගාස්තු ක්‍රමය යනු පෞද්ගලික අංශයේ ආයෝජනයන් ඔස්සේ රටේ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කිරීමත් සමඟ හඳුන්වා දුන් පළමු ගාස්තු කාණ්ඩයයි. මෙම ගාස්තුව 1997 සිට ලංවිම විසින් වාර්ෂිකව ගණනය කර ප්‍රකාශයට පත් කරනු ලබන අතර එය ඉන්ධන පිරිවැය, වසරේ යැවීමේ (Dispatch) පුරෝකථනය, ගලා එන (Inflow) පුරෝකථනය, පුනර්ජනනීය බලශක්ති පුරෝකථනය සහ සාමාන්‍ය විනිමය අනුපාත වැනි සාධක කිහිපයක් මත රඳා පවතී. යම් අවස්ථාවක දී NCRE බලාගාර මගින් ආදේශනය කරන ලද ආන්තික තාප බලාගාරයේ ඒකක පිරිවැය වෙන් කිරීමේ මූලධර්මය මත වළකාලන ලද පිරිවැය ගණනය කරනු ලබයි. එබැවින්, වළකාලන ලද පිරිවැය තථ්‍ය පිරිවැයට සෘජු සම්බන්ධයක් නොමැත. කෙසේ වෙතත්, 2008 සිට, සියලූ NCRE තාක්ෂණයන් සඳහා පිරිවැය පරාවර්තක තිත්ව-ස්ථර ගාස්තු ක්‍රමය හඳුන්වා දී ඇත. නමුත් විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම්වලට එළැඹ ඇති වළකාලන ලද පිරිවැය කාණ්ඩය යටතේ තවමත් ක්‍රියාත්මක වන බලාගාර 20 ක් ඇත. වර්තමාන දත්තවලට අනුව, 2013-09-24 සිට වාණිජ මෙහෙයුම් ආරම්භ කර ඇති Aqua Jet (Pvt) බව විසින් ක්‍රියාත්මක කරනු ලබන ගෝනගමුව කුඩා ජල විදුලි බලාගාරයෙහි කාලසීමාව අවසන් වන 2028-09-23 දින දක්වා වළකාලන ලද පිරිවැය ගාස්තු අඛණ්ඩව පවතිනු ඇත.

ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023-10-10 දිනැති ඔවුන්ගේ තීරණය අනුව, 2028 වර්ෂය දක්වා දැනටමත් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සමඟ ගිවිසුම්ගතව හෝ සුහදව සාකච්ඡා කිරීම සඳහා වළකාලන ලද පිරිවැය ගාස්තු විමර්ශනය කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට නියෝග කර ඇත.

**(ඌ) ලක්ෂපාන ජලවිදුලි බලාගාරයෙන් බැහැර කරන ලද ටර්බයින යොදා ගනිමින් කැලණිතිස්ස බලාගාරයේ ස්මාරකයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව එහි ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර වසර 04 ක ප්‍රමාදයකින් පසු 2017 වසරේ දී ප්‍රදානය කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව රු. මිලියන 25.12 කට ලබාදී තිබූ අතර එය දින 180 ක කොන්ත්‍රාත්තු කාලයක් සහිතව 2018 ජනවාරි 05 දින නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපොහොසත් වී තිබූ අතර එදිනට ඉදිකිරීම් කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 43 ක් පමණ විය. තවද, කොන්ත්‍රාත්කරුට කිසිදු කාලය දීර්ඝ කිරීමක් ලබා දී නොමැති බව නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. මිලියන 19.65 ක් (උපදේශන ගාස්තු ඇතුළුව) දැරීමෙන් පසුවත් දින 1746 ක ප්‍රමාදයක් නිරීක්ෂණය විය. ඊට අමතරව, විගණනය විසින් සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී, නිම නොකළ ස්මාරකය පිහිටි පරිශ්‍රය වල් පැළෑටිවලින් වැසී ඇති බවත්, ඉදිකිරීම් කටයුතු අත්හැර දමා ඇති බවත් නිරීක්ෂණය විය. ඒ අනුව, මෙම ඉදිකිරීමේ නියමිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබූ අතර ඒ සඳහා වැය වූ මුදල් අනාර්ථික වියදමක් බවට පත් වී තිබුණි.**

පවතින තත්ත්වය පිළිබඳව සොයා බැලීමේදී, දැනට පවතින කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ව්‍යාපෘතිය අවසන් කළ නොහැකි බව හඳුනාගෙන ඇත. ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට නම්, පවතින තත්ත්වය යටතේ සැලකිය යුතු මිල වැඩි කිරීමක් පිරිනැමිය යුතුය. ඒ අතරම, කොන්ත්‍රාත්කරු විසින් විවිධ හේතූන් මත කොන්ත්‍රාත්තුව අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කරන ලෙස ඉල්ලා ඇත. එබැවින්, ප්‍රසම්පාදන ආයතනය විසින් කොන්ත්‍රාත්තුව අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කිරීමට සහ කිසිදු හිමිකම් පෑමකින් තොරව කාර්ය සාධන බැඳුම්කරය නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ජනන අංශය) අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ජනන අංශය) විසින් තත්ත්වය සමාලෝචනය කර ඉදිරි ක්‍රියාමාර්ගය නිර්දේශ කිරීම සඳහා තාක්ෂණික කමිටුවක් පත් කර ඇත. කමිටු නිර්දේශ මත පදනම්ව, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ජනන අංශය) විසින් පහත සඳහන් දේ සඳහා අනුමැතිය ලබා දී ඇත.

1) ලංකා විදුලිබල මණ්ඩලය සහ කොන්ත්‍රාත්කරු අතර ඇති ගිවිසුම අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කිරීමට
2) Fair faced concrete surface සඳහා අනුමාන මුදල (provisional sum) ලෙස වෙන් කර ඇති රු. 200,000.00 ක් සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ගෙවීම නතර කිරීමට
3) Fair-face surface හි ඇති දෝෂ නිවැරදි කිරීම වෙනුවෙන් රඳවා ගත් මුදලින් රු. 789,000.00 ක් අඩු කිරීමට
4) කිසිදු හිමිකම් පෑමක් නොමැතිව කාර්ය සාධන බැඳුම්කරය නිකුත් කිරීමට
5) රු. 529,148.37 ක් වූ ඉතිරි රඳවා ගත් මුදල් නිදහස් කිරීමට
6) ඉතිරි ව්‍යාපෘති කටයුතු අවසන් වන තුරු වැර ගැන්නුම (reinforcement) දිරාපත් වීම වළක්වා ගැනීමට පවතින ව්‍යුහය අව්වෙන් සහ වර්ෂාවෙන් ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය ආරක්ෂක පියවරයන් ක්‍රියාත්මක කිරීමට
7) ආරක්ෂිත පියවරයන් සම්පූර්ණ කිරීමෙන් පසු වත්කම් (මෙතෙක් ව්‍යාපෘතිය මගින් සම්පූර්ණ කර ඇති) කැලණිතිස්ස බලාගාරය වෙත පැවරීම

**(එ) මණ්ඩලයෙන් ලද තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට මණ්ඩලය සතු වාහන හතක් රේඛීය අමාත්‍යාංශය වෙත මුදා හැර ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අමාත්‍යාංශයෙන් ලද තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට අමාත්‍යාංශය විසින් එක් වාහනයක් පමණක් භාවිත කරනු ලබයි.**

මෙම වාහන 7 න් වාහන 3 ක් සොයා ගැනීමට නොහැක. ඒවා තවමත් ලංවිම නමින් පවතින අතර ඒ පිළිබඳව විමර්ශනය කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත. ඒ සම්බන්ධව 2022-12-28 දින සිහිකැඳවීමක් යවා ඇත. කෙසේ වෙතත්, මෙම වාහන සම්බන්ධයෙන් මෙතෙක් තොරතුරු සොයාගෙන නොමැති බවත් විමර්ශනය ක්‍රියාත්මක වෙමින් පවතින බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිචාර දක්වා ඇත.

| අංකය | වාහන අංකය | සටහන |
|---|---|---|
| 1 | 32-1492 | විමර්ශනය කිරීම සඳහා අප විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත. |
| 2 | 32-2761 | විමර්ශනය කිරීම සඳහා අප විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත. |
| 3 | 32-5009 | විමර්ශනය කිරීම සඳහා අප විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත. |

මීට අමතරව, ලංවිම විමර්ශන ඒකකය මගින් ද පරීක්ෂණයක් සිදු කර ඇති අතර මෙම වාහන 7 න් වාහන 4 සම්බන්ධයෙන් පහත පරිදි ඔවුන් වාර්තා කර ඇත. මෙම වාහන 2011 වර්ෂයේදී භෞතික සත්‍යාපනය සිදු කරන ලද අවස්ථාවේ භෞතිකව නොතිබූ බැවින් ශූන්‍ය අගයට ගිණුම් පොත්වල සටහන් කර ඇත.

| අංකය | වාහන අංකය | සටහන |
|---|---|---|
| 1 | 50-3665 | පළමු ලියාපදිංචිය විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නමට වූ අතර පසුව එය සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත පවරා ඇත. |
| 2 | 32-3463 | වාහනය මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය නමින් පවතී. |
| 3 | 32-2760 | ලංවිම මෙම වාහනය පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරා ඇත. |
| 4 | 32-4554 | පොලිස්පතිවරයාගේ නමින් මෙම වාහනය ලියාපදිංචි කර ඇත. |

මෙම වාහන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු මෙම වාහන හතර සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයේ සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත.

**(ඒ) කැලණිතිස්ස බලාගාරයේ ඩී ගෑස් ටර්බයින් ජනන යන්ත්‍ර හතරක් පුනරුත්ථාපනය කිරීම 2017 ජූලි 07 දින ආරම්භ කර තිබුණු අතර 2018 අගෝස්තු 11 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටදී ආරම්භ කළ දින සිට අවුරුදු 5 ක් සහ මාස 5 ක් ගත කිරීමෙන් පසුව ජනක යන්ත්‍ර 3 ක් පමණක් පුනරුත්ථාපනය කර තිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටදී සියලුම ටර්බයින සඳහා රු. මිලියන 752.22 ක් වැය කර පුනරුත්ථාපනය කරන ලද ජනක යන්ත්‍ර 3 කින් මෙහෙයුම් කටයුතු සඳහා එක් ගෑස් ටර්බයිනයක් පමණක් යොදාගෙන තිබුණි.**

පුනරුත්ථාපන ව්‍යාපෘතිය 2017 ජූලි මස ආරම්භ කරන ලද අතර මුලදී එය 2018 අගෝස්තු වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. මූලික තාක්ෂණික අධ්‍යයනයට අනුව, මාස හතරකට ආසන්න කාලයක් තනි යන්ත්‍රයකට වෙන් කර තිබුණි.

කෙසේ වෙතත්, ගෑස් ටර්බයින හතරම විවිධ මෙහෙයුම් තත්ත්වයේ තිබූ බැවින් යන්ත්‍ර ගලවා දැමීමෙන් පසුව පමණක් ඒවායේ තථ්‍ය පුනරුත්ථාපන ගැඹුර සහ විෂය පථය හඳුනාගත හැකිව තිබුණි. ඉදිරි පස් අවුරුදු මෙහෙයුම සඳහා අවම පුනරුත්ථාපන අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා බොහෝ තත්ව තක්සේරු පරීක්ෂණ පවත්වා ඇත.

අදාළ ක්ෂේත්‍රවල ව්‍යාපෘති ඉංජිනේරුවන් සහ විශේෂඥ ඉංජිනේරුවන් විසින් තක්සේරු කිරීම් සිදු කරන ලද අතර ඔවුන් යන්ත්‍ර හතරේම (GT1, GT2, GT4 සහ GT5) inlet air filter, fined tube coolers, zero seal සහ exhaust duct වල ප්‍රධාන පුනරුත්ථාපන අවශ්‍යතා හඳුනාගෙන ඇත. ඒ අතරම, නව ස්වයංක්‍රීය වෝල්ටීයතා නියාමක පද්ධති, නව විදුලි ආරක්ෂණ පද්ධති, පැරණි පාලන කේබල් ප්‍රතිස්ථාපනය සහ නව HMI පාලන ඒකක ස්ථාපනය කිරීම වැනි අවශ්‍යතා හඳුනා ගෙන ඇත.

මෙම අනපේක්ෂිත විෂය පථයේ විචලනය ව්‍යාපෘති ප්‍රමාදයට සෘජුවම බලපෑ අතර කොරෝනා වසංගත තත්ත්වය සමඟ එම ප්‍රමාදය තවත් වැඩි විය.

කෙසේ වෙතත්, ගෑස් ටර්බයින තුනක් (GT1, GT2 සහ GT4) සම්පූර්ණයෙන්ම පුනරුත්ථාපනය කර වාණිජ මෙහෙයුම් සඳහා නිදහස් කර ඇත. ගෑස් ටර්බයිනයේ පසුකාලීන අසාර්ථකත්වය පුනරුත්ථාපන කාර්යයට සම්බන්ධ නොවන අතර එය මෙහෙයුම් අසාර්ථක වීමක් පමණි.

GT 5 හි පුනරුත්ථාපන කටයුතුවලින් සියයට 95 ක් අවසන් කර ඇත. යන්ත්‍රයේ පූර්ව-ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී, උපාංග ගියර් පෙට්ටියේ ගියර් රෝදයක (gear wheel) දෝෂයක් ඇති විය. ස්ථානීය අලුත්වැඩියාව සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කිහිපයක් අසාර්ථක විය. ඒ නිසා අවසානයේ ඒ වෙනුවට නව ගියර් රෝදයක් මිලදී ගැනීමට තීරණය කර ඇණවුම ලබා දී ඇත.

**(ඔ) විදේශීය අරමුදල් සපයන ව්‍යාපෘති තුනක් සම්බන්ධයෙන්, නිම කිරීමට නියමිත දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා මාස 14 සිට මාස 39 දක්වා සැලකිය යුතු ප්‍රමාදයක් නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්කරුවන්ට ලබාදුන් පළමු දින දීර්ඝ කිරීම තුළදී පවා එම ව්‍යාපෘති අවසන් කර නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.**

| | **ව්‍යාපෘතියේ නම** | **පරිත්‍යාග කරන්නාගේ / ණය දෙන්නාගේ නම** | **ආරම්භක දිනය** | **අවසන් කිරීමට නියමිත දිනය** | **අවසන් වරට දීර්ඝ කර දිනය/දීර්ඝ කිරීම් ගණන** | **2022.12.31 දිනට ප්‍රගතිය** | **2022.12.31 දිනට ප්‍රමාද** |
|---|---|---|---|---|---|---|---|
| 1 | හරිත බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ ආයෝජන වැඩසටහන (ණය වාරික 1) 1 කොටස (මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය) | ADB | 02.07.2014 | 31.03.2021 | 31.07.2024 (02) | 44.4 % | 21 මාස |
| 2 | හබරණ * වේයන්ගො ාඩ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය | JICA | 20.06.2017 | 18.02.2018 | 30.06.2023 (02) | 98.50 % | 58 මාස |
| 3 | විදුලිබල සැපයුමේ චිරස්ථායීතාවය වැඩිදියුණු කිරීමට සහය වීමේ ව්‍යාපෘතිය * පැකේජය 4 | ADB | 28.10.2019 | 27.10.2021 | 29.11.2023 (02) | 45.10% | 14 මාස |

**මොරගොල්ල ජලවිදුලි ව්‍යාපෘතිය 2014.07.02 දින ආරම්භ කළද පහත සඳහන් හේතූන් මත 2020 ජනවාරි මස භෞතික ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.**

- ප්‍රධාන වශයෙන් උපදේශන සේවා සහ ප්‍රධාන සිවිල් වැඩ කොන්ත්‍රාත්තුවල ප්‍රසම්පාදන ප්‍රමාදයන් පැවතීම
- ව්‍යාපෘති අනුමත කිරීමේ අධිකාරිය එනම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉල්ලීම මත වේල්ල ප්‍රතිනිර්මාණය කිරීම
- වඳවීමේ තර්ජනයට ලක්ව ඇති fish Labeo Fisheri හි නව සොයාගැනීම් හේතුවෙන් අතිරේක පාරිසරික අධ්‍යයනයන් 2020 ජනවාරි මස ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමෙන් පසුවද පහත සඳහන් හේතූන් මත ව්‍යාපෘති කටයුතු තවදුරටත් ප්‍රමාද විය.
- 2020 ජනවාරි සිට චීනයේ කොවිඩ් 19 වසංගතය පැතිරීම සහ ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන් ද චීනයේ අය බැවින් එය ව්‍යාපෘති කටයුතුවලට දැඩි ලෙස බලපා ඇත.
- දිවයින පුරා පනවා ඇති ඇඳිරි නීතිය ඇතුළු අගුලු දැමීමේ කාලසීමාවන් දීර්ඝ කිරීම
- විදේශිකයන්ට මෙන්ම දේශීය අයටද ගමන් සීමා පැනවීම
- ද්‍රව්‍ය නැව්ගත කිරීමේ ප්‍රමාදය සහ ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟකම

**හබරණ - වේයන්ගොඩ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය, ලොට් බී: 2017/05/02 දින සම්ප්‍රේෂණ මාර්ගයේ වැඩ ආරම්භය වූ අතර 2020/11/02 දින අවසන් කිරීමට නියමිත විය.**

කෙසේ වෙතත්, නඩු විභාගයක් හේතුවෙන් (අධිකරණ නඩුව විසඳන තුරු සම්ප්‍රේෂණ මාර්ගය ක්‍රියාත්මක කළ නොහැක) මීරිගම පිහිටි ස්ථානය හැර මුල් කොන්ත්‍රාත්තුවේ ද්විත්ව පරිපථ විෂය පථය අවසන් කර ඇත.

කොන්ත්‍රාත්තුව සංශෝධනය කිරීමෙන් පසුව 2020/10/05 දින 4-පරිපථ විචලතා නියෝගයක් පසුව ලබා දී ඇත. මෙම විචල්‍ය විෂය පථය සඳහා, සම්පූර්ණ කිරීමේ දිනය 2023/06/30 දක්වා දීර්ඝ කරන ලද බැවින් මාස 58 ක ප්‍රමාදයක් නොමැත. 2022 අප්‍රේල් මාසයේ ෂෂක් විසින් ගෙවීම් අත්හිටුවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට මුදල් නොගෙවන බැවින්, මෙම කාර්යය තවමත් අසම්පූර්ණ වේ. 2024 ජනවාරි 30 දක්වා තවත් මාස 6 ක දීර්ඝ කිරීමක් අවශ්‍ය වේ.

විදුලිබල සැපයුමේ විරස්තායීතාවය වැඩිදියුණු කිරීමට සහය වීමේ ව්‍යාපෘතියේ පැකේජය 4 හි භෞතික කාර්ය සාධනයේ ප්‍රමාදය හේතු කිහිපයක් නිසා වේ.

- රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන්, කණ්ඩායම් (gangs) යෙදවීමට නොහැකි වූ අතර ඒ සමඟම පැවති රජයේ රෙගුලාසි හේතුවෙන් කණ්ඩායම්වල වැඩ නතර කිරීමට සිදු විය.
- කොවිඩ් හේතුවෙන් පැවති සංචාරක සීමා කිරීම් නිසා කොන්ත්‍රාත්කරුට සැලසුම් කළ පරිදි චීනයේ සිට කාර්ය මණ්ඩලය යෙදවීමට නොහැකි විය.
- රට තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වයන්.
- ඉන්ධන හිඟය 2022 වර්ෂයේ ඉදිකිරීම් කටයුතුවලට බලපා ඇත.
- 2022 වර්ෂය තුළ පැවති ආනයන සීමා කිරීම් හේතුවෙන් ද්‍රව්‍ය හිඟය පැවතීම.
- රජයේ බලධාරීන්ගෙන් (එනම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව) අනුමැතිය ලබා ගැනීමට සැලකිය යුතු කාලයක් ගත වී තිබුණි.
  ප්‍රමාදයට හේතු වූ මෙම කරුණු නොවැළැක්විය හැකි කරුණු වන අතර දැනට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 64.44 දක්වා ඉහළ ගොස් ඇත.

**(ඕ) 2000 වසරේ සිට ව්‍යාපෘති කටයුතු, ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සහ ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම සඳහා රු. මිලියන 188.38 ක වියදමින් මිලදී ගත් ඉඩම් 18 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අවුරුදු 1 සිට අවුරුදු 22 දක්වා වූ කාල පරාසයක් තිස්සේ අපේක්ෂිත අරමුණු සඳහා ප්‍රයෝජනයට ගෙන නොමැති බව නිරීක්ෂණය විය. එම ඉඩම් අතරින් රු. මිලියන 86.52 ක් වටිනා ඉඩම් 8 ක් බෙදාහැරීමේ අංශවල සහ ව්‍යාපෘති අංශවල ස්ථාවර වත්කම් ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි. තවද, අහඹු විගණන පරීක්ෂණයට අනුව, මීට වසර 5 කට පෙර අදාළ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කර තිබුණද, ව්‍යාපෘති සඳහා අත්කර ගත් ඉඩම් හතරක් පවරා ගැනීමේ කටයුතු සම්පූර්ණ කිරීමට මණ්ඩලය අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.**

| අරමුණ | ගැසට් නිවේදනයේ දිනය | තැන්පත් කළ මුදල | තැන්පත් කළ වර්ෂය |
|---|---|---|---|
| **බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි ව්‍යාපෘතිය** | | | |
| ප්‍රධාන වේල්ල, උමං මාර්ගය, කෙහෙල්ගමුව ඔය වේල්ල, උමං මාර්ගය සහ විධායක නිල නිවාස ඉදිකිරීම | | 750,000 | 2007-2021 |
| **පුනර්ජනනීය බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය** | | | |
| රාගල ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම (රහතුන්ගොඩවත්ත ඉඩම) | 14-10-2016 | 825,000 | 29 -02-2016 |
| මාලිබොඩ (උඩපොලවත්ත ඉඩම) ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම | 15-05-2017 | 870,000 | 08-09-2016 |
| **ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධනය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය** | | | |
| මාලඹේ ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම (ඇටහෙරලියගහකුඹුර ඉඩම) | | 311,250 | 08-12-2015 |

මෙම ඉඩම් 18 න් ඉඩම් 3 ක් ව්‍යාපෘති අංශයට අදාළ වේ. ස්ථාවර වත්කම් ලෙස ඇතුළත් කිරීමට නියමිත ඉඩම්වල පිරිවැය පැවරීමට කටයුතු කරමින් පවතී. තවද, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර ඉඩම්වල අයිතිය පවරා ගන්නා ලෙස අදාළ අංශ වෙත උපදෙස් දෙනු ඇත. ඉන් පසුව, ඒ අනුව ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කරනු ඇත.

**(ක) රත්නපුර, සිරිපාගම, කාර්නි වත්ත, ඉඩමේ කුළුණු ඉදිකිරීම සහ ඉඩම උඩින් කේබල් ඇදීම සඳහා අවසරය ඉල්ලා සිටි දින සිට (2018 මැයි 31) එකී අවසරය ලද දිනය (2023 අගෝස්තු 11) දක්වා දින 1,898 ක් හෝ වසර 5 යි මාස 2 ක කාලයක් පැවති බව නිරීක්ෂණය විය. එබැවින්, ශ්‍රී ලංකාවේ දකුණු පළාතට විශ්වාසනීය විදුලිබල සැපයීමක් සඳහා තීරණාත්මක යටිතල පහසුකම් ලෙස හඳුනාගෙන තිබූ පොල්පිටිය - හම්බන්තොට කි.වෝ 220 ක ධාරිතාවක් සහිත කි.මී 150 ක සම්ප්‍රේෂණ මාර්ගයේ ඉදිකිරීම් නිම කිරීම සැලකිය යුතු කාලයක් ප්‍රමාද වී තිබුණු අතර විදුලිබල සැපයුමේ හිඟයට ඉදිකිරීම්වල ප්‍රමාදය හේතු වී තිබුණි. තවද, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2016 ජනවාරි 25 දිනැති විදුලි (ආරවුල් විසඳීමේ ක්‍රියාපටිපාටිය) රීති ප්‍රකාරව මෙම ආරවුල කලින්ම මණ්ඩලයේ කළමනාකාරිත්වය විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබුවේ නම්, ශ්‍රී ලංකාවේ දකුණු පළාතට විශ්වාසනීය විදුලිබල සැපයීමක් සඳහා තීරණාත්මක යටිතල පහසුකමක් වූ මෙම සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම කලින්ම නිම කිරීමට හැකිව තිබුණු අතර ඉදිකිරීම් ප්‍රමාදය හේතුවෙන් සියලුම පාර්ශ්වකරුවන් මුහුණ දුන් දුෂ්කරතා අවම කර ගත හැකිව තිබුණි. තවද, ඉඩම් හිමියා කිසිදු වන්දියක් නොමැතිව ඉඩම ලබා දීමට එකඟ වී තිබියදී ඉඩම් හිමියාට ගෙවිය යුතු වන්දිය වෙනුවෙන් පිළිවෙළින් රත්නපුර ප්‍රාදේශීය ලේකම් සහ රත්නපුර දිස්ත්‍රික් ලේකම් වෙත තැන්පත් කර ඇති රු. මිලියන 1.7 ක සහ රු. මිලියන 7.9 ක මුදල 2023 ඔක්තෝම්බර් මස අවසන් වන විටත් අය කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.**

මෙම සම්ප්‍රේෂණ මාර්ගය ශ්‍රී ලංකාවේ දිගම සම්ප්‍රේෂණ මාර්ගය වන අතර එය කිලෝමීටර 150 ක දිගකින් යුක්ත වන අතර ආරක්ෂාව සහ විදුලි නිෂ්කාශනය සඳහා පළල කිලෝමීටර් 35 ක අඑහකැඩ කොරිඩෝවක් ඇත. ඒ අනුව, වන්දි ගෙවීම සඳහා වූ සිද්ධීන් 2,000 කට අධික සංඛ්‍යාවක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් හසුරුවන ලද අතර, ඉතිරි වූ එකම සිද්ධිය මෙය වේ. රත්නපුර, සිරිපාගම, ක්‍රියාමාර්ග මාලාවක් සිදු කිරීමෙන් අනතුරුව කාර්නි වත්ත පිළිබඳ ගැටලුව 2023 අගෝස්තු 11 දින මහජන උපයෝගිතා කොමිසමේ දී අවසන් විය.

තවද, මෙම සිද්ධිය ආසියානු සංවර්ධන බැංකුව (ADB) වෙත වාර්තා කරන ලද අතර අරමුදල් සපයන ආයතනය ලෙස ඔවුන්ගේ මහජන ආරක්ෂක ප්‍රතිපත්ති න්‍යායසය යටතේ ඔවුන්ද මෙම ක්‍රියාවලියට මැදිහත් විය. එබැවින් ලංවිමට රටේ රෙගුලාසි මෙන්ම ADB හි මහජන ආරක්ෂණ ප්‍රතිපත්ති මාර්ගෝපදේශද සපුරාලීමට සිදු විය. ADB හි මහජන ආරක්ෂණ ප්‍රතිපත්ති න්‍යායසයට අනුව, සම්ප්‍රේෂණ මාර්ගය හේතුවෙන් හානියක් සිදුවුවහොත් විපතට පත් පාර්ශවයට ප්‍රතිස්ථාපන පිරිවැය ගෙවිය යුතුය. හානිය සඳහා වූ රජයේ තක්සේරුව බලපෑමට ලක් වූ පාර්ශවයන් විසින් ප්‍රකාශ කරන ලද මෙම ප්‍රතිස්ථාපන පිරිවැයට වඩා අඩු විය. මෙම සීමාවන් සමඟ, මෙම කාරණය මහජන උපයෝගිතා කොමිසමේ දී විසඳන තෙක් එනම් 2023 අගෝස්තු 11 දක්වා කල්ගත විය. තවද, ව්‍යාපෘතියේ ප්‍රගතියට මෙම කාල සීමාව තුළදී ඇති වූ පාස්කු බෝම්බ ප්‍රහාරය, කොවිඩ් 19 වසංගතය සහ රටේ අයහපත් ආර්ථික තත්ත්වය බරපතල ලෙස බලපෑ තිබුණි. තවද, 2023 සැප්තැම්බර් අග වන විට මෙම තැන්පතු ආපසු අයකර ගෙන ඇත.

**2.2 වෙනත් කරුණු**

**(අ) 2022 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 46.41 ක් වූ වෙළඳ ණයගැති ශේෂය අතරින්, සාමාන්‍ය සහ තොග සැපයුම්වලට අදාළව රු. මිලියන 4,003 ක් වූ ණය ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණු අතර ඉන් රු. මිලියන 2,210 ක් වසර පහකට වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් වැඩිදුර නිරීක්ෂණ සිදු කරනු ලැබේ.**

**(i) ඉහත මුළු ණයගැති ශේෂය අතරින්, දීර්ඝ කාලයක් තිස්සේ හිඟ මුදල් අයකර නොගැනීම හේතුවෙන් රු. බිලියන 2.4 ක් හෙවත් සියයට 4.9 ක් අවසන් කරන ලද ණයගැති ශේෂ යටතේ වර්ගීකරණය කර තිබූ අතර එයින් රු. මිලියන 984 ක් හෙවත් සියයට 43 ක් බෙදාහැරීමේ අංශය 01ට අදාළ විය.**

2023 ඔක්තෝම්බර් මාසයේදී අවසන් කළ ණයගැති ශේෂය මුළු ණය ගැතියන්ගෙන් සියයට 4.9 සිට සියයට 3.6 දක්වා අඩු වී ඇත.

| අංශය | පිළිතුර - අවසන් කළ ණය ගැතියන් සම්බන්ධයෙන් ගත් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග |
|---|---|
| **ඩීඩී-01** | 1. DCC/COM/03/2009 චක්‍රලේඛය ප්‍රකාරව සමථ මණ්ඩලයක් මගින්, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම මගින් සහ තැන්පතුවෙන් අයකර ගැනීම මගින් අවසන් කළ ගිණුමේ හිඟ ශේෂය අයකර ගැනීම.<br>2. ප්‍රාදේශීය ආදායම් කමිටු පත් කිරීම.<br>3. හිඟ ශේෂ පියවන ලෙස ඉල්ලා පාරිභෝගිකයන් වෙත සිහි කැඳවීම් ලිපි යවා ඇත.<br>4. අවසන් කළ ගිණුම් ලෙස වර්ග කිරීමෙන් තොරව හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා විසන්ධි කිරීමේ වැඩසටහන්, පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් යනාදිය ක්‍රියාත්මක කරමින් පවතී. |
| **ඩීඩී-02** | **බස්නාහිර පළාත ii**<br>1. 2021.12.31 දිනට වසර 5 ට වැඩි තොග සැපයුම අවසන් කළ ණය ගැතියන් රු. 21,819,241.28 ක් වූ අතර 2022.12.31 වන විට එම ශේෂය රු. 11,914,583.61 ක් දක්වා අඩු විය. හිඟ ශේෂයන් අයකර ගැනීමට සහ නිරවුල් කිරීමට අඛණ්ඩව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ඇත.<br>2. සාමාන්‍ය සැපයුම් ණය ගැතියන්ගේ වයස් විශ්ලේෂණයට සක්‍රීය ගිණුම් මෙන්ම අවසන් කළ ගිණුම්ද ඇතුළත් වේ. අවසන් කළ ගිණුම්වල හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා අදාළ ප්‍රදේශයේ ඉංජිනේරුවන් විසින් දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර හිඟ මුදල් එකතු කිරීමේ මාසික ප්‍රගතිය පිළිබඳ විස්තර DGM ශාඛාවට මෙන්ම ගණකාධිකාරී (ආදායම්) ඒකකයට යවනු ලබයි.<br>3. තවද, අවසන් කළ ගිණුම් සම්බන්ධයෙන්, අංක: DCC/ COH/ 03/ 2009 චක්‍රලේඛයේ උපදෙස් අනුව හර ශේෂයන්, පවතින ආරක්ෂක තැන්පතු වටිනාකමට වඩා අඩු නම් ආරක්ෂක තැන්පතුවලට එරෙහිව හිඟ හර ශේෂයන් හිලව් කිරීමට දැනටමත් කටයුතු කර ඇත.<br><br>**නැගෙනහිර**<br>තොග සැපයුම් කාණ්ඩයේ අවුරුදු 5 සහ ඊට වැඩි වයස් සීමාවේ ඇති ශේෂයෙන් සියයට 90 කට වඩා වැඩි ප්‍රතිශතයක් පහත පාරිභෝගික ශේෂයන් නියෝජනය කරයි.<br>1. වාලච්චේන කඩදාසි සමාගම<br>2. කන්තලේ සීනි සංස්ථාව<br>ඉහත ප්‍රධාන පාරිභෝගිකයින් දෙදෙනාගේ හිඟ ශේෂයන් සම්බන්ධයෙන් ලංවිම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් තීරණ ගෙන ඇත.<br><br>1. වාලච්චේන කඩදාසි සමාගම - හිඟ ශේෂයේ කොටස කපා හැරීමට සහ වාරික පදනම මත ඉතිරි ශේෂය පාරිභෝගිකයාගෙන් අයකර ගැනීමට.<br>රු. 361,992,685.22 ක මුදලක් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇති අතර ඉතිරි ශේෂය නැවත ආරම්භ කළ දින සිට වසර දෙකකට පසු මාස හයක කාලයක් තුළ වාරික පදනම මත අයකර ගත යුතුය. කෙසේ වෙතත්, මෙම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ඉදිරියට ගෙන යාම සඳහා වාලච්චේන කඩදාසි සමාගම සහ ලංවිම අතර මෙම ගිවිසුම තවමත් අත්සන් කර නොමැත.<br>ඒ අනුව, රු. 361,992,685.22 ක් 2022 දෙසැම්බර් මාසයේදී කපා හැර තිබුණි. 2023.03.21 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල සටහන (BM/2023/05) මගින් අනුමත කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2023 සිට 2026 දක්වා රු. මිලයන 122 ක හිඟ ශේෂය ගෙවීමේ කාලසීමාව පහත පරිදි දීර්ඝ කර ඇත.<br>2023   මාසයට රු. මිලියන 1 බැගින්   රු. මිලියන 12<br>2024   මාසයට මිලියන 2 බැගින්   රු. මිලියන 24<br>2025   මාසයට රු. මිලියන 3 බැගින්   රු. මිලියන 36<br>2026   මාසයට රු. මිලියන 4.17 බැගින්   රු. මිලියන 50<br>රු. මිලියන 122<br><br>ඒ අනුව, 2023 අප්‍රේල් වන විට රු. මිලියන 2 ක් ලැබී ඇති අතර අඛණ්ඩව පසු විපරම් කර ඇත. |

| | |
|---|---|
| | **2. කන්තලේ සීනි සංස්ථාව - හිඟ ශේෂයෙන් කොටසක් අයකර ගැනීම සහ ගිණුම් පොත්වලින් ඉතිරි ශේෂය කපා හැරීම.**<br>කන්තලේ සීනි සංස්ථාවට අදාළව (ගිණුම් අංක 3470100217) රු. 76,331,246.03 ක් වූ දිගුකාලීන ණයගැති ශේෂයක් පවතින අතර ඉතිරි හිඟ ශේෂය පියවීමෙන් පසු රු. 44,839,186.53 ක් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය එකඟ වී ඇත. කෙසේ වෙතත්, ලංවිම විසින් ඉදිරිපත් කර ඇති මෙම පියවීම් යෝජනාවට සීනි සංස්ථාව මෙතෙක් ප්‍රතිචාර දක්වා නොමැත.<br><br>**මධ්‍යම පළාත 1 සහ 2**<br>තොග සැපයුම් සහ සාමාන්‍ය සැපයුම් අවසන් කළ ණය ගැතියන්ගේ හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා අදාළ ප්‍රදේශයේ ඉංජිනේරුවන් විසින් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර හිඟ මුදල් එකතු කිරීමේ මාසික ප්‍රගතිය පිළිබඳ විස්තර පළාතේ ෆධඑ වෙත මෙන්ම ගණකාධිකාරී (ආදායම්) වෙත යවනු ලබයි.<br><br>තවද, අවසන් කළ ගිණුම් සම්බන්ධයෙන්, අංකඃ DCC/COH/03/2009 දරන චක්‍රලේඛයේ උපදෙස් අනුව හිඟ ශේෂය ආරක්ෂක තැන්පතු මුදලට වඩා අඩු නම්, ආරක්ෂක තැන්පතුවලට එරෙහිව හිඟ ශේෂයන් හිලව් කිරීමට කටයුතු කරනු ඇත. |
| **ඩීඩී-03** | **අවසන් කළ ණය ගැතියන් සම්බන්ධයෙන් පහත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගෙන ඇත.**<br>1. සාමාන්‍ය සහ තොග ණය ගැතියන්ගේ ආරක්ෂක තැන්පතුවලින් අවසන් කළ ගිණුම්වල ශේෂයන් අයකර ගැනීමට.<br>2. දිගුකාලීන හිඟ ශේෂයන් සහ වසර දෙකකට අඩු අවසන් කළ ගිණුම් සඳහා සිහි කැඳවීම් යැවීමට කටයුතු කර ඇත.<br>3. පැහැර හරින ලද පාරිභෝගිකයාගේ සක්‍රීය ගිණුම් හඳුනාගෙන ශේෂයන් ක්‍රියාකාරී ගිණුම් වෙත පැවරීමට කටයුතු කර ඇත.<br>4. අයවිය යුතු ශේෂය අයකර ගැනීමට හමුදා කඳවුරු වැනි රජයේ සංවිධානවලට දිගින් දිගටම සිහි කැඳවීම් යවා ඇත. මෙම ක්‍රියාවලිය හරහා සැලකිය යුතු මුදලක් අයකරගෙන ඇත. |
| **ඩීඩී-04** | බස්නාහිර පළාත i - ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ගෙන ඇත. කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් සහ නීතිමය පියවර ගැනීමට ලිපියක් යවා ඇත.<br><br>දකුණ පළාත 1 - සාමාන්‍ය සැපයුම් අවසන් කළ ගිණුම්වල දිගුකාලීන හිඟ ශේෂයන් සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර නිරවුල් කිරීම සිදු කරමින් පවතී. ආරක්ෂක තැන්පතු ශේෂවලට එරෙහිව අවසන් කළ හිඟ ගිණුම් ශේෂයන් හිලව් කිරීමට කටයුතු කර ඇත.<br><br>දකුණ පළාත 2 - අවසන් කළ ගිණුම්වල හිඟ මුදල් අවම කිරීමට කටයුතු කර ඇත. එකතු කිරීමේ ක්‍රියාවලියේ සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කරමින් පසුගිය වසර තුළ සමස්ත ලැබිය යුතු තත්ත්වය 2.5 සිට 1.45 දක්වා වර්ධනය වී ඇත. |

**(ii)** **බෙදාහැරීමේ අංශය 01 හි අවසන් කරන ලද රු. මිලියන 872.39 ක සාමාන්‍ය සැපයුම් ණයගැතියන් අතරින්, වැඩිම මුදල වන රු. මිලියන 230.58 ක් කොළඹ නගර කලාපය නියෝජනය කරන අතර මණ්ඩලයේ ඩීසීසී/සීඕඑම්/03/2009 චක්‍රලේඛය අනුව පියවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව එම ශේෂයේ පාරිභෝගික ගිණුම් 13,710 කට අදාළ රු. මිලියන 41.58 ක මුදලක් බැර ශේෂ ලෙස පැවති බව නිරීක්ෂණය විය. ඊට අමතරව, පියවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව තොග ණය ගැතියන් (අවසන් කරන ලද) තුළ පාරිභෝගික ගිණුම් 216 කට අදාළ රු. මිලියන 13.15 ක බැර ශේෂයන් ද පැවතුණි.**

| අංශය | පිළිතුරු |
|---|---|
| ඩීඩී-01 | දිගුකාලීන හිඟ අවසන් කළ වෙළඳ ණයගැති බැර ශේෂයන් අයකර ගැනීමට පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>1. උපලේඛන සහ ලිපි සකස් කර පළාත් DGM වරුන් හරහා පාරිභෝගිකයින්ට දැනුම් දී ඇත.<br>2. චක්‍රලේඛයට අනුකූලව, සාමාන්‍ය සැපයුම අවසන් කළ බැර ශේෂයන් ඉවත් කිරීමට කටයුතු කර ඇත.<br>**කොළඹ නගරය**<br>උපලේඛන සහ ලිපිය සකස් කර අනුමැතිය සඳහා DGM, කොළඹ නගරය වෙත ඉදිරිපත් කර ඇත.<br>2023.06.30 දිනට කොළඹ නගරයට අදාළව පාරිභෝගික ගිණුම් 23 ක තොග සැපයුම් බැර ශේෂය රු. මිලියන 1.63 ක් පමණක් වේ. මෙය බැර ශේෂයන්හි සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කරයි.<br>වයඹ පළාත -1<br>එම චක්‍රලේඛයට අනුව, 2019 වර්ෂය දක්වා සාමාන්‍ය සැපයුම අවසන් කළ බැර ශේෂයන් ඉවත් කිරීමට කටයුතු කර ඇත. තවද, 2020 වර්ෂයට අදාළ රු. මිලියන 1.09 ක් වටිනා ගිණුම් 1815 ක් 2023 අප්‍රේල් 10 වැනි දින AGM (ඩීඩී1) හි අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.<br>රු. 6990.58 ක් වටිනා තොග සැපයුම ගිණුම් 13 ක් 2022 ඔක්තෝබර් 14 වැනි දින AGM (ඩීඩී1) හි අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.<br>(වයඹ පළාත 1)<br>DCC/COM/03/2009 දරන චක්‍රලේඛය අනුව පාරිභෝගික ගිණුම් 4679 කට අදාළව රු. මිලියන 2.89 ක බැර ශේෂයන් නිරවුල් කර ඇත. |
| ඩීඩී-04 | බැර ශේෂයන් වෙනත් ආදායම්වලට අවශෝෂණය කර ගැනීමට සහ පියවූ ගිණුම් පද්ධතියෙන් ඉවත් කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. |

**(iii)** **අහඹු විගණන පරීක්ෂණයට අනුව, අවසන් කළ තොග සැපයුම් සම්බන්ධතා 413 අතරින් පාරිභෝගිකයන් 137 දෙනෙකුට කිසිදු තැන්පතු මුදලක් ලබා නොගෙන විදුලි සැපයුම් සම්බන්ධතා ලබා දී තිබූ අතර එම ගිණුම්වල මුළු හිඟ ශේෂය රු. මිලියන 266.84 ක් බව නිරීක්ෂණය විය. ඉහත අවසන් කළ තොග සැපයුම් සම්බන්ධතා 413 අතරින් පාරිභෝගිකයින් 147 දෙනෙකුගේ ගිණුම්වල ඇති මුළු තැන්පතු මුදලට වඩා එම ගිණුම්වල මුළු හිඟ ශේෂය රු. මිලියන 203.15 කින් ඉක්මවා ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.**

කොළඹ නගරය සම්බන්ධතා 409 ක් නියෝජනය කරන අතර සම්බන්ධතා 4 ක් වයඹ පළාත 2 ට අයත් වේ. 2022.12.31 දිනට ලෙජරයට අනුව කොළඹ නගරයේ මුළු අවසන් කළ ණයගැති ශේෂය රු. 33,997,534.69 ක් වන අතර මුළු ආරක්ෂක තැන්පතුව රු. මිලියන 44.85 කි.

වයඹ පළාත 2 සම්බන්ධයෙන්, පාරිභෝගික ගිණුම් 4 ක් සඳහා ආරක්ෂක තැන්පතු ලබාගෙන නොමැති බව නිරීක්ෂණය විය. ආරක්ෂක තැන්පතුව හැකි ඉක්මනින් ලබා ගැනීමට දැනටමත් කටයුතු කර ඇත.

**(iv)** **සිදු කරන ලද අහඹු විගණන පරීක්ෂණයට අනුව, පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ නිල නිවාස සඳහා ලබාදී ඇති විදුලි සම්බන්ධතා 74 ක් සම්බන්ධයෙන් රු. මිලියන 16.32 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට අයකර ගැනීමෙන් තොරව පැවති බව නිරීක්ෂණය විය. එයින් සම්බන්ධතා 29 කට අදාළ රු. මිලියන 5.31 ක මුදලක් වසර හයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව පැවති අතර සම්බන්ධතා 30 ට අදාළ තවත් රු. මිලියන 3.13 ක් වසරකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව පැවතුණි.**

<table>
<tr><th>අංශය</th><th>පිළිතරු</th></tr>
<tr><td>ඩීඩී01</td><td>පාර්ලිමේන්තු නියෝජිතයන්ගෙන් අයකර ගැනීමෙන් තොරව හිඟ ශේෂයන් පවතින බවට එකඟ වේ. කෙසේ වෙතත්, අතිරේක සාමාන්‍යාධිකාරී සහ කොළඹ නගරය හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ සමීප අධීක්ෂණය සහ උපදෙස් මත වත්මන් පාර්ලිමේන්තු නියෝජිතයින්ගේ රු. මිලියන 32 ක් අයකර ගැනීමට ලංවීමට හැකි වූ අතර පහත සඳහන් දෑ ඇතුලත්ව අඛණ්ඩව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනිමින් පවතී.<br>1. පුද්ගලයන්ගේ විස්තර ඇතුළත් ලැයිස්තුව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලින් ලබාගෙන ඇත.<br>2. පාරිභෝගික ලිපිගොනු පරීක්ෂා කිරීම/සත්‍යාපනය කිරීම සහ පාර්ලිමේන්තු නියෝජිතයින්ගේ එක් එක් සහ සෑම වත්මන් සහ පෙර පදිංචි නිල නිවාස හඳුනා ගැනීම.<br>3. දිගුකාලීන වෙළඳ ණයගැතියන්ගේ හිඟ මුදල් අයකර ගැනීම සඳහා ආදායම් කමිටු පත් කිරීම.<br>හිඟ ශේෂයන් පියවන ලෙස ඉල්ලා පාරිභෝගිකයින්ට සිහි කැඳවීම් ලිපි යැවීම.</td></tr>
<tr><td>ඩීඩී04</td><td><table>
<tr><td>බස්නාහිර පළාත දකුණ I</td><td>බිල්පත් අයකර ගැනීමේ ක්‍රියාවලියේදී මෙම ගිණුම් ද සාමාන්‍ය ගිණුම් ලෙස සලකනු ලැබේ.</td></tr>
<tr><td>දකුණ පළාත 2</td><td>තංගල්ල ප්‍රදේශයේ දේශපාලන සංස්කෘතියේ සංවේදී ස්වභාවය හේතුවෙන් සැපයුම විසන්ධි කිරීමට උත්සාහ නොකර හිඟ මුදල් පියවන ලෙසට ලංවීම විසින් සිහි කැඳවීම් ලිපි යවා ඇත. ඉතිරි ප්‍රදේශවල අපට එවැනි ගැටළු නොමැත.</td></tr>
</table></td></tr>
</table>

**(ආ) අනෙකුත් ණයගැති ශේෂය වන රු. බිලියන 38.38 අතරින් රු. බිලියන 14.59 ක් හෙවත් සියයට 38 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට වසර 2 කට වැඩි කාලයක් තිස්සේ අය නොවී පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් වැඩිදුරටත් නිරීක්ෂණ සිදු කර ඇත.**

**(i) අනෙකුත් ණයගැති ශේෂය අතරින් රු. මිලියන 12.67 කට සමාන මුදලක් බෙදාහැරීමේ අංශය 04 ට අදාළව රාජ්‍ය ආයතනවලින් වසර 5 කට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව පැවතුණි.**

මෙම හිඟ ශේෂයන් සම්බන්ධයෙන් බෞද්ධ කටයුතු අමාත්‍යාංශයට දිගින් දිගටම සිහි කැඳවීම් යොමු කළද තවමත් මෙම ශේෂයන් පියවා නොමැත. තවද, අනෙකුත් ණය ගැතියන් තුළ පියවා නොමැති ඉන්ධන තැන්පතු ද ඇතුළත් වන අතර ශේෂය නිරවුල් කිරීමට කටයුතු ආරම්භ කර ඇත.

**(ii) 2022 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ වත්කම් කළමනාකරණ අංශය විසින් සෝපාන, වායුසමීකරණ යන්ත්‍ර සහ විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රාජ්‍ය ආයතන 93 කින් රු. මිලියන 346.95 ක මුදලක් අය නොවී පැවතුණි. එයින් රු. මිලියන 114.04 ක මුදලක් සහ රු. මිලියන 82.84 ක මුදලක් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන පිළිවෙලින් වසරකට සහ වසර පහකට වැඩි කාලයක් තිස්සේ හිඟව පැවතුණි. තවද, අනෙකුත් ශේෂවල අයකරගත හැකි වටිනාකම තක්සේරු කිරීමෙන් තොරව වසර පහකට වැඩි හිඟ ශේෂය සඳහා පමණක් හානිකරණ ප්‍රතිපාදන සිදු කර තිබුණි.**

ලැබිය යුතු බොහෝමයක් රජයේ රෝහල්, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ අනෙකුත් රාජ්‍ය ආයතනවලින් සමන්විත වේ. ලිපි යැවීම සහ වෙනත් පියවරයන් භාවිතා කරමින් අයකර ගැනීමට පසු විපරම් ක්‍රියාමාර්ග ගෙන ඇති නමුත් ලැබිය යුතු මුදල් අයකර ගැනීමේ හැකියාව සැක සහිතය. එම අයකරගත නොහැකි ශේෂයන් කපා හැරීමට පියවර ගෙන ඇත.

**(iii) ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගම (රු. මිලියන 478.18 ක්) සහ ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් (රු. මිලියන 236.78 ක්) හරහා ලංකා ගල් අඟුරු සමාගමෙන් අය විය යුතු රු. මිලියන 714.96 ක් වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග නොගෙන හිඟව පැවතුණි.**

මෙම ශේෂය ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගමට අදාළව රු. 478,179,795 කින් සහ ලිබර්ටි කොමෝඩිටීස් ලිමිටඩ් අදාළව රු. 236,785,639.43 කින් සමන්විත වේ. ටෝරියන් අයන් ඇන්ඩ් ස්ටීල් සමාගමෙන් අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් කැබිනට් කමිටුවක් පත් කර අවසන් වාර්තාව සමථයකට පත් කිරීම සඳහා වරාය සහ නාවික අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත භාර දී ඇත. ලිබර්ටි කොමෝඩිටීස් ලිමිටඩ් සම්බන්ධයෙන්, ලංකා ගල් අඟුරු සමාගම බේරුම්කරණ ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් එරෙහිව ලංකා ගල් අඟුරු සමාගම විසින් ගනු ලැබූ බේරුම්කරණ ක්‍රියාවලියේ තීරණය මත මෙය නිරවුල් වනු ඇත.

**(iv) සමාලෝචිත වර්ෂය අවසන් වන දිනට විදුලිය සැපයීම වෙනුවෙන් පූජනීය ස්ථානවලින් රු. මිලියන 253.7 ක මුදලක් අය විය යුතුව පැවති අතර එයින් රු. මිලියන 81.58 ක මුදලක් වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමට ක්‍රියාමාර්ග නොගෙන හිඟව පැවතුණි.**

| **අංශය** | **2022.12.31 දිනට ශේෂය රු.මිලියන** | **වසර 5ට වැඩි ශේෂය රු.මිලියන** | **පිළිතුරු** |
|---|---|---|---|
| ඩීඩී01 | 79 | 34 | ඩීඩී 1 හි පූජනීය ස්ථානවලින් අයවිය යුතු මුදල රු. මිලියන 79.81 ක් වන අතර ඒ අතරින් රු. මිලියන 34.07 ක් වසර 5 ක් තිස්සේ පැවතුණි.<br>මේ සම්බන්ධයෙන්, ඉහත ලැබිය යුතු මුදල් කපා හැරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුවට එහි නිර්දේශ සඳහා යොමු කර තිබුණි.<br>පූජනීය ස්ථානවලින් ලැබිය යුතු මුදල්වල විස්තර පහත දැක්වේ. |

| අංකය | ස්ථානය | 2023.03.31 දිනට ශේෂය රු.මිලියන |
|---|---|---|
| 1 | ශ්‍රී මහා බෝධි ආවාසය | 13.87 |
| 2 | අබයගිරි දාගැබ | 5.87 |
| 3 | සඳවාස බෝමළුව පුස්තකාලය - ශ්‍රීමහා බෝධී | 0.01 |
| 4 | ජේතවනාරාමය | 0.27 |
| 5 | ලෝවාමාපාය | 0.01 |
| 6 | අභයගිරි විහාරය | 0.09 |
| 7 | අබයගිරිය ස්ථූපය | 0.25 |
| 8 | අබයගිරි විහාරය | 0.71 |
| 9 | ලංකාරාම විහාරය | 0.31 |
| 10 | ලංකාරාම විහාරය | 1.21 |
| 11 | මිරිසවැටිය කාර්යාලය | 2.63 |
| 12 | මිරිසවැටිය සංඝාරාමය | 1.68 |
| 13 | ථූපාරාමය ස්තූපය | 1.79 |
| 14 | ථූපාරාමය විහාරය | 0.61 |
| 15 | සිංහ කණුව, ශ්‍රී මහා බෝධි පාර | 2.13 |
| 16 | රුවන්වැලිසෑය (වීදි ලාම්පුව) | 10.06 |
| 17 | උඩමළුව පන්සල (පරිත්ත චතුරශ්‍රය) | 0.18 |
| 18 | රුවන්වැලිසෑය විහාරය | 0.04 |
| 19 | මිහින්තලේ පන්සල | 11.83 |
| 20 | ඉසුරුමුණි රාජ මහා විහාරය | 0.01 |
| 21 | ඉසුරුමුණි මහා විහාරය | 1.34 |
| 22 | ඉසුරුමුණි විහාරය සංඝාරාමය | 0.07 |
| 23 | දිඹුලාගල පන්සල | 7.43 |
| 24 | ජේතවන ව්‍යාපෘතිය | 17.40 |
| | **එකතුව** | **79.81** |

| | | | |
|---|---|---|---|
| ඩීඩී02 | 67 | 17 | පූජනීය ස්ථානවල ශේෂ කපා හැරීම සහ නැවත සංවර්ධනය වන පාසල් (මහින්ද චින්තනය) සඳහා විදුලිය සැපයීමේ ගාස්තු කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කර ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී. |
| ඩීඩී03 | 49 | 14 | පූජනීය ස්ථානවලින් අයවිය යුතු මුදල්වලට අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත ලංවිම විසින් පියවන ලද විදුලි පරිභෝජන පිරිවැය ඇතුළත් වේ. මේ ශේෂය රජයෙන් ලැබිය යුතු වේ. මෙතෙක් මුදල් ලැබී නොමැති නිසා ශේෂය කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. |
| ඩීඩී04 | 56 | 15 | විදුලිය සැපයීම වෙනුවෙන් පූජනීය ස්ථානවලින් ලැබිය යුතු ශේෂය කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. |
| **එකතුව** | **253** | **81** | |

**(ඇ) ගෙවිය යුතු රු. බිලියන 26.67 ක ටෙන්ඩර් තැන්පතු, සුරැකුම් සහ අනෙකුත් තැන්පතු අතරින් රු. බිලියන 2.79 ක මුදලක් පියවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන වසර 5 කට වැඩි කාලයක් තිසිසේ හිඟව පැවතුණි. තවද, ඉහත වසර 5 ට වැඩි ශේෂය අතරින් රු. මිලියන 1,312.94 ක් සහ රු. මිලියන 2.57 ක් හෝ සියයට 47 ක් පිළිවෙලින් බෙදාහැරීමේ අංශය 01 සහ ප්‍රධාන කාර්යාලයේ ප්‍රාග්ධන කාර්යයන් සඳහා ලැබුණු පාරිභෝගික තැන්පතු නියෝජනය කරයි. කෙසේ වෙතත් අදාළ ප්‍රාග්ධන කාර්යයන් අවසන් කර තිබේද නැද්ද යන්න තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් ලැබී නොතිබුණි.**

<table>
<tr><td>අංශය</td><td>මුදල (රු.) මිලියන</td><td>පිළිතුරු</td></tr>
<tr><td>ඩීඩී01</td><td>1,469</td><td>
<table>
<tr><th>විස්තර</th><th>එකතුව</th></tr>
<tr><td>ප්‍රාග්ධන කාර්යයන් සඳහා පාරිභෝගික තැන්පතු</td><td>1,312,944,129.41</td></tr>
<tr><td>ආපසු ගෙවිය හැකිය ටෙන්ඩර් තැන්පතු</td><td>14,360,860.92</td></tr>
<tr><td>නීතිවිරෝධී විදුලි පරිභෝජනය සඳහා උසාවි මගින් අයකර ගැනීම්</td><td>36,236,584.97</td></tr>
<tr><td>වෙනත් විවිධ තැන්පතු</td><td>59,124,355.19</td></tr>
<tr><td>ජී.ඩී. තැන්පතු</td><td>46,466,640.85</td></tr>
<tr><td></td><td>1,469,132,571.34</td></tr>
</table>
ඉහත සඳහන් වසර 5 කට වැඩි කාලයක් තිස්සේ ගෙවිය යුතු හිඟ ටෙන්ඩර් තැන්පතු, ආරක්ෂක සහ අනෙකුත් තැන්පතුවලින් ඩීඩී1 රු. බිලියන 1,469 නියෝජනය කරයි.
සාමාන්‍යයෙන්, පාරිභෝගිකයාගේ/තැන්පතුකරුගේ ඉල්ලීම මත ඉහත තැන්පතු ආපසු ගෙවනු ලබයි. ඉල්ලීම් කළ පසු එම තැන්පතු මුදල් ආපසු ලබා දීමට කටයුතු කරනු ඇත. මීට අමතරව, ප්‍රාග්ධන කාර්යයන් අවසන් කර වත්කම් වෙත මාරු කළ පසු, ප්‍රාග්ධන කාර්යයන්ට එරෙහිව තැන්පතු නිරවුල් වේ.
</td></tr>
<tr><td>ඩීඩී02</td><td>415</td><td>(පී ඇන්ඩ් එච්එම්) ශාඛාව විසින් හසුරුවන ව්‍යාපෘතිවලින් වසර 5 කට වැඩි තැන්පතු බොහොමයක් පිළිබිඹු වන අතර අනාගතයේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.</td></tr>
<tr><td>ඩීඩී03</td><td>798</td><td>සේවා ප්‍රධාන තැන්පතු: පිරිවැය ගෙවා ඇති ඉතිරි ඉදිකිරීම් කාර්යයන් අවසන් වූ පසු, තැන්පතුව පාරිභෝගික දායකත්වයට මාරු කරනු ඇත.<br>ටෙන්ඩර් තැන්පතු: සැපයුම්කරුගේ ඉල්ලීම මත පමණක් සැපයුම්කරුවන්ට මුදල් ආපසු ගෙවනු ඇත.</td></tr>
<tr><td>ඩීඩී04</td><td>0.032</td><td>මෙම තැන්පතු තෙවන පාර්ශවයන් විසින් සිදු කර ඇති තැන්පතු නියෝජනය කරන අතර අදාළ තෙවන පාර්ශවයේ ඉල්ලීම මත පමණක් මෙම තැන්පතු ආපසු ගෙවනු ඇත.</td></tr>
</table>

<table>
<tr><td>සම්ප්‍රේෂණය</td><td>57</td><td>2022/12/312 දිනට ගෙවිය යුතු මුළු තැන්පතු රු. මිලියන 67.24 ක් වන අතර රු. මිලියන 57.76 ක් වසර 5 කට වැඩි කාලයක් තිස්සේ පවතී. පද්ධතියට කිසියම් අලුත්වැඩියාවක් හඳුනාගෙන ඇති විට සහ අවශ්‍ය වන විට භාවිතා කිරීම සඳහා කැළණිතිස්ස 132 KV ග්‍රිඩ් උපපොළේ ස්ථාපනය කර ඇති දෝෂ සහිත බැටරි බැන්ක් පද්ධතියේ කිසියම් අනාගත නිවැරදි කිරීම් වෙනුවෙන් ව්‍යාපෘති අංශයෙන් සම්ප්‍රේෂණ අංශය වෙත මාරු කරන ලද රු. මිලියන 52.7 ක තැන්පතුවක් වසර 5 කට වැඩි ශේෂය තුළ ඇතුළත් වේ. වසර 5 කට වඩා වැඩි කාලයක් තිස්සේ තැන්පතුවල ඇති ශේෂයන් සම්බන්ධයෙන් ගනුදෙනු සාධාරණකරණය කිරීමෙන් පසු අනාගතයේදී තැන්පතු ගිණුම නිරවුල් කිරීමට පියවර ගනු ඇත.</td></tr>
<tr><td>ජනන</td><td>3</td><td>ජනන අංශයේ ගිණුම්වල වර්ෂ 5 ට වැඩි ටෙන්ඩර් තැන්පතු ශේෂය රු. මිලියන 3.6 ක් පමණක් වේ. 2023 වර්ෂය තුළ මෙම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.</td></tr>
<tr><td>වත්කම් කළමනාකරණය</td><td>16</td><td>වත්කම් කළමනාකරණය අංශයේ වර්ෂ 5 ට වැඩි ගෙවිය යුතු තැන්පතු මුදල වන රු. 16,033,950 ක් DGM(W&AS) ඒකකයට අයත් වන අතර එය ප්‍රධාන ඉංජිනේරු (A/C) ඒකකය විසින් මහ රෝහලෙන් A/C ස්ථාපනය කිරීම වෙනුවෙන් ලබා ගෙන ඇත. කෙසේ වෙතත්, මහ රෝහල විසින් A/C සවි කිරීම සඳහා අදාළ ගොඩනැගිල්ල/ ඉඩ ලබා දී නොමැත.</td></tr>
<tr><td>ව්‍යාපෘති</td><td>2</td><td>මෙම තැන්පතු බොහොමයක් AGM (ව්‍යාපෘති) අංශය පිහිටුවීමේදී සම්ප්‍රේෂණ අංශයෙන් මාරු කර ඇති අතර සමහරක් කේතකරණ දෝෂ වේ. 2023 වර්ෂය තුළදී මෙම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.</td></tr>
<tr><td>මූලස්ථානය</td><td>32</td><td>තැන්පතුවල විස්තර සහ තැන්පතුවල කාලසීමාව අනුව, ගනුදෙනුවේ ස්වභාවය හඳුනාගෙන ඇති අතර ඊළඟ වර්ෂයේදී ඒ සඳහා ප්‍රතිකර්ම සිදු කරයි.
<table>
<tr><th>විස්තරය</th><th>වටිනාකම (රු.)</th><th>වර්ෂ 5 සහ ඊට වැඩි</th></tr>
<tr><td>L 5610 පාරිභෝගික තැන්පතු * ප්‍රාග්ධන කාර්යයන්</td><td>2,568,099</td><td>2,568,099</td></tr>
<tr><td>L 5640 ටෙන්ඩර් තැන්පතු</td><td>1,978,194</td><td>468,694</td></tr>
<tr><td>L 5660 විවිධ තැන්පතු</td><td>273,626</td><td>273,626</td></tr>
<tr><td>L 5650 නීති විරෝධී විදුලිය සඳහා උසාවි අයකර ගැනීම්</td><td>28,890,558</td><td>28,890,558</td></tr>
<tr><td>එකතුව</td><td>33,710,477</td><td>32,200,977</td></tr>
</table>
<u>පාරිභෝගික තැන්පතු - ප්‍රාග්ධන කාර්යයන්</u><br>
පොළොන්නරුව ව්‍යාපෘතියේ භූගත කේබල් විදුලි ආලෝකකරණයේ දෙවන අදියර සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලින් රු. 3,426,522.75 ක් 2017.01.18 දින ලැබී ඇත. DGM (R&D) වෙතින් සම්පූර්ණ කිරීමේ වාර්තා ලබා ගැනීමෙන් පසු ශේෂය මාරු කළ යුතුය.<br>
<u>ටෙන්ඩර් තැන්පතු සහ විවිධ තැන්පතු</u><br>
මෙම ටෙන්ඩර් තැන්පතු සහ විවිධ තැන්පතු අතරින් වසර 5 කට වැඩි මුදල ආදායම් ප්‍රකාශයට ගැනීමට කටයුතු කරනු ඇත.<br>
<u>නීති විරෝධී විදුලිය සඳහා උසාවි අයකර ගැනීම්</u><br>
නීති විරෝධී විදුලිය සඳහා උසාවි අයකර ගැනීමේ මුදල වන රු. 28,890,558 ක් අදාළ පළාත්වලට මාරු කිරීම සඳහා විස්තර යැවීමට විමර්ශන කළමණාකරුට දන්වා ඇත.</td></tr>
<tr><td>එකතුව</td><td>2,794</td><td></td></tr>
</table>

**(ඈ) රු. මිලියන 12.34 ක අසාමාන්‍ය බැර ශේෂයක් විමර්ශනය කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන බෙදාහැරීමේ අංශය 01 හි ඉතිරිකිරීමේ ගිණුමේ පැවතුණි. කෙසේ වෙතත්, අදාළ බැංකු තහවුරු කිරීම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.**

මෙම මුදල මහජන බැංකුව විසින් SESRIP ව්‍යාපෘතියේ සැපයුම්කරුවෙකු සඳහා ටෙලිග්‍රාෆික් හුවමාරු සඳහා අය කරන ලද කොමිස් මුදල ආපසු ගෙවීම නියෝජනය කරයි. බැංකු තහවුරු කිරීමක් දැනටමත් අප විසින් ඉල්ලා ඇත. තවද, එම මුදල 2023 මැයි මාසයේදී ගිණුම් පොත්වලින් නිරවුල් කිරීමට කටයුතු කර ඇත.

**(ඉ) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් 2013/14 තක්සේරු වර්ෂය සඳහා වන උද්දේශිත ලාභාංශ (deemed dividend) බදුවලට අදාළව රු. බිලියන 1.27 ක් දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවට පියවා නොතිබුණි.**

1985 අංක 56 දරන පනත මගින් සංශෝධිත 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 33 (1) (ඇ) වගන්තියට අනුව සහ ඉන් පසුව සිදු කරන ලද සංශෝධන අනුව, එම පනතේ 33 (1) අ වගන්තිය යටතේ ගෙවිය යුතු බද්දෙන් අඩු කිරීමෙන් පසුව රාජ්‍ය සංස්ථා එහි ඉතිරි ලාභයෙන් සියයට 25 ට සමාන මුදලක් ගෙවීමට බැඳී සිටී. ඒ අනුව, ගිණුම්කරණ ලාභය මත පදනම්ව උද්දේශිත ලාභාංශ බද්ද තක්සේරු කළ යුතු බවට ලංවිම කළ ඉල්ලීම නොසලකා 2010/2011 තක්සේරු වර්ෂය දක්වා බදු අරමුණු සඳහා ගලපන ලද ලාභය මත පදනම්ව උද්දේශිත ලාභාංශ බද්ද සඳහා ලංවිම තක්සේරු කර ඇත. කෙසේ වෙතත්, 2013/2014 තක්සේරු වර්ෂය සඳහා ලංවිම ගිණුම් ලාභය රු. 16,133,182,036 ක් වූ අතර බදු අය කළ හැකි ව්‍යාපාර අලාභය රු. 8,913,400,992 කි. එම තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලංවිම බදු ගොනුව විමර්ශනයක් සඳහා ගෙන ඇති අතර මුළු බදු අය කළ හැකි ආදායම රු. 1,265,020,130 ක් සහ ලංවිම එකඟ වූ එම බදු අය කළ හැකි ආදායම මත බදු රු. 354,208,156 ක් ලෙස ප්‍රකාශ කරමින් 2016-05-30 දිනැති අංක ITA 16300500067 V2 දරන තක්සේරුවක් නිකුත් කර ඇත. කෙසේ වෙතත්, එම තක්සේරුවේදීම ගිණුම්කරණ ලාභය මත පදනම්ව රු. 3,585,289,319 ක උද්දේශිත ලාභාංශ බදු වගකීම තීරණය කර ඇත. ගිණුම් ලාභය මත පදනම් වූ උද්දේශිත ලාභාංශ බද්ද සඳහා පෙර වසරවල තක්සේරු කිරීම්වලට පටහැනිව උද්දේශිත ලාභාංශ බදු ගණනය කිරීමේ පදනම වෙනස් කර ඇති බැවින් එයට ලංවිම එකඟ නොවීය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2013-01-30 දින නිකුත් කරන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උද්දේශිත ලාභාංශ බදු නිර්ණය මත පදනම්ව උද්දේශිත ලාභාංශ බද්ද තක්සේරු කර ඇති අතර එය 2007/2008 තක්සේරු වර්ෂයේ සිට ක්‍රියාත්මක විය. උද්දේශිත ලාභාංශ බද්ද තීරණය කිරීමේදී රාජ්‍ය සංස්ථා සඳහා ගිණුම්කරණ ලාභය යොදා ගැනීමේ නීතිමය හේතු නිරවුල් කිරීම සඳහා ලංවිම නිලධාරීන් සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සාකච්ඡා කිහිපයක් සිදු කර ඇත. සාකච්ඡා කිහිපයකින් පසුව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිර්ණයට යටත්ව ගිණුම්කරණ ලාභය මත පදනම්ව තක්සේරු කරන ලද උද්දේශිත ලාභාංශ බදු වගකීම 2007/2008 තක්සේරු වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි ලංවිමට යෙදිය යුතු බවටත් බදු සඳහා ගලපන ලද ලාභය මත ගෙවන ලද උද්දේශිත ලාභාංශ බද්ද ගිණුම්කරණ ලාභය මත පදනම්ව 2009/2010 සහ 2010/2011 තක්සේරු වර්ෂ සඳහා නැවත ගණනය කළ යුතු බවටත් ගලපන ලද ලාභය මත පදනම්ව වැඩිපුර ගෙවූ මුදල ලංවිම වෙත ආපසු ගෙවිය යුතු බවටත් ලංවිම පිළිගෙන ඇත. ඒ අනුව, විමර්ශන ශාඛාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් විසින් ඉල්ලා ඇති පරිදි 2009/2010 සහ 2010/2011 තක්සේරු වර්ෂ සඳහා අපේක්ෂිත මුදල් ආපසු ගෙවීමෙන් පසු ගෙවිය යුතු මුදල් සඳහා ශුද්ධ පියවීම් සැලැස්මට එකඟ විය. අපගේ ඉල්ලීම පරිදි 2009/2010 තක්සේරු වර්ෂය සඳහා බදු ආපසු ගෙවීමේ (Tax Refund) දැන්වීම ජනනය කරන ලද නමුත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එය අවසන් කර නොමැත. පසුව බදු ආපසු ගෙවීම සම්බන්ධයෙන් අප කළ විමසීමට ප්‍රතිචාර වශයෙන් 6වී ඒකකයේ කොමසාරිස්වරයා විසින් 2017-10-31 දිනැති ලිපිය මගින් බදු ආපසු ගෙවීමේ ඉල්ලීම සිදු කරන විටත් අදාළ කාල සීමාව ඉක්මවා ඇති බැවින් (Time barred) 2009/2010 සහ 2010/2011 තක්සේරු වර්ෂ සඳහා බදු ආපසු ගෙවීමක් ලබා දිය නොහැකි බව ලංවිමට දැනුම් දී ඇත. 2007/2008 සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිර්ණයට අනුව ගිණුම්කරණ ලාභය මත පදනම්ව උද්දේශිත ලාභාංශ බදු ගණනය කිරීම සහ 2013/2014 සිට ලංවිම වෙත එම නිර්ණයම යෙදීමෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විසින්ම ආරවුලක් නිර්මාණය කර ඇති බැවින් ආපසු ගෙවීමේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තීරණයට ලංවිම එකඟ නොවේ. 2013/2014 සඳහා තක්සේරුව 2016-05-30 දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති අතර එම අවස්ථාවේදී 2009/2010 සහ 2010/2011 තක්සේරු වර්ෂ සඳහා උද්දේශිත ලාභාංශ බදු වැඩිපුර ගෙවීම සඳහා බදු ආපසු ගෙවීමේ ඉල්ලීම ඉදිරිපත් කිරීමේ කාල සීමාව අවසන් විය. 2016-05-30 දින 2013/2014 තක්සේරු වර්ෂය සඳහා උද්දේශිත ලාභාංශ බදු තක්සේරුව නිකුත් කිරීම හේතුවෙන් ආරවුලක් ඇති වූ බැවින් එය ලංවිම පාලනයේ නොතිබුණි. 2022 මාර්තු මාසයේදී ලංවිම විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයාට මෙම ගැටලුව පැහැදිලි කරමින් ලිපියක් යවා ඇති අතර ගැටලුව ඉක්මනින් විසඳන ලෙස ඉල්ලා ඇත.

තවද, උද්දේශිත ලාභාංශ බදු ගැටලුව සම්බන්ධයෙන් 2023.08.11 දින ලංවිම හා දේශීය ආදායම් නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රැස්වීමක් පවත්වා ඇත. එම රැස්වීමේ දී ගනු ලැබූ තීරණයට අනුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ලිපියක් යවමින්, අදාළ කාලසීමාවන් සඳහා ලංවිමේ උද්දේශිත ලාභාංශ බදු තක්සේරු කිරීම සඳහා බදු අය කළ හැකි ලාභයේ ස්ථාවර පදනමක් භාවිත කරන ලෙසත් ලංවිමේ උද්දේශිත ලාභාංශ බදු තක්සේරුව නැවත සලකා බලන ලෙසත් නිර්දේශ කර ඇත.

**(ඊ) 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 230.63 ක ගල් අඟුරු තොග හිඟයක් (මෙට්‍රික් ටොන් 2,161.98) ආදායම් ප්‍රකාශනයට ගෙන තිබුණි. 2022 නොවැම්බර් 19 වැනි දින සිදු කරන ලද ගල් අඟුරු තොග සමීක්ෂණයට අනුව, ගල් අඟුරු තොග සමීක්ෂණය සිදු කරන ලද කාල සීමාව තුළ පැවති අධික වර්ෂාපතනය හේතුවෙන් ගල් අඟුරු අංගනයේ ජල අන්තර්ගතය සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවතීම නිසා මෙට්‍රික් ටොන් 1,046.32 ක අතිරික්ත ගල් අඟුරු තොගයක් පැවතුණි. ඒ අනුව, ගල් අඟුරුවල සාමාන්‍ය ඝනත්වයේ සුළු වැඩිවීමක් සිදු විය. එබැවින්, මෙම වර්ෂයේ ගල් අඟුරුවල සාමාන්‍ය ඝනත්වය වෙනුවට පසුගිය වර්ෂයේ ගල් අඟුරුවල සාමාන්‍ය ඝනත්වය යොදා ගනිමින් භෞතික ගල් අඟුරු තොගය ගණනය කිරීමට සමීක්ෂණ කමිටුව තීරණය කර තිබුණි. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට මෙට්‍රික් ටොන් 2,161.98 ක ගල් අඟුරු තොග හිඟයක් පැවතුණි. කෙසේ වෙතත්, විශාල ගල් අඟුරු තොගයක් සත්‍යාපනය කිරීම සඳහා ඝන මීටරයකට ගල් අඟුරුවල සාමාන්‍ය ඝනත්වය මැනීම සඳහා වළවල්වලින් කැටම් කරන ලද ගල් අඟුරු කිලෝග්‍රෑම් 35 ක් පමණක් යොදා ගෙන තිබුණු නිසා පසුගිය වර්ෂයේ ගල් අඟුරුවල සාමාන්‍ය ඝණත්වයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.**

2021 ගල් අඟුරු අංගනයේ තොග සත්‍යාපනයේ දී, මනින ලද ගල් අඟුරු අංගන ප්‍රදේශයේ මතුපිට බොහෝ දුරට සමාන, ඒ හා සමානව සංයුක්ත සහ සමජාතීය විය. තවද, ක්ෂේත්‍ර ඝනත්වය මැනීම සඳහා සිදු කරන ලද ක්‍රමය ඉතා නිවැරදි විය. එබැවින්, ස්ථානයේ ඝනත්වය මැනීම සඳහා කැණීම් කළ ප්‍රමාණය (කිලෝ ග්‍රෑම් 35) ප්‍රමාණවත් ලෙස සලකනු ලැබීය. ගල් අඟුරු අංගනයේ මුළු ප්‍රදේශය පුරා ගල් අඟුරු මෙ.ටොන් 114,290 ක් (මෙ.ටොන් 85,358 ක භාවිතයට ගත නොහැකි (deaf) ගල් අඟුරු ඇතුළුව) පැතිර තිබුණි. එබැවින්, විකල්ප 2 ලෙස 2022 දී ගල් අඟුරු ප්‍රමාණය ගණනය කිරීම සඳහා 2021 වර්ෂයේ සාමාන්‍ය ගල් අඟුරු ඝනත්වය යොදා ගෙන ඇත.

**(උ) මණ්ඩලයේ වාර්තාවලට අනුව, හරිත බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැන්වීමේ ආයෝජන වැඩසටහන (ණය වාරික 1) සහ හරිත බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැන්වීමේ ආයෝජන වැඩසටහන (ණය වාරික 2) සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළදී ලද මුළු ණය මුදල රු. මිලියන 6,253.39 ක් විය. කෙසේ වෙතත්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව එය රු. මිලියන 4,488.06 ක් ලෙස දක්වා තිබුණි. එබැවින්, එකතුව රු. මිලියන 1,765.33 ක වෙනසක් නිරීක්ෂණය විය.**

මෙම වෙනස හේතු තුනක් නිසා වේ.

1. 2022 හි ගිණුම්ගත කළ 2021 වර්ෂයේ ණය මුදල් ලැබීම්වල විනිමය අනුපාත වෙනස ලංවිම විසින් අරමුදල් නියෝජිතායතනයේ තහවුරු කිරීම් මත පදනම්ව ණය මුදල් ලැබීම් (disbursement) ගිණුම් ගත කර ඇත. 2021 දී ලංවිම විසින් මහ බැංකු විනිමය අනුපාතිකය මත පදනම්ව AFD වෙතින් ලද ණය මුදල් ලැබීම් ගිණුම් ගත කර ඇති අතර 2021 සඳහා ගිණුම් අවසන් කිරීමෙන් පසුව 2021 වර්ෂය සඳහා ERD හි (විදේශ සම්පත් දෙපාර්තමෙන්තුව) ණය මුදල් ලැබීම් වාර්තාවල එම ණය මුදල් ලැබීම් යාවත්කාලීන කර ඇත. එබැවින්, 2022 ජනවාරි මාසයේ දී ලංවිම හි මූල්‍ය ප්‍රකාශනවල රු. 23,082,400 ක විනිමය අනුපාත වෙනස ගිණුම්ගත කර ඇත.

2. 2022 මාර්තු මාසයේදී යුරෝ 6,000,000 (රු. 1,754,160) AFD ණය මුදල් ලැබීම් 2022 ERD ණය මුදල් ලැබීම් වාර්තාවල යාවත්කාලීන කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ සහ විස්තීර්ණ ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා 2022 මහ බැංකු විනිමය අනුපාත මත පදනම්ව මෙම ණය මුදල් ලැබීම් ලංවිම විසින් ගිණුම්ගත කර ඇත.

3. තිරසාර බලශක්ති අධිකාරිය විසින් හසුරුවන ලද රු. 11,915,158 ක ණය මුදල් ලැබීම් ලංවිම විසින් වාර්තා කර නොමැත. ලංවිම ව්‍යාපෘතිය සඳහා භාවිතා කරන ලද ණය මුදලෙන්ම එය ලබාදී ඇතත් එය ලංවිම ව්‍යාපෘතිවල විෂය පථය යටතට නොවැටෙන බැවින් ලංවිම මූල්‍ය ප්‍රකාශනවල ගණුදෙනුව ගිණුම්ගත කිරීමට ලංවිමට නොහැක. වාර්තා කරණ ආයතනයේ මූල්‍ය කාර්ය සාධනයට අදාළ ගනුදෙනු වාර්තා කළ යුතු බව සඳහන් එල්.කේ.ඒ.එස් 01, සංකල්පීය රාමුව මත පදනම්ව ලංවිම මෙය ගිණුම්ගත කර නොමැත.

| **සැසඳීම** | **රු.මිලියන** |
|---|---|
| **ලංවිම මූල්‍ය ප්‍රකාශනවලට අනුව ණය මුදල් ලැබීම්** | 6,253.39 |
| අඩු කළා : 2022 දී ලංවිම මූල්‍ය ප්‍රකාශනවල සටහන් වූ විනිමය වෙනස | (23.08) |
| අඩු කළා : ERD වාර්තා කර නොමැති ණය මුදල් ලැබීම් | 1,754.16) |
| එකතු කළා : ලංවිම විසින් වාර්තා කර නොමැත තිරසාර බලශක්ති අධිකාරියේ ණය මුදල් ලැබීම් | 11.91 |
| ERD අනුව ණය මුදල් ලැබීම් | 4,488.06 |

**(ඌ) 2023 පෙබරවාරි 01 දිනැති අංක 3/0154/504/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට සහ 2023 පෙබරවාරි 17 දිනැති අංක. පීඊඩී/1/සීඊබී/02/11(ස) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව, ව්‍යාපෘති හතකින් ලද රු. බිලියන 60.97 ක් වූ ණය මුදල් රජයෙන් ලද ස්කන්ධය ලෙස මාරු කර තිබුණි. ඉහත ණයවලින් හබරණ වේයන්ගොඩ සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතියට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට ලද රු. මිලියන 13,736.28 ක් භාණ්ඩාගාරය විසින් රජයේ ස්කන්ධය ලෙස මාරු කර තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලයේ වාර්තාවලට අනුව, රජයෙන් ලද ස්කන්ධය ලෙස රු. මිලියන 13,729.29 ක් පමණක් මාරු කර තිබුණි. එබැවින්, රු. මිලියන 6.99 ක වෙනසක් නිරීක්ෂණය විය.**

ERD ණය මුදල් ලැබීම් වාර්තා මත පදනම්ව විදේශ මුදල් සෘජු ණය මුදල් ලැබීම් ලංවිම වාර්තා කරයි. කෙසේ වෙතත්, දේශීය මුදල් කොන්ත්‍රාත් ගෙවීම් අතුරු ගෙවීම් සහතිකයේ දක්වා ඇති දේශීය මුදල් ප්‍රමාණය අනුව සටහන් කරයි. මහ බැංකුව අතුරු ගෙවීම් සහතිකයේහි සඳහන් නියම වටිනාකම කොන්ත්‍රාත්කරුට ප්‍රේෂණය කරන බැවින් වෙනත් කිසිදු වටිනාකමක් වාර්තා කිරීමට ලංවිමට හැකියාවක් නොමැත. එබැවින්, දේශීය මුදල් ගෙවීම් සඳහා ණය මුදල් ලැබීම් ද්වාරයෙහි නිවැරදි දේශීය මුදල් අගය උඩුගත කරන ලෙස ERD වෙත දැනුම් දිය යුතුය. එබැවින්, ණය මුදල් ලැබීම් සඳහා ප්‍රේෂණ උපදෙස් ලංවිමට ලැබී ඇති බැවින් ණය මුදල් ලැබීම් උඩුගත නොකිරීම සම්බන්ධයෙන් ERD වෙතින් විමසිය යුතුය.

මේ හේතුවෙන් ERD සහ ලංවිම අතර රු. මිලියන 6.99 ක වෙනසක් සිදුවී ඇත. භාණ්ඩාගාරය විසින් ERD ශේෂයන් මාරු කර ඇති නමුත් ලංවිම විසින් වාර්තා කරන ලද තථ්‍ය ණය ශේෂය ලංවිම විසින් ස්කන්ධයට මාරු කර ඇත.

**(එ) මණ්ඩලය විසින් වසර ගණනාවක් තිස්සේ ලංකා විදුලි පුද්ගලික සමාගම වෙත විදුලිය විකිණීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඉන්ධන මිලදී ගැනීම සිදු කළ ඇතත්, මෙම ආයතන සමග සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා එම පාර්ශව දෙක සමග එළඹී විකුණුම් හා මිලදී ගැනීමේ ගිවිසුම් නොතිබුණි.**

බලශක්ති විකුණුම් ගිවිසුම 2016 දී කමිටුවක් විසින් සකස් කර ඇත. ලෙකෝහි සාමාජිකයෙකු එම කමටුවට ඇතුළත් වූ අතර සාමාජිකයා කෙටුම්පත් ගිවිසුමට අත්සන් කර නොමැත. එබැවින්, 2022 දී නව කමිටුවක් පත් කරන ලද අතර බෑකඩ හි සාමාන්‍යාධිකාරීවරයාගේ අදහස් දැක්වීම සඳහා ඔහු වෙත කෙටුම්පත් බලශක්ති විකුණුම් ගිවිසුම ඉදිරිපත් කර ඇත. ලෙකෝ වෙතින් අදහස් ලැබීමෙන් පසු, එම අදහස් සාකච්ඡා කිරීම සඳහා PUCSL සහ ලෙකෝ සමඟ ඒකාබද්ධ රැස්වීමක් පවත්වා ඇත. ඒවා අදාළ පාර්ශ්ව විසින් සමාලෝචනය කරමින් පවතින අතර අවසන් කෙටුම්පත් වාර්තාව ලැබුණු විගස ලෙකෝ වෙත යවනු ඇත.

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගිවිසුම**

නුදුරු අනාගතයේදී තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමවේදය භාවිතා කරමින් ඉන්ධන ලබා ගැනීමට නියමිත බැවින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ ගිවිසුමක් අවශ්‍ය නොවේ.

**(ඒ) උතුරු වසන්තය ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයේදී හඳුනාගත් රු. මිලියන 37.27 ක තොග හිඟය සම්බන්ධයෙන් මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ශාඛාව මගින් විශේෂ පරීක්ෂණයක් සිදු කර තිබුණි. පසුව. විශේෂ කමිටුවක් විසින් කරන ලද විමර්ශනයට අනුව, එම හිඟය රු. මිලියන 46.33 ක් වන බවට අනාවරණය වී ඇති අතර එය අදාළ ගබඩා භාරකරුගෙන් ලැබිය යුතු බවට ගිණුම්ගත කර තිබුණි. කෙසේ වෙතත්, කිසිදු අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් ලබා නොගෙන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාගේ (උතුරු) සහ අතිරේක සාමාන්‍යාධිකාරීවරයාගේ අනුමැතිය මත පමණක් 2019 සිට 2020 දක්වා කාලය තුළදී එම මුදල රු. මිලියන 8.29 ක් දක්වා කපා හැර තිබුණි. එසේ වුවද, වසර අවසානයේදී පවා රු. මිලියන 46.33 ක ඉහත සඳහන් තොග හිඟය වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට අසමත් වී තිබුණි.**

2014 වසරේ විශේෂ විමර්ශනයක් සිදු කර ඇති අතර එමගින් උතුරු වසන්තය ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 46.33 ක තොග හිඟයක් හඳුනාගෙන ඇත. මේ සම්බන්ධයෙන් නඩු අංකඃ බී/164/15 යටතේ යූ.පී. ගුණරත්න මහතාට එරෙහිව නීතිමය පියවර ගෙන ඇති අතර පසුව නඩු අංක ඝඞ/2980/20 සම්බන්ධ මුදල හේතුවෙන්.එම නඩුව වවුනියාව මහාධිකරණයට මාරු කර ඇත. මෙම නඩුවේ තීන්දුව ප්‍රකාශ වූ අතර යූ.පී. ගුණරත්න වරද පිළිගෙන ඇත. එබැවින්, යූ.පී. ගුණරත්න මහතාට (උතුරුවසන්තය ව්‍යාපෘතියේ හිටපු ගබඩා භාරකරු) එරෙහිව සිවිල් අධිකරණයේ නඩුවක් මගින් ඉතිරි අලාභ අයකර ගැනීමට ලංවිම නීති ශාඛාව පියවර ගත යුතුය.

තවද, වත්මන් තත්ත්වය දැනුම් දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් සකස් කර ඉදිරිපත් කරන ලද අතර එය 2023-08-28 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සාකච්ඡාවට ගෙන ඇති අතර අතිරේක සාමාන්‍යාධිකාරී (ඩීඩී1), ප්‍රධාන නීති නිලධාරී සහ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගෙන් පැහැදිලි කිරීම් කිහිපයක් ඉල්ලා ඇත.

**(ඔ) 2020 වර්ෂයේදී හෙයියන්තුඩුව ගබඩාවේ තොග සත්‍යාපනය කිරීමේදී හඳුනාගත් රු. මිලියන 12.65 ක තොග හිඟය සම්බන්ධයෙන් ගබඩා භාරකරු සහ තවත් විදුලි අධිකාරීවරුන් දෙදෙනෙකු පිළිවෙලින් රු. මිලියන 6.47 ක් සහ රු. මිලියන 2.49 ක් සඳහා වගකිව යුතු බව මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය සිදුකළ විශේෂ විමර්ශනයට අනුව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, 2023 පෙබරවාරි මාසය අවසන් වන විටත් විධිමත් පරීක්ෂණයක් පවත්වා ඔවුන්ගෙන් පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.**

හෙයියන්තුඩුව ගබඩාවේ තොග හිඟය වූ රු. මිලියන 12.65 ක් සම්බන්ධයෙන්, AGM (DD1) විසින් මෙම කාරණය විමර්ශන කමිටුවට යොමු කර ඇත. වාර්තාවේ නිර්දේශ මත පදනම්ව, ලංවිම සාමාන්‍යාධිකාරී විසින් මෙම කාරණය අභ්‍යන්තර විගණන ශාඛාව වෙත යොමු කර ඇත. අභ්‍යන්තර විගණන ශාඛාව විසින් පරීක්ෂණයක් පවත්වා වාර්තාව ලංවිම සාමාන්‍යාධිකාරී වෙත ඉදිරිපත් කර ඇත. (2022.11.03 දිනැති අංක. CEB/CIAI-02/2022-03).

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

**(ඕ) විධිමත් පරීක්ෂණය අවසන් වී තිබියදීත්, වත්කම් කළමනාකරණ අංශයේ (බලාගාරය) 2006 නොවැම්බර් 20 සිට 2012 පෙබරවාරි 20 දක්වා කාලය තුළ සිදුවී ඇති රු. මිලියන 3.67 ක තොග හිඟයට වගකිව යුතු පුද්ගලයාට එරෙහිව මණ්ඩලය විසින් වර්ෂය අවසන් වන විටත් කඩිනම් පියවර ගෙන නොතිබුණි.**

සාක්ෂි තිබේද යන්න සහ කිසියම් කාල සීමාවන් තිබේද යන්න යන දෙකම සලකා බලා මෙම කාරණය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඇති හැකියාව පිළිබඳව නීතිපතිවරයාගෙන් ලිඛිත පැහැදිලි කිරීමක් ලබා ගන්නා ලෙස ලංවිම විගණන කමිටුව විසින් සාමාන්‍යාධිකාරීවරයාට නියෝග කර ඇත.

**(ක) පරීක්ෂණය සඳහා පත්කළ කමිටුව නිර්දේශ කර පරිදි අලාභ අයකර ගැනීමෙන් තොරව වත්කම් කළමනාකරණ අංශයේ රු. මිලියන 3.79 ක තොගය හිඟය සඳහා වගකිය යුතු නිලධාරියකුට 2011 ඔක්තෝබර් 15 වන දින විශ්‍රාම යාමට අවසර දී තිබුණි. තවද, 2022 සැප්තැම්බර් 12 වැනි දින පැවති කමිටු රැස්වීමේදී හිඟය රු. 2,537,695 ක් විය යුතු බවට තීරණය කර තිබූ අතර, මණ්ඩලයේ වැඩබලන සාමාන්‍යාධිකාරීවරයා ඔහුගේ පාරිතෝෂික සහ විශ්‍රාම වැටුප් අරමුදලින් හිඟය අයකර ගන්නා ලෙස උපදෙස් දී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් වගකිවයුතු නිලධාරියාගෙන් හිඟය අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන එම මුදල ගිණුම් පොත්වල අයනොවී පැවතී බව නිරීක්ෂණය විය.**

පාරිතෝෂික සහ විශ්‍රාම වැටුප් අරමුදලින් හිඟය අයකර ගැනීමට ලංවිම විශ්‍රාම වැටුප් අරමුදලට දන්වා ඇත. කෙසේ වෙතත්, 2023 සැප්තැම්බර් 15 වැනි දින පැවති විගණන කමිටු රැස්වීමේදී විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසිවලට අනුව සමුච්චිත විශ්‍රාම අරමුදල් ශේෂයෙන් තොග හිඟයේ වටිනාකම අයකර ගැනීම කළ නොහැකි බව පැහැදිලි විය. එබැවින්, විශ්‍රාම වැටුප් අරමුදල් නීතිරීතිවල අඩංගු විධිවිධාන සම්බන්ධයෙන් ලිඛිත පැහැදිලි කිරීමක් ලබා ගන්නා ලෙස විගණන කමිටුව විසින් නියෝග කර ඇති අතර මෙම කරුණ වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා ඉදිරි විගණන කමිටු රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ඇත.

**(ග) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බස්නාහිර උතුරු පළාත) යටතේ ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ප්‍රාදේශීය ගබඩාවේ 2014 සැප්තැම්බර් මාසයේදී හඳුනාගත් රු. මිලියන 1.15 ක තොග හිඟයට වගකිව යුතු ගබඩා භාරකරු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදු කරන ලද විධිමත් පරීක්ෂණය අවසන් කර නොතිබූ බව නිරීක්ෂණය විය.**

කොටුගොඩ මධ්‍යම ගබඩාවේ රු. 1,595,450 ක තොග හිඟය හඳුනා ගෙන ඇත. චූදිත ගබඩාකරු 2016 දී ලංවිමෙන් නෙරපා හැර ඇත. විධිමත් පරීක්ෂණ මත පදනම්ව, ඔහුගේ අර්ථසාධක ශේෂයෙන් අය විය යුතු මුදල් අයකර ගන්නා ලෙස ලංවිම සේවක අර්ථසාධක අරමුදලින් ඉල්ලා ඇත.

**(ච) බෙදාහැරීම් අංශ 02 සහ 03 ට අදාළව තොග හිඟයන් ලෙස තොග ගැලපුම් ගිණුමට අයකර තිබූ රු. මිලියන 14.98 ක් සහ රු. මිලියන 60.44 ක් 2004 වසරේ සිට විමර්ශනය කර පියවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන ගිණුම් පොත්වල පැවතුණි. කෙසේ වෙතත්, මෙම තොග හිඟය සම්බන්ධ විස්තර විගණනයට සපයා නොතිබුණි.**

වසර 5 ක් තිස්සේ තොග ගැලපුම් ගිණුමේ ඇති හිඟ ශේෂයන් නිරවුල් කිරීම සඳහා විමර්ශනය කිරීමට සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට අවශ්‍ය අනුමැතිය සහිතව කමිටුවක් පත් කරනු ඇත.

**(ජ) 2022 දෙසැම්බර් 31 දිනට ජනන අංශයේ කෙරිගෙන යන ප්‍රාග්ධන වැඩ ගිණුමේ වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ රු. මිලියන 22.42 ක් වටිනා චලනය නොවන අයිතම තිබූ බව නිරීක්ෂණය විය.**

2023 වර්ෂය තුළ එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.

**(ට) රු. බිලියන 32.54 ක මුළු පරිභෝජන කළ හැකි තොගයෙන් සියයට 6.5 ක් නියෝජනය කරන රු. බිලියන 2.12 ක්, 2022 දෙසැම්බර් 31 වන විට සෙමින් චලනය වන, චලනය නොවන සහ හානි වූ තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබූ අතර එමගින් තොග හානිවලට, රඳවා ගැනීමේ පිරිවැය වැඩි වීමට සහ වංචා සඳහා අවස්ථාවක් නිර්මාණය කිරීමට හේතු විය හැකිය. තවද, අහඹු විගණන පරීක්ෂණයට අනුව, බෙදාහැරීමේ අංශ හතරෙහි සහ වත්කම් කළමනාකරණ අංශයේ පැවති රු. මිලියන 217.7 ක් වටිනා හානි වූ සහ යල් පැන ගිය තොග අපහරණය කිරීම සඳහා 2019 සිට 2022 දක්වා අවස්ථා කිහිපයකදී අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා දී තිබියදීත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.**

| | |
|---|---|
| ඩීඩී01 | ඩීඩී 01 හි ගිණුම්වල 2022-12-31 දිනට චලනය නොවන, සෙමින් චලනය වන, යල්පැනගිය සහ හානි වූ තොග අයිතමවල වටිනාකම රු. 486,203,073.73 කි. මීට අමතරව, ඩීඩී 01 හි අතිරේක සාමාන්‍යාධිකාරීගේ උපදෙස් මත ඩීඩී 01 හි තොග මට්ටම් අවම කිරීමට අඛණ්ඩ ක්‍රියාමාර්ග ගෙන ඇත. තවද, 2023 වර්ෂය සඳහා වන ගබඩාවල වාර්ෂික සත්‍යාපනය පසුගිය සතියේ අවසන් කර ඇති අතර චලනය නොවන සහ හානි වූ තොග ඉවත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය දැනටමත් පත් කර ඇත. |

ඩීඩී02

හානි වූ සහ යල්පැනගිය තොග සඳහා එක් එක් පළාතෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව ලංවිම ක්‍රියා පටිපාටියට අනුව තොග අපහරණය කිරීමේ ක්‍රියාවලිය සිදු කරමින් ඇත. 2021/2022 ඉදිරිපත් කරන ලද අනුමත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවල තත්ත්වය පහත වගුවේ දැක්වේ.

| අංශය | විස්තරය | අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංකය | තත්ත්වය |
|---|---|---|---|
| නැගෙනහිර පළාත | නැගෙනහිර පළාතේ කල්මුනේ ගබඩා, සමන්තුරේ CSC සහ නිතුරූර් CSC හි චලනය නොවන, සෙමින් චලනය වන සහ හානි වූ තොග අපහරණය කිරීම/විකිණීම | EP/DGM/25/BP (කල්මුණේ ප්‍රදේශය) | අවසන් කර ඇත. |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ගබඩාවල සහ CSC ගබඩාවල චලනය නොවන, සෙමින් චලනය වන සහ හානි වූ තොග අයිතම අපහරණය කිරීම | EP/DGM125/ BP(ත්‍රිකුණාමලය) | අවසන් කර ඇත. |
| මඩකලපුව | නැගෙනහිර පළාතේ මඩකලපුව ප්‍රදේශයේ ගබඩා, ඒරාවූර්, වාලච්චේන, කලවංචිකුඩි, කාත්තන්කුඩි CSC ගබඩාවල චලනය නොවන, සෙමින් චලනය වන සහ හානි වූ තොග අයිතම අපහරණය කිරීම. | EP/DGM/25/ BP(මඩකලපුව) | අවසන් කර ඇත. |
| අම්පාර | අම්පාර සහ CSC ගබඩාවල චලනය නොවන, සෙමින් චලනය වන සහ හානි වූ තොග අයිතම අපහරණය කිරීම | EP/DGM/25/ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා (අම්පාර ප්‍රදේශය) | අවසන් කර ඇත. |
| DGM(EP) | නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය පළාත් ගබඩා සහ මඩකලපුව, අම්පාර පළාත් උප ගබඩාවල හානි වූ, චලනය නොවන, සෙමින් චලනය වන අයිතම අපහරණය කිරීම | EP/DGM/25/ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා | සිදු කරමින් පවතී. |
| AGM(DD-02)-DGM(EP) | නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය පළාත් ගබඩා, අම්පාර ප්‍රාදේශීය කාර්යාලයේ චලනය නොවන, සෙමින් චලනය වන සහ හානි වූ එකලා සහ තෙකලා මීටර් විකිණීම සඳහා මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට | EP/DGM/25/අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා | අවසන් කර ඇත. |
| AGM(DD-02)/ DGM(WPN) | බස්නාහිර පළාත උතුරහි පළාත් ගබඩා සහ CSC හි හානි වූ සහ භාවිතා කළ නොහැකි තොග අයිතම අපහරණය කිරීම | WPN/GM(BP) /2021/08 | කොටසක් අවසන් කර ඇත. |
| AGM(DD02)/ DGM (P&HM) -DD02 | P&HM)DD2 හි සියඹලාපේ ගබඩාවල හානි වූ, යල් පැන ගිය සහ නිෂ්ක්‍රීය තොග අයිතම අපහරණය කිරීම | DGM(P&HM)-DD02 / ගබඩා/ අපහරණය කිරීම | සිදු කරමින් පවතී. |
| AGM(DD 02)/ DGM(CP 02) | කෑගල්ල ප්‍රදේශය / මාවනැල්ල / හඟුරන්කෙත / නුවරඑළිය / නාවලපිටිය / ගිනිගත්හේන / පේරාදෙණිය යන ස්ථානවල චලනය නොවන, සෙමින් චලනය වන සහ හානි වූ තොග අයිතම අපහරණය කිරීම සහ විකිණීම DGM(CP)02)AGM(DD 02) | CP2/DGM/25/BP (නාවලපිටිය) | 2023 මාර්තු මාසයේ අපහරණය කර ඇත. |
| AGM(DD02)/ DGM(CP02) | නුවරඑළිය ප්‍රදේශයේ තවලම්තැන්න, ලිඳුල CSC හි චලනය නොවන, සෙමින් චලනය වන සහ හානි වූ තොග අයිතම අපහරණය කිරීම සහ විකිණීම | CP2/DGM/25/BP (නුවරඑළිය) | 2023 මාර්තු මාසයේ අපහරණය කර ඇත. |
| AGM(DD02)/ DGM(CP02) | හඟුරන්කෙත ප්‍රදේශයේ රිකිල්ලගස්කඩ සහ වලපනේ CSC හි චලනය නොවන, සෙමින් චලනය වන සහ හානි වූ තොග අයිතම අපහරණය කිරීම සහ විකිණීම | CP2/DGM/25/BP (හඟුරන්කෙත්) | සිදු කරමින් පවතී. |
| AGM(DD02)/ DGM(CP02) | මාවනැල්ල ප්‍රාදේශීය කාර්යාලයේ චලනය නොවන, සෙමින් චලනය වන සහ හානි වූ තොග අයිතම අපහරණය කිරීම සහ විකිණීම | CP2/DGM/25/ BP(මාවනැල්ල) | සිදු කරමින් පවතී. |
| AGM(DD 02)/ DGM(CP 02) | කෑගල්ල, තුල්හිරිය, රඹුක්කන සහ මොරොන්තොට CSC එළිය/නාවලපිටිය/ගිනිගත්හේන/පේරාදෙණිය යන ස්ථානවල චලනය නොවන, සෙමින් චලනය වන සහ හානි වූ තොග අයිතම අපහරණය කිරීම සහ විකිණීම DGM(CP-02)AGM(DD 02) | CP2/DGM/25/ BP(කෑගල්ල) | 2023 මාර්තු මාසයේ අපහරණය කර ඇත. |
| AGM(DD02)/ DGM(CP02) | පේරාදෙණිය යටිනුවර සහ ඊරියගම CSC හි චලනය නොවන, සෙමින් චලනය වන සහ හානි වූ තොග අයිතම අපහරණය කිරීම සහ විකිණීම | CP2/DGM/25/ BP(පේරාදෙණිය) | 2023 මාර්තු මාසයේ අපහරණය කර ඇත. |
| AGM(DD 02)/ DGM(CP 02) | ගිනිගත්හේන ප්‍රදේශයේ උතුරු පාලම CSC හි චලනය නොවන, සෙමින් චලනය වන සහ හානි වූ තොග අයිතම අපහරණය කිරීම සහ විකිණීම | CP2/DGM/25/BP (ගිනිගත්හේන්) | සිදු කරමින් පවතී. |

2023 වර්ෂයේ මේ දක්වා රු. 101,453,029.45 ක් වටිනා තොග අපහරණය කර ඇත.

| | | |
|---|---|---|
| මධ්‍යම පළාත 02 | - | රු.2,494,120 |
| මධ්‍යම පළාත 01 | - | රු.18,859,681.86 |
| නැගෙනහිර පළාත | - | රු.43,580,891.16 |
| බස්නාහිර පළාත උතුර | - | රු.36,518,336.43. |

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

| | |
|---|---|
| ඩීඩී03 | ඉහත ශේෂයට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇති බස්නාහිර පළාත දකුණ 2 හි රු. මිලියන 25 ක යල්පැන ගිය තොගයක් ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අංකː DD3/DGM(WPSII)/BP/2021/03 සඳහා ලැබුණු අනුමැතියට අනුව, අපහරණය කිරීමේ ටෙන්ඩර් දෙකක් ආරම්භ කර ඇත. (WPSII/T/2022/084 සහ (WPSII/T/2022/107). ඉහත සඳහන් කරන ලද ටෙන්ඩර් වැඩිම මිල ගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුවන්ට ලබා දී ඇති අතර අපහරණය කරන ලද ද්‍රව්‍යවල මුළු වටිනාකම දැනටමත් ලංවිම වෙත ගෙවා ඇත. ඉහත සඳහන් කරන ලද ටෙන්ඩර්වල යල්පැන ගිය සහ භාවිතයට ගත නොහැකි අයිතම ඉවත් කිරීම අවසන් කර අවශ්‍ය සටහන් ලෙජරයේ සිදු කර ඇත.<br>සබරගමුව පළාතේ ශේෂය අතරින්, රු. මිලියන 8.8 ක තොගයක් ලබා දී ඇති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට අනුව අපහරණය කර ඇත. (මුළු තොග පොත් වටිනාකම රු. මිලියන 9.9 කි). ඉතිරි තොග ශේෂය අපහරණය කිරීම සඳහා ටෙන්ඩර් ක්‍රියාවලිය අවසන් කර ඇත.<br>ඌව පළාත සහ මීටර විද්‍යාගාරය සඳහා අපහරණය කිරීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. |
| ඩීඩී04 | PHM - PHM ශාඛාවේ චලනය නොවන සහ හානි වූ තොග අපහරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් සකස් කරමින් පවතී. සෙමින් චලනය වන තොගයේ ඇති සමහර අයිතම ශාඛාවට සහ අනෙකුත් අංශවලට ඉදිහිට අවශ්‍ය වේ. එම නිසා, ඒවා සෙමෙන් චලනය වන තොග ලෙස තබා ගනී.<br>බස්නාහිර පළාත දකුණ1 - ශේෂයන් නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලද අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.<br>දකුණ පළාත 1 - පත් කරන ලද කමිටු විසින් ලබා දුන් අදහස් මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර විගණන කමිටු තීරණය ලැබී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබුණු පසු ක්‍රියාමාර්ග ගනු ඇත.<br>දකුණ පළාත 2 - 2021 තොග සත්‍යාපනය මත පදනම්ව අපහරණය කිරීම සඳහා අනුමැතිය ලැබී ඇති අතර ඒකක කිහිපයක් අපහරණය කිරීම අවසන් කර ඇත. 2022 දී හඳුනාගත් අයිතම සඳහා, සමීක්ෂණ මණ්ඩලය විසින් ලබා දී ඇති නිර්දේශ මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් සකස් කිරීමේ ක්‍රියාවලියේ දැන් පවතී. |

<table>
<tr><td>ජනන</td><td>රු. බිලියන 1.51 ක මුළු පරිභෝජන කළ හැකි තොගයෙන් සියයට 2.6 ක් නියෝජනය කරමින් රු. මිලියන 39.3 ක් පමණක් 2022 දෙසැම්බර් 31 දිනට ජනන අංශයේ සෙමින් චලනය වන, චලනය නොවන සහ හානි වූ තොග ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇත.<br><br>
<table>
<tr><td>ලක්විජය විදුලි බලාගාරය</td><td>මෙම අයිතමයන් සෑම වසර 05 කට වරක් සහ වසර 02 කට වරක් සිදු කරනු ලබන පිළිවෙලින් "A" මට්ටමේ හෝ "B" මට්ටමේ අලුත්වැඩියා නඩත්තුව සඳහා භාවිතා කරන බැවින් ලක්විජය විදුලි බලාගාරයේ සමහර පරිභෝජන කළ හැකි ද්‍රව්‍ය සෙමින් චලනය වන තොග වේ.</td></tr>
<tr><td>සමනල සංකීර්ණය</td><td>සෙමින් චලනය වන තොග - ශේෂයන් නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.<br>චලනය නොවන - ශේෂයන් නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.<br>යල් පැන ගිය - නිර්දේශය ලබා ගැනීම සඳහා දැනටමත් සිව් දෙනෙකුගෙන් යුත් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇත.</td></tr>
<tr><td>මහවැලි සංකීර්ණය</td><td>භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ වාර්තා එකතු කරන ලද අතර, හානියට පත්, යල් පැන ගිය සහ නිෂ්ක්‍රීය තොග අපහරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් සකස් කරනු ඇත. චලනය නොවන සහ සෙමින් චලනය වන ශේෂය පරිභෝජනය කළ හැකි තොගයෙන් සියයට 1.95 ක් නියෝජනය කරයි.</td></tr>
<tr><td>තාප සංකීර්ණය</td><td>ඉහත තොග නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී.</td></tr>
<tr><td>ලක්ෂපාන සංකීර්ණය</td><td>සෑම පිරිවැය මධ්‍යස්ථානයක් සඳහාම ත්‍රිපුද්ගල කමිටුවක් පත් කිරීම මගින් වාර්ෂික තොග සත්‍යාපනයේදී වාර්තා වන සෙමින් චලනය වන/චලනය නොවන සහ හානි වූ/යල් පැන ගිය තොග අයිතම විසඳීමට කටයුතු කර ඇත.<br>මේ සඳහා විසඳුමක් ලබා ගැනීම සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ලක්ෂපාන සංකීර්ණය) විසින් විදුලි බලාගාර ගබඩාකරුවන් සහ ස්ථාන ඉංජිනේරුවන් සමඟ රැස්වීමක් කැඳවා, ජනන අංශයේ අනෙකුත් සංකීර්ණවලට මාරු කිරීමට අවශ්‍ය ශේෂයක් තිබේ නම්, ශේෂය ඔවුන් වෙත මාරු කිරීමටත්, අමතර අයිතමයන් ඉතිරිව පවතී නම් හානි වූ සහ යල්පැන ගිය තොග ඉවත් කිරීම සඳහා ලංවිම අපහරණය කිරීමේ ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමටත් උපදේස් දී ඇත.</td></tr>
</table></td></tr>
<tr><td>වත්කම් කළමනා -කරණ</td><td>අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අංකः CW&B/CC/16/Verifi/2021 සඳහා ලද අනුමැතියට අනුව, 2022 වර්ෂයේ අවසානයේදී 2021 තොග සත්‍යාපනය මත පදනම්ව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සිවිල් වැඩ සහ ගොඩනැගිලි) ශාඛාවේ රු. 255,300.77 ක් වූ තොග සඳහා අපහරණය කිරීමේ ක්‍රියාවලිය දැනටමත් අවසන් කර ඇත.<br><br>තොග සත්‍යාපනයේ නවතම ප්‍රතිඵල මත පදනම්ව 2022-12-31 දිනට යල් පැන ගිය සහ භාවිතා කළ නොහැකි තොග ගිණුම් සඳහා වන ප්‍රතිපාදනවල ඉතිරි ශේෂයන් සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගවල තත්ත්වය පහත දැක්වේ.<br><br>■ DGM (CW&B) විසින් අපහරණය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.<br>■ DGM (W&AS) විසින් DGM (W&AS) ශාඛාවට අදාළ තොගය ගණනයේදී හඳුනාගත් හානි වූ සහ යල් පැන ගිය තොග අපහරණය කිරීමට කමිටු පත් කර ඇත.<br>■ නවතම තොග සත්‍යාපන ප්‍රතිඵල සමඟ හැකි ඉක්මනින් පියවර ගනු ඇත.</td></tr>
</table>

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

**(ඩ) මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය සිදුකළ විශේෂ විමර්ශනයට අනුව, 2022 ජූනි 09 වැනි දින මණ්ඩලයේ වෘත්තීය සමිති විසින් ගනු ලැබූ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග නිසා රන්දෙණිගල සහ රන්ටැඹේ ජලාශවලින් නිකුත් කරන ලද ජලයෙන් නිපදවිය හැකි විදුලි ඒකක පිළිවෙළින් කි.වෝ 160,000 ක් සහ කි.වෝ 35,000 ක් මණ්ඩලයට අහිමි කර ඇති බව අනාවරණය වී තිබුණි. එම නිසා, එදිනට පුද්ගලික විදුලිය මිලදී ගැනීම් සඳහා රු. මිලියන 262.6 ක අමතර වියදමක් දැරීමට මණ්ඩලයට සිදු වූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, 2023 පෙබරවාරි අවසන් වන විටත් 2022 දෙසැම්බර් 08 දින ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ දක්වා ඇති පරිදි විධිමත් පරීක්ෂණයක් පවත්වා එම අලාභය වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.**

එදින ලංවිම බලාගාරවලින් බහුතරයක් නොතිබීම හේතුවෙන්, සේවා නොලබන බර (unserved loads) අවම කරමින් පද්ධති ඉල්ලුම සැපයීමට ඊළඟට ලබා ගත හැකි අවම පිරිවැය ජනක යන්ත්‍ර හරහා විදුලිය ලබා ගැනීමට පද්ධති පාලන අංශයට සිදු විය.

**(ණ) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවීමට පියවර නොගෙන රු. බිලියන 3.15 ක වෙළඳ ගෙවිය යුතු ශේෂය වසර 3 කට වැඩි කාලයක් තිස්සේ ගිණුම් පොත්වල පැවතුණි. ඒ අතරින් රු. බිලියන 2.9 ක් සම්ප්‍රේෂණ අංශයට අදාළව මීට වසර 4 කට පෙර නොර්දන් පවර් කම්පැනි පයිවට් ලිමිටඩ් නම් තාප විදුලිබල සැපයුම්කරු වෙත ගෙවිය යුතු බවට ගිණුම්ගත කර තිබුණි. කෙසේ වෙතත්, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් පසුව නීතිපතිවරයාගෙන් ලැබුණු පැහැදිලි කිරීම් අනුව මෙම ඉන්වොයිසි පියවීමට මණ්ඩලයට වගකීමක් නොමැති බවට තීරණය කර ඇති බව නිරීක්ෂණය විය. එසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම ගෙවිය යුතු ශේෂයට අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.**

| **අංශය** | **පිළිතුරු** |
|---|---|
| ඩීඩී03 | ඩීඩී3 හි අදාළ ශේෂය බස්නාහිර පළාත දකුණ 2 විසින් අදාළ සමාගම් වෙත ගෙවිය යුතු රු. මිලියන 14.6 ක් වූ ශේෂයකින් සමන්විත වේ. පළාතේ ප්‍රධාන ඉංජිනේරු (වාණිජ්‍යය) විසින් ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් සිටී. |
| සම්ප්‍රේෂණ | ජලය අපවිත්‍ර වීමේ ප්‍රශ්නයක් නිසා ගරු විදුලිබල හා බලශක්ති ඇමති සමඟ පැවති සාකච්ඡාවක දී ගත් තීරණය මත 2015-01-22 දින නොදර්න් පවර් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්හි මෙහෙයුම් අත්හිටුවා ඇත.<br><br>අංක. MC 2892/PL/14 දරන අධිකරණ නඩුවට අදාළව, 2015-01-27 වන දින මල්ලාකම් මහේස්ත්‍රාත් අධිකරණය විසින් නොදර්න් පවර් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්හි මෙහෙයුම් නතර කිරීමට නියෝගයක් නිකුත් කර ඇත.<br><br>ඉහත උසාවි නියෝගය මත නොදර්න් පවර් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් විසින් Sri Lanka Force Majeure තත්ත්වයක් ප්‍රකාශයට පත් කර ඇත.<br><br>ලංවිම විසින් නොදර්න් පවර් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් විසින් ප්‍රකාශයට පත් කරන ලද Sri Lanka Force Majeure තත්ත්වය සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නීති මතය 2016-09-02 දින ලබා ගෙන ඇත.<br><br>2016-09-26 දිනැති ලංවිම ලිපිය අංක DGM (EPT) / Nor Power -11 මගින් මෙය නොදර්න් පවර් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් වෙත දන්වා ඇත. 2015-01-27 දනැති උසාවි නියෝගය මගින් "Sri Lanka Force Majeure" තත්ත්වයක් ප්‍රකාශ කර නොමැති බැවින් ස්ථාවර ගාස්තු ගෙවීමට ලංවිම බැඳී නොසිටින බව එම ලිපිය මගින් ලංවිම නොදර්න් පවර් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් වෙත අවධාරණය කර ඇත.<br><br>නොදර්න් පවර් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් විසින් 2018 වසර දක්වා ධාරිතා ගාස්තු සඳහා මාසිකව ඉන්වොයිසි ලංවිම වෙත එවා ඇති අතර ලංවිම ඒ සඳහා ප්‍රතිපාදන සලසා ඇත. උසාවි නඩුවේ තීන්දුව ලැබෙන තෙක් ගෙවීම් පමණක් නවතා තිබුණි. එබැවින්, මෙම ණයහිමි ශේෂය, ගිණුම් පොත්වල දිගුකාලීන හිඟ ශේෂයක් ලෙස පවතී.<br><br>එසේ වුවද, 2016-09-02 දිනැති ලිපිය මගින් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලැබුණු නීතිමය මතයට අනුව, මෙම නඩුව මගින් "Sri Lanka Force Majeure" තත්ත්වයක් ප්‍රකාශ කර නොමැති බැවින් මෙම මුදල සමාගමට ගෙවීමට ලංවිමට වගකීමක් නොමැත.<br><br>විගණන කමිටුව විසින් නිර්දේශ කර ඇති පරිදි නොදර්න් පවර් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් වෙත ගෙවිය යුතු ශේෂය වූ රු. 2,886,675,795 ක් ලංවිම ගිණුම් පොත්වලින් ලියා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් පිළියෙල කර ඇත. ගෙවිය යුතු ශේෂය ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර 2023 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විට අවශ්‍ය සටහන් යොදනු ඇත. |

**(ත) සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැවති රු. බිලියන 10.36 ක් වූ ආපදා සහ ප්‍රවාහන ණය ශේෂ අතරින් රු. මිලියන 446 ක් ප්‍රධාන කාර්යාලයේ නොගෙවූ ණය නියෝජනය කරන අතර ඉන් රු. මිලියන 41.88 ක ණය ශේෂය වසර 4 කට වැඩි කාලයක් තිස්සේ හිඟව පැවතුණි. එසේ වුවද, අහඹු විගණන පරීක්ෂාවකට අනුව, අදාළ සේවකයින් මේ වන විටත් සේවයෙන් ඉවත් වී සිටීම සහ වසර 2 කට වැඩි කාලයක් වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති බැවින් රු. මිලියන 2.32 ක ණය ආපසු අයකර ගැනීමේ හැකියාව සැක සහිත බව නිරීක්ෂණය විය.**

රෙගුලාසිවලට අනුව, සේවකයින් විදේශයන්හි සේවය කරන අතරතුර, ණය වාරික ගෙවීමට ක්‍රමවේදයක් සේවා යෝජකයන් සැපයිය යුතුය. ඔවුන්ට ගෙවීමට නොහැකි නම්, නියම කර ඇති ක්‍රියා පටිපාටියට අනුව අයකිරීමේ ක්‍රියාවලිය සිදු කළ යුතුය. දිගුකාලීන හිඟ ණයවල තත්ත්වය දැනටමත් හඳුනාගෙන ඇති අතර, ඔවුන්ගේ අවසන් ගෙවීම්වලින් ඒවා අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග දැනටමත් ගෙන ඇත.

**(ද) මීට වසර 3කට පෙර ගෙවිය යුතු බවට ගිණුම් පොත්වල හඳුනාගෙන තිබූ ජාතිය ගොඩනැගීමේ බදුවල හිඟ ශේෂය රු. මිලියන 30.95 ක් විමර්ෂණය කර පියවීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගොනු කළ අවසන් වාර්ෂික බදු වාර්තාවට අනුව, මණ්ඩලය විසින් ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්දක් නොමැති බව නිරීක්ෂණය විය.**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගොනු කළ අවසන් වාර්ෂික ආදායම් වාර්තාවලට අනුව, මණ්ඩලය විසින් ජාතිය ගොඩනැගීමේ බද්දක් ගෙවිය යුතු නැති බව නිරීක්ෂණය විය. සමහර සටහන් යෙදීමේ දෝෂ හේතුවෙන් මෙම ශේෂය සිදු වූ අතර වෙනස දැනටමත් සසඳා ඇත.

**(ධ) 2023 ජනවාරි 20 වැනි දින නිකුත් කරන ලද මණ්ඩලය විසින් ඒස් පවර් ඇඹිලිපිටිය පෞද්ගලික සමාගමෙන් විදුලිය මිලට ගැනීම් පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ පහත නිරීක්ෂණ ඇතුළත් විය.**

**(i) ඒස් පවර් ඇඹිලිපිටිය (පුද්ගලික) සමාගමෙන් වර්ෂ 10 ක කාලයක් සඳහා විදුලිය මිලදී ගැනීම සඳහා එම සමාගම සමග මණ්ඩලය 2003 මැයි 09 වන දින ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමෙහි වලංගු කාලය වූ වසර 10 ක කාලය 2005 අප්‍රේල් 06 සිට 2015 අප්‍රේල් 06 වන දිනෙන් අවසන් වූ පසු මෙම බලාගාරය මණ්ඩලය මඟින් මිලදී ගැනීම සඳහා සලකා බැලීමට 2016 මාර්තු 23 දින රැස්වූ අමාත්‍ය මණ්ඩලයේ දී තීරණය කර තිබුණි. මණ්ඩලය විසින් කරන ලද ඉල්ලීමට අනුව, බලාගාරයේ වටිනාකම රු. මිලියන 2,370 ක් ලෙස රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කර තිබුණි. සියයට 66.9 ක ධාරිතා අගය සහ සියයට 55 ක් වූ දළ ලාභයෙන් වෙනත් මෙහෙයුම් වියදම ආදේශ කිරීමෙන් බලාගාරයේ වටිනාකම තක්සේරු කල විට බලාගාරයේ වටිනාකම රු. මිලියන 4,176 කට ආසන්න අගයක් විය යුතු බව විගණනයට නිරීක්ෂණය විය. එම නිසා, තක්සේරු වටිනාකම වන රු.මිලියන 2,370 සමඟ සැසඳීමේදී බලාගාරයේ වටිනාකම රු.1,806 කින් අවප්‍රමාණය වී තිබූ බව නිරීක්ෂණය විය. තවද, වසර 10 ක මුල් ගිවිසුම් කාලය තුළදී ගිණුම්ගත කරන ලද ශුද්ධ ලාභයේ සාමාන්‍ය ඉදිරි වසර 8 ක් සඳහා සියයට 9.5 ක වට්ටම් සාධකය යටතේ වට්ටම් කිරීමෙන් බලාගාරයේ වටිනාකම රු. මිලියන 4,192 කට ආසන්න අගයක් වන බව විගණනයට නිරීක්ෂණය වු අතර එය තක්සේරු වටිනාකම සමඟ සැසඳීමේදී බලාගාරයේ වටිනාකම රු.1,822 කින් අවප්‍රමාණය වී තිබූ බව නිරීක්ෂණය විය.**

ඇමුණුම අංක 2 යටතේ පිළිතුරු ලබා දී ඇත.

**(ii) ඒ අනුව, තක්සේරු වටිනාකම බලාගාරයේ හිමිකරුවන් විසින් එය මණ්ඩලයට අලෙවි කිරීමට එකඟ වූ ලංසු මිළ වන රු.මිලියන 2,446 ට වඩා පහළ අගයක් ගෙන තිබුණි. මෙම බලාගාරය මිලදී ගැනීමට කටයුතු කිරීමකින් තොරව 2016 අප්‍රේල් 6 දින සිට 2022 සැප්තැම්බර් 8 දින දක්වා අවස්ථා 4 කදී වසර 05 යි මාස 06 ක කාලයක් සඳහා මූලික ගිවිසුම දීර්ඝ කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, රජයේ තක්සේරුකරුගේ තක්සේරු වටිනාකම සමාගමේ හිමිකරුවන් විසින් බලාගාරය විකි□මට එකඟ වූ ලංසු මිළට වඩා අඩු අගයක් වීම හේතුවෙන් බලාග ාරය මණ්ඩලයට අත්කර ගෙන රජයට වඩා වාසිදායක ලෙස පවත්වාගෙන යාමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.**

ඇමුණුම අංක 2 යටතේ පිළිතුරු ලබා දී ඇත.

**(iii) 2003 වර්ෂයේදී ඇතිකර ගත් මුල් ගිවිසුම වර්ෂ 10 කින් අවසන් වුවද 10 වන වර්ෂය අවසානයේදී ගිවිසුම අවසන් වීම, මුල් ගිවිසුමේ 11 වන ව්‍යවස්ථාවේ සඳහන් Buy out Event අවස්ථාවක් ලෙස ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව, මෙම ගිවිසුම අනුව ගිවිසුම් කාලය අවසන් වීම මත Buy out Event අවස්ථාවක් ලෙස මෙම බලාගාරය මිළදී ගැනීමේ අයිතිය (සමාගම විසින් බලාගාරය මණ්ඩලයට අලෙවි කිරීමට යෝජනා නොකළද) මණ්ඩලයට අහිමි වී තිබුණි. තවද, වසර 20 ක ඵලදායි ජීව කාලයක් සහිත වත්කමක් සඳහා එම වත්කමෙහි පූර්ණ වටිනාකම වසර 10 ක කාලයක් තුළ මණ්ඩලය විසින් එස් පවර් ඇඹිලිපිටිය සමාගම වෙත ගෙවා තිබුණි.**

ඇමුණුම අංක 2 යටතේ පිළිතුරු ලබා දී ඇත.

(iv) ධාරිතා ගාස්තු ලෙස ගිවිසුම දීර්ඝ කිරීමෙන් පසු වසර පහක කාලයට අදාළව එ.ජ.ඩො 29,085,134 ක් ගෙවා තිබුණි. එයින්, ස්කන්ධ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ වෙනුවෙන් ගෙවන ධාරිතා ගාස්තුවේ Non-Escalable කොටස සඳහා පමණක් එ.ජ.ඩො 21,701,362 (රු.මිලියන 3,650) ක් ගෙවා තිබුණි. එය බලාගාරයේ හිමිකරුවන් විසින් බලාගාරය මණ්ඩලයට අලෙවි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ලංසුව වූ ඇ.ඩො 17,000,000 (රු.මිලියන 2,446) මෙන් සියයට 127.7 ක් බව නිරීක්ෂණය විය.

ඇමුණුම අංක 2 යටතේ පිළිතුරු ලබා දී ඇත.

(ඩ) මුල් ගිවිසුම් කාලය තුළදී ඒස් පවර් ඇඹිලිපිටිය පෞද්ගලික සමාගම රු. මිලියන 8,572 ක ශුද්ධ ලාභයක් ලබා තිබූ අතර එය 2003 වර්ෂයේදී සමාගම විසින් සිදුකර තිබූ මූලික ප්‍රාග්ධන ආයෝජනය වූ රු. මිලියන 1,676 ට සාපේක්ෂව සියයට 511 ක් වී තිබුණි. තවද, ගිවිසුම දීර්ඝ කිරීමෙන් පසු වසර පහක කාලය සඳහා රු. මිලියන 6,270 ක ශුද්ධ ලාභයක් උපයාගෙන තිබුණු අතර එය මූලික ආයෝජනයට ප්‍රතිශතයක් ලෙස සියයට 406 කි. ඒ අනුව, 2021 මාර්තු 31 වන දිනට ඒස් ඇඹිලිපිටිය පෞද්ගලික සමාගම උපයාගෙන ඇති මුළු ශුද්ධ ලාභය රු. මිලියන 14,841 ක් වූ අතර එය මූලික ආයෝජනයට සාපේක්ෂව සියයට 885 කි.

ඇමුණුම අංක 2 යටතේ පිළිතුරු ලබා දී ඇත.

(vi) ඒස් පවර් ඇඹිලිපිටිය පෞද්ගලික විදුලි බලාගාරයේ ගිවිසුම් දීර්ඝ කරමින් විදුලිය මිලදී ගැනීමේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණ ද පෞද්ගලික විදුලි බලාගාර වෙතින් විදුලිය මිලදී ගැනීමේ දී 2013 අංක 31 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනතේ 43 වන වගන්තිය ප්‍රකාරව විදුලිය මිලදී ගැනීමේදී අනුගමනය කළ යුතු නියමයන් කෙරෙහි එහිදී ප්‍රමාණවත් අවධානය යොමු කර තිබූ බවට කරුණු නිරීක්ෂණය නොවිය.

ඇමුණුම අංක 2 යටතේ පිළිතුරු ලබා දී ඇත.

(vii) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ නියමයන් ප්‍රකාරව විදුලි ජනනය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව වෙතින් විදුලි ජනනය සඳහා බලපත්‍ර ලබාගත යුතුය. ඒ අනුව උක්ත පනතේ 43 (1) වගන්තිය ප්‍රකාරව එසේ බලපත්‍ර හිමිවූ සමාගම් වෙතින් පමණක් විදුලිය ජනනය සහ සැපයීම සිදුකළ යුතු වුවද එසේ ජනන බලපත්‍ර ලබාගෙන නොමැති ඒස් පවර් ඇඹිලිපිටිය සමාගමෙන් 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා විදුලිය මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි.

ඇමුණුම අංක 2 යටතේ පිළිතුරු ලබා දී ඇත.

(viii) සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ නියමයන්ට අනුව සියයට 100 ක හිමිකාරිත්වයක් දරන පෞද්ගලික සමාගම්වලට මෙ.වො.25 කට වඩා ධාරිතාවයක් සහිත විදුලි බලාගාර පවත්වාගෙන යාමට ප්‍රතිපාදන නොමැත. කෙසේ වෙතත්, මෙ.වො. 100 ධාරිතාවයකින් යුත් සියයට 100 ක පෞද්ගලික හිමිකාරිත්වයක් දරන ඒස් පවර් ඇඹිලිපිටිය විදුලි බලාගාර සමඟ කෙටිකාලීන විදුලිය මිලදී ගැනීම සඳහා වන ගිවිසුම 2016 අප්‍රේල් 06 වන දින අත්සන් කර තිබුණි.

ඇමුණුම අංක 2 යටතේ පිළිතුරු ලබා දී ඇත.



## ඇමුණුම 01

විගණන වාර්තාවේ සඳහන් කාල සීමාව සඳහා ලෙකෝ වෙත නිකුත් කරන ලද මාසික ඉන්වොයිසිවල සමාජ ආරක්ෂණ දායක බදු (SSCL) මුදල ඇතුළත් කර ඇත. කෙසේ වෙතත්, ඉන්වොයිසිවල සඳහන් SSCL මුදල් ලෙකෝ විසින් පියවා නොමැත. ඒ අනුව, මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) වෙත ප්‍රේෂණය කිරීමට ලංවිම සතුව මුදල් නොතිබුණි.

තවද, ලෙකෝ වෙතින් SSCL මුදල නොලැබීම හේතුවෙන් ලෙකෝ වෙත කරන අලෙවිය මත වූ SSCL පියවීමට නොහැකි වීම සම්බන්ධයෙන් 2023 ජනවාරි 10 දිනැති සහ 2023 සැප්තැම්බර් 04 දිනැති DGM/EMT/SSCL යන ලිපි යොමුව මගින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

SSCL පනතට අනුකූලව, ලංවිම SSCL බද්දට යටත් වන අතර 2022-10-01 දින සිට බලපැවැත්වෙන පරිදි ලෙකෝ ඇතුළු පාරිභෝගිකයින්ගෙන් එය අය කරයි. කෙසේ වෙතත්, පාරිභෝගිකයින්ට විදුලිය සැපයීම සඳහා බෙදාහැරීමේ බලපත්‍රලාභියෙකු වන ලෙකෝ SSCL පනතට අනුව SSCL සඳහා යටත් නොවේ. ඒ අනුව, ලෙකෝ සහ ලංවිම විදුලි පාරිභෝගිකයින් අතර වෙනස්කම් ඇති කරමින් ලංවිම අවසාන පරිශීලක පාරිභෝගිකයින් SSCL ගෙවීමට බැඳී සිටින අතර ලෙකෝහි අවසාන පරිශීලක පාරිභෝගිකයින් SSCL ගෙවීමෙන් නිදහස් කර ඇත. එබැවින් පාරිභෝගිකයන් දෙපාර්ශවයම සාධාරණ ක්ෂේත්‍රයට ගෙන ඒම වැදගත් වේ. සියලුම බෙදාහැරීමේ බලපත්‍රලාභීන් SSCL සඳහා යටත් වන බවට පත් කිරීමෙන් මෙය ක්‍රියාත්මක කළ හැක. ඒ අනුව, විදුලි පාරිභෝගිකයින් සඳහා නිර්මාණය වී ඇති විෂමතාව සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කිරීමට සහ විදුලි පනත සංශෝධනය කිරීමට ලංවිම ගතහැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගෙන ඇත. පනත සංශෝධනය කිරීමට ලංවිම විසින් දරන ලද නොපසුබට උත්සාහයෙන් පසුව, 2022 අංක 25 දරන SSCL බදු පනත සංශෝධනය කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 23/0190/604/016 දරන සංදේශය 2023.01.30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩල විසින් අනුමත කර ඇත. SSCL පනත සංශෝධනයට අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය පහත පරිදි වේ.

''2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 13 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද බෙදාහැරීමේ බලපත්‍රයක් දරන ඕනෑම පුද්ගලයෙකු විසින් විදුලිය සැපයීම හැර විදුලිය ජනනය සහ විදුලිය සැපයීම SSCL වලින් නිදහස් කර ඇත''. පනතේ මෙම සංශෝධනය 2023 සැප්තැම්බර් සිට බලපැවැත්වෙන අතර 2023 සැප්තැම්බර් සිට ලංවිම සම්ප්‍රේෂණ බලපත්‍රලාභියා SSCL සඳහා යටත් නොවේ. කෙසේ වෙතත්, 2023 සැප්තැම්බර් මාසයට පෙර කාලසීමාව සඳහා IRD වෙත ගෙවිය යුතු SSCL මුදල නිරාකරණය කිරීම සඳහා ලංවිම 2023 ඔක්තෝබර් 24 දිනැති FM(CEB)/AFM(HQ)/Tax Unit/SSCL යන ලිපිය හරහා භාණ්ඩාගාර මැදිහත්වීමක් ඉල්ලා ඇත. IRD වෙත ගෙවිය යුතු SSCL වගකීම, විදුලි පාරිභෝගිකයින් අතර වෙනස්කම් ඇති කර ඇති SSCL පනතේ ගැටලුව නිසා බැවින් භාණ්ඩාගාර මැදිහත්වීමක් ඉල්ලා ඇත.

# ඇමුණුම 02

කෝප් වාර්තාවේ නිරීක්ෂණ පිළිබඳ වාර්තාව

## මෙගාවොට් 100 ධාරිතාවයකින් යුත් ඒස් පවර් ඇඹිලිපිටිය පෞද්ගලික සමාගමෙන් විදුලිය මිලදී ගැනීම

### හැඳින්වීම

ඉදිකිරීම, අයිතිය, මෙහෙය වීම (BOO-ඉදිකිරීම-අයිතිය-මෙහෙය වීම) සහ දැවි තෙල් (HFO) වලින් ක්‍රියාත්මක වන සහතික කරන ලද මෙගාවොට් 100 ක සම්පූර්ණ ධාරිතාවයකින් යුත් ප්‍රත්‍යාවර්ත එන්ජිමක් මත ධාවනය වන ජනන කට්ටල (reciprocating engine-driven generating sets) නඩත්තු කිරීමේ අරමුණින් හදිසි අවශ්‍යතා බලාගාරයක් ලෙස නොව based load බලාගාරයක් ලෙස ඒස් පවර් ඇඹිලිපිටිය පෞද්ගලික සමාගම 2003 වර්ෂයේදී සංස්ථාපිත කර ඇත. ඒස් පවර් ඇඹිලිපිටිය පෞද්ගලික සමාගම 132kV වෝල්ටීයතාවයෙන්යුත් ඇඹිලිපිටිය උපපොළට සම්බන්ධ කර ඇත.

ඒස් පවර් ඇඹිලිපිටිය විදුලි බලාගාරය ටෙන්ඩර් පටිපාටියක් මත විදුලිය මිලදී ගැනීම සඳහා තෝරාගෙන ඇති අතර ඒ සඳහා මූලික ගිවිසුම 2003-05-09 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත අත්සන් කර ඇත. බලාගාරය විදුලිබල පද්ධතියට සම්බන්ධ කර 2005-04-06 දින ලංවිම වෙත විදුලිය ලබා දී ඇත.

මෙම බලාගාරය මගින් ජනනය කරන ලද විදුලි බලය, පහත වගුවේ සාරාංශ කර ඇති පරිදි අවස්ථා පහකදී මුල් බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම (PPA) සහ කෙටි කාලීන බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් (දීර්ඝ කිරීම්) හි දක්වා ඇති නියමයන් සහ කොන්දේසිවලට යටත්ව ලංවිම විසින් මිලදී ගෙන ඇත.

| විස්තරය | PPA අත්සන් කළ දිනය | කාල සීමාව | කාල සීමාව (වසර) |
|---|---|---|---|
| මුල් ගිවිසුම | 2003-05-09 | 2005-04-05 to 2015-04-04 | 10 |
| පළවන දීර්ඝ කිරීම | 2016-04-06 | 2016-04-05 to 2017-04-04 | 1 |
| දෙවන දීර්ඝ කිරීම | 2017-03-17 | 2017-04-06 to 2018-04-05 | 1 |
| තෙවන දීර්ඝ කිරීම | 2018-04-05 | 2018-04-06 to 2021-04-05 | 3 |
| සිව්වන දීර්ඝ කිරීම | 2022-03-28 | 2022-03-28 to 2022-09-28 | මාස 6 |

PPA අනුව, මිනුම් ස්ථානයේදී (ඇඹිලිපිටිය ග්‍රිඩ් උපපොළ) වර්ෂයක් සඳහා බලාගාරයේ අවම සහතික කළ බලශක්ති ප්‍රමාණය (MGEA) ගිගාවොට් පැය 697.67 ක් විය.

### බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමේ ගාස්තු ව්‍යුහය

ලංවිමට විදුලිබලය සැපයීමේ ගාස්තු, ධාරිතා ගාස්තු සහ බලශක්ති ගාස්තුවලින් සමන්විත වේ. ධාරිතා ගාස්තුවේ සංරචක දෙකක් ඇත. එනම් වැඩි කළ හැකි සංරචකය සහ වැඩි කළ නොහැකි සංරචකය වේ.
ධාරිතා ගාස්තුව බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමේ (PPA) නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව අවම සහතික කළ බලශක්ති ප්‍රමාණය (MGEA) මත පදනම් වේ. ධාරිතා ගාස්තුවේ වැඩි කළ හැකි සංරචකය එක්සත් ජනපද පාරිභෝගික මිල දර්ශකය (USCPI) අනුව ගණනය කරනු ලබයි. ධාරිතා ගාස්තුවේ වැඩි කළ නොහැකි සංරචකය ස්ථාවර වන අතර එය වැඩි කිරීමට යටත් නොවේ.

බලශක්ති ගාස්තුවේ සංරචක තුනක් ඇත. එනම් ඉන්ධන නොවන සංරචකය, ඉන්ධන සංරචකය සහ ඉන්ධන ප්‍රවාහන සංරචකය වේ. ඉන්ධන නොවන සංරචකයට විචල්‍ය මෙහෙයුම් සහ නඩත්තු වියදම් ඇතුළත් වේ. ඉන්ධන සංරචකය බලාගාරයේ තාප අනුපාතය (Heat rate) සහ ඉන්ධන මිල මත පදනම්ව බලශක්ති පිරිවැය නියෝජනය කරයි. තාප අනුපාතය යනු තාප බලාගාරයක බලාගාර ධාරිතාව (මෙගාවොට්), තාක්ෂණය සහ ඉන්ධන වර්ගය අනුව තීරණය වන විශේෂිත සාධකයකි. ඉන්ධන ප්‍රවාහන සංරචකයට බලාගාරයට ඉන්ධන ප්‍රවාහනය කිරීමේදී දරන ලද වියදම ඇතුළත් වේ.

ආරම්භක නැවතුම් ගාස්තු: කොන්ත්‍රාත් කාලයකට නොමිලේ ලබා දෙන නැවතුම් ගණන PPA හි දක්වා ඇත. තථ්‍ය නැවතුම් සංඛ්‍යාව PPA හි සඳහන් නොමිලේ ලබා දෙන නැවතුම් ප්‍රමාණය ඉක්මවා ගිය විට යැවීමට (dispatch) අවශ්‍ය එක් එක් විදුලිබල ජනන කට්ටලයේ එක් එක් නැවතුම සඳහා නැවතුම් ගාස්තුවක් ඇත.

එක් එක් බිල්පත් කාල සීමාව සඳහා සම්පූර්ණ ධාරිතා ගාස්තුව සහ බලශක්ති ගාස්තුව මුල් PPA හි IV වගන්තිය සහ මුල් PPA හි හතරවන උපලේඛනයෙන් සමන්විත සූත්‍ර මත පදනම්ව තීරණය කරනු ලබයි.

ධාරිතා ගාස්තුව කිලෝවොට් පැයකට එ.ජ.ඩො වලින් (වැඩි කළ නොහැකි සංරචකය), ධාරිතාව ගාස්තු කිලෝවොට් පැයකට එ.ජ.ඩො වලින් (වැඩි කළ හැකි සංරචකය), මූලික බලශක්ති ගාස්තුව කිලෝවොට් පැයකට එ.ජ.ඩො වලින් (ඉන්ධන නොවන සංරචකය), ඉන්ධන පරිභෝජන අනුපාතය කිලෝවොට් පැයකට රුපියල්වලින්, ප්‍රාථමික ඉන්ධනවල මූලික අඩු තාපන අගය kJ/kg වලින් වශයෙන් PPA හි එක් එක් නියමයන් මත එකඟ විය යුතුය.

බිල්පත් කාලසීමාව සඳහා එක් එක් බෙදාහැරීම සඳහා ඉන්ධන මිල, එවැනි බෙදාහැරීම්වල ඉන්ධන ඝනත්වය, ඉන්ධනවල අඩු තාප අගයන් වැනි විචල්‍ය පරාමිතීන් ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ (CPC) ඉන්වොයිසි සහ තෙවන පාර්ශවීය ඉන්ධන රසායනාගාර වාර්තා මත පදනම්ව එකතු කර ගත යුතුය. මනු කියවීම්වල ඡායාරූප සමඟ දෙපාර්ශවයේම නියෝජිතයා විසින් අත්සන් කරන ලද ගාස්තු බලශක්ති මනු කියවීම භාවිතා කිරීමෙන් බෙදා හරින ලද විදුලි ශක්තිය හඳුනා ගනු ලබයි.

**ලංවිම ගෙවන ඒකක මිල (CEB claimed unit price) සහ රැස්වීමේදී ඉස්මතු කරන ලද ඒකක මිල (AG's claim unit price) අතර වෙනස පිළිබඳ අදහස් දැක්වීම**

අත්සන් කරන ලද PPA, සූත්‍ර, එකඟ වූ අගයන් සහ පවතින පරාමිති මත පදනම්ව, ලංවිම විසින් බිල්පත් කාලසීමාව සඳහා සම්පූර්ණ ගාස්තු ගණනය කර ඇති අතර (තහවුරු කිරීමේ අරමුණ සඳහා ඉංජිනේරුවන් දෙදෙනෙකු විසින් වෙන වෙනම ගණනය කරනු ලබයි) සමාගම විසින් ඉදිරිපත් කරන ලද ඉන්වොයිසිය සමඟ පරීක්ෂා කරයි.

බිල්පත් කාල සීමාවක් සඳහා ඒකක අනුපාතය, ගණනය කරන ලද ඉහත සම්පූර්ණ ගාස්තු භාවිතා කිරීමෙන් සහ එම මාසය සඳහා ලංවිමට ලබා දෙන බලශක්ති ප්‍රමාණය මගින් තීරණය කළ හැක. MGEA මත පදනම්ව ගණනය කරනු ලබන ධාරිතා ගාස්තුව, ග්‍රිඩ් වෙත සම්බන්ධ කර බලාගාරය ලබා ගැනීම සඳහා ලංවිම විසින් නිශ්චිත කාලසීමාවක් සඳහා එකඟවූ පිරිවැයක් වන බැවින් කුසලතා අනුපිළිවෙලින් බලාග ාරය යැවීම (dispatch) සඳහා පද්ධති පාලන ශාඛාව විසින් ධාරිතා ගාස්තුව නොසලකනු ලබයි.

බලාගාරවල බලශක්ති ගාස්තු ඒකක අනුපාතය සලකා බැලීමෙන් වඩාත්ම ආර්ථිකමය යැවීමේ (dispatch) පිළිවෙල සකස් කරනු ලබයි. 2022 ජූනි 09 දිනට පවතින නවතම ඉන්ධන මිල වූ රු. 369 සහ එ.ජ.ඩොලරයක විනිමය අනුපාතිකය වූ රු. 365.02 සැලකිල්ලට ගනිමින් පද්ධති පාලන මධ්‍යස්ථානය විසින් බලශක්ති ගාස්තු ඒකක අනුපාතය කිලෝවොට් පැයකට රු. 95.73 ක් ලෙස ගණනය කර ඇත.

රැස්වීමේදී ඉස්මතු කර ඇති පරිදි බලශක්ති ගාස්තු ඒකක මිල සඳහා කිසිදු විෂමතාවයක් අපට හමු නොවේ.

**මුල් ගිවිසුම කල් ඉකුත් වූ පසු ධාරිතා ගාස්තු පැනවීම සඳහා පැහැදිලි කිරීම**

i වැඩි කළ හැකි ධාරිතා ගාස්තුව - පරිපාලන වියදම්, ස්ථාවර මෙහෙයුම් වියදම්, ගොඩනැගිලි සහ වාහන නඩත්තු, විදුලිය සහ ජල බිල්පත්
ii වැඩි කළ නොහැකි ධාරිතාව ගාස්තුව - එය ප්‍රධාන සංරචක 4 කින් සමන්විත වේ.
iii ප්‍රාග්ධන කොටස ආපසු ගෙවීම
iv ස්කන්ධය මත ප්‍රතිලාභ
v රක්ෂණය
vi ලබා ගත් ණය සඳහා ගෙවන පොලිය

ප්‍රාග්ධන කොටස ආපසු ගෙවීමේ සංරචකය සහ පොලී සංරචකය මුල් ගිවිසුමේ 7 වන වසරෙන් පසු ශූන්‍ය (0) බවට පත් වේ.
රක්ෂණ සංරචකය මුල් ගිවිසුමේ 10 වැනි වසර සඳහා පමණක් ශූන්‍ය (0) බවට පත් වේ.

එබැවින්, මුල් ගිවිසුම් කාලසීමාව අවසානයේදී, වැඩි කළ නොහැකි ධාරිතා ගාස්තු ලෙස ස්කන්ධය මත ප්‍රතිලාභය යන සංරචකය පමණක් ගෙවනු ලබයි.

ඒ අනුව, පළවන දිර්ඝ කිරිමේ ගිවිසුමට අදාළ ධාරිතා ගාස්තුව (කිලෝවොට් පැයකට එ.ජ.ඩො) දිර්ඝ කරන ලද එක් වර්ෂයක කාල සීමාවක් සඳහා (2016 අප්‍රේල් සිට 2017 අප්‍රේල් දක්වා) මුල් ගිවිසුමේ දසවන වර්ෂයේ ධාරිතා ගාස්තුවෙන් (USD/kWh) සියයට 95 ක් බවට එකඟ විය. එක්සත් ජනපද පාරිභෝගික මිල දර්ශකය (USCPI) සමඟ වෙනස් වන වැඩි කළ හැකි ධාරිතා ගාස්තු (අවම සහතික කළ බලශක්ති ප්‍රමාණය (MGEA) මත කිලෝවොට් පැයකට ඒකක අනුපාතය) සහ ඉන්ධන නොවන බලශක්ති ගාස්තුව (බෙදාහරින ලද බලශක්තියෙන් කිලෝවොට් පැයකට ඒකක අනුපාතය) යන සංරචක දෙකම පළමු දිර්ඝ කිරිම ආරම්භයේදීම ස්ථාවර කර ඇත. (සටහන: මුල් ගිවිසුමට අනුව, ප්‍රාග්ධන කොටස ආපසු ගෙවීම, ණය පොලී සහ රක්ෂණ සංරචකවල ගෙවීම් අගයන් 10 වන වසර තුළ බිංදුවට සමාන වේ.) මුල් PPA කාල සීමාව තුළ සිදු කරන ලද ගෙවීම්වල සාරාංශය පහත පරිදි වේ;

| බෙදාහරින ලද බලශක්තිය | | ධාරිතා ගාස්තුව | | බලශක්ති ගාස්තුව | |
|---|---|---|---|---|---|
| වැඩි කළ හැකි සංරචකය | | වැඩි කළ නොහැකි සංරචකය | ඉන්ධන නොවන සංරචකය | ඉන්ධන සංරචකය | ඉන්ධන ප්‍රවාහන සංරචකය |
| ගිගාවොට් පැය | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 5,568.46 | 1,677.5 | 11,669.6 | 4,265.6 | 69,235.4 | 1,357 |
| | 13,347.12 | | 74,857.78 | | |

❖ මෙයට නැවතුම් ගාස්තු, ප්‍රමාද වූ පොලී ගෙවීම් සහ ප්‍රතිපූරණය කළ හැකි බදු ගෙවීම් ඇතුළත් නොවේ.

ඒ අනුව, මුල් ගිවිසුම් කාලය තුළදී PPA අනුව ඉන්ධන සංරචකය සඳහා සමාගමට ගෙවා ඇති මුදල රු. මිලියන 69,235.4 කි. කෙසේ වෙතත්, PPA හි මුල් ගිවිසුම් කාලසීමාව තුළ ඉන්ධන සැපයීම සඳහා සමාගම විසින් CPC වෙත ගෙවා ඇති මුදල රු. මිලියන 65,332.8 ක් බව සමාගමේ ඉන්වොයිසිවලින් නිරීක්ෂණය වී ඇත.

දෙවන (2017 අප්‍රේල් - 2018 අප්‍රේල් ), තෙවන (2018 අප්‍රේල් - 2021 අප්‍රේල්) සහ සිව්වන (2022 මාර්තු - 2022 සැප්තැම්බර්) දිර්ඝ කිරීම් සඳහා වැඩි කළ හැකි ධාරිතා ගාස්තු සංරචකය, වැඩි කළ නොහැකි ධාරිතා ගාස්තු සංරචකය සහ ඉන්ධන නොවන බලශක්ති ගාස්තු සංරචකය සඳහා ගාස්තු පළවන වන දිර්ඝ කිරිම ආරම්භයේ ඇති අගයන්ට ස්ථාවර කර ඇත. දිර්ඝ කිරීම් සඳහා සිදු කරන ලද ගෙවීම් සාරාංශය පහත පරිදි වේ;

| බෙදාහරින ලද බලශක්තිය | | ධාරිතා ගාස්තුව | | බලශක්ති ගාස්තුව | |
|---|---|---|---|---|---|
| වැඩි කළ හැකි සංරචකය | | වැඩි කළ නොහැකි සංරචකය | ඉන්ධන නොවන සංරචකය | ඉන්ධන සංරචකය | ඉන්ධන ප්‍රවාහන සංරචකය |
| ගිගාවොට් පැය | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 2,285.6 | 1,243 | 3,653 | 3,312.8 | 46,760.6 | 879.8 |
| | 4,896 | | 50,953.2 | | |

❖ මෙයට නැවතුම් ගාස්තු, ප්‍රමාද වූ පොලී ගෙවීම් සහ ප්‍රතිපූරණය කළ හැකි බදු ගෙවීම් ඇතුළත් නොවේ.

ඒ අනුව, දීර්ඝ කිරීමේ කාලසීමාව තුළදී PPA අනුව ඉන්ධන සංරචකය සඳහා සමාගමට ගෙවා ඇති මුදල රු. මිලියන 46,760.6 කි. කෙසේ වෙතත්, දීර්ඝ කිරීමේ කාලය තුළදී ඉන්ධන සැපයීම සඳහා සමාගම විසින් CPC වෙත ගෙවා ඇති මුදල රු. මිලියන 44,131.5 ක් බව සමාග මේ ඉන්වොයිසිවලින් නිරීක්ෂණය වී ඇත.

ඉන්ධන සංරචකය යනු උපයෝජනය සඳහා වැයවන පිරිවැයකි. (a pass-through cost to the utility). ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරයේ PPA අනුව 42,677 kJ/kg ලෙස උපකල්පනය කරන ලද ප්‍රාථමික ඉන්ධනයේ (දැවි තෙල්) පාදක අඩු තාපන අගයේදී (base lower heating value) කිලෝවොට් පැයකට කිලෝග්රෑම් 0.2217 ක් ලෙස ලබා දී ඇති ඉන්ධන පරිභෝජන අනුපාතයෙන් ඉන්ධන සංරචකය ව්‍යුත්පන්න කර ඇත. ඉන්ධන පරිභෝජන අනුපාතිකය තරඟකාරී ලංසු තැබීම මගින් තීරණය කරනු ලබන බැවින් සහ මුල් ගිවිසුමේ අදාළ කොන්දේසි සමාලෝචනය කිරීමට ප්‍රතිපාදන සපයා නොමැති බැවින් ගණනය කිරීමේ බලපෑම පිලිබඳව අවදානය යොමු කළ නොහැක. ඉදිරි ටෙන්ඩර්වලදී, රජයට උපරිම මූල්‍ය ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා කාල සීමාව තුළ ඉන්ධන පරිභෝජන අනුපාතිකය සමාලෝචනය කිරීමේ ප්‍රතිපාදන යෙදීම පිලිබඳව අවදානය යොමු කළ යුතුය.

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

### ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරයෙන් විදුලිය මිලදී ගැනීමේ ක්‍රියා පටිපාටිය

ටෙන්ඩර් පටිපාටියක් මත විදුලිය මිලදී ගැනීම සඳහා බලාගාරය තෝරාගෙන ඇති අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2003-05-09 වැනි දින මුල් ගිවිසුම අත්සන් කර ඇත. බලාගාරය විදුලිබල පද්ධතියට සම්බන්ධ කර 2005-04-06 දින ලංවිම වෙත විදුලිය ලබා දී ඇත. මුල් ගිවිසුමේ කාලය වසර 10 කි.

2016 මාර්තු 18 වන දින විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරය අත්පත් කර ගැනීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව හරහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුව (CANC) සහ තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) පත් කර ඇත. කාර්ය වාර්තාව සඳහා අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව 2016 මාර්තු 23 වැනි දින පැවැති අමාත්‍ය මණ්ඩලය රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය නිර්දේශය ලැබී තිබුණි.

මෙම බලාගාරයේ වටිනාකම තීරණය කිරීම සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරුවක් ලබා ගැනීමට CANC තීරණය කර තිබුණි. නියං කාලය තුළ ජල විදුලි බලාගාරවලින් විදුලිය ලබා ගැනීමට නොහැකිවීම හේතුවෙන් විදුලි අර්බුදයක් ඇති විය. රජයේ ප්‍රධාන තක්සේරුකරුට වාර්තාව ඉදිරිපත් කිරීමට යම් කාලයක් ගතවන බැවින් විදුලි අර්බුදය විසඳීම සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් හදිසි පදනමින් ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරයෙන් විදුලිය මිලදී ගන්නා ලෙස CANC සහ TEC වෙත උපදෙස් දී තිබුණි.

මුල් ගිවිසුම මත පදනම්ව සහ මිල සංශෝධන සහිතව, මෙම සමාගමෙන් විදුලිය මිලදී ගැනීම සඳහා සාකච්ඡා කරන ලෙස විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් CANC වෙත උපදෙස් දී තිබුණි. බලාගාරය මිලදී ගැනීම සඳහා CANC වෙත බලය පවරා ඇති බැවින් ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරයෙන් විදුලිය මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට තීරණය විය.

ඒ අනුව, 2016-03-29 දින විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් විදුලිය මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණි. 2016-03-30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරයෙන් විදුලිය මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය.

අමාත්‍ය මණ්ඩල අනුමැතියට යටත්ව පළවන දීර්ඝ කිරීමේ ගිවිසුම සඳහා අනුමැතිය ඉල්ලා ලංවිම විසින් 2016-04-01 සහ 2016-04-06 දිනැති ලිපි මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත යොමු කර තිබුණි. කොමිසමේ අනුමැතිය ලැබෙන තුරු 2016-04-06 සිට 2017-04-06 දක්වා කාලය සඳහා පළවන දීර්ඝ කිරීමේ ගිවිසුම අත්සන් කර ඇත. 2016-04-07 දිනැති ලිපිය මගින් මෙම බලාගාරයෙන් විදුලිය මිලදී ගැනීමට විරෝධතාවයක් නොමැති බව මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් දන්වා තිබුණි.

මුල් කොන්ත්‍රාත් කාල සීමාවේ දසවන වර්ෂයේදී, වැඩි කළ නොහැකි ධාරිතා ගාස්තුවට ස්කන්ධය මත ප්‍රතිලාභය පමණක් ඇතුළත් වේ. මුල් ගිවිසුමේ දහවන වර්ෂයේ වැඩි කළ නොහැකි ගාස්තුවෙන් (කිලෝවොට් පැයකට එ.ජ.ඩො) සියයට 95 ක් දීර්ඝ කරන ලද කාල සීමාවේ වැඩි කළ නොහැකි ධාරිතා ගාස්තුව ලෙස එනම් කිලෝවොට් පැයකට එ.ජ.ඩො 0.00627 ක් ලෙස ස්ථාවර කර තිබුණි. අත්සන් කරන ලද පළවන දීර්ඝ කිරීමේ කාල සීමාව සඳහා වැඩි කළ නොහැකි ධාරිතා ගාස්තුවට සංරචක දෙකක් ඇත. එනම් ස්කන්ධය මත ප්‍රතිලාභය සහ රක්ෂණය වේ. පළවන දීර්ඝ කිරීමේ කාල සීමාව සඳහා ප්‍රාග්ධන කොටස ආපසු ගෙවීමේ සංරචකයට සහ ණය පොලී සංරචකයට වන ගෙවීම් බිංදුවට සකසා ඇත.

ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරයෙන් විදුලිය මිලදී ගැනීමට හේතු දක්වමින් 2016-12-09 වන දින ලංවිම විසින් මහජන උපයෝගිතා කොමිෂන් සභාවට ලිපියක් යවා තිබුණි.

2017 මාර්තු මාසයේදී, ජලාශ හිඳී යාමේ සහ ජලවිදුලි බලාගාරවල ජනන ධාරිතාව අඩුවීමේ හැකියාවක් පවතින බැවින් නැවත වසරයක් සඳහා (දෙවන දීර්ඝ කිරීම ලෙස) මෙම සමාගමෙන් විදුලිය මිලදී ගැනීමට සාකච්ඡා කර තිබුණි. නැවතත් 2016-12-29 දින විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණි. 2017-01-10 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරයෙන් විදුලිය මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය. තවද, රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තා ඒ වන විටත් අමාත්‍යාංශයට ලැබී නොතිබුණි.

ඒ අනුව, දෙවන දීර්ඝ කිරීමේ ගිවිසුම සඳහා අනුමැතිය ඉල්ලා ලංවිම විසින් මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත 2017-03-17 දිනැති ලිපිය යොමු කර තිබුණි. කෙසේ වෙතත්, 2017-04-04 දිනැති ලිපිය මගින් මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමැතිය සඳහා වැඩිදුර තොරතුරු ඉල්ලා තිබුණි. මෙම විදුලිය මිලදී ගැනීම අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව සිදු කර ඇති බැවින් අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශ ලේකම්වරයාගේ උපදෙස් හා මැදිහත්වීම අපේක්ෂා කරන බව ලංවිම විසින් 2017-05-18 දින ලිපියක් යවා තිබුණි. (පරිශිෂ්ටය 12).

2016 පළවන දීර්ඝ කිරීමේ ගිවිසුමට සමානව දෙවන දීර්ඝ කිරීමේ ගිවිසුම, 2017-04-06 සිට 2018-04-06 දක්වා වූ කාලය සීමාවක් සඳහා 2017-03-17 දින අත්සන් කර තිබුණි. අත්සන් කරන ලද දෙවන දීර්ඝ කිරීමේ කාල සිමාවේ වැඩි කළ නොහැකි බලශක්ති ගාස්තුව, ස්කන්ධය මත ප්‍රතිලාභ සහ රක්ෂණය පමණක් ඇතුළත් වන පළවන වන දීර්ඝ කිරීමේ කාල සීමාවේ පැවති වැඩි කළ නොහැකි බලශක්ති ගාස්තුවට සමාන විය. දෙවන දීර්ඝ කිරීමේ කාල සිමාවේ වැඩි කළ හැකි ධාරිතා ගාස්තුව (කිලෝවොට් පැයකට එ.ජ.ඩො 0.002133339) සහ බලශක්ති ගාස්තුවේ ඉන්ධන නොවන සංරචකය (කිලෝවොට් පැයකට එ.ජ.ඩො 0.008454097), පළවන දීර්ඝ කිරීමේ කාල සීමාවේ පැවති අගයන්ට සමාන විය. (මුල් ගිවිසුම් කාලය සිමාවේ දහවන වර්ෂයේ පැවති අගයන්ගෙන් සියයට 95 ක්)

# විගණකාධිපති වාර්තාවට පිළිතුරු (ඉතිරි කොටස)

2017 මැද භාගය වන විට, බලාගාරයේ වටිනාකම රු. මිලියන 2,370.00 ක් ලෙස තක්සේරු කරමින් රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තාව ලැබී තිබුණි. සමාගම විසින් පිරිනමනු ලබන වටිනාකම (ඇ.ජ.ඩො මිලියන 17 කි) රජයේ තක්සේරුවට වඩා වැඩි බැවින්, ඉදිරිපත් කරන ලද මිල අඩු කිරීමට CANC සහ සමාගම අතර සාකච්ඡා පවත්වා ඇති අතර ඒ සඳහා සමාගම එකඟ වී නොමැත. 2018-03-15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ එය පැහැදිලි කර ඇත.

තක්සේරුව සකස් කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ලංවිම මගින් රජයේ තක්සේරුකරු වෙත ලබා දී ඇති බව නිරීක්ෂණය වී ඇති අතර කිසිදු තොරතුරක් නොමැතිකම හේතුවෙන් තක්සේරුව අඩු වී ඇති බවක් පෙනෙන්නට නොමැත.

තවද, අවසන් වරට කල් ඉකුත් වූ PPA අනුව, පරාමිතීන් මත පදනම්ව මෙගාවොට් 100 ක ඒස් පවර් ඇඹිලිපිටිය පෞද්ගලික සමාගමේ කාලය දීර්ඝ කිරීම ලංවිම විසින් විශ්ලේෂණය කර ඇත. 2018-2037 ජනන සැලසුමේ (LTGEP) සැලසුම් කර ඇති පරිදි ප්‍රධාන තාප විදුලි බලාගාර ක්‍රියාත්මක කරන්නේ නම් ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරය භාවිතා කිරීම 2023 න් පසුව සීමා වන බව එම වාර්තාවෙන් අවධාරණය කර ඇත. ධාරිතා ගාස්තුවේ වැඩි කළ නොහැකි සංරචකයේ ශුද්ධ වර්තමාන අගය අධ්‍යයනය කිරීමේදී, කෙටිකාලීන අරමුණු සඳහා පමණක් බලාගාරය භාවිතා කරන්නේ නම්, එය අත්පත් කර ගැනීමට වඩා PPA වසර තුනකට හෝ දීර්ඝ කිරීම ලංවිමට වාසිදායක වන බව නිර්දේශ කෙරේ.

2018-02-22 දිනැති CANC වාර්තාවේ නිර්දේශ සහිතව, 2018-03-15 දින විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණි. 2018-03-27 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරයෙන් වසර 3 ක් සඳහා විදුලිය මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය.

2018-04-05 සහ 2018-05-01 දිනැති ලිපි මගින් ලංවිම විසින් තෙවන දීර්ඝ කිරීමේ ගිවිසුම සඳහා අනුමැතිය ඉල්ලා මහජන උපයෝගිතා කොමිෂන් සභාව වෙත ලිපි යවා තිබුණි.

එසේම, දෙවන දීර්ඝ කිරීමේ ගිවිසුම මෙන් තෙවන දීර්ඝ කිරීමේ ගිවිසුම ද 2018-05-04 දින අත්සන් කර ඇති අතර එහි කාල සීමාව වසර 03 ක් විය. අත්සන් කරන ලද තෙවන දීර්ඝ කිරීමේ කාල සීමාව සඳහා වැඩි කළ නොහැකි ධාරිතා ගාස්තුව, පළවන සහ දෙවන දීර්ඝ කිරීමේ කාල සීමාවල පැවති  වැඩි කළ නොහැකි ධාරිතා ගාස්තුවට සමාන විය. එයට ද සංරචක දෙකක් ඇත. එනම්  ස්කන්ධය මත ප්‍රතිලාභ සහ රක්ෂණය වේ. තෙවන දීර්ඝ කිරීමේ කාල සිමාවේ වැඩි කළ හැකි ධාරිතා ගාස්තුව සහ බලශක්ති ගාස්තුවේ ඉන්ධන නොවන සංරචකය, පළවන සහ දෙවන දීර්ඝ කිරීමේ කාල සීමාවල පැවති අගයන්ට සමාන විය. මෙම ගිවිසුම 2021-04-06 වන විට අවසන් විය.

ඒ අනුව, දීර්ඝ කිරීමේ ගිවිසුම් මගින් වසර 05 ක කාලයක් සඳහා විදුලිය මිලදී ගැනීම් සිදු කර ඇති අතර ඒ සඳහා කරන ලද ගෙවීම්වල සාරාංශයක් අමුණා ඇත. (පරිශිෂ්ටය 04). මෙහි පෙන්වා ඇති බලශක්ති ගාස්තුව සඳහා ගෙවීම උපයෝජනය සඳහා ගෙවන සංරචකයක් ( චී-චියරදමටය ජදපවදබැබච) හෝ එය විදුලිය උත්පාදනය කිරීමේ පිරිවැය ප්‍රතිපූරණය කිරීමකි.

ඉන් අනතුරුව, 2021 අප්‍රේල් මස අග සිට ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරය මගින් විදුලිය මිලදී ගැනීම සඳහා වූ සාකච්ඡා අඛණ්ඩව සිදු කර තිබුණි. ඊට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ සහ අනුමැතිය පහත දැක්වේ.

I. 2021-04-07 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සහ 2021-04-19 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය

II. 2021-10-22 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය

III.2022-01-26 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සහ 2022-01-31 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය

IV.2022-03-07 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සහ 2022-03-07 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය

2021-04-07 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් ලබන වසරේ ඇති විය හැකි විදුලි අර්බුදයට මුහුණ දීම සඳහා ඇති විසඳුම් පිළිබඳව සාකච්ඡා කර තිබුණි. 2012 වසරේ සිට නව මහා පරිමාණ බලාගාරයක් පද්ධතියට සම්බන්ධ කර නොමැති බැවින්, අනපේක්ෂිතව බලාග ාරයක් බිඳවැටීමකදී 2022 සිට ඉල්ලුම කළමනාකරණයක් ලෙස විදුලිය විසන්ධි විය හැකි බවත් නව බලාගාරයක් ඉදි කිරීමට තවත් අවුරුදු 03 ක කාලයක් ගතවනු ඇති බවත් ප්‍රකාශ කර ඇත. ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරයෙන් මාස 06 ක කාලයක් සඳහා විදුලිය මිලදී ගැනීම සඳහා සාකච්ඡා කර එම කාලසීමාව අවසානයේ බලාගාරය මිලදී ගැනීමට ඇති හැකියාව පිළිබඳව සොයා බැලීම සඳහා 2021-04-19 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය.

2020 ආරම්භයේ සිට පැවති කොවිඩ් 19 අර්බුදය සහ වෙනත් හේතු නිසා නව බලාගාර ඉදිකිරීම ප්‍රමාද විය. නව බලාගාර ඉදිකිරීමේ ප්‍රමාදය හේතුවෙන් 2022 වියළි කාලය සඳහා ජනන ධාරිතාව ප්‍රමාණවත් නොවීය.

එබැවින්, ජල විදුලි බලාගාරවල ක්‍රියාකාරිත්වය වැඩි වීම නිසා ජලාශ වේගයෙන් සිඳී යමින් තිබුණි. 2022 මාර්තු වන විට දකුණු පළාතේ පැය 07 කට වැඩි කාලයක් විදුලිය විසන්ධි කිරීමට සිදු විය.

ඒ අනුව, විදුලිය මිලදී ගැනීම සඳහා, 2022-03-04 දින අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC) සහ තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) පත් කරන ලෙස විදුලිබල අමාත්‍යාංශයේ ලේකම් විසින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට දන්වා තිබුණි. ඒ අනුව, 2022-03-08 දිනැති ලිපියක් මගින් TEC කමිටුව පත් කර තිබුණි.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ දැනට පවතින බලාගාරවලින් මාස 06, 12, 24 යන කාලසීමාවන් සඳහා සීමිත මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර කෙටි කාලයක් තුළ ක්‍රියාත්මක කළ හැකිය. ඒස් පවර් ඇඹිලිපිටිය පෞද්ගලික සමාගමෙන් තෙවන දීර්ඝ කිරීමේ ගිවිසුමේ සඳහන් මිල ගණන් ඉදිරිපත් විය.

2022-03-07 දින, අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් (24/2022/PE) සහ අංක 22/0381/318/024 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් විදුලි සැපයුම් හිඟය හදිසි තත්ත්වයක් ලෙස සලකා තිබුණි. එමෙන්ම, ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරයෙන් මාස 06 ක කාලයක් සඳහා විදුලිය මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය.

රටේ නිෂ්පාදන හා අනෙකුත් ආර්ථික කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට හැකිවන පරිදි දිවයින පුරා අඛණ්ඩව විදුලිය සැපයීම සහතික කිරීමට විදුලිබල අමාත්‍යාංශය සහ ලංකා විදුලිබල මණ්ඩලය පියවර ගත යුතු බව අංක 22/-381/318/024 දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ දක්වා තිබුණි. විදුලිය මිලදී ගැනීමේදී විදුලි ඒකකයක් සඳහා අමතර වියදම් හෝ ධාරිතා ගාස්තු ලංකා විදුලිබල මණ්ඩලයට දැරීමට සිදුවුවහොත් එම අමතර වියදම් මුදල් අමාත්‍යාංශය විසින් ප්‍රතිපූරණය කරන බවද සඳහන් කර ඇත.

2022-03-09 දින ලංවිම සාමාන්‍යාධිකාරීවරයා විසින් බලාගාරයෙන් විදුලිය මිලදී ගැනීමට අවසර ඉල්ලීම සහ අදාළ ගිවිසුමේ කෙටුම්පත ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර ඇත.

පහත සඳහන් වගන්ති ඇතුළුව සිව්වන බලශක්ති මිලදී ගැනීමේ දීර්ඝ කිරීමේ ගිවිසුම 2022-03-28 දින අත්සන් කර ඇත.

ගෙවීම් ගණනය කිරීම සඳහා භාවිතා කරන සියලුම පරාමිති 2022-03-28 දින අත්සන් කරන ලද PPA හි සඳහන් වේ.

i) මෙම ගිවිසුම් කාලය තුළ ඉන්ධන හිඟයක් පවතින බැවින්, ඉන්ධන නොමැතිකම හේතුවෙන් බලාගාරය වසා ඇති කාලය සඳහා ධාරිතා ගාස්තුවේ වැඩි කළ නොහැකි සංරචකය ගෙවනු නොලැබේ.
ii) වැඩි කළ නොහැකි සංරචකයේ අගය රුපියල් බවට පරිවර්තනය කිරීමේ විනිමය අනුපාතය (එ.ජ.ඩොලරයකට රු. 288.75) ගිවිසුම අත්සන් කරන දිනයේදී ස්ථාවර කිරීම.

2022 වර්ෂයේදී මෙම කෙටි කාලීන විදුලිය මිලදී ගැනීමට අදාළව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවට අදාළ ලිපි පහත පරිදි වේ.

I. ලංවිම සභාපතිවරයා විසින් මහජන උපයෝගිතා කොමිසම් සභාවේ (PUCSL) සභාපති වෙත යැවූ 2022-03-09 දිනැති ලිපිය
II. DGM (සී/ඝ) විසින් PUCSL හි අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවූ 2022-03-11 දිනැති ලිපිය
III. PUCSL හි අධ්‍යක්ෂ ජනරාල් විසින් සාමාන්‍යාධිකාරී වෙත යැවූ 2022-03-12 දිනැති ලිපිය
IV. ලංවිම සභාපතිවරයා විසින් PUCSL හි අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවූ 2022-03-14 දිනැති ලිපිය
V. PUCSL හි අධ්‍යක්ෂ ජනරාල් විසින් ලංවිම සභාපති වෙත යැවූ 2022-03-14 දිනැති ලිපිය
V. ලංවිම සභාපතිවරයා විසින් PUCSL හි අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවූ 2022-03-28 දිනැති ලිපිය
VI. ලංවිම සාමාන්‍යාධිකාරී විසින් PUCSL හි අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවූ 2022-04-27 දිනැති ලිපිය

**පොදු තොරතුරු**

2016-04-06 සිට, ව්‍යාපෘතියේ ප්‍රාග්ධන කොටස ආපසු ගෙවීම සහ එහි ණය පොලී ගෙවීම සඳහා දීර්ඝ කිරීමේ ගිවිසුමක් අත්සන් කර නොමැත. 2016-04-06 සිට 2021-04-06 දක්වා, පළමු දීර්ඝ කිරීම් තුනේදී සමාගමට ගෙවා ඇති ස්කන්ධය මත ප්‍රතිලාභය (2016 අප්‍රේල් වන විට වර්තමාන අගය) එ.ජ.ඩො මිලියන 12.046 ක් විය. 2016 දී, සමාගම එ.ජ.ඩො මිලියන 17 කට බලාගාරය විකිණීමට එකඟ විය. බලාගාරය අත්පත් කර ගැනීම වෙනුවට පසුගිය වසර 5 තුළ (පළමු දීර්ඝ කිරීම් තුන තුළ) විදුලිය මිලදී ගැනීමෙන් පාඩුවක් සිදුවී නොමැති බව මෙයින් පෙනී යයි.

පැරණි තාප විදුලි බලාගාරයක ධාරිතා ගාස්තු පිරිවැය (ධාරිතාව සහ තාක්ෂණය) ඊට සමාන ඝනවඩ තාප බලාගාරයක ධාරිතා ගාස්තු පිරිවැයට සාපේක්ෂව අඩුය. එබැවින්, පැරණි තාප බලාගාරයකින් විදුලිය මිලදී ගැනීම ලංවිමට මූල්‍යමය වශයෙන් වාසිදායක වේ. කෙසේ

වෙතත්, වීස් පවර් ඇඹිලිපිටිය පෞද්ගලික සමාගමේ මුල් PPA හි මිලදී ගැනීමේ විකල්පය (Buy-Out option) නොපවතින අතර (BOO වර්ගයේ IPP ආකෘතිය), PPA හි කාල සීමාව අවසානයේදී අදාළ මිලදී ගැනීමේ මිල (Buy-Out Price) සමඟ මිලදී ගැනීමේ විකල්පය සක්‍රීය කිරීමෙන් රජයට තවදුරටත් මූල්‍යමය වාසිදායක තත්වයක් සහතික කළ හැකිය.

තවද, මෙම ප්‍රතිපාදනය ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43 වැනි වගන්තියෙන් ආවරණය කර නොමැති අතර, විදුලි බලශක්ති ප්‍රසම්පාදනය සහ විදුලි ජනන ධාරිතාවය නියාමනය කිරීම සඳහා ප්‍රතිපාදන සම්පාදනය කර ඇතත් බලාගාර ප්‍රසම්පාදනය සඳහා ප්‍රතිපාදන නොමැති අතර එම ප්‍රතිපාදන අනුව එය කොමිෂන් සභාවට ලබා දී ඇති බලයට අභිබවා යන කාරණයකි. ඉහත කරුණු සලකා බැලීමෙන් පසු, PPA හි කාල සීමාව අවසානයේදී මිලදී ගැනීමේ විකල්පය සක්‍රීය කිරීමෙන් (BOOT -ඉදිකිරීම-අයිතිය-මෙහෙයවීම-මාරු කිරීම වැනි වර්ගයේ IPP ආකෘතීන්) විදුලිය ප්‍රසම්පාදනය සඳහා ලංවිම විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43 වැනි වගන්තියේ විධිවිධානවලට අනුකූල නොව බව ලංවිමට දැනුම් දීමට කොමිෂන් සභාව තීරණය කර තිබුණි.

ගිවිසුමේ ආරම්භක කාල සීමාව තුළ දරන ලද ආයෝජනය සහ ප්‍රාග්ධන පිරිවැය ආවරණය කිරීම සඳහා BOOT වර්ගයේ IPP ආකෘති නිර්මාණය කර ඇත. PPA අවසන් කිරීමේදී සහ/හෝ කල් ඉකුත් වන අවස්ථාවකදී සෑම වසරකම මිලදී ගැනීමේ මිල ඇතුළුව බලාගාරය මිල දී ගැනීම සඳහා නියමයන් සහ කොන්දේසි මෙම ආකෘතියේ ව්‍යාපෘතිවල ඇත. මුල් ගිවිසුම් කාල සීමාව තුළ ආයෝජනය සහ ප්‍රාග්ධන පිරිවැය ආවරණය කිරීම සඳහා මූල්‍ය ආකෘතිය සැලසුම් කර ඇති අතර, ගිවිසුම් කාලය අවසානයේදී එම පහසුකමේ මිලදී ගැනීමේ මිල නාමික එක්සත් ජනපද ඩොලරයක් විය යුතුය. කෙසේ වෙතත්, වීස් පවර් ඇඹිලිපිටිය සම්බන්ධයෙන් මෙම මූලිකාංගය ආවරණය කර නොමැත.

තාප විදුලි බලාගාරයක ඒකක පිරිවැය, ධාරිතා ගාස්තුවට අමතරව බලාගාරයේ තාප අනුපාතය (Heat rate) සහ ඉන්ධන මිල මත පදනම් වේ. එබැවින් දිගුකාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම (LTGEP) යටතේ ක්‍රියාත්මක වන 'නව' විදුලි බලාගාරයක ඒකක පිරිවැය, පැරණි තාප විදුලි බලාගාරයක ඒකක පිරිවැයට වඩා අඩු හෝ වැඩි වනු ඇතැයි නිශ්චිතව කිව නොහැක.

නියං සමයේදී විදුලි හිඟය මඟහරවා ගැනීම සඳහා හදිසි පදනමක් මත මෙම Base load තාප බලාගාරයෙන් විදුලි බලශක්තිය ලබාගෙන ඇති නිසා එය ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී කේවල් කිරීමේ බලය අඩු කර ඇති අතර වඩාත් හිතකර නියමයන් සහ කොන්දේසි සහිත ගිවිසුමකට එළඹීමට ඇති අවස්ථාව රජයට අහිමි විය.

**වත්මන් තත්වය**

නියඟ කාලසීමාව තුළ ප්‍රධාන ජලවිදුලි බලාගාරයේ විදුලි ජනනය අඩුවීම හේතුවෙන් 2023 වසරේ දී ද මෙවැනිම විදුලි ජනන හිඟයක් ඇති වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් තුළ දකුණු කලාපයට මෙගාවොට් 100 ක අතිරේක විදුලි බලයක් මිලදී ගැනීමට සිදු විය. කෙසේ වෙතත්, එම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා දකුණු පළාතේ විදුලි ඉල්ලුමට සහය වීමට ඉතා කෙටි කාලයක් තුළ දී මෙගාවොට් 30 ධාරිතාවයකින් යුත් තුල්හිරිය, කොළොන්නාව ප්‍රදේශයේ ස්ථාපිත කර තිබූ ලංවිම සතු ඩීසල් බලාගාර හම්බන්තොට ග්‍රිඩ් උපපොළ වෙත ගෙන යාමට ලංවිම පියවර ගෙන ඇත.

තවද, සම්ප්‍රේෂණ මාර්ගයේ මීටර් 900 ක් හැර නව ලක්ෂපාන - හම්බන්තොට සම්ප්‍රේෂණ මාර්ගයේ ඉදිකිරීම් බොහෝ දුරට අවසන් කර ඇත. මෙම මාර්ගය සම්පූර්ණ නොකිරීම දකුණු කලාපයට ඵලදායී ලෙස විදුලිය සැපයීමට ද බාධාවකි. ඉඩම් අත්පත් කර ගැනීමේ නීතිමය ගැටලු සහ මාර්ග අවසරය සම්බන්ධ විවිධ ගැටලු හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද වී ඇත. ඉතිරි මීටර 900 ක කොටස සඳහාද ඉඩම්/මාර්ග අවසරය පිළිබඳ ගැටලු පවතී. පවතින බාධාවන් මඟහරවා ගෙන 2023 මැයි මස අවසන් වන විට කටයුතු අවසන් කිරීමට හැකි වනු ඇත.

PUCSL විසින් අනුමත කරන ලද 2023-2042 දිගුකාලීන ජනන සැලැස්මට අනුව 2030 වන විට පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් සියයට 70 ක විදුලිය ජනනය කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම. 2023-2026 දක්වා ජාතික විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්ති සම්පත් ඒකාබද්ධ කිරීමේ ඉදිරි ක්‍රියාමාර්ගය පිළිබඳ වාර්තාව. 2023-2042 දිගුකාලීන ජනන සැලැස්ම මත පදනම් වූ බලශක්ති ජනන ධාරිතාව. හඳුනාගත් දකුණු කලාපයේ මෙගාවොට් 320 ක අතිරේක පුනර්ජනනීය බලශක්ති ධාරිතාව. දැනට සංවර්ධකයින්ගේ එකමුතුවක් මගින් මෙගාවොට් 130 ක භූමියේ සවි කරන ලද සූර්ය විදුලි බලාගාරයක් (Ground mounted solar PV power plant) ඉදිකිරීමට කටයුතු කරමින් පවතී.

# කෙටි යෙදුම්

| | | |
|---|---|---|
| AC | - | වායු සමීකරණ |
| ADB | - | ආසියානු සංවර්ධන බැංකුව |
| AFM | - | අතිරේක මුදල් කළමනාකරු |
| AGM | - | අතිරේක සාමාන්‍යාධිකාරී |
| B&OS | - | ව්‍යාපාර හා මෙහෙයුම් ක්‍රමෝපාය |
| BOQ | - | ප්‍රමාණ බිල්පත් |
| BSC | - | කැඩුම් ස්විච ධාරිත්‍රකය |
| CA | - | ආයතනික ක්‍රමෝපාය |
| CANC | - | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුව |
| C&C | - | වාණිජ හා ආයතනික |
| CDM | - | පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රනය |
| CE | - | ප්‍රධාන ඉංජිනේරු |
| CEA Act. | - | මධ්‍යම පරිසර අධිකාරී පනත |
| CEB | - | ලංකා විදුලිබල මණ්ඩලය |
| CEBPF | - | ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාදක අරමුදල |
| CEMS | - | අඛණ්ඩ විමෝචන නිරීක්ෂණ පද්ධති |
| CMDS | - | චක්‍රලේඛ, අත්පොත් හා ලේඛන පද්ධතිය |
| CMT | - | ආයතනික කළමනාකරණ කමිටුව |
| CO | - | කාබන් මොනොක්සයිඩ් |
| COPE | - | පොදු ව්‍යාපාර කාරක සභාව |
| CP | - | මධ්‍යම පළාත |
| CPC | - | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව |
| CPD | - | අඛන්ඩ වෘත්තීය සංවර්ධනය |
| CRR | - | ආයතනික හා නියාමන සබඳතා |
| CS&RA | - | ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු |
| CSC | - | පාරිභෝගික සේවා මධ්‍යස්ථානය |
| CSE | - | කොළඹ කොටස් වෙළඳපොළ |
| CSR | - | ආයතනික සමාජ වගකීම |
| CW&B | - | සිවිල් වැඩ හා ගොඩනැගිලි |
| DC | - | සරල ධාරා |
| DD1 | - | බෙදාහැරීමේ අංශය 1 |
| DD2 | - | බෙදාහැරීමේ අංශය 2 |
| DD3 | - | බෙදාහැරීමේ අංශය 3 |
| DD4 | - | බෙදාහැරීමේ අංශය 4 |
| DFM | - | නියෝජ්‍ය මූල්‍ය කළමනාකරු |
| DGM | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී |
| DGM(P) | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරිස්) |
| DGEU | - | රජයේ විදුලිබල පවරාගැනීමේ දෙපාර්තමේන්තුව |
| DNCC | - | බෙදාහැරීමේ ජාල පාලන මධ්‍යස්ථාන |
| DSCR | - | Debt - Service Coverage Ration |
| EGC | - | සේවක දුක්ගැනවිලි කමිටුව |
| EMS | - | බලශක්ති කළමනාකරණ පද්ධතිය |
| EMU | - | පරිසර නිරීක්ෂණ ඒකකය |
| ERD | - | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව |
| FD | - | ස්ථිර තැම්පත් |
| FS&PD | - | ක්‍රියාකාරී ක්‍රමෝපාය හා කාර්යක්‍රම ප්‍රවර්ධන |
| FSUR | - | පාවෙන ගබඩා හා ප්‍රතිවායුකරණ ඒකකය |
| GC | - | ජාලගත |
| GIS | - | වායු පිරිවෘත වහරුපන්න |
| GIS | - | භූගෝලීය තොරතුරු පද්ධතිය |
| GOSL | - | ශ්‍රී ලංකා රජය |
| GS | - | කොටුමා උපපොළ |
| GT | - | වායු තලබමනය |
| HR | - | මානව සම්පත |
| HRM | - | මානව සම්පත් කළමණාකරු |
| ICASL | - | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය |
| IPP | - | ස්වාධීන විදුලිය නිෂ්පාදකයන් |
| IT | - | තොරතුරු තාක්ෂණය |
| ITI | - | කාර්මික තාක්ෂණායතනය |
| JICA | - | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය |
| KPS | - | කැළණිතිස්ස විදුලි බලාගාරය |
| LC | - | ණයවර ලිපිය |
| LECO | - | ලංකා විදුලි (පෞද්ගලික) සමාගම |
| LKAS | - | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය |
| LKR | - | ශ්‍රී ලංකා රුපියල් |
| LOI | - | අභිප්‍රාය ලිපිය |
| LNG | - | ද්‍රව ස්වභාවික වායු |
| LTGEP | - | දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම |
| LTL | - | ලංකා ට්‍රාන්ස්ෆෝමර් ලිමිටඩ් |
| LV | - | අඩු වෝල්ටීයතාව |
| LVPP | - | ලක්විජය විදුලි බලාගාරය |
| MEPA | - | සාගර පරිසර ආරක්ෂණ අධිකාරිය |
| MLKR | - | ශ්‍රී ලංකා රුපියල් මිලියන |
| MLTS | - | මධ්‍යම මට්ටමේ තාක්ෂණික කාර්ය මණ්ඩලය |
| MMT | - | මෙට්‍රික් ටොන් මිලියන |
| MOI | - | වාරිමාර්ග අමාත්‍යාංශය |
| MT | - | මෙට්‍රික් ටොන් |
| MV | - | මැදි වෝල්ටීයතා |
| MVA | - | මෙගා වොට් ඇම්පියර් |
| MVMMS | - | මැදි වෝල්ටීයතා නඩත්තු කළමනාකරණ පද්ධතිය |
| NARA | - | ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය |
| NBQSA | - | ජාතික ඉහළම ගුණාත්මකභාවයට අදාළ මෘදුකාංග සම්මානය |

# කෙටි යෙදුම් (ඉතිරි කොටස)

| | | |
|---|---|---|
| NCP | - | උතුරු මැද පළාත |
| NCRE | - | සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය |
| NGO | - | රාජ්‍ය නොවන සංවිධානය |
| NO2 | - | නයිට්‍රජන් ඩයොක්සයිඩ් |
| NVQ | - | ජාතික වෘත්තීය සුදුසුකම |
| NWP | - | වයඹ පළාත |
| NWSDB | - | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| O3 | - | ඕසෝන් |
| OEM | - | මුල් උපකරණ නිෂ්පාදක |
| PD | - | ව්‍යාපෘති අධ්‍යක්ෂ |
| PM | - | අංශුමය ද්‍රව්‍ය |
| PMU | - | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය |
| PPA | - | විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම |
| PP | - | බලාගාරය |
| PS | - | විදුලි බලාගාරය |
| PUCSL | - | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව |
| PV | - | ප්‍රකාශ වෝල්ටීයතාවය |
| R&D | - | පර්යේෂණ හා සංවර්ධන |
| RCL | - | ආලෝකකරණ ප්‍රාදේශීය මධ්‍යස්ථානය |
| RE | - | ග්‍රාමීය විදුලියනය |
| ROE | - | කොටස් මත ප්‍රතිලාභ |
| SAIDI | - | පද්ධති සාමාන්‍ය බිඳවැටුම් කාල සීමා දර්ශකය |
| SAIFI | - | පද්ධති සාමාන්‍ය බිඳවැටුම් සංඛ්‍යාත දර්ශකය |
| SESRIP | - | විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට සහාය ලබාදීමේ ව්‍යාපෘතිය |
| SLAS | - | ශ්‍රී ලංකා පරිපාලන සේවය |
| SLFRS | - | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති |
| SLIDA | - | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| SO2 | - | සල්ෆර් ඩයොක්සයිඩ් |
| SP | - | දකුණු පළාත |
| SPPA | - | ප්‍රමිතිගත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් |
| ST | - | වාෂ්ප තලබමන |
| SVS | - | ස්ථිතික වාර පද්ධතිය |
| TL | - | සම්ප්‍රේෂණ මාර්ගය |
| UNT | - | ඒකක උපකාරක තරාපැවිය |
| UNFCCC | - | දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සංයුතිය |
| UOMDP | - | උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය |
| USA | - | ඇමරිකා එක්සත් ජනපදය |
| USAID | - | ජාත්‍යන්තර සංවර්ධනය උදෙසා වූ එක්සත් ජනපද නියෝජිතායතනය |
| USD | - | එක්සත් ජනපද ඩොලර් |
| VAT | - | එකතු කළ අගය මත බද්ද |
| WPLR | - | බරතැබූ ප්‍රමුඛ ණයදීමේ අනුපාතිකයක් |
| WPN | - | බස්නාහිර පළාත උතුර |
| WPS | - | බස්නාහිර පළාත දකුණ |
| WRB | - | ජල සම්පත් මණ්ඩලය |

ලංකා විදුලිබල මණ්ඩලය
කොළඹ 00200, ශ්‍රී ලංකාව
www.ceb.lk

Designed by BC Advertising